බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා: 8



සූත්‍රාන්ත පිටකයෙහි

02 වන ග්‍රන්ථය

දීඝනිකාය

දවිතීය භාගය

මහවග්ගය

ලඬකා බෞද්ධමණ්ඩලයේ ආරාධනාවෙන්

අග්ගමහාපණ්ඩිත

බළන්ගොඩ ආනන්දමෛත්‍රීය මහානායක

ස්ථවිරයන් වහන්සේ

විසින් කරනලද සිංහල පරිවර්තනයෙන් සමුපෙතයි

බු: ව: 2550

ක්‍රි: ව: 2006

Free Distribution www.aathaapi.org

Buddha Jayanti Tripitaka Series, Volume 8

The Second Book in the

Suttanta-Pitaka

2

DĪGHA-NIKĀYA (II)

With the Sinhala translation by

The Venerable Aggamahāpandita
Balangoda Ānanda Maitreya Mahā Nāyaka Thera

Free Distribution www.aathaapi.org

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස
චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස
තථාගතස්ස සබ්බඤ්ඤුනෝ සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ
චතුර්වෛශාරද්‍යත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ
ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා
පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ
මහා ධර්ම දානමය පුණ්‍යකර්මය

“අපාරුතා තේසං අමතස්ස ද්වාරා
යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං”

“කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී”

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ගලයෙකු නො සළකා හිදින් ද ? චතු වෛශාරද්‍යත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්ඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල ‘සද්ධා’ නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව (“සද්ධිධ විත්තං පුරිසස්ස සෙට්ඨං”) මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !
බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !
ලෝ සත්නට සෙත් වේවා !

"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"
(*යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය*)

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය
මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ
සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද
පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,
සමින්ද රණසිංහ.
2009.06.28

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 15 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:15 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

සුත්තන්ත පිටකෙ

දීඝනිකායො

මහාවග්ගො

සූත්‍රාන්ත පිටකයෙහි

දීඝනිකාය

මහාවර්ගය

Free Distribution www.aathaapi.org

"තථාගතප්පවෙදිතො භිකඛවෙ ධම්මවිනයො විවටො විරොචති, නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්ම්ය හා විනය විවෘත වූයේ බබලයි. වැසුනේ නො ම බබලයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත – හරණඛුවගඟ, 9 සූත්‍රය)

Free Distribution www.aathaapi.org

පටුන
CONTENTS

සංස්කාරක නිවේදනය	xxi
ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය	xxiii
සංඥාපනය	xxv
සංකෙත නිරූපණය	xxvii
පාළිහෝඩිය	xxix
විෂය සූචිය	xxxi
පෙළ හා පරිවර්තනය	2–564
ගාථාදිපාද සූචි	567
ස්ථාන හා පුද්ගල සංඥා සූචි	571
විශේෂ පදානුක්‍රමණිකා	579

Free Distribution www.aathaapi.org

සංස්කාරක නිවේදනය

සූත්‍රාන්ත පිටකයට අයත් ආගමග්‍රන්ථයන් අතුරෙහි පළමු වැන්න වූ දීඝනිකායෙහි ද්විතීය භාගය වන මහාවර්ගය බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි අටවැනි ග්‍රන්ථය වෙයි.

ලඬකා බෞද්ධ මණ්ඩලය විසින් ආරාධිත වූ සඛරගමු සද්ධම්මවංසික නිකායාන්තර්ගත රාස්සාගල විහාරගණයෙහි, මහානායක ධුරීණ අග්ගමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය ස්වාමීන්ද්‍රයෝ දික්සහි පෙළ සිංහල භාෂායෙන් සපුරා පරිවර්තන කළහ. එහි ප්‍රථම භාගය වූ ශීලස්කන්ධ වර්ගය 1962 දී මුද්‍රිත වී ඇත.

ශ්‍රී ලඬකා විද්‍යොදය විශ්වවිද්‍යාලයෙහි උපකුලපති ව සිටි සමස්ත ලඬකා අමරපුර මහානිකායෙහි මහානායක ධුරය ද දරූ ආනන්ද මෛත්‍රෙය මහානායක ස්ථවිරපාදයන් වහන්සේ භාෂාන්තරයෙහි හා සමයාන්තරයෙහි ද බුද්ධි විශදතා ඇති කෙනෙකි. ඔබ මේ ද්විතීය භාගයෙහි අනුවාදය ද මැනැවින් සිදු කොට ඇත. දුර්බොධාර්ථ ඇති ඇතැම් ධර්මපදයන් සඳහා අර්ථකථාගත විවරණ ද වරහන් තුළ දක්වමින් ධර්මව්‍යාඛ්‍යානය නිපදවා ඇති සැටි ද, ඒ සඳහා ඔබට හුරු වූ සුගම භාෂාස්වරූපය මැනැවින් හසුරුවා ඇති සැටි ද, සුධීන්ගේ පැසැසීමට ලක් වෙති සිතමි හ.

මුද්‍රණකාර්‍යය ඉක්මනින් නිමවාලීම සඳහා ත්‍රිපිටක මණ්ඩලයේ ස්ථවිරවරුන්ගේ සහාය ඇති වැ අප දු හට මහත් පරිශ්‍රමයක් දරන්නට සිදුවූ බව ද කියැ යුතු ය.

තවද ශ්‍රී ලඬකාජනරජයේ ගරු අග්‍රාමාත්‍ය උත්තමාවගේ අනුග්‍රහය ද ගරු සංස්කෘතික ඇමැතිතුමා ප්‍රමුඛ නදකිකාරීන්ගේ උදෙසාගය ද විශේෂයෙන් සංස්කෘතික සහකාර අධ්‍යක්ෂ සෝමපාල ජයවර්ධන මහතාණන්ගේ ක්‍රියාශීලීභාවයද කෘතඥතා පූර්වක වැ සඳහන් කරමිහ.

දෙහිවල තිසර මුද්‍රණාලයාධිකාරීන් ඇතුළු මේ සද්ධර්ම ප්‍රකාශනයෙහි සහාය වූ හැම පින්වත්තු මැ මේ හේතුයෙන් සුඛභාගී වෙත්වා' යි ආශංසනය කරමිහ.

මේ වගට:

යාසනෝදයකාරී,
ලබුගම ලඬකානන්ද ස්ථවිර
ත්‍රිපිටකමණ්ඩලයේ ප්‍රධාන සම්පාදක.

1976 නොවැම්බර් 10 දින,
ත්‍රිපිටක කාර්‍යාලය,
මහානායක චාරිකාරාමය,
115, විජේරාම මාවත,
කොළඹ. 7.

Free Distribution www.aathaapi.org

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

උපදේශක:

අග්ගමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහා ස්ථවිරපාදයන් වහන්සේ.

සභාපති:

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මීයයෙහි (භික්ෂුවිහෙ විද්‍යාලයෙහි) අධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය, කෝදගොඩ ශ්‍රී ඥානාලෝක දක්ෂිණ ලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

ප්‍රධාන සම්පාදක:

මොල්ලිගොඩ, ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්‍ය්‍ය, ත්‍රිපිටක වාගීශ්වර, ලබුගම ශ්‍රී ලඞ්කානන්ද-කෝට්ටෙ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහා සඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

සම්පාදක:

ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දල්ලේ සිරි පඤ්ඤාලෝක - ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඩරුවේ සිරි අනෝමදස්සී බටහිර දිශාවෙහි ප්‍රධාන සඞ්ඝනායකස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ - මාකඩවර විහාරාධිපති රාජකීය පණ්ඩිත, කරහම්පිටිගොඩ සිරි සුමනසාර ස්ථවිරයන්වහන්සේ.

කොළඹ, තිණිරිගස්යාමයේ අශෝකාරාමාධිපති, රාජකීය පණ්ඩිත, කරඳන පඤ්ඤාලඞ්කාර නායක ස්ථවිරයන් වහන්සේ.

ලේඛකාධිකාරී:

කොළඹ, බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල - කොළඹ පළාතේ ප්‍රධානසඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

Free Distribution www.aathaapi.org

සංඥපනය

දීඝනිකාය හෙවත් දීඝාගමය වනාහි සංගීතියට නැඟූ පෙරවාද ත්‍රිපිටකයෙන් සූත්‍ර පිටකයෙහි පළමුවන පොතය. මෙය පිළිබඳව විශේෂයෙන් කිය යුතු දෑ මෙහි මුද්‍රිත වූ පළමු වන කාණ්ඩයෙහි (සීලක්ඛන්ධ වග්ගයෙහි) මුල ම සඳහන් ව ඇත.

එහි සීලක්ඛන්ධවග්ගයේ සූත්‍රවල අදහස සැකෙවින් දක්විණ. මේ දීඝනිකායයේ දෙවෙනි භාගය යැ. මෙහි එන සූත්‍රයන් ගේ සංක්ෂේප අදහස් පහත දක්වේ.

1. මහාපදාන සූත්‍රයෙහි –

විපස්සී බුදුරජුන් පටන් මෙකොට පහළ වූ අප බුදුරජුන් ඇතුළු සත් බුදුවරුන් ගේ චරිත දක්වේ.

2. මහානිදාන සූත්‍රයෙහි –

පටිච්චසමුප්පාදය සවිස්තර ව දක්වේ.

3. මහාපරිනිර්වාණ සූත්‍රයෙහි –

බුදුරජුන් පිරිනිවන් පානු පිණිස කුසිනාරාවට වැඩි ගමන ද ඒ අතර දෙසූ ධර්ම ද දක්වෙත්.

4. මහා සුදර්ශන සූත්‍රයෙහි –

බුදුරජුන් කුසිනාරා නුවර උපවත්තන සල්වෙනෙහි යමා සල් රුක් අතර පැනැවුණු යහනෙහි වැඩහිඳ කුසිනාරාපුරයේ ඉතා පෙර මහාසුදර්ශන නම් සක්විති රජ සමයෙහි පැවැති ශ්‍රී විභූතිය ද පසු කලැ ඒ සියල්ල පිරිහී ගිය සැටි ද වදාරා ලොව සියල්ලෙහි අනිත්‍යතාව ද ශ්‍රාවකයන් ආත්ම ද්වීප ව විසිය යුතු බව ද වදාළ නියා දක්වේ.

5. ජනවසභ සූත්‍රයෙහි –

කලුරිය කළ ඇතැම් ශ්‍රාවකයන්ගේ පරලෝගතිය බුදුරජුන් පැවැසීම ද, කලුරිය කළ බිම්සර රජ ජනවසභ නම් සිවුමහරජයෙහි දෙවියකු ව ඉපි ද සිට බුදුරජුන් දක්නට අවුත් දෙවලෙ වැ දෙවියන් තුනුරුවන් කෙරෙහි ඇති භක්තිය ද, සනත් කුමාර බඹහු බුදුරජුන් ගෙන් අසා දැන ගත් සප්ත සමාධි පරිෂ්කාර ධර්ම දෙවියනට පැවැසූ අයුරු ද දක්වෙත්.

Free Distribution www.aathaapi.org

6. **මහාගොවින්ද සූත්‍රයෙහි —**

පන්සිළු දෙවිපුත් අවුත් තවතිසාහි දේවසභාවක පැවැති කථාවක් පැවැසීම දැක්වේ. මෙහි සක්දෙව්දු බුදුගුණ අටක් පැවැසීම, සනත්කුමාර බඹහු බුදුරජුන් බොහෝ පෙර ජෝතිපාල නම් මාණවක ව ඉපිද මහාගොවින්ද නමින් ප්‍රසිද්ධ ව රජුන් සඳෙනකුට ගුරු තන්හි සිට අනුශාසනා කොට ඔවුනට සුගති ගමනට මග පෙන්වූ සැටි පැවැසීම, ඔහුගේ කථාව ඇසූ බුදුරජුන් පන්සිළුහට මහාගොවින්දානුශාසනය නෛයර්‍යාණික නොවන බව ද මේ අටඅඟ ම දුක්නසන මහ බව පැවැසීම යන මෙතෙක් දෑ දැක්වේ.

7. **මහාසමය සූත්‍රයෙහි —**

කිඹුල්වත් නුවර අසල මහවෙනෙහි වැඩහුන් බුදුරජුන් හා මහා සංඝයා දක්නට රැස්වූ දෙවබඹුන් මුළුව ගැන සඳහන් වේ. ඔවුන් ගේ නම් වැල ද දැක්වේ.

8. **සක්කපඤ්හ සූත්‍රයෙහි —**

පන්සිළුහු බුදුරජුන් ඉදිරියෙහි ගී ගැයීම හා වැයීම, සක්දෙව් පැමිණ ප්‍රශ්න විචාරීම, සක්දෙව් සෝවාන් වීම දැක්වේ.

9. **මහාසතිපට්ඨාන සූත්‍රයෙහි —**

සතර සතිපට්ඨාන භාවනා විස්තර වේ.

10. **පායාසිරාජඤ්ඤ සූත්‍රයෙහි —**

කුමරකසුප් මහතෙරුන් ද පායාසිරාජඤ්ඤයා ද අතර පරලොවක් ඇතිනැතිබව පිළිබඳ ව පැවැති ධර්ම සංවාදය දැක්වේ.

මෙසේ දීඝනිකායයේ මේ මහාවර්ගය සූත්‍ර දහයෙකින් පරිමිතය.

මෙය සකස් කිරීමෙහි දී මෙම ත්‍රිපිටක ග්‍රන්ථපරිවර්තක මණ්ඩලයෙහි සභාපතිවූ පණ්ඩිත කෝදාගොඩ ඤාණාලෝක ප්‍රධානසංඝනායක ස්ථවිරයන් වහන්සේගේ ද සම්පාදක වූ පණ්ඩිත ලබුගම ලංකානන්ද නායක ස්ථවිරයන් වහන්සේගේ ද ශොධ්‍යපත්‍ර බැලීම හා ග්‍රන්ථ සූචිය සකස් කිරීමෙහි ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලයේ සෙසු මහතෙරවරුන් කිහිප නම ගේ ද සහයෝගය ලද බව ස්තුතිපෙරටුව සඳහන් කරමිහ.

මෙයට,

බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය ස්ථවිර.

මහරගම
වටයවත්ත පාර,
ශ්‍රී චන්ද්‍රඝේඛරාරාමය.
1976.11.04.

Free Distribution www.aathaapi.org

සංකෙත නිරූපණය

සී. සිංහල පුස්කොළ පිටපත

සිමු. සිංහල මුද්‍රිත දීඝනිකාය

මජඝං. බුරුම ඡට්ඨසංගීති–සොධිත දීඝනිකාය

ස්‍යාම. ස්‍යාම තාය් අක්ෂර මුද්‍රිත දීඝනිකාය

කෑ. කාම්බොජ අක්ෂර මුද්‍රිත පොත.

PTS. Text Society Edition.

Free Distribution www.aathaapi.org

THE PALI ALPHABET

IN SINHALA CHARACTERS

VOWELS

අ ආ ඉ ඊ උ ඌ එ ඔ

CONSONANTS

කka	ඛkha	ගga	ඝgha	ඞña
චca	ඡcha	ජja	ඣjha	ඤña
ටṭa	ඨṭha	ඩḍa	ඪḍha	ණṇa
තta	ථtha	දda	ධdha	නna
පpa	ඵpha	බba	භbha	මma

යya රra ලla වva සsa හha ළḷa ංṃ

කka	කාkā	කිki	කීkī	කුku	කූkū	කෙke	කොko
ඛkha	ඛාkhā	ඛිkhi	ඛීkhī	ඛුkhu	ඛූkhū	ඛෙkhe	ඛොkho
ගga	ගාgā	ගිgi	ගීgī	ගුgu	ගූgū	ගෙge	ගොgo

CONJUCT - CONSONANTS

ක්කkka	ඤ්ඤña	ත්tra	ම්pha
ක්ඛkkha	ණ්හṇha	ද්dda	ම්බ ,mba
ක්‍යkya	ඤ්චña	ද්ධddha	ම්භmbha
ක්‍රkra	ඤ්ඡ, ñcha	ද්රdra	ම්මmma
ක්වkva	ඤ්ජ්, ñja	ද්ව, dvva	ම්භmbha
ක්‍ෂkhya	ඤ්ඣñjha	ධ්වdhva	ය්‍ය, yyya
ඛ්වkhva	ට්ට්ṭṭa	න්තnta	ඥyha
ග්ගgga	ඨ්ඨ, ṭṭha	න්thna	ල්ලlla
ඝ්ඝggha	ඩ්ඩdda	න්දnda	ල්‍යlya
ඞ්කṅka	ඪ්ඪddha	න්ධndha	ල්හlha
ග්‍රgrā	ණ්ණṇṇa	න්නnna	ව්හwha
ඛ්ඛkkha	ණ්ටṇṭa	න්හnha	ස්සssa
ඟ්ගṅga	ණ්ඨṇṭha	ප්පppa	ස්මsma
ඟ්ඝṅgha	ණ්ඩ, ṇda	ප්ප්phpha	ස්වsva
ච්චcca	ත්තtta	බ්බbba	හ්මhma
ච්ඡccha	ත්ථttha	භ්භbbha	හ්වhva
ජ්ජjja	ත්වtva	ඹ්බra	ළ්හḷha
ජ්ඣjjha		ම්පmpa	

ාā ිi ීī ුu ූū ෙe ොo

Free Distribution www.aathaapi.org

විෂය සූචිය

1.	මහාපදාන සූත්‍රය	2 – 79
2.	මහානිදාන සූත්‍රය	80 – 109
3.	මහාපරිනිබ්බාන සූත්‍රය	110 – 265
4.	මහාසුදස්සන සූත්‍රය	266 – 305
5.	ජනවසභ සූත්‍රය	306 – 333
6.	මහාගොවින්ද සූත්‍රය	334 – 381
7.	මහාසමය සූත්‍රය	382 – 395
8.	සක්කපඤ්හ සූත්‍රය	396 – 435
9.	මහා සතිපට්ඨාන සූත්‍රය	436 – 503
10.	පායාසිරාජඤ්ඤ සූත්‍රය...	504 – 565

Free Distribution www.aathaapi.org

සුත්තන්තපිටකෙ

දීඝනිකායො

(දුතියො භාගො)

මහාවග්ගො

Free Distribution www.aathaapi.org

සුත්තන්තපිටකෙ

දීඝනිකායො

(දුතියො භාගො)

මහාවග්ගො

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස

1.

මහාපදානසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ කරෙරිකුටිකායං. අථ ඛො සම්බහුලානං භික්ඛුනං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං කරෙරිමණ්ඩලමාළෙ සන්නිසින්නානං සන්නිපතිතානං පුබ්බෙනිවාසපටිසංයුත්තා ධම්මී කථා උදපාදි: 'ඉතිපි පුබ්බෙ නිවාසො, ඉතිපි[1] පුබ්බෙ නිවාසො'ති.

2. අසෙසාසි ඛො භගවා දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය[2] තෙසං භික්ඛුනං ඉමං කථාසල්ලාපං. අථ ඛො භගවා උට්ඨායාසනා යෙන කරෙරිමණ්ඩලමාළො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "කායනුත්ථ භික්ඛවෙ එතරහි කථාය සන්නිසින්නා? කා ච පන වො අන්තරාකථා විප්පකතා?"ති.

3. එවං වුත්තෙ තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "ඉධ භන්තෙ අම්හාකං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං කරෙරිමණ්ඩලමාළෙ සන්නිසින්නානං සන්නිපතිතානං පුබ්බෙනිවාසපටිසංයුත්තා ධම්මී කථා උදපාදි: 'ඉතිපි පුබ්බෙනිවාසො, ඉතිපි පුබ්බෙනිවාසො'ති. අයං ඛො නො භන්තෙ අන්තරා කථා විප්පකතා. අථ භගවා අනුප්පත්තො"ති.

---

1. ඉති PTS
2. මානුසකාය-සීහ

Free Distribution www.aathaapi.org

සූත්‍රාන්තපිටකයෙහි

දීඝනිකාය

(දෙවනිය භාගය)

මහාවග්ගය

ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා

1.

මහාපදාන සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** නිසා **ජේතවන** නම් වූ අනේපිඬුසිටුතුමාගේ අරමහි **කරෙරි-කුටිකායෙහි** (ලුණුවරණ රුක අසල කරන ලද කිළියෙහි) වැඩ වසන සේක. ඒ කල්හි පිණ්ඩපාතයෙන් පෙරළා පැමිණ (බත්කිස කොට නැවී සිට) කරෙරිමණ්ඩලමාළයෙහි (යටකී කරෙරිමණ්ඩපය අසලැ හිමිදන ශාලායෙහි) එක් වැ හුන් එක්රැස් වූ බොහෝ භික්ෂූන් අතර 'පෙර වුසු කඳපිළිවෙළ මෙසේත් වේ. පෙර වුසු කද පිළිවෙළ මෙසේත් වේ' යැ යි පූර්වනිවාසප්‍රතිසංයුක්ත වූ දැහැමි කතාවෙක් පහළ විය.

2. භාග්‍යවතුන් වහන්සේ මිනිසුන්ගේ ඇසුම්ඉම ඉක්මැ අසනුවට සමත් වූ පිරිසිදු දිවකනින් ඒ මහණුන්ගේ මේ කථාසංලාපය අසා වදළ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හුනස්නෙන් නැගි කරෙරිමණ්ඩලමාළය කරා එළැඹී සේක. එළැඹ පනවා තුබුණු අස්නෙහි වැඩහුන් සේක. වැඩහිඳ ම භාග්‍යවතුන් වහන්සේ මහණුන් බණවා, 'මහණෙනි, දැන් තෙපි කවර නම් කතාවෙකින් මෙහි හුන්නහු ද? තොපගේ කවර නම් අතුරු කතාවෙක් අඩාළ වී ද?' යි අසා වදළ සේක.

3. මෙසේ වදළ කල්හි මහණහු භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, පසුබත්හි පිණ්ඩපාතයෙන් පෙරළා ආ, මෙහි කරෙරිමණ්ඩලමාළයෙහි එක්වැහුන් එක් රැස් වූ අප අතර 'පූර්වනිවාසය මෙසේත් වේ, පූර්වනිවාසය මෙසේත් වේ' යැ යි පූර්වනිවාසප්‍රතිසංයුක්ත දැහැමි කතාවෙක් උපන. වහන්ස, අපගේ මේ අතුරු කතාව අඩාළ විය. එකලැ භාග්‍යවතුන් වහන්සේ වැඩි සේකැ"යි මෙම බස් පැවැසූහ.

Free Distribution www.aathaapi.org

4. "ඉච්ඡෙය්‍යාථ නො තුමෙහ භික්ඛවෙ පුබ්බෙනිවාසපටිසංයුත්තං ධම්මිං කථං සොතු"න්ති.

"එතස්ස භගවා කාලො, එතස්ස සුගත කාලො, යං භගවා පුබ්බෙනිවාසපටිසංයුත්තං ධම්මිං කථං කරෙය්‍ය. භගවතො සුත්වා භික්ඛු ධාරෙස්සන්ති"ති. "තෙන හි භික්ඛවෙ සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමී"ති. "එවම්භන්තෙ"ති ඛො තෙ භික්ඛු භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච:

5. ඉතො සො භික්ඛවෙ එකනවුතොකප්පෙ[1] යං විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උදපාදි. ඉතො සො භික්ඛවෙ එකතිංසොකප්පෙ[2] යං සිඛී භගවා අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උදපාදි. තස්මිඤ්ඤෙව ඛො භික්ඛවෙ එකතිංසෙ කප්පෙ වෙස්සභූ භගවා අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උදපාදි. ඉමස්මිඤ්ඤෙව ඛො භික්ඛවෙ භද්දකප්පෙ කකුසන්ධො භගවා අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උදපාදි. ඉමස්මිඤ්ඤෙව ඛො භික්ඛවෙ භද්දකප්පෙ කොණාගමනො භගවා අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උදපාදි. ඉමස්මිඤ්ඤෙව ඛො භික්ඛවෙ භද්දකප්පෙ කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උදපාදි. ඉමස්මිඤ්ඤෙව ඛො භික්ඛවෙ භද්දකප්පෙ අහං එතරහි අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උප්පන්නොහා.

6. විපස්සී භික්ඛවෙ භගවා අරහං සම්මාසම්බුද්ධො ඛත්තියො ජාතියා අහොසි, ඛත්තියකුලෙ උදපාදි. සිඛී භික්ඛවෙ භගවා අරහං සම්මාසම්බුද්ධො ඛත්තියො ජාතියා අහොසි, ඛත්තියකුලෙ උදපාදි. වෙස්සභූ භික්ඛවෙ භගවා අරහං සම්මාසම්බුද්ධො ඛත්තියො ජාතියා අහොසි, ඛත්තියකුලෙ උදපාදි. කකුසන්ධො භික්ඛවෙ භගවා අරහං සම්මාසම්බුද්ධො බ්‍රාහ්මණො ජාතියා අහොසි, බ්‍රාහ්මණකුලෙ උදපාදි. කොණාගමනො භික්ඛවෙ භගවා අරහං සම්මාසම්බුද්ධො බ්‍රාහ්මණො ජාතියා අහොසි, බ්‍රාහ්මණකුලෙ උදපාදි. කස්සපො භික්ඛවෙ භගවා අරහං සම්මාසම්බුද්ධො බ්‍රාහ්මණො ජාතියා අහොසි, බ්‍රාහ්මණකුලෙ උදපාදි. අහං භික්ඛවෙ එතරහි අරහං සම්මාසම්බුද්ධො ඛත්තියො ජාතියා අහොසිං, ඛත්තියකුලෙ උප්පන්නොහා.

7. විපස්සී භික්ඛවෙ භගවා අරහං සම්මාසම්බුද්ධො කොණ්ඩඤ්ඤ, ගොත්තෙන අහොසි. සිඛී භික්ඛවෙ භගවා අරහං සම්මාසම්බුද්ධො කොණ්ඩඤ්ඤ, ගොත්තෙන අහොසි. වෙස්සභූ භික්ඛවෙ භගවා අරහං සම්මාසම්බුද්ධො කොණ්ඩඤ්ඤ, ගොත්තෙන අහොසි. කකුසන්ධො භික්ඛවෙ භගවා අරහං සම්මාසම්බුද්ධො කස්සපො ගොත්තෙන අහොසි.

1. එකනවුතිකප්පෙ – ම ජ සං,
2. එකතිංසෙ කප්පෙ – ම ජ සං,

Free Distribution www.aathaapi.org

4. ''මහණෙනි, තෙපි පෙර වුසූ කඳපිළිවෙළ පිළිබඳ වූ දහම්කතාවක් අසන්නට කැමැත්තහු ද?''යි භාග්‍යවතුන් වහන්සේ පුළුවුත් සේක.

''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පෙර වුසූ කඳපිළිවෙළ පිළිබඳ වූ දැහැමි කතාවක් කරන සේක යන යමෙක් ඇද්ද, භාග්‍යවතුන් වහන්ස, එයට මේ කාලය ය. සුගතයන් වහන්ස, එයට මේ කාලය ය. භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසා මහණහු සිත්හි ලා දරත්නාහ''යි භික්ෂූහු කීහ. ''මහණෙනි, එසේ වී නම්, අසවු. මොනොවට මෙනෙහි කරවු; කියන්-නෙමි'' යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක ''එසේ යැ වහන්ස'' යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මේ (මතු දක්වෙන) ධර්මකථාව වදළ සේක.

5. මහණෙනි, යම් කලෙක අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ විපස්සී භගවත්හු ලොවැ පහළ වූහු නම්, ඒ මෙයින් පෙර එක්අනූවන කප ය. මහණෙනි, යම් කලෙක අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ සිඛී භගවත්හු ලොවැ පහළ වූහු නම්, ඒ මෙයින් යටැ එක්තිස්වන කප ය. මහණෙනි, ඒ එක් තිස්වන කපෙහි ම අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ වෙස්සභූ භගවත්හු ලොවැ පහළ වූහ. මහණෙනි, මේ බදුරුකප්හි ම අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කකුසන්ධ භගවත්හු ලොවැ පහළ වූහ. මහණෙනි, මෙ බදුරුකප්හි ම අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කොණාගමන භගවත්හු ලොවැ පහළ වූන. මහණෙනි, මෙ බදුරුකප්හි ම අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කාශ්‍යප භගවත්හු ලොවැ පහළ වූහ. මහණෙනි, මෙ බදුරුකප්හි ම අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ මම් මෙ සමයෙහි ලොවැ පහළ වීමි.

6. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ විපස්සී භගවත්හු ජාතියෙන් ක්ෂත්‍රිය වූහ, කැත්කුලෙහි උපන්හ. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ සිඛී භගවත්හු ජාතියෙන් ක්ෂත්‍රිය වූහ, කැත්කුලෙහි උපන්හ. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ වෙස්සභූ භගවත්හු ජාතියෙන් ක්ෂත්‍රිය වූහ, කැත්කුලෙහි උපන්හ. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කකුසන්ධ භගවත්හු ජාතියෙන් බ්‍රාහ්මණ වූහ, බමුණුකුලයෙහි උපන්හ. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කොණාගමන භගවත්හු ජාතියෙන් බ්‍රාහ්මණ වූහ, බමුණුකුලෙහි උපන්හ. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කාශ්‍යප භගවත්හු ජාතියෙන් බ්‍රාහ්මණ වූහ, බමුණුකුලෙහි උපන්හ. මහණෙනි, මෙ කලැ අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ මම් ජාතියෙන් ක්ෂත්‍රිය වීමි, කැත්කුලෙහි උපන්මි.

7. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ විපස්සී භගවත්හු ගොත්‍ර-යෙන් කෞණ්ඩිණ්‍ය වූහ. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ සිඛී භගවත්හු ගොත්‍රයෙන් කෞණ්ඩිණ්‍ය වූහ. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ වෙස්සභූ භගවත්හු ගොත්‍රයෙන් කෞණ්ඩිණ්‍ය වූහ. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කකුසන්ධ භගවත්හු ගොත්‍රයෙන් කාශ්‍යප වූහ.

Free Distribution www.aathaapi.org

කොණාගමනො භික්ඛවෙ, භගවා අරහං සම්මාසම්බුද්ධො කස්සපො ගොත්තෙන අහොසි. කස්සපො භික්ඛවෙ, භගවා අරහං සම්මාසම්බුද්ධො කස්සපො ගොත්තෙන අහොසි. අහං භික්ඛවෙ, එතරහි අරහං සම්මා-සම්බුද්ධො ගොතමො ගොත්තෙන[1].

8. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අසීති[2] වස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. සිඛිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස සත්තතිවස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. වෙස්සභුස්ස භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සට්ඨිවස්ස-සහස්සානි ආයුප්පමාණං අහොසි. කකුසන්ධස්ස භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස චත්තාලීස[3]වස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. කොණාගමනස්ස භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස තිංසවස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. කස්සපස්ස භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස වීසති[4]වස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. මය්හං භික්ඛවෙ, එතරහි අප්පකං ආයුප්පමාණං පරිත්තං ලහුකං යො චිරං ජීවති සො වස්සසතං අප්පං වා භියොා.

9. විපස්සී භික්ඛවෙ, භගවා අරහං සම්මාසම්බුද්ධො පාටලියා මූලෙ අභිසම්බුද්ධො. සිඛී භික්ඛවෙ, භගවා අරහං සම්මාසම්බුද්ධො පුණ්ඩරීකස්ස මූලෙ අභිසම්බුද්ධො. වෙස්සභූ භික්ඛවෙ, භගවා අරහං සම්මාසම්බුද්ධො සාලස්ස මූලෙ අභිසම්බුද්ධො. කකුසන්ධො භික්ඛවෙ, භගවා අරහං සම්මා-සම්බුද්ධො සිරීසස්ස මූලෙ අභිසම්බුද්ධො. කොණාගමනො භික්ඛවෙ, භගවා අරහං සම්මාසම්බුද්ධො උදුම්බරස්ස මූලෙ අභිසම්බුද්ධො. කස්සපො භික්ඛවෙ, භගවා අරහං සම්මාසම්බුද්ධො නිග්‍රොධස්ස මූලෙ අභිසම්බුද්ධො. අහං භික්ඛවෙ, එතරහි අරහං සම්මාසම්බුද්ධො අස්සත්ථස්ස මූලෙ අභිසම්බුද්ධො.

10. විපස්සිස්ස භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ඛණ්ඩ තිස්සං නාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. සිඛිස්ස භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අභිභූසම්භවං නාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. වෙස්සභුස්ස භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සොණුත්තරං නාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. කකුසන්ධස්ස භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස විධුරසඤ්ජීවං නාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. කොණාගමනස්ස භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස භියොාසුත්තරං නාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. කස්සපස්ස භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස තිස්සභාරද්වාජං නාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. මය්හං භික්ඛවෙ, එතරහි අරහතො සම්මාසම්බුද්ධස්ස සාරිපුත්තමොගගලලානං නාම සාවක-යුගං හොති අග්ගං භද්දයුගං.

---

1. ගොතමො ගොත්තෙන අහොසිං සී මු ස්‍යා
2. අසීතිං, PTS. 3. චත්තාලිසං ම ජ සං, PTS. 4. වීසතිං PTS.

Free Distribution www.aathaapi.org

මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කොණාගමන භගවත්හු ගොත්‍රයෙන් කාශ්‍යප වූහ. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කාශ්‍යප භගවත්හු ගොත්‍රයෙන් කාශ්‍යප වූහ. මහණෙනි, මෙ සමයෙහි අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ මම ගොත්‍රයෙන් ගෞතම වෙමි.

8. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ විපස්සී භාග්‍යවතුන්ගේ ආයුෂ්ප්‍රමාණය හවුරුදු අසූදහසෙක් විය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ සිඛී භාග්‍යවතුන්ගේ ආයුෂ්ප්‍රමාණය හවුරුදු සැත්තෑදහසෙක්විය. මහණෙනි,අර්හත්සම්‍යක්සම්බුද්ධවූ වෙස්සභූ භාග්‍යවතුන්ගේ ආයුෂ්ප්‍රමාණය හවුරුදු සැටදහසෙක් විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ කකුසන්ධ භාග්‍යවතුන්ගේ ආයුෂ්ප්‍රමාණය හවුරුදු සතළිස් දහසෙක් විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කොණාගමන භාග්‍යවතුන්ගේ ආයුෂ්ප්‍රමාණය හවුරුදු තිස්දහසෙක් විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කාශ්‍යප භාග්‍යවතුන්ගේ ආයුෂ්ප්‍රමාණය හවුරුදු විසිදහසෙක් විය. මහණෙනි, මෙ කලෑ මාගේ ආයුෂ්ප්‍රමාණය අල්ප ය, ස්වල්පය, ලඝු ය. යමෙක් (මෙ සමයෙහි) බොහෝ කල් ජීවත් වන්නේ නම් හෙ තෙම හවුරුදු සියක් හෝ ස්වල්පයක් වැඩියෙන් හෝ ජීවත් වන්නේ ය.

9. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ විපස්සී භාග්‍යවත්හු පළොල් රුකක් මුලැ සත්‍යාවබොධය කළහ. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ සිඛී භාග්‍යවත්හු හෙළඹරුකක්මුලැ සත්‍යාවබොධය කළහ. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ වෙස්සභූ භාග්‍යවත්හු සල්රුකක්මුලැ සත්‍යාව බොධය කළහ. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කකුසන්ධ භාග්‍ය-වත්හු මහරි රුකක්මුලැ සත්‍යාවබොධය කළහ. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කොණාගමන භාග්‍යවත්හු දිඹුල්රුකක් මුලැ සත්‍යාව-බොධය කළහ. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කාශ්‍යප භාග්‍යවත්හු නුගරුකක් මුලැ සත්‍යාවබොධය කළහ. මහණෙනි, මෙ කලෑ අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ මම ඇසතු රුකක් මුලැ සත්‍යාවබොධය කෙළෙමි.

10. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ විපස්සී භාග්‍යවතුන්හට **ඛණ්ඩය තිස්ස** යැ යි හඳුයුගල වූ අක්සවුයුවලෙක් විය. මහණෙනි, අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ සිඛී භාග්‍යවතුන්හට **අභිභූ** ය **සම්භව** යැ යි හඳුයුගල වූ අක්සවුයුවලෙක් විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ වෙස්සභූ භාග්‍යවතුන්හට **සොණ ය උත්තර** යැ යි හඳුයුගල වූ අක්සවු-යුවලෙක් විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කකුසන්ධ භාග්‍ය-වතුන්හට **විධුර ය සඤ්ජීව** යැ යි හඳුයුගල වූ අක්සවුයුවලෙක් විය. මහ-ණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කොණාගමන භාග්‍යවතුන්හට **භියෝසභ ය උත්තර** යැ යි හඳුයුගල වූ අක්සවුයුවලෙක් විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කාශ්‍යප භාග්‍යවතුන්හට **තිස්ස ය භාරද්වාජ** යැ යි හඳු-යුගල වූ අක්සවුයුවලෙක් විය. මහණෙනි, මෙ කලෑ අර්හත් සම්‍යක් සම්-බුද්ධ වූ මහට හඳුයුගල වූ **සැරියුත් ය මුගලන්** යැ යි අක්සවුයුවලෙක් වෙයි.

Free Distribution www.aathaapi.org

11. විපස්සිස්ස භිකඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස තයො සාවකානං සන්නිපාතා අහෙසුං. එකො සාවකානං සන්නිපාතො අහොසි අට්ඨසට්ඨිභික්ඛුසතසහස්සං. එකො සාවකානං සන්නිපාතො අහොසි භික්ඛු-සතසහස්සං. එකො සාවකානං සන්නිපාතො අහොසි අසීතිභික්ඛුසහස්සානි. විපස්සිස්ස භිකඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ඉමෙ තයො සාවකානං සන්නිපාතා අහෙසුං සඛෙඛසං යෙව ඛීණාසවානං. සිඛිස්ස භිකඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස තයො සාවකානං සන්නිපාතා අහෙසුං: එකො සාවකානං සන්නිපාතො අහොසි භික්ඛු-සතසහස්සං. එකො සාවකානං සන්නිපාතො අහොසි අසීති භික්ඛුසහස්සානි. එකො සාවකානං සන්නිපාතො අහොසි සත්තති භික්ඛුසහස්සානි. සිඛිස්ස භිකඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ඉමෙ තයො සාවකානං සන්නිපාතා අහෙසුං සඛෙඛසං යෙව ඛීණාසවානං. වෙස්සභුස්ස භිකඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස තයො සාවකානං සන්නිපාතා අහෙසුං: එකො සාවකානං සන්නිපාතො අහොසි අසීති භික්ඛුසහස්සානි. එකො සාවකානං සන්නිපාතො අහොසි සත්තති භික්ඛුසහස්සානි. එකො සාවකානං සන්නිපාතො අහොසි සට්ඨි භික්ඛුසහස්සානි. වෙස්සභුස්ස භිකඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ඉමෙ තයො සාවකානං සන්නිපාතා අහෙසුං සඛෙඛසං යෙව ඛීණාසවානං. කකුසන්ධස්ස භිකඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස එකො සාවකානං සන්නිපාතො අහොසි චත්තාළීස භික්ඛුසහස්සානි. කකුසන්ධස්ස භිකඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අයං එකො සාවකානං සන්නිපාතො අහොසි සඛෙඛසං යෙව ඛීණාසවානං. කොණාගමනස්ස භිකඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස එකො සාවකානං සන්නිපාතො අහොසි තිංස-භික්ඛුසහස්සානි කොණාගමනස්ස භිකඛවෙ, භගවතො අරහතො සම්මා-සම්බුද්ධස්ස අයං එකො සාවකානං සන්නිපාතො අහොසි සඛෙඛසං යෙව ඛීණාසවානං කස්සපස්ස භිකඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස එකො සාවකානං සන්නිපාතො අහොසි විසති භික්ඛුසහස්සානි. කස්සපස්ස භිකඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අයං එකො සාවකානං සන්නිපාතො අහොසි සඛෙඛසං යෙව ඛීණාසවානං. මයං භිකඛවෙ, එතරහි අරහතො සම්මාසම්බුද්ධස්ස එකො සාවකානං සන්නිපාතො අහොසි අඩ්ඪතෙළසානි භික්ඛුසතානි. මයං භිකඛවෙ අයං එකො සාවකානං සන්නිපාතො අහොසි සඛෙඛසං යෙව ඛීණාසවානං.

12. විපස්සිස්ස භිකඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අසොකො නාම භික්ඛු උපට්ඨාකො අහොසි අග්ගුපට්ඨාකො. සිඛිස්ස භිකඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ඛෙමඞ්කරො නාම භික්ඛු උපට්ඨාකො අහොසි අග්ගුපට්ඨාකො වෙස්සභුස්ස භිකඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස උපසන්තො නාම භික්ඛු උපට්ඨාකො අහොසි අග්ගුපට්ඨාකො. කකුසන්ධස්ස භිකඛවෙ, භගවතො අරහතො සම්මා-සම්බුද්ධස්ස බුද්ධිජො නාම භික්ඛු උපට්ඨාකො අහොසි අග්ගුපට්ඨාකො.

Free Distribution www.aathaapi.org

11. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ විපස්සී භාග්‍යවතුන් ගේ ශ්‍රාවක සන්නිපාත තුනෙක් විය: එක් ශ්‍රාවකසන්නිපාතයෙක් මහණුන් එක් **ලක්ෂ** අටසැටදහසෙක් විය. එක් ශ්‍රාවකසන්නිපාතයෙක් මහණුන් ලක්ෂයෙක් විය. එක් ශ්‍රාවකසන්නිපාතයෙක් මහණුන් අසූදහසෙක් විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ විපස්සි භාග්‍යවතුන්ගේ හැම දෙනා ම රහතුන් වූ සවිවන් පිළිබඳ මේ සන්නිපාතයෝ තිදෙනෙක් වූහ. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ සිඛී භාග්‍යවතුන්ගේ ශ්‍රාවකසන්නිපාත තුනෙක් විය: එකෙක් මහණුන් **ලක්ෂයක්** වූ ශ්‍රාවකසන්නිපාතයෙක් විය. එකෙක් මහණුන් අසූදහසක් වූ ශ්‍රාවකසන්නිපාතයෙක් විය. එකෙක් මහණුන් සැත්තෑදහසක් වූ ශ්‍රාවකසන්නිපාතයෙක් විය. අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ සිඛී භාග්‍යවතුන්හට හැම දෙනා ම රහතුන් වූ සවිවන් පිළිබඳ මේ තුන් සන්නිපාත කෙනෙක් වූහ. මහණෙනි, අර්හත් සම්‍යක්-සම්බුද්ධ වූ වෙස්සභූ භාග්‍යවතුන්හට තුන් ශ්‍රාවකසන්නිපාත කෙනෙක් වූහ: එකෙක් මහණුන් අසූදහසක් වූ ශ්‍රාවකසන්නිපාතයෙක් විය. එකෙක් භික්ෂූන් සැත්තෑ දහසක් වූ ශ්‍රාවකසන්නිපාතයෙක් විය. එකෙක් මහණුන් සැටදහසක් වූ ශ්‍රාවකසන්නිපාතයෙක් විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ වෙස්සභූ භාග්‍යවතුන්ගේ සියල්ලන් ම රහතුන් වූ සවිවන් සම්බන්ධ මේ තුන් සන්නිපාත කෙනෙක් වූහ. මහණෙනි, අර්හත් සම්‍යක්-සම්බුද්ධ වූ කකුසන්ධ භාග්‍යවතුන්ගේ මහණුන් සතළිස්දහසක් වූ එක් ශ්‍රාවකසන්නිපාතයෙක් විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කකුසන්ධ භාග්‍යවතුන්ගේ හැම දෙනා ම රහතුන් වූ සවිවන් සම්බන්ධ මේ එක් සන්නිපාතයෙක් විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කොනා-ගමන භාග්‍යවතුන්ගේ මහණුන් තිස්දහසක් වූ එක් ශ්‍රාවකසන්නිපාතයෙක් විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කොණාගමන භාග්‍යවතුන්හට හැම දෙනා ම රහතුන් වූ සවිවන්ගේ මේ එක් සන්නිපාතයෙක් විය. මහ-ණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කාශ්‍යප භාග්‍යවතුන්හට මහණුන් විසි දහසක් වූ එක් ශ්‍රාවකසන්නිපාතයෙක් විය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ කාශ්‍යප භාග්‍යවතුන්හට හැම දෙනා ම රහතුන් වූ සවිවන්ගේ මේ එක් සන්නිපාතයෙක් විය. මහණෙනි, මෙ සමයෙහි අර්හත් සම්‍යක්-සම්බුද්ධ වූ මා හට මහණුන් එක්දහස් දෙසිය පණසක් වූ එක් ශ්‍රාවකසන්නි-පාතයෙක් විය. මහණෙනි, මාහට හැම දෙනා ම රහතුන් වූ සවිවන් සම්බන්ධ මෙ එක් සන්නිපාතයෙක් විය.

12. මහණෙනි, අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ විපස්සි භාග්‍යවත්නට **අශෝක** නම් මහණෙක් උපස්ථායක, අග්‍රෝපස්ථායක විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ සිඛී භාග්‍යවත්නට **බෙමඩ්කර** නම් මහණෙක් උපස්ථායක, අග්‍රෝපස්ථායක විය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ වෙස්සභූ භාග්‍යවත්නට **උපශාන්ත** නම් මහණෙක් උපස්ථායක, අග්‍රෝපස්ථායක විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කකුසන්ධ නම් භාග්‍යවත්නට **බුද්ධිජ** නම් මහණෙක් උපස්ථායක, අග්‍රෝපස්ථායක විය.

Free Distribution www.aathaapi.org

කොණාගමනස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සොත්ථිජො නාම භික්ඛු උපට්ඨාකො අහොසි අගගුපට්ඨාකො. කස්සපස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සබ්බමිත්තො නාම භික්ඛු උපට්ඨාකො අහොසි අගගුපට්ඨාකො. මය්හං භික්ඛවෙ එතරහි අරහතො සම්මාසම්බුද්ධස්ස ආනන්දො භික්ඛු උපට්ඨාකො හොති අගගුපට්ඨාකො.[1]

13. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස බන්ධුමා නාම රාජා පිතා අහොසි. බන්ධුමතී නාම දෙවී මාතා අහොසි ජනෙත්ති.[2] බන්ධුමස්ස රඤ්ඤො බන්ධුමතී නාම නගරං රාජධානි අහොසි. සිඛිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අරුණො නාම රාජා පිතා අහොසි. පභාවතී නාම දෙවී මාතා අහොසි ජනෙත්ති. අරුණස්ස රඤ්ඤො අරුණවතී නාම නගරං රාජධානි අහොසි. වෙස්සභුස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සුප්පතීතො[3] නාම රාජා පිතා අහොසි. යසවතී නාම දෙවී මාතා අහොසි ජනෙත්ති. සුප්පතීතස්ස රඤ්ඤො අනොමං නාම නගරං රාජධානි අහොසි. කකුසන්ධස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අග්ගිදත්තො නාම බ්‍රාහ්මණො පිතා අහොසි. විසාඛා නාම බ්‍රාහ්මණී මාතා අහොසිජනෙත්ති. තෙන ඛො පන භික්ඛවෙ සමයෙන ඛෙමො නාම රාජා අහොසි. ඛෙමස්ස රඤ්ඤො ඛෙමවතී නාම නගරං රාජධානි අහොසි. කොණාගමනස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස යඤ්ඤදත්තො නාම බ්‍රාහ්මණො පිතා අහොසි. උත්තරා නාම බ්‍රාහ්මණී මාතා අහොසි ජනෙත්ති. තෙන ඛො පන භික්ඛවෙ සමයෙන සොභො නාම රාජා අහොසි. සොභස්ස රඤ්ඤො සොභාවතී නාම නගරං රාජධානි අහොසි. කස්සපස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස බ්‍රහ්මදත්තො නාම බ්‍රාහ්මණො පිතා අහොසි. ධනවතී නාම බ්‍රාහ්මණී මාතා අහොසි. ජනෙත්ති. තෙන ඛො පන භික්ඛවෙ සමයෙන කිකී නාම[4] රාජා අහොසි. කිකිස්ස රඤ්ඤො බාරාණසී නාම නගරං රාජධානි අහොසි. මය්හං භික්ඛවෙ එතරහි අරහතො සම්මාසම්බුද්ධස්ස සුදෙධාදනො රාජා පිතා අහොසි, මායාදෙවී මාතා ජනෙත්ති. කපිලවත්ථු නාම නගරං රාජධානී''ති.

ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො උච්ඨායාසනා විහාරං පාවිසි.

14. අථ ඛො තෙසං භික්ඛුනං අචිරපක්කන්තස්ස භගවතො අයමන්තරා කථා උදපාදි: ''අච්ඡරියං ආවුසො තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා, යත්‍ර හි නාම තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවට්ටුමෙ පරියාදින්නවට්ටෙ සබ්බදුක්ඛවීතිවත්තෙ ජාතිතොපි අනුස්සරිස්සති, නාමතොපි අනුස්සරිස්සති,

1. උපට්ඨාකො අහොසි සීමු.
2. ජනෙත්ති – ස්‍යා
3. සුප්පතී කො – ම ජ සං.
4. කිංකී නාම – ස්‍යා.

Free Distribution www.aathaapi.org

මහණෙනි, අර්හත්සම්‍යක්සම්බුද්ධ වූ කොණාගමන භාග්‍යවත්නට **සොත්ථිජ** නම් මහණෙක් උපස්ථායක, අග්‍රොපස්ථායක විය. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ කාශ්‍යප නම් භාග්‍යවත්නට **සර්වමිත්‍ර** නම් මහණෙක් උපස්ථායක, අග්‍රොපස්ථායක විය. මහණෙනි, මෙ සමයෙහි අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ මට **ආනන්ද** නම් මහණ උපස්ථායක, අග්‍රොපස්ථායක වෙයි.

13. මහණෙනි, අර්හත් **සම්‍යක්සම්බුද්ධ** විපස්සී භාග්‍යවත්නට **බන්ධුමත්** නම් රජ පිය වී ය, **බන්ධුමතී** නම් දෙවී විජාත මාතා වූය. බන්ධුමතී නම් නුවර බන්ධුමත් රජුගේ රජදහන් විය. මහණෙනි, අර්හත් **සම්‍යක්**-සම්බුද්ධ වූ සිඛී භාග්‍යවත්නට **අරුණ** නම් රජ පිය වී ය, **ප්‍රභාවතී** නම් දෙවී වැදූ මව වූ ය **අරුණවතී** නම් නුවර අරුණ රජුගේ රජදහන විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වෙස්සභූ භාග්‍යවත්නට **සුප්‍රතීත** නම් රජ පිය වී ය. **යශොවතී** නම් දෙවී වැදූ මවු වූ ය. **අනොම** නම් නුවර **සුප්‍රතීත** රජුහුගේ රදජහත් විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කකුසන්ධ නම් භාග්‍යවත්නට **අග්ගිදත්ත** නම් බමුණු පිය විය, **විශාඛා** නම් බැමිණි වැදූ මවු වූ ය. මහණෙනි, එසමයෙහි **ක්ෂෙම** නම් රජෙක් විය. **ක්ෂෙමවතී** නුවර රජුහුගේ රජදහන විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කොණාගමන නම් භාග්‍යවත්නට **යඤ්ඤදත්ත** නම් බමුණු පිය වී ය, **උත්තරා** නම් බැමිණි වැදූ මවු වූ ය. එසමයෙහි මහණෙනි, **ශොභ** නම් රජෙක් විය. **ශොභාවතී** නම් නුවර ශොභ රජුහුගේ රජදහන් විය. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ කාශ්‍යප භාග්‍යවත්නට බ්‍රහ්මදත්ත නම් බමුණු පිය විය. **ධනවතී** නම් බැමිණි වැදූ මවු වූ ය. මහ ණෙනි, ඒ සමයෙහි **කිකී** නම් රජෙක් විය. **බරණැස්** නම් නුවර **කිකී** රජුහුගේ රජදහන විය. මහණෙනි, මෙ සමයෙහි රහත් වූ සම්මාසම්බුදු වූ මාහට **සුදෙවුන්** රජ පිය වී ය. **මායාදේවී** වැදූ මවු වූ ය. ''**කිඹුල්වත්** නම් නුවර රජදහන් වෙයි.''

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක. මෙය වදරා සුගතයන් වහන්සේ තුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසි සේක.

14. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නික්ම වැඩි නොබෝ වේලායෙහි මේ අතුරු කථාව උපන: ''ඇවැත්නි, යම්බඳු වූ කථාගතයන් වහන්සේ 'ඒ භාග්‍යවත්හු මෙබඳු ජාතියෙහි උපන්නෝ වූහ යි ද, මෙබඳු නම් ඇත්තෝ මෙබඳු ගොත් ඇත්තෝ මෙබඳු සිල් ඇත්තෝ මෙබඳු දහම් ඇත්තෝ මෙබඳු ප්‍රඥා ඇත්තෝ මෙබඳු විහරණ ඇත්තෝ මෙබඳු විමුක්ති ඇත්තෝ වූහ'යි පිරිනිවියා වූ, සිදැලූ තෘෂ්ණාමානදෘෂ්ටිප්‍රපඤ්ච ඇති, සිදැලූ කම්වට ඇති, හැම ලෙයින් ක්ෂීණ කළ කම්වට ඇති, සියලු විපාකවට්ට දුක ඉක්මී ඉකුත් බුදුවරුන් ජාති වියින් සිහි කළ සේක ද, නම් වියින් සිහි කළ සේක්ද,

Free Distribution www.aathaapi.org

ගොත්තතොපි අනුස්සරිස්සති, ආයුප්පමාණතොපි අනුස්සරිස්සති, සාවකයුගතොපි අනුස්සරිස්සති, සාවකසන්නිපාතතොපි අනුස්සරිස්සති: 'එවංජච්චා තෙ භගවන්නො අහෙසුං ඉතිපි, එවංනාමා එවංගොත්තා එවංසීලා එවංධම්මා එවංපඤ්ඤා එවංවිහාරී එවංවිමුත්තා තෙ භගවන්නො අහෙසුං ඉතිපීති. කින්නු ඛො ආවුසො තථාගතස්සෙව නු ඛො එසා ධම්මධාතු සුප්පටිවිද්ධා, යස්සා ධම්මධාතුයා සුප්පටිවිද්ධත්තා තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවටුමෙ පරියාදින්නවට්ටෙ සබ්බදුක්ඛ වීතිවත්තෙ ජාතිතොපි අනුස්සරති, නාමතොපි අනුස්සරති, ගොත්තතොපි අනුස්සරති, ආයුප්පමාණතොපි අනුස්සරති, සාවකයුගතො පි අනුස්සරති, සාවකසන්නිපාතතො පි අනුස්සරති: 'එවං ජච්චා තෙ භගවන්නො අහෙසුං ඉතිපි, එවංනාමා එවංගොත්තා එවංසීලා එවංධම්මා එවංපඤ්ඤා එවංවිහාරී එවංවිමුත්තා තෙ භගවන්නො අහෙසුං ඉතිපීති', උදහු දෙවතා තථාගතස්ස එතමත්ථං ආරොචෙසුං යෙන තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවටුමෙ පරියාදින්නවට්ටෙ සබ්බදුක්ඛවීතිවත්තෙ ජාතිතොපි අනුස්සරති, නාමතොපි අනුස්සරති, ආයුප්පමාණතොපි අනුස්සරති, සාවකයුගතොපි අනුස්සරති, සාවකසන්නිපාතතොපි අනුස්සරති: 'එවංජච්චා තෙ භගවන්නො අහෙසුං ඉතිපි, එවංනාමා එවංගොත්තා එවංසීලා එවංධම්මා එවංපඤ්ඤා එවංවිහාරී එවංවිමුත්තා තෙ භගවන්නො අහෙසුං ඉතිපීති'' අයඤ්ච හිදං තෙසං භික්ඛූනං අන්තරාකථා විප්පකතා හොති.

15. අථ ඛො භගවා සායනහසමයං පතිසල්ලානා වුට්ඨිතො යෙන, කරෙරිමණ්ඩලමාළො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්නෙසි: ''කායනු'ත්ථ භික්ඛවෙ එතරහි කථාය සන්නිසින්නා? කා ච පන වො අන්තරා කථා විප්පකතා?'' ති. එවං වුත්තෙ තෙ භික්ඛු භගවන්තං එතදවොචුං: ''ඉධ භන්තෙ අම්හාකං අවිරපක්කන්තස්ස භගවතො අයමන්තරා කථා උදපාදි:

Free Distribution www.aathaapi.org

ගොත් විසින් සිහි කළ සේක් ද, ආයු පමණ විසින් සිහි කළ සේක්ද, ශ්‍රාවකයුග විසින් සිහි කළ සේක් ද, ශ්‍රාවක සන්නිපාත විසින් සිහි කළ සේක් ද, ඒ තථාගතයන් වහන්සේගේ එසා මහත් ඍද්ධි ඇති නියාව, එසා මහත් අනුභාව ඇති නියාව ආශ්චර්‍ය්‍ය ය, අද්භූත ය. ඇවැත්නි, කිමෙක් ද? යම් ධර්මධාතුවක් (යම් සියල්ල දක්නා නුවණක්) මොනොවට පිළිවිදි බැවින් තථාගතයන් වහන්සේ 'ඒ භාග්‍යවත්හු මෙ බදු ජාතියෙහි උපන්හ යි ද, මෙබඳු නමැත්තෝ මෙබඳු ගොත් ඇත්තෝ මෙබඳු ප්‍රඥා ඇත්තෝ මෙබඳු විහරණ ඇත්තෝ මෙබඳු විමුක්ති ඇත්තෝ වූහ'යි ද පිරිනිවියාවූ, සිදැලූ ප්‍රපඤ්ච ඇති, සිදැලූ කම්වට ඇති, හැම ලෙසින් ක්ෂිණ කළ කම්වට ඇති, සියලු විවාවටදුක් ඉක්මි ඉකුත් බුදුවරුන් ජාති විසින්, නම විසින්, ගොත් විසින්, ආයු පමණ විසින්, ශ්‍රාවකයුග විසින්, ශ්‍රාවකසන්නිපාත විසින් සිහි කළ සේක් නම්, ඒ ධර්මධාතුව තථාගතයන් වහන්සේ විසින් ම පිළිවිදුනා ලද ද? නැත හොත් යමෙකින් තථාගතයන්, වහන්සේ 'ඒ භගවත්හු මෙබඳුජාති ඇත්තෝ මේ බඳු නම් ඇත්තෝ මෙබඳු ගොත් ඇත්තෝ මෙබඳු සිල්ඇත්තෝ මෙබඳු දහම් ඇත්තෝ මෙබඳු ප්‍රඥා ඇත්තෝ මෙබඳු විහරණ ඇත්තෝ මෙබඳු විමුක්ති ඇත්තෝ වූහ'යි සිදැලූ ප්‍රපඤ්ච ඇති, සිදැලූ කම්වට ඇති, හැම ලෙසින් ක්ෂිණ කළ කම්වට ඇති, සියලු විවාවට දුක් ඉක්මි, ඉකුත් බුදුවරුන් ජාති විසින් නම විසින් ගොත් විසින් ආයුපමණ විසින් ශ්‍රාවකයුග විසින් ශ්‍රාවකසන්නිපාත විසින් සිහි කළ සේක් නම්, මෙ කරුණ දෙවතා කෙනෙක් තථාගතයන් වහන්සේට සැළ කළෝ ද?''යි ඒ මහණුන්ගේ මේ අතුරු කථාවෙක් අඩාළ වූයේ වෙයි.

15. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි සමවතින් නැගී සිට කරෙරිමණ්ඩලමාළයට වැඩි සේක. වැඩ ප්‍රඥප්ත ආසනයෙහි හුන් සේක. වැඩ හිඳ මහණුන් ඛණවා, ''මහණෙනි, තෙපි දැන් එක් ව කවර නම් කථාවෙකින් හුන්නහු ද? තොපගේ කවර නම් කථාවෙක් අඩාළ වී ද?''යි අසා වදළ සේක. මෙසේ වදළ කලැ ඒ මහණහු ''වහන්ස, භාග්‍යවතුන්වහන්සේ නික්මැ වැඩි නොබෝ කල්හි අපගේ මෙසේ වූ අතුරු කථාවෙක් උපන:

Free Distribution www.aathaapi.org

'අච්ඡරියං ආවුසො අබ්භුතං ආවුසො තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා, යත්ර හි නාම තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවට්ටුමෙ පරියාදින්නවත්තෙ සබ්බදුක්ඛවීතිවත්තෙ ජාතිතොපි අනුසරිස්සති, නාමතොපි අනුසරිස්සති, ගොත්තතොපි අනුසරිස්සති, ආයුපමාණතොපි අනුසරිස්සති, සාවකයුගතොපි අනුසරිස්සති, සාවකසන්නිපාතතොපි අනුසරිස්සති: 'එවංජච්චා තෙ භගවන්තො අහෙසුං ඉතිපි, එවංනාමා, එවංගොත්තා, එවංසීලා, එවංධම්මා, එවංපඤ්ඤා, එවංවිහාරී, එවංවිමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපිති. කින්නු ඛො ආවුසො තථාගතස්සෙව නු ඛො එසා ධම්මධාතු සුප්පටිවිද්ධා යස්සා ධම්මධාතුයා සුප්පටිවිද්ධත්තා තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුත්ත ඡින්නපපඤ්චෙ ඡින්නවට්ටුමෙ පරියාදින්නවත්තෙ සබ්බදුක්ඛවීතිවත්තෙ ජාතිතොපි අනුසරති, නාමතොපි අනුසරති, ගොත්තතොපි අනුසරති, ආයුපමාණතොපි අනුසරති, සාවකයුගතොපි අනුසරති, සාවකසන්නිපාතතොපි අනුසරති: එවංජච්චා තෙ භගවන්තො අහෙසුං ඉතිපි, එවංනාමා, එවංගොත්තා, එවංසීලා, එවංධම්මා, එවංපඤ්ඤා, එවංවිහාරී, එවංවිමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපිති? උදාහු දෙවතා තථාගතස්ස එතමත්ථං ආරොචෙසුං යෙන තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවට්ටුමෙ පරියාදින්නවත්තෙ සබ්බදුක්ඛවීතිවත්තෙ ජාතිතොපි අනුසරති, නාමතොපි අනුසරති, ගොත්තතොපි අනුසරති, ආයුපමාණතොපි අනුසරති, සාවකයුගතොපි අනුසරති, සාවකසන්නිපාතතොපි අනුසරති: 'එවංජච්චා තෙ භගවන්තො අහෙසුං ඉතිපි, එවංනාමා, එවංගොත්තා, එවංසීලා, එවංධම්මා, එවංපඤ්ඤා, එවංවිහාරී, එවංවිමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපි'ති?

16. "තථාගතස්සෙවෙසා භික්ඛවෙ ධම්මධාතු සුප්පටිවිද්ධා යස්සා ධම්මධාතුයා සුප්පටිවිද්ධත්තා තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවට්ටුමෙ පරියාදින්නවත්තෙ සබ්බදුක්ඛවීතිවත්තෙ ජාතිතොපි අනුසරති, නාමතොපි අනුසරති, ගොත්තතොපි අනුසරති, ආයුපමාණතොපි අනුසරති, සාවකයුගතොපි අනුසරති, සාවකසන්නිපාතතොපි අනුසරති: එවංජච්චා තෙ භගවන්තො අහෙසුං ඉතිපි, එවංනාමා, එවංගොත්තා, එවංසීලා, එවංධම්මා, එවංපඤ්ඤා, එවංවිහාරී, එවංවිමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපි'ති. දෙවතා පි තථාගතස්ස එතමත්ථං ආරොචෙසුං එවංජච්චා තෙ භගවන්තො අහෙසුං ඉතිපි, එවංනාමා, එවංගොත්තා, එවංසීලා, එවංධම්මා, එවංපඤ්ඤා, එවංවිහාරී, එවංවිමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපි'ති. ඉච්ඡෙය්‍යාථ නො තුමෙ භික්ඛවෙ භියෙය්‍යොමත්තාය පුබ්බෙනිවාසපටිසංයුත්තං ධම්මිං කථං සොතුන්ති?."

Free Distribution www.aathaapi.org

ඇවැත්නි, යම්බඳු වූ තථාගතයන් වහන්සේ ''ඒ භාග්‍යවත්හු මෙබඳු ජාතියෙහි උපන්හ, මෙබඳු ගොත් ඇතියෝ, මෙබඳු සිල් ඇතියෝ, මෙබඳු දහම් ඇතියෝ, මෙබඳු ප්‍රඥා ඇතියෝ, මෙබඳු විහරණ ඇතියෝ, මෙබඳු විමුක්ති ඇතියෝ වූහ'යි පිරිනිවි, සිඳැලූ තෘෂ්ණා මාන දෘෂ්ටි ප්‍රපඤ්ච ඇති, සිඳැලූ කම්වට ඇති, හැම ලෙසින් ක්ෂීණ කළ කම්වට ඇති, සියලු විඛාවට දුක ඉක්මි ඉකුත් බුදුවරුන් ජාති විසින් නම් විසින් ගොත් විසින් ආයුප්‍රමාණ විසින් ශ්‍රාවකයුග විසින් ශ්‍රාවක-සන්නිපාත විසින් සිහි කළ සේක් ද, ඒ තථාගතයන් වහන්සේගේ එසේ වූ මහත් ඍද්ධි ඇති නියාව, මහත් අනුභාව ඇති නියාව ආශ්චර්‍ය්‍ය ය, අද්භූතය. ඇවැත්නි, කිම? යම් ධර්මධාතුවක් මොනොවට පිළිවිදි බැවින් තථාගත-යන් වහන්සේ, ඒ භාග්‍යවත්හු මෙබඳු දෑයෙහි උපන්හයි, මෙබඳු නමැත්තෝ මෙබඳු ගොතැත්තෝ, මෙබඳු සිල් ඇත්තෝ, මෙබඳු දහමැත්තෝ, මෙබඳු පැණැත්තෝ, මෙබඳු විහරණ ඇත්තෝ, මෙබඳු විමුක්ති ඇත්තෝ වූහ'යි පිරිනිවි, සිඳැලූ ප්‍රපඤ්ච ඇති, සිඳැලූ කම්වටැති, හැම ලෙසින් ක්ෂීණ කළ කම්වටැති, සියලු විපාකවට්ට දුක ඉක්මී, ඉකුත් බුදුවරුන් දෑ නම් ගොත් විසින්, ආයුප්‍රමාණ විසින්, ශ්‍රාවකයුග විසින්, ශ්‍රාවකසන්නිපාත විසින් සිහි කළ සේක් නම්, ඒ ධර්මධාතුව තථාගතයන් වහන්සේ විසින් ම පිළිවිදුනා ලද ද? නැතහොත් යමෙකින් තථාගතයන්වහන්සේ ඒ භාග්‍යවත්හු 'මෙබඳු ජාති නාම ගොත්‍ර ශීල ධර්ම ප්‍රඥා විහරණ විමුක්ති ඇත්තෝ වූහ'යි සිඳැලූ ප්‍රපඤ්ච ඇති, සිඳැලූ කම්වට ඇති, ඇම ලෙසින් ක්ෂීණ කළ කම්වට ඇති, සියලු විපාකවට්ට දුක ඉක්මී, අතීත බුදුවරුන් ජාති නාම ගොත්‍ර ආයුෂ් ප්‍රමාණ ශ්‍රාවකයුග ශ්‍රාවක සන්නිපාත විසින් සිහිකරන සේක් නම්, මෙකරුණ දෙවතා කෙනෙක් තථාගතයන් වහන්සේට සැළ කළාහු ද?'යි අපගේ මේ අතුරු කථාව අඩාළ විය. එ කලැ භාග්‍යවතුන් වහන්සේ මෙහි වැඩවදළ සේකැ''යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ.

16. ''මහණෙනි, යම් ධර්මධාතුවක් පිළිවිදි බැවින් තථාගතයෝ 'ඒ භාග්‍යවත්හු මෙබඳු ජාති නාම ගොත්‍ර ශීල ධර්ම ප්‍රඥා විහරණ විමුක්ති ඇත්තෝ වූහ'යි සිඳැලූ ප්‍රපඤ්ච ඇති, සිඳැලූ කම්වට ඇති, හැම ලෙසින් ක්ෂීණ කළ කම්වට ඇති සියලු විපාකවට්ට දුක ඉක්මී, අතීත බුදුවරුන් ජාති නාම ගොත්‍ර ආයුෂ්ප්‍රමාණ ශ්‍රාවකයුග ශ්‍රාවකසන්නිපාත විසින් සිහි කරන්නාහු නම්, ඒ ධර්මධාතුව තථාගතයන් විසින් මොනොවට ම පිළිවිදුනා ලද්දේ ය. මෙ කරුණ දෙවතාවෝ ද තථාගතයනට සැළ කළහ. මහණෙනි, තෙපි වඩාලාත් පෙරවුසු කඳපිළිවෙළ පිළිබඳ වූ ධර්ම කථාව අසන්නට කැමැත්තහු දැ?''යි භාග්‍යවතුන් වහන්සේ අසා වදළ සේක.

Free Distribution www.aathaapi.org

17. "එතස්ස භගවා කාලො, එතස්ස සුගත කාලො. යං භගවා භියෝ-සොමත්තාය පුබ්බෙනිවාසපටිසංයුත්තං ධම්මං කථං කරෙය්‍ය භගවතො සුත්වා භික්ඛු ධාරෙස්සන්ති"ති. "තෙන හි භික්ඛවෙ සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමි"ති. 'එවංභන්තෙ'ති ඛො තෙ භික්ඛු භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

18. "ඉතො සො භික්ඛවෙ එකනවුතො කප්පො[1]. යං විපස්සී භගවා අරහංසම්මාසම්බුද්ධො ලොකෙ උදපාදි. විපස්සී භික්ඛවෙ භගවා අරහං සම්මාසම්බුද්ධො ඛත්තියො ජාතියා අහොසි, ඛත්තියකුලෙ උදපාදි. විපස්සී භික්ඛවෙ භගවා අරහං සම්මාසම්බුද්ධො කොණ්ඩඤ්ඤ ගොත්තෙන අහොසි. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අසීතිවස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. විපස්සී භික්ඛවෙ භගවා අරහං සම්මාසම්බුද්ධො පාටලියා මූලෙ අභිසම්බුද්ධො. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ඛණ්ඩතිස්සං නාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස තයො සාවකානං සන්නිපාතා අහෙසුං: එකො සාවකානං සන්නිපාතො අහොසි අට්ඨසට්ඨිභික්ඛුසතසහස්සං. එකො සාවකානං සන්නිපාතො අහොසි භික්ඛුසතසහස්සං. එකො සාවකානං සන්නිපාතො අහොසි අසීතිභික්ඛුසතසහස්සානි. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ඉමෙ තයො සාවකානං සන්නිපාතා අහෙසුං සබ්බෙසං යෙව ඛීණාසවානං. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අසොකො නාම භික්ඛු උපට්ඨාකො අහොසි අග්ගුපට්ඨාකො. විපස්සිස්ස භික්ඛවෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස බන්ධුමා නාම රාජා පිතා අහොසි. බන්ධුමතී නාම දෙවී මාතා අහොසි ජනෙත්තී. බන්ධුමස්ස රඤ්ඤෙ බන්ධුමතී නාම නගරං රාජධානි අහොසි.

19. අථ ඛො භික්ඛවෙ විපස්සී ඛොධිසත්තො තුසිතා කායා චවිත්වා සතො සම්පජානො මාතුකුච්ඡිං ඔක්කමි. අයමෙත්ථ ධම්මතා.

20. ධම්මතා එසා භික්ඛවෙ යදා ඛොධිසත්තො තුසිතා කායා චවිත්වා මාතුකුච්ඡිං ඔක්කමති, අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අප්පමාණො උළාරො[2] ඔභාසො පාතුභවති අතික්කමෙමව දෙවානං දෙවානුභාවං. යා පි තා ලොකන්තරිකා අසා අසංවුතා අන්ධකාරා අන්ධකාරතිමිසා, යත්ථපිමෙ චන්දිමසූරියා එවංමහිද්ධිකා එවංමහානුභාවා ආභාය නානුහොන්ති, තත්ථපි අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කමෙමව දෙවානං දෙවානුභාවා. –

1. එකනවුතිකප්පෙ–ම ජ සං,
2. ඔළාරො – ස්‍යා

Free Distribution www.aathaapi.org

17. ''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වඩාලාත් පෙරවූසු කඳපිළිවෙළ පිළිබඳ දහම් කතාව කරන සේක යන යමෙක් ඇද්ද, භාග්‍යවතුන් වහන්ස, එයට මේ කාලය වෙයි. සුගතයන් වහන්ස, එයට මේ කාලය වෙයි. භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසා භික්ෂූහු සිතැ ලා දරන්නාහ''යි ඒ මහණහු කිහ. ''මහණෙනි, එසේ වී නම් අසවු, මොනොවට මෙනෙහි කරවු, කියන්නෙමි''යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. 'එසේ යැ වහන්සැ'යි කියා ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:

18. මහණෙනි, යම් කලෙක රහත් වූ සම්මාසම්බුදු වූ විපස්සී භාග්‍යවත්හු ලොවැ පහළ වූහු නම්, ඒ මෙයින් එක්අතු වන කප ය. මහණෙනි, රහත් සම්මාසම්බුදු වූ විපස්සී භාග්‍යවත්හු ජාතියෙන් ක්ෂත්‍රිය වූහ, ක්ෂත්‍රිය-කුලයෙහි උපන්හ. මහණෙනි, රහත් වූ සම්මාසම්බුදු වූ විපස්සී භාග්‍යවත්හු ගොත්‍රයෙන් කෞණ්ඩින්‍ය වූහ. මහණෙනි, රහත් වූ සම්මාසම්බුදු වූ විපස්සී භාග්‍යවත්නට හවුරුදු අසූදහසෙක් ආයුෂ්ප්‍රමාණය විය. මහණෙනි, රහත් වූ සම්මාසම්බුදු වූ විපස්සී භාග්‍යවත්හු පළොල්රුක්හී මුලැ සත්‍යාවබෝධය කළහ. මහණෙනි, රහත් වූ සම්මාසම්බුදු වූ විපස්සී භාග්‍යවත්නට ඛණ්ඩය තිස්ස යැ යි නම් වූ හදියුග වූ සවුයුවලෙක් විය. මහණෙනි, රහත් වූ සම්මාසම්බුදු වූ විපස්සී භාග්‍යවත්නට ශ්‍රාවකයන්ගේ රැස්වීම් තුනෙක් විය: එයින් එක් ශ්‍රාවකසන්නිපාතයෙක් අටසැට ලක්ෂයක් භික්ෂූන්ගෙන් යුක්ත විය. එක් ශ්‍රාවකසන්නිපාතයෙක් භික්ෂූන් ලක්ෂයෙක් විය. එක් ශ්‍රාවකසන්නිපාතයෙක් භික්ෂූන් අසූ දහසෙක් විය. මහණෙනි, රහත් වූ සම්මාසම්බුදු වූ විපස්සී භාග්‍යවත්නට හැම දෙනාම ක්ෂීණාශ්‍රව වූ සව්වන්ගේ මේ තුන් සන්නිපාත කෙනෙක් වූහ. මහණෙනි, රහත් වූ සම්මාසම්බුදු වූ විපස්සී භාග්‍යවත්නට අශොක නම් මහණෙක් අග්‍රොපස්ථායක වූ උවසු විය. මහණෙනි, රහත් වූ සම්මාසම්බුදු වූ විපස්සී භාග්‍යවත්නට බන්ධුමත් නම් රජෙක් පිතෘ විය, බන්ධුමතී නම් දේවියක් වැදූ මව වූ ය. බන්ධුමතී නම් තුවර බන්ධුමත් රජහුගේ රජදහන විය.

19. මහණෙනි, එකල්හි විපස්සී බෝසත්හු තුසි දෙවනකායෙන් සැව යිහි ඇත්තේ තුවණැත්තේ මවුකුසට බවුයේ ය. මේ මෙහි ධර්මතා යි (සඞ්භාවය යි).

20. මහණෙනි, මේ ධර්මතා යැ: යම් කලෙක බෝසත්හු තුසි දෙවනකායෙන් සැව මව කුස පිළිසිඳ ගන්නාහු නම්, එ කලැ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොවිහි, මහණබමුණන් සහිත සත්වප්‍රජායෙහි, දෙවියන්ගේ දෙවානුභාවය ඉක්මැ අපමණ වූ මහත් එළියෙක් පහළ වෙයි. නිහි විවැරුණු, නො හැවිරුණු (යවීන් පිහිටක් නැති), ඇස් අඳුරු කරන ගනදුර ඇති යම් ලෝඇඳිරි නිරයෝ වෙත් ද, මෙසා මහඉදුහු ඇති මෙසා මහ තෙදති සඳ හිරුහු ඒ යම් තැනෙක සිය එළියෙන් අඳුරු දුරලන්නට නොහැකි වෙත් ද, එහි පවා දෙවියන්ගේ දෙවඑළිය ඉක්මැ ම අපමණ වූ මහත් එළියෙක් පහළ වෙයි:–

Free Distribution www.aathaapi.org

යෙ පි තත්‍ථ සත්තා උපපන්නා,[1] තෙ පි තෙනෝහංසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජානන්ති 'අඤ්ඤෙ පි කිර භො සත්තී සත්තා ඉධූපපන්නා'ති. අයඤ්ච දසසහස්සී ලොකධාතු සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අපමාණොච උළාරොඕභාසො ලොකෙ පාතුභවති අතික්කමෙම්ව දෙවානං දෙවානුභාවං. අයමෙත්‍ථ ධම්මතා.

21. ධම්මතා එසා භික්ඛවෙ යද බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති, චත්තාරොනං දෙවපුත්තා චතුද්දිස[2] රක්ඛාය උපගච්ඡන්ති: 'මා නං බොධිසත්තං වා බොධිසත්තමාතරං වා මනුසෙසා වා අමනුසෙසා වා කොචි වා විහෙඨෙසී'ති. අයමෙත්‍ථ ධම්මතා.

22. ධම්මතා එසා භික්ඛවෙ, යද බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති, පකතියා සීලවතී බොධිසත්තමාතා හොති විරතා පාණාතිපාතා, විරතා අදින්නාදානා, විරතා කාමෙසු මිච්ඡාචාරා, විරතා මුසාවාදා, විරතා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා. අයමෙත්‍ථ ධම්මතා.

23. ධම්මතා එසා භික්ඛවෙ, යද බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති, න බොධිසත්තමාතු පුරිසෙසු මානසං උප්පජ්ජති කාමගුණූපසංහිතං. අනතික්කමනීයා ච බොධිසත්තමාතා හොති කෙනචි පුරිසෙන රත්තචිත්තෙන. අයමෙත්‍ථ ධම්මතා.

24. ධම්මතා එසා භික්ඛවෙ, යද බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති, ලාභිනී බොධිසත්තමාතා හොති පඤ්චන්නං කාමගුණානං. සා පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගිභූතා පරිචාරෙති. අයමෙත්‍ථ ධම්මතා.

25. ධම්මතා එසා භික්ඛවෙ, යද බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති, න බොධිසත්තමාතු කොචිදෙව ආබාධො උප්පජ්ජති. සුඛිනී බොධිසත්තමාතා හොති අකිලන්තකායා. බොධිසත්තඤ්ච බොධිසත්තමාතා තිරොකුච්ඡිගතං පස්සති සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං.

සෙය්‍යථාපි භික්ඛවෙ මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අවෙජ්ඣා විප්පසන්නෙනා සබ්බාකාරසම්පන්නෙනා, තත්‍ර යං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදතං වා පණ්ඩුසුත්තං වා, තමෙනං චක්ඛුමා පුරිසො හත්‍ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය: අයං ඛො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අවෙජ්ඣා විප්පසන්නෙනා සබ්බාකාර සම්පන්නෙනා, තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදතං වා පණ්ඩුසුත්තං වා'ති. එවමෙව ඛො භික්ඛවෙ යද බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති, න බොධිසත්තමාතු කොචිදෙව ආබාධො උප්පජ්ජති. සුඛිනී බොධිසත්තමාතා හොති අකිලන්තකායා. බොධිසත්තඤ්ච බොධිසත්තමාතා තිරොකුච්ඡිගතං පස්සති සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං, අයමෙත්‍ථ ධම්මතා:

---

1. උපපන්නා – ම ජ සං, සත්තා PTS
2. චතුද්දිසං ම ජ සං. චාතුද්දිසං – සත්තා

Free Distribution www.aathaapi.org

එහි යම් සත් කෙනෙක් උපන්නෝ ද, ඔහු ද ඒ එළියෙන් 'හවත්නි, මෙහි උපන් අන් සත් කෙනෙක් ඇත්හ' යි උනුන් හැඳින ගනිත්. මේ දසදහස් ලෝද ද හාත්පසින් සැලෙයි, වෙසෙසින් සැලෙයි, වෙවුලයි. දෙවියන්ගේ දෙවානුභාවය ඉක්මැ ම අප්‍රමාණ වූ විපුල ආලෝකයෙක් ලොවැ පහළ වෙයි. මේ මෙහි ධර්මතා යි.

21. මහණෙනි, මේ ධර්මතා යි: යම් විටෙක බෝසත්හු මව කුසට බවුවෝ වේද්ද, එකලැ සිවුදෙනෙක් දෙව්පුත්තු (සිවු වරම්රජුහු) 'ඒ බෝසතුන් හෝ බෝසත්මව හෝ කිසි මිනිසෙක් හෝ නොමිනිසෙක් හෝ නො පෙළාව'යි සතර දිගැ රකවළට වෙත පැමිණෙත්. මෙහි මේ ධර්මතායි.

22. මහණෙනි, මේ ධර්මතා යි: යම් විටෙක බෝසත් තෙම මව කුසට බවුයේ වේ ද, එකල්හි පියෙව්යෙන් ම සිල්වත් වූ බෝසත්මව පණිවායෙන් වැළැකුණි වෙයි. අයිනාදනින් වැළැකුණි වෙයි, කාමමිථ්‍යාචාරයෙන් වැළැකුණි වෙයි, මුසවායෙන් වැළැකුණි වෙයි, මදට පමාවට කරුණු වූ රහමෙරින් වැළැකුණි වෙයි. මේ මෙහි ධර්මතා යි.

23. මහණෙනි, මේ ධර්මතා යි: යම් විටෙක බෝසත් තෙම මව කුසට බවුයේ වේ ද, එ තැන් පටන් කොට බෝසත්මවට පිරිමින් කෙරෙහි කාමගුණනිඃශ්‍රිත වූ සිතෙක් නො පහළ වේ. රාගයෙන් රත් වූ සිතැති කිසිදු පුරුෂයෙක්හු විසින් බෝසත් මව ඉක්මියැ හැකි නො වේ. මෙහි මේ ධර්මතා යි.

24. මහණෙනි, මේ ධර්මතා යි: යම් විටෙක බෝසත් තෙම මව කුසට බවුයේ වේ ද, එතැන් පටන් කොට බෝසත්මව පස්කම්සුව ලබන්නී වෙයි. ඕ පස්කම් ගුණයෙන් සමර්පිත ව සංයුක්ත ව ඉඳුරන් හසුරුවයි. මේ මෙහි ධර්මතා යි.

25. මහණෙනි, මේ ධර්මතා යි: යම් විටෙක බෝසත් තෙම මව කුසැ පිළිසිඳ ගත්තේ වේ ද, එතැන් පටන් කොට බෝසත්මවට කිසි ම ආබාධයෙක් නො උපදී. බෝසත්මව සුවැත්තී ක්ලාන්ත නොවූ කයැත්තී වෙයි. බෝසත්මව සිය කුසතුළැ වූ බෝසත්හු සියලු අඟපසඟ ඇත්තහු, නොපිරිහුණු ඉඳුරන් ඇත්තහු දකී. මේ මෙහි ධර්මතා යි.

මහණෙනි, යම්සේ ශොභන වූ, ජාතිමත් වූ, අටැස් වූ, මොනොවට පිරියම් කළ, පිරිසිදු, වෙසෙසින් පහන්, හැම අයුරින් පිරිපුන් වෙරළුම්ණෙක් වේ ද, එහි නිල්වන් හෝ රන්වන් හෝ ලෙහෙවන් හෝ සුදුවන් හෝ පඩුවන් හෝ හුයෙක් අඹුනන ලද්දේ වේ ද, එය ඇස්ඇති පුරුෂයෙක් අතෙහි කොට 'මේ වෙරළුම්ණ හොඹතේ ය, ජාතිමත් ය, අටැස් ය, මොනොවට පිරියම් කරන ලද්දේ ය, පිරිසිදු ය, වෙසෙසින් පහන් ය, හැම සැටියෙන් පිරිපුන් ය. මෙහි මේ නිල්වන් හෝ රන්වන් හෝ ලෙහෙවන් හෝ සුදුවන් හෝ පඩුවන් හෝ හුයෙක් අඹුනන ලද්දේ වේ යැ'යි සලකා බලන්නේ ද, එසේ ම මහණෙනි, යම් කලෙක බෝසත්හු මවකුසැ පිළිසිඳ ගත්තෝ වෙත්ද, එකලැ බෝසත්මවට කිසිදු ආබාධයෙක් නො උපදී. බෝසත්මව අක්ලාන්ත කය ඇත්තී සුවපත් වෙයි. බෝසත් මව සිය කුසතුළැ වූ බෝසතුන් සියලු අඟපසඟ ඇතියවුන් නොපිරිහුණු ඉඳුරන් ඇතියවුන් දකී. මේ මෙහි ධර්මතා යි.

Free Distribution www.aathaapi.org

26. ධම්මතා එසා භික්ඛවෙ. සත්තාහජාතෙ බොධිසත්තෙ බොධිසත්තමාතා කාලං කරොති, තුසිතං, කායං උප පජ්ජති. අයමෙපා ධම්මතා.

27. ධම්මතා එසා භික්ඛවෙ. යථා අඤ්ඤා ඉත්ථිකා නව වා දස වා මාසෙ ගබ්භං කුච්ඡිනා පරිහරිත්වා විජායන්ති, න හෙවං බොධිසත්තං බොධිසත්ත-මාතා විජායති. දසෙව මාසානි බොධිසත්තං බොධිසත්තමාතා කුච්ඡිනා පරිහරිත්වා විජායති. අයමෙපා ධම්මතා.

28. ධම්මතා එසා භික්ඛවෙ. යථා අඤ්ඤා ඉත්ථිකා නිසින්නා වා නිපන්නා වා විජායන්ති, න හෙවං බොධිසත්තං බොධිසත්තමාතා විජායති. ඨිතා'ව බොධිසත්තං බොධිසත්තමාතා විජායති. අයමෙපා ධම්මතා.

29. ධම්මතා එසා භික්ඛවෙ. යදා බොධිසත්තෙ මාතුකුච්ඡිම්හා නික්ඛමති, දෙවා පඨමං පතිගණ්හන්ති, පච්ඡා මනුස්සා. අයමෙපා ධම්මතා.

30. ධම්මතා එසා භික්ඛවෙ. යදා බොධිසත්තෙ මාතුකුච්ඡිම්හා නික්ඛමති, අපපත්තෙ'ව බොධිසත්තෙ පඨවිං හෙති. චත්තාරෝ නං දෙවපුත්තා පටිග්ගහෙත්වා මාතු පුරතෝ ඨපෙන්ති. 'අත්තමනා දෙවි හොහි මහෙසක්ඛෝ. තෙ පුත්තෝ උපපන්නෝ'ති, අයමෙපා ධම්මතා.

31. ධම්මතා එසා භික්ඛවෙ. යදා බොධිසත්තෙ මාතුකුච්ඡිම්හා නික්ඛමති, විසදෙ'ව නික්ඛමති අමක්කිතෙ උදෙන[1] අමක්කිතෙ සෙම්හෙන අමක්කිතෙ රුහිරෙන, අමක්කිතෙ කෙනචි අසුචිනා, සුද්ධෝ විසදෙ.

සෙය්‍යථාපි භික්ඛවෙ මණිරතනං කාසිකෙ වත්ථෙ නික්ඛිත්තං නෙව මණිරතනං කාසිකං වත්ථං මක්කෙති, නාපි කාසිකං වත්ථං මණිරතනං මක්කෙති – තං කිස්ස හෙතු: උභින්නං සුද්ධත්තා. එවමෙව බො භික්ඛවෙ යදා බොධිසත්තෙ මාතුකුච්ඡිම්හා නික්ඛමති, විසදෙ'ව නික්ඛමති, අමක්කිතෙ උදෙන අමක්කිතෙ සෙම්හෙන අමක්කිතෙ රුහිරෙන අමක්කිතෙ කෙනචි අසුචිනා, සුද්ධෝ විසදෙ. අයම්පි ධම්මතා.

32. ධම්මතා එසා භික්ඛවෙ. යදා බොධිසත්තෙ මාතුකුච්ඡිම්හා නික්ඛමති, දෙව උදකස්ස ධාරා[2] අන්තලික්ඛා පාතුභවන්ති: එකා සීතස්ස එකා උණ්හස්ස, යෙන බොධිසත්තස්ස උදකකිච්චං කරොන්ති මාතුචෙ[3]. අයමෙපා ධම්මතා.

---

1. උදෙන – ම ඡ සං
2. උදකධාරා – සීමු.
3. මාතු ච – සීමු. ම ඡ සං ස්‍යා

Free Distribution www.aathaapi.org

26. මහණෙනි, මේ ධර්මතා යි: බෝසත්හු උපන් සත්දවසැ බෝසත්-මව කලුරිය කෙරෙයි. (කලුරිය කොට) තුසිදෙව්ලොවැ උපදී. මේ මෙහි ධර්මතා යි.

27. මහණෙනි, මේ ධර්මතා යි: යමසේ අන් ස්ත්‍රීහු නව මසක් හෝ දසමසක් කුසින් ගබ රැක වදත් ද, බෝසත්මව එසේ බෝසතුන් නො ම ප්‍රසූත කෙරෙයි. බෝසත්මව පූරා දස මසක් ම බෝසතුන් කුසින් උසුලා ප්‍රසූත කෙරෙයි. මේ මෙහි ධර්මතා යි.

28. මහණෙනි, මේ ධර්මතා යි: යමසේ අන් ස්ත්‍රීහු හිඳ හෝ වැදහෙව වදත් ද, බෝසත්මව බෝසතුන් එසේ ප්‍රසූත නො කරයි. බෝසත් මව සිටියා ම බෝසතුන් ප්‍රසූත කෙරෙයි. මේ මෙහි ධර්මතා යි.

29. මහණෙනි මේ ධර්මතා යි: යම් විටෙක බෝසත්හු මව කුසින් බිහි වෙත්ද, එවිට පළමුවෙන් දෙවියෝ ද පසු ව මිනිස්සු ද ඔබ පිළිගනිත්. මේ මෙහි ධර්මතා යි.

30. මහණෙනි, මේ ධර්මතා යි: යම් විටෙක බෝසත්හු මව කුසින් නික්මෙත් ද, එකල්හි බෝසත්හු පොළොවට නො පැමිණියෝ ම වෙති. (නොපැමිණියැදී ම) සතර දෙවිපුත් කෙනෙක් ඔබ පිළිගෙන, 'දේවිනි, සතුටු වන්න, ඔබට මහායශස්ක පුතෙක් උපනැ'යි කියා මව ඉදිරියෙහි තබත්. මේ මෙහි ධර්මතායි.

31. මහණෙනි, මේ ධර්මතා යි: යම් විටෙක බෝසත්හු මව කුසින් නික්මෙත් ද, විශද වැ ම, දියෙන් නොවැකුණේ, සෙමින් නොවැකුණේ, ලෙයින් නොවැකුණේ, කිසිදු අශුචියෙකින් නොවැකුණේ පිරිසිදු වැ නිර්මල වැ නික්මෙති.

මහණෙනි, කසී සළුවෙක තබන ලද මිණිරුවනෙක් වේ නම් එය කසිසළුව නො වකා ද (කසිසළුවෙහි නො තැවැරේ ද) කසිසළුවත් මිණිරුවන නො වකා ද (කසිසළුව මිණිරුවනෙහි නො තැවරේ ද)—ඒ කවර හෙයින? ඒ දෙක ම පිරිසුදු බැවිනි. මහණෙනි, එසේ ම යම් විටෙක බෝසත්හු මව කුසින් නික්මෙත් ද, විශද වැ ම, දියෙන් නොවැකුණේම, සෙමින් නොවැකුණේම, ලෙයින් නොවැකුණේම, කිසි දු අශුචියෙකින් නොවැකුණේම, පිරිසිදුවැම නිර්මල වැම නික්මෙත්. මේ මෙහි ධර්මතා යි.

32. මහණෙනි මේ ධර්මතා යි: යම් විටෙක බෝසත්හු මව කුසින් නික්මෙත් ද, එකල්හි යමෙකින් බෝසතුන්ගේත් මවගේත් දියකිස කෙරෙත් ද, එසේ වූ එකක් උණුදිය වූත් එකක් සිහිල් දිය වූත් දියදහර දෙකක් අහසින් පහළ වෙයි. මේ මෙහි ධර්මතා යි.

Free Distribution www.aathaapi.org

33. ධම්මතා එසා භික්ඛවෙ. සම්පතිජාතො බොධිසත්තො සමෙහි පාදෙහි පතිට්ඨහිත්වා උත්තරාභිමුඛො[1] සත්ත පදවීතිහාරෙ[2] ගච්ඡති සෙතම්හි ඡත්තෙ අනුධාරියමානෙ[3], සබ්බා ච දිසා අනුවිලොකෙති[4], ආසභිඤ්ච වාචං භාසති: ''අග්ගොහං'ස්මි ලොකස්ස, ජෙට්ඨොහං'ස්මි ලොකස්ස, සෙට්ඨොහං'ස්මි ලොකස්ස, අයමන්තිමා ජාති, නත්ථි'දානි පුනබ්භවො''ති. අයමෙත්ථ ධම්මතා.

34. ධම්මතා එසා භික්ඛවෙ. යදා බොධිසත්තො මාතුකුච්ඡිම්හා නික්ඛමති, අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අපපමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කමෙමෙව දෙවානං දෙවානුභාවං. යා'පි තා ලොකන්තරිකා අසා අසංවුතා අන්ධකාරා අන්ධකාරතිමිසා, යත්ථපිමෙ චන්දිමසූරියා එවම්මහානුභාවා ආභාය නානුභොන්ති, තත්ථපි අපපමාණො උළාරො ඔභාසො පාතු භවති අතික්කමෙමෙව දෙවානං දෙවානුභාවං. යෙ'පි තත්ථ සත්තා උපපන්නා, තෙ'පි තෙනොභාසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජානන්ති: ''අඤ්ඤෙ'පි කිර භො සන්ති සත්තා ඉධූපපන්නා''ති. අයඤ්ච දසසහස්සී ලොකධාතු සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අපපමාණො ච උළාරො ඔභාසො ලොකෙ පාතුභවති අතික්කමෙමෙව දෙවානං දෙවානුභාවං. අයමෙත්ථ ධම්මතා.

35. ජාතෙ බොධිසත්තෙ පන භික්ඛවෙ විපස්සිම්හි කුමාරෙ බන්ධුමතො රඤ්ඤො පටිවෙදෙසුං: 'පුත්තො තෙ දෙව ජාතො; තං දෙවො පස්සතූ'ති. අද්දසා බො භික්ඛවෙ බන්ධුමා රාජා විපස්සිං කුමාරං, දිස්වා නෙමිත්තෙ බ්‍රාහ්මණෙ ආමන්තාපෙත්වා එතදවොච:-

'පස්සන්තු භොන්තො නෙමිත්තා බ්‍රාහ්මණා කුමාරන්ති.' අද්දසංසු[5] බො භික්ඛවෙ නෙමිත්තා බ්‍රාහ්මණා විපස්සිං කුමාරං දිස්වා බන්ධුමං[6] රාජානං එතදවොචුං: 'අත්තමනො දෙව භොහි. මහෙසක්ඛා තෙ දෙව පුත්තො උපපන්නො. ලාභා තෙ මහාරාජ, සුලද්ධං තෙ මහාරාජ, යස්ස තෙ කුලෙ එවරූපො පුත්තො උපපන්නො.'

36. ''අයං භි දෙව කුමාරො දවත්තිංසමහාපුරිසලක්ඛණෙහි සමන්නාගතො යෙහි සම්මන්නාගතස්ස මහාපුරිසස්ස ද්වෙව ගතියො භවන්ති අනඤ්ඤා -සචෙ අගාරං අජ්ඣාවසති, රාජා හොති චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසම්මන්නාගතො. තස්සිමානි සත්ත රතනානි භවන්ති: සෙය්‍යථීදං-

1. උත්තරෙනාභිමුඛො, සී॰,
2. පදවීතිහාරෙන, ම ජ සං॰
3. අනුධාරියමානො, ම ජ සං॰
4. විලොකෙති, PTS
5. අද්දසංසු, ම ජ සං॰
6. බන්ධුමස්සා॰, ම ජ සං॰

Free Distribution www.aathaapi.org

33. මහණෙනි, මේ ධර්මතා යි: උපන් නොබෝ වෙලෙහි ම දෙව්-සේසත් දරුනු ලබත් ම බෝසත්තෙම සම පියෙන් පොළොවැ පිහිටා උතුරු දෙසට මුහුණ ලා සත් පියවරක් යෙති. හැම දිගුන් අනුව බලති. ''මම ලොවට අග්‍ර වෙමි. මම ලොවට දෙවු වෙමි. මම ලොවට සෙට වෙමි. මේ අන්තිම ඉපැත්ම ය. දැන් මට මතු භවයෙක් නැතැ''යි උතුම් ඔස් පවසත්. මේ මෙහි ධර්මතා යි.

34. මහණෙනි, මේ ධර්මතා යි: යම් විටෙක බෝසත්හු මව කුසින් නික්මෙත් ද, එකල්හි දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොවෙහි, මහණබමුණන් සහිත දෙවිමිනිසුන් සහිත සත්මුළුලයෙහි දෙවියන්ගේ දෙවානුභාවය ඉක්මැ ම පමණ කට නොහැකි මහත් එළියෙක් පහළ වෙයි. (රුක් ඇ කිසිවෙක) ගැටුම නැති, කිසිවෙකින් නොවැසුණු, අඳුරු වූ, ගනඳුරු ඇති, මේ සා මහත් ඉද්ධ ඇති මහත් තෙද ඇති මේ සඳ-හිරුන් සිය එළියෙන් බබුලුවනු නොහැකි යම් ලෝඇඳිරි නිරයෝ වෙත් ද, එහි දු දෙවියන්ගේ දෙවානුභාවය ඉක්මැ ම අපමණ වූ මහත් එළියෙක් පහළ වෙයි. එහි යම් සත් කෙනෙක් උපන්නාහු නම් ඔහු ද ඒ එළියෙන් භවත්නි, මෙහි උපන් අන් සත්හු ද ඇතැ'යි උනුන් හැඳින ගනිත්. මේ දසදහසක් ලෝද ද සැලෙයි, වෙසෙයින් සැලෙයි, වෙවුලයි. දෙවානුභාවය ඉක්මැ ම අපමණ වූ ම මහත් එළියෙක් ලොවැ පහළ වෙයි. මේ මෙහි ධර්මතා යි.

35. මහණෙනි, විපස්සී කුමරුන් උපන් කල්හි 'දේවයිනි, ඔබට පුතෙක් උපන. දේවයන් වහන්සේ ඔහු දකින සේක් වා'යි බන්ධුමත් රජුට දන්වූහ. මහණෙනි, බන්ධුමත් රජ විපස්සී කුමරුන් දුටුයේ ම ය. දැක නිමිත්තපාඨක බමුණන් කැඳවා

''භවත් නෙමිත්තිකබ්‍රාහ්මණයෝ කුමාරයා දකිත්ව''යි මෙ බස් පැවැ-සි ය: නෙමිත්තික බ්‍රාහ්මණයෝ විපස්සී කුමරහු දුටුවාහු ම ය. දැක බන්ධුමත් රජුට 'දෙවයිනි, සතුටු වන්න, ඔබට මහත් යශස් ඇති පුතෙක් උපන. මහරජුනි, යම්බඳු ඔබගේ කුලයෙහි මෙබඳු පුතෙක් උපන්නේ ද, ඒ ඔබට ලාභ ය. මහරජුනි, ඒ ඔබ විසින් ලබන ලද මනා ලාභයෙකි.

36. ''දෙවයිනි, යමෙකින් සමන්විත මහපුරිස්හට නිශ්චා (නිෂ්පත්ති) දෙකෙක් ම වේ ද, අන් නිශ්චාවක් නැද්ද, මේ කුමර එසේ වූ දෙකිස් මහපුරිස්ලකුණින් සමන්විත ය. ඉදින් මේ තෙම ගිහිගෙහි වෙසේ නම්, සිවුසමුදුර හිම කොටැති පොළොවට අධිපති, දිනූ යුද ඇති, දනවහි තහවුරුබවට පැමිණි, සත්රුවනින් සමන්විත, දහැම් වූ ධර්මරාජ වූ සක්විත්තෙක් වෙයි.

Free Distribution www.aathaapi.org

චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිනායකරතනමෙව සත්තමං. පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසති. සවෙ ඛො පන අගාරස්මා අනගාරියං පබ්බජති, අරහං හොති සම්මාසම්බුද්ධො ලොකෙ විවත්තච්ඡදෙ,

37. කතමෙහි චායං දෙව කුමාරො අවත්තිංසමහාපුරිසලක්ඛණෙහි සමන්තාගතො යෙහි සමන්තාගතස්ස මහාපුරිසස්ස දෙවව ගතියො භවන්ති අනඤ්ඤ-සවෙ අගාරං අජ්ඣාවසති, රාජා හොති චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතන-සමන්තාගතො, තස්සිමානි සත්ත රතනානි භවන්ති: සෙය්‍යථිදං-චක්ක-රතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිනායකරතනමෙව සත්තමං, පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසති. සවෙ ඛො පන අගාරස්මා අනගාරියං පබ්බජති, අරහං හොති සම්මාසම්බුද්ධො ලොකෙ විවත්තච්ඡදෙ.

අයං හි දෙව කුමාරො සුප්පතිට්ඨිතපාදෙ. යම්පායං දෙව කුමාරො සුප්පතිට්ඨිතපාදෙ, ඉදම්පිමස්ස මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණං භවති.

ඉමස්ස දෙව කුමාරස්ස හෙට්ඨාපාදතලෙසු චක්කානි ජාතානි සහස්සාරානි සනෙමිකානි සනාභිකානි සබ්බාකාරපරිපූරාණි. යම්පි දෙව ඉමස්ස කුමාරස්ස හෙට්ඨාපාදතලෙසු චක්කානි ජාතානි සහස්සාරානි සනෙමිකානි සනාභිකානි සබ්බාකාරපරිපූරාණි, ඉදම්පි'ස්ස මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණං භවති.

අයං හි දෙව කුමාරො ආයතපණ්හි. (යම්පායං දෙව කුමාරො ආයතපණ්හි ඉදම්පිමස්ස මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණං භවති.*)

අයං හි දෙව කුමාරො දීඝඞ්ගුලී. -පෙ-

අයං හි දෙව කුමාරො මුදුතළුණහත්ථපාදෙ. -පෙ-

අයං හි දෙව කුමාරො ජාලහත්ථපාදෙ: -පෙ-

අයං හි දෙව කුමාරො උස්සඞ්ඛපාදෙ. -පෙ-

අයං හි දෙව කුමාරො එණිජඞ්ඝො. -පෙ-

---

* පාඨො'යං පොත්තකෙසු න දිස්සති. එත්ථාපි අඤ්ඤෙසුපි ඨානෙසු ''පො'' ඉති ච ඝිහල පොත්තකෙසු න දිස්සති.

Free Distribution www.aathaapi.org

චක්‍රරත්නය, හස්තිරත්නය, අශ්වරත්නය, මණිරත්නය, ස්ත්‍රීරත්නය, ගෘහපතිරත්නය, සත්වනු පරිණායකරත්නය යන මේ සත්රුවන් කෙනෙක් ඔහුට වෙත්. ඔහුට ශූර වූ වීර්‍යප්‍රකෘතික (වීර්‍යමය) වූ සතුරු සෙන් මැඩලනුයෙහි සමත් වූ දහසකට වැඩී පුත්තු වෙත්. සේ සයුර හිමි කොටැති මේ පොළොව දංඩෙන් තොර වැ සැතින් තොර වැ දැහැමින් දිනා එහි අධිපති ව වෙසෙයි. ඉදින් ගිහි ගෙන් නික්මැ පැවිදි වදී නම් ලොවැ බැහැර කරන ලද කෙලෙස් සෙවෙනි ඇති රහත් සම්මාසම්බුදුවරයෙක් වෙයි.

37. යමෙකින් සමන්විත මහ පුරිස්හට නිශ්චා දෙකෙක් ම වේ ද, අන් නිශ්චාවෙක් නැද්ද - ඉදින් ගිහි ගෙහි වෙසේ නම්, සිවුසමුදුර හිමි කොටැති පොළොවට අධිපති, දිනූ යුද ඇති, දනවුහි තහවුරුබවට පැමිණි, සත්රුවනින් සමන්විත, දැහැමි වූ දහමරජ වූ සක්විත්තෙක් වේ ද, යමකුහට චක්‍රරත්නය, හස්තිරත්නය, අශ්වරත්නය, මණිරත්නය, ස්ත්‍රීරත්නය, ගෘහපතිරත්නය, සත්වනු පරිණායකරත්නය යන මේ සත් රුවන් කෙනෙක් වෙත් ද, යමකුට අහිත වූ වීර්‍යප්‍රකෘතික වූ, සතුරු සෙන් මැඩ ලනුයෙහි සමත් වූ දහසකට වැඩි පුත්තු වෙත් ද, යමෙකින් සමන්විතයෙක් සයුර හිමි කොටැති මේ පොළොව දංඩෙන් සැතින් තොර වැ දැහැමින් දිනා එහි අධිපති වැ වෙසේ ද, ඉදින් ගිහි ගෙන් නික්මැ පැවිදි වදී නම් ලොවැ බැහැර කළ කෙලෙස් සෙවෙනි ඇති රහත් සම්මාසම්බුදුවරයෙක් වේ ද, ඒ කවර දෙකිස් මහපුරිස්ලකුණින් මේ කුමර සමන්විත වේ ද යත්:

දෙවයිනි, මේ කුමර සුපිහිටි පා (එක පැහැර බිම පහස්නා පතුල්) ඇත්තේ ය. දෙවයිනි, මෙකුමර සුපිහිටි පා ඇත්තේ ය යන යමෙක් ඇද්ද, මේ ද මේ මහපුරිස්හුගේ මහපුරිස් ලකුණෙක් වෙයි.

දෙවයිනි, මේ කුමරහුගේ යැටි පතුල්හි දහසක් අර ඇති, නිම්වලලු සහිත, නැබ සහිත, හැම සැටියෙන් පිරිපුන් චක්‍රයෝ හටගත්තාහු වෙත්. දේවයිනි, මෙ කුමරුගේ යැටි පතුල්හි දහසක් අර ඇති, නිම්වලලු සහිත, නැබ සහිත, හැම අයුරින් පිරිපුන් චක්‍රයෝ හටගත්තහු වෙත් ද, මෙත් මේ මහපුරිස්හුගේ මහපුරිස්ලකුණෙක් වේ.

දෙවයිනි, මෙ කුමර (පිරිපුන්) දික් විළුම ඇත්තේ ය. දෙවයිනි, මේ කුමර දික් විළුම ඇතියේ වේද, මෙද මේ මහපුරිස්හුගේ මහපුරිස් ලකුණෙක් වෙයි.

දෙවයිනි, මෙ කුමර (මුලින් දළ අගින් සිඟින්) දික් ඇඟිලි ඇත්තේ ය.

දෙවයිනි, මෙ කුමර මොළොක් තුරුණු අත් පා ඇතියේ ය...

දෙවයිනි, මෙ කුමර (අත සතර ඇඟිලි පය පස් ඇඟිලි එකප්‍රමාණ වැ ඇති බැවින් ජාල කවුළුවක්) බදු අත් පා ඇත්තේ ය...

දෙවයිනි, මෙ කුමර උස් (නැඟී පිහිටි) බොලට ඇත්තේ ය...

දෙවයිනි, මෙ කුමර ඒණිමුවන්ගේ බදු කෙංඛා ඇත්තේය...

Free Distribution www.aathaapi.org

අයං හි දෙව කුමාරො යීතකොව අඤ්ඤතමඤ්ඤා උභොහි පාණිතලෙහි ජණ්ඩුකානි පරිමසති[1] පරිමජ්ජති. -පෙ-

අයං හි දෙව කුමාරො කොසොහිතවත්ථගුය්හො[2]. -පෙ-

අයං හි දෙව කුමාරො සුවණ්ණවණ්ණො කඤ්චනසන්නිභත්තචො, -පෙ-

අයං හි දෙව කුමාරො සුඛුමච්ඡවි. සුඛුමත්තා ඡවියා රජොජල්ලං කායෙ න උපලිම්පති.[3] -පෙ-

අයං හි දෙව කුමාරො එකෙකලොමෙ, එකෙකානි ලොමානි ලොම. කූපෙසු ජාතානි. -පෙ-

අයං හි දෙව කුමාරො උද්ධග්ගලොමෙ. උද්ධග්ගානි ලොමානි ජාතානි නීලානි අඤ්ජනවණ්ණානි කුණ්ඩලාවත්තානි දක්ඛිණාවත්තකජාතානි. -පෙ-

අයං හි දෙව කුමාරො බ්‍රහ්මුජ්ජුගත්තො. -පෙ-

අයං හි දෙව කුමාරො සත්තුස්සදෙ. -පෙ-

අයං හි දෙව කුමාරො සීහපුබ්බද්ධකායො -පෙ-

අයං හි දෙව කුමාරො චිත්තන්තරංසො. -පෙ-

අයං හි දෙව කුමාරො නිග්‍රොධපරිමණ්ඩලො යාවතක්වස්ස කායො තාවතක්වස්ස බ්‍යාමෙ, යාවතක්වස්ස බ්‍යාමෙ තාවතක්වස්ස කායො. -පෙ-

අයං හි දෙව කුමාරො සමවත්තක්ඛන්ධො. -පෙ-

අයං හි දෙව කුමාරො රසග්ගසග්ගී. -පෙ-

අයං හි දෙව කුමාරො සීහහනු - පෙ -

අයං හි දෙව කුමාරො චත්තාළීසදන්තො - පෙ -

අයං හි දෙව කුමාරො සමදන්තො - පෙ -

අයං හි දෙව කුමාරො අවිවර[4] දන්තො - පෙ -

අයං හි දෙව කුමාරො සුසුක්කදංඨො - පෙ -

---

1. පරිමසති, ම ස්‍ය
2. කොසොපගතවත්ථගුය්හ - මහාව්‍යුත්පත්ති, - කොසගතවත්ථගුය්හ - මහාවස්තුපාඨ,
3. උපලිම්පති, ම ස්‍ය
4. අවිරළ (සී ඉ.)

Free Distribution www.aathaapi.org

දෙවයිනි, මෙ කුමර තෙම සිටියේ ම නො නැමි දෙ අත්ලෙන් දෙදන ස්පර්ශ කෙරෙයි, පිරිමදී...

දෙවයිනි, මේ කුමර කොශයෙහි අවහිත වස්ත්‍රගුහ්‍ය (අංගජාතය) ඇත්තේ ය...

දෙවයිනි,මෙ කුමර රන්වන් ය. කසුන්කඳක් බඳු පහන් සිවි පැහැ ඇත්තේ ය...

දෙවයිනි, මෙ කුමර සියුම් සිවිය ඇත්තේ ය. සිවිය සියුම් බැවින් දූලි හෝ දූලි ඇහැ නො ඇලෙයි.

දෙවයිනි, මෙ කුමර එකෙකී ලොම් ඇත්තේ ය. ලොමකූපයන්හි (එක් එක් ලොමකූපයෙක) එකෙකී ලොම් හටගත්තේ ය.

දෙවයිනි, මෙ කුමර උඩුඅඟ් ලොම් ඇත්තේය. (මුඹගේ සිරුරු) නිල්වූ අඳුන්වන් ලොම්හු කොඩොල් අයුරින් කරකැවී දක්ෂිණාවර්තක ව ඇත...

දෙවයිනි, මෙ කුමර බ්‍රහ්මයාගේ සෙයින් ඍජු වූ ගාත්‍ර ඇත්තේ ය...

දෙවයිනි, මෙ කුමර උස් ව පිරුණු මස් ඇති බැවින් (දෙඅත්පිට දෙපාපිට දෙඋර කඳ යන) සත් තන්හි උත්සන්න (පිරිපුන්) මාංශ ඇත්තේය.

දෙවයිනි, මෙ කුමර සිංහයාගේ පෙරඩකය බඳු පිරිපුන් සිරුර ඇත්තේය...

දෙවයිනි, මේ කුමර චිත වූ (පිරිපුන්) අන්තරාංස (පිටැ දෙ අංසයන් අතර මැදකොටස) ඇත්තේ ය....

දෙවයිනි, මේ කුමර සම වූ කඳ හා සම වූ අතු ඇති (අයම්විතරින් සම වූ) නුගරුකක් සෙයින් පරිමණ්ඩල වෙයි. මුඹගේ කය යම් පමණ ද, බඹයත් එපමණ ම වෙයි. බඹය යම් පමණ ද, කයත් එපමණ ම වේ.

දෙවයිනි, මෙ කුමර සම වට කඳට ඇත්තේ ය...

දෙවයිනි, මෙ කුමර රසග්‍රාසාග්‍රය. (රසයන්ගෙන් ග්‍රාසයෙහි – රසවිඳී-මෙහි ඌර්ධවාග්‍ර වූ රසනහර ඇත්තේ ය).

දෙවයිනි, මෙ කුමර සිංහයාගේ අධස්තාත් හනුව සෙයින් පිරිපුන් හනු ඇත්තේ ය...

දෙවයිනි, මෙ කුමර නොඅඩු සතළිස් දත් ඇත්තේ ය...

දෙවයිනි, මෙ කුමර සම වූ දත් ඇත්තේ ය...

දෙවයිනි, මෙ කුමර විවරරහිත දත් ඇත්තේ ය...

දෙවයිනි, මෙ කුමර ඉතා සුදු (දිලියෙන පැහැ ඇති) දත් ඇත්තේ ය...

Free Distribution www.aathaapi.org

අයං හි දෙව කුමාරො පහූතජිව්හො – පෙ –

අයං හි දෙව කුමාරො බ්‍රහ්මස්සරො කරවීකභාණී – පෙ –

අයං හි දෙව කුමාරො අභිනීලනෙත්තො – පෙ –

අයං හි දෙව කුමාරො ගොපබුමො. (යම්පායං දෙව කුමාරො ගොපබුමො, ඉදම්පිමස්ස මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණං භවති.)

ඉමස්ස දෙව කුමාරස්ස උණ්ණා භමුකන්තරෙ ජාතා ඔදාතා මුදුතුල-සන්නිභා. යම්පිමස්ස දෙව කුමාරස්ස උණ්ණා භමුකන්තරෙ ජාතා ඔදාතා මුදුතුලසන්නිභා, ඉදම්පිමස්ස මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණං භවති.

අයං හි දෙව කුමාරො උණ්හීසසීසො. යම්පායං දෙව කුමාරො උණ්හීසසීසො, ඉදම්පිමස්ස මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණං භවති.

38. ඉමෙහි ඛො අයං දෙව කුමාරො දවත්තිංසමහාපුරිසලක්ඛණෙහි සමන්නාගතො යෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස දෙවව ගතියො භවන්ති අනඤ්ඤා, සචෙ අගාරං අජ්ඣාවසති, රාජා හොති චක්කවත්තී ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො. තස්සිමානි සත්තරතනානි භවන්ති: සෙය්‍යථීදං-චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිනායකරතනමෙව සත්තමං. පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන[1] අභිවිජිය අජ්ඣාවසති. සචෙ ඛො පන අගාරස්මා අනගාරියං පබ්බජති, අරහං හොති සම්මාසම්බුද්ධො ලොකෙ විවත්තච්ඡදෙ''ති.

39. අථ ඛො භික්ඛවෙ බන්ධුමා රාජා නෙමිත්තෙ බ්‍රාහ්මණෙ අහතෙහි වත්ථෙහි අච්ඡාදාපෙත්වා සබ්බකාමෙහි සන්තප්පෙසි. අථ ඛො භික්ඛවෙ බන්ධුමා රාජා විපස්සිස්ස කුමාරස්ස ධාතියො උපට්ඨාපෙසි. අඤ්ඤා සුදං පායෙන්ති.[2] අඤ්ඤා නහාපෙන්ති. අඤ්ඤා ධාරෙන්ති. අඤ්ඤා අඞ්කෙන පරිහරන්ති. ජාතස්ස ඛො පන භික්ඛවෙ විපස්සිස්ස කුමාරස්ස සෙතච්ඡත්තං ධාරීයිත්ථ දිවා චෙව රත්තිඤ්ච 'මා නං සීතං වා උණ්හං වා තිණං වා රජො වා උස්සාවො වා බාධයිත්ථා'ති. ජාතො ඛො පන භික්ඛවෙ විපස්සී කුමාරො බහුනො ජනස්ස පියො අහොසි මනාපො. සෙය්‍යථාපි භික්ඛවෙ උප්පලං වා පදුමං වා පුණ්ඩරීකං වා බහුනො ජනස්ස පියං මනාපං, එවමෙව ඛො භික්ඛවෙ විපස්සී කුමාරො බහුනො ජනස්ස පියො අහොසි මනාපො. සවාසසුදං අඞ්කෙනෙව අඞ්කං පරිහරීයති.

---

1. ධම්මෙන සමෙන, ස්‍යා.

2. පීරං පායෙන්ති, සීමු.

Free Distribution www.aathaapi.org

දෙවයිනි, මේ කුමර මොළොක් දික්පුළුල් දිව ඇත්තේ ය. . . .

දෙවයිනි, මේ කුමර බ්‍රහ්මයාගේ ස්වර බඳු විශුද්ධස්වර ඇත්තේ ය. කුරවිකෙවිල්ලන්ගේ බඳු මිහිරි හඬින් බණන සුලු ය. . . .

දෙවයිනි, මේ කුමර නිල් වුවමනා තන්හි ඉතා පිරිසිදු නිල් පැහැ ඇස් ඇත්තේ ය. . . . .

දෙවයිනි, මේ කුමර එකෙණෙහි උපන් වස්සක්හුගේ බඳු මොළොක් සිනිඳු නිල් සියුම් ඇස් පියුම් ඇත්තේ ය. .

දෙවයිනි, මේ කුමරුගේ දෙබැම අතර වූ සුදු වූ මොළොක් පුලුන් රොදක් බඳු වූ ඌර්ණාරොමය වෙයි. දෙවයිනි, මේ කුමරහු දෙබැම අතර සුදු මොළොක් පුලුන් පොදක් බඳු ඌර්ණරොමයෙක් ඇද්ද, මේද මේ මහපුරිස්හුගේ මහපුරිස්ලකුණෙක් වෙයි.

දෙවයිනි, මේ කුමර නළල්පටින් වෙළන ලද හිසක් සෙයින් පිරිපුන්, නොහොත් නළල්පට සෙයින් හැමතන්හි පිරිමඬුලු වූ හිස ඇත්තේ ය. මේ ද මේ මහපුරිස්හුගේ මහපුරිස්ලකුණෙක් වෙයි.

38. දෙවයිනි, යමෙකින් සමන්විත මහාපුරිසක්හට දෙගතියෙක් ම වේ ද, අන් ගතියෙක් නැද්ද — ඉදින් ගිහිගෙහි වෙසේ නම් සිවු සමුදුර හිම කොටැති පොළොවට හිමි වූ, දිනූ යුදෑති, දනවුහි තහවුරු බවට පැමිණි, සත්රුවනින් සමන්විත, දහැමි වූ දහමරජ වූ සක්විත්තෙක් වේ ද, යමක්හට චක්‍රරත්නය හස්තිරත්නය අශ්වරත්නය මණිරත්නය ස්ත්‍රීරත්නය ගෘහපති රත්නය සත්වනු පරිණායකරත්නය යන මෙසත් රුවන් කෙනෙක් වෙත් ද යමක් හට අතීත වූ වියාප්‍රකෘතික වූ, සතුරු සෙන් මැඩ ලනුයෙහි සමත්වූ දහසකට වැඩි පුත්තු වෙත් ද, හේ සයුර හිම කොටැති මේ පොළොව දණ්ඩෙන් සැතින් තොර වැ දැහැමින් දිනා එහි අධිපති වැ වෙසේ ද, ඉදින් ගිහිගෙන් නික්මැ පැවිදි වදී නම් ලොවැ බැහැර කළ කෙලෙස් සෙවෙනි ඇති රහත් සම්මාසම්බුදුවරයෙක් වේ ද, එසේ වූ දෙසිස් මහපුරිස්ලකුණෙන් මෙ කුමර සමන්වාගත වේ'' (යැ යි කීහ).

39. මහණෙනි, එකල්හි ඔන්ධුමත් රජතෙම තොමෝත්තික බමුණන් කරළයෙන් පුදු සියලු කැමැති දැයින් සන්තර්පිත කෙළේ ය. මහණෙනි, ඉක්බිති ඔන්ධුමත් රජ තෙම විපස්සි කුමරහට කිරිමවුන් එළැඹැවී ය. ඔවුන් අතුරෙහි ඇතැම් කිරිමවුහු කිරි පොවත්. ඇතැම්හු නාවත්, ඇතැම්හු උසුලාගෙන සිටිත්, ඇතැම්හු ඇකයෙන් පරිහරණය කරත්. මහණෙනි, උපන් කෙණෙහි ම විපස්සි කුමරහට 'ශීතයෙක් හෝ උණුසුමෙක් හෝ කෑණ හෝ දුලි හෝ මොහු නො පෙළාවා' යි සේසතෙක් දරන ලද්දේ ය. මහණෙනි, උපන් කෙණෙහි ම විපස්සි කුමර තෙම බොහෝ දෙනාට ප්‍රිය ද මනාප ද වී ය. මහණෙනි, යම්සේ උපුල්මලෙක් හෝ පියුම්මලෙක් හෝ සුදුනෙළුම් මලෙක් හෝ බොහෝ දෙනාට ප්‍රියත් මනාපත් වේ ද, එසේ ම විපස්සි කුමර තෙම බොහෝ දෙනාට ප්‍රිය විය, මනාප විය. හෙ තෙම වූ කලී එක් කිරිමවකගේ ඇකයෙන් අන් කිරිමවකගේ ඇකයට පමුණුවනු ලැබේ.

Free Distribution www.aathaapi.org

40. ජාතො ඛො පන භික්ඛවෙ විපස්සී කුමාරො මඤ්ජුස්සරො ච[1] අහොසි වග්ගුස්සරො ච මධුරස්සරො ච[2] සෙය්‍යථාපි භික්ඛවෙ හිමවන්තෙ පබ්බතෙ කරවීකා නාම සකුණජාති මඤ්ජුස්සරා ච වග්ගුස්සරා ච මධුරස්සරා ච පෙමනීයස්සරා ච, එවමෙව ඛො භික්ඛවෙ විපස්සී කුමාරො මඤ්ජුස්සරො ච අහොසි වග්ගුස්සරො ච මධුරස්සරො ච පෙමනීයස්සරො ච. ජාතස්ස ඛො පන භික්ඛවෙ විපස්සිස්ස කුමාරස්ස කම්මවිපාකජං දිබ්බං චක්ඛු පාතුරහොසි, යෙන සුදං[3] සමන්තා යොජනං පස්සති දිවා චෙව රත්තිඤ්ච. ජාතො ඛො පන භික්ඛවෙ විපස්සී කුමාරො අනිමිසන්නො පෙක්ඛති, සෙය්‍යථාපි දෙවා තාවතිංසා. 'අනිමිසන්නො කුමාරො පෙක්ඛති'ති ඛො භික්ඛවෙ විපස්සිස්ස කුමාරස්ස 'විපස්සී, විපස්සී' ත්වෙව සමඤ්ඤා උදපාදි.

41. අථ ඛො භික්ඛවෙ බන්ධුමා රාජා අත්ථකරණෙ[4] නිසින්නො විපස්සිං කුමාරං අඞ්කෙ නිසීදපෙත්වා අත්ථෙ අනුසාසති. තත්‍ර සුදං භික්ඛවෙ විපස්සී කුමාරො පිතු අඞ්කෙ නිසින්නො විචෙය්‍ය විචෙය්‍ය අත්ථෙ පනයති ඤායෙන. 'විචෙය්‍ය විචෙය්‍ය කුමාරො අත්ථෙ පනයති ඤායෙනා'ති ඛො භික්ඛවෙ විපස්සිස්ස කුමාරස්ස භියොසොමත්තාය 'විපස්සී, විපස්සී' ත්වෙව සමඤ්ඤා උදපාදි.

42. අථ ඛො භික්ඛවෙ බන්ධුමා රාජා විපස්සිස්ස කුමාරස්ස තයො පාසාදෙ කාරාපෙසි, එකං වස්සිකං එකං හෙමන්තිකං එකං ගිම්හිකං. පඤ්චකාමගුණානි උපට්ඨාපෙසි. තත්‍ර සුදං භික්ඛවෙ විපස්සී කුමාරො වස්සිකෙ පාසාදෙ වස්සිකෙ චත්තාරො මාසෙ[5] නිපපුරිසෙහි තුරියෙහි පරිචාරියමානො න හෙට්ඨාපාසාදං ඔරොහති.

(පඨමකභාණවාරං*)

1. බ්‍රහමස්සරො මඤ්ජුස්සරොච, මජ්ඣ.
2. වග්ගුමධුරස්සරා ච, PTS
3. යෙන දුර, ස්‍යා.
4. අත්ථකරණෙ, ස්‍යා
5. වස්සිකෙ පාසාදෙ චත්තාරො මාසෙ, මජ්ඣ.
* ජාතිකබණ්ඩං නිට්ඨිතං, PTS

Free Distribution www.aathaapi.org

40. මහණෙනි, විපස්සී කුමාර තෙම උපන්නේ ම නොරළු කටහඬැතියේ ද වියත් කට හඬැතියේ ද මිහිරි කටහඬැතියේ ද ඇලුම් කටයුතු කටහඬැතියේ ද විය. මහණෙනි, යම්සේ හිමවුපවතෙහි නොරළුහඬ ඇත්තාවූ ද වියත් හඬ ඇත්තා වූ ද මිහිරි හඬ ඇත්තා වූ ද ඇලුම් කටයුතු හඬ ඇත්තාවූ ද කුරවිකෙවිලි නම් ලිහිණිවගෙක් ඇත් ද, මහණෙනි, එසේ ම, විපස්සී කුමාර තෙම නොරළු කටහඬැතියේ ද, වියත් කටහඬ ඇතියේ ද, මිහිරි කටහඬැතියේ ද, ඇලුම් කටයුතු කටහඬැතියේ ද වී ය. මහණෙනි, උපන්නාවූ ම විපස්සී කුමරහට- යමෙකින් දහවලුත් රෑත් භාත්පසැ යොදුනක් මානය දක්ක හැකි ද, එසේ වූ කර්මවිපාකජ දිවැස පහළ විය. මහණෙනි, උපන්නාවූ ම විපස්සී කුමර තවතිසාවැසි දෙවියන් සේ ඇසිපිය නො හෙලනුයේ බලයි. මහණෙනි, 'මේ කුමර ඇසිපිය නො හෙලනුයේ බලා'යැ යි විපස්සී කුමරහට **විපස්සී, විපස්සී** යැයි සංඥාව (නම) උපන.

41. මහණෙනි, එකල්හි බන්ධුමත් රජ විනිශ්චයසභායෙහි හුන්නේ, විපස්සී කුමරහු ඇකයෙහි හිඳුවා ගෙන අර්ථානුශාසනය කෙරෙයි. මහණෙනි, විපස්සී කුමර එහි පියා ඇකයෙහි හුන්නේ විමස විමසා න්‍යායයෙන් යුක්ති ලෙස අරුත් (දනී, දකී,) පවත්වයි. 'කුමර තෙම න්‍යායයෙන් (යුක්ති ලෙස) විමස විමසා (දනී, දකී,)අරුත් පවත්වා යැ යි කියා ම විපස්සී කුමරහට වඩාලාත් **විපස්සී, විපස්සී** යැ යි කියා ම සංඥාව උපන.

42. මහණෙනි, ඉක්බිති බන්ධුමත් රජ විපස්සී කුමරහට වැසි සෙමෙහි වසනුවට **සුදුසු** එකක් ද, හිමත් සෙමෙහි වසනුවට **සුදුසු** එකක් ද, ගිමත් සෙමෙහි වසනුවට **සුදුසු** එකක් ද යි ප්‍රාසාද තුනක් කැරැවී ය. පස් කම් ගුණ එළැඹැවී ය. මහණෙනි, විපස්සී කුමර තෙම වැසිසමයට **සුදුසු** පහයෙහි වැසි සාර මසැ පිරිමින් නැති තූරුඋවාරණින් (පුරුෂරහිත තූර්‍යෝපකරණයෙන් හෙවත් තූර්‍යභාණ්ඩ ගත් ස්ත්‍රීන් විසින් ම) උවටැන් කරනු ලබනුයේ යට පහයට නො බසී.

(පළමු බණවර ය)

Free Distribution www.aathaapi.org

43. අථ ඛො භික්ඛවෙ විපස්සී කුමාරො බහුන්නං වස්සානං බහුන්නං වස්සසතානං බහුන්නං වස්සසහස්සානං අච්චයෙන සාරථිං ආමන්තෙසි: 'යොජෙහි සම්ම සාරථි භද්දානි භද්දානි යානානි. උය්‍යානභූමිං ගච්ඡාම සුභූමිං දස්සනායා'ති. 'එවං දෙවා'ති ඛො භික්ඛවෙ සාරථි විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා භද්දානි භද්දානි යානානි යොජෙත්වා[1] විපස්සිස්ස කුමාරස්ස පටිවෙදෙසි: යුත්තානි ඛො තෙ දෙව භද්දානි භද්දානි යානානි. යස්ස'දානි කාලං මඤ්ඤසී'ති.

44. අථ ඛො භික්ඛවෙ විපස්සී කුමාරො භද්දං[2] යානං අභිරුහිත්වා භද්දෙහි භද්දෙහි යානෙහි උය්‍යානභූමිං නිය්‍යාසි. අද්දසා ඛො භික්ඛවෙ විපස්සී කුමාරො උය්‍යානභූමිං නිය්‍යන්තො[3] පුරිසං ජිණ්ණං ගොපානසිවඞ්කං භොග්ගං[4] දණ්ඩපරායණං පවෙධමානං ගච්ඡන්තං ආතුරං ගතයොබ්බනං දිස්වා සාරථිං ආමන්තෙසි: අයම්පන සම්ම සාරථි පුරිසො කිඞ්කතො? කෙසා'පි'ස්ස න යථා අඤ්ඤෙසං, කායො'පි'ස්ස න යථා අඤ්ඤෙසන්ති''. ''එසො ඛො දෙව ජිණ්ණො නාමා''ති. ''කිම්පනෙසො සම්ම සාරථි ජිණ්ණො නාමා?''ති. ''එසො ඛො දෙව ජිණ්ණො නාම: න'දානි තෙන චිරං ජීවිතබ්බං භවිස්සති''ති. ''කිම්පන සම්ම සාරථි අහම්පි ජරාධම්මො ජරං අනතීතො?'ති. ''ත්වඤ්ච දෙව මයඤ්චම්හා සබ්බෙ ජරාධම්මා ජරං අනතීතා''ති. ''තෙන හි සම්ම සාරථි අලන්දානජ්ජ උය්‍යානභූමියා. ඉතො'ව අන්තෙපුරං පච්චනිය්‍යාහී''ති. එවං දෙවා'ති ඛො භික්ඛවෙ සාරථි විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා තතො'ව අන්තෙපුරං පච්චනිය්‍යාසි. තත්‍ර සුදං භික්ඛවෙ විපස්සී කුමාරො අන්තෙපුරගතො[5] දුක්ඛී දුම්මනො පජ්ඣායති: ''ධිරත්ථු කිර භො ජාති නාම, යත්‍ර හි නාම ජාතස්ස ජරා පඤ්ඤායිස්සති''ති.

45. අථ ඛො භික්ඛවෙ බ්‍රහ්මා රාජා සාරථිං ආමන්තාපෙත්වා එතදවොච: '' කච්චි සම්ම සාරථි කුමාරො උය්‍යානභූමියා අභිරමිත්ථ? කච්චි සම්ම සාරථි කුමාරො උය්‍යානභූමියා අත්තමනො අහොසී?''ති. ''න ඛො දෙව කුමාරො උය්‍යානභූමියා අභිරමිත්ථ. න ඛො දෙව කුමාරො උය්‍යානභූමියා අත්තමනො අහොසී''ති. ''කිම්පන සම්ම සාරථි අද්දස කුමාරො උය්‍යානභූමිං නිය්‍යන්තො?''ති.

---

1. යොජාපෙත්වා PTS.
2. භද්දං භද්දං, මජ්ඣං. සිමු
3. නියන්තො PTS
4. භග්ගං, ස්‍යා
5. අන්තෙපුරං ගතො, මජ්ඣං

Free Distribution www.aathaapi.org

43. එකල්හි මහණෙනි, විපස්සී කුමර තෙම බොහෝ හවුරුදු ගණනක්, බොහෝ හවුරුදු සිය ගණනක්, බොහෝ හවුරුදු දහස් ගණනක් ඇවෑමෙන් රියැදුරා ඛණුවා, 'යහළු සැරිය, මනාප මනාප යානයන් යොදව (පිළියෙල කරව), මනාප බිම පෙදෙසක්වූ උයන්බිම දක්නට යමු' කීය. මහණෙනි, රියැදුරු තෙම 'දෙවයිනි එසේ යැ'යි කියා විපස්සී කුමරහට පිළිවදන් දී, මනාප මනාප යානයන් යොදා, 'දෙවයිනි, ඔබට මනාප මනාප යානයෝ යොදන ලදහ. යම් ගමනකට කලැයි සිතන සේක් නම් (දැන් ඒ ගමන අරඹනු වටී යැ) යි සැළ කෙළේ ය.

44. මහණෙනි, ඉක්බිති විපස්සී කුමර හද්‍ර වූ යානයක් නැඟ හද්‍ර වූ හද්‍ර වූ යානයන්ගෙන් උපලක්ෂිත වැ උයන්බිම බලා නික්මියේ ය. මහණෙනි, විපස්සී කුමර තෙම උයන් බලා යන්නේ, ගොනැස්සක් මෙන් වක් වූ, තුන් කුදු ගැසුණු, සැරයැටිය පිළිසරණ කොටැති, වෙවුලමින් යන, ජරාතුර වූ, ඉක්මුණු යොවුන් ඇති, ජරපත් මිනිසක්හු දිටි. දැක රියැදුරා අමතා, ''යහළු සැරිය, මෙතෙම කුමක් කරනු ලැබියෙක් ද? මොහුගේ හිසකෙස් ද සෙස්සන්ගේ බදු නො වෙයි. මොහුගේ කය සෙස්සන්ගේ බදු නො වේ යැ''යි කී ය. ''දෙවයිනි, මෙ තෙම ජීර්ණ (ජරපත්තේ) නමැ''යි රියැදුරු කී ය. ''යහළු සැරිය, මේ ජීර්ණ නම් කිමැ?''යි කුමර පුළුවුත. ''දෙවයිනි, ඔහු විසින් බොහෝ කල් ජීවත් විය නො හැක්කේ ය, මෙසේ වූ තැනැත්තේ ජීර්ණ නම් වේ'' යැ යි රියැදුරු කී ය. ''කිම, යහළු සැරිය, මමත් දිරන සුලුයෙමි, දිරුම නො ඉක්මියෙමි වෙම ද?'' යි කුමර පුළුවුත. ''දෙවයිනි, ඔබ අටි ද හැම දෙන මෝ දිරන සුල්ලම්හ, දිරුම නො ඉක්මියමහ''යි රියැදුරු කී ය. යහළු සැරිය, එසේ වී නම් දැන් අද උයන්බිමෙන් කම් නැත. මේ තැනින් ම ඇතොවුරට පෙරළා නික්ම යව ''යි කුමර කී ය. මහණෙනි, 'එසේ යැ, දෙවයිනි'යි රියැදුරු තෙම විපස්සී කුමරහට පිළිවදන් දී එතැනින් ම ඇතොවුර කරා පෙරළා නික්මියේ ය. මහණෙනි, එහි විපස්සී කුමර ඇතොවුරට ගියේ (හුදෙකලා වැ හිඳ) දුක් ඇතියේ දෙමනස් ඇතියේ, 'භවත්නි, යම් ඉපැත්මක් ඇති කලැ එසේ උපන්නහුට ජරාව පැනෙන්නේ ද, එසේ වූ ඒ ඉපැත්මට හින්ද වේ වා'යි සිතිවිලි සිතයි.

45. මහණෙනි, එ එල්හි බත්ධුමත් රජ තෙම රියැදුරා කැඳවා, ''කිමෙක් ද යහළු සැරියැ, කුමර තෙම උයන්බිමැ ඇලුණේ ද? කිමෙක් ද යහළු සැරිය, කුමර උයන් බිමෙහි සතුටු වූයේ දැ?''යි ඇසිය. ''දෙවයිනි, කුමර තෙම උයන්බිමැ නො මැ ඇලුණේ ය. දෙවයිනි, කුමර තෙම උයන් බිමෙහි නො මැ සතුටු වූයේ යැ'' යි රියැදුරු කී ය. ''යහළු සැරිය, කුමර උයන්බිම් කරා නික්මැ යනුයේ කුමක් නම් දිටි ද?''යි රජ පුළුවුත.

Free Distribution www.aathaapi.org

"අද්දසා ඛො දෙව, කුමාරො උය්‍යානභූමිං නිය්‍යන්තෙ පුරිසං ජිණ්ණං ගොපානසිවඞ්කං භොග්ගං දණ්ඩපරායණං පවෙධමානං ගච්ඡන්තං ආතුරං ගතයොබ්බනං. දිස්වා මං එතදවොච: අයම්පන සම්ම සාරථි, පුරිසො කිඞ්කතො? කෙසාපිස්ස න යථා අඤ්ඤෙසං, කායොපි'ස්ස න යථා අඤ්ඤෙසන්ති." 'එසො ඛො දෙව, ජිණ්ණො නාම හි. "කිම්පන සො සම්ම සාරථි, ජිණ්ණො නාම?" ති. 'එසො ඛො දෙව, ජිණ්ණො නාම. න'ද්ධා තෙන චිරං ජීවිතබ්බං භවිස්සති'ති. "කිම්පන සම්ම සාරථි, අහම්පි ජරාධම්මො ජරං අනතීතො?" ති. 'එවඤ්ච දෙව මයඤ්චම්හා සබ්බෙ ජරාධම්මා ජරං අනතීතා හි. "තෙන හි සම්ම සාරථි, අලඤ්ඤනජ්ජ උය්‍යානභූමියා. ඉතො'ව අන්තෙපුරං පච්චනියාහී" ති. 'එවං දෙවා හි ඛො අහං දෙව, විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා තතො'ව අන්තෙපුරං පච්චනියාසිං. සො ඛො කුමාරො අන්තෙපුරගතො දුක්ඛී දුම්මනො පජ්ඣායති: 'ධිරත්ථු කිර භො ජාති නාම, යත්‍ර හි නාම ජාතස්ස ජරා පඤ්ඤායිස්සති'ති.

46. අථ ඛො භික්ඛවෙ, බන්ධුමස්ස රඤ්ඤො එතදහොසි: මාහෙව ඛො විපස්සී කුමාරො නා රජ්ජං කාරෙසි. මාහෙව විපස්සී කුමාරො අගාරමා අනගාරියං පබ්බජි. මාහෙව නෙමිත්තානං බ්‍රාහ්මණානං සව්වං අස්ස වචනන්ති. අථ ඛො භික්ඛවෙ, බන්ධුමා රාජා විපස්සිස්ස කුමාරස්ස භිය්‍යොසොමත්තාය පඤ්චකාමගුණානි උපට්ඨාපෙසි යථා විපස්සී කුමාරො න අගාරමා අනගාරියං පබ්බජෙය්‍ය, යථා නෙමිත්තානං බ්‍රාහ්මණානං මිච්ඡා අස්ස වචනන්ති. තත්‍ර සුදං භික්ඛවෙ, විපස්සී කුමාරො පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගිභූතො පරිචාරෙති.

47. අථ ඛො භික්ඛවෙ, විපස්සී කුමාරො බහූනං වස්සානං බහූනං වස්සසතානං බහූනං වස්සසහස්සානං අච්චයෙන සාරථිං ආමන්තෙසි: යොජෙහි සම්ම සාරථි, භද්දානි භද්දානි යානානි උය්‍යානභූමිං ගච්ඡාම සුභූමිං දස්සනාය'ති. 'එවං දෙවා හි ඛො භික්ඛවෙ, සාරථි විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා භද්දානි භද්දානි යානානි යොජෙත්වා විපස්සිස්ස කුමාරස්ස පටිවෙදෙසි: යුත්තානි ඛො තෙ දෙව, භද්දානි භද්දානි යානානි, යස්ස දානිකාලං මඤ්ඤසී'ති.

48. අථ ඛො භික්ඛවෙ, විපස්සී කුමාරො භද්දං යානං අභිරුහිත්වා භද්දෙහි භද්දෙහි යානෙහි උය්‍යානභූමිං නිය්‍යාසි. අද්දසා ඛො භික්ඛවෙ, විපස්සී කුමාරො උය්‍යානභූමිං නිය්‍යන්තෙ පුරිස ආබාධිකං දුක්ඛිතං බාළහගිලානං සකෙ මූත්‍තකරීසෙ පළිපන්නං සෙමානං අඤ්ඤෙහි වුට්ඨාපිරමානං අඤ්ඤෙහි සංවෙසිරමානං. දිස්වා සාරථිං ආමන්තෙසි: අයම්පන, සම්ම සාරථි, පුරිසො කිඞ්කතෙ ? අකබීනිපි'ස්ස න යථා අඤ්ඤෙසං, සරොපි'ස්ස න යථා අරඤ්ඤසන්ති. එසො ඛො දෙව, බ්‍යාධිතො නාම'ති. "කිම්පන සො සම්ම සාරථි, බ්‍යාධිතො නාම?" ති 'එසො ඛො දෙව, බ්‍යාධිතො නාම, අපෙවනාම තමහා ආබාධා වුට්ඨහෙය්‍යා'ති:-

Free Distribution www.aathaapi.org

''දෙවයිනි, කුමරුතෙම උපන්බිම කරා නික්මෑ යනුයේ ගොනැස්සක් මෙන් වක් වූ, තුන් කුදු ගැසුණු, සැරයැටිය පිළිසරණ කොටැති, වෙවුලමින් යන, ජරාතුර වූ, ගිය යොවුන් ඇති, පීරිණ මිනිසක්හු දිටි ය. දැක මා අමතා 'යහළු සැරිය, මෙ මිනිස් තෙම කුමක් කරනු ලැබුයෙක් ද? මොහුගේ හිසකෙස් ද සෙස්සන්ගේ මෙන් නො වෙයි. මොහුගේ කය ද සෙස්සන්ගේ මෙන් නො වේ' යැ යි කී ය. 'දෙවයිනි, මෙ තෙම පීරිණ නම් වේ' යැ යි කීමි. 'යහළු සැරිය, පීරිණ නම් කිමැ'යි මේ පුළුවුත. 'දැන් ඔහු විසින් බොහෝ කලක් ජීවත් විය හැකි නො වන්නේ ය. මේ පීරිණ නමැ'යි කීමි. 'කිම යහළු සැරිය, මමත් දිරණ සුළුලෙම් ද? දිරුම නො ඉක්මියෙම් ද? යි කුමර ඇසී. 'දෙවයිනි, මුඛත් අපිත් සැම දෙන ම දිරන සුළුලමහ. ජරාව නො ඉක්මියමහ'යි මම කීමි. 'එසේ වී නම් යහළු සැරිය, අද දැන් උපන්බිමෙන් කම් නැත. මෙයින් ම ඇතොවුර කරා යව'යි ඔබ කීහ. 'එසේ ය, දෙවයිනි' යි කියා මම විපස්සී කුමාරයනට පිළිවදන් දී, එයින් ම පෙරළා ඇතොවුරට ගියෙමි. දෙවයිනි, ඇතොවුරට ගිය එ කුමරුණෝ දුක් දෙමනස් ඇත්තෝ, යමෙකින් උපන්නහුට ජරාව පැණෙන්නේ ද, භවත්හි, ඒ ඉපැත්ම නින්දවට භාජන වේ වා'යි සිතිවිලි සිතන්නාහ'' යි රියැදුරු කී යැ.

46. මහණෙනි, එකලැ ඔන්ධුමත් රජහට ''විපස්සී කුමර රජය නො ම නො කරවා වා. විපස්සී කුමර තෙම ගිහි ගෙන් නික්මැ පැවිදි නො වේවා. බමුණන්ගේ බස් සබා නො වේවා''යි මෙ සිත විය. මහණෙනි, ඉක්බිති ඔන්ධුමත් රජ විපස්සී කුමර යමසේ රජය කරවන්නේ ද, විපස්සී කුමර යමසේ ගිහි ගෙන් නික්මැ පැවිදි නො වන්නේ ද, යමසේ නෛමිත්තික බ්‍රාහ්මණයන්ගේ බස් නො සබා වන්නේ ද, එසේ වඩාලාත් පස්කම් ගුණ එළැවී යැ. මහණෙනි, එකලැ විපස්සී කුමර පස් කම්ගුණයෙන් සමර්පිත වැ සමන්විත වැ ඉඳුරන් පිණවා ලයි.

47. මහණෙනි, එකල්හි විපස්සී කුමර බොහෝ හවුරුදු ගණනෙක, බොහෝ අවුරුදු සිය ගණනෙක, බොහෝ හවුරුදු දහස්ගණනෙක ඇවෑමෙන් රියැදුරු ඛණවා යහළු 'සැරිය, උතුම් උතුම් යානයන් යොදවා. ප්‍රියභූමිවූ උපන්බිම දක්නට යම්හයි කීය. මහණෙනි, 'එසේ යැ දේවයිනි'යි කියා රියැදුරු තෙම විපස්සී කුමරුනට පිළිවදන් දී උතුම් උතුම් යානයන් යොද 'දෙවයිනි, උතුම් යාන යොදන ලද, යම් ගමනකට කල් යැ යි සිතන්නහු නම්, දැන් එයට සුදුසු යැ' යි කීය.

48. මහණෙනි, එකල්හි විපස්සී කුමර උතුම් යානයක් නැඟ උතුම් උතුම් යානයන්ගෙන් උපලක්ෂිත ව උපන්බිම බලා නික්මිණ. මහණෙනි, විපස්සී කුමර තෙම උපන්බිම යනුයේ ගිලන් වූ දුකට පත්, දඩි සේ ගිලන් වූ, සිය මලමූත්‍රයහි ගැලී හෝනා, අනුන් විසින් නගා සිටුවනු ලබන, අනුන් විසින් හොවනු ලබන පුරුෂයකු දිටි ය. දැක, රියැදුරු බණවා, 'යහළු සැරිය, මේ මිනිස් තෙම කුමක් කරනු ලැබුයේ ද? මොහුගේ ඇස් ද සෙස්සන් ගේ මෙන් නො වේ. මොහුගේ කටහඬ ද සෙස්සන් ගේ මෙන් නො වේ යැ'යි කී ය. 'දෙවයිනි, මේ වූකලි ලෙඩින් පෙළුණේ' යි මේ පිළිවදන් දින. 'යහළු සැරිය, මේ ලෙඩින් පෙළුණේ යනු කිමැ?'යි කුමර පුළුවුත 'දෙවයිනි, මේ ලෙඩින් පෙළුණේ නම් වේ. මෙ තෙම ඒ ලෙඩින් නැඟී සිටුනේ නම් මැනැවැ'යි (පැකියැ යුත්තෙකු) රියැදුරු කීය.

Free Distribution www.aathaapi.org

"කිම්පන සම්ම සාරථි, අහම්පි ඛ්‍යාධිධම්මෝ ඛ්‍යාධිං අනතීතො?" ති. "එවඤ්ච දෙව මයඤ්චම්හා සබ්බෙ ඛ්‍යාධිධම්මා ඛ්‍යාධිං අනතීතා" ති. "තෙන හි සම්ම සාරථි, අලඤ්ජජ උය්‍යානභූමියා. ඉතො'ව අන්තෙපුරං පවෙදෙහී"ති. 'එවං දෙවා' ති ඛො භික්ඛවෙ, සාරථි විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා තතො'ව අන්තෙපුරං පවෙදෙසි. තත්‍ර සුදං භික්ඛවෙ විපස්සී කුමාරො අන්තෙපුරගතො දුකඛී දුම්මනො පජ්ඣායති: "ධිරත්ථු කිර භො ජාති නාම, යත්‍ර හි නාම ජාතස්ස ජරා පඤ්ඤායිස්සති, ඛ්‍යාධි පඤ්ඤායිස්සති" ති

49. අථ ඛො භික්ඛවෙ, බන්ධුමා රාජා සාරථිං ආමන්තාපෙත්වා එතදවොච: "කච්චි සම්ම සාරථි, කුමාරො උය්‍යානභූමියා අභිරම්මෙ? කච්චි සම්ම සාරථි, කුමාරො උය්‍යානභූමියා අත්තමනො අහොසී?" ති. "න ඛො දෙව, කුමාරො උය්‍යානභූමියා අනත්තමනො අහොසී" ති. කිම්පන සම්ම සාරථි, අද්දස කුමාරො උය්‍යානභූමිං, නියය්‍යන්නො?" ති.

50. "අද්දසා ඛො දෙව, කුමාරො උය්‍යානභූමිං නියය්‍යන්නො පුරිසං ආබාධිකං දුකඛිතං බාළහගිලානං සකෙ මූත්තකරිසෙ පළිපන්නං පෙමනං අඤ්ඤෙහි වුට්ඨාපියමානං අඤ්ඤෙහි සංවෙසියමානං, දිස්වා මං එතදවොච: අයම්පන්න සම්ම සාරථි, පුරිසො කිඞ්කතො? අකතීනිපි'ස්ස න යථා අඤ්ඤෙසං, සරො පි'ස්ස න යථා අඤ්ඤෙසන්නි. "එසො ඛො දෙව, ඛ්‍යාධිතො නාමා"ති. "කිම්පන්නස සම්ම සාරථි ඛ්‍යාධිතො නාමා?"ති. "එසො ඛො දෙව, ඛ්‍යාධිතො නාම අපෙව නාම තමහා ආබාධා වුට්ඨහෙය්‍යා"ති. "කිම්පන සම්ම සාරථි, අහම්පි ව්‍යාධිධම්මෝ ව්‍යාධිං අනතීතො?"ති. "එවඤ්ච දෙව, මයඤ්චම්හා සබ්බෙ ව්‍යාධිධම්මා ව්‍යාධිං අනතීතා"ති. "තෙන හි සම්ම සාරථි, අලං දනජ්ජ උය්‍යානභූමියා ඉතො'ව අන්තෙපුරං පවෙදෙහී' ති. 'එවං දෙවා'ති ඛො අහං දෙව, විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා තතො'ව අන්තෙපුරං පවෙදෙසිං. සො ඛො දෙව, කුමාරො අන්තෙපුරගතො දුකඛී දුම්මනො පජ්ඣායති: "ධිරත්ථු කිර භො ජාති නාම, යත්‍ර හි නාම ජාතස්ස ජරා පඤ්ඤායිස්සති, ව්‍යාධි පඤ්ඤායිස්සති" ති.

51. අථ ඛො භික්ඛවෙ, බන්ධුමස්ස රඤ්ඤො එතදහොසි: මා හෙව ඛො විපස්සී කුමාරො න රජ්ජං කාරෙසි. මා හෙව ඛො විපස්සී කුමාරො අගාරස්මා අනගාරියං පබ්බජි. මා හෙව නෙමිත්තිකානං බ්‍රාහ්මණානං සච්චං අස්ස වචනස්සි.

Free Distribution www.aathaapi.org

''යහළු සැරිය, කිමෙක් ද, මමත් ලෙඩින් පෙළෙන සුළු වෙම් ද? ලෙඩ නො ඉක්මියෙම් වෙම් ද?'' යි කුමර පුළුවුත. ''දෙවයිනි, මුඛත් අපිත් යන හැම දෙන මෝ ලෙඩින් පෙළෙන සුල්ලම්හ, ලෙඩ නො ඉක්මියමහ''යි රියැදුරු කීය. ''එසේ නම් යහළු සැරිය, අද දැන් උයන් බිමෙන් කම් නැත. මේ තැනින් ම ඇතොවුරට පෙරළා නික්මෙව''යි කුමර කී ය. 'එසේ යැ දෙවයිනි' යි කියා රියැදුරු තෙම විපස්සී කුමරහට පිළිවදන් දී එතැනින් ම ඇතොවුර බලා නික්මුණේ ය. මහණෙනි, එහි විපස්සී කුමර තෙම දුක් ඇති යේ, දෙමනස් ඇතියේ ''භවත්නි, යම් ඉපැත්මෙකින් උපන්නානුට ජරාවෙක් පැණෙන්නේ නම්, ව්‍යාධියෙක් පැණෙන්නේ නම්, ඒ ඉපැත්ම නින්දවට භාජන වේවා'යි සිතිවිලි සිතයි.

49. මහණෙනි, ඉක්බිති බන්ධුමත් රජ තෙම රියැදුරා කැඳවා, 'යහළු සැරිය, කිමෙක් ද, කුමර තෙම උයන්බිමැ ඇලුණේ ද? කිමෙක් ද, යහළු සැරිය, කුමර උයන් බිම සතුටු වී ද?'' යි පුළුවුත. ''දෙවයිනි, කුමරුවාණෝ උයන්බිමැ නො ම ඇලුණහ. දෙවයිනි, කුමරුවාණෝ උයන්බිමැ නො ම සතුටු වූහ''යි රියැදුරු කී ය. ''යහළු සැරිය, කුමර උයන්බිමට යනුයේ කුමක් දිටී ද?'' යි රජ පුළුවුත.

50. ''දෙවයිනි, කුමරුවාණෝ උයන් බිම වඩිනුවෝ දුකට පත් දඩි ගිලන් වූ සිය මලමූත්‍රයහි ගැලී හෝනා අනුන් විසින් නහා සිටුවනු ලබන අනුන් විසින් හිඳුවනු ලබන ලෙඩින් පෙළුණු මිනිසක්හු දුටහ. දැක, මා බණවා 'යහළු සැරිය, මෙ මිනිස් තෙම කුමක් කරනු ලැබුයේ ද? මොහුගේ ඇසුදු සෙස්සන්ගේ සේනො වෙයි, මොහුගේ කටහඬ ද සෙස්සන්ගේ මෙන් නොවේ යැ'යි කිවුය. 'දෙවයිනි, මේ වූ කලි ලෙඩින් පෙළුණේ නමැ'යි මම කීමි. 'යහළු සැරිය, මේ ලෙඩින් පෙළුණේ නම් කිමැ?'යි කුමරාණෝ පුළුවුත්හ. 'මෙ තෙම ඒ ලෙයින් නැඟී සිටුනේ නම් ඉතා යෙහෙකැ'යි පැතියැ යුතු වූ රොගියෙක් නමැ'යි කීමි. 'කිමෙක් ද, යහළු සැරිය, මමත් ලෙඩින් පෙළෙන සුල්ලෙම් ද? ලෙඩ නො ඉක්මියෙම් ද?''යි කුමරාණෝ පුළුවුත්හ. ''දෙවයිනි, මුඛත් අපිත් යන හැම දෙන ම ව්‍යාධිය ස්වභාව කොට ඇත්තම්හ, ව්‍යාධිය නො ඉක්මියමහ'යි මම කීමි. ''එසේ නම් යහළු සැරිය, අද දැන් උයන්බිමෙන් කම් නැත. මේ තැනින් ම ඇතොවුර බලා නික්මැ යා''යි කුමරාණෝ කීහ. ''දෙවයිනි, මම ද එසේ යැ, දෙවයිනි, කියා විපස්සී කුමාරයනට පිළිවදන් දී ඒ තැනින් ම ඇතොවුර බලා නික්මියෙමි. දෙවයිනි, ඇතොවුර වත් ඒ කුමරාණෝ දුක් ඇත්තෝ දෙමනස් ඇත්තෝ 'යම් ඉපැද්මෙකින් උපන්නාහට ජරාව පැණෙන්නේ නම්, ව්‍යාධිය පැණෙන්නේ නම් ඒ ඉපැද්ම නින්දවට භාජන වේවා'යි සිතිවිලි සිතත්'' යැයි රියැදුරු කී ය.

51. මහණෙනි, එකලැ බන්ධුමත් රජහට ''විපස්සී කුමර රජය නො ම නො කරවා, විපස්සී කුමර හිඟිගෙත් නික්මැ පැවිදි නො වේ වා, නෛමිත්තික බ්‍රාහ්මණයන්ගේ බස සත්‍ය නො වේ වා''යි මේ සිත විය.

Free Distribution www.aathaapi.org

52. අථ ඛො භික්ඛවෙ, බන්ධුමා රාජා - විපස්සිස්ස කුමාරස්ස භියේ‍යාසොමත්තාය පඤ්ච කාමගුණානි උපට්ඨපෙසි, යථා විපස්සී කුමාරො රජ්ජං කාරෙය්‍ය, යථා විපස්සී කුමාරො න අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය, යථා නෙමිත්තානං බ්‍රාහ්මණානං මිච්ඡා අස්ස වචනන්ති. තත්‍ර සුදං භික්ඛවෙ, විපස්සී කුමාරො පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙති.

53. අථ ඛො භික්ඛවෙ, විපස්සී කුමාරො බහුත්තං වස්සානං බහුත්තං වස්සසතානං බහුත්තං වස්සසහස්සානං අච්චයෙන සාරථිං ආමන්තෙසි: "යොජෙහි සම්ම සාරථි, භද්‍රානි භද්‍රානි යානානි, උය්‍යානභූමිං ගච්ඡාම සුභූමිං දස්සනායා"ති. 'එවං දෙවා'ති ඛො භික්ඛවෙ, සාරථි විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා භද්‍රානි භද්‍රානි යානානි යොජෙත්වා විපස්සිස්ස කුමාරස්ස පටිවෙදෙසි: "යුත්තානි ඛො තෙ දෙව, භද්‍රානි භද්‍රානි යානානි යස්ස'දානි කාලං මඤ්ඤසී"ති. අථ ඛො භික්ඛවෙ, විපස්සී කුමාරො භද්‍රං යානං අභිරුහිත්වා භද්‍රෙහි භද්‍රෙහි යානෙහි උය්‍යානභූමිං නිය්‍යාසි.

54. අද්දසා ඛො භික්ඛවෙ, විපස්සී කුමාරො උය්‍යානභූමිං නිය්‍යන්තො මහාජනකායං සන්නිපතිතං නානාරත්තානඤ්ච දුස්සානං විලාතං කයිරමානං, දිස්වා සාරථිං ආමන්තෙසි; "කින්නු ඛො සො සම්ම සාරථි, මහාජනකායො සන්නිපතිතො, නානාරත්තානඤ්ච දුස්සානං විලාතං කයිරති?"ති. "එසො ඛො දෙව, කාලකතො නාමා 'ති. "තෙන හි සම්ම සාරථි, යෙන සො කාලකතො තෙන රථං පෙසෙහී"ති. 'එවං දෙවා'ති ඛො භික්ඛවෙ, සාරථි විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා යෙන සො කාලකතො තෙන රථං පෙසෙසි.

55. අද්දසා ඛො භික්ඛවෙ, විපස්සී කුමාරො පෙතං කාලකතං දිස්වා සාරථිං ආමන්තෙසි: "කිම්පනායං සම්ම සාරථි, කාලකතො නාමා?"ති. "එසො ඛො දෙව කාලකතො නාම. න'දානි තං දක්ඛින්තී මාතා වා පිතා වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතා. සො'පි න දක්ඛිස්සති මාතරං වා පිතරං වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතෙ"ති. කිම්පන සම්ම සාරථි, අහම්පි මරණ ධම්මො මරණං අනතීතො? මම්පි න දක්ඛින්තී දෙවො වා දෙවී වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතා? අහම්පි න දක්ඛිස්සාමි දෙවං වා දෙවිං වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතෙ?"ති.

Free Distribution www.aathaapi.org

52. මහණෙනි, එකල්හි බන්ධුමත් රජ තෙම යමසේ විපස්සී කුමරු රජය කරවන්නේ ද, විපස්සී කුමරු ගිහිගෙය හැර පැවිදි නො වන්නේ ද, යම් සේ නිමිති කී බමුණන්ගේ බස බොරු වන්නේ ද, එසේ විපස්සී කුමරහට වඩාලාත් පස්කමගුණ එළැවී යැ. මහණෙනි, එහි විපස්සී කුමර තෙම පස්කමගුණයෙන් සමර්පිත වැ සමන්විත වැ ඉදුරන් හසුරුවයි.

53. මහණෙනි, ඉක්බිති විපස්සී කුමර තෙම බොහෝ හවුරුදු ගණනක්, බොහෝ හවුරුදු සියගණනක්, බොහෝ හවුරුදු දහස්ගණනක් ඇවෑමෙන් රියැදුරු බණවා, ''යහළු සැරිය, උතුම් යානයන් යොදවා සුහුම් වූ උයන්බිම දක්නට යමහ''යි කී ය. මහණෙනි, 'එසේ යැ, දෙවයිනි'යි කියා රියැදුරු තෙම විපස්සී කුමරහට පිළිවදන් දී උතුම් උතුම් යානයන් යොද, ''දෙවයිනි, මුබට උතුම් උතුම් යාන යොදන ලද. යම් ගමනකට කල් යැ යි සිතත් නම් දැන් එයට සුදුසු යැ''යි සැළ කෙළේ ය. මහණෙනි, එකල්හි විපස්සී කුමර තෙම උතුම් යානයක් නැඟ උතුම් උතුම් යානයන්ගෙන් උපලක්ෂිත වැ උයන්බිම බලා නික්මියේ ය.

54. මහණෙනි, විපස්සී කුමර උයන්බිම බලා යන්නේ එක්රැස් වැ නන්වැදෑරුම් රතුවතින් සිවිගෙයක් කරන මහ ජනමුළුවක් දිටී. දැක රියැදුරා අමතා ''යහළු සැරිය, මහ ජනමුළුවෙක් රැස් වැ නන්වැදෑරුම් රත්වතින් සිවිගෙයක් කුමට කෙරෙයි ද?''යි විචාළේ ය. ''දෙවයිනි, මෙහි මේ (මිනිසෙක්) කලුරිය කෙළේ නම් වේ ''යැයි රියැදුරු කී ය. ''යහළු සැරිය, එසේ නම් ඒ කලුරිය කළහු වෙතට රිය පදුව''යි කුමර කීය. 'එසේය දෙවයිනි' යි විපස්සී කුමරහට පිළිවදන් දී රියැදුරු තෙම ඒ කලුරිය කළහු වෙත රිය පැදවී ය.

55. මහණෙනි, විපස්සී කුමර තෙම ඉවත් වූ සිත් සතන් ඇති කලුරිය කළහු දිටී. දැක රියැදුරු බණවා ''යහළු සැරිය, මේ කලුරිය කෙළේ යනු කිමැ?''යි පුළුවුත. ''දෙවයිනි, දැන් මව හෝ පියා හෝ අන් සහලේ නැ කෙනෙක් හෝ ඔහු නො දක්නාහ. හේ ද මව හෝ පියා හෝ අන් සහලේ නැයන් හෝ නො දක්නේ ය. මෙසේ වූ තැනැත්තේ කලුරිය කෙළේ නම් වේ යැ''යි රියැදුරු කී ය. ''කිමෙක් ද යහළු සැරිය, මමත් මැරෙන සුල්ලෙමි ද? මරණය නො ඉක්මියෙමි ද? පිය රජ හෝ මාතෘ දෙවී හෝ අන් සහලේ නැයෝ හෝ මා නො දක්නාහු ද? මමත් පියරජු හෝ මාතෘදෙවිය හෝ අන් සහලේ නැයන් හෝ නො දක්නෙමි ද?''යි කුමර පුළුවුත.

Free Distribution www.aathaapi.org

''එසඤ්ච දෙව, මයඤ්චමඤ්ඤ සබ්බෙ මරණධම්මා මරණං අනතීතා. තම්පි න දක්ඛිත්‍යති දෙවෝ වා දෙවී වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතා. එවම්පි න දක්ඛිස්සසි දෙවං වා දෙවිං වාඅඤ්ඤෙ වා ඤාතිසාලොහිතෙ''ති.''තෙනහි සම්ම සාරථි, අලඤ්ඤනජ්ජ උය්‍යානභූමියා, ඉතෝ'ව අත්තෙනපුරං පවහනිය්‍යාහි''ති. 'එවං දෙවා'ති ඛො භික්ඛවෙ, සාරථි විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා, තත්තෝ'ව අත්තෙනපුරං පවහනිය්‍යාසි. තත්‍ර සුදං භික්ඛවෙ, විපස්සී කුමාරෝ අත්තෙනපුරගතෝ දුක්ඛී දුම්මනෝ පජ්ඣායති ''ධිරත්ථු කිර හෝ ජාති නාම, යත්‍ර හි නාම ජාතස්ස ජරා පඤ්ඤායිස්සති, බ්‍යාධි පඤ්ඤායිස්සති, මරණං පඤ්ඤායිස්සති''ති.

56. අථ ඛො භික්ඛවෙ, බන්ධුමා රාජා සාරථිං ආමන්තාපෙත්වා එතදවොච: ''කච්චි සම්ම සාරථි, කුමාරෝ උය්‍යානභූමියා අභිරමිත්ථ? කච්චි සම්මසාරථි, කුමාරෝ උය්‍යානභූමියා අත්තමනෝ අහොසි?ති''''න ඛො දෙව කුමාරෝ උය්‍යානභූමියා අභිරමිත්ථ, න ඛො දෙව කුමාරෝ උය්‍යානභූමියා අත්තමනෝ අහොසි''ති. ''කිම්පන සම්ම සාරථි, අද්දස කුමාරෝ උය්‍යානභූමිං නිය්‍යත්තෙත්වා?''ති.

57. ''අද්දසා ඛො දෙව, කුමාරෝ උය්‍යානභූමිං නිය්‍යාත්තෙත්වා මහාජනකායං සන්නිපතිතං නානාරත්තානඤ්ච දුස්සානං විලාතං කඨිරමානං, දිස්වා මං එතදවොච: 'කිඤ්හු ඛො සෝ සම්ම සාරථි, මහාජනකායෝ සන්නිපතිතෝ, නානාරත්තානඤ්ච දුස්සානං විලාතං කඨිරති?'ති 'එසෝ ඛො දෙව, කාලකතෝ නාමා'ති. 'තෙන හි සම්ම සාරථි, යෙන සෝ කාලකතෝ තෙන රථං පෙසෙහී'ති. 'එවං දෙවා'ති ඛො අහං දෙව, විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා යෙන සෝ කාලකතෝ තෙන රථං පෙසෙසිං. අද්දසා ඛො දෙව, කුමාරෝ පෙතං කාලකතං. දිස්වා මං එතදවොච; 'කිම්පනායං සම්ම සාරථි, කාලකතෝ නාමා?'ති. 'එසෝ ඛො දෙව, කාලකතෝ නාම, න'දනි තං දක්ඛිත්‍යති මාතා වා පිතා වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතා. සෝ'පි න දක්ඛිස්සති මාතරං වා පිතරං වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතෙ'ති. 'කිම්පන සම්ම සාරථි, අහම්පි මරණධම්මා මරණං අනතීතෝ? මම්පි න දක්ඛිත්‍යති දෙවෝ වා දෙවී වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතා? අහම්පි න දක්ඛිස්සාමි දෙවං වා දෙවිං වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතෙ?'ති. 'එසඤ්ච දෙව, මයඤ්චමඤ්ඤ සබ්බෙ මරණධම්මා මරණං අනතීතා. තම්පි න දක්ඛිත්‍යති දෙවෝ වා දෙවී වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතා. එවම්පි න දක්ඛිස්සසි දෙවං වා දෙවිං වා අඤ්ඤෙ වා ඤාතිසාලොහිතෙ'ති.'

Free Distribution www.aathaapi.org

''දෙවයිනි, මුඛ ද අපි ද යන හැම දෙන ම මැරෙන සුල්ලමිහ, මරණය නො ඉක්මියමිහ. පියරජාණෙනි හෝ මාතෘ දෙවී හෝ අන් සහලේනෑයෝ හෝ මුඛත් නො දක්නාහ. මුඛ ද පියරජාණන් හෝ මාතෘ දෙවිය හෝ අන් සහලේ නෑයන් හෝ නො දකිති' යි රියැදුරු කී ය. ''යහළු සැරිය, එසේ නම් අද උයන්බිමෙන් කම් නැත, මෙ තැනින් ම ඇතොවුර බලා ගිය මෙව''යි කුමර කී ය. මහණෙනි, රියැදුරු තෙම 'එසේ ය, දෙවයිනි' යි කියා විපස්සි කුමර හට පිළිවදන් දී එ තැනින් ම ඇතොවුර බලා නික්මිණ. මහණෙනි, විපස්සි කුමර එහි ඇතොවුරට ගියේ, දුක් ඇතියේ, දෙමනස් ඇතියේ, ''භවත්නි, යම් ඉපැද්මෙකින් උපන්නාහට ජරාව පැණෙන්නේ ද, ව්‍යාධිය පැණෙන්නේ ද, මරණය පැණෙන්නේ ද, එසේ වූ ඒ ඉපැද්ම නිත්දවට හාජන වේ වා'' යි කී ය.

56. මහණෙනි, එ කල්හි බන්ධුමත් රජ රියැදුරු කැඳවා ''යහළු සැරිය, කිම, කුමර තෙම උයන්බිමෑ ඇලුණේ ද? යහළු සැරිය, කිම, කුමර තෙම උයන්බිම කෙරෙහි සතුටු වී ද?''යි පුළුවුත. ''දෙවයිනි, කුමාරයාණෙනි උයන්බිමෑ නො ම ඇලුණහ. දෙවයිනි, කුමාරයාණෙනි උයන්බිම කෙරෙහි නො ම සතුටු වූහ'' යි රියැදුරු කී ය. ''යහළු සැරිය, කුමර උයන්බිම යනුයේ කුමක් දුටු ද?'' යි රජ පුළුවුත.

57. ''දෙවයිනි, කුමරාණෙනි උයන්බිම යනුවෝ රැස් වැ රත් පැ වතින් යිවිකාවක් කරන මහජන මුළුවක් දුටු. දැක මා අමතා 'යහළු සැරිය, කවර හෙයින් එ මහජනමුළුවෙක් රැස් වූයේ වේ ද, නත් රත්පැ වතින් සිවිගෙයකුත් කෙරේ ද?' යි විචාළේ ය. 'දෙවයිනි, මෙ තෙමේ කලුරිය කෙළේ නම් වේ' යැ යි මම කීමි. 'එසේ වී නම්, යහළු සැරිය, ඒ කලුරිය කළහු හොත් තැනට රිය පදව' යි කුමරාණෙනි කීහ. 'එසේ යැ දෙවයිනි' යි මම විපස්සි කුමරාණන්ට පිළිවදන් දී ඒ කලුරිය කළාහු වෙත රථය ගෙන ගියෙමි. දෙවයිනි, කුමරාණෙනි සිත්සතන් ඉවත් ව ගිය කලුරිය කළහු දුටුහ. දැක 'යහළු සැරිය, මේ කලුරිය කෙළේ යනු කිම ද?' යි මා විචාළේ ය. 'දෙවයිනි, දැන් ඔහු මාපියෝ හෝ අන් සහලේ නෑයෝ හෝ නො දක්නාහ. හෙ ද මව හෝ පියා හෝ අන් සහලේ නෑයන් හෝ නො දක්නේය. මේ කලුරිය කෙළේ නම් වේ' යැ යි මම කීමි. 'යහළු සැරිය, කිම, මමත් මැරෙන සුල්ලෙමි ද, මරණය නො ඉක්මියෙමි ද? මාත් පිය රජාණෙනි හෝ මාතෘ දෙවි හෝ අන් සහලේ නෑයෝ හෝ නො දක්නාහු ද? මමත් පිය රජාණන් හෝ මාතෘදෙවිය හෝ අන් සහලේ නෑයන් හෝ නො දක්ක හෙමි ද?' යි කුමරාණෙනි මා සුළුවුත් හ. 'දෙවයිනි, මුඛත් අපිත් යන හැම දෙනවෝ මැරෙන සුල්ලමිහ, මරණය නො ඉක්මියමිහ. පිය රජාණෙනි හෝ මාතෘ දේවි හෝ අන් සහලේ නෑයෝ හෝ මුඛත් නො දක්නාහ, මුඛ ද පියරජාණන් හෝ මාතෘ දේවිය හෝ අන් සහලේ නෑයන් හෝ දක්ක නො හෙති' යි මම කීමි.

Free Distribution www.aathaapi.org

'තෙන හි සම්ම සාරථි අලඤ්ඤාජ්ජ උය්‍යානභූමියං. ඉතෝ'ව අන්තෙපුරං පවිසාහී'ති. 'එවං දෙවා'ති ඛෝ අහං දෙව, විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා තතෝ'ව අන්තෙපුරං පාවිසිං. සෝ ඛෝ දෙව, කුමාරෝ අන්තෙපුරගතෝ දුකඛී දුම්මනෝ පජ්ඣායති: 'ධිරත්ථු කිර භෝ ජාති නාම යත්‍ර හි නාම ජාතස්ස ජරා පාතුභවිස්සති, ඛ්‍යාධි පාතුභවිස්සති, මරණං පාතුභවිස්සතී''ති.

58. අථ ඛෝ භික්ඛවෙ, බන්ධුමස්ස රඤ්ඤෝ එතදහොසි: ''මාහෙව ඛෝ විපස්සී කුමාරෝ න රජ්ජං කාරෙසි. මාහෙව විපස්සී කුමාරෝ අගාරස්මා අනගාරියං පබ්බජි. මාහෙව ඛෝ නෙමිත්තානං බ්‍රාහ්මණානං සච්චං අස්ස වචනාය.'' අථ ඛෝ භික්ඛවෙ, බන්ධුමා රාජා විපස්සිස්ස කුමාරස්ස භිය්‍යොසොමත්තාය පඤ්ච කාමගුණානි උපට්ඨාපෙසි, යථා විපස්සී කුමාරෝ රජ්ජං කාරෙය්‍ය, යථා විපස්සී කුමාරෝ න අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය, යථා නෙමිත්තානං බ්‍රාහ්මණානං මිච්ඡා අස්ස වචනාය. තත්‍ර සුදං භික්ඛවෙ විපස්සී කුමාරෝ පඤ්චහි කාමගුණෙහි සමප්පිතෝ සමඞ්ගීභූතෝ පරිචාරෙති.

59. අථ ඛෝ භික්ඛවෙ, විපස්සී කුමාරෝ බහූනං වස්සානං බහූනං වස්සසතානං බහූනං වස්සසහස්සානං අච්චයෙන සාරථිං ආමන්තෙසි: ''යොජෙහි සම්ම සාරථි, භද්දානි භද්දානි යානානි, උය්‍යානභූමිං ගච්ඡාම සුභූමිං දස්සනාය''ති. 'එවං දෙවා'ති ඛෝ භික්ඛවෙ, සාරථි විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා භද්දානි භද්දානි යානානි යොජෙත්වා විපස්සිස්ස කුමාරස්ස පටිවෙදෙසි: ''යුත්තානි ඛෝ තෙ දෙව, භද්දානි භද්දානි යානානි, යස්ස'දානි කාලං මඤ්ඤසී''ති. අථ ඛෝ භික්ඛවෙ, විපස්සී කුමාරෝ භද්දං යානං අභිරුහිත්වා භද්දෙහි භද්දෙහි යානෙහි උය්‍යානභූමිං නිය්‍යාසි.

60. අද්දසා ඛෝ භික්ඛවෙ, විපස්සී කුමාරෝ උය්‍යානභූමිං නිය්‍යාන්තෝ පුරිසං හණ්ඩුං පබ්බජිතං කාසාවවසනං දිස්වා සාරථිං ආමන්තෙසි: ''අයම්පන සම්ම සාරථි, පුරිසෝ කිඞ්කතෝ? සීසම්පි'ස්ස න යථා අඤ්ඤස්, වත්ථානි පි'ස්ස න යථා අඤ්ඤස්''නති. ''එසෝ ඛෝ දෙව, පබ්බජිතා නාමා''ති. කිම්පනෙසෝ සම්ම සාරථි, පබ්බජිතා නාමා?''ති. ''එසෝ ඛෝ දෙව පබ්බජිතෝ නාම: 'සාධු ධම්මචරියා, සාධු සමචරියා, සාධු කුසලකිරියා, සාධු පුඤ්ඤකිරියා, සාධු අවිහිංසා, සාධු භූතානුකම්පා''ති. ''සාධු ඛෝ සෝ සම්ම සාරථි, පබ්බජිතෝ නාම. සාධු සම්ම සාරථි, ධම්මචරියා, සාධු සමචරියා, සාධු කුසලකිරියා, සාධු පුඤ්ඤකිරියා, සාධු අවිහිංසා, සාධු භූතානුකම්පා. තෙන හි සම්ම සාරථි, යෙන සෝ පබ්බජිතෝ තෙන රථං පෙසෙහී''ති.

Free Distribution www.aathaapi.org

'යහළු සැරිය, එසේ වී නම් අද උයන් බිමෙන් කම් නැත. මෙ තැනින් ම ඇතොවුර බලා නික්මෙව' යි කුමරාණෝ කීහ. දෙවයිනි, මම 'එසේ ය, දෙවයිනි' යි කියා විපස්සී කුමරාණනට පිළිවදන් දී, එ තැනින් ම ඇතොවුර බලා නික්මිණිමි. දෙවයිනි, ඒ කුමරාණෝ ඇතොවුර වන්නෝ දුක් ඇත්තෝ, දෙමනස් ඇත්තෝ, 'භවත්නි, යම ඉපැද්මෙකින් උපන්නාහට ජරාව පැණෙන්නේ නම, ව්‍යාධිය පැනෙන්නේ නම, මරණය පැනෙන්නේ නම, ඒ ඉපැත්ම නින්දර්හ වේ වා' යි සිතිවිලි සිතත්'' යැ යි රියැදුරු සැළ කෙළේ ය.

58. මහණෙනි, එකල්හි බන්ධුමත් රජහට ''විපස්සී කුමර රජය නො ම නො කරවා වා, විපස්සී කුමර ගිහි ගෙන් නික්මැ පැවිද්දට නො ම වදී වා, නිමිත්තපාඨක බමුණන් බස් සබා නො වේ වා'' යි මෙ සිත වී ය. මහණෙනි, ඉක්බිති බන්ධුමත් රජ තෙම, යමසේ විපස්සී කුමර රජය කරවනු කැමැති වන්නේ ද, යමසේ විපස්සී කුමර ගිහිගෙන් නික්මැ නො ම පැවිදි වන්නේ ද, යමසේ නිමිත්තපාඨක බමුණන් බස් බොරු වන්නේ ද, එසේ විපස්සී කුමරහට වඩාලාත් පස්කම්ගුණ එළැවී ය. මහණෙනි, විපස්සී කුමාර තෙම එහි පස්කම්ගුණයෙන් සමර්පිත වැ සමන්විත වැ ඉඳුරන් හසුරුවයි.

59. මහණෙනි, එකල්හි විපස්සී කුමර තෙම බොහෝ හවුරුදු ගණනක් බොහෝ හවුරුදු සිය ගණනක් බොහෝ හවුරුදු දහස් ගණනක් ඇවෑමෙන් රියැදුරු අමතා, ''යහළු සැරිය, උතුම් උතුම් යාන යොදව, සුහුමියවූ උයන් බිම දක්නා පිණිස යමහ'' යි කීය. මහණෙනි, 'දෙවයිනි, එසේ යැ' යි කියා රියැදුරු තෙම විපස්සී කුමරහට පිළිවදන් දී උතුම් උතුම් යාන යොද 'දෙවයිනි, මුඛට උතුම් උතුම් යාන යොදන ලද. යම් ගමනකට කල් සිතත් නම් දැන් ඒ කාලය පැමිණියේ යැ' යි දැන්වී ය. මහණෙනි, ඉක්බිති විපස්සී කුමාර තෙම උතුම් යානයක් අරා උතුම් උතුම් යානයන්ගෙන් උපලක්ෂිත වැ උයන්බිම බලා නික්මිණ.

60. මහණෙනි, විපස්සී කුමාර තෙම උයන්බිම බලා නික්ම යනුයේ, හිසමුඩු, පැවිදි වූ, කසාවත් සන් පුරිසක්හු දුටුයේ ය. දැක, රියැදුරා අමතා, යහළු සැරිය, මෙ මිනිස් තෙම කුමක් කරනු ලැබූයෙක් ද? මොහු හිස ද සෙස්සන්ගේ මෙන් නො වේ, වස්ත්‍ර ද සෙස්සන්ගේ මෙන් නො වේ'' යැ යි කී ය. ''දෙවයිනි, පැවිද්ද නම මෙ තෙමේ''යි රියැදුරු කී ය. ''යහළු සැරිය, මේ පැවිද්ද නම කිමැ?'' යි කුමර පුළුවුන. ''දෙවයිනි, මෙ තෙම 'දහම් පුරනු මැනැවැ' යි, කෙලෙසුන් සංහිඳුවනු මැනැවැ යි, කුසල් කරනු මැනැවැ යි, පින් කරනු මැනැවැයි, අවිහිංසාව මැනැවැ යි, සත්ත්වානුකම්පාව මැනැවැ යි සිතා එය පුරනු පිණිස පැවිදි වූයේ නම් වේ''යැ යි රියැදුරු කී ය. ''යහළු සැරිය, ඒ පැවිද්ද නම් මැනැව, යහළු සැරිය, ධර්මචර්‍යාව මැනැව. ශමචර්‍යාව මැනැව. කුශල ක්‍රියාවමැනැව. පුණ්‍යක්‍රියාව මැනැව. අවිහිංසාව මැනැව. සත්ත්වානුකම්පාව මැනැව. යහළු සැරිය, එසේ නම් ඒ පැවිද්ද වෙතට රිය පදුව''යි කුමර කී ය.

Free Distribution www.aathaapi.org

'එවං දෙවා'ති ඛො භික්ඛවෙ, සාරථි විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා යෙන සො පබ්බජිතො තෙන රථං පෙසෙසි. අථ ඛො භික්ඛවෙ, විපස්සී කුමාරො තං පබ්බජිතං එතදවොච: "ත්වම්පන සම්ම, කිඞ්කතො? සීසම්පි තෙ න යථා අඤ්ඤෙසං, වත්ථානි'පි තෙ න යථා අඤ්ඤෙසන්ති?" "අහං ඛො දෙව, පබ්බජිතො නාමා"ති, "කිං පන ත්වං සම්ම, පබ්බජිතො නාමා?"ති. "අහං ඛො දෙව පබ්බජිතො නාම, 'සාධු ධම්මචරියා, සාධු සමචරියා, සාධු කුසල-කිරියා, සාධු පුඤ්ඤකිරිසා, සාධු අවිහිංසා, සාධු භූතානුකම්පා ති. "සාධු ඛො ත්වං සම්ම, පබ්බජිතො නාම, සාධු ධම්මචරියා, සාධු සමචරියා, සාධු කුසලකිරියා, සාධු පුඤ්ඤකිරියා, සාධු අවිහිංසා, සාධු භූතානුකම්පාති"

61. අථ ඛො භික්ඛවෙ, විපස්සී කුමාරො සාරථිං ආමන්තෙසි: "තෙන හි සම්ම සාරථි, රථං ආදය ඉතො'ච අන්තෙපුරං පච්චනිය්‍යාහි. අහං පන ඉධෙව කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිස්සාමි"ති. 'එවං දෙවා'ති ඛො භික්ඛවෙ සාරථි, විපස්සිස්ස කුමාරස්ස පටිස්සුත්වා රථං ආදය තතො'ච අන්තෙපුරං පච්චනිය්‍යාසි.

62. විපස්සී පන භික්ඛවෙ, කුමාරො තත්ථෙව කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජි. අස්සොසි ඛො භික්ඛවෙ, බන්ධුමතියා රාජධානියා මහාජනකායො චතුරාසීතිපාණසහස්සානි "විපස්සී කිර කුමාරො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පම්මජිතො"ති. සුත්වාන තෙසං එතදහොසි "න හි නූන සො ඔරකො ධම්මචිනයො, න සා ඔරකා[1] පබ්බජ්ජා, යත්ථ විපස්සී කුමාරො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො. විපස්සී'පි[2] නාම කුමාරො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිස්සති කිමඞ්ගපන මයන්ති?" අථ ඛො සො භික්ඛවෙ මහාජනකායො චතුරා-සීතිපාණසහස්සානි කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා විපස්සිං බොධිසත්තං අගාරස්මා අනගාරියං පබ්බජිතං අනුපබ්බජිංසු. තාය සුදං භික්ඛවෙ, පරිසාය පරිවුතො විපස්සි බොධිසත්තො ගාමනිගමජන-පදරාජධානීසු චාරිකං චරති.

63. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස රහොගතස්ස පටි-සලලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: න ඛො මෙතං පතිරූපං යො'හං ආකිණ්ණො විහරාමි, යන්නුනාහං එකො ගණ්ම්හා වූපකට්ඨො විහරෙය්‍යන්ති'. අථ ඛො භික්ඛවෙ විපස්සී බොධිසත්තො අපරෙන සමයෙන එකො ගණ්ම්හා වූපකට්ඨො විහාසි. අඤ්ඤෙනෙව තානි චතුරාසීතිපබ්බජිත-සහස්සානි අගමංසු, අඤ්ඤෙන විපස්සී බොධිසත්තො.

1. ඔරිකා—PTS.

2. විපස්සි හි—මජ්ජ.

Free Distribution www.aathaapi.org

මහණෙනි, රියැදුරු තෙම 'දෙවයිනි, එසේ යැ' යි කියා විපස්සී කුමරහට පිළිවදන් දී, ඒ පැවිද්ද වෙතට රිය පැදැවී ය. මහණෙනි, ඉක්බිති විපස්සී කුමාර තෙම ඒ පැවිද්ද ඛණවා, ''යහළු, මුඛ කුමක් කරනු ලැබුවෝ ද? මුඛ හිස ද සෙස්සන්ගේ මෙන් නො වේ. මුඛ හත් පෙරෙවි වත් ද සෙස්සන්ගේ මෙන් නො වේ'' යැ සි කී ය. ''දෙවයිනි, මම පැවිදි නම් වෙමි''යි හේ කී ය. ''යහළු, භවත් කවර හෙයින් පැවිදි නම් වෙයි හො?'' යි කුමර පුළුවුන. ''දෙවයිනි, මම 'ධර්මවයඃභාව මැනැව, ශමවයඃභාව මැනැව, කුශල ක්‍රියාව මැනැව, පුණ්‍යක්‍රියාව මැනැව, අවිහිංසාව මැනැව, සත්වානුකම්පාව මැනැවැ' යි පැවිදි වූයෙමි' යි හේ කී ය. ''යහළු, මුඛ 'ධර්මවයඃභාව මැනැවැ යි, ශමවයඃභාව මැනැවැ යි, කුශලක්‍රියාව මැනැවැ යි, පුණ්‍යක්‍රියාව මැනැවැ යි, අවිහිංසාව මැනැවැ යි, සත්වානුකම්පාව මැනැවැ' යි පැවිදි වූ සේ යහපතැ'' යි විපස්සී කුමර කී ය.

61. මහණෙනි, ඉක්බිති විපස්සී කුමාර තෙම රියැදුරු ඛණවා ''එසේ නම් යහළු සැරිය, රිය ගෙන මෙ තැනින් ම ඇතොවුර බලා යා. මම මෙහි ම කෙහෙ රවුළු ඛහවා කසාවත් හැඳ ගිහි ගෙන් පැවිදි වදනෙමි''යි කී ය. මහණෙනි, 'එසේ ය, දෙවයිනි' යි කියා රියැදුරු තෙම විපස්සී කුමරහට පිළිවදන් දී රිය ගෙන එ තැනින් ම ඇතොවුර බලා නික්මියේ ය.

62. විපස්සී කුමර එහිදී ම කෙහෙ රවුළු ඛහවා කසාවත් හැඳ ගිහි ගෙන් පැවිද්දට වන. මහණෙනි, බන්ධුමති රජදහන්හි සුවාසූදහසක් පමණ වූ මහජනමුළුව 'විපස්සී කුමරාණෝ කෙහෙ රවුළු ඛහවා කසාවත් හැඳ ගිහිගෙන් පැවිදි වන්හ' යි ඇසී. ඇසීමෙන් ඔවුනට ''යමෙක විපස්සී කුමරාණෝ කෙහෙරවුළු ඛහවා කසාවත් හැඳ ගිහි ගෙන් නික්මැ පැවිදි වන්හු නම්, ඒ දහම්විනය ඇති සස්න සුලු එකෙක් නො වේ ම ය. ඒ පැවිද්ද සුලු නො වේ ම ය. විපස්සී කුමරාණෝත් කෙහෙරවුළු ඛහවා කසාවත් හැඳ ගිහි ගෙන් නික්මැ පැවිදි වූහු නම්, අප ගැන කියනු ම කිමැ?''යි මෙ සිත් වී ය. මහණෙනි, ඉක්බිති සුවාසූදහසක් පමණ වූ ඒ මහජනමුළුව කෙහෙරවුළු ඛහවා කසාවත් හැඳ ගිහිගෙන් පැවිදි වන් විපස්සී බෝසතු අනුව පැවිදි වූහ. මහණෙනි, විපස්සී බෝසත් තෙම ඒ පිරිස විසින් පිරිවරන ලදු ව ගම්නියම්ගම්දනවුරජදහන්හි සැරි සරයි.

63. මහණෙනි, එ කල්හි හුදෙකලා වූ චිත්තවිවෙකයෙන් යුක්තවූ විපස්සී බෝසත්හට ''යම්බඳු වූ මම ගණයා විසින් පිරිවරන ලදු ව වෙසෙම් ද, එය මට නො සුදුසු ය. මම එකලා වැ, ගණයා කෙරෙන් වෙන් වැ, වෙසෙම් නම් මැනැවැ''යි මෙසේ චිත්තසංකල්පනාවෙක් උපන. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසත් තෙම පසු කලෙක එකලා වැ ගණයාගෙන් වෙන් වැ විසි ය. ඒ සුවාසූදහසක් පැවිද්දෝ අත් දෙසට ම ගියහ, විපස්සී බෝසත් අත් දෙසෙක ගියේ ය.

Free Distribution www.aathaapi.org

64. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස වාසූපගතස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "කිච්ඡං වතායං ලොකො ආපන්නො, ජායති ච ජීයති මීයති ච චවති ච උපපජ්ජති ච. අථ ච පනිමස්ස දුක්ඛස්ස නිස්සරණං නප්පජානාති ජරාමරණස්ස. කුදස්සු නාම ඉමස්ස දුක්ඛස්ස නිස්සරණං පඤ්ඤායිස්සති ජරාමරණස්සා?ති.

65. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො සති ජරාමරණං හොති, කිම්පච්චයා ජරාමරණ න්ති. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො "ජාතියා ඛො සති ජරාමරණං හොති, ජාතිපච්චයා ජරාමරණ"න්ති.

66. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො සති ජාති හොති කිම්පච්චයා ජාති" ති අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "භවෙ ඛො සති ජාති හොති, භව පච්චයා ජාති" ති.

67. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි:" කිම්හි නු ඛො සති භවො හොති කිම්පච්චයා භවො"ති. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "උපාදානෙ ඛො සති භවො හොති, උපාදානපච්චයා භවො"ති.

68. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි:"කිම්හි නු ඛො සති උපාදානං හොති කිම්පච්චයා උපාදානන්ති." අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "තණ්හාය ඛො සති උපාදානං හොති, තණ්හාපච්චයා උපාදානන්ති."

69. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො සති තණ්හා හොති, කිම්පච්චයා තණ්හා"ති. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "වෙදනාය ඛො සති තණ්හා හොති, වෙදනාපච්චයා තණ්හා"ති.

70. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො සති වෙදනා හොති, කිම්පච්චයා වෙදනා"ති. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "එසස ඛො සති වෙදනා හොති, එසසපච්චයා වෙදනා"ති.

71. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: "කිම්හි නු ඛො සති එසසා හොති, කිම්පච්චයා එසසා"ති. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: "සළායතනෙ ඛො සති එසසා හොති, සළායතනපච්චයා එසසා"ති.

Free Distribution www.aathaapi.org

64. මහණෙනි, ඒ කල්හි එකලා වූ චිත්තවිවේකයෙන් යුක්ත වූ (බෝමැඩ) උක්‌රුයක් විසීමට පැමිණි විපස්සී බෝසත්හට ''මෙදයෙක, මේ ලොවැසි තෙම දුකට පැමිණියේ ය. හේ උපදනේ ද දිරනුයේ ද මියෙනුයේ ද වෙයි. එසේ චුත වනුයේ ද යළි උපදනේද වේ. එතෙකුදු වුවත් මේ දුඃඛයාගේ, මේ ජරාමරණ දෙක්හි නිඃසරණය නො දනියි. කවර දක නම් මේ දුකේ නිඃසරණය පැණෙන්නේ ද'' යි මෙසේ චිත්තසංකල්පයෙක් පහළ විය.

65. මහණෙනි, ඒ කල්හි විපස්සී බෝසත්හට ''කුමක් ඇති කලැ ජරාමරණ වේ ද කිමෙක පසයෙන් ජරාමරණ වේ ද'' යි මේ සිත විය. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසත්හට ''ජාතිය ඇති කලැ ජරාමරණ වේ. ජාතිප්‍රත්‍යයයෙන් ජරාමරණ වේ'' යැ යි උපායමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය, අවබොධ වියයි සේ සි.

66. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසත්හට ''කුමක් ඇති කල්හි ජාතිය වේ ද කිමෙක පසයෙන් ජාතිය වේ ද'' යි මේ සිත විය. එකල්හි විපස්සී බෝසත්හට භවය ඇති කල්හි ජාතිය වේ. භවප්‍රත්‍යයයෙන් ජාතිය වේ' යැ යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

67. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසත්හට ''කුමක් ඇති කල්හි භවය වේ ද, කිමෙක ප්‍රත්‍යයයෙන් භවය වේ ද'' යි මේ සිත විය. මහණෙනි, එකල්හි විපස්සී බෝසත්හට ''උපාදනය ඇති කල්හි භවය වේ. උපාදනප්‍රත්‍යයයෙන් භවය වේ'' යැ යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

68. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසත්හට ''කුමක් ඇති කල්හි උපාදනය වේ ද, කිමෙක ප්‍රත්‍යයයෙන් උපාදනය වේ ද''යි මේ සිත විය. මහණෙනි, ඒ කල්හි විපස්සී බෝසත්හට ''තෘෂ්ණාව ඇති කල්හි උපාදනය වේ. තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදනය වේ''යැ යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

69. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බෝසත්හට ''කුමක් ඇති කල්හි තෘෂ්ණාව වේ ද, කිමෙක ප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ ද''යි මේ සිත විය. මහණෙනි, එකල්හි විපස්සී බෝසත්හට ''වෙදනාව ඇති කල්හි තෘෂ්ණාව වේ. වෙදනාප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ'' යැ යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

70. මහණෙනි, ඉක්බිති විපස්සී බෝසත්හට ''කුමක් ඇති කල්හි වෙදනාව වේ ද, කිමෙක ප්‍රත්‍යයයෙන් වෙදනාව වේ ද'' යි මේ සිත විය. මහණෙනි, ඒ කල්හි විපස්සී බෝසත්හට ''ස්පර්ශය ඇති කල්හි වෙදනාව වේ. ස්පර්ශප්‍රත්‍යයයෙන් වෙදනාව වේ'' යැ යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

71. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බෝසත්හට, ''කුමක් ඇති කල්හි ස්පර්ශය වේ ද, කිමෙක ප්‍රත්‍යයයෙන් ස්පර්ශය වේ ද'' යි මේ සිත විය. මහණෙනි, ඒ කල්හි විපස්සී බෝසත්හට ''ෂඩායතනය ඇති කල්හි ස්පර්ශය වේ. ෂඩායතනප්‍රත්‍යයයෙන් ස්පර්ශය වේ'' යැ යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

Free Distribution www.aathaapi.org

72. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: ''කිම්හි නු ඛො සති සළායතනං හොති, කිම්පච්චයා සළායතනන්ති'' අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: ''නාමරූපෙ ඛො සති සළායතනං හොති, නාමරූපපච්චයා සළායතනන්ති.''

73. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: ''කිම්හි නු ඛො සති නාමරූපං හොති, කිම්පච්චයා නාමරූපන්ති'' අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: ''විඤ්ඤාණෙ ඛො සති නාමරූපං හොති, විඤ්ඤාණපච්චයා නාමරූපන්ති.''

74. අථ ඛො භික්ඛවෙ. විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: කිම්හි නු ඛො සති විඤ්ඤාණං හොති, කිම්පච්චයා විඤ්ඤාණන්ති'' අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: ''නාමරූපෙ ඛො සති විඤ්ඤාණං හොති, නාමරූපපච්චයා විඤ්ඤාණන්ති.''

75. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: ''පච්චුදවත්තති ඛො ඉදං විඤ්ඤාණං, නාමරූපම්හා නාපරං ගච්ඡති. එත්තාවතා ජායෙථ වා ජීයෙථ වා චවෙථ වා උපපජ්ජෙථ වා, යදිදං නාමරූපපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති''ති.

76. 'සමුදයො, සමුදයො'ති ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

77. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: ''කිම්හි නු ඛො අසති ජරාමරණං න හොති, කිස්ස නිරොධා ජරාමරණනිරොධොති''ති. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: ''ජාතියා ඛො අසති ජරාමරණං න හොති, ජාතිනිරොධා ජරාමරණනිරොධොති''ති.

78. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: ''කිම්හි නු ඛො අසති ජාති න හොති, කිස්ස නිරොධා ජාතිනිරොධොති'' ති. අථ ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: ''භවෙ ඛො අසති ජාති න හොති, භවනිරොධා ජාතිනිරොධොති''ති.

Free Distribution www.aathaapi.org

72. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බෝසත්හට ''කුමක් ඇති කල්හි ෂඩායතනය වේ ද, කිමෙක ප්‍රත්‍යයයෙන් ෂඩායතනය වේ ද'' යි මේ සිත විය. මහණෙනි, එ කල්හි විපස්සී බෝසත්හට ''නාමරූපය ඇති කල්හි ෂඩායතනය වේ. නාමරූපප්‍රත්‍යයයෙන් ෂඩායතනය වේ'' යැ යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

73. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බෝසත්හට ''කුමක් ඇති කල්හි නාමරූපය වේ ද, කිමෙක ප්‍රත්‍යයයෙන් නාමරූපය වේ ද'' යි මේ සිත විය. මහණෙනි, එ කල්හි විපස්සී බෝසත්හට ''විඥානය ඇති කල්හි නාමරූපය වේ. විඥානප්‍රත්‍යයයෙන් නාමරූපය වේ'' යැ යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

74. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බෝසත්හට ''කුමක් ඇති කල්හි විඥානය වේ ද කිමෙක ප්‍රත්‍යයයෙන් විඥානය වේ ද'' යි මේ සිත විය. මහණෙනි, එකල්හි විපස්සී බෝසත්හට ''නාමරූපය ඇති කල්හි විඥානය වේ. නාමරූපප්‍රත්‍යයයෙන් විඥානය වේ'' යැ යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

75. මහණෙනි, එ කල්හි විපස්සී බෝසත්හට ''මේ විඥානය පෙරළා නවතී ම ය. නාමරූපයෙකින් බැහැරට නො යෙයි. මෙතෙකින් උපදනේ හෝ දිරනුයේ හෝ මියෙනුයේ හෝ චුත වන්නේ හෝ නැවැත උපදිනුයේ හෝ වේ. එ නම්: නාමරූපප්‍රත්‍යයයෙන් විඥානය වේ, විඥානප්‍රත්‍යයයෙන් නාමරූපය වේ, නාමරූපප්‍රත්‍යයයෙන් ෂඩායතනය වේ, ෂඩායතනප්‍රත්‍යයයෙන් ස්පර්ශය වේ, ස්පර්ශප්‍රත්‍යයයෙන් වේදනාව වේ, වේදනාප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ, තෘෂ්ණාප්‍රත්‍යයයෙන් උපාදානය වේ, උපාදානප්‍රත්‍යයයෙන් භවය වේ, භවප්‍රත්‍යයයෙන් ජාතිය වේ. ජාතිප්‍රත්‍යයයෙන් ජරාමරණ ද ශොකපරිදෙව දුක් දෙමනස් උපායාසයෝ ද පහළ වෙත්. මෙසේ මේ සියලු දුක් රැසේ ඉපැද්ම වේ'' යි මේ සිත විය.

76. මහණෙනි, විපස්සී බෝසත්හට 'ඉපැත්ම, ඉපැත්ම' යැ යි පෙර නො ඇසූ ධර්මවිෂයයෙහි ඇස පහළ විය, නුවණ පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලොකය පහළ විය.

77. මහණෙනි, එ කල්හි විපස්සී බෝසත්හට ''කුමක් නැති කල්හී ජරාමරණ නො වේ ද, කිමෙක නිරොධයෙන් ජරාමරණනිරොධය වේ ද'' යි මේ සිත විය. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බෝසත්හට ''ජාතිය නැති කලැ ජරාමරණය නො වේ. ජාතිනිරොධයෙන් ජරාමරණනිරොධය වේ යැ'' යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

78. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බෝසත්හට ''කුමක් නැති කලැ ජාතිය නො වේ ද, කිමෙක නිරොධයෙන් ජාතිනිරොධය වේ ද'' යි මේ සිත විය. මහණෙනි, එ කල්හි විපස්සී බෝසත්හට ''භවය නැති කලැ ජාතිය නො වේ. භවනිරොධයෙන් ජාතිනිරොධය වේ'' යැ යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

Free Distribution www.aathaapi.org

79. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: ''කිම්හි නු ඛො අසති භවො න හොති, කිස්ස නිරොධා භවනිරොධො''ති අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: ''උපාදනෙ ඛො අසති භවො න හොති, උපාදානනිරොධා භවනිරොධො''ති.

80. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: ''කිම්හි නු ඛො අසති උපාදානං න හොති, කිස්ස නිරොධා උපාදානනිරොධො''ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: ''තණ්හාය ඛො අසති උපාදානං න හොති, තණ්හානිරොධා උපාදානනිරොධො''ති.

81. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: ''කිම්හි නු ඛො අසති තණ්හා න හොති, කිස්ස නිරොධා තණ්හානිරොධො''ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: ''වෙදනාය ඛො අසති තණ්හා න හොති, වෙදනානිරොධා තණ්හානිරොධො''ති.

82. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: ''කිම්හි නු ඛො අසති වෙදනා න හොති, කිස්ස නිරොධා වෙදනානිරොධො''ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස. යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: ''ඵස්සෙ ඛො අසති වෙදනා න හොති, ඵස්සනිරොධා වෙදනානිරොධො''ති.

83. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: ''කිම්හි නු ඛො අසති ඵස්සා න හොති, කිස්ස නිරොධා ඵස්සනිරොධො''ති අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: ''සළායතනෙ ඛො අසති ඵස්සා න හොති, සළායතනනිරොධා ඵස්සනිරොධො''ති.

84. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: ''කිම්හි නු ඛො අසති සළායතනං න හොති, කිස්ස නිරොධා සළායතනනිරොධො?''ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසොමනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: ''නාමරූපෙ ඛො අසති සළායතනං න හොති, නාමරූපනිරොධා සළායතනනිරොධො''ති.

Free Distribution www.aathaapi.org

79. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බෝසත්හට ''කුමක් නැති කලැ භවය නො වේ ද, කිමෙක නිරොධයෙන් භවනිරොධය වේ ද'' යි මේ සිත විය. මහණෙනි, එකලැ විපස්සී බෝසත්හට ''උපාදානය නැති කලැ භවය නො වේ. උපාදානනිරොධයෙන් භවනිරොධය වේ'' යැ යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

80. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බෝසත්හට ''කුමක් නැති කලැ උපාදානය නො වේ ද, කිමෙක නිරොධයෙන් උපාදානනිරොධය වේ ද'' යි මේ සිත විය. මහණෙනි, එ කලැ විපස්සී බෝසත්හට ''තෘෂ්ණාව නැති කල්හි උපාදානය නො වේ, තෘෂ්ණානිරොධයෙන් උපාදානනිරොධය වේ'' යැ යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

81. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බෝසත්හට ''කුමක් නැති කලැ තෘෂ්ණාව නො වේ ද, කිමෙක නිරොධයෙන් තෘෂ්ණානිරොධය වේ ද'' යි මේ සිත විය. මහණෙනි, එ කලැ විපස්සී බෝසත්හට ''වෙදනාව නැති කලැ තෘෂ්ණාව නො වේ. වෙදනානිරොධයෙන් තෘෂ්ණානිරොධය වේ'' යැ යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

82. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බෝසත්හට ''කුමක් නැති කලැ වෙදනාව නො වේ ද, කිමෙක නිරොධයෙන් වෙදනානිරොධය වේ ද'' යි මේ සිත විය. ''මහණෙනි, එ කලැ විපස්සී බෝසත්හට ''ස්පර්ශය නැති කලැ වෙදනාව නො වේ. ස්පර්ශනිරොධයෙන් වෙදනා-නිරොධය වේ'' යැ යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

83. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බෝසත්හට ''කුමක් නැති කලැ ස්පර්ශය නො වේ ද, කිමෙක නිරොධයෙන් ස්පර්ශනිරොධය වේ ද''යි මේ සිත විය. මහණෙනි, එකලැ විපස්සී බෝසත්හට ''ෂඩායතනය නැති කලැ ස්පර්ශය නො වේ. ෂඩායතනනිරොධයෙන් ස්පර්ශනිරොධය වේ'' යැ යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

84. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බෝසත්හට 'කුමක් නම් නැති කලැ ෂඩායතන නො වේ ද? කිමෙක නිරොධයෙන් ෂඩායතනනිරොධය වේ ද?'' යි මේ සිත විය. මහණෙනි, එකලැ විපස්සී බෝසත්හට ''නාමරූප නැති කලැ ෂඩායතන නො වේ. නාමරූපනිරොධයෙන් ෂඩායතන නිරොධය වේ'' යැයි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

Free Distribution www.aathaapi.org

85. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: ''කිම්හි නු ඛො අසති නාමරූපං න හොති, කිස්ස නිරොධා නාමරූපනිරොධො?'' ති අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: ''විඤ්ඤාණෙ ඛො අසති නාමරූපං න හොති, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො'' ති.

86. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: 'කිම්හි නු ඛො අසති විඤ්ඤාණං න හොති, කිස්ස නිරොධා විඤ්ඤාණනිරොධො?'' ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස යොනිසො මනසිකාරා අහු පඤ්ඤාය අභිසමයො: ''නාමරූපෙ ඛො අසති විඤ්ඤාණං න හොති. නාමරූපනිරොධා විඤ්ඤාණනිරොධො'' ති.

87. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස එතදහොසි: ''අධිගතො ඛො ම්‍යායං[1] මග්ගො සම්බොධාය[2]: යදිදං නාමරූපනිරොධාය විඤ්ඤාණනිරොධො' විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරොධා සළායතනනිරොධො, සළායතනනිරොධා ඵස්සනිරොධො, ඵස්සනිරොධා වෙදනානිරොධො, වෙදනානිරොධා තණ්හානිරොධො, තණ්හානිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති'' ති. ''නිරොධො, නිරොධො'' ති ඛො භික්ඛවෙ විපස්සිස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි:

88. අථ ඛො භික්ඛවෙ විපස්සී බොධිසත්තො අපරෙන සමයෙන පඤ්චසූපාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සී විහාසි: ''ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථඞ්ගමො. ඉති වෙදනා, ඉති වෙදනාය සමුදයො, ඉති වෙදනාය අත්ථඞ්ගමො. ඉති සඤ්ඤා, ඉති සඤ්ඤාය සමුදයො, ඉති සඤ්ඤාය අත්ථඞ්ගමො. ඉති සඞ්ඛාරා, ඉති සඞ්ඛාරානං සමුදයො, ඉති සඞ්ඛාරානං අත්ථඞ්ගමො. ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථඞ්ගමො'' ති. තස්ස පඤ්චසු උපාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සිනො විහරතො න චිරස්සෙව අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චි'' ති.

දුතියං භාණවාරං නිට්ඨිතං.

---

1. මෙ අයං විපස්සනාමග්ගෝ PTS
2. බොධාය සත්‍ය

Free Distribution www.aathaapi.org

85. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බෝසත්හට ''කුමක් නම් නැති කලැ නාමරූප නො වේ ද? කිමෙක නිරොධයෙන් නාමරූපනිරොධය වේ ද?'' යි මේ සිත විය. මහණෙනි, එකල්හි විපස්සී බෝසත්හට ''විඤ්ඤාණය නැති කලැ නාමරූපය නො වේ. විඤ්ඤාණනිරොධයෙන් නාමරූපනිරොධය වේ යැ'යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

86. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බෝසත්හට ''කුමක් නම් නැති කලැ විඤ්ඤාණය නො වේ ද? කිමෙක නිරොධයෙන් විඤ්ඤාණනිරොධය වේ ද?'' යි මේ සිත විය. මහණෙනි, එ කලැ විපස්සී බෝසත්හට 'නාමරූපය නැති කලැ විඤ්ඤාණය නො වේ. නාමරූපනිරොධයෙන් විඤ්ඤාණනිරොධය වේ'' යැ යි යොනිසොමනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

87. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බෝසත්හට ''නාමරූප නිරොධයෙන් විඤ්ඤාණනිරොධය වේ. විඤ්ඤාණනිරොධයෙන් නාමරූපනිරොධය වේ. නාමරූපනිරොධයෙන් ෂඩායතනනිරොධය වේ. ෂඩායතනනිරොධයෙන් ස්පර්ශනිරොධය වේ. ස්පර්ශනිරොධයෙන් වේදනානිරොධය වේ. වේදනානිරොධයෙන් තෘෂ්ණානිරොධය වේ. තෘෂ්ණානිරොධයෙන් උපාදානනිරොධය වේ. උපාදානනිරොධයෙන් භවනිරොධය වේ. භවනිරොධයෙන් ජාතිනිරොධය වේ. ජාතිනිරොධයෙන් ජරාමරණ සොක පරිදෙව දුක් දෙම්නස් උපායාස යන මොහු නිරුද්ධ වෙත්. මෙසේ මේ සියලු දුක් රැසේ නිරොධය වේ'' යැ යි මේ සිත විය. මහණෙනි, විපස්සී බෝසත්හට 'නිරොධය, නිරොධයැ' යි ම පෙර නො ඇසූ දහම්හි ඇස උපන, නුවණ උපන, ප්‍රඥාව උපන, විද්‍යාව උපන, ආලොකය උපන.

88. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සී බෝසත් තෙම පසු කලෙක ''රූපය මෙසේ ය, රූපසමුදයය මෙසේ ය, රූපනිරොධය මෙසේ ය. වේදනාව මෙසේ ය, වේදනාසමුදයය මෙසේ ය, වේදනානිරොධය මෙසේ ය. සංඥාව මෙසේ ය, සංඥාසමුදයය මෙසේ ය, සංඥානිරොධය මෙසේ ය. සංස්කාරයෝ මෙසේ ය, සංස්කාරසමුදයය මෙසේ ය, සංස්කාරනිරොධය මෙසේ ය. විඤ්ඤාණය මෙසේ ය, විඤ්ඤාණසමුදයය මෙසේ ය, විඤ්ඤාණනිරොධය මෙසේ යැ'' යි උපාදානස්කන්ධ පසෙහි ඉපැත්මත් නැස්මත් අනුව බලන සුලු ව විසි ය. උපාදානස්කන්ධ පසෙහි උදය ව්‍යයය අනුව බලන සුලු ව වසන ඒ බෝසත්හුගේ සිත නොබෝ කලෙකින් ම උපාදාන රහිත වැ ආස්‍රවයන් කෙරෙන් මිදුණේ ය.

දෙවෙනි බණවර නිමියේ ය.

Free Distribution www.aathaapi.org

89. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස එතදහොසි: "යන්නූනාහං ධම්මං දෙසෙය්‍ය"න්ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස එතදහොසි: "අධිගතො ඛො ම්‍යායං ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිතවෙදනීයො. ආලයාරාමා ඛො පනායං පජා ආලයරතා ආලයසම්මුදිතා. ආලයාරාමාය ඛො පන පජාය ආලයරතාය ආලයසම්මුදිතාය දුද්දසං ඉදං ඨානං යදිදං ඉදප්පච්චයතාපටිච්චසමුප්පාදො. ඉදම්පි ඛො ඨානං දුද්දසං යදිදං සබ්බ සඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං අහඤ්චෙ ච ඛො පන ධම්මං දෙසෙය්‍යං, පරෙ ච මෙ න ආජානෙය්‍යුං සො මමස්ස කිලමථො, සා මමස්ස විහෙසා ති, අපිස්සුදං[1] භික්ඛවෙ විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං ඉමා අනච්ඡරියා ගාථායො පටිභංසු පුබ්බෙ අස්සුතපුබ්බා:

"කිච්ඡෙන මෙ අධිගතං හලං'දනි පකාසිතුං,
රාගදෙසපරෙතෙහි නායං ධම්මො සුසම්බුධො.
පටිසොතගාමිං නිපුණං ගම්භීරං දුද්දසං අණුං,
රාගරත්තා න දක්ඛින්ති තමොක්ඛන්ධෙන ආවුතා"ති.

ඉතිහ භික්ඛවෙ විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පටිසංචික්ඛතො අප්පොස්සුක්කතාය චිත්තං නමී, නො ධම්මදෙසනාය.

90. අථ ඛො භික්ඛවෙ අඤ්ඤතරස්ස මහාබ්‍රහ්මුනො විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස වෙතසා වෙතොපරිවිතක්කමඤ්ඤාය එතදහොසි: "නස්සති වත හො ලොකො, විනස්සති වත හොලොකො, යත්‍ර හි නාම විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අප්පොස්සුක්කතාය චිත්තං නමති නො ධම්මදෙසනායා"ති. අථ ඛො සො භික්ඛවෙ මහාබ්‍රහ්මා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව බ්‍රහ්මලොකෙ අන්තරහිතො විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පුරතො පාතුරහොසි.

91. අථ ඛො සො භික්ඛවෙ මහාබ්‍රහ්මා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දක්ඛිණං ජානුමණ්ඩලං පුථුවියං නිහන්ත්වා,[2] යෙන විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධා තෙනඤ්ජලිං පනාමෙත්වා විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතදවොච: "දෙසෙතු භන්තෙ භගවා ධම්මං, දෙසෙතු සුගතො ධම්මං සන්ති[3] සත්තා අප්පරජක්ඛජාතිකා. අස්සවනතා ධම්මස්ස පරිහායන්ති. භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො"ති.

1. අපිස්සු PTS. මජ්ඣං
2. නිදහන්තො – ස්‍යා,
3. සන්තීධ – ස්‍යා,

Free Distribution www.aathaapi.org

89. මහණෙනි, ඉක්බිත්තෙන් භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදු රජුට මම දහම් දෙසන්නෙමි නම් මනා ම නු'' යි මේ සිත විය. මහණෙනි, එ කල්හි භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදු රජහට 'මා විසින් අවබොධ කරන ලද මේ ධර්මය ගැඹුරු ය, දුකසේ දක්ක යුතු ය, දුකසේ අවබොධ කටයුතු ය, ශාන්තය, ප්‍රණීත ය, තර්කයෙන් බැස ගත නො හැක්කේ ය, සියුම් නුවණැත්තවුන් විසින් දන ගත යුතු ය. මේ සත්මුළුව ආලය සංඛ්‍යාත කාමගුණ තෘෂ්ණාවන්ගෙන් සතුටු වන්නේ ය, ආලයයන්හි ඇලුණේ ය, ආලයයන්හි ප්‍රමුදිත ය. ආලයයන්ගෙන් සතුටුවන, ආලයයන්හි ඇලුණ, ආලයයන්හි දැඩි සේ මුදිත වූ සත්මුළුව විසින් ඉදම්ප්‍රත්‍යයතා ප්‍රතීත්‍යසමුත්පාද නම් වූ යමෙක් ඇද්ද, ඒ මේ කාරණය දක්නට දුෂ්කර ය. සර්වසංස්කාරශමථය, සර්වොපධිප්‍රතිනිඃසර්ගය, තෘෂ්ණාක්ෂයය, විරාගය, නිරොධය, නිර්වාණයැ යි කියන ලද යම් මේ දහමෙක් වේ ද, මේ කාරණය ද දක්ම දුෂ්කර ය. ඉදින් මම දහම් දෙසීම් නම්, අන්හුත් මගේ ඒ දහම් දන නො ගන්නාහු නම්, එය මා කයට ක්ලමථයෙක් වන්නේ ය. මා කයට වෙහෙසෙක් වන්නේ යැ' යි මේ සිත විය. මහණෙනි, එපමණක් නො ව වැලිඳ භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුරජුට පෙර නො ඇසූවිරූ, සිතත් සිතත් ආශ්චර්‍ය්‍ය එළවන මේ ගාථාවෝ ද වැටහුණහ:

''මා විසින් දුකසේ අවබොධ කරන ලද ධර්මය ප්‍රකාශ කරන්නට දන් නො සුදුසු ය. (දන් එය පැවැසීමෙන් වන වැඩෙක් නැත) මෙය රාගද්වේෂාදී කෙලෙසුන්ගෙන් මැඩුණුවුන් විසින් සුවසේ අවබොධ කට හැකි නො වේ. උඩුහොයට යන (ශාස්‍වතසංඥාදියට විරුද්ධ අනිත්‍ය සංඥාදි වශයෙන් පැවැති) නිපුණ වූ ගැඹුරු වූ දුකසේ දක්ක යුතු වූ අණු (සූක්ෂම) වූ මේ ධර්මය රාගයෙන් රත් වූ අවිද්‍යාරාශියෙන් ඇවුරුණු සත්වයෝ නො දක්නාහ.''

මහණෙනි, මෙසේ නුවණින් සලකන භගවත් අර්හත් විපස්සී සම්මා-සම්බුදුන්ගේ සිත මන්දෙත්සාහී බවට නැඹුණේ ය, දහම් දෙසුමට නො නැඹුණේ ය.

90. මහණෙනි, එ කල්හි භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන්ගේ චිත්තසංකල්පනාව සිය සිතින් දනගැන්මෙන් එක්තරා මහබඹකුහට ''භවත්නි, යම් ලොවෙක භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන්ගේ සිත මන්දෙත්සාහ බවට නැමේ ද, දහම් දෙසුමට නො නැමේ ද, ඒ ලොකය නැසේම ය. භවත්නි, ඒ ලොකය එකාන්තයෙන් වැනැසේම ය'' යි මේ සිත විය. මහණෙනි, එකෙණෙහි ඒ මහබඹ තෙම ශක්තිමත් පුරුෂයෙක් යම් සේ හැකුලූ අත දිගු කරන්නේ ද, දිගු කළ අත හෝ හකුලන්නේ ද, එ සෙයින් ම බඹලොවැ අතුරුදහන් වූයේ භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන් ඉදිරියෙහි පහළ විය.

91. මහණෙනි, ඉක්බිත්තෙන් ඒ මහබඹ තෙම උතුරුසඟ එකස් කොට දකණු දණමඬල බිමැ හැන භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන් දෙසට ඇදිලි නමා වැඳ ''වහන්ස, භගවත්හු දහම් දෙසත් වා. සුගත්හු දහම් දෙසත් වා. අල්පරජස්කඇස්වහාව (පැණැස්හි අල්ප වූ රාගාදි රජස්) ඇති සත්හු ඇත්හ. ඔහු දහම් නො අසන බැවින් පිරිහෙති. දහම් දත හෙන්නෝ වන්නාහ'' යි ඔබට මේ බස් කී ය.

Free Distribution www.aathaapi.org

92. අථ ඛො භික්ඛවෙ විපස්සිං භගවා අරහං සම්මාසම්බුද්ධං තං මහාබ්‍රහ්මානං එතදවොච: "මය්හම්පි ඛො බ්‍රහ්මෙ, එතදහොසි: "යන්නූනාහං ධම්මං දෙසෙය්‍ය'න්ති. තස්ස මය්හං බ්‍රහ්මෙ, එතදහොසි: 'අධිගතො ඛො ම්‍යායං ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිතවෙදනීයො. ආලයාරාමා ඛො පනායං පජා ආලයරතා ආලයසම්මුදිතා. ආලයාරාමාය ඛො පන පජාය ආලයරතාය ආලයසම්මුදිතාය දුද්දසං ඉදං ඨානං යදිදං ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදෙ ඉදම්පි ඛො ඨානං දුද්දසං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං අහඤ්චෙව ඛො පන ධම්මං දෙසෙය්‍යං, පරෙ ච මෙ න ආජානෙය්‍යුං, සෙ මමස්ස කිලමථො, සා මමස්ස විහෙසා"ති. අපිසුදං මං බ්‍රහ්මෙ ඉමා අනච්ඡරියා ගාථායො පටිභංසු පුබ්බෙ අස්සුතපුබ්බා:

"කිච්ඡෙන මෙ අධිගතං හලන්දානි පකාසිතුං,
රාගදෙසපරෙතෙහි නායං ධම්මො සුසම්බුද්ධො.
පටිසොතගාමිං නිපුණං ගම්භීරං දුද්දසං අණුං
රාගරත්තා න දක්ඛින්ති තමොක්ඛන්ධෙන[1] ආවුතා"ති

ඉතිහ මෙ බ්‍රහ්මෙ පටිසංචික්ඛතො අප්පොස්සුක්කතාය චිත්තං නමි, නො ධම්මදෙසනාය"ති.

දුතියම්පි ඛො භික්ඛවෙ සො මහාබ්‍රහ්මා -පෙ- තතියම්පි ඛො භික්ඛවෙ ඡා මහාබ්‍රහ්මා විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතදවොච: "දෙසෙතු භන්තෙ භගවා ධම්මං, දෙසෙතු සුගතො ධම්මං, සන්ති සත්තා අපරජ්ඣකජාතිකා. අස්සවණතා ධම්මස්ස පරිහායන්ති. භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො"ති.

93. අථ ඛො භික්ඛවෙ විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො බ්‍රහ්මුනො ච අජ්ඣෙසනං විදිත්වා සත්තෙසු ච කාරුඤ්ඤතං පටිච්ච බුද්ධචක්ඛුනා ලොකං වොලොකෙසි. අද්දසා ඛො භික්ඛවෙ විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො බුද්ධචක්ඛුනා ලොකං වොලොකෙන්තො සත්තෙ අපරජ්ඣකෙ මහාරජ්ඣකෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ සවාකාරෙ අවාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ, අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ

1. නමොක්ඛන්ධෙන ආවුතා ම ජ ස.

Free Distribution www.aathaapi.org

92. මහණෙනි, එ කල්හි භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු ඒ මහබඹහු බණවා, ''බ්‍රහ්මය, මට ද ඉදින් මම දහම් දෙසන්නෙම් මනා මැ නු'' යි මේ සිත විය. ''බ්‍රහ්මය, ඒ මට 'මා විසින් අවබොධ කරන ලද මේ ධර්මය වූ කලි ගැඹුරු ය, දුකසේ දක්ක යුතු ය, දුකසේ අනුබොධ කටයුතු ය, ශාන්ත ය, ප්‍රණීත ය, තර්කයෙන් බැස ගත නො හැකි ය, සියුම් ය, පණ්ඩිතයන් විසින් දත යුතු ය. මේ සත්වප්‍රජාව ආලයාරාමය, (පස්කම්ගුණයෙහි බැඳුණේ ය) ආලයරත ය (පස්කම්ගුණයෙහි ඇලුණේ ය) ආලයසම්මුදිත ය (පස්කම්ගුණයෙහි සතුටු වූයේ ය). ආලයාරාම වූ ආලයරත වූ ආලයසම්මුදිත වූ සත්ත්වප්‍රජාව විසින් ඉදම්ප්‍රත්‍යයතා ප්‍රතීත්‍යසමුත්පාද සංඛ්‍යාත මේ කාරණය දුකසේ දක්ක යුතු ය. සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන්ගේ දුරු ලීම, තෘෂ්ණාක්ෂයය, විරාගය, නිරොධය, නිර්වාණය යන මේ කරුණ ද දුකසේ දක්ක යුතු ය. මමත් දහම් දෙසන්නෙම් නම්, අන්හු මා දෙසන දහම් දැන නො ගන්නාහු නම්, එය මට ක්ලාන්තයෙකි. එය මට වෙහෙසෙකි' යි මේ සිත විය. තව ද බ්‍රහ්මය, පෙර නොඇසුවිරූ, සිතත් සිතත් ආශ්චර්‍ය්‍ය එලවන මේ ගාථාවෝ මට වැටහුණාහ.

''මා විසින් දුකසේ අවබෝධ කරන ලද ධර්මය ප්‍රකාශ කරන්නට දැන් නො සුදුසු ය. රාගද්වේෂාදි කෙලෙසුන්ගෙන් මැඩුණවුන් විසින් මේ ධර්මය සුවසේ අවබොධ කට හැකි නො වේ. උඩුහොයට (නිවන් කරා) යන සුලු, නිපුණ වූ, ගැඹුරු වූ දුකසේ දක්ක යුතු වූ, සියුම් වූ මේ ධර්මය රාගයෙන් රත්වූ මොහඳුරුරැසින් ඇවුරුණාහු නො දක්නාහ.''

බ්‍රහ්මය, මෙසේ සලකන මගේ සිත අල්පොත්සුක බවට නැමුණේ ය, දහම් දෙසීමට නො නැමුණේ යැ'' යි (විපස්සී බුදුහු වදළහ).

මහණෙනි, දෙවෙනි වර ද ඒ මහාබ්‍රහ්ම තෙම ... මහණෙනි, තෙවෙනි වර ද ඒ මහාබ්‍රහ්ම තෙම භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදු රජුනට ''වහන්ස, භගවත් තෙමේ දහම් දෙසා වා. සුගත තෙමේ දහම් දෙසා වා. (පැණැස්හි) මඳ කෙලෙස් රජස් ඇති සත්හු ඇත්හ. දහම් නො අසන බැවින් ඔහු පිරිහෙත්. දහම් දත හෙන්නෝ ඇතිවන්නාහ'' යි මෙ බස් කිවු ය.

93. මහණෙනි, එකලැ භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු බඹහුගේ අයදනා ද ලැබ, සතුන් කෙරෙහි කරුණාව ද නිසා බුදු ඇසින් ලොව බැලූහ. මහණෙනි, භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු බුදුඇසින් ලොව බලනුවෝ අල්ප කෙලෙස් රජස් ඇතියන් ද, බොහෝ කෙලෙස් රජස් ඇතියන් ද, තියුණු (සඳහැ ඇ) ඉඳුරන් ඇතියන් ද, මෘදු වූ (සැදැහැ ඇ) ඉඳුරන් ඇතියන් ද, (සැදැහැ ඇ) මනා අයුරු ඇතියන් ද, නොමනා අයුරු ඇතියන් ද, සුවසේ අඟවනු හැකියන් ද, දුකසේ අඟවනු හැකියන් ද, පරලොවත් වරදත් භය වශයෙන් දක්නාසුලු වැ වසන ඇතැම් පුගුලන් ද, පරලොවත් වරදත් භයවශයෙන් නො දක්නාසුලු ව වසන ඇතැම් පුගුලන් ද යි මෙසේ නානාවිධ වූ සත්ත්වයන් දුටුහ.

Free Distribution www.aathaapi.org

සෙය්‍යථාපි නාම උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවද්ධානි උදකානුග්ගතානි අන්තොනිමුග්ගපොසීනි, අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙන ජනානි උදකෙ සංවද්ධානි සමොදකං ඨිතානි, අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවද්ධානි උදකා අච්චුග්ගම්ම තිට්ඨන්ති අනුපලිත්තානි උදකෙන, එවමෙව ඛො භික්ඛවෙ විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො බුද්ධචක්ඛුනා ලොකං වොලොකෙන්තො අද්දස සත්තෙ අපරප්පෙකෙ මහාරප්පෙකෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ සවාකාරෙ ඛවාකාරෙ සුවිඤ්ඤාපයෙ දුව්විඤ්ඤාපයෙ, අප්පෙකච්චෙ පරලොකවජ්ජභය-දස්සාවිනො විහරන්තෙ, අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ.

94. අථ ඛො සො භික්ඛවෙ මහාබ්‍රහ්මා විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං ගාථාහි අජ්ඣභාසි:

"සෙලෙ යථා පබ්බතමුද්ධනිට්ඨිතො
යථාපි පස්සෙ ජනතං සමන්තතො,
තථූපමං ධම්මමයං සුමෙධ
පාසාදමාරුය්හ සමන්තචක්ඛු,
සොකාවතිණ්ණං ජනතමපෙතසොකො
අවෙක්ඛස්සු ජාතිජරාභිභූතං.
උට්ඨෙහි වීර විජිතසඞ්ගාම සත්ථවාහ අණණ විචර ලොකෙ
දෙසස්සු[1] භගවා ධම්මං අඤ්ඤාතාරො භවිස්සන්තී"ති.

95. අථ ඛො භික්ඛවෙ විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො තං මහාබ්‍රහ්මානං ගාථාය අජ්ඣභාසි:

"අපාරුතා තෙසං අමතස්ස දුවාරා
යෙ සොතවන්තො පමුඤ්චන්තු සද්ධං
විහිංසසඤ්ඤී පගුණං න භාසිං
ධම්මං පණීතං මනුජෙසු බ්‍රහ්මෙ"ති.

අථ ඛො සො භික්ඛවෙ මහාබ්‍රහ්මා "කතාවකාසො ඛො'මහි විපස්සිනා භගවතා අරහතා සම්මාසම්බුද්ධෙන ධම්මදෙසනායා"ති විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

1. දෙසෙතු PTS.

Free Distribution www.aathaapi.org

යම්සේ උපුල්විලෙක හෝ රත්පියුම්විලෙක හෝ හෙළපියුම්විලෙක හෝ ඇතැම් උපුල්හු හෝ රත්පියුම්හු හෝ හෙළපියුම්හු හෝ දියෙහි උපන්නාහු දියෙහි වැඩුණාහු දියෙන් නො නැගුණාහු දිය තුළැ ම ඊලී වැඩෙන්නාහු වෙත් ද, ඇතැම් උපුල්හු හෝ රත්පියුම්හු හෝ හෙළ පියුම්හු හෝ දියෙහි උපන්නාහු දියෙහි වැඩුණාහු (දිය මතුපිටැ) දිය හා සම වැ සිටියාහු වෙත් ද, ඇතැම් උපුල්හු හෝ රත්පියුම්හු හෝ හෙළ පියුම්හු හෝ දියෙහි උපන්නාහු දියෙහි වැඩුණාහු දියෙන් උඩට නැගුණාහු දියෙන් නො තැවරී සිටිත් ද, මහණෙනි, එසේ ම භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු බුදු ඇසින් ලොව බලනුවෝ අල්පරජස්ක සත්වයන් ද, මහාරජස්ක සත්වයන් ද, තියුණු ඉඳුරන් ඇති සත්වයන් ද, මොළොක් ඉඳුරන් ඇති සත්වයන් ද, මනා අයුරු ඇති සත්වයන් ද, නොමනා අයුරු ඇති සත්වයන් ද, සුව සේ ඇඟැවිය හැකි සත්වයන් ද, දුක සේ ඇඟැවිය හැකි සත්වයන් ද, පරලොවත් වරදත් භය විසින් දක්නා සුලු ව වසන ඇතැම් සත්වයන් ද, පරලොවත් වරදත් භය විසින් නොදක්නා සුලු ව වසන ඇතැම් සත්වයන් ද දුටුහ.

94. මහණෙනි, ඉක්බිත්තෙන් ඒ මහාබ්‍රහ්ම තෙම තම සිතින් භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන්ගේ චිත්තසංකල්පනාව දැන ඔබට ගාථායෙන් කී ය:

''සෙල්මුවා පව්වක් මතැ සිටියෙක් හාත්පස සිටින දනමුළුව යම්සේ දක්නේ ද, සොඳුරු නුවණ ඇති සමතැසියාණන් වහන්ස, පහ වූ ශොක ඇති ඔබ ඒ සෙල්පව්ව බඳු වූ (ලොවුතුරා) දහම්මුවා පහය අරා, ශොකයට බටුවාවූ ජාතිජරායෙන් මැඩුණු දනමුළුව බලාවදුළ මැනැව. දිනූ මරයුද ඇති ණයනැති සාර්ථවාහයන් වහන්ස, නැගි සිටිනු මැනැව. ලොවැ සැරිසරනු මැනැව. භාග්‍යවතුන් වහන්ස, දහම් දෙසන්නැ. දහම් දැනැ ගන්නෝ ඇති වන්නාහ.''

95. මහණෙනි, එකලැ භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු ඒ මහාබ්‍රහ්මයාට ගාථායෙන් මෙසේ වදළහ:

''බ්‍රහ්මය, කන් ඇති යම් කෙනෙක් වෙත් නම්, ඔහු සැදහැ මුදත් වා (ශ්‍රද්ධාව යොමු කොට තබත්වා) ඔවුනට අමාදෙර හරන ලදි. නො දක හෙන්නවුනට දහම් දෙසීම වෙහෙස පමණෙකැ යි හැඟීම ඇතියෙම් ප්‍රගුණ වූ උතුම් දහම් සත්නට නො කිමි.''

මහණෙනි, ඉක්බිත්තෙන් ඒ මහාබ්‍රහ්ම තෙම 'භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන් විසින් දම් දෙසනුවට කරන ලද පිළින ඇතියෙමි' යි භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන් ආදරයෙන් වැඳ පැදකුණු කොට එහි ම අතුරුදහන් විය.

Free Distribution www.aathaapi.org

96. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස භගවතො අරහතො සම්මා-සම්බුද්ධස්ස එතදහොසි: ''කස්ස නු ඛො අහං පඨමං ධම්මං දෙසෙය්‍යං, කො ඉමං ධම්මං ඛිපමෙව ආජානිස්සති''ති. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස එතදහොසි: ''අයං ඛො ඛණ්ඩො ච රාජපුත්තො තිස්සො ච පුරොහිතපුත්තො බන්ධුමතියා රාජධානියා පටිවසන්ති පණ්ඩිතා වියත්තා මෙධාවිනො දීඝරත්තං අප-රජක්ඛජාතිකා. යන්නූනාහං ඛණ්ඩස්ස ච රාජපුත්තස්ස තිස්සස්ස ච පුරොහිතපුත්තස්ස පඨමං ධම්මං දෙසෙය්‍යං. තෙ ඉමං ධම්මං ඛිපමෙව ආජානිස්සන්ති''ති.

97. අථ ඛො භික්ඛවෙ විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො, සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව ඛොධිරුක්ඛමූලෙ අන්තර-හිතො බන්ධුමතියා රාජධානියා මෙමෙ මිගදයෙ පාතුරහොසි. දථ ඛො භික්ඛවෙ විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො දයපාලං ආමන්තෙසි ''එහි ත්වං සම්ම දයපාල බන්ධුමතිං රාජධානිං පවිසිත්වා ඛණ්ඩඤ්ච රාජපුත්තං තිස්සඤ්ච පුරොහිතපුත්තං එවං වදෙහි: ''විපස්සී භන්තෙ භගවා අරහං සම්මාසම්බුද්ධො බන්ධුමතිං රාජධානිං අනුපපත්තො මෙමෙ මිගදයෙ විහරති. සො තුම්හාකං දස්සනකාමො''ති. එවං භන්තෙ'ති ඛො භික්ඛවෙ දයපාලො විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පටිස්සු ත්වා බන්ධුමතිං රාජධානිං පවිසිත්වා ඛණ්ඩඤ්ච. රාජපුත්තං තිස්සඤ්ච පුරොහිතපුත්තං එතදවොච; ''විපස්සී භන්තෙ භගවා අරහං සම්මාසම්බු-ද්ධො බන්ධුමතිං රාජධානිං අනුපපත්තො මෙමෙ මිගදයෙ විහරති, සො තුම්හාකං දස්සනකාමො''ති.

98. අථ ඛො භික්ඛවෙ ඛණ්ඩො ච රාජපුත්තො තිස්සො ච පුරොහිතපුත්තො භද්‍රානි භද්‍රානි යානානි යොජාපෙත්වා භද්‍රං යානං අභිරුහිත්වා භද්‍රෙහි භද්‍රෙහි යානෙහි බන්ධුමතියා රාජධානියා නිය්‍යංසු, යෙන මෙමෙ මිගදයො තෙන පායංසු. යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකා ච යෙන විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. තෙසං විපස්සි භගවා අරහං සම්මාසම්බුද්ධො ආනුපුබ්බිං කථං කථෙසි, සෙය්‍යථීදං; දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං තෙසඤ්ඤෙව ච නිස්සංසං පකාසෙසි. යදා තෙ භගවා අඤ්ඤාසි කල්ලචිත්තෙ මුදුචිත්තෙ විනීවරණචිත්තෙ උදග්ගචිත්තෙ පසන්නචිත්තෙ, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා තං පකාසෙසි: දුක්ඛං සමුදයං නිරොධං මග්ගං සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමෙව ඛණ්ඩස්ස ච රාජපුත්තස්ස ච තිස්සස්ස ච පුරොහිත-පුත්තස්ස තස්මිං යෙව ආසනෙ විරජං විතමලං ධම්මචක්ඛුං උදපාදි ''යං කිඤ්චි සමුදයධම්මං, සබ්බන්තං නිරොධධම්මන්ති''.

Free Distribution www.aathaapi.org

96. මහණෙනි, එකල්හි ''මම කාට නම් පළමු කොට දහම් දෙසන්නෙම් ද, කවරෙක් මේ දහම් වහා අවබොධ කරන්නේ ද'' යි භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුනට මේ සිත විය. ඉක්බිති භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුනට ''මේ බන්ධ නම් රාජපුත්‍ර ද තිස්ස නම් පෙරෙව්පුත් ද යන පණ්ඩිත වූ ව්‍යක්ත වූ නුවණැති දික් කලක් අල්පරජස්කස්වභාවය ඇති මොහු බන්ධුමතී රාජධානියෙහි වෙසෙත්. බන්ධ රාජපුත්‍රයාටත් තිස්ස පෙරෙව්පුතුටත් මම පළමු කොට දහම් දෙසීම් නම් මැනැවි. ඔහු මේ දහම් වහා ම දනැගන්නාහ'' යි මේ සිත විය.

97. මහණෙනි, ඉක්බිති භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු කාබලැති මිනිසෙක් යම්සේ වක්කළ අත දික් කරන්නේ ද දික් කළ අත වක්කරන්නේ ද එසේම ඛේරුක්මුලැ අතුරුදහන් ව බන්ධුමති රජදහන්හි ක්ෂේම නම් මුවවෙනෙහි පහළ වූහ. මහණෙනි, ඉක්බිත්තෙන් භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු උයන්පලු බණවා ''යහලු දයපාලයෙනි, තෙපි මෙහි එවු. බන්ධුමතී රජදහනට පිවිසැ බන්ධ නම් රජපුතුට ද තිස්ස නම් පෙරෙව්පුතුට ද 'ස්වාමීනි, භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු බන්ධුමතී රාජධානියට වැඩියාහු ක්ෂේම නම් මෘගදවයෙහි වෙසෙති. ඔබ මුබ (දෙදෙනා) දක්නා කැමැත්තාහ' යි මෙසේ කියව'' යි වදළහ. මහණෙනි 'එසේ ය, වහන්ස' යි කියා උයන්පල් තෙම භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුනට පිළිවදන් දී බන්ධුමති රජදහන් වැද, බන්ධ නම් රජපුතුට ද තිස්ස නම් පෙරෙව්පුතුට ද ''ස්වාමීනි, භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුරජහු බන්ධුමති රජදහනට වැඩ මෙම නම් මුවලැවිනි වැඩවෙසෙති. ඔබ මුබ දෙදෙනා දක්නා කැමැත්තාහ'' යි සැළ කෙළේ ය.

98. මහණෙනි, එ කල්හි බන්ධ රජපුත් ද තිස්ස පෙරෙව්පුත් ද සොඳුරු සොඳුරු යාන යොදවා, සොඳුරු යානයකට නැඟ, සොඳුරු සොඳුරු යානයන්ගෙන් උපලක්ෂිත වැ බන්ධුමති රජදහනින් නික්මුණහ. ක්ෂේම මෘගදවය කරා ගියහ. යානයට සුදුසු බිම යම් තාක් ද එ තාක් යානයෙන් ගොය් (එයින් පසු) යානයෙන් බැස පාගමන් ඇත්තාහු ම භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුරජුන් කරා එළැඹියහ. එළැඹ ඔබ වැඳ පසෙක හිඳ ගත්හ. පසෙක හුන් ඔවුනට භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු – දානකථා ද ශීලකථා ද ස්වර්ග කථා ද, කාමයන්ගේ දෝෂ ද ලාමක බව ද කිලිටි බව ද කාමයෙන් නික්මීමේ අනුසස් ද යන පිළිවෙළ කථාව දක්වා වදළහ. භගවත්හු යම් විටෙක නීරොග සිත් ඇති වූ මොළොක් සිත් ඇති වූ නීවරණරහිත සිත් ඇති වූ ඔදවැඩි සිත් ඇති වූ පහන් සිත් ඇති වූ ඔවුන් දක්නාහු ද, එ කල්හි දුඃඛ සමුදය නිරොධ මාර්ග යන බුදුවරුන්ගේ අනුන් ගෙන් නොඅසූ තමන්ම දැනගත් ස්වයම්භූඥානයෙන් දත් යම් ධර්ම දෙශනාවෙක්වේ ද, එය දක්වා වදළහ. යම්සේ පහ වූ කළුපැහැ ඇති පිරිසිදු වස්ත්‍රයෙක් මොනොවට රඳන් උරා ගන්නේ ද, එසේ ම බන්ධ නම් රජපුතුට ද තිස්ස නම් පෙරෙව්පුතුට ද එ අස්නෙහි ම ''උපදනාසුලු සියල්ල නැසෙනසුලු යැ'' යි කෙලෙස්රජස් රහිත, පහ වූ කෙලෙස්මල ඇති දහම් ඇස් පහළ විය.

Free Distribution www.aathaapi.org

99. තෙ දිට්ඨධම්මා පත්තධම්මා විදිතධම්මා පරියොගාළ්හධම්මා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථුසාසනෙ විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතදවොචුං ''අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය 'චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති'ති, එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එතෙ මයං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාම ධම්මඤ්ච, ලභෙය්‍යාම මයං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං, ලභෙය්‍යාම උපසම්පදන්ති''.

100. අලත්ථුං ඛො භික්ඛවෙ බණ්ඩා ච රාජපුත්තො තිස්සො ච පුරොහිතපුත්තො විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථුං උපසම්පදං. තෙ විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. සංඛාරානං ආදිනවං ඔකාරං සංකිලෙසං නිබ්බානෙ ච ආනිසංසං පකාසෙසි. තෙසං විපස්සිනා භගවතා අරහතා සම්මාසම්බුද්ධෙන ධම්මියා කථාය සන්දස්සියමානානං සමාදපියමානානං සමුත්තෙජියමානානං සම්පහංසියමානානං න චිරස්සෙව අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසු.

101. අස්සොසි ඛො භික්ඛවෙ බන්ධුමතියා රාජධානියා මහාජනකායො චතුරාසීතිපාණසහස්සානි ''විපස්සී කිර භගවා අරහං සම්මාසම්බුද්ධො බන්ධුමතිං රාජධානිං අනුප්පත්තො ඛෙමෙ මිගදායෙ විහරති. බණ්ඩා ච කිර රාජපුත්තො තිස්සො ච පුරොහිතපුත්තො විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සන්තිකෙ කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතා''ති. සුත්වාන නෙසං එතදහොසි: ''න හි නූන සො ඔරකො ධම්මවිනයො, න සා ඔරකා පබ්බජ්ජා, යත්ථ ඛො බණ්ඩා ච රාජපුත්තො තිස්සො ච පුරොහිතපුත්තො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතා. බණ්ඩා ච නාම රාජපුත්තො තිස්සො ච පුරොහිතපුත්තො විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සන්තිකෙ කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිස්සන්ති, කිමඩ්ගපන මයන්ති.''

Free Distribution www.aathaapi.org

99. ඔහු දුටු සිවුසස් දහම් ඇතියාහු, පැමිණි සිවුසස්දහම් ඇතියාහු, දන්නා ලද සිවුසස් දහම් ඇතියාහු, නුවණින් බැස ගත් සිවුසස් දහම් ඇතියාහු, සිඳුණු සැක ඇතියාහු, පහවූ සංසය ඇතියාහු, විසාරද බවට පැමිණියාහු. ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යය නැතියාහු භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුනාට ''වහන්ස, දම් දෙසූ නියා ඉතා මැනැවි. වහන්ස, දම් දෙසූ නියා ඉතා මැනැවි. යම්සේ යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ ද, වැසුණු දෙයක් වැස්ම හැර දක්වන්නේ ද, මංමුළා වූවකුට මඟ කියන්නේ ද, 'ඇස් ඇත්තන් රූප දකිති' යි අඳුරෙහි තෙල්පහනක් දරන්නේ ද, එසේ ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කරුණින් ධර්මය පැවැසිණ. වහන්ස, මේ අපි භාග්‍යවතුන් වහන්සේ ද ධර්මය ද සරණ යමිහ. වහන්ස, අපි භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිද්ද ලබමෝ වා, උපසම්පදව ලබමෝ වා'' යි මේ බස් පැවැසූහ.

100. මහණෙනි, බඳ්ධ රජපුත් ද තිස්ස පෙරෙවිපුත් ද භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන් වෙත පැවිද්ද ලදහ, උපසපුව ලදහ. භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු ඔවුනට දහම් කථායෙන් කරුණු දක්වූහ, එය මොනෙවට ගැන්වූහ, එහි ඔවුන් සිත් තියුණු කළහ, එහි සතුටු කළහ. සංස්කාරකයන්ගේ ආදීනව ද ලාමක බව ද කෙලෙසීම ද, නිවනෙහි අනුසස් ද පැවැසූහ. භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුරජුන් විසින් දහම් කතාවෙන් කරුණු දක්වනු ලබන, කරුණු ගන්වනු ලබන, එදහම් කතායෙහි තියුණු කරනු ලබන, එහි සතුටු කරනු ලබන ඔවුන්ගේ සිත් නොබෝ කල්හි ම උපාදන රහිත ව ආසුව කෙරෙන් මිදිණ.

101. මහණෙනි, බන්ධුමති රජදහන්හි ප්‍රාණීන් සුවාසුදහසක් වූ මහ ජනමුළුව ''භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු බන්ධුමති රජදහනට වැඩියාහු ක්ෂේම නම් මෘගදවයෙහි වැඩ වෙසෙති. බඳ්ධ රජපුත් ද තිස්ස පෙරෙවිපුත් ද භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුරජුන් වෙතැ කෙහෙරවුළු බහවා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම පැවිදි වන්හ'' යි ඇසී ය. ඇසීමෙන් ඔවුනට ''බඳ්ධ රජපුතුන් තිස්ස පෙරෙවිපුතුන් කෙහෙරවුළු බහවා ගිහිගෙන් නික්ම යම් සස්නෙක පැවිදි වූහු නම්, ඒ දහම්විනය (සස්න) එසේ මෙසේ එකෙක් නො වේ. ඒ පැවිද්ද ද එසේ මෙසේ එකෙක් නො වේ. බඳ්ධ රජපුතුත් තිස්ස පෙරෙවිපුතුත් ගිහි ගෙන් නික්මැ භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන් වෙත පැවිදි වූහු නම්, අප පැවිදි වනු අරුම දැ!'' යි මේ සිත වී ය.

Free Distribution www.aathaapi.org

102. අථ ඛො සො භික්ඛවෙ මහාජනකායො චතුරාසීතිපාණසහස්සානි බන්ධුමතියා රාජධානියා නික්ඛමිත්වා යෙන බෙමො මිගදයො, යෙන විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො, තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු තෙසං විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො ආනුපුබ්බිං කථං කථෙයි සෙය්යථීදං – දානකථං සීලකථං සංග්ගකථං, කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං, නෙක්ඛම්මෙ ච ආනිසංසං පකාසෙසි. යදා තෙ භගවා අඤ්ඤාසි කල්ලචිත්තෙ මුදුචිත්තෙ විනීවරණචිත්තෙ පසන්නාචිත්තෙ, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා තං පකාසෙසි: දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්ය. එවමෙව තෙසං චතුරාසීතිපාණසහස්සානං තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි. "යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මන්ති."

103. තෙ දිට්ඨධම්මා පත්තධම්මා විදිතධම්මා පරියොගාළ්හධම්මා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථුසාසනෙ විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතදවොචුං: "අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ. සෙය්යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්ය, පටිච්ඡන්නං වා විවරෙය්ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්ය. 'චක්ඛු-මන්තො රූපානි දක්ඛින්තී'ති එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එතෙ මයං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්යාම මයං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්යාම උපසම්පදන්ති. අලත්ථුං ඛො භික්ඛවෙ තානි චතුරා-සීතිපාණසහස්සානි විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථුං උපසම්පදං.

104. තෙ විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි, සඞ්ඛාරානං ආදීනවං ඔකාරං සංකිලෙසං නිබ්බානෙ ච ආනිසංසං පකාසෙසි: තෙසං විපස්සිනා භගවතා අරහතා සම්මාසම්බුද්ධෙන ධම්මියා කථාය සන්දස්සියමානානං සමාදපියමානානං සමුත්තෙජියමානානං සම්පහංසියමානානං න චිරස්සෙව අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසු.

Free Distribution www.aathaapi.org

102. මහණෙනි, ඉක්බිත්තෙන් ප්‍රාණීන් සුවාසූදහසක් වූ ඒ මහදනමුළුව භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන් කරා ගියහ. නොස් ඔබ වැඳ පසෙක හිඳ ගත්හ. ඔවුනට භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු දානකථා ශීලකථා ස්වර්ගකථා ද, කාමයන්ගේ ආදීනව ද ලාමකබව ද කෙලෙසීම ද, කාමයෙන් නික්මීමෙහි අනුසස් ද යන පිළිවෙළ කතාව වදළහ. භගවත්හු යම් විටෙක නිරොඟ සිතැති මොළොක් සිතැති නීවරණරහිත සිතැති ඔදවැඩි සිතැති පහන් සිතැති ඔවුන් දක්නාහු ද, එ කල්හි, දුඃඛ සමුදය නිරොධ මාර්ග යන බුදුවරුන්ගේ තමන් විසින් ම අවබොධ කළ යම් ධර්ම දෙශනාවෙක් ඇද්ද එය පැවැසූහ. යම්සේ පහ වූ කළුපැහැ ඇති පිරිසිදු වස්ත්‍රය මොනොවට රඳන් උරා ඖන්නේ ද, එසේ ම ඒ සුවාසූදහසක් ප්‍රාණීනට එ අස්නෙහි ම ''උපදනා සුලු යමෙක් ඇත් ද, ඒ සියල්ල නැසෙන සුලු යැ'' යි කෙලෙස්රජස් පහ වූ කෙලෙස්මල පහ වූ දහම් ඇස පහළ විය.

103. දුටු සියුසස් දහම් ඇති, පැමිණි සියුසස්දහම් ඇති, දැනගත් සියුසස් දහම් ඇති, නුවණින් බැස ගත් සියුසස් දහම් ඇති, තරණය කළ විචිකිච්ඡා ඇති, පහ වූ සැක ඇති, විශාරද බවට පැමිණි, ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යය රහිත ඔහු භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුනට ''වහන්ස, දෙශනාව ඉතා මැනැවි. වහන්ස, දෙශනාව ඉතා මැනැවි. වහන්ස, යම්සේ යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ ද වැසුණ දයක් හෝ විවෘත කරන්නේ ද, මං මුළා වූවක්හට මඟ හෝ කියන්නේ ද, 'ඇස් ඇතියන් රූප දකිති' යි අඳුරේ තෙල්පහනක් හෝ දරන්නේ ද, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කරුණින් දහම් වදරන ලද්දේ ය. වහන්ස, ඒ අපි භාග්‍යවතුන් වහන්සේ ද ධර්මය ද භික්ෂුසංඝයා ද සරණ යමිහ. වහන්ස, අපි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලබමෝ වා, උපසපුව ලබමෝ වා'' යි මෙ බස් කීහ. මහණෙනි, ඒ සුවාසූ දහසක් මිනිස්සු භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන් ගේ සමීපයෙහි පැවිද්ද ලැබූහ, උපසපුව ලැබූහ.

104. භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු දැහැමිකතායෙන් ඔවුනට කරුණු දක්වූහ. කරුණු ගැන්වූහ, එහි ඔවුන් සිත් තියුණු කළහ, සතුටු කළහ. සංස්කාරයන් ගේ ආදීනව ද, ලාමක බව ද, කෙලෙසීම ද, නිවනෙහි අනුසස් ද පැවැසූහ. භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන් විසින් දැහැමි කතායෙන් කරුණු දක්වනු ලබන, කරුණු ගන්වනු ලබන, එහි තියුණු කරනු ලබන, සතුටු කරනු ලබන ඔවුන් සිත් නොබෝ කලෙකින් ම උපාදානරහිත ව ආස්‍රවයන්ගෙන් මිදිණ.

Free Distribution www.aathaapi.org

105. අථ ඛො භික්ඛවෙ, තාසං පුරිමාසං චතුරාසීතිපබ්බජිත-සහස්සානං: 'විපස්සී කිර භගවා අරහං සම්මාසම්බුද්ධෝ බන්ධුමතිං රාජධානිං අනුපපත්තෝ තෙමෙ මිගදයෙ විහරති, ධම්මඤ්ච කිර දෙසෙති'ති. අථ ඛො භික්ඛවෙ, තාසං චතුරාසීතිපබ්බජිතසහස්සානං යෙන බන්ධුමතී රාජධානී යෙන තෙමෙ මිගදයෝ යෙන විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධෝ, තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.

106. තෙසං විපස්සී භගවා අරහ සම්මාසම්බුද්ධෝ ආනුපුබ්බිං කථං කථෙසි–සෙය්‍යථීදං: දානකථං, සීලකථං සග්ගකථං, කාමානං ආදීනවං ඔකාරං සඞ්කිලෙසං, නෙක්ඛම්මෙ ච ආනිසංසං පකාසෙසි. යදා තෙ භගවා අඤ්ඤාසි කල්ලචිත්තෙ මුදුචිත්තෙ විනීවරණචිත්තෙ උදග්ගචිත්තෙ පසන්න-චිත්තෙ, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා, තං පකාසෙසි දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමෙව තෙසං චතුරාසීතිපබ්බජිතසහස්සානං තස්මිංයෙව ආසනෙ විරජං විතමලං. ධම්මචක්ඛුං උදපාදි ''යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මන්ති.''

107. තෙ දිට්ඨධම්මා පත්තධම්මා විදිතධම්මා පරියොගාළ්හධම්මා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථු-සාසනෙ විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතදවොචුං: ''අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ..., සෙය්‍යථාපි නාම භන්තෙ, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය 'චක්ඛු-මන්තො රූපානි දක්ඛින්තී'ති, එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එතෙ මයං භන්තෙ, භගවන්තං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්‍යාම මයං භන්තෙ, භගවතො සන්තිකෙ පබ්බජ්ජං, ලභෙය්‍යාම උපසම්පදන්ති.'' අලත්ථුං බො භික්ඛවෙ, තාසි චතුරාසීති-පබ්බජිතසහස්සානි විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථුං උපසම්පදං.

108. තෙ විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධෝ ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. සඞ්ඛාරානං ආදීනවං ඔකාරං සඞ්කිලෙසං නිබ්බානෙ ච ආනිසංසං පකාසෙසි. තෙසං විපස්සිනා භගවතා අරහතා සම්මාසම්බුද්ධෙන ධම්මියා කථාය සන්දස්සියමානානං සමාදපියමානානං සමුත්තෙජියමානානං සම්පහංසියමානානං න චිරස්සෙව අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසු.

Free Distribution www.aathaapi.org

105. මහණෙනි, ඒ සුවාසූදහසක් පළමු පැවිද්දෝ 'භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු බන්ධුමතී රාජධානියට වැඩියාහු ක්ෂේම නම් මෘගදවයෙහි වෙසෙත් ලු, දහම් ද දෙසත් ලැ' යි ඇසූහ. මහණෙනි, ඉක්බිත්තෙන් ඒ සුවාසූදහසක් පැවිද්දෝ බන්ධුමතී රාජධානිය යම් තැනක ද, ක්ෂේම මෘගදවය යම් තැනෙක ද, භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු යම් තැනෙක ද, එ තැනට එළැඹියහ. එළැඹ භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන් වැඳ එක් පසෙක හිඳගත්හ.

106. ඔවුනට භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු දනකථා ශීලකථා ස්වර්ගකථා ද, කාමයන්ගේ ආදීනව හා ලාමක බව හා කෙලෙසීම ද, කාමයන්ගෙන් නික්මීමෙහි අනුසස් ද දක්වා වදළහ. යම් විටෙක භගවත්හු නිරොග සිත් ඇති මොළොක් සිත් ඇති නිවරණ පහ වූ සිත් ඇති ඔදවැඩි සිත් ඇති පහන් සිත් ඇති බවුන් දත්තාහු ද, එ කල්හි දුඃඛ සමුදය නිරෝධ මාර්ග යන බුදුවරුන්ගේ අනන්‍ය සාධාරණ වූ යම් ධර්ම දෙශනාවෙක් වේද එය ප්‍රකාශ කළහ. පහ වූ කළ පැහැ ඇති ශුද්ධ වස්ත්‍රය යම් සේ මොනොවට රඳන් පිළිගන්නේ ද, ඒ සුවාසූදහසක් පැවිද්දනට එ අස්තෙහි ම 'උපදනා සුලු සියල්ල නැසෙන සුලු යැ' යි පහ වූ කෙලෙස්රජස් ඇති, පහ වූ කෙලෙස් මල ඇති දහම් ඇස පහළ විය.

107. දුටු දහම් ඇති, පැමිණි දහම් ඇති, දැනගත් දහම් ඇති, බැසගත් දහම් ඇති, තිණු විචිකිච්ඡා ඇති, පහ වූ සැක ඇති, විසාරද බවට පැමිණි ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යයරහිත වූ ඔහු භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුනුවන් ''වහන්ස, දෙශනාව ඉතා මැනැවැ, වහන්ස, දෙශනාව ඉතා මැනැවැ. වහන්ස, යැවිකුරු කොට තබනලද්දක් හෝ යම්සේ උඩුකුරු කරන්නේ ද, වැසුණු දයක් හෝ විවෘත කරන්නේ ද, මංමුළා වූවකුට මඟ හෝ කියන්නේ ද, 'ඇස් ඇත්තන් රූප දකිති' යි අඳුරෙහි තෙල්පහනක් හෝ දරන්නේ ද, එ පරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ විසින් (අපට) නොයෙක් කරුණින් දහම් පැවැසිණ. වහන්ස, ඒ අපි භාග්‍යවතුන් වහන්සේ ද ධර්මය ද භික්ෂුසංඝයා ද සරණ යමිහ. වහන්ස, අපි භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිද්ද ලබමෝ වා, උපසපුව ලබමෝවා'' යි කිහ. මහණෙනි, ඒ සුවාසූදහසක් පැවිද්දෝ භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන් වෙත පැවිද්ද ලදහ. උපසපුව ලදහ.

108. භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු උනට දැහැමි කතායෙන් කරුණු දක්වූහ, කරුණු ගැන්වූහ, එහි ඔවුන් සිත් තියුණු කළහ. සතුටු කළහ. සංස්කාරයන්ගේ දෝෂ ද ලාමක බව ද කෙලෙසීම ද, නිවනෙහි අනුසස් ද පැවැසූහ. භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන් විසින් දැහැමි කතායෙන් කරුණු දක්වනු ලබන, කරුණු ගන්වනු ලබන, එහි තියුණු කරනු ලබන, සතුටු කරනු ලබන ඔවුන්ගේ සිත් නොබෝ කල්හි ම උපාදානරහිත ව ආශ්‍රවයන්ගෙන් මිදිණ.

109. තෙන ඛො පන භික්ඛවෙ සමයෙන බන්ධුමතියා රාජධානියා මහාභික්ඛුසඞ්ඝො පටිවසති අසීතියා භික්ඛුසතසහස්සං. අථ ඛො භික්ඛවෙ විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: ''මහා ඛො එතරහි භික්ඛුසඞ්ඝො බන්ධුමතියා රාජධානියා පටිවසති අසීතියා භික්ඛුසතසහස්සං. යන්නූනාහං භික්ඛූ අනුජානෙය්යං 'චරථ භික්ඛවෙ චාරිකං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය, අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. මා එකෙන දෙ අගමිත්ථ, දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං, කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ, සන්ති සත්තා අපපරජක්ඛජාතිකා, අස්සවණතා ධම්මස්ස පරිහායන්ති, භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො. අපි ච ඡන්නං ඡන්නං වස්සානං අච්චයෙන බන්ධුමතිං රාජධානිං උපසඞ්කමිතබ්බා පාතිමොක්ඛුද්දෙසාය'ති.''

110. අථ ඛො භික්ඛවෙ, අඤ්ඤතරො මහාබ්‍රහ්මා විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව බ්‍රහ්මලොකෙ අන්තරහිතො විපස්සිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පුරතො පාතුරහොසි. අථ ඛො සො භික්ඛවෙ, මහාබ්‍රහ්මා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො තෙනඤ්ජලිං පණාමෙත්වා විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං එතදවොච: ''එවමෙතං භගවා, එවමෙත, සුගත, මහා ඛො භන්තෙ එතරහි භික්ඛුසඞ්ඝො බන්ධුමතියා රාජධානියා පටිවසති අසීතියා භික්ඛුසතසහස්සං. අනුජානාතු භන්තෙ භගවා භික්ඛූ 'චරථ භික්ඛවෙ, චාරිකං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය, අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. මා එකෙන දෙව අගමිත්ථ. දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ සන්ති සත්තා අපපරජක්ඛජාතිකා, අස්සවණතා ධම්මස්ස පරිහායන්ති. භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො'ති. අපි ච භන්තෙ, මයං තථා කරිස්සාම යථා භික්ඛූ ඡන්නං ඡන්නං වස්සානං අච්චයෙන බන්ධුමතිං රාජධානිං උපසඞ්කමිස්සන්ති පාතිමොක්ඛුද්දෙසාය''ති. ඉදමවොච භික්ඛවෙ, සො මහාබ්‍රහ්මා, ඉදං වත්වා විපස්සිං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

Free Distribution www.aathaapi.org

109. මහණෙනි, එ සමයෙහි වනාහි බන්ධුමතී රාජධානියෙහි භික්ෂූන් එක්සිය අටසැටදහසක් වූ මහත් භික්ෂු සමූහයෙක් වෙසෙයි. මහණෙනි, එ කල්හි හුදෙකලා චිත්තවිවෙකයෙන් හුන් භගවත් අර්හත් විපස්සී සම්මා-සම්බුදුනට ''දැන් බන්ධුමතී රාජධානියෙහි භික්ෂූන් එක්සියඅටසැටදහසක් වූ මහත් භික්ෂුසමූහයෙක් වෙසෙයි. 'මහණෙනි, බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පායෙන්, දෙවිමිනිස්-නට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස සැරි සරවු. දෙදෙනෙක් එක් මගින් නො යවු. මුල කලණ මැද කලණ අග කලණ අරුත් සහිත ව්‍යඤ්ජන සහිත දහම් දෙසවු. හැම ලෙසින් පිරිපුන් පිරිසිදු (මහ) බඹසර පවසවු. මඳ කෙලෙස් රජස් ඇති සත්ත්ව ඇත්හ. දහම් නො අසනුයෙන් ඔහු පිරිහෙත්. දහම් දනගන්නෝ ඇති වන්නාහ. වැලි සයක් සයක් හවුරුදු ඉක්මීතැන පාමොක් උදෙසනුවට බන්ධුමතී රාජධානියට එළැඹිය යුතු යැ' යි මහණු නට අනුදත්තෙමි නම් මැනැවැ'' යි මෙසේ චිත්තසංකල්පනායෙක් පහළ විය.

110. මහණෙනි, එ කල්හි එක්තරා මහාබ්‍රහ්මයෙක් භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන්ගේ චිත්තසංකල්පනාව සිය සිතින් දැන, බල ඇති පුරුෂයක්හු වක් කළ හෝ අත දික් කරන්නා සේ දික් කළ හෝ අත වක් කරන්නා සේ වහා බඹලොවදී අතුරුදහන් වැ භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන් ඉදිරියෙහි පහළ විය. මහණෙනි, ඉක්බිති ඒ මහාබ්‍රහ්ම තෙම උතුරුසඟ එකස් කොට, භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන් දිසාවට දෙහොත් මුදුනැ තබා වැඳ, ''භාග්‍යවතුන් වහන්ස, එය එසේ ය. සුගතයන් වහන්ස, එය එසේ ය. වහන්ස, දැන් බන්ධුමතී රාජධානියෙහි භික්ෂූන් එක්සිය අට සැටදහසක් වූ මහත් බික්සඟ වෙසෙයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූනට 'මහණෙනි, බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පායෙන් දෙවිමිනිස්නට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස සැරි සරවු, දෙදෙනෙක් එක් මගින් නො යවු. මහණෙනි, මුලකලණ මැදකලණ, අගකලණ අරුත් සහිත ව්‍යඤ්ජන සහිත දහම් දෙසවු. හැම ලෙසින් පිරිපුන් පිරිසිදු බඹසර පවසවු. මඳ කෙලෙස්රජස් ඇති සත්ත්ව ඇත. දහම් නො ඇසීමෙන් ඔහු පිරිහෙත්. දහම් දනගන්නෝ ඇති වන්නාහ' යි භික්ෂූනට අනුදන්නා සේක් වා. වැලි දු වහන්ස, අපි මහණුන් අවුරුදු සයක් සයක් ඇවැමෙන් පාමොක් දෙසනුවට බන්ධුමතී රාජධානියට එළැඹෙන සෙයක් කරන්නමු'' යි මෙ බස් කී ය. මහණෙනි, මහාබ්‍රහ්ම තෙම මෙය කී ය. මෙය කියා භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන් වැඳ පැදකුණු කොට එහි ම අතුරුදහන් විය.

Free Distribution www.aathaapi.org

111. අථ ඛො භික්ඛවෙ, විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො සායණ්හසමයං පතිසල්ලානා වුට්ඨිතො භික්ඛූ ආමන්තෙසි: ඉධ මය්හං භික්ඛවෙ, රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "මහා ඛො එතරහි භික්ඛුසඞ්ඝා බන්ධුමතියා රාජධානියා පටිවසති අට්ඨසට්ඨිභික්ඛුසතසහස්සං. යන්නූනාහං භික්ඛූ අනුජානෙය්‍යං "චරථ භික්ඛවෙ චාරිකං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය, අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. මා එකෙන දෙව අගමිත්ථ. දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ. සන්ති සත්තා අපරජ්ඣකජාතිකා. අස්සවනතා ධම්මස්ස පරිහායන්ති. භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො. අපි ච ඡන්නං ඡන්නං වස්සානං අච්චයෙන බන්ධුමති රාජධානි උපසඞ්කමිතබ්බා පාතිමොක්ඛුද්දෙසායා"ති.

112. අථ ඛො භික්ඛවෙ, අඤ්ඤතරො මහාබ්‍රහ්මා මම චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව බ්‍රහ්මලොකෙ අන්තරහිතො මම පුරතො පාතුරහොසි. අථ ඛො සො භික්ඛවෙ, මහාබ්‍රහ්මා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙනාහං තෙනඤ්ජලිමපනාමෙත්වා මං එතදවොච "එවමෙතං භගවා, එවමෙතං සුගත, මහා ඛො හත්ථෙ, එතරහි භික්ඛුසඞ්ඝා බන්ධුමතියා රාජධානියා පටිවසති අට්ඨසට්ඨිභික්ඛුසතසහස්සං. අනුජානාතු භන්තෙ, භගවා භික්ඛූ "චරථ භික්ඛවෙ, චාරිකං බහුජනහිතාය බහුජන සුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. මා එකෙන දෙව අගමිත්ථ. දෙසෙථ භික්ඛවෙ, ධම්මං ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං, කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ සන්ති සත්තා අපරජ්ඣකජාතිකා අස්සවණතා ධම්මස්ස පරිහායන්ති. භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො. අපි ච භන්තෙ, මයං තථා කරිස්සාම, යථා භික්ඛූ ඡන්නං ඡන්නං වස්සානං අච්චයෙන බන්ධුමතිං රාජධානිං උපසඞ්කමිස්සන්ති පාතිමොක්ඛුද්දෙසායා"ති. ඉදමවොච සො භික්ඛවෙ මහාබ්‍රහ්මා, ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

113. "අනුජානාමි භික්ඛවෙ, චරථ චාරිකං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය, අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. මා එකෙන දෙව අගමිත්ථ, දෙසෙථ භික්ඛවෙ, ධම්මං ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං, පරියොසාන කල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං. කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ. සන්ති සත්තා අපරජ්ඣකජාතිකා. අස්සවණතා ධම්මස්ස පරිහායන්ති. භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො. අපි ච භික්ඛවෙ, ඡන්නං ඡන්නං වස්සානං අච්චයෙන බන්ධුමති රාජධානි උපසඞ්කමිතබ්බා පාතිමොක්ඛුද්දෙසායා"ති.

Free Distribution www.aathaapi.org

111. මහණෙනි, ඉක්බිති භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු සවස්වේලෙහි සමවතින් නැඟී සිටියාහු, මහණුන් බණවා මෙය වදළහ: 'මහණෙනි, මෙහි එකලා වැ චිත්තවිවේකයෙන් යුක්ත වූ මට 'දැන් බන්ධුමතී රාජධානියෙහි භික්ෂූන් එක්සිය අටසැටදහසක් වූ මහත් භික්ෂු සමූහයෙක් වෙසෙයි. මම භික්ෂූනට 'මහණෙනි, බොහෝ දෙනාට වැඩ පිණිස බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස දෙවිමිනිස්නට වැඩ පිණිස හිත පිණිස, සුව පිණිස සැරි සරවු. දෙදෙනෙක් එක් මඟින් නො යවු. මුලකලණ මැදකලණ අගකලණ අරුත් සහිත ව්‍යඤ්ජන සහිත දහම දෙසවු. හැම ලෙසින් පිරිපුන් පිරිසිදු බඹසර පවසවු. අල්පරජස්ක ජාතික සත්වයෝ ඇත. ධර්මය නො ඇසීමෙන් ඔහු පිරිහෙත්. දහම් දනගන්නෝ ඇති වන්නාහ. වැලි දූ හවුරුදු සයක් සයක් ඇවෑමෙන් පාමොක් උදෙසනුවට බන්ධුමතී රාජධානිය එළැඹිය යුතු ය යි භික්ෂූනට අනුදත්තෙම් නම් මැනැවැ'' යි මෙසේ චිත්තසංකල්පයෙක් පහළ විය.

112. මහණෙනි, එකල්හි මහාබ්‍රහ්මයෙක් සිය සිතින් මගේ චිත්ත සංකල්පය දැන බල ඇති මිනිසක්හු වක් කල හෝ අත දික් කරන්නා සේ දික් කළ හෝ අත වක් කරන්නා සේ වහා ම බඹලොවින් අතුරුදහන් ව මා ඉදිරියෙහි පහළ විය. මහණෙනි, ඉක්බිති ඒ මහාබ්‍රහ්ම තෙම උතුරු සඟ එකස් කොට මා දෙසට දෙහොත් මුදුන් තබා වැඳ, ''භාග්‍යවතුන්වහන්ස, එය එසේ ය. සුගතයන් වහන්ස, එය එසේ ය. වහන්ස, දැන් බන්ධුමතී රාජධානියෙහි භික්ෂූන් එක්සිය අටසැටදහසක් වූ මහත් භික්ෂුසමූහයෙක් වෙසෙයි. වහන්ස, භාග්‍යවත්හු 'මහණෙනි, බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස දෙවිමිනිස්නට වැඩ පිණිස, හිත පිණිස, සුව පිණිස සැරි සරවු. දෙදෙනෙක් එක් මඟින් නො යවු. මහණෙනි, මුලකලණ මැදකලණ අගකලණ අරුත් සහිත ව්‍යඤ්ජනසහිත දහම දෙසවු. හැම ලෙසින් පිරිපුන් පිරිසිදු බඹසර පවසවු. අල්පරජස්ක ජාතික සත්හු ඇත. දහම් නොඅසනුයෙන් ඔහු පිරිහෙත්. දහම් දැන ගන්නෝ ඇති වන්නාහ' යි භික්ෂූනට අනුදනිත් වා. වැලිදු වහන්ස, යම්සේ භික්ෂූහු හවුරුදු සයක් සයක් ඇවෑමෙන් පාමොක් උදෙසනුවට බන්ධුමතී රාජධානියට එළැඹෙන්නාහු ද, එසේ කරන්නමු''යි කිය. මහණෙනි, ඒ මහාබ්‍රහ්ම තෙම මෙය කී ය. මෙය කියා මා වැඳ පැදකුණු කොට එ තන්හි ම අතුරුදහන් විය.

113. මහණෙනි, තොපට අනුදනිමි: ''බොහෝ දෙනාට වැඩ පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙවිමිනිස්නට අර්ථ පිණිස, හිත පිණිස, සුව පිණිස සැරි සරවු. දෙදෙනෙක් එක් මඟින් නො යවු. මහණෙනි, මුලකලණ මැදකලණ අගකලණ අරුත්සහිත ව්‍යඤ්ජනසහිත දහම දෙසවු. හැම ලෙසින් පිරිපුන් පිරිසිදු බඹසර පවසවු. අල්පරජස්කජාතික සත්වයෝ ඇත. ඔහු දහම් නො ඇසීමෙන් පිරිහෙත්. දහම් දැනගන්නෝ ඇති වන්නාහ. එතෙකුදු වුවත්, මහණෙනි, හවුරුදු සයක් සයක් ඇවෑමෙන් පාමොක් උදෙසනුවට බන්ධුමතී රාජධානියට එළැඹිය යුතු යැ'' යි (වදළහ.)

Free Distribution www.aathaapi.org

114. අථ ඛො භික්ඛවෙ, භික්ඛූ යෙභුය්‍යෙන එකාහෙනෙව ජනපදචාරිකං පක්කමිංසු නෙන ඛො පන භික්ඛවෙ, සමයෙන ජම්බුදීපෙ චතුරාසීති ආවාසසහස්සානි හොන්ති. එකමසි වසෙස නික්ඛන්තෙ දෙවතා සද්දමනුස්සාවෙසුං: "නික්ඛන්තං ඛො මාරිසා එකං වස්සං පඤ්ච'දානි වස්සානි සෙසානි. පඤ්චන්නං වස්සානං අච්චයෙන ඛන්ධුමතී රාජධානි උපසඞ්කමිතබ්බා පාතිමොක්ඛුද්දෙසාය"ති. දුතියසු වසෙසසු නික්ඛන්තෙසු දෙවතා සද්දමනුස්සාවෙසුං: "නික්ඛන්තානි ඛො මාරිසා දෙව වස්සානි, චත්තාරිදානි වස්සානි සෙසානි. චතුන්නං වස්සානං අච්චයෙන ඛන්ධුමතී රාජධානි උපසඞ්කමිතබ්බා පාතිමොක්ඛුද්දෙසාය"ති. තතියසු වසෙසසු නික්ඛන්තෙසු දෙවතා සද්දමනුස්සාවෙසුං: 'නික්ඛන්තානි ඛො මාරිසා තීණි වස්සානි. තීණි'දානි වස්සානි සෙසානි. තිණ්ණං වස්සානං අච්චයෙන ඛන්ධුමතී රාජධානි උපසඞ්කමිතබ්බා පාතිමොක්ඛුද්දෙසාය"ති. චතුත්ථසු වසෙසසු නික්ඛන්තෙසු දෙවතා සද්දමනුස්සාවෙසුං: "නික්ඛන්තානි ඛො මාරිසා චත්තාරි වස්සානි. දෙව'දානි වස්සානි සෙසානි. දුවිහං වස්සානං අච්චයෙන ඛන්ධුමතී රාජධානි උපසඞ්කමිතබ්බා පාතිමොක්ඛුද්දෙසාය"ති. පඤ්චමසි වසෙසසු නික්ඛන්තෙසු දෙවතා සද්දමනුස්සාවෙසුං: "නික්ඛන්තානි ඛො මාරිසා පඤ්ච වස්සානි. එකං'දානි වස්සං සෙසං. එකස්ස වස්සස්ස අච්චයෙන ඛන්ධුමතී රජධානි උපසඞ්කමිතබ්බා පාතිමොක්ඛුද්දෙසාය"ති. ඡසු වසෙසසු නික්ඛන්තෙසු දෙවතා සද්දමනුස්සාවෙසුං: "නික්ඛන්තානි ඛො මාරිසා ඡබ්බස්සානි. සමයො'දානි ඛන්ධුමතිං රාජධානිං උපසඞ්කමිතුං පාතිමොක්ඛුද්දෙසාය"ති.

115. අථ ඛො තෙ භික්ඛවෙ භික්ඛූ, අපෙපකවෙව සඤ්ඤා ඉද්ධානුභාවෙන, අඤ්ඤපකවෙව දෙවතානං ඉද්ධානුභාවෙන, එකාහෙනෙව ඛන්ධුමතිං රාජධානිං උපසඞ්කමිංසු පාතිමොක්ඛුද්දෙසාය. තත්‍ර සුදං භික්ඛවෙ විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො භික්ඛුසඞ්ඝඤ්ච එවං පාතිමොක්ඛං උද්දිසති:

"ඛන්තී පරමං තපො තිතික්ඛා,
නිබ්බානං පරමං වදන්ති බුද්ධා.
න හි පබ්බජිත්තො පරූපඝාති
සමණො හොති පරං විහෙඨයන්තො.

සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා,
සචිත්තපරියොදපනං එතං බුද්ධානසාසනං.

අනූපවාදෙ අනූපඝාතො පාතිමොක්ඛෙ ච සංවරො,
මත්තඤ්ඤුතා ච භත්තස්මිං පන්තඤ්ච සයනාසනං,
අධිචිත්තෙ ච ආයොගො එතං බුද්ධාන සාසනං"ති.

Free Distribution www.aathaapi.org

114. මහණෙනි, ඉක්බිත්තෙන් භික්ෂූහු බොහෝ සෙයින් එක් දවසින් ම ජනපදචාරිකායෙහි නික්මුණහ. ඒ සමයෙහි දඹදිවැ සුවාසූදහසක් ආවාසයෝ වෙති. එක් හවුරුද්දක් ගිය කලැ 'නිදුකාණනි' එක් හවුරුද්දෙක් ගත විය. දැන් හවුරුදු පසෙක් ඉතිරි ව ඇත. පස් හවුරුද්දක් ඇවැමෙන් පාමොක් උදෙසනුවට බන්ධුමතී රාජධානියට එළැඹිය යුතුයැ'' යි දෙවියෝ ශබ්දානුශ්‍රාවණය කළහ (හඬ නැගූහ). හවුරුදු දෙකක් ගත වූ කල්හි ''නිදුකාණනි, දෙහවුරුද්දෙක් ගත විය. දැන් තව සතර හවුරුද්දෙක් ඉතිරි ව ඇත. සතර හවුරුද්දක් ඇවැමෙන් පාමොක් උදෙසනුවට බන්ධුමතී රාජධානියට එළැඹියැ යුතු යැ'' යි දෙවියෝ හඬ නැගූහ. තුන් හවුරුද්දක් ගත කල්හි ''නිදුකාණනි, තුන් හවුරුද්දෙක් ගත විය. දැන් තව තුන් හවුරුද්දෙක් ඉතිරි ව ඇත. තුන් හවුරුද්දක් ඇවැමෙන් පාමොක් උදෙස නුවට බන්ධුමතී රාජධානියට එළැඹිය යුතු යැ'' යි දෙවියෝ හඬ නැගූහ. සතර හවුරුද්දක් ගිය කල්හි ''නිදුකාණනි, සතර හවුරුද්දෙක් ගත විය. දැන් තව හවුරුදු දෙකෙක් ඉතිරි ව ඇත. හවුරුදු දෙක ඇවැමෙන් පාමොක් උදෙසනුවට බන්ධුමතී රාජධානියට එළැඹිය යුතු යැ''යි දෙවියෝ හඬ නැගූහ. පස් හවුරුද්දක් ගත කල්හි ''නිදුකාණනි, පස් හවුරුද්දෙක් ගත විය. දැන් එක් හවුරුද්දෙක් ඉතිරි ය. එක් හවුරුද්දක් ඇවැමෙන් පාමොක් උදෙසනුවට බන්ධුමතී රාජධානියට එළැඹියැ යුතු යැ'' යි දෙවියෝ හඬ නැගූහ. හවුරුදු සයක් ඉක්මී කල්හි ''නිදුකාණනි, හවුරුදු සයෙක් ගත විය. දැන් පාමොක් උදෙසනුවට බන්ධුමතී රාජධානියට එළැඹෙන්නට කල් වේ'' යැ යි දෙවියෝ හඬ නැගූහ.

115. මහණෙනි, එකල්හි ඒ මහණහු, ඇතැම් කෙනෙක් තමන්ගේ ඉදුහ බෙලෙන් ද, තව කෙනෙක් දෙවියන්ගේ ඉදුහ බෙලෙන් ද, බන්ධුමතී රාජධානියට පාමොක් උදෙසනු පිණිස එක් දවසින් ම එළැඹියහ. මහණෙනි, එහි භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු භික්ෂුසමාගමයෙහි මෙසේ පාමොක් උදෙසති:

''පරූපකාරත් පරූපවාදත් ඉවැසීම වූ අධිවාසනක්ෂාන්තිය උතුම් තපස යැ යි ද, නිවන සියල්ලෙන් උතුම් ම දහමැ යි ද බුදුවරු වදරත්. මෙරමා පෙළන්නේ පැවිද්දෙක් නො වේ ම ය. මෙරමා වෙශභසතුයේ මහණෙක් නො වේ ම ය.

සියලු පව් නොකරනු ද, කුසල් උපදවනු හා වඩනු ද, සිය සිත පිරිසිදු කරනු ද යන මේ බුදුවරුන්ගේ ශාසන ය.

මෙරමාහට උපවාද නොකරනු ද, මෙරමා නොපෙළනු ද, පාමොක්හි සංවරය ද, ඔතෙහි පමණ දන්ම ද, ගමින් ඈත සෙනස්තෙහි ඇල්ම ද, අධිචිත්තයෙහි (රූපාරූප අටසමවත්හි) යෙදෙනු ද යන මේ බුදුවරුන්ගේ ශාසන යි.''

Free Distribution www.aathaapi.org

116. එකමිදහං භික්ඛවෙ සමයං උක්කට්ඨායං විහරාමි සුභගවනෙ සාලරාජමූලෙ. තත්‍ර මය්හං භික්ඛවෙ, රහොගතස්‍ස පටිසල්ලීනස්‍ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: 'න ඛො සො සත්තාවාසො සුලභරූපො යො මයා අනාසඞ්කාචුට්ඨාපුබ්බො[1] ඉමිනා දීඝෙන අද්ධුනා අඤ්ඤත්‍ර සුද්ධාවාසෙහි දෙවෙහි. යන්නූනාහං යෙන සුද්ධාවාසා දෙවා තෙනුපසඞ්කමෙය්‍යන්ති''. අථ ඛො අහං[2] භික්ඛවෙ සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව උක්කට්ඨායං සුභගවනෙ සාලරාජමූලෙ අන්තරහිතො අවිහෙසු දෙවෙසු පාතුරහොසිං.

117. තත්‍රමං භික්ඛවෙ, දෙවනිකායෙ අනෙකානි දෙවතාසහස්සානි අනෙකානි දෙවතා සතසහස්සානි යෙනාහං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු, එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ තා දෙවතා මං එතදවොචුං: ''ඉතො සො මාරිස[3], එකනවුතො කප්පෝ[4] යං විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උදපාදි. විපස්සී මාරිස, භගවා අරහං සම්මා සම්බුද්ධො ඛත්තියො ජාතියා අහොසි ඛත්තියකුලෙ උදපාදි විපස්සී මාරිස, භගවා අරහං සම්මාසම්බුද්ධො කොණ්ඩඤ්ඤා ගොත්තෙන අහොසි. විපස්සිස්ස මාරිස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අසීතිවස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. විපස්සී මාරිස, භගවා අරහං සම්මාසම්බුද්ධො පාටලියා මූලෙ අභිසම්බුද්ධො. විපස්සිස්ස මාරිස, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ඛණ්ඩතිස්සං නාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. විපස්සිස්ස මාරිස, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස තයො සාවකානං සන්නිපාතා අහෙසුං: එකො සාවකානං සන්නිපාතො අහොසි අට්ඨසට්ඨිභික්ඛුසතසහස්සං. එකො සාවකානං සන්නිපාතො අහොසි භික්ඛුසතසහස්සං. එකො සාවකානං සන්නිපාතො අහොසි අසීතිභික්ඛුසහස්සානි. විපස්සිස්ස මාරිස, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ඉමෙ තයො සාවකානං සන්නිපාතා අහෙසුං සබ්බෙසංයෙව ඛීණාසවානං. විපස්සිස්ස මාරිස, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අසොකො නාම භික්ඛු උපට්ඨාකො අහොසි අග්ගුපට්ඨාකො. විපස්සිස්ස මාරිස, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස බන්ධුමා නාම රාජා පිතා අහොසි. බන්ධුමතී නාම දෙවී මාතා අහොසි ජනෙත්තී. බන්ධුමස්ස රඤ්ඤො බන්ධුමතී නාම නගරං රාජධානී අහොසි. විපස්සිස්ස මාරිස, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස එවං අභිනික්ඛමනං අහොසි, එවං පබ්බජ්ජා, එවං පධානං එවං අභිසම්බොධි, එවං ධම්මචක්කප්පවත්තනං. තෙමයං මාරිස, විපස්සිම්හි භගවති බ්‍රහ්මචරියං චරිත්වා කාමෙසු කාමච්ඡන්දං විරාජෙත්වා ඉද්ධිපත්තා''ති. - පෙ -

---

1. අනාවුට්ඨපුබ්බො – මජ්ඣ.
2. අථ, ඒවං හං – මජ්ඣ.
3. 'මාරිසා' – මජ්ඣ.
4. ඒකතවුතිකප්පෙ – මජ්ඣ.

Free Distribution www.aathaapi.org

116. මහණෙනි, මම එක් සමයෙක්හි **උක්කට්ඨාපුරය** සමීපයෙහි වූ **ශුභගවනයෙහි** මහරුක් මුලැ වෙසෙමි. මහණෙනි, එකලා වැ චිත්ත-විවේකයෙන් යුක්ත වූ ඒ මට ''මේ දීර්ඝකාලය තුළ ශුද්ධාවාසයන් හැර මා නොවූ වූ විරූ අන් සත්වාවාසයෙක් වේ ද, එය සුලභරූප නොවේ (දුර්ලභ ය). ශුද්ධාවාසි දෙවියෝ යම් තැනෙක ඇද්ද එ තැනට එළැ-බෙත්තෙම් නම් යෙහෙකැ''යි මෙසේ චිත්තසංකල්පනාවෙක් උපන. මහණෙනි, ඉක්බිති මම බල ඇති පුරුෂයෙක් යම්සේ හැකුලූ හෝ අත දිගු කරන්නේ ද, දිගු කළ හෝ අත හකුලන්නේ ද, එසේ ම උක්කට්ඨායෙහි ශුභගවනයෙහි වෘක්ෂරාජ මූලයෙහි අතුරුදහන් වැ අවිහ දෙවියන් අතුරෙහි පහළ වීමි.

117. මහණෙනි, ඒ දෙවනකාහි නොයෙක් දහස් ගණන් දෙවියෝ, නොයෙක් ලක්ෂ ගණන් දෙවියෝ මා කරා එළැඹුණහ. එළැඹ මා වැඳ එක් පසෙක සිටියහ. මහණෙනි, එක් පසෙක සිටියාවූ ම ඒ දෙවියෝ මට මෙය කීහ: ''නිදුකාණන් වහන්ස, යම් කලෙක භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු ලොවැ පහළ වූහු ද, ඒ මෙයින් එක්අනූ වන කප ය. නිදු-කාණන් වහන්ස, භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු ජාතියෙන් ක්ෂත්‍රිය වූහ, ක්ෂත්‍රියකුලයෙහි උපන්හ. නිදුකාණන් වහන්ස, භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු ගොත්‍රයෙන් කොණ්ඩඤ්ඤ වූහ. නිදුකාණන් වහන්ස, භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුනට ආයුෂප්‍රමාණය වස් අසූදහසෙක් විය. නිදුකාණන් වහන්ස, භගවත් අර්හත් විපස්සී සම්මා-සම්බුදුහු පළොල් රුක්මුලැ බුදු වූහ. නිදුකාණන් වහන්ස, භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන්හට **බන්ධ** කිසස නම් හද්‍රයුගල වූ අගසවු යුවලෙක් විය. නිදුකාණන් වහන්ස, භගවත් අර්හත් විපස්සී සම්මා-සම්බුදුන්ගේ සව්වන් පිළිබඳ තුන් සන්නිපාත කෙනෙක් වූහ: **සව්වන්** පිළිබඳ එක් සන්නිපාතයෙක් භික්ෂූන් එක්සිය අටසැට දහසෙක් විය. සව්වන්ගේ එක් සන්නිපාතයෙක් භික්ෂූන් සියදහසෙක් විය. සව්වන්ගේ එක් සන්නිපාතයෙක් භික්ෂූන් අසූදහසෙක් විය. නිදුකාණන් වහන්ස, භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුන්ගේ හැම දෙන ම රහතුන් වූ ශ්‍රාවක -යන් පිළිබඳ මේ තුන් සන්නිපාත කෙනෙක් වූහ. නිදුකාණන් වහන්ස, භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුනට **අශොක** නම් භික්ෂු අග්‍ර උපස්ථායක වූ උවටැ විය. නිදුකාණන් වහන්ස, භගවත් වූ අර්හත් වූ විපස්සී සම්මා සම්බුදුන්ගේ පිය තෙම **බන්ධුමත්** නම් රජ වී ය. වැදූ මැණියෝ බන්ධුමතී නම් දේවි වූහ. බන්ධුමත් රජහුගේ රාජධානිය බන්ධුමතී නම් නගරය විය. නිදුකාණන් වහන්ස, භගවත් වූ අර්හත් වූ විපස්සී සම්මාසම්බුදුන්ගේ අභිනිෂ්ක්‍රමණය මෙසේ විය. පැවිද්ද මෙසේ විය. ප්‍රධන් වියැ වැඩීම මෙසේ විය. අභිසම්බෝධිය මෙසේ විය. දම්සක් පැවැත්වීම මෙසේ විය. නිදුකාණන් වහන්ස, ඒ අපි විපස්සී භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වැස කාමයන්හි කාමච්ඡන්දය දුරු කොට මෙහි උපන්නමෝ යැ''යි (සැළ කළහ)....

Free Distribution www.aathaapi.org

118. තස්මිංයෙව ඛො භික්ඛවෙ දෙවනිකායෙ අනෙකානි දෙවතා-සහස්සානි අනෙකානි දෙවතාසතසහස්සානි යෙනාහං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ තා දෙවතා මං එතදවොචුං:

"ඉමස්මිං යෙව ඛො මාරිස[1], භද්දකප්පෙ භගවා එතරහි අරහං සම්මා-සම්බුද්ධො ලොකෙ උප්පන්නො. භගවා මාරිස, ඛත්තියො ජාතියා, ඛත්තියකුලෙ උප්පන්නො. භගවා මාරිස ගොතමො ගොත්තෙන. භගවතො මාරිස, අප්පකං ආයුප්පමාණං පරිත්තං ලහුකං,[2] යො චිරං ජීවති සො වස්සසතං, අප්පං වා භියොා. භගවා මාරිස අස්සත්ථස්ස මූලෙ අභිසම්බුද්ධො. භගවතො මාරිස, සාරිපුත්තමොග්ගල්ලානං[3] නාම සාවකයුගං අග්ගං භද්දයුගං. භගවතො මාරිස, එකො සාවකානං සන්නිපාතො අහොසි අඞ්ඪතෙළසානි භික්ඛුසතානි භගවතො මාරිස, අයං එකො සාවකානං සන්නිපාතො අහොසි සබ්බෙසංයෙව ඛීණාසවානං. භගවතො මාරිස, ආනන්දො භික්ඛු උපට්ඨාකො[4] අගගුපට්ඨාකො. භගවතො මාරිස, සුදෙධාදනො නාම රාජා පිතා,[4] මායා නාමදෙවී මාතා[4] ජනෙත්ති. කපිලවත්ථු නාම නගරං රාජධානි. භගවතො මාරිස, එවං අභිනික්ඛමනං අහොසි, එවං පබ්බජ්ජා, එවං පධානං, එවං අභිසම්බොධි, එවං ධම්මචක්කප්ප-වත්තනං. තෙ මයං මාරිස, භගවතී බ්‍රහ්මචරියං චරිත්වා කාමෙසු කාමච්ඡන්දං විරාජෙත්වා ඉධූපපන්නා"ති.

119. අථ ඛ්වාහං භික්ඛවෙ, අවිහෙහි දෙවෙහි සද්ධිං යෙන අතප්පා දෙවා තෙනුපසඞ්කමිං -පෙ-* අථ ඛ්වාහං භික්ඛවෙ, අවිහෙහි ච දෙවෙහි අතප්පෙහි ච දෙවෙහි සද්ධිං යෙන සුදස්සා දෙවා තෙනුපසඞ්කමිං -පෙ- අථ ඛ්වාහං භික්ඛවෙ, අවිහෙහි ච දෙවෙහි අතප්පෙහි ච දෙවෙහි සුදස්සෙහි ච දෙවෙහි සද්ධිං යෙන සුදස්සී දෙවා තෙනුපසඞ්කමිං. -පෙ- අථ ඛ්වාහං භික්ඛවෙ, අවිහෙහි ච දෙවෙහි අතප්පෙහි ච දෙවෙහි සුදස්සෙහි ච දෙවෙහි සුදස්සීහි ච දෙවෙහි සද්ධිං යෙන අකනිට්ඨා දෙවාතෙනුපස-ඞ්කමිං තස්මිං භික්ඛවෙ, දෙවනිකායෙ අනෙකානි දෙවතාසහස්සානි අනෙකානි දෙවතා සතසහස්සානි යෙනාහං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ, තා දෙවතා මං එතදවොචුං: "ඉතො සො මාරිස, එකනවුතො කප්පො යං විපස්සී භගවා අරහං සම්මා සම්බුද්ධො ලොකෙ උදපාදි -පෙ-*

1. මාරිසා, – මජ්ඣං.
2. ලහුසං, – PTS
3. සාරිපුත්තමොග්ගල්ලානා, – PTS
4. අහොසි – මජ්ඣං.

* පෙය්‍යාලමුඛෙන සංයුත්තං හෙට්ඨා වුත්තනයෙන වෙදිතබ්බං

Free Distribution www.aathaapi.org

118. මහණෙනි, ඒ දෙවි නකාඟි ම නොයෙක් දහස් ගණන් දෙවියෝ, නොයෙක් ලක්ෂ ගණන් දෙවියෝ මා වෙත ආහ. අවුත් මා වැඳ එක් පසෙක සිටියාහ. මහණෙනි, එක් පසෙක සිටියාවූ ම ඒ දෙවියෝ මට මෙය කීහ:-

''නිදුකාණන් වහන්ස, දැන් මේ බදුරු කපෙහි ම භගවත් අර්හත් සම්මාසම්බුදුහු ලොවැ පහළ වූවාහු වෙති. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ජාතියෙන් **ක්ෂත්‍රිය** සේක, ක්ෂත්‍රියකුලයෙහි උපන් සේක. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ගොත්‍රයෙන් ගෞතම වන සේක. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ ආයුෂ්ප්‍රමාණය අල්ප ය, ලඝු ය. යමෙක් (මෙ සමයෙහි) බොහෝ කල් ජීවත් වන්නේ නම්, හේ සිය හවුරුද්දක් ජීවත් වෙයි. එයට වැඩි නම් ස්වල්පයකි. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ඇසතු රුක් මුලැ බුදු වූ සේක. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ සැරියුත් මුගලන් නම් හදයුගල වූ අක්ෂවූ යුවලෙක් වේ. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේට භික්ෂූන් එක්දහස්දෙසිය පණසක් වූ සව්වන්ගේ එක් සන්නිපාතයෙක් විය: නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේට හැම දෙන ම රහතුන් වූ සව්වන්ගේ මේ එක් ම සන්නිපාතය විය. නිදුකාණන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ට **ආනන්ද** නම් භික්ෂු තෙම අග්‍රොපස්ථායක වූ උවටු වේ. නිදුකාණන් වහන්ස, ශුද්ධොදන නම් රජ භාග්‍යවතුන්වහන්සේගේ පියා ය. **මායා** නම් දෙවී වැදු මවු ය. කිඹුල්වත් නම් පුර රජදහන ය. නිදුකාණන් වහන්ස, මෙසේ භාග්‍යවතුන් වහන්සේගේ අභිනිෂ්ක්‍රමණය විය, මෙසේ පැවිද්ද විය, මෙසේ ප්‍රධන් වැඩීම විය, මෙසේ අභිසම්බොධිය විය, මෙසේ දම්සක්පැවැත්වීම විය. නිදුකාණන් වහන්ස, ඒ අපි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වැස කාමයන්හි කාමච්ඡන්දය දුරු කොට මෙහි උපනුම්හ'' යි (කීහ.)

119. මහණෙනි, ඉක්බිති මම අවිහ දෙවියන් හා අතප්ප දෙවියන් කරා ගියෙමි...මහණෙනි ඉන් පසු මම අවිහ දෙවියන් ද අතප්ප දෙවියන් ද හා සුදස්ස දෙවියන් කරා ගියෙමි...මහණෙනි, ඉන් පසු මම අවිහ දෙවියන් ද අතප්ප දෙවියන් ද සුදස්ස දෙවියන් ද කැටුව සුදස්සී දෙවියන් කරා ගියෙමි... මහණෙනි, ඉන් පසු මම අවිහ දෙවියන් ද අතප්ප දෙවියන් ද සුදස්ස දෙවියන් ද සුදස්සී දෙවියන් ද කැටුව අකනිට්ඨක දෙවියන් වෙත ගියෙමි. මහණෙනි, ඒ දෙවි නකාඟි නොයෙක් දහස්ගණන් දෙවියෝ නොයෙක් ලක්ෂ ගණන් දෙවියෝ මා කරා ආහ. අවුත් මා වැඳ එකත්පස් වැ සිටියහ. මහණෙනි, එකත්පස් වැ සිටියා වූ ඒ දෙවියෝ ''නිදුකාණන් වහන්ස, භගවත් අර්හත් විපස්සී සම්මාසම්බුදුහු යම් සමයෙක ලොව පහළ වූහු ද, ඒ මෙයින් යට එකානූ වන කප යැ...යි කීහ.

Free Distribution www.aathaapi.org

120. තස්මිං යෙව ඛො භික්ඛවෙ, දෙවනිකායෙ අනෙකානි දෙවතාසහස්සානි අනෙකානි දෙවතාසතසහස්සානි යෙනාහං තෙනුපසඞ්කමිංසු. උපසංකමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ, තා දෙවතා මං එතදවොචුං: ඉතො ඛො මාරිස, එකතිංසෙ කප්පෙ යං සිඛී භගවා ලොකෙ උදපාදි -පෙ- තෙ මයං මාරිස, සිඛිම්හි භගවති බ්‍රහ්මචරියං -පෙ- ඉධූපපන්නා. සො යෙව ඛො මාරිස, එකතිංසො කප්පො යං වෙස්සභූ භගවා ලොකෙ උදපාදි -පෙ- තෙ මයං මාරිස, වෙස්සභූම්හි භගවති බ්‍රහ්මචරියං චරිත්වා -පෙ- ඉධූපපන්නා.- ඉමස්මිං යෙව ඛො මාරිස, භද්දකප්පෙ කකුසන්ධො භගවා ලොකෙ උදපාදි -පෙ- තෙ මයං මාරිස, කකුසන්ධම්හි භගවති බ්‍රහ්මචරියං චරිත්වා -පෙ- ඉධූපපන්නා. ඉමස්මිං යෙව මාරිස, භද්දකප්පෙ කොණාගමනො භගවා ලොකෙ උදපාදි -පෙ- තෙ මයං මාරිස, කොණාගමනම්හි භගවති බ්‍රහ්මචරියං චරිත්වා -පෙ- ඉධූපපන්නා. ඉමස්මිං යෙව මාරිස, භද්දකප්පෙ කස්සපො භගවා ලොකෙ උදපාදි -පෙ- තෙ මයං මාරිස, කස්සපම්හි භගවති බ්‍රහ්මචරියං චරිත්වා කාමෙසු කාමච්ඡන්දං විරාජෙත්වා ඉධූපපන්නා''ති.

121. තස්මිං යෙව ඛො භික්ඛවෙ, දෙවනිකායෙ අනෙකානි දෙවතාසහස්සානි අනෙකානි දෙවතාසතසහස්සානි යෙනාහං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො භික්ඛවෙ, තා දෙවතා මං එතදවොචුං: ''ඉමස්මිං යෙව ඛො මාරිස, භද්දකප්පෙ භගවා එතරහි අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උප්පන්නො -පෙ- තෙ මයං මාරිස, භගවති බ්‍රහ්මචරියං චරිත්වා කාමෙසු කාමච්ඡන්දං විරාජෙත්වා ඉධූපපන්නා''ති,

122. ඉති ඛො භික්ඛවෙ, තථාගතස්සෙවෙසා ධම්මධාතු සුප්පටිවිද්ධා යස්සා ධම්ම ධාතුයා සුප්පටිවිද්ධත්තා තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ 'ඡින්නවටුමෙ පරියාදින්නවට්ටෙ, සබ්බදුක්ඛවිතිවත්තෙ ජාතිතොපි අනුස්සරති, නාමතොපි අනුස්සරති, ගොත්තතොපි අනුස්සරති, අයුප්පමාණතොපි අනුස්සරති සාවකයුගතොපි ආනුස්සරති, සාවකසන්නිපාතතොපි අනුස්සරති ''එවංජච්චා තෙ භගවන්තො අහෙසුං ඉතිපි, එවංනාමා, එවංගොත්තා, එවංසීලා, එවංධම්මා, එවංපඤ්ඤා, එවංවිහාරී, එවංවිමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපි''ති. දෙවතා'පි තථාගතස්ස එතමත්ථං ආරොචෙසුං යෙන තථාගතො අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතො -පෙ- අනුස්සරති -පෙ- එවංවිමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉතිපි''ති.

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛු භගවතො භාසිතං අභිනන්දුන්ති.

මහාපදානසුත්තං නිට්ඨිතං පඨමං.

Free Distribution www.aathaapi.org

120. මහණෙනි, ඒ දෙවනකාහි ම නොයෙක් දහස් ගණන් නොයෙක් ලක්ෂ ගණන් දෙවියෝ මා වෙත එළැඹියහ. එළැඹ මා වැඳ එකත්පස් ව සිටියහ. මහණෙනි, එකත්පස් ව සිටියාවූ ඒ දෙවියෝ මට මෙය කිහ: ''නිදුකාණන් වහන්ස, යම් **සමයෙක්හි** භගවත් අර්හත් **සිඛී** සම්මා-සම්බුදුහු ලොවැ පහළ වූහු ද, ඒ මෙයින් යට එක්තිස් වන කප ය...නිදුකා-ණන් වහන්ස, මේ අපි භගවත් අර්හත් සිඛී සම්මා සම්බුදුන් කෙරෙහි බඹසර වැස...මෙහි උපනුම්හ. නිදුකාණන් වහන්ස, යම් සමයෙක භගවත් අර්හත් **වෙස්සභූ** සම්මාසම්බුදුහු ලොවැ වූහු ද, ඒ මෙයින් යට ඒ එක්තිස්වන කප මය...නිදුකාණන් වහන්ස, ඒ අපි භගවත් **වෙස්සභූ** සම්මා-සම්බුදුන් කෙරෙහි බඹසර වැස...මෙහි උපනුම්හ''යි කී හ. නිදුකාණන් වහන්ස, මේ බදුරු කපෙහි ම භගවත් අර්හත් **කකුසන්ධ** සම්මාසම්බුදුහු ලොවැ පහළ වූහ ... නිදුකාණන් වහන්ස, ඒ අපි කකුසන්ධ භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වැස ... මෙහි උපනුම්හ. නිදුකාණන් වහන්ස, මෙ බදුරු කපෙහි ම භගවත් අර්හත් **කොණාගමන** සම්මාසම්බුදුහු ලොවැ පහළ වූහ ... නිදුකාණන් වහන්ස, ඒ අපි කොණාගමන භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වැස ... මෙහි උපනුම්හ. නිදුකාණන් වහන්ස, මේ බදුරුකපෙහි ම භගවත් අර්හත් **කාශ්‍යප** සම්මාසම්බුදුහු ලොවැ පහළ වූහ ... ඒ අපි කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වැස කාමව-ජ්ජදය දුරු ලා මෙහි උපනුම්හ''යි කිහ.

121. මහණෙනි, ඒ දෙවනකාහි ම නොයෙක් දහස් ගණන් දෙවියෝ, නොයෙක් ලක්ෂ ගණන් දෙවියෝ මා වෙත එළැඹියහ. එළැඹ මා වැඳ එකත්පස් වැ සිටියහ. මහණෙනි, එකත්පස්ව සිටියාවූ ඒ දෙවියෝ මට ''නිදුකාණන් වහන්ස, මේ බදුරුකපෙහි ම අර්හත් සම්මාසම්බුදු වූ භාග්‍ය-වතුන් වහන්සේ ලොවැ පහළ වූ සේක ... නිදුකාණන් වහන්ස, මුඛ කෙරෙහි බඹසර වැස කාමයන්හි කාමරාගය දුරු කොට මෙහි උපනුම්හ''යි මෙය කිහ.

122. මහණෙනි, මෙසේ යම් ධර්මධාතුවක් මොනොවට පිළිවිදි බැවින් තථාගත තෙමේ ''ඒ භගවත්හු මෙ නම් ජාතියෙහි උපන්හ යි ද, මෙ නම් ඇත්තෝ, මෙ නම් ගොත්‍ර ඇත්තෝ, මෙබඳු ධර්ම ඇත්තෝ, මෙබඳු ප්‍රඥා ඇත්තෝ, මෙබඳු විහරණ ඇත්තෝ, මෙබඳු විමුක්ති ඇත්තෝ වූහ''යි පිරිනිවියාවූ, සිඳිනලද ප්‍රපඤ්ච ඇති, සිඳින ලද වර්ත්ම ඇති, ක්ෂීණ කරන ලද තුන් වට ඇති, සියලු දුක් ඉක්මවූ අතීත බුදුවරුන් ජාති විසිනුත් සිහි කෙරේ ද, නාම විසිනුත් සිහි කෙරේ ද, ගොත්‍ර විසිනුත් සිහි කෙරේ ද, ආයුෂ්ප්‍රමාණ විසිනුත් සිහි කෙරේ ද, ශ්‍රාවකයුග විසිනුත් සිහි කෙරේ ද, ශ්‍රාවකසන්නිපාත විසිනුත් සිහි කෙරේ ද, මහණෙනි, තථාගත බුදුන් විසින් ම ඒ ධර්මධාතුව මොනොවට පිළිවිදුනා ලද්දේ ය. ... 'ඒ භගවත්හු මෙබඳු විමුක්ති ඇත්තෝ වූ හ'යි ද තථාගත බුදුහු පිරිනිවියා වූ අතීත බුදුවරුන් යමෙකින් සිහි කෙරෙද්ද...දෙවියෝත් මේ කරුණ තථාගත බුදුනට දන්වූහ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක. ඒ භික්ෂූහු සතුටු සිතැත්තාහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගත්හ.

පළමු වන මහාපදාන සූත්‍රය නිමියේ යි.

Free Distribution www.aathaapi.org

2.

මහානිදානසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා කුරූසු විහරති කම්මාසදම්මං[1] නාම කුරූනං නිගමො. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, යාවගම්භීරො චායං භන්තෙ, පටිච්චසමුප්පාදෙ ගම්භීරාවභාසො ච. අථ ච පන මෙ උත්තානකුත්තානකො විය බාහති" ති.

2. මා හෙවං ආනන්ද අවච, මා හෙවං ආනන්ද අවච, ගම්භීරො චායං ආනන්ද පටිච්චසමුප්පාදෙ ගම්භීරාවභාසො ච. එතස්ස ආනන්ද, ධම්මස්ස අනනුබොධා අප්පටිවෙධා එවමයං පජා තන්තාකුලකජාතා ගුළාගුණ්ඨිකජාතා[2] මුඤ්ජබබ්බජභූතා[3] අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තති.

3. අත්ථි ඉදප්පච්චයා ජරාමරණන්ති ඉති පුට්ඨෙන සතා ආනන්ද, අත්ථී'ස්ස වචනීයං. කිම්පච්චයා ජරාමරණන්ති ඉති චෙ වදෙය්‍යා, ජාතිපච්චයා ජරාමරණන්ති ඉච්චස්ස වචනීයං.

අත්ථි ඉදප්පච්චයා ජාතීති ඉති පුට්ඨෙන සතා ආනන්ද, අත්ථී'ස්ස වචනීයං. කිම්පච්චයා ජාතීති ඉති චෙ වදෙය්‍යා, භවපච්චයා ජාතීති ඉච්චස්ස වචනීයං.

අත්ථි ඉදප්පච්චයා භවො'ති ඉති පුට්ඨෙන සතා ආනන්ද, අත්ථී'ස්ස වචනීයං. කිම්පච්චයා භවො'ති ඉති චෙ වදෙය්‍යා, උපාදානපච්චයා භවො'ති ඉච්චස්ස වචනීයං.

අත්ථි ඉදප්පච්චයා උපාදනන්ති ඉති පුට්ඨෙන සතා ආනන්ද, අත්ථී'ස්ස වචනීයං. කිම්පච්චයා උපාදනන්ති ඉති චෙ වදෙය්‍යා, තණ්හාපච්චයා උපාදනන්ති ඉච්චස්ස වචනීයං.

---

1. කම්මාසධම්මං – මජ්ඣං
2. ගුළාගුණ්ඨිකජාතා – සී‍මු ගුලගණ්ඨිකජාතා – දී අට්ඨකථා
කුලගණ්ඨිකජාතා – ගුණගණ්ඨිකජාතා – ස්‍යා.
3. මුඤ්ජපබ්බජභූතා – මජ්ඣං • ස්‍යා

Free Distribution www.aathaapi.org

2.

මහානිදාන සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කුරු රටැ කුරු දනවු වැස්සන්ගේ කල්මාෂදම්‍ය නම් යම් නියම ගමෙක් වී ද, එහි වැඩ වසන සේක. ඒ කල්හි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක හිඳ ගත්හ. එක්පසෙක හුන් ආයුෂ්මත් අනඳ තෙරණුවෝ "වහන්ස, මේ ප්‍රතීත්‍යසමුත්පාදය කොතරම් ගැඹුරු ද, කොතරම් ගැඹුරු පෙනුම් ඇත්තේ ද යනු ආශ්චර්‍ය්‍ය ය, අද්භූත ය. එතෙකුදු වුවත් මට එය ප්‍රකට වූවක් මෙන්, ඉතා ප්‍රකට වූවක් මෙන් වැටැහේ යැ" යි කීහ.

2. "ආනන්දය, එසේ නො කිය. ආනන්දය, එසේ නො කිය. ආනන්දය, මේ ප්‍රතීත්‍යසමුත්පාදය ගැඹුරු ද වේ, ගැඹුරු පෙනුම් ඇත්තේ ද වේ. ආනන්දය, මේ ධර්මය අනුබෝධ නො කිරීමෙන්, ප්‍රතිවේධ නො කිරීමෙන් මෙසේ මේ සත්ත්වප්‍රජාව (ඉපෙහර) ගුලිකැටියක් මෙන් අවුල් වූවා, කැඳ ලූ පෙහෙර හූ මෙන් ගැට ගැසුණි නොහොත් කිටිලි කසල්ලක් බදු වූවා, මුදුතණ බබුස් තණ සේ අවුල් වූවා සැපයෙන් පහ වූ, නපුරු ගති ඇති, විවශ ව පතිත වීම් ඇති අපාය ද සසර ද ඉක්ම නො යෙයි.

3. ආනන්දය, 'මේ යම් ප්‍රත්‍යයයෙකින් ජරාමරණ වේ නම්, එසේ වූ ප්‍රත්‍යයයෙක් ඇත් ද?'යි විචාරන ලද්දහු විසින් 'ඇතැ'යි ඔහුට කිය යුතු. 'කිමෙක ප්‍රත්‍යයයෙන් ජරාමරණ වේ ද'? යි මෙසේ විචාරන්නේ නම් 'ජාතිප්‍රත්‍යයයෙන් ජරාමරණ වේ යැ'යි මෙසේ ඔහුට කිය යුතු.

ආනන්දය, 'මේ යම් ප්‍රත්‍යයයෙකින් ජාතිය (ඉපැත්ම) වේ නම්, එසේ වූ ප්‍රත්‍යයයෙක් ඇත් ද? යි මෙසේ විචාරන ලද්දහු විසින් 'ඇතැ'යි ඔහුට කිය යුතු. 'කිමෙක ප්‍රත්‍යයයෙන් ජාතිය වේ ද'යි මෙසේ කියන්නේ නම් 'භවප්‍රත්‍යයයෙන් ජාතිය වේ යැ' යි මෙසේ ඔහුට කිය යුතු.

ආනන්දය, 'මේ යම් ප්‍රත්‍යයයෙකින් භවය වේ නම්, එසේවූ ප්‍රත්‍යයයෙක් ඇත්ද?'යි මෙසේ විචාරන ලද්දහු විසින් 'ඇතැ'යි ඔහුට කියයුතු. කිමෙක ප්‍රත්‍යයයෙන් භවය වේ ද?' යි මෙසේ විචාරන්නේ නම් 'උපාදාන ප්‍රත්‍යයයෙන් භවය වේ යැ'යි මෙසේ ඔහුට කිය යුතු.

ආනන්දය, මේ යම් ප්‍රත්‍යයයෙකින් උපාදානය වේ නම්, එබඳු ප්‍රත්‍යයයෙක් ඇත් ද?' යි මෙසේ විචාරන ලද්දහු විසින් 'ඇතැ'යි ඔහුට කිය යුතු. 'කිමෙක ප්‍රත්‍යයයෙන් උපාදානය වේ ද'යි මෙසේ විචාරන්නේ නම් තෘෂ්ණාප්‍රත්‍යයයෙන් උපාදානය වේ යැ' යි මෙසේ ඔහුට කිය යුතු.

Free Distribution www.aathaapi.org

අත්ථි ඉදප්පච්චයා තණ්හා'ති ඉති පුට්ඨෙන සතා ආනන්ද අත්ථි'ස්ස වචනීයං, කිම්පච්චයා තණ්හා'ති ඉති චෙ වදෙය්‍ය, වෙදනාපච්චයා තණ්හා'ති ඉච්චස්ස වචනීයං,

අත්ථි ඉදප්පච්චයා වෙදනා'ති ඉති පුට්ඨෙන සතා ආනන්ද අත්ථි'ස්ස වචනීයං. කිම්පච්චයා වෙදනා'ති ඉති චෙ වදෙය්‍ය, ඵස්සපච්චයා වෙදනා'ති ඉච්චස්ස වචනීයං.

අත්ථි ඉදප්පච්චයා ඵස්සෝ'ති ඉති පුට්ඨෙන සතා ආනන්ද අත්ථි'ස්ස වචනීයං. කිම්පච්චයා ඵස්සෝ'ති ඉති චෙ වදෙය්‍ය, නාමරූපපච්චයා ඵස්සෝ'ති ඉච්චස්ස වචනීයං.

අත්ථි ඉදප්පච්චයා නාමරූපන්ති ඉති පුට්ඨෙන සතා ආනන්ද අත්ථි'ස්ස වචනීයං. කිම්පච්චයා නාමරූපන්ති ඉති චෙ වදෙය්‍ය, විඤ්ඤාණපච්චයා නාමරූපන්ති ඉච්චස්ස වචනීයං.

අත්ථි ඉදප්පච්චයා විඤ්ඤාණන්ති ඉති පුට්ඨෙන සතා ආනන්ද අත්ථි'ස්ස වචනීයං. කිම්පච්චයා විඤ්ඤාණන්ති ඉති චෙ වදෙය්‍ය, නාමරූපපච්චයා විඤ්ඤාණන්ති ඉච්චස්ස වචනීයං.

ඉති ඛො ආනන්ද නාමරූපපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා ඵස්සෝ, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවෝ, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදෝමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හොති.''

4. ''ජාතිපච්චයා ජරාමරණන්ති ඉති ඛො පනෙතං වුත්තං. තදනන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං යථා ජාතිපච්චයා ජරාමරණං: ජාති ච හි ආනන්ද නාභවිස්ස සෙය්‍යථිදං: දෙවානං වා දෙවත්තාය, ගන්ධබ්බානං වා ගන්ධබ්බත්තාය, යක්ඛානං වා යක්ඛත්තාය, භූතානං වා භූතත්තාය, මනුස්සානං වා මනුස්සත්තාය, චතුප්පදානං වා චතුප්පදත්තාය, පක්ඛීනං වා පක්ඛිත්තාය, සිරිංසපානං වා සිරිංසපත්තාය[1], තෙසං තෙසඤ්හි ආනන්ද සත්තානං තථත්තාය[2] ජාති නාභවිස්ස, සිඤ්ඤසෙ ජාතියා අසති ජාතිනිරොධා අපි නු ඛො ජරාමරණං පඤ්ඤායෙථා?''ති.

''නො හෙතං භන්තෙ''.

''තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයෝ එස පච්චයෝ ජරාමරණස්ස යදිදං ජාති''.

---

1. සරීසපානං වා මජ්ඣෙ
2. තදත්තත්තාය – මජ්ඣෙ

Free Distribution www.aathaapi.org

ආනන්දය, 'මේ යම් ප්‍රත්‍යයයෙකින් තෘෂ්ණාව වේ නම්, එසේ වූ ප්‍රත්‍යයයෙක් ඇද්ද?'යි මෙසේ විචාරන ලද්දාහු විසින් 'ඇතැ'යි ඔහුට කිය යුතු. 'කිමෙක ප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ ද'? යි මෙසේ විචාරන්නේ නම් 'වෙදනාප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ' යැ යි මෙසේ ඔහුට කිය යුතු.

ආනන්දය, 'මේ යම් ප්‍රත්‍යයයෙකින් වේදනාව වේ නම්, එබඳු වූ ප්‍රත්‍යයයෙක් ඇද්ද? යි මෙසේ විචාරන ලද්දාහු විසින් 'ඇතැ'යි ඔහුට කිය යුතු. 'කිමෙක ප්‍රත්‍යයයෙන් වේදනාව වේ ද?'යි මෙසේ විචාරන්නේ නම් 'ස්පර්ශප්‍රත්‍යයයෙන් වේදනාව වේ' යැ යි මෙසේ ඔහුට කිය යුතු.

ආනන්දය, 'මේ යම් ප්‍රත්‍යයයෙකින් ස්පර්ශය වේ නම්, එසේ වූ ප්‍රත්‍යයයෙක් ඇද්ද?'යි මෙසේ විචාරන ලද්දාහු විසින් 'ඇතැ'යි ඔහුට කියා යුතු 'කිමෙක ප්‍රත්‍යයයෙන් ස්පර්ශය වේ ද'යි මෙසේ විචාරන්නේ නම් 'නාම රූපප්‍රත්‍යයයෙන් ස්පර්ශය වේ' යැ යි මෙසේ ඔහුට කිය යුතු.

ආනන්දය, 'මේ යම් ප්‍රත්‍යයයෙකින් නාමරූපය වේ නම්, එසේ වූ ප්‍රත්‍යයයෙක් ඇද්ද'යි මෙසේ විචාරන ලද්දාහු විසින් 'ඇතැ'යි ඔහුට කිය යුතු. 'කිමෙක ප්‍රත්‍යයයෙන් නාමරූපය වේ ද?'යි මෙසේ විචාරන්නේ නම් 'විඤ්ඤාණප්‍රත්‍යයයෙන් නාමරූපය වේ යැ'යි ඔහුට කිය යුතු.

මේ යම් ප්‍රත්‍යයයෙකින් විඤ්ඤාණය වේ නම්, එසේ වූ ප්‍රත්‍යයයෙක් ඇද්දැයි විචාරන ලද්දාහු විසින් 'ඇතැ'යි ඔහුට කිය යුතු. 'කිමෙක ප්‍රත්‍යයයෙන් විඤ්ඤාණය වේ ද?'යි මෙසේ විචාරන්නේ නම් 'නාමරූප-ප්‍රත්‍යයයෙන් විඤ්ඤාණය වේ' යැයි මෙසේ ඔහුට කිය යුතු.

ආනන්දය, මෙසේ නාමරූපප්‍රත්‍යයයෙන් විඤ්ඤාණය වේ. විඤ්ඤාණප්‍රත්‍යයයෙන් නාමරූපය වේ. නාමරූපප්‍රත්‍යයයෙන් ස්පර්ශය වේ. ස්පර්ශප්‍රත්‍යයයෙන් වේදනාව වේ. වෙදනාප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ. තෘෂ්ණාප්‍රත්‍යයයෙන් උපාදනය වේ. උපාදනප්‍රත්‍යයයෙන් භවය වේ. භවප්‍රත්‍යයයෙන් ජාතිය වේ. ජාතිප්‍රත්‍යයයෙන් ජරාමරණ, ශොක පරිදෙව දුක් දෙමනස් උපායාස යන මොහු පහළ වෙත්. මෙසේ මේ සියලු දුක්ඛස්කන්ධයාගේ ඉපැත්ම වේ.''

4. ''ආනන්දය, 'ජාතිප්‍රත්‍යයයෙන් ජරාමරණ වේ' යැ යි මෙසේ ම මෙය කියන ලදි. ආනන්දය, යම්සේ ජාතිප්‍රත්‍යයයෙන් ජරාමරණ වේ ද, මෙය මේ කරුණිතුත් දත යුතු: ආනන්දය, හැම අයුරින් ම හැම ලෙයින් ම ජාතිය කිසිවකුට කිසිදු තැනෙක නොවී නම්, විභාග වීසින් – දෙවියන්ගේ දෙවබව පිණිස හෝ ගඳෙව්වන්ගේ ගඳෙවුබව පිණිස හෝ යකුන්ගේ යක්ඛබව පිණිස හෝ උපන් කවර හෝ සතුන් ගේ ඒ ලත් අත්බව පිණිස හෝ මිනිසුන් ගේ මිනිස්බව පිණිස හෝ සිවුපාවන් ගේ සිවුපාබව පිණිස හෝ පක්ෂීන්ගේ පක්ෂි බව පිණිස හෝ සරීසෘපයන්ගේ (බඩ ගා යන සතුන්ගේ) සරීසෘප බව පිණිස හෝ ඒ ඒ සතුන් ගේ එසේ වීම පිණිස ජාතිය නො වී නම්, සර්වප්‍රකාරයෙන් ම ජාතිය නැති කල්හි ජාතියගේ නිරොධයෙන් (අභාවයෙන්) ජරාමරණය පැනෙන්නේ ද?''

''වහන්ස, මෙය නො ම වන්නේ යැ'' යි ආනඳ තෙරණුවෝ වදළහ.

''එහෙයින් ආනන්දය, යම් මේ ජාතියෙක් වේ ද, ජරාමරණයට මෙය ම හෙතු ය, මෙය ම නිදාන ය, මෙය ම සමුදය ය, මෙය ම ප්‍රත්‍යය ය.''

Free Distribution www.aathaapi.org

5. "භවපච්චයා ජාතීති ඉති ඛො පනෙතං වුත්තං. තදඤ්ඤ ඉමිඤ්ඤාපෙතං පරියායෙන වෙදිතබ්බං යථා භවපච්චයා ජාති: භවො ච හි ආනන්ද නාභවිස්ස සඤ්ඤත්ත සඤ්ඤං සඤ්ඤථා සඤ්ඤං කසස්ව කිම්හිච් සෙය්‍යථිදං: කාමභවො රූපභවො අරූපභවො, සඤ්ඤිසො භවෙ අසති භවනිරොධා අපි නු ඛො ජාති පඤ්ඤායෙථා?" ති.

"නොහෙතං භන්තෙ".

"තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො ජාතියා යදිදං භවො."

6. "උපාදානපච්චයා භවො'ති ඉති ඛො පනෙතං වුත්තං. තදඤ්ඤ ඉමිඤ්ඤාපෙතං පරියායෙන වෙදිතබ්බං: යථා උපාදානපච්චයා භවො: උපාදානං ච හි ආනන්ද නාභවිස්ස සඤ්ඤත්ත සඤ්ඤං සඤ්ඤථා සඤ්ඤං කසස්ව කිම්හිච්– සෙය්‍යථිදං: කාමූපාදානං වා දිට්ඨූපාදානං වා සීලබ්බතූපාදානං වා අත්තවා දූපාදානං වා– සඤ්ඤිසො උපාදනෙ අසති උපාදානනිරොධා අපි නු ඛො භවො පඤ්ඤායෙථා?" ති.

"නොහෙතං භන්තෙ."

"තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො භවස්ස යදිදං උපාදානං."

7. තණ්හාපච්චයා උපාදානන්ති ඉති ඛො පනෙතං වුත්තං. තදඤ්ඤ ඉමිඤ්ඤාපෙතං පරියායෙන වෙදිතබ්බං: යථා තණ්හාපච්චයා උපාදානං: තණ්හා ච හි ආනන්ද නාභවිස්ස සඤ්ඤත්ත සඤ්ඤං සඤ්ඤථා සඤ්ඤං කසස්ව කිම්හිච් – සෙය්‍යථිදං; රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා– සඤ්ඤිසො තණ්හාය අසති තණ්හානිරොධා අපි නු ඛො උපාදානං පඤ්ඤායෙථා?" ති.

"නොහෙතං භන්තෙ".

"තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො උපාදානස්ස යදිදං තණ්හා"

8. "වෙදනාපච්චයා තණ්හා'ති ඉති ඛො පනෙතං වුත්තං. තදඤ්ඤ ඉමිඤ්ඤාපෙතං පරියායෙන වෙදිතබ්බං යථා වෙදනාපච්චයා තණ්හා; වෙදනා ච හි ආනන්ද නාභවිස්ස සඤ්ඤත්ත සඤ්ඤං සඤ්ඤථා සඤ්ඤං කසස්ව කිම්හිච් –සෙය්‍යථිදං: චක්ඛුසම්ඵස්සජා වෙදනා සොතසම්ඵස්සජා වෙදනා ඝානසම්ඵස්සජා වෙදනා කායසම්ඵස්සජා වෙදනා මනොසම්ඵස්සජා වෙදනා,– සඤ්ඤිසො වෙදනාය අසති වෙදනානිරොධා අපි නු ඛො තණ්හා පඤ්ඤායෙථා?" ති.

"නො හෙතං භන්තෙ".

"තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො තණ්හාය යදිදං වෙදනා."

Free Distribution www.aathaapi.org

5. "භවප්‍රත්‍යයයෙන් ජාතිය වේ යැ යි මෙසේ ම මෙය කියන ලදි. ආනන්දය, යම්සේ භවප්‍රත්‍යයයෙන් ජාතිය වේ ද, එය මෙ කරුණින් ද දත යුතු: ආනන්දය, කිසිවකුට කිසිදු තැනෙක හැම අයුරින් ම හැම ලෙසින් ම කාමභව, රූපභව, අරූපභව යන භවයෙක් නො වී නම්, හැම අයුරින් ම භවය නැති කල්හි භවනිරොධයෙන් ජාතියෙක් පැනෙන්නේ ද?"

"වහන්ස, මෙය නො ම වන්නේ යැ"යි අනඳ තෙරණුවෝ වදළහ.

"ආනන්දය, එහෙයින් යම් මේ භවයෙක් වේ ද මෙය ම ජාතියට හෙතු ය, මෙය ම ජාතියට නිදන ය, මෙය ම ජාතියගේ සමුදය ය, මෙය ම ජාතියට ප්‍රත්‍යය ය."

6. "උපාදන ප්‍රත්‍යයයෙන් භවය වේ යැ යි මෙසේ ම මෙය කියන ලදි. ආනන්දය, උපාදනප්‍රත්‍යයයෙන් යම්සේ භවය වේ ද, එය මෙ කරුණින් ද දත යුතු: ආනන්දය, කමොපාදන ද දෘෂ්ටුපාදන ද ශීලව්‍රතොපාදන ද ආත්මවාදෙපාදන ද යන මේ උපාදනයෙක් හැම අයුරින් ම හැම ලෙසින් ම කිසිවක්හට කිසිදු තැනෙක නො වී නම්, හැම අයුරින් ම උපාදනයක් නැති කල්හි උපාදනනිරොධයෙන් භවයෙක් පැනෙන්නේ ද"?

"වහන්ස, මෙය නො වේ ම ය."

"ආනන්දය, එහෙයින් යම් මේ උපාදනයෙක් වේද, මෙය ම භවයට හෙතු ය, මෙය ම නිදන ය, මෙය ම සමුදය ය, මෙය ම ප්‍රත්‍යය ය".

7. "තෘෂ්ණාප්‍රත්‍යයයෙන් උපාදනය වේ යැ යි මෙසේ ම මෙය කියන ලදි. ආනන්දය, යම්සේ තෘෂ්ණාප්‍රත්‍යයයෙන් උපාදනය වේ ද, එය මෙ කරුණිනුදු දත යුතු: ආනන්දය, රූපතෘෂ්ණා ශබ්දතෘෂ්ණා ගන්ධතෘෂ්ණා රසතෘෂ්ණා සප්‍රෂ්ටව්‍යතෘෂ්ණා යන මේ යම් තෘෂ්ණාවෙක් කිසිවක්හු පිළිබඳ ව කිසිදු තැනෙක හැම අයුරින් ම හැම ලෙසින් ම නො වී නම්, සර්වප්‍රකාරයෙන් ම තෘෂ්ණාව නැති කල්හි තෘෂ්ණාවගේ නිරොධයෙන් උපාදනයෙක් පැනෙන්නේ ද?"

"වහන්ස, මෙය නො වන්නේ ම ය."

"ආනන්දය, එහෙයින් තෘෂ්ණාසංඛ්‍යාත මෙය ම උපාදනයාගේ හෙතු ය, මෙය ම නිදනය ය, මෙය ම සමුදය ය, මෙය ම තෘෂ්ණාවගේ ප්‍රත්‍යය ය."

8. "වෙදනාප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ යැ යි මෙසේ ම මෙය කියන ලදි. ආනන්දය, යම්සේ වෙදනාප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ ද, එය මෙ කරුණිනුත් දත යුතු: ආනන්දය, චක්ඛුසම්ඵස්සජ වෙදනා ය, සොතසම්ඵස්සජ වෙදනා ය, ඝානසම්ඵස්සජ වෙදනාය, ජිව්හාසම්ඵස්සජ වෙදනා ය, කායසම්ඵස්සජ වෙදනා ය මනොසම්ඵස්සජ වෙදනා ය යන මේ යම් වෙදනාවෙක් කිසිවක්හට කිසිදු තැනෙක සියලු අයුරින් ම සියලු ලෙසින් ම නො වී නම්, හැම අයුරින් ම වෙදනාව නැති කල්හි වෙදනාවගේ නිරොධයෙන් තෘෂ්ණාව පැනෙන්නේ ද?"

"වහන්ස, මෙය නො වන්නේ ම ය."

"ආනන්දය, එහෙයින් වෙදනා යන මෙය ම තෘෂ්ණාවට හෙතු වේ, මෙය ම නිදනය වේ, මෙය ම සමුදයය වේ, මෙය ම ප්‍රත්‍යයය වේ."

Free Distribution www.aathaapi.org

9. ඉති ඛො පනෙතං ආනන්ද වෙදනං පටිච්ච තණ්හා, තණ්හං පටිච්ච පරියෙසනා, පරියෙසනං පටිච්ච ලාභො, ලාභං පටිච්ච විනිච්ඡයො, විනිච්ඡයං පටිච්ච ඡන්දරාගො, ඡන්දරාගං පටිච්ච අජ්ඣොසානං, අජ්ඣොසානං පටිච්ච පරිග්ගහො, පරිග්ගහං පටිච්ච මච්ඡරියං, මච්ඡරියං පටිච්ච ආරක්ඛො, ආරක්ඛාධිකරණං[1] පටිච්ච දණ්ඩාදාන සත්ථාදානකලහවිග්ගහවිවාදතුවංතුවං පෙසුඤ්ඤමුසාවාද අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති.

10. ආරක්ඛාධිකරණං දණ්ඩාදානසත්ථාදානකලහ-විග්ගහ-විවාද-තුවන්තුවං – පෙසුඤ්ඤ – මුසාවාද අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්තීති ඉති ඛො පනෙතං වුත්තං. තදානන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං යථා ආරක්ඛාධිකරණං දණ්ඩාදාන – සත්ථාදාන – කලහ – විග්ගහ – විවාද – තුවන්තුවං – පෙසුඤ්ඤ – මුසාවාද අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති: ආරක්ඛො ච හි ආනන්ද නාභවිස්ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්සචි කිම්හිචි, සබ්බසො ආරක්ඛෙ අසති ආරක්ඛනිරොධා අපි නු ඛො දණ්ඩාදාන – සත්ථාදාන – කලහ – විග්ගහ – විවාද – තුවන්තුවං – පෙසුඤ්ඤ – මුසාවාද අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවෙය්‍යුන්ති?.

"නො හෙතං භන්තෙ."

තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො දණ්ඩ දාන – සත්ථාදාන කලහ – විග්ගහ – විවාද – තුවන්තුවං – පෙසුඤ්ඤ – මුසාවාදානං අනෙකෙසං පාපකානං අකුසලානං ධම්මානං සම්භවාය යදිදං ආරක්ඛො.

11. මච්ඡරියං පටිච්ච ආරක්ඛො'ති ඉති ඛො පනෙතං වුත්තං තදානන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං යථා මච්ඡරියං පටිච්ච ආරක්ඛො: මච්ඡරියං ච හි ආනන්ද නාභවිස්ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්සචි කිම්හිචි, සබ්බසො මච්ඡරියෙ අසති මච්ඡරියනිරොධා අපි නු ඛො ආරක්ඛො පඤ්ඤායෙථාති?

"නො හෙතං භන්තෙ."

තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො ආරක්ඛස්ස යදිදං මච්ඡරියං.

12. පරිග්ගහං පටිච්ච මච්ඡරියන්ති ඉති ඛො පනෙතං වුත්තං. තදානන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං. යථා පරිග්ගහං පටිච්ච මච්ඡරියං: පරිග්ගහො ච හි ආනන්ද නාභවිස්ස සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං කස්සචි කිම්හිචි, සබ්බසො පරිග්ගහෙ අසති පරිග්ගහනිරොධා අපි නු ඛො මච්ඡරියං පඤ්ඤායෙථා ති?

"නො හෙතං භන්තෙ."

තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයෙ මච්ඡරියස්ස යදිදං පරිග්ගහො.

---

1. ආරක්ඛං පටිච්ච ආරක්ඛාධිකරණං – ස්‍යා

Free Distribution www.aathaapi.org

9. "ආනන්දය, මෙසේ මේ වේදනාව නිසා තෘෂ්ණාව වේ. තෘෂ්ණාව නිසා පර්යේෂණය (අරමුණු සෙවීම) වේ. පර්යේෂණය නිසා ලාභය (අරමුණු ලැබීම) වේ. ලාභය නිසා විතර්කවිනිශ්චය (අරමුණෙහි ඉටු අනිටු බව විතර්කයෙන් නිශ්චය කොට ගැනීම) වේ. විනිශ්චය නිසා ඡන්දරාගය (විතර්කිත වස්තුව කෙරෙහි ඇල්ම) වේ. ඡන්දරාගය නිසා අධ්‍යවසානය (මම ය මගේ යැ යි බලවත් සනිටුහන) වේ. අධ්‍යවසානය නිසා පරිග්‍රහය (තෘෂ්ණා දෘෂ්ටි වියින් මගේයැ යි අයත් කරා ගැන්ම) වේ. පරිග්‍රහය නිසා මසුරුබව වේ. මසුරුබව නිසා රැක්ම වේ. රැක්ම කරණ කොට ගෙන දඬුමුගුරු දුරුම්, අවි දුරුම්, කලහ, විග්‍රහ (විරොධ පැම) විවාද, තුවංතුවං වාද (ඇනුම් බැණුම්), කේලාම්, මුසාබිණුම්, නොයෙක් ලාමක අකුසල්දහම්හු පහළ වෙත්.

10. "රකවළ කරන කරුණෙන් දඬුමුගුරු දුරුම් අවි දුරුම් කලහ විග්‍රහ විවාද තුවන්තුවංවාද කේලාම් මුසාබස්, නොයෙක් අකුසල් දහම්හු පහළ වෙති යි මෙය මෙසේ ම කියන ලද්දේ ය. ආනන්දය, රකවළ කරන කරුණින් දඬුමුගුරු දුරුම් අවිදුරුම් කලහ විග්‍රහ විවාද තුවන්තුවංවාද කේලාම් මුසාබිණුම්, නොයෙක් අකුසල් දහම්හු යම්සේ පහළ වෙත් ද, එය මේ කරුණෙන් ද දත යුතු: ආනන්දය, කිසිවක්හුගෙත් කිසි කැනෙක්-හිත් හැම අයුරින් හැම ලෙසින් රකවළෙක් නො වී නම්, හැම අයුරින් රකවළක් නැති කල්හි, රකවළ නැති බැවින් දඬුමුගුරු දුරුම් අවිදුරුම් කලහ විග්‍රහ විවාද තුවන්තුවංවාද කේලාම් මුසාබිණුම්, නොයෙක් අකුසල් දහම්හු පහළ වන්නාහු ද?"

"වහන්ස, මෙය නො වන්නේ ම ය."

"ආනන්දය, එහෙයින් දඬුමුගුරු දුරුම් අවිදුරුම් කලහ විග්‍රහ විවාද තුවන්තුවංවාද කේලාම් මුසාබිණුම් යන මොවුන්ගේ, නොයෙක් අකුසල්ද-හමුන්ගේ හට ගැන්මට වස්තුව රැක ගැන්ම යන මෙය ම හෙතු ය, මෙය ම නිදන ය, මෙය ම සමුදය ය, මෙය ම ප්‍රත්‍යය ය."

11. "මසුරුබව නිසා රැක ගැන්ම වේ යැ යි මෙසේ මෙය කියන ලද්දේ ම ය. ආනන්දය, මසුරුබව නිසා රැක ගැන්ම යම්සේ වේ ද, එය මෙ කරුණිනුදු දත යුතු: ආනන්දය, කිසිවක්හුගේ කිසි කැනෙක හැම අයුරින් හැම ලෙසින් මසුරුබවෙක් නො වී නම්, හැම අයුරින් මසුරුබව නැති කල්හි, මසුරුබව නැති වීමෙන් වස්තු රැක ගැන්මෙක් පැණෙන්නේ ද?"

"වහන්ස මෙය නො වන්නේ ම ය."

"ආනන්දය, එහෙයින් මසුරුබවය යන මෙය ම වස්තුව රැක ගැන්මට හෙතු ය, මෙය ම නිදනය ය, මෙය ම සමුදය ය, මෙය ම ප්‍රත්‍යය ය."

12. "පරිග්‍රහය (අයත් කොට ගැනීම) නිසා මසුරුබව වේ යැ යි මෙසේ මෙය කියන ලද්දේ ම ය. ආනන්දය, පරිග්‍රහය නිසා මසුරුබව යම්සේ වේ ද, එය මේ කරුණින් ද දත යුතු: ආනන්දය, කිසිවක්හුගේ කිසි කැනෙකත් හැම අයුරින් හැම ලෙසින් පරිග්‍රහයෙක් නො වී නම්, හැම අයුරින් පරිග්‍රහයක් නැති කල්හි, පරිග්‍රහනිරොධයෙන් මසුරුබවෙක් පැණෙනනේ ද?"

"වහන්ස, මෙය නො වන්නේ ම ය."

"ආනන්දය, එහෙයින් මසුරුබවට පරිග්‍රහය යන මෙය ම නිදන ය, මෙය ම සමුදය ය, මෙය ම ප්‍රත්‍යය ය."

Free Distribution www.aathaapi.org

13. "අජ්ඣාසානං පටිච්ච පරිඤ්ඤහෝ'ති ඉති ඛො පනෙතං වුත්තං. තදනන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං යථා අජ්ඣාසාත්තං පටිච්ච පරිඤ්ඤහෝ; අජ්ඣාසානං ච හි ආනන්ද නාභවිස්ස සඤ්ඤන සඤ්ඤං සඤ්ඤථා සඤ්ඤං කස්සවි කිමහිවි. සඤ්ඤසො අජ්ඣාසානෙ අසති අජ්ඣාසාන නිරොධා අපි නු ඛො පරිඤ්ඤහෝ පඤ්ඤ්යෙථා?"ති

"නෝ හෙතං භන්තෙ."

"තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයෝ එස පච්චයෝ පරිඤ්ඤහස්ස යදිදං අජ්ඣාසානං."

14. "ඡන්දරාගං පටිච්ච අජ්ඣාසාන න්ති ඉති ඛො පනෙතං වුත්තං. තදනන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං. යථා ඡන්දරාගං පටිච්ච අජ්ඣාසානං; ඡන්දරාගො ච හි ආනන්ද නාභවිස්ස සඤ්ඤන සඤ්ඤ සඤ්ඤථා සඤ්ඤං කස්සවි කිමහිවි, සඤ්ඤසො ඡන්දරාගෙ අසති ඡන්දරාගනිරොධා අපි නු ඛො අජ්ඣාසානං පඤ්ඤ්යෙථා?ති."

"නෝ හෙතං භන්තෙ."

"තස්මාතිහානන්ද එසෙව හෙතු. එතං නිදානං එස සමුදයෝ එස පච්චයෝ අජ්ඣාසානස්ස යදිදං ඡන්දරාගො."

15. "විනිච්ඡයං පටිච්ච ඡන්දරාගො'ති ඉති ඛො පනෙතං වුත්තං. තදනන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං යථා විනිච්ඡයං පටිච්ච ඡන්දරාගො; විනිච්ඡයෝ ච හි ආනන්ද නාභවිස්ස සඤ්ඤන සඤ්ඤං සඤ්ඤථා සඤ්ඤං කස්සවි කිමහිවි, සඤ්ඤසො විනිච්ඡයෙ අසති විනිච්ඡයනිරොධා අපි නු ඛො ඡන්දරාගො පඤ්ඤ්යෙථා?"ති

"නෝ හෙතං භන්තෙ."

"තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයෝ එස පච්චයෝ ඡන්දරාගස්ස, යදිදං විනිච්ඡයෝ."

16. "ලාභං පටිච්ච විනිච්ඡයෝ'ති ඉති ඛො පනෙතං වුත්තං. තදනන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං යථා ලාභං පටිච්ච විනිච්ඡයෝ; ලාභෝ ච හි ආනන්ද නාභවිස්ස සඤ්ඤන සඤ්ඤං සඤ්ඤථා සඤ්ඤං කස්සවි කිමහිවි, සඤ්ඤසො ලාභෙ අසති ලාභනිරොධා අපි නු ඛො විනිච්ඡයෝ පඤ්ඤ්යෙථා?"ති

"නෝ හෙතං භන්තෙ"

"තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයෝ එස පච්චයෝ විනිච්ඡයස්ස යදිදං ලාභෝ."

17. "පරියෙසනං පටිච්ච ලාභෝ'ති ඉති ඛො පනෙතං වුත්තං. තදනන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං යථා පරියෙසනං පටිච්ච ලාභෝ; පරියෙසනා ච හි ආනන්ද නාභවිස්ස සඤ්ඤන සඤ්ඤං සඤ්ඤථා සඤ්ඤං කස්සවි කිමහිවි, සඤ්ඤසො පරියෙසනාය අසති පරියෙසනානිරොධා අපි නු ඛො ලාභෝ පඤ්ඤ්යෙථා?"ති

"නෝ හෙතං භන්තෙ."

"තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයෝ එස පච්චයෝ ලාභස්ස යදිදං පරියෙසනා."

Free Distribution www.aathaapi.org

13. "අධ්‍යවසානය (මම ය, මාගේ යයි බලවත් සේ සනිටුහන් කිරීම) නිසා වස්තුපරිග්‍රහය වේ යැ යි මෙසේ ම මෙය කියන ලද්දේ ය. ආනන්දය, අධ්‍යවසානය නිසා වස්තුපරිග්‍රහය යම්සේ වේ ද, එය මෙ කරුණෙන් ද දත යුතු: ආනන්දය, කිසිවක්හුගේ කිසි ද තැනෙක අධ්‍යවසානයෙක් හැම අයුරින් හැම ලෙසින් නො වී නම්, හැම අයුරින් අධ්‍යවසානය නැති කල්හි, අධ්‍යවසානනිරොධයෙන් වස්තුපරිග්‍රහයෙක් පැනෙන්නේ ද?"

"වහන්ස මෙය නො වන්නේ ම ය."

"ආනන්දය එහෙයින් අධ්‍යවසානය යන යමෙක් ඇද්ද, පරිග්‍රහයට මෙය ම හෙතු ය, මෙය ම නිදන ය, මෙය ම සමුදය ය, මෙය ම ප්‍රත්‍යය ය."

14. "ඡන්දරාගය නිසා අධ්‍යවසානය වේ යැ යි මෙසේ ම මෙය කියන ලද්දේ ය. ආනන්දය, ඡන්දරාගය නිසා අධ්‍යවසානය යම්සේ වේ ද, එය මෙ කරුණින් ද දත යුතු: ආනන්දය, කිසිවක්හුගේ කිසිතැනෙක හැම අයුරින් හැම ලෙසින් ඡන්දරාගයෙක් නො වී නම්, හැම අයුරින් ඡන්දරාගය නැති කල්හි, ඡන්දරාගනිරොධයෙන් අධ්‍යවසානයෙක් පැනෙන්නේ ද?"

"වහන්ස, මෙය නො වන්නේ ම ය."

"ආනන්දය එහෙයින් ඡන්දරාගය යන මෙය ම අධ්‍යවසානයට හෙතු ය, මෙය ම නිදන ය, මෙය ම සමුදය ය, මෙය ම ප්‍රත්‍යයය."

15. "විනිශ්චයය නිසා ඡන්දරාගය වේ යැ යි මෙසේ ම මෙය කියන ලද්දේ ය. ආනන්දය, යම්සේ විනිශ්චයය නිසා ඡන්දරාගය වේ ද, එය මෙ කාරණයෙනුදු දත යුතු: ආනන්දය, කිසිවක්හුගේ කිසිතැනෙක හැම අයුරින් හැම ලෙසින් විනිශ්චයයෙක් නො වී නම්, හැම අයුරින් විනිශ්චය-යක් නැති කල්හි, විනිශ්චයයාගේ අභාවයෙන් ඡන්දරාගයෙක් පැනෙන් නේ ද?"

"වහන්ස, මෙය නො වන්නේ ම ය."

"ආනන්දය, එහෙයින් විනිශ්චය යන යමෙක් වේ නම්, මෙය ම ඡන්දරාගයට හෙතු ය, මෙය ම නිදන ය, මෙය ම සමුදය ය, මෙය ම ප්‍රත්‍යය ය."

16. "ලාභය නිසා විනිශ්චයය වේයැ යි මෙසේ ම මෙය කියන ලදි. ආනන්දය, ලාභය නිසා විනිශ්චය යම්සේ වේ ද, එය මෙ කරුණිනුත් දත යුතු: ආනන්දය, කිසිවකුගේ කිසි ද තැනෙක හැම අයුරින් හැම ලෙසින් ලාභයෙක් නො වී නම්, හැම අයුරින් ලාභය නැති කල්හි ලාභයාගේ අභාවයෙන් විනිශ්චයයෙක් පැනෙන්නේ ද?"

"වහන්ස, මෙය නොවන්නේ ම ය."

"එහෙයින් ආනන්දය, යම් ලාභයෙක් ඇත් නම් මෙය ම විනිශ්චයයට හෙතු ය, මෙය ම නිදන ය, මෙය ම සමුදය ය, මෙය ම ප්‍රත්‍යය ය."

17. "පර්යේෂණය නිසා ලාභය වේ යැ යි මෙසේ ම මෙය කියන ලද්දේ ය. ආනන්දය, යම්සේ පර්යේෂණය නිසා ලාභය වේ ද, එය මෙ කරුණිනුත් දත යුතු: ආනන්දය, කිසිවකුගේ කිසි ද තැනෙක හැම අයුරින් හැම ලෙසින් පර්යේෂණයෙක් නො වී නම්, හැම අයුරින් ම පර්යේෂණයක් නැති කලැ, පර්යේෂණයාගේ අභාවයෙන් ලාභයෙක් පැනෙන්නේ ද?"

"වහන්ස, මෙය නො වන්නේ ම ය."

"ආනන්දය, එහෙයින් පර්යේෂණ නම් වූ යමෙක් ඇද්ද, ලාභයට මෙය ම හෙතු ය, මෙය ම නිදන ය, මෙය ම සමුදය ය, මෙය ම ප්‍රත්‍යය ය."

Free Distribution www.aathaapi.org

18. තණ්හං පටිච්ච පරියෙසනා'ති ඉති ඛො පනෙතං වුත්තං. තදනන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං යථා තණ්හං පටිච්ච පරියෙසනා; තණ්හා ච හි ආනන්ද නාභවිස්ස සෙය්‍යථිදං කාමතණ්හා භවතණ්හා විභවතණ්හා, සඤ්ඤතො තණ්හානිරොධා අපි නු ඛො පරියෙසනා පඤ්ඤායෙථා?ති.

"නො හෙතං භන්තෙ."

"තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො පරියෙසනාය යදිදං තණ්හා.

ඉති ඛො ආනන්ද ඉමම දෙම ධම්මා ද්වයෙන වෙදනාය එකසමොසරණා භවන්ති."

19. "එසසපච්චයා වෙදනා'ති ඉති ඛො පනෙතං වුත්තං, තදනන්ද ඉමිනා පෙතං පරියායෙන වෙදිතබ්බං යථා එසසපච්චයා වෙදනා: එසො ච හි ආනන්ද නාභවිස්ස සෙය්‍යථිදං – චක්ඛුසම්ඵස්සො සොතසම්ඵස්සො ඝානසම්ඵස්සො ජිව්හාසම්ඵස්සො කායසම්ඵස්සො මනොසම්ඵස්සො, සඤ්ඤතො එසස අසති එසසනිරොධා අපි නු ඛො වෙදනා පඤ්ඤායෙථා?"ති

"නො හෙතං භන්තෙ".

"තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො වෙදනාය යදිදං එස්සො."

20. "නාමරූපපච්චයා එස්සො'ති ඉති ඛො පනෙතං වුත්තං. තදනන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං යථා නාමරූපපච්චයා එස්සො: යෙහි ආනන්ද ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි යෙහි උද්දෙසෙහි නාමකායස්ස පඤ්ඤත්ති හොති, තෙසු ආකාරෙසු තෙසු ලිඞ්ගෙසු තෙසු නිමිත්තෙසු තෙසු උද්දෙසෙසු අසති අපි නු ඛො රූපකායෙ අධිවචනසම්ඵස්සො පඤ්ඤායෙථාති?"

"නො හෙතං භන්තෙ."

"යෙහි ආනන්ද ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි යෙහි උද්දෙසෙහි රූපකායස්ස පඤ්ඤත්ති හොති, තෙසු ආකාරෙසු තෙසු ලිඞ්ගෙසු තෙසු නිමිත්තෙසු තෙසු උද්දෙසෙසු අසති අපි නු ඛො නාමකායෙ පටිඝසම්ඵස්සො පඤ්ඤායෙථා?"ති.

"නො හෙතං භන්තෙ."

Free Distribution www.aathaapi.org

18. ''තෘෂ්ණාව නිසා පර්යේෂණය වෙයැ යි මෙසේ ම මෙය කියන ලදි. ආනන්දය, යම්සේ තෘෂ්ණාව නිසා පර්යේෂණය වේ ද, එය මෙ කරුණිනුත් දත යුතු: ආනන්දය, කිසිවක්හුගේ කිසිවෙකත් හැම අයුරින් ම හැම ලෙසින් ම කාමතෘෂ්ණා භවතෘෂ්ණා විභවතෘෂ්ණා යන තෘෂ්ණා අතුරෙන් එකකුත් හැම අයුරින් හැම ලෙසින් නො වී නම්, හැම අයුරින් තෘෂ්ණාව නැති කල්හි තෘෂ්ණාවගේ අභාවයෙන් පර්යේෂණයෙක් පැනෙන්නේ ද?''

''වහන්ස, මෙය නො වන්නේ ම ය.

''ආනන්දය, එහෙයින් තෘෂ්ණා නම් වූ යමෙක් ඇද්ද, පර්යේෂණයට මෙය ම හෙතු ය, මෙය ම නිදන ය, මෙය ම සමුදය ය, මෙය ප්‍රත්‍යය ය.

ආනන්දය, මෙසේ වට්ටමූලක තණ්හාව සමුදචාරතණ්හාව යන මේ දෙ දහම්හු වට්ටමූලක—සමුදචාර වශයෙන් කොටස් දෙකෙකින් වෙදනා සඞ්ඛ්‍යාත ප්‍රත්‍යයයෙන් එක ම ප්‍රත්‍යය ඇත්තාහු වෙති. (එක ම වෙදනායෙන් උපදනාහු වෙති.)''

19. ''ස්පර්ශප්‍රත්‍යයයෙන් වෙදනාව වේ' යැ යි මෙසේ ම මෙය කියන ලදි. ආනන්දය, යම්සේ ස්පර්ශප්‍රත්‍යයයෙන් වෙදනාව වේ ද, මෙ කරුණින් ද එය දත යුතු: ආනන්දය, කිසිවක්හුගේ කිසි තැනෙකත් චක්ඛුසම්ඵස්ස සොතසම්ඵස්ස ඝානසම්ඵස්ස ජිව්හාසම්ඵස්ස කායසම්ඵස්ස මනොසම්ඵස්ස යන මේ ස්පර්ශයෙක් හැම අයුරින් හැම ලෙසින් ම නො වී නම්, හැම අයුරින් ම ස්පර්ශයක් නැති කල්හි, ස්පර්ශයාගේ අභාවයෙන් වෙදනාවේ ක් පැනෙන්නේ ද?''

''වහන්ස මෙය නො වන්නේ ම ය.''

''ආනන්දය, එහෙයින් යම් ස්පර්ශයෙක් වේ ද, වෙදනාවට මෙය ම හෙතු ය, මෙය ම නිදන ය, මෙය ම සමුදය ය, මෙය ම ප්‍රත්‍යය ය.

20. ''නාමරූපප්‍රත්‍යයයෙන් ස්පර්ශය වේ යැ යි මෙසේ ම මෙය කියන ලදි. ආනන්දය, නාමරූපප්‍රත්‍යයයෙන් යම්සේ ස්පර්ශය වේ ද, එය මෙ කරුණෙනුත් දත යුතු: ආනන්දය, යම් ආකාරයන්ගෙන් යම්ලිඞ්ගයන්ගෙන් සංඥුදි ප්‍රඥප්තිය යම් නිමිත්තයන්ගෙන් යම් උද්දේසයන්ගෙන් නාමධර්ම-සමූහයට වෙදනා (පැනැවීම) වේ ද, ඒ ආකාරයන් ඒ ලිංගයන් ඒ නිමිත්තයන් ඒ උද්දේසයන් නැති කල්හි, රූපකායයෙහි අධිවචනසංස්පර්ශය (නාමස්කන්ධ වස්තු කොටගෙන මනොද්වාරයේ ශබ්දඥානානුගත ව උපදනා මනඃසංස්පර්ශය) පැනෙන්නේ ද?''

''වහන්ස, මෙය නො වන්නේ ය.''

ආනන්දය, යම් ආකාරයන්ගෙන් යම් ලිඞ්ග- නිමිත්ත- උද්දේසයන් ගෙන් රූපකායයා ගේ පැණවීම වේ නම්, ඒ ආකාර-ලිංග-නිමිත්ත-උද්දේසයන් නැති කල්හි නාමකායයෙහි ප්‍රතිඝසංස්පර්ශය (රූපස්කන්ධය වස්තු කොට පස්දෙරෙහි උපදනා ස්පර්ශය) පැනෙන්නේ ද?''

''වහන්ස, මෙය නො වන්නේ ම ය.''

Free Distribution www.aathaapi.org

"යෙහි ආනන්ද ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි යෙහි උද්දෙසෙහි නාමකායස්ස ච රූපකායස්ස ච පඤ්ඤත්ති හොති, තෙසු ආකාරෙසු තෙසු ලිඞ්ගෙසු තෙසු නිමිත්තෙසු තෙසු උද්දෙසෙසු අසති අපි නු ඛො අධිවචනසම්ඵස්සො ච පටිඝසම්ඵස්සා ච පඤ්ඤායෙථා?" ති

"නො හෙතං භන්තෙ."

"යෙහි ආනන්ද ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි යෙහි උද්දෙසෙහි නාමරූපස්ස පඤ්ඤත්ති හොති, තෙසු ආකාරෙසු තෙසු ලිඞ්ගෙසු තෙසු නිමිත්තෙසු තෙසු උද්දෙසෙසු අසති අපි නු ඛො එවං පඤ්ඤායෙථා?" ති

"නො හෙතං භන්තෙ."

"තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො එවංසස යදිදං නාමරූපං.

21. "විඤ්ඤාණපච්චයා නාමරූපන්ති ඉති ඛො පනෙතං වුත්තං. තදානන්ද ඉමිනා පෙතං පරියායෙන වෙදිතබ්බං යථා විඤ්ඤාණපච්චයා නාමරූපං. විඤ්ඤාණං ච හි ආනන්ද මාතුකුච්ඡිස්මිං න ඔක්කමිස්සථ, අපි නු ඛො නාමරූපං මාතුකුච්ඡිස්මිං සණ්ඨහිස්සථාති"?

"නො හෙතං භන්තෙ."

"විඤ්ඤාණං ච හි ආනන්ද මාතුකුච්ඡිං ඔක්කමිත්වා වොක්කමිස්සථ, අපි නු ඛො නාමරූපං ඉත්ථත්තාය අභිනිබ්බත්තිස්සථාති"?

"නො හෙතං භන්තෙ".

"විඤ්ඤාණං ච හි ආනන්ද දහරස්සෙව සතො වොච්ඡිජ්ජිස්සථ කුමාරකස්ස වා කුමාරිකාය වා, අපි නු ඛො නාමරූපං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සථාති"?

"නො හෙතං භන්තෙ."

"තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං. එස සමුදයො එස පච්චයො නාමරූපස්ස යදිදං විඤ්ඤාණං."

22. "නාමරූපපච්චයා විඤ්ඤාණන්ති ඉති ඛො පනෙතං වුත්තං. තදානන්ද ඉමිනාපෙතං පරියායෙන වෙදිතබ්බං යථා නාමරූපපච්චයා විඤ්ඤාණං: විඤ්ඤාණං ච හි ආනන්ද නාමරූපෙ පතිට්ඨා න ලභිස්සථ, අපි නු ඛො ආයතිං ජාතිජරාමරණං දුක්ඛසමුදයසම්භවො පඤ්ඤායෙථාති"?

"නො හෙතං භන්තෙ."

"තස්මාතිහානන්ද, එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො විඤ්ඤාණස්ස යදිදං නාමරූපං."

Free Distribution www.aathaapi.org

"ආනන්දය, යම් ආකාර-ලිංග-නිමිත්ත-උද්දේසයන්ගෙන් නාමකායයා ගේ හා රූපකායයා ගේ හා පැනවීම වේ ද, ඒ ආකාර- ලිඞ්ග- නිමිත්ත- උද්දේසයන් නැති කල්හි අධිවචනසංස්පර්ශය (මනොද්වාරිකස්පර්ශය) හෝ ප්‍රතිඝ සංස්පර්ශය (පඤ්චද්වාරිකස්පර්ශය) හෝ පැනෙන්නේ ද?"

"වහන්ස, මෙය නො වන්නේ ම ය."

ආනන්දය, යම් ආකාර- ලිඞ්ග- නිමිත්ත- උද්දේසයන් ගෙන් නාමරූපයා ගේ පැනවීම වේ ද, ඒ ආකාර-ලිංග- නිමිත්ත - උද්දේසයන් නැති කල්හි ස්පර්ශයෙක් පැනෙන්නේ ද?"

"වහන්ස, මෙය නො වන්නේ ම ය."

"ආනන්දය, එහෙයින් මේ නාමරූප නම් වූ යමෙක් ඇද්ද, ස්පර්ශයට මෙය ම හෙතු ය. මෙය ම නිදන ය, මෙය ම සමුදය ය, මෙය ම ප්‍රත්‍යය ය."

21. "විඤ්ඤාණප්‍රත්‍යයයෙන් නාමරූපය වේ යැ යි මෙසේ ම මෙය කියන ලද්දේය. ආනන්දය, යම්සේ විඤ්ඤාණප්‍රත්‍යයයෙන් නාමරූපය වේ ද, එය මෙ කරුණෙහුත් ද දත යුතු: ආනන්දය, විඤ්ඤාණය ද මවුකුසට නො බස්නේ නම් (මවුකුසැ ප්‍රතිසන්ධි වශයෙන් නො පහළ වන්නේ නම්) හුදු නාමරූපය (කලලාදිවශයෙන්මිශ්‍ර ව) මවුකුසැ පහළ වන්නේ ද?"

"වහන්ස, මෙය නො වන්නේ ම ය."

"ආනන්දය, විඤ්ඤාණය මවුකුසට බැස (ප්‍රතිසන්ධිවශයෙන් පහළ වැ) පහ වන්නේ නම් (නිරුද්ධ වන්නේ නම්) නාමරූපය මෙබඳු (පරිපූර්ණ ස්කන්ධ) බව පිණිස වන්නේ ද?"

"වහන්ස, මෙය නො වන්නේ ම ය."

"ආනන්දය, ළදරු වූ ම කුමරක්හුගේ හෝ කුමරියකගේ හෝ විඤ්ඤාණය සිඳෙන්නේ නම්, නාමරූපය වැඩීමට නැඟීමට විපුලබවට පැමිණෙන්නේ ද?"

"වහන්ස, මෙය නො වන්නේ ම ය."

"ආනන්දය, එහෙයින් විඤ්ඤාණය යන මෙය ම නාමරූපයට හෙතු වේ, මෙය ම නිදන වේ, මෙය ම සමුදය වේ, මෙය ම ප්‍රත්‍යයය වේ.

22. "නාමරූපප්‍රත්‍යයයෙන් විඤ්ඤාණය වේ යැ යි මෙසේ ම මෙය කියන ලදි. ආනන්දය, යම්සේ නාමරූපප්‍රත්‍යයයෙන් විඤ්ඤාණය වේ ද, මෙ කරුණෙහුත් එය දත යුතු: ආනන්දය, විඤ්ඤාණය ද නාමරූපයෙහි පිහිට නො ලබන්නේ නම්, මතු ජාතිජරාමරණ දුක්ඛයේ හටගැන්ම පැනෙන්නේ ද?"

"වහන්ස මෙය නො වන්නේ ම ය."

"ආනන්දය, එහෙයින් මේ නාමරූප යැ යි යමෙක් ඇද්ද, විඤ්ඤාණයට මෙය ම හෙතු ය, මෙය ම නිදන ය, මෙය ම සමුදය ය, මෙය ම ප්‍රත්‍යය ය."

Free Distribution www.aathaapi.org

''එත්තාවතා ඛෝ ආනන්ද ජායෙථ වා ජීයෙථ වා මීයෙථ වා චවෙථ වා උපපජ්ජෙථ වා, එත්තාවතා අධිවචනපථෝ, එත්තාවතා නිරුත්තිපථෝ, ඤත්තාවතා විඤ්ඤත්තිපථෝ, ඤත්තාවතා පඤ්ඤාවචරං එත්තාවතා වට්ටං වත්තති, (එත්තාවතා) ඉත්ථත්තං පඤ්ඤාපනාය, යදිදං නාමරූපං සහ විඤ්ඤාණෙන අඤ්ඤමඤ්ඤපච්චයතාය පවත්තති.''

23, ''කිත්තාවතා ච ආනන්ද අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති; රූපිං වා හි ආනන්ද පරිත්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති 'රූපී මෙ පරිත්තො අත්තාති'ති, රූපිං වා හි ආනන්ද අනන්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති 'රූපී මෙ අනන්තො අත්තා'ති, 'අරූපිං වා හි ආනන්ද පරිත්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති 'අරූපී මෙ පරිත්තො අත්තා'ති, අරූපිං වා හි ආනන්ද අනන්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති 'අරූපී මෙ අනන්තො අත්තා ති,

24. ''තත්‍රානන්ද යො සො රූපිං පරිත්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති[1], එතරහි වා සො රූපිං පරිත්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති. තත්‍ර භාවිං වා සො රූපිං පරිත්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති. අතථං වා පන සත්තං තථත්තාය උපකප්පෙසසාමී ති ඉති වා පනස්ස හොති. එවං සන්තං ඛෝ ආනන්ද රූපිං පරිත්තන්තානුදිට්ඨි අනුසෙතීති ඉච්චාලං වචනාය.

25. ''තත්‍රානන්ද යො සො රූපිං අනන්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති, එතරහි වා සො රූපිං අනන්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති, තත්‍ර භාවිං වා සො රූපිං අනන්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති. අතථං වා පන සත්තං තථත්තාය උපකප්පෙසසාමීති ඉති වා පනස්ස හොති. එවං සන්තං ඛෝ ආනන්ද රූපිං අනන්තන්තානුදිට්ඨි අනුසෙතීති ඉච්චාලං වචනාය.

1. පඤ්ඤාපෙන්තො පඤ්ඤාපෙති, කත්ථචි

Free Distribution www.aathaapi.org

"ආනන්දය, යම් නාමරූපයෙක් විඤ්ඤාණය හා උකුණට ප්‍රත්‍යයභාවයෙන් පවත්නේ ද, මෙතෙකින් ම උපදනේ යැ යි හෝ දිරන්නේ යැ යි හෝ මැරෙන්නේ යැ යි හෝ චුත වන්නේ යැ යි හෝ චුත ව උපදනේ යැ යි හෝ පැතෙන්නේ ය. මෙතෙකින් (සිරිවඩ්ඪකාදි) ආරූඪ නාම ව්‍යවහාරයට මාර්ග (විෂය) වේ. මෙතෙකින් නිරුක්තියට (අර්ථානුගත වශයෙන් පැවැති ව්‍යවහාරයට) මාර්ග වේ. මෙතෙකින් ප්‍රඥප්තියට (පණ්ඩිතයා ය, ව්‍යක්තයා ය යන ආදීන් ගුණ හඟවනු විසින් පැවැති ව්‍යවහාරයට) මාර්ග වේ. මෙතෙකින් ප්‍රඥායෙන් දතයුතු ස්කන්ධ දෘෂ්ටකය වේ. මෙතෙකින් (කර්ම ක්ලේශ විපාක යන) සසරවට වැටෙයි. මෙතෙකින් (වෙදනාසංඥාදි) නාමප්‍රඥප්තිය පිණිස ඉත්ථම්භාවය හෙවත් පඤ්චස්කන්ධය වේ.

23. "ආනන්දය, ආත්මය පනවන තැනැත්තේ කොතෙකින් එය පනවා ද යත්: ආනන්දය, රූපවත් වූ හෝ සූක්ෂම ආත්මයක් පනවන්නේ (නො වැඩූ පරිත්ත කසිණ රූපය සූක්ෂම ආත්ම යැ යි ගන්නේ) 'මගේ ආත්මය රූපවත් ය, සූක්ෂම යැ'යි පනවයි. ආනන්දය, රූපවත් වූ හෝ අනන්ත ආත්මයක් පනවන්නේ (වැඩූ කසිණ රූපය අනන්තාත්ම යැ යි ගන්නේ) 'මගේ ආත්මය රූපවත් ය, අනන්ත යැ යි පනවයි. ආනන්දය, අරූපී වූ හෝ සූක්ෂ්ම ආත්මයක් පනවන්නේ (නොවැඩූ කසිණ නිමිත්ත ඉගුළු අහස්හි පැවැති අරූපස්කන්ධ ආත්ම ය යි ගෙන) මගේ ආත්මය අරූපී ය, සූක්ෂම යැ' යි පනවයි. ආනන්දය, අරූපී වූ හෝ අනන්ත ආත්මයක් පනවන්නේ (වැඩූ කසිණ නිමිත්ත ඉගුළු අහස්හි පැවැති අරූපස්කන්ධ ආත්ම ය යි ගෙන) 'මගේ ආත්මය අරූපී ය, අනන්ත යැ' යි පනවයි.

24. "ආනන්දය, ඔවුන් අතුරෙන් යමෙක් රූපී වූ සූක්ෂම ආත්මයක් පනවන්නේ පනවා ද, හෙතෙම මෙ අත්ඛවිහි පමණක් පවත්නා වූ (මරණින් සිඳී යන) හෝ සියුම් ආත්මයක් පනවනුයේ පනවයි. එහි (ශාශ්වත විසින් පරලොවෙහිත්) වන්නාවූ හෝ සියුම් වූ ආත්මයක් පනවනුයේ පණවයි. 'අතථ වූ (පරවාදියා කියන ශාශ්වත නොවූ ම) ආත්මය තථත්වය පිණිස (එහි යථාස්වභාවය ඔහුට පිළිගැනෙන පිණිස) සමර්ථනය කරන්නෙමි' යි මෙසේ හෝ ඔහුට සිතෙක් වෙයි. ආනන්දය, මෙසේ වූ ම රූපකසිණලාභියා කෙරෙහි සූක්ෂමාත්මානුදෘෂ්ටිය වැදහේ යැ යි (සන්තානානුගත වැ හෝනේ යැ යි) මෙසේ කියන්නට සුදුසු ය.

25. "ආනන්දය, ඔවුන් අතුරෙන් යමෙක් රූපී වූ අනන්ත ආත්මයක් පනවනුයේ පනවා ද, හෙතෙම මෙ අත්ඛවිහි පමණක් පවත්නා හෝ අනන්ත ආත්මයක් පනවනුයේ පනවයි. පරලොවිහිත් වන්නාවූ හෝ අනන්ත ආත්මයක් පනවනුයේ පනවයි. 'අතථ වූ ම (පරවාදියා කියනා අවිද්‍යමාන වූ ම) ආත්මය තථත්වය පිණිස (ඇති සැටිය ඔහුට පිළිගැනෙනු පිණිස) සමර්ථනය කරන්නෙමි' යි මෙසේ හෝ සිතෙක් ඔහුට වෙයි. ආනන්දය, මෙසේ වූ ම රූපකසිණලාභියා කෙරෙහි අනන්තාත්මානුදෘෂ්ටිය වැද හෝනේ යැ යි (සන්තානානුගත ව පවත්නේ යැ යි) මෙසේ කියන්නට සුදුසු ය.

Free Distribution www.aathaapi.org

26. "තත්‍රානන්ද යො සො අරූපිං පරිත්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති, එතරහි වා සො අරූපිං පරිත්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති. තස්ස භාවිං වා සො අරූපිං පරිත්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති. අතථං වා පන සන්තං තථ්‍යාය උපකප්පෙස්සාමීති ඉති වා පනස්ස හොති. එවං සන්තං ඛො ආනන්ද අරූපිං පරිත්තත්තානුදිට්ඨි අනුසෙතීති ඉච්චාලං වචනාය.

27. "තත්‍රානන්ද යො සො අරූපිං අනන්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති, එතරහි වා සො අරූපිං අනන්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති. තස්ස භාවිං වා සො අරූපිං අනන්තං අත්තානං පඤ්ඤපෙන්තො පඤ්ඤපෙති. අතථං වා පන සන්තං තථ්‍යාය උපකප්පෙස්සාමීති ඉති වා පනස්ස හොති. එවං සන්තං ඛො ආනන්ද අරූපිං අනන්තත්තානුදිට්ඨි අනුසෙතීති ඉච්චාලං වචනාය. එත්තාවතා ඛො ආනන්ද අත්තානං පඤ්ඤපෙන්තා පඤ්ඤපෙති.

28. "කිත්තාවතා චානන්ද අත්තානං න පඤ්ඤපෙන්තො න පඤ්ඤපෙති:

රූපිං වා හි ආනන්ද පරිත්තං අත්තානං න පඤ්ඤපෙන්තා න පඤ්ඤපෙති 'රූපි මෙ පරිත්තො අත්තා'ති. රූපිං වා හි ආනන්ද අනන්තං අත්තානං න පඤ්ඤපෙන්තා න පඤ්ඤපෙති රූපි මෙ අනන්තො අත්තා'ති. අරූපිං වා හි ආනන්ද පරිත්තං අත්තානං න පඤ්ඤපෙන්තා න පඤ්ඤපෙති 'අරූපි මෙ පරිත්තො අත්තා'ති. අරූපිං වා හි ආනන්ද අනන්තං අත්තානං න පඤ්ඤපෙන්තා න පඤ්ඤපෙති 'අරූපි මෙ අනන්තො අත්තා'ති.

29. "තත්‍රානන්ද යො සො රූපිං පරිත්තං අත්තානං න පඤ්ඤපෙන්තා, න පඤ්ඤපෙති, එතරහි වා සො රූපිං පරිත්තං අත්තානං න පඤ්ඤපෙන්තා න පඤ්ඤපෙති. තස්ස භාවිං වා සො රූපිං පරිත්තං අත්තානං න පඤ්ඤපෙන්තා න පඤ්ඤපෙති. අතථං වා පන සන්තං තථ්‍යාය උපකප්පෙස්සාමී ති ඉති වා පනස්ස න හොති. එවං සන්තං ඛො ආනන්ද රූපිං පරිත්තත්තානුදිට්ඨි නානුසෙතීති ඉච්චාලං වචනාය.

Free Distribution www.aathaapi.org

26. ආනන්දය, ඔවුන් අතුරෙන් යමෙක් අරූපී වූ සියුම් ආත්මයක් පනවනුයේ පනවා ද, හේ දැන් පමණක් පවත්නා හෝ අරූපී වූ සියුම් ආත්මයක් පනවන්නේ පනවයි. පරලොවහි පවත්නා වූ හෝ අරූපී වූ සියුම් ආත්මයක් පනවන්නේ පනවයි. 'අතථ වූ ම ආත්මය තථත්වය පිණිස සමර්ථනය කරන්නෙමි' යි මෙසේ හෝ සිතෙක් ඔහුට වෙයි. ආනන්දය, මෙසේ වූ ම අරූපකසිණලාභියා කෙරෙහි සූක්ෂමාත්මානුදෘෂ්ටිය වැඳ හෝනේ යැ යි මෙසේ කියනු සුදුසු ය.

27. "ආනන්දය, ඔවුන් අතුරෙන් යමෙක් අරූපී වූ අනන්ත ආත්මයක් පනවනුයේ පනවා ද, හේ දැන් පමණක් පවත්නා හෝ අරූපී වූ අනන්ත ආත්මයක් පනවන්නේ පනවයි. පරලොවහි ද පවත්නා හෝ අරූපී වූ අනන්ත ආත්මයක් පනවන්නේ පනවයි. 'අතථ වූ ම ආත්මය තථත්වය පිණිස සමර්ථනය කරන්නෙමි' යි මෙසේ හෝ ඔහුට සිතෙක් වෙයි. ආනන්දය, මෙසේ වූ ම අරූපකසිණලාභියා කෙරෙහි අනන්තාත්මානුදෘෂ්ටිය වැඳ හෝනේ යැ යි මෙසේ කියනු සුදුසු ය. ආනන්දය, ආත්මය පණවන්නේ මෙතෙකින් ම පනවයි.

28. "ආනන්දය, ආත්මය නො පනවන්නේ කොතෙකින් නො පනවා ද යත්:

ආනන්දය, රූපී වූ සියුම් ආත්මයක් නො පනවන්නේ 'මගේ ආත්මය රූපවත් ය, සියුම් යැ' යි හෝ නො පනවයි. ආනන්දය, රූපී වූ අනන්ත ආත්මයක් නො පනවන්නේ 'මගේ ආත්මය රූපවත් ය, අනන්ත යැ'යි කියා හෝ නො පනවයි. ආනන්දය, අරූපී වූ සියුම් ආත්මයක් නො පනවන්නේ 'මගේ ආත්මය අරූපී ය, සියුම් යැ'යි කියා හෝ නො පණවයි. ආනන්දය, අරූපී වූ අනන්ත ආත්මයක් නොපනවන්නේ 'මගේ ආත්මය අරූපී ය, අනන්ත යැ යි කියා හෝ නො පනවයි.

29. "ආනන්දය, ඔවුන් අතුරෙන් යමෙක් රූපී වූ සියුම් ආත්මයක් නො පනවන්නේ නො පණවා ද, හෙ තෙම දැන් (වර්තමාන භවයෙහි) හෝ රූපවත් වූ සියුම් ආත්මයක් නො පනවන්නේ නො පනවයි. මතු භවයෙහි වත්නා වූ හෝ රූපවත් සියුම් ආත්මයක් නො පනවන්නේ නො පනවයිදු 'අවිද්‍යමාන වූ හෝ ආත්මයක් විද්‍යමානත්වය පිණිස සමර්ථනය කරන්නෙමි' යි මෙසේ හෝ සිතෙක් ඔහුට නො වෙයි. ආනන්දය, මෙසේ වූ ම රූපකසිණලාභියා අනුව සූක්ෂමාත්මානුදෘෂ්ටිය නො හෝනේ යැ යි මෙසේ කියනු සුදුසු ය.

Free Distribution www.aathaapi.org

30. "තත්‍රානන්ද, යෝ සෝ රූපිං අත්තානං අත්තානං න පඤ්ඤපෙන්තෝ න පඤ්ඤපෙති, එතරහි වා සෝ රූපිං අත්තානං අත්තානං න පඤ්ඤපෙන්තෝ න පඤ්ඤපෙති. තස්ස භාවිං වා සෝ රූපිං අත්තානං අත්තානං න පඤ්ඤපෙන්තෝ න පඤ්ඤපෙති. 'අතථං වා පන සත්තං තථත්තාය උපකප්පෙස්සාමී'ති ඉති වා පනස්ස න හොති. එවං සන්තං ඛො ආනන්ද රූපිං අත්තපටිලාභානුදිට්ඨි නානුසෙතීති ඉච්චාලං වචනාය.

31. "තත්‍රානන්ද, යෝ සෝ අරූපිං පරිත්තං අත්තානං න පඤ්ඤපෙන්තෝ න පඤ්ඤපෙති, එතරහි වා සෝ අරූපිං පරිත්තං අත්තානං න පඤ්ඤපෙන්තෝ න පඤ්ඤපෙති. තස්ස භාවිං වා සෝ අරූපිං පරිත්තං අත්තානං න පඤ්ඤපෙන්තෝ න පඤ්ඤපෙති. 'අතථං වා පන සත්තං තථත්තාය උපකප්පෙස්සාමී'ති ඉති වා පනස්ස න හොති. එවං සන්තං ඛො ආනන්ද, අරූපිං පරිත්තත්තානුදිට්ඨි නානුසෙතීති ඉච්චාලං වචනාය.

32. "තත්‍රානන්ද, යෝ සෝ අරූපිං අනන්තං අත්තානං න පඤ්ඤපෙන්තෝ න පඤ්ඤපෙති, එතරහි වා සෝ අරූපිං අනන්තං අත්තානං න පඤ්ඤපෙන්තෝ න පඤ්ඤපෙති. තස්ස භාවිං වා සෝ අරූපිං අනන්තං අත්තානං න පඤ්ඤපෙන්තෝ න පඤ්ඤපෙති. 'අතථං වා පන සත්තං තථත්තාය උපකප්පෙස්සාමී'ති ඉති වා පනස්ස න හොති. එවං සන්තං ඛො ආනන්ද, අරූපිං අනන්තත්තානුදිට්ඨි නානුසෙතීති ඉච්චාලං වචනාය. එත්තාවතා ඛො ආනන්ද අත්තානං න පඤ්ඤපෙන්තෝ න පඤ්ඤපෙති.

33. "කිත්තාවතා ච ආනන්ද අත්තානං සමනුපස්සමානෝ සමනුපස්සති;

වෙදනං වාහි ආනන්ද, අත්තානං සමනුපස්සමානෝ සමනුපස්සති: 'වෙදනා මෙ අත්තා'ති. 'න හෙව ඛො මෙ වෙදනා අත්තා, අපපටිසංවෙදනෝ මෙ අත්තා'ති ඉති වා හි ආනන්ද, අත්තානං සමනුපස්සමානෝ සමනුපස්සති. 'න හෙව ඛො මෙ වෙදනා අත්තා, නෝ'පි අපපටිසංවෙදනෝ මම අත්තා, අත්තා මෙ වෙදයති වෙදනාධම්මෝ හි මෙ අත්තා'ති ඉති වා හි ආනන්ද, අත්තානං සමනුපස්සමානෝ සමනුපස්සති.

Free Distribution www.aathaapi.org

30. ආනන්දය, ඔවුන් අතුරෙන් යමෙක් රූපවත් වූ අනන්ත ආත්මයක් නොම පනවන්නේ නොම පනවා නම්, හෙතෙම දැන් (මේ භවයෙහි) හෝ රූපවත් වූ අනන්ත ආත්මයක් නොම පනවන්නේ නොම පනවයි. මතු භවයෙහි වන්නාවූ හෝ අනන්ත ආත්මයක් නොම පනවන්නේ නොම පනවයි. 'අවිද්‍යමාන වූ හෝ ආත්මයක් විද්‍යමානත්වය පිණිස සමර්ථනය කරන්නෙමි'යි මෙසේ සිතෙක් හෝ ඔහුට නොවෙයි. ආනන්දය, මෙසේ වූ ම අනන්තාත්මානුදෘෂ්ටිය රූපකසිණලාභියා කෙරෙහි නොම හෝනේ යැ යි කියනු සුදුසු ය.

31. "ආනන්දය, ඔවුන් අතුරෙන් යමෙක් අරූපී වූ සූක්ෂම ආත්මයක් නොම පනවන්නේ නොම පනවා නම්, හෙතෙම දැන් (මේ භවයෙහි) හෝ අරූපී වූ සූක්ෂම ආත්මයක් නොම පනවන්නේ නොම පනවයි. මතු භවයෙහි වන්නාවූ හෝ අරූපී සූක්ෂම ආත්මයක් නොම පනවන්නේ නොම පනවයි. 'අවිද්‍යමාන වූ හෝ ආත්මයක් විද්‍යමානත්වය පිණිස සමර්ථනය කරන්නෙමි' යි මෙසේ සිතෙක් හෝ ඔහුට නොවෙයි. ආනන්දය, මෙසේ වූ ම අරූපකසිණලාභියා කෙරෙහි සූක්ෂමාත්මානුදෘෂ්ටිය නොම හෝනේ යැ යි කියනු සුදුසු ය.

32. ආනන්දය, ඔවුන් අතුරෙන් යමෙක් අරූපී වූ අනන්ත ආත්මයක් නොම පනවන්නේ නොම පනවා නම්, හෙතෙම දැන් (මේ භවයෙහි) හෝ අරූපී වූ අනන්ත ආත්මයක් නොම පනවන්නේ නොම පනවයි. මතු භවයෙහි වන්නාවූ හෝ අරූපී අනන්ත ආත්මයක් නොම පනවන්නේ නොම පනවයි. 'අවිද්‍යමාන ආත්මයක් හෝ විද්‍යමානත්වයෙන් සමර්ථනය කරන්නෙමි' යි මෙසේ සිතෙක් හෝ ඔහුට නොවෙයි. ආනන්දය, මෙසේ වූ ම අරූපකසිණලාභියා කෙරෙහි අනන්තාත්මානුදෘෂ්ටිය නොම හෝනේ යැ යි කියනු සුදුසු ය.

ආනන්දය, මෙතෙකින් ම ආත්මය නොම පණවන්නේ නොම පණවයි.

33. "ආනන්දය, කොතෙකින් (දිට්ඨිසමනුපස්සනායෙන්) ආත්මයක් දක්නේ දකී ද යත්:

ආනන්දය, වෙදනාව ආත්ම යැ යි දක්නා, 'වෙදනාව මාගේ ආත්මය වේ' යැ යි හෝ මෙසේ දකියි. 'වෙදනාව මගේ ආත්මය නොම වේ, මාගේ ආත්මය වෙදනාරහිත යැ' යි මෙසේ හෝ ආනන්දය, ආත්මයක් දක්නේ දකියි. 'වෙදනාව මගේ ආත්මය නොම වේ ම ය, මගේ ආත්මය වෙදනා රහිත ද නොම වේ ම ය, ආත්මය විඳී, මගේ ආත්මය (වෙදනාසම්ප්‍රයුක්ත බැවින්) විඳින ස්වභාව ඇත්තේ ම යැ' යි මෙසේ හෝ ආනන්දය, ආත්මයක් දක්නේ දකී.

Free Distribution www.aathaapi.org

34. තත්‍රානන්ද, යො සො එවමාහ: 'වෙදනා, මෙ අත්තා'ති, සො එවමස්ස වචනීයො: 'තිස්සො ඛො ඉමා ආවුසො වෙදනා: සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා. ඉමාසං ඛො ත්වං තිස්සන්නං වෙදනානං කතමං අත්තතො සමනුපස්සසී ති'. යස්මිං ආනන්ද, සමයෙ සුඛං වෙදනං වෙදෙති, නෙව තස්මිං සමයෙ දුක්ඛං වෙදනං වෙදෙති, න අදුක්ඛමසුඛං වෙදනං වෙදෙති, සුඛං යෙව තස්මිං සමයෙ වෙදනං වෙදෙති. යස්මිං ආනන්ද, සමයෙ දුක්ඛං වෙදනං වෙදෙති, නෙව තස්මිං සමයෙ සුඛං වෙදනං වෙදෙති, න අදුක්ඛමසුඛං වෙදනං වෙදෙති, දුක්ඛං යෙව තස්මිං සමයෙ වෙදනං වෙදෙති. යස්මිං ආනන්ද, සමයෙ අදුක්ඛමසුඛං වෙදනං වෙදෙති, නෙව තස්මිං සමයෙ සුඛං වෙදනං වෙදෙති, න දුක්ඛං වෙදනං වෙදෙති, අදුක්ඛමසුඛං යෙව තස්මිං සමයෙ වෙදනං වෙදෙති.

35. "සුඛා පි ඛො ආනන්ද, වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා. දුක්ඛාපි ඛො ආනන්ද වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා. අදුක්ඛමසුඛා පි ඛො ආනන්ද වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා. තස්ස සුඛං වෙදනං වෙදයමානස්ස[1] 'එසො මෙ අත්තා'ති හොති. තස්සා යෙව සුඛාය වෙදනාය නිරොධා 'ව්‍යග්ගො මෙ අත්තා'ති හොති. දුක්ඛං වෙදනං වෙදයමානස්ස 'එසො මෙ අත්තා'ති හොති. තස්සා යෙව දුක්ඛාය වෙදනාය නිරොධා 'ව්‍යග්ගො මෙ අත්තා'ති හොති. අදුක්ඛමසුඛං වෙදනං වෙදයමානස්ස 'එසො මෙ අත්තා'ති හොති. තස්සා යෙව අදුක්ඛමසුඛාය වෙදනාය නිරොධා 'ව්‍යග්ගො මෙ අත්තා'ති හොති. ඉති සො දිට්ඨෙව ධම්මෙ අනිච්චං සුඛං දුක්ඛං වොකිණ්ණං[2] උප්පාදවයධම්මං අත්තානං සමනුපස්සමානො සමනුපස්සති. යො සො එවමාහ 'වෙදනා මෙ අත්තා'ති. තස්මාතිහානන්ද, එතෙනපෙතං නක්ඛමති 'වෙදනා මෙ අත්තා'ති සමනුපස්සිතුං.

36. "තත්‍රානන්ද, යො සො එවමාහ 'නහෙව ඛො මෙ වෙදනා අත්තා, අප්පටිසංවෙදනො මෙ අත්තා'ති, සො එවමස්ස වචනීයො 'යත්ථ පනාවුසො සබ්බසො වෙදයිතං නත්ථි, අපි නු ඛො තත්ථ අයමහමස්මි'ති[3] සියා?''ති.

"නො හෙතං භන්තෙ".

"තස්මාතිහානන්ද, එතෙනපෙතං නක්ඛමති 'නහෙව ඛො මෙ වෙදනා අත්තා, අප්පටිසංවෙදනො මෙ අත්තා'ති සමනුපස්සිතුං.

---

1. වෙදියමානස්ස – කත්ථ
2. අනිච්චසුඛදුක්ඛවොකිණ්ණං – කත්ථ
3. අහමස්මිති, – සිමු.

Free Distribution www.aathaapi.org

34. "ආනන්දය, ඔවුන් අතුරෙන් යමෙක් 'වෙදනාව මගේ ආත්මය යැ'යි මෙසේ කියා ද, 'ඇවැත්නි, සුඛවෙදනා දුඃඛවෙදනා අදුඃඛාසුඛ වෙදනා යි මේ වෙදනා තුනෙකි. මේ තුන් වෙදනාවන්ගෙන් තෝ කවර වෙදනාවක් ආත්ම වශයෙන් දක්නෙහි ද'යි හෙ තෙම මෙසේ කිය යුතු (ඔහුගෙන් මෙසේ ප්‍රශ්න කටයුතු). ආනන්දය, යම් විටෙක ඍත්ව තෙමේ) සුඛවෙදනාව විඳි ද, එ සමයෙහි හේ දුඃඛවෙදනාව නො ම විඳියි, අදුඃඛාසුඛවෙදනාව ද නො ම විඳියි, එසමයෙහි හේ සුඛවෙදනාව ම විඳී. ආනන්දය, යම් විටෙක දුඃඛවෙදනාව විඳී ද, එ විටැ සුඛවෙදනාව නො ම විඳියි, අදුඃඛාසුඛ වෙදනාව ද නො ම විඳියි, එ සමයෙහි දුඃඛවෙදනාව ම විඳී. ආනන්දය, යම් විටෙක අදුඃඛාසුඛවෙදනාව විඳී ද, එවිටැ සුඛවෙදනාව නො ම විඳියි, දුඃඛවෙදනාව ද නො ම විඳියි, අදුඃඛාසුඛවෙදනාව ම එවිටැ විඳී.

35. "ආනන්දය, සුඛවෙදනාව ද අනිත්‍ය ය, සංස්කෘත ය (ප්‍රත්‍යයයන් විසින් සකස් වූයේ ය), ප්‍රතීත්‍යසමුත්පන්න ය, ක්ෂයධර්මය (ක්ෂිණ වන සුලු ය), ව්‍යයධර්ම ය (වැනසෙන සුලු ය), විරාගධර්ම ය (පහ වන සුලු ය), නිරොධධර්මය (නිරුද්ධ වන සුලු ය). ආනන්දය, දුඃඛවෙදනාව ද අනිත්‍ය ය, සංස්කෘත ය, ප්‍රතීත්‍යසමුත්පන්න ය, ක්ෂයධර්ම ය, ව්‍යයධර්ම ය, විරාගධර්ම ය, නිරොධධර්ම ය. ආනන්දය, අදුඃඛාසුඛවෙදනාව ද අනිත්‍ය ය, සංස්කෘත ය, ප්‍රතීත්‍යසමුත්පන්න ය, ක්ෂයධර්මය, ව්‍යයධර්ම ය, විරාග ධර්ම ය, නිරොධධර්ම ය. සුඛවෙදනාව විඳුනාහට 'මේ මගේ ආත්මය වේ' යැ යි සිතෙක් වෙයි. ඒ සුඛවෙදනාව ගේ නිරොධයෙන් 'මගේ ආත්මය ව්‍යග්‍ර වී (විසිරී ගියේ යැ යි, පහ ව ගියේ යැ)' යි සිතෙක් වෙයි. දුඃඛවෙදනාව විඳුනාහට 'මේ මාගේ ආත්මය වේ' ය යි සිතෙක් වෙයි. ඒ දුඃඛවෙදනාව ගේ ම නිරොධයෙන් 'මගේ ආත්මය ව්‍යග්‍ර වී' යැ යි සිතෙක් වෙයි. අදුඃඛාසුඛවෙදනාව විඳුනාහට 'මේ මගේ ආත්මය යැ'යි සිතෙක් වෙයි. ඒ අදුඃඛාසුඛවෙදනාව නිරුද්ධ වීමෙන් 'මගේ ආත්මය ව්‍යග්‍ර වී යැ' යි සිතෙක් වෙයි. මෙසේ හෙ තෙම මේ අත්බවහි ම ආත්මයක් දක්නේ අනිත්‍ය වූ සුඛ වූ දුක් වූ අනිත්‍යාදි ලක්ෂණයන්ගෙන් මිශ්‍ර වූ (අදුඃඛාසුඛ වූ) උපදනසුලු නැසෙන සුලු රූපාදි ස්කන්ධයක් දකී. එහෙයින් ආනන්දය, 'වෙදනාව මගේ ආත්මයැ' යි මෙය දක්නට මෙයිනුත් නො රිසියෙයි.

36. "ආනන්දය, ඔවුන් අතුරෙන් යමෙක් 'වෙදනාව මගේ ආත්මය නොවේ ම ය, මගේ ආත්මය ප්‍රතිසංවේදනා රහිත යැ' යි මෙසේ කියා නම්, 'ඇවැත්නි, යම් තැනෙක හැම අයුරින් ම විඳීමෙක් නැත් නම්, එහි මේ මම වෙමි' යි කියැ යුතු කිසි ස්කන්ධධර්මයෙක් වන්නේ ද?' යි හෙ තෙම කිය යුතු (ඔහුගෙන් ප්‍රශ්න කළ යුතු).

"වහන්ස, මෙය (මම වෙමි යි ගත යුතු කිසි ස්කන්ධයෙක් එහි) නො වේ ම යැ" යි (අනඳ තෙරණුවෝ වදළහ.)

"ආනන්දය, එහෙයින් 'වෙදනාව මගේ ආත්මය නො වේ ම ය, මගේ ආත්මය ප්‍රතිසංවේදනාරහිත යැ' යි මෙය දක්නට මෙයිනුත් නො රිසියෙයි."

Free Distribution www.aathaapi.org

37. තත්‍රානන්ද, යො සො එවමාහ 'නගෙව ඛො මෙ වෙදනා අත්තා, නොපි අපටිසංවෙදනො මෙ අත්තා, අත්තා මෙ වෙදෙති, වෙදනාධම්මොහි මෙ අත්තා'ති, සො එවමස්ස වචනීයො: 'වෙදනා ච හි ආවුසො සඞ්ඛත සඞ්ඛං සඞ්ඛථා සඞ්ඛං අපරිසෙසා නිරුජ්ඣෙය්‍යුං, සඞ්ඛයො වෙදනාය අසති වෙදනානිරොධා අපි නු ඛො තත්‍ර අයමහමස්මීති සියා?''ති.

''නො හෙතං භන්තෙ''.

''තස්මාතිහානන්ද, එතෙනපෙතං නක්ඛමති 'නහෙව ඛො මෙ වෙදනා අත්තා, නොපි අපටිසංවෙදනො මෙ අත්තා, අත්තා මෙ වෙදයති, වෙදනාධම්මොහි මෙ අත්තා'ති සමනුපස්සිතුං.''

38. ''යතො ඛො පනානන්ද, භික්ඛු නෙව වෙදනං අත්තානං සමනුපස්සති, නොපි අපටිසංවෙදනං අත්තානං සමනුපස්සති, නොපි 'අත්තා මෙ වෙදයති වෙදනාධම්මොහි මෙ අත්තා'ති සමනුපස්සති, සො එවං අසමනුපස්සන්නො න ච කිඤ්චි ලොකෙ උපාදියති, අනුපාදියං න පරිතස්සති, අපරිතස්සං පච්චත්තං යෙව පරිනිබ්බායිස්සති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාති.

39. ''එවං විමුත්තචිත්තං ඛො ආනන්ද, භික්ඛුං යො එවං වදෙය්‍ය ''හොති තථාගතො පරම්මරණා ඉති'ස්ස දිට්ඨී''ති තදකල්ලං. ''න හොති තථාගතො පරම්මරණා ඉති'ස්ස දිට්ඨීති තදකල්ලං. ''හොති ච න ච හොති තථාගතො පරම්මරණා ඉති'ස්ස දිට්ඨී''ති තදකල්ලං. ''නෙව හොති, න න හොති තථාගතො පරම්මරණා ඉති'ස්ස දිට්ඨී''ති තදකල්ලං. තං කිස්ස හෙතු: යාවතා ආනන්ද අධිවචනං, යාවතා අධිවචනපථො, යාවතා නිරුත්ති, යාවතා නිරුත්තිපථො, යාවතා පඤ්ඤත්ති, යාවතා පඤ්ඤත්තිපථො, යාවතා පඤ්ඤා, යාවතා පඤ්ඤාවචරං යාවතා වට්ටං වට්ටති,[1] තදභිඤ්ඤා විමුත්තො භික්ඛු ''තදභිඤ්ඤා විමුත්තො භික්ඛූ[2] න ජානාති න පස්සති ඉති'ස්ස දිට්ඨී''ති තදකල්ලං.

40. ''සත්ත ඛො ඉමා ආනන්ද, විඤ්ඤාණට්ඨිතියො, ද්වෙ ආයතනානි, කතමා සත්ත:

සන්තානන්ද, සත්තා නානත්තකායා නානත්තසඤ්ඤිනො සෙය්‍යථාපි මනුස්සා එකච්චෙ ච දෙවා එකච්චෙ ච විනිපාතිකා. අයං පඨමා විඤ්ඤාණට්ඨිති.

---

1. යාවතා වට්ටං යාවතා වට්ටති—මජ්ඣං 2. විමුත්තකං භික්ඛු—මජ්ඣං.

Free Distribution www.aathaapi.org

37. "ආනන්දය, ඔවුන් අතුරෙන් යමෙක් 'වෙදනාව මගේ ආත්මය නොවේ ම ය, මගේ ආත්මය වෙදනාරහිතත් නොවේ ම ය, මගේ ආත්මය විඳියි, මගේ ආත්මය විඳින සුලු යැ' යි යමෙක් මෙසේ කියා නම්, 'ඇවැත්නි, වෙදනාවෝත් හැම අයුරින් ම හැම සැටියෙන් ම නොඉතිරි ව නිරුද්ධ වන්නාහු නම්, හැම අයුරින් ම වෙදනාව නැති කල්හි, වෙදනාවගේ නිරොධයෙන් එහි 'මේ මම වෙමි' යි කිය යුතු කිසිදු ස්කන්ධධර්මයෙක් වන්නේ ද? යි මෙසේ හෙතෙම කියැ යුතු (ඔහුගෙන් ප්‍රශ්න කළයුතු). "එහන්ස, ('මේ මම වෙමි' යි කිය යුතු කිසිත් වන්නේ ය යන) මෙය නොවේ ම ය." ආනන්දය, එහෙයින් මෙයිනුත් වෙදනාව මගේ ආත්මය නොවේ ම ය, වෙදනා නොවනුයේත් මගේ ආත්මය නොවේ ම ය, (වෙදනායෙන් අන්‍ය ධර්මයෙක් වූ) මගේ ආත්මය විඳියි, (එසේ වූ) මගේ ආත්මය විඳින සුලු යැ' යි මෙසේ මෙය දක්නට නොරිසියෙයි.

38. "ආනන්දය, යම් කලෙක මහණ වෙදනාව ආත්ම කොට නොදකී ද, ආත්මය වෙදනා නොවූවක් කොට හෝ නොදකී ද, 'මගේ ආත්මය විඳියි, මගේ ආත්මය විඳුනා සුලු යැ' යි හෝ නොම දකී ද, එසේ නොදක්නා හෙතෙම ලොවැ කිසිත් (ආත්ම ආත්මීය වශයෙන්) නොගනුයේ තෘෂ්ණා දෘෂ්ටි මාන යන තුන් පරිතස්සනායෙන් පරිතස්සනා නොකෙරෙයි. පරිතස්සනා නොකරන්නේ තෙමේ ම කෙලෙස් පිරිනිවනින් පිරිනිවෙයි, 'සසර ඉපැත්ම ක්ෂීණ වියැ යි, මග බඹසර වැස නිමැවිණැ යි, කළ යුතු දෑ කරන ලද්දේයැ යි, මේ රහත් බව පිණිස කළ යුතු අනෙකෙක් නැතැ'යි දනගනී.

39. ආනන්දය, මෙසේ (ආත්මදර්ශන නැති) මිදුණු සිතැති රහත් මහණහු ඇරබ යමෙක් 'තථාගත තෙම මරණින් මත්තෙහි වේ යැ යි මොහුගේ (රහත් වූවහුගේ) දෘෂ්ටිය මෙසේ යැ'යි කියන්නේ නම්, ඒ කිම (රහත් තෙම කිසිවක් නොදනී යැයි කියූවක් වන බැවින්) නොයුතු ය. 'තථාගත තෙම මරණින් මත්තෙහි නොවේ යැයි යනු මොහුගේ දෘෂ්ටියැ'යි කියන්නේ නම්, එය නොයුතු ය. 'තථාගත තෙම මරණින් මත්තෙහි වන්නේත් නොවන්නේත් වේ යැ යි යනු මොහුගේ දෘෂ්ටියැ' යි කියන්නේ නම්, එය නොයුතු ය. 'තථාගත තෙම මරණින් මතු නොම වෙයි. නොම නොවෙයි යනු මොහුගේ දෘෂ්ටියැ' යි කියන්නේ නම් එය නොයුතු ය. ඒ කවර හෙයින: ආනන්දය, ව්‍යවහාර යම් පමණ ද, ව්‍යවහරවිෂය යම් පමණ ද, නිර්වචන යම් පමණ ද, නිර්වචනවිෂය යම් පමණ ද, ප්‍රඥප්තිය (පැණවීම) යම් පමණ ද, ප්‍රඥප්තිවිෂය යම් පමණ ද, ප්‍රඥාව යම් පමණ ද, ප්‍රඥායෙන් බැස ගත යුතු පඤ්චස්කන්ධය යම් පමණ ද, යමතාක් සසරවට පවතී ද, රහත් මහණ එය වෙසෙසින් දන මිදුණේ වෙයි. 'එය දන මිදුණු මහණ නොදනී, නොදකී, එබැවින් මොහුගේ දෘෂ්ටිය මෙසේ යැ' යි යම් කීමෙක් ඇද්ද, එය නොයුතු යැ.

40. ආනන්දය, මේ විඥානස්ථිති (විඥානය පිහිටි තැන්) සත් දෙනෙකි, මේ ආයතනයෝ දෙදෙනෙකි.

විඥානස්ථිති සත කවරහ යත්:

ආනන්දය, මනුෂ්‍යයෝ ද සමහර දෙවියෝ ද සමහර විනිපාතිකයෝ (වෙමානික ප්‍රෙතයෝ) ද යන කායනානාත්වය හා සංඥානානාත්වය ඇති සත්ත්වයෝ ඇත. මේ ප්‍රථම විඥානස්ථිතිය යැ.

Free Distribution www.aathaapi.org

"සන්තානන්ද, සත්තා නානත්තකායා එකත්තසඤ්ඤිනො සෙය්‍යථාපි දෙවා බ්‍රහ්මකායිකා පඨමාභිනිබ්බත්තා. අයං දුතියා විඤ්ඤාණට්ඨිති.

"සන්තානන්ද, සත්තා එකත්තකායා නානත්තසඤ්ඤිනො සෙය්‍යථාපි දෙවා ආභස්සරා. අයං තතියා විඤ්ඤාණට්ඨිති.

"සන්තානන්ද, සත්තා එකත්තකායා එකත්තසඤ්ඤිනො සෙය්‍යථාපි දෙවා සුභකිණ්ණා. අයං චතුත්ථා[1] විඤ්ඤාණට්ඨිති.

"සන්තානන්ද, සත්තා සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිස-සඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනූපගා. අයං පඤ්චමා[2] විඤ්ඤාණට්ඨිති.

"සන්තානන්ද, සත්තා සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම 'අනන්තං විඤ්ඤාණ'න්ති විඤ්ඤාණඤ්චායතනූපගා. අයං ඡට්ඨා[3] විඤ්ඤාණට්ඨිති.

"සන්තානන්ද, සත්තා සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනූපගා. අයං සත්තමා[4] විඤ්ඤාණට්ඨිති.

අසඤ්ඤසත්තායතනං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනමෙව දුතියං.

41. තත්‍රානන්ද, යායං පඨමා විඤ්ඤාණට්ඨිති නානත්තකායා නානත්ත-සඤ්ඤිනො සෙය්‍යථාපි මනුස්සා එකච්චෙ ච දෙවා එකච්චෙ ච විනිපාතිකා, යො නු ඛො ආනන්ද, තඤ්ච පජානාති, තස්සා ච සමුදයං පජානාති, තස්සා ච අත්ථඞ්ගමං පජානාති, තස්සා ච අස්සාදං පජානාති, තස්සා ච ආදීනවං පජානාති, තස්සා ච නිස්සරණං පජානාති, කල්ලං නු තෙන තදභිනන්දිතුන්ති?"

"නො හෙතං භන්තෙ".

"තත්‍රානන්ද, යායං දුතියා විඤ්ඤාණට්ඨිති -පෙ- යායං තතියා විඤ්ඤාණට්ඨිති -පෙ- යායං චතුත්ථා විඤ්ඤාණට්ඨිති -පෙ- යායං පඤ්චමා විඤ්ඤාණට්ඨිති -පෙ- යායං ඡට්ඨා විඤ්ඤාණට්ඨිති -පෙ- තත්‍රානන්ද යායං සත්තමා විඤ්ඤාණට්ඨිති සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනූපගා, යො නු ඛො ආනන්ද තඤ්ච පජානාති, තස්සා ච සමුදයං පජානාති, තස්සා ච අත්ථඞ්ගමං පජානාති, තස්සා ච අස්සාදං පජානාති, තස්සා ච ආදීනවං පජානාති, තස්සා ච නිස්සරණං පජානාති, කල්ලං නු තෙන තදභිනන්දිතුන්ති?

"නො හෙතං භන්තෙ".

---

1. චතුත්ථි – සීමු, මජ්ඣං, ස්‍යා, PTS.
2. පඤ්චමි – සීමු, මජ්ඣං, ස්‍යා. PTS.
3. ඡට්ඨි, සීමු – මජ්ඣං; ස්‍යා, PTS.
4. සත්තමි – සීමු, මජ්ඣං, ස්‍යා, PTS.

Free Distribution www.aathaapi.org

"ආනන්දය, ප්‍රථමධ්‍යානයෙන් උපන් බ්‍රහ්මකායික දෙවියෝ ය යන කායනානාත්වය ඇති (ප්‍රමාණ වියින් කයින් වෙනස් වූ), සංඥාඑකත්වය ඇති (ප්‍රථම ධ්‍යාන සංඥා වියින් සමාන වූ) සත්ත්වයෝ ඇත. මේ දෙවෙනි විඥානස්ථිතිය යි.

ආනන්දය, ආභාස්වර (විහිදෙන ප්‍රභා ඇති) දෙවියෝ ය යන (ප්‍රභා වියින්) කායඑකත්වය ඇති (අවිතර්ක විචාර - අවිතර්ක අවිචාර ධ්‍යාන වියින්) සංඥානානාත්වය ඇති සත්ත්ව කෙනෙක් ඇත. මේ තෙවෙනි විඥානස්ථිතිය යි.

ආනන්දය, ශුභකෘත්ස්නක දෙවියෝ ය යන කායඑකත්වය ඇති (චතුර්ථ ධ්‍යාන වියින්) සංඥා එකත්වය ඇති සත්ත්ව කෙනෙක් ඇත. මේ සතරවන විඥානස්ථිතිය යි.

ආනන්දය, හැම අයුරින් ම රූපසංඥාවන් ඉක්මීමෙන් ප්‍රතිඝසංඥාවන් පහවීමෙන්, නානාත්වසංඥාවන් නො මෙනෙහි කිරීමෙන් 'අහස අනන්ත යැයි දහන් වඩා ආකාසානඤ්චායතන භූමියට පැමිණි සත්වයෝ ඇත. මේ පස්වන විඥානස්ථිතිය යි.

ආනන්දය, සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්ම 'විඥානය අනන්තයැ' යි දහන් වඩා විඤ්ඤාණඤ්චායතනභූමියට පැමිණි සත්ත්වයෝ ඇත. මේ සවන විඥානස්ථිතිය යි.

ආනන්දය, සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම 'කිසිත් නැතැ'යි නාස්තිභාවප්‍රඥප්තිය වඩා ආකිඤ්චඤ්ඤායතන භූමියට පැමිණි සත්වයෝ ඇත. මේ සත්වන විඥානස්ථිතිය යි.

අසංඥසත්ත්වායතනය ආයතන වියින් පළමු වැන්න යි. නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනය ම දෙවැන්න යි.

41. "ආනන්දය, ඔවුන් අතුරෙන් මනුෂ්‍යයෝ ද ඇතැම් දෙවියෝ ද ඇතැම් විනිපාතිකයෝ ද යන නානත්තකාය නානත්තසඤ්ඤී වූ යම් මේ ප්‍රථම විඥානස්ථිතියෙක් වේ ද, යමෙක් එයත් දනී නම්, එහි සමුදයයත් (පහළ වන්නට කාරණයත්) දනී නම්, එහි නිරෝධයත් දනී නම්, එහි ආස්වාදයත් (රසයත්) දනී නම්, එහි ආදීනවයත් (දෙෂයත්) දනී නම්, එහි නිඃසරණයත් (එයින් නික්මීමත්) දනී නම් ඔහු විසින් එය (මම ය යි, මාගේ ය'යි) අභිනන්දනයට (පිළිගන්නට) සුදුසු ද?"

"වහන්ස, මෙය නො සුදුසු යැ."

"ආනන්දය, ඔවුන් අතුරෙන් යම් මේ දෙවෙනි විඥානස්ථිතියෙක් ඇද්ද...යම් මේ තෙවෙනි විඥානස්ථිතියක් ඇද්ද ... යම් මේ සිවුවන විඥානස්ථිතියෙක් ඇද්ද ... යම් මේ පස්වන විඥානස්ථිතියෙක් ඇද්ද ... යම් මේ සවන විඥානස්ථිතියෙක් ඇද්ද...ආනන්දය, ඔවුන් අතුරෙන් සියලු අයු-රින් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම 'කිසිත් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතන භූමියට පැමිණි සත්ත්ව කෙනෙක් ඇත් නම් ඔවුන් පිළිබඳ වූ යම් මේ සත්වන විඥානස්ථිතියෙක් වේ ද, ආනන්දය යමෙක් ඒ විඥානස්ථිතියත් දනී ද, එයට කාරණයත් දනී ද, එහි නිරෝධයත් දනී ද, එහි රසයත් දනී ද එහි ආදීනවයත් දනී ද, එහි නිඃසරණයත් දනී ද, එසේ දන්නාවූ ඔහු විසින් එය අභිනන්දනයට සුදුසු ද?"

"වහන්ස, මෙය සුදුසු නො වේ ම යැ."

Free Distribution www.aathaapi.org

"තත්‍රානන්ද, යදිදං අසඤ්ඤසත්තායතනං, යෝ නු ඛෝ ආනන්ද, තඤ්ඤේ පජානාති, තස්ස ච සමුදයං පජානාති, තස්ස ච අත්ථඞ්ගමං පජානාති, තස්ස ච අස්සාදං පජානාති, තස්ස ච ආදීනවං පජානාති, තස්ස ච නිස්සරණං පජානාති, කල්ලං නු තෙන තදභිනන්දිතුන්ති?"

"නෝ හෙතං භන්තෙ."

"තත්‍රානන්ද, යදිදං නෙවසඤ්ඤානාසඤ්ඤායතනං, යෝ නු ඛෝ ආනන්ද, තඤ්ඤේ පජානාති, තස්ස ච සමුදයං පජානාති, තස්ස ච අත්ථඞ්ගමං පජානාති, තස්ස ච අස්සාදං පජානාති, තස්ස ච ආදීනවං පජානාති, තස්ස ච නිස්සරණං පජානාති, කල්ලං නු තෙන තදභිනන්දිතුන්ති?"

"නෝ හෙතං භන්තෙ."

"යතෝ ඛෝ ආනන්ද, භික්ඛු ඉමාසඤ්ච සත්තන්නං විඤ්ඤාණට්ඨිතීනං, ඉමෙසඤ්ච ද්වින්නං ආයතනානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමුත්තෝ හොති. අයං වුච්චතානන්ද, භික්ඛු සබ්බසෝ විමුත්තෝ.

42. "අට්ඨ ඛෝ ඉමෙ ආනන්ද විමොක්ඛා. කතමෙ අට්ඨ:

රූපී රූපානි පස්සති. අයං පඨමෝ විමොක්ඛෝ.

අජ්ඣත්තං අරූපසඤ්ඤීධහිද්ධා රූපානි පස්සති. අයං දුතියෝ විමොක්ඛෝ.

සුභන්ත්වෙව අධිමුත්තෝ හොති. අයං තතියෝ විමොක්ඛෝ.

සබ්බසෝ රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තෝ ආකාසෝ'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං චතුත්ථෝ විමොක්ඛෝ.

සබ්බසෝ ආකාසානඤ්චායතනං සමතික්කම්ම 'අනන්තං විඤ්ඤාණ'න්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං පඤ්චමෝ විමොක්ඛෝ.

සබ්බසෝ විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං ඡට්ඨෝ විමොක්ඛෝ.

සබ්බසෝ ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං සත්තමෝ විමොක්ඛෝ.

සබ්බසෝ නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. අයං අට්ඨමෝ විමොක්ඛෝ.

ඉමෙ ඛෝ ආනන්ද, අට්ඨ විමොක්ඛා.

Free Distribution www.aathaapi.org

"ආනන්දය, ඔවුන් අතුරෙන් යම් මේ අසංඥසත්ත්වායතනයෙක් වේ ද, ආනන්දය, යමෙක් එයත් දනී ද, එහි සමුදයයත් දනී ද, එහි නිරෝධයත් දනී ද, එහි රසයත් දනී ද, එහි දෝෂයත් දනී ද, එහි නිස්සීමත් දනී ද, ඔහු විසින් එය අභිනන්දනයට පිළිගන්නට සුදුසු ද?"

"වහන්ස, මෙය සුදුසු නො වේ ම යැ."

"ආනන්දය, ඔවුන් අතුරෙන් යම් මේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙක් වේ ද, ආනන්දය, යමෙක් එයත් දනී ද, එයට කාරණයත් දනී ද, එහි නිරෝධයත් දනීද, එහි රසයත් දනී ද, එහි නිඃසරණයත් දනී ද ඔහු විසින් එය පිළිගන්නට සුදුසු ද?"

"වහන්ස, මෙය සුදුසු නො වේ ම යැ."

"ආනන්දය, යම් කලෙක මහණ මේ විඤ්ඤාණස්ථිති සතේ ද මේ ආයතන දෙක්හි ද සමුදයයත් අස්තගමයත් ආස්වාදයත් ආදීනවයත් නිඃසරණයත් තතු වූ පරිදි දන උපාදන රහිත ව මිදුණේ වේ ද, ආනන්දය, මේ මහණ **ප්‍රඥාවිමුක්ත** (ප්‍රඥා බලයෙන් නාම රූප කයින් මිදුණේ) යැ යි කියනු ලැබේ.

42. "ආනන්දය, මේ විමොක්ෂයෝ අට දෙනෙකි. කවර අට දෙනෙක් ද යත්:

රූපී වූයේ (තමාගේ කෙසාදියෙහි නීලකසිණාදි වශයෙන් ඉපිදවූ රූපධ්‍යාන සතරෙන් එකක් ඇත්තේ තමා කෙරෙහි වූ නීලකසිණාදී) රූපයන් ධ්‍යාන ඇසින් දකී. මේ පළමු විමොක්ෂ ය යි.

අධ්‍යාත්මයෙහි අරූපසංඥා ඇත්තේ (තමාගේ කෙසාදින්හි ඉපැද වූ රූපසංඥා නැත්තේ, බාහිර අරමුණෙහි පිරියම් වඩා බාහිර අරමුණෙහි ම ඉපිද වූ රූපධ්‍යාන ඇත්තේ) බාහිර නීලකසිණාදි රූපයන් දකී. මේ දෙවෙනි විමොක්ෂ ය යි.

(පිරිසිදු වූ නීලාදි වර්ණකසිණ අරමුණක් ගෙන) 'ඒ අරමුණ ඉහ යැ' යි එහි වැදගත්තේ වෙයි. මේ තෙවෙනි විමොක්ෂ ය යි.

හැම අයුරින් ම රූපසංඥාවන් ඉක්මීමෙන් ප්‍රතිඝසංඥාවන් පහ ව යෑමෙන් නානාත්වසංඥාවන් නොමෙනෙහි කිරීමෙන් 'අභස අනන්ත' යැ යි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසෙයි. මේ සිවුවන විමොක්ෂය යි.

හැම අයුරින් ම ආකාසානඤ්චායතනය ඉක්ම 'විඤ්ඤාණය අනන්ත යැ' යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වෙසෙයි. මේ පස්වන විමොක්ෂය යි.

හැම අයුරින්ම විඤ්ඤාණඤ්චායතනය ඉක්ම ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසෙයි. මේ සවන විමොක්ෂ ය යි.

හැම අයුරින් ම ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය ඉක්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වෙසෙයි. මේ සත්වන විමොක්ෂ ය යි.

හැම අයුරින් ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්ම සඤ්ඤාවෙදයිත නිරෝධයට පැමිණ වෙසෙයි. මේ අට වන විමොක්ෂ ය යි.

ආනන්දය, මේ විමොක්ෂ අට යි.

Free Distribution www.aathaapi.org

"යතො බො ආනන්ද, භික්ඛු ඉමෙ අට්ඨ විමොක්ඛෙ අනුලොමම්පි සමාපජ්ජති, පටිලොමම්පි සමාපජ්ජති, අනුලොමපටිලොමම්පි සමාපජ්ජති, යත්ථිච්ඡකං යදිච්ඡකං යාවදිච්ඡකං සමාපජ්ජති පි වුට්ඨාති පි, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චතානන්ද, භික්ඛු උභතොභාගවිමුත්තොති. ඉමාය ච ආනන්ද උභතොභාගවිමුත්තියා අඤ්ඤා උභතොභාගවිමුත්ති උත්තරිතරා වා පණීතතරා වා නත්ථී"ති.

ඉදමවොච භගවා අත්තමනො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

මහානිදානසුත්තං නිට්ඨිතං දුතියං.

Free Distribution www.aathaapi.org

"ආනන්දය, යම් කලෙක මහණ තෙම මේ අෂ්ට විමොක්ෂයන් අනුලොම්විසිනුත් (මූල පටන් අවසන දක්වාත්) සමවදීද, පිළිලොම්විසිනුත් (අග සිට මූල දක්වාත්) සමවදී ද, අනුලොම්පිළිලොම් විසිනුත් සමවදී ද, කැමැති තැනෙක, කැමැති සමවීතකට, කැමැති තාක් කල් සමවැදීමත් එයින් නැගී සිටීමත් කෙරේ ද, ආස්‍රවයන් ද ක්ෂය කිරීමෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය (ඵලසමාධිය) ද, ප්‍රඥාවිමුක්තිය (ඵලඥානය) ද මේ අත්බවහි ම තෙමේ වෙසෙසි නුවණින් දැන පසක් කොට සපයා වෙසේ ද, ආනන්දය, මේ මහණ **උභතොභාගවිමුක්ත** (අරූපසමාපත්තියෙන් රූපකාය කෙරෙන් ද, මාර්ගයෙන් නාමකාය කෙරෙන් දැ යි දෙපසින් ම මිදුණේ) යැ යි කියනු ලැබේ. ආනන්දය, මේ උභතොභාගවිමුක්තියෙන් උත්තරිතර (මෙයට වැඩි තරම්) වූ ප්‍රණීතතර (මෙයට වඩා උතුම්) වූ උභතොභාග විමුක්තියෙක් නැති."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක. ආයුෂ්මත් අනඳ තෙරණුවෝ ආරාධිත සිත් ඇත්තාහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගත්හ.

දෙවැනි මහානිදාන සූත්‍රය නිමියේ යි.

Free Distribution www.aathaapi.org

3

මහාපරිනිබ්බානසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. තෙන ඛො පන සමයෙන රාජා මාගධො අජාතසත්තු වෙදෙහි-පුත්තො වජ්ජී අභියාතුකාමො හොති. සො එවමාහ: 'අහං හි ඉමෙ වජ්ජී එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ උච්ඡෙජ්ජාමි,[1] විනාසෙස්සාමි වජ්ජී, අනයබ්‍යසනං ආපාදෙස්සාමි වජ්ජී'ති.

2. අථ ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො වස්සකාරං බ්‍රාහ්මණං මගධමහාමත්තං ආමන්තෙසි:

''එහි ත්වං බ්‍රාහ්මණ, යෙන භගවා තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්දහි. අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ: 'රාජා භන්තෙ, මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භගවතො පාදෙ සිරසා වන්දති. අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡතී'ති.

එවං ච වදෙහි: 'රාජා භන්තෙ, මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො වජ්ජී අභියාතුකාමො හොති. සො එවමාහ: අහං හි ඉමෙ වජ්ජී එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ උච්ඡෙජ්ජාමි, විනාසෙස්සාමි වජ්ජී, අනයබ්‍යසනං ආපාදෙස්සාමි වජ්ජී'ති. යථා ච තෙ භගවා බ්‍යාකරොති, තං සාධුකං උග්ගහෙත්වා මම ආරොචෙය්‍යාසි. න හි තථාගතා විතථං භණන්තී''ති.

3. 'එවං භො'ති ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො රඤ්ඤො මාගධස්ස අජාතසත්තුස්ස වෙදෙහිපුත්තස්ස පටිස්සුත්වා, භද්දානි භද්දානි යානානි යොජාපෙත්වා,[2] භද්දං යානං අභිරුහිත්වා, භද්දෙහි භද්දෙහි යානෙහි රාජගහම්හා නිය්‍යාසි. යෙන ගිජ්ඣකූටො පබ්බතො තෙන පායාසි. යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකො'ව යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරානීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො භගවන්තං එතදවොච:

---

1. උච්ඡෙජ්ජාමි – අට්ඨකථා, ස්‍යා, PTS.

2. යොජෙත්වා – ම ජ සං,

Free Distribution www.aathaapi.org

3
මහාපරිනිබ්බාණ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයෙහි වූ **ගිජ්ඣකූට** පර්වතයෙහි වැඩවසන සේක. එසමයෙහි වෛදේහීපුත්‍ර වූ මගධදේශාධිපති **අජාසත්** රජ වැදෑ රජුන් මැඩැ ලනු පිණිස යනු කැමැත්තේ වෙයි. හෙ තෙම 'මම වූ කලි මෙසා මහත් රාජර්ධියෙන් සමන්විත මෙසා මහත් ආනුභාව ඇති වැදෑ රජුන් මුලින් සිඳලන්නෙමි, වජ්ජීන් වනසන්නෙමි, වජ්ජීන් අනයව්‍යසනයට පමුණුවන්නෙමි' යි මෙසේ කියයි.

2. ඉක්බිත්තෙන් වෛදේහීපුත්‍ර මගධදේශාධිපති අජාසත් රජ මගධ-මහාමාත්‍ර වූ වස්සකාර බමුණහු බැණැවිය:

''බමුණාණනි, මෙහි එන්න, භාග්‍යවතුන් වහන්සේ වෙත යවු. ගොස් මගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් (පාමුල හිස තබා) වඳිවු. 'වහන්ස, වෛදේහීපුත්‍ර වූ මගධාධිපති අජාසත් රජ භාග්‍යවතුන් වහන්සේගේ පාමුල හිස තබා වඳියි. භාග්‍යවතුන් වහන්සේ ගේ නිරාබාධ බව, නීරෝග්‍ය බව, හැල්ලු පැවැත්ම, කායබලය, සැප විහරණය විචාරා'යැ යි නිරාබාධ බව, නිරොග බව, හැල්ලු පැවැත්ම, කාය බලය, සැප විහරණය විචාරන්න.

'වහන්ස, වෛදේහීපුත්‍ර මගධෙශ්වර අජාසත් රජ වැදෑරජුන් මඩිනුවට යනු කැමැත්තේ වෙයි. හෙතෙම 'මෙසා මහඉද්ධිමත් මෙසා මහතෙදැති වැදෑ රජුන් මුල්සුන් කරන්නෙමි, වැදෑ රජුන් වනසන්නෙමි, වැදෑ රජුන් අනයව්‍යසනයට පමුණුවන්නෙමි'යි මෙපරිද්දෙන් කියා' යැ යි මෙසේත් කියන්න. භාග්‍යවතුන් වහන්සේ ඔබට යම්සේ වදරන සේක් ද, එය මොනොවට ඉගෙන මට සැළ කරන්න. තථාගතවරු නො සැබෑ බසක් නො බෙණෙත්'' යැ යි කී ය.

3. 'එසේ ය, පින්වතාණනි'යි කියා මගධමහාමාත්‍ර වූ වස්සකාර බමුණු වෛදේහීපුත්‍ර වූ මගධෙශ්වර වූ අජාසත් රජුට පිළිවදන් දී, මනාප මනාප යානයන් යොදවා, මනාප යානයක් නැඟ, මනාප මනාප යානයන් ගෙන් උපලක්ෂිත ව රජගහපුරයෙන් නික්මියේ ය. ගිජ්ඣකූට පර්ව්ව වෙත එළැඹියේ ය. යානයෙන් යෑමට සුදුසු බිම යම් තැක් ද, ඒ තැක් ගොස් යානයෙන් බැස පාගමන් දැත්තේ ම භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සතුටු විය. සතුටට කරුණු වූ, සිතැ රැඳැවිය යුතු වූ කථාව අවසන් කොට එක් පසෙක හිඳගත. එක් පසෙක හුන්නා වූ මගද මහමැති වස්සකාර බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය:

Free Distribution www.aathaapi.org

"රාජා හො ගොතම, මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො හොතො ගොතමස්ස පාදෙ සිරසා වන්දති. අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. රාජා හො ගොතම, මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො වජ්ජී අභියාතුකාමො. සො එවමාහ: අහං හි ඉමෙ වජ්ජී එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ උච්ඡෙච්ඡාමි, විනාසෙස්සාමි වජ්ජී අනයබ්‍යසනං ආපාදෙස්සාමි වජ්ජී''ති.

[වජ්ජීනං සත්ත අපරිහානියා ධම්මා:]

4. තෙන ඛො පන සමයෙන ආයස්මා ආනන්දො භගවතො පිට්ඨිතො ඨිතො හොති භගවන්තං වීජයමානො[1]. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි:

"කින්නි තෙ ආනන්ද, සුතං: වජ්ජී අභිණ්ඡසන්නිපාතා සන්නිපාතබහුලාති?

"සුතම්මෙතං භන්තෙ, වජ්ජී අභිණ්ඡසන්නිපාතා සන්නිපාතබහුලා''ති.

"යාවකීවඤ්ච ආනන්ද, වජ්ජී අභිණ්ඡසන්නිපාතා සන්නිපාතබහුලා භවිස්සන්ති වුද්ධියෙව[2] ආනන්ද, වජ්ජීනං පාටිකඞ්ඛා නො පරිහානි.'' (1)

"කින්නි තෙ ආනන්ද, සුතං: වජ්ජී සමග්ගා සන්නිපාතන්ති, සමග්ගා වුට්ඨහන්ති, සමග්ගා වජ්ජිකරණීයානි කරොන්තීති?''

"සුතම්මෙතං භන්තෙ, වජ්ජී සමග්ගා සන්නිපතන්ති, සමග්ගා වුට්ඨහන්ති, සමග්ගා වජ්ජිකරණීයානි කරොන්ති''ති.

"යාවකීවඤ්ච ආනන්ද, වජ්ජී සමග්ගා සන්නිපතිස්සන්ති, සමග්ගා වුට්ඨහිස්සන්ති, සමග්ගා වජ්ජිකරණීයානි කරිස්සන්ති, වුද්ධියෙව ආනන්ද වජ්ජීනං පාටිකඞ්ඛා, නො පරිහානි.'' (2)

''කින්නි තෙ ආනන්ද, සුතං: වජ්ජී අපඤ්ඤත්තං න පඤ්ඤපෙන්ති, පඤ්ඤත්තං න සමුච්ඡින්දන්ති, යථාපඤ්ඤත්තෙ පොරාණෙ වජ්ජිධම්මෙ සමාදය වත්තන්තීති?''

"සුතම්මෙතං භන්තෙ, වජ්ජී අපඤ්ඤත්තං න පඤ්ඤපෙන්ති, පඤ්ඤත්තං න සමුච්ඡින්දන්ති, යථාපඤ්ඤත්තෙ පොරාණෙ වජ්ජිධම්මෙ සමාදය වත්තන්ති''ති.

---

1. විජියමානො, ස්‍යා.
   විජයමානො – මජසං.
2. වුද්ධියෙව–ස්‍යා.

Free Distribution www.aathaapi.org

''භවද් ගෞතමයිනි, වෛදේහීපුත්‍ර වූ මගධාධිපති අජාසත් රජ තිස නමා භවද් ගෞතමයන්ගේ පා වඳී. ඔබ නිරාබාධ නියා, නීරෝග නියා, හැල්ලු පැවැතුම් ඇති නියා, කාබල ඇති නියා, සුව විහරණ ඇති නියා විචාරයි. භවද් ගෞතමයිනි, වෛදේහීපුත්‍ර මගධේශ්වර අජාසත් රජ වැදෑ රජුන් මඩින්නට යනු කැමැත්තේ ය. 'මෙසේ වූ මහත් රාජර්ද්ධි ඇති මෙසේ වූ මහත් ආනුභාව ඇති මේ වැදෑ රජුන් මුල්සුන් කරන්නෙමි යි, මේ වැදෑ රජුන් වනසන්නෙමි යි, මේ වැදෑ රජුන් අනයව්‍යසනයට පමුණුවන්නෙමි' යි මෙසේ කියා'' යි භාග්‍යවතුන් වහන්සේට සැළ කෙළේ ය.

වජ්ජීන් පිළිබඳ අපරිහානිය දහම් සත

4. ඒ වේලෙහි ආනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පවන් සලමින් පිටුපසින් සිටියාහු වෙති. ඒ කලෑ භාග්‍යවතුන් වහන්සේ ආනඳ තෙරුන් ඇමතූ සේක:

''ආනඳයෙනි, වැදෑ රජුහු නිරතුරු (දවස තෙවරක්) රැස් වන්නාහු ය, රැස් වනු බහුල කොට ඇත්තාහ යි මෙය තොප විසින් අසන ලද ද?'' යි අසාවදළ සේක.

''වහන්ස, වැදෑ රජුහු නිරතුරු රැස්වන්නාහ, රැස් වනු බහුල කොට ඇත්තාහ'යි මෙය මා විසින් අසන ලදී'' යි ආනඳ තෙරණුවෝ පිළිතුරු දුන්හ.

''ආනඳයෙනි, වැදෑ රජුහු යම්තාක් එක්වන් රැස්වීම ඇත්තාහු ද, රැස් වනු බහුල කොට ඇත්තෝ වන්නාහු ද, ඒතාක් ආනඳයෙනි, වැදෑ රජුන්ගේ වැඩීම ම ඇවෙක්සිය (කැමැතිවිය) යුතු, පිරිහීම නො ඇවෙක්සිය යුතු.'' (1)

''ආනඳයෙනි, වැදෑ රජුහු සමඟ වැ රැස් වෙත්ය, සමඟ වැ නැඟී සිටිත්ය, සමඟ වැ වැදෑකරණීය කෙරෙත් යැ යි මෙය තොප විසින් අසන ලද ද?''

''වහන්ස, වැදෑ රජුහු සමඟ වැ රැස් වෙත්, සමඟ වැ නැඟී සිටිත්, සමඟ වැ වැදෑකරණීය කෙරෙත් යැයි මෙය මා විසින් අසන ලදී.''

''ආනඳයෙනි, යම්තාක් වැදෑ රජුහු සමඟ වැ රැස් වන්නාහු ද, සමඟ වැ නැඟී සිටින්නාහු ද, සමඟ වැ වැදෑකරණීය කරන්නාහු ද, ආනඳයෙනි, ඒතාක් ම වැදෑ රජුන්ගේ වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ඇවෙක්සිය යුතු.'' (2)

''ආනඳයෙනි, වැදෑ රජුහු (පෙර තම පරපුරෙහි රජුන්) නො පනවන ලද්දක් නො පනවත්, පනවන ලද්ද නො සිඳිත්, පනවන ලද පොරණ වැදෑ දහමහි පිහිටා පවතිත් යැයි මෙය තොප විසින් අසන ලද ද?''

''වහන්ස වැදෑ රජුහු පෙර තම පරපුරෙහි රජුන් නො පැනැවූවක් නො පනවත්, පැනැවූවක් නො සිඳිත්, පනවන ලද පොරණ වැදෑ දහමහි පිහිටා සිටිත් යැයි මෙය මා විසින් අසන ලදී.''

Free Distribution www.aathaapi.org

"යාවකීවඤ්ච ආනන්ද වජ්ජී අපඤ්ඤත්තං න පඤ්ඤපෙස්සන්ති, පඤ්ඤත්තං න සමුච්ඡින්දිස්සන්ති, යථාපඤ්ඤත්තෙසු පොරාණෙසු වජ්ජිධම්මෙසු සමාදාය වත්තිස්සන්ති, වුද්ධියෙව ආනන්ද වජ්ජීනං පාටිකඞ්ඛා; නො පරිහානි. (3)

කින්නි තෙ ආනන්ද සුතං: වජ්ජී යෙ තෙ වජ්ජීනං වජ්ජිමහල්ලකා, තෙ සක්කරොන්ති ගරුකරොන්ති[1] මානෙන්ති පූජෙන්ති, තෙසඤ්ච සොතබ්බං මඤ්ඤන්තීති?"

"සුතමෙමතං භන්තෙ, වජ්ජී යෙ තෙ වජ්ජීනං වජ්ජිමහල්ලකා, තෙ සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, තෙසඤ්ච සොතබ්බං මඤ්ඤන්තී"ති.

"යාවකීවඤ්ච ආනන්ද වජ්ජී යෙ තෙ වජ්ජීනං වජ්ජිමහල්ලකා, තෙ සක්කරිස්සන්ති ගරුකරිස්සන්ති මානෙස්සන්ති පූජෙස්සන්ති, තෙසඤ්ච සොතබ්බං මඤ්ඤිස්සන්ති, වුද්ධියෙව ආනන්ද වජ්ජීනං පාටිකඞ්ඛා, නො පරිහානි." (4)

"කින්නි තෙ ආනන්ද සුතං: "වජ්ජී යා තා කුලිත්ථියො කුලකුමාරියො තා න ඔක්කස්ස පසය්හ වාසෙන්ති?"ති.

"සුතමෙමතං භන්තෙ, වජ්ජී යා තා කුලිත්ථියො කුලකුමාරියො, තා න ඔක්කස්ස පසය්හ වාසෙන්ති"ති.

"යාවකීවඤ්ච ආනන්ද වජ්ජී යා තා කුලිත්ථියො කුලකුමාරියො, තා න ඔක්කස්ස පසය්හ වාසෙස්සන්ති, වුද්ධියෙව ආනන්ද වජ්ජීනං පාටිකඞ්ඛා, නො පරිහානි." (5)

"කින්නි තෙ ආනන්ද සුතං: වජ්ජී යානි තානි වජ්ජීනං වජ්ජි-චෙතියානි අබ්භන්තරානි චෙව බාහිරානි ච, තානි සක්කරොන්ති ගරු කරොන්ති මානෙන්ති පූජෙන්ති, තෙසඤ්ච දින්නපුබ්බං කතපුබ්බං ධම්මිකං බලිං නො පරිහාපෙන්තීති?."

"සුතමෙමතං භන්තෙ, වජ්ජී යානි තානි වජ්ජීනං වජ්ජිචෙතියානි අබ්භන්තරානි චෙව බාහිරානි ච, තානි සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති, තෙසඤ්ච දින්නපුබ්බං කතපුබ්බං ධම්මිකං බලිං නො පරිහාපෙන්ති"ති.

---

1. ගරුං කරොන්ති. – ම ජ ඵ.

Free Distribution www.aathaapi.org

"අනඳයෙනි, යම් තාක් වැදෑරජුහු පෙර වැදෑරජුන් නො පැනැවූවක් නො පනවන්නාහු ද, පැනැවූවක් නො සිඳින්නාහු ද, පනවන ලද පොරණ වැදෑ දහමහි පිහිටා සිටින්නාහු ද, ඒ තාක් ම අනඳයෙනි, වැදෑ රජුන්ගේ වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ඇවෙක්සිය යුතු." (3)

"අනඳයෙනි, වැදෑ රජුන් අතුරෙහි යම් මහළු වැදෑ කෙනෙක් වෙත් නම්, වැදෑ රජුහු ඔවුනට සත්කාර කෙරෙත්, ගුරුකාර කෙරෙත්, බුහුමන් කෙරෙත්, පූජා කෙරෙත්, ඔවුන් ඔස් ඇසිය යුතු කොට සිතත් යැයි මෙය තොප විසින් අසන ලදද?"

"වහන්ස, වැදෑ රජුන් අතුරෙහි යම් මහළු වැදෑ කෙනෙක් වෙත් නම්, වැදෑරජුහු ඔවුනට සත්කාර කෙරෙත්, ගුරුකාර කෙරෙත්, බුහුමන් කෙරෙත්, පූජා කෙරෙත්, ඔවුන් ඔස් ඇසිය යුතු කොට සිතත් යැයි මෙය මා විසින් අසන ලදි."

"අනඳයෙනි, යම් තාක් වැදෑ රජුහු සිය මහළු වැදුවනට සත්කාර ගුරුකාර මානන පූජන කරන්නාහු නම්, ඔවුන් ඔස් ඇසිය යුතු කොට සිතන්නාහු නම්, ඒ තාක් අනඳයෙනි, වැදෑවනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ඇවෙක්සිය යුතු." (4)

"අනඳයෙනි, යම් කුලවම්යෝ කුලදූරියෝ වෙත් ද, වැදෑ රජුහු ඔවුන් ඇදගෙන ගොස් බලාත්කාරයෙන් තමන් කෙරෙහි නො වස්වත් යැයි මෙය තොප විසින් අසන ලද ද?"

"වහන්ස, යම් කුලවම්යෝ කුලදූරියෝ වෙත් නම්, වැදෑ රජුහු ඔවුන් ඇදගෙන ගොස් බලාත්කාරයෙන් තමන් කෙරෙහි නො වස්වත් යැයි මෙය මා විසින් අසන ලදි."

"අනඳයෙනි, යම්තාක් වැදෑරජුහු කුලවම්යන් කුලදූරියන් ඇද ගෙන ගොස් බලාත්කාරයෙන් තමන් වෙතැ නො වස්වන්නාහු ද, ඒ තාක් ම අනඳයෙනි, වැදෑවනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ඇවෙක්සියැ යුතු." (5)

"අනඳයෙනි, නුවර ඇතුළත ද පිටත ද වැදෑ රජුන්ගේ යම් වැදෑ දෙවොල් කෙනෙක් වෙත් නම්, වැදෑහු එයට සත්කාර කෙරෙත්, ගුරුකාර කෙරෙත්, බුහුමන් කෙරෙත්, පූජා කෙරෙත්, එයට දුන් විරූ, කළ විරූ දහැමි බිලියම් නො පිරිහෙළත් යැයි මෙය තොප විසින් අසන ලද ද?"

"වහන්ස, නුවර ඇතුළත ද බැහැර ද වැදෑ රජුන්ගේ යම් වැදෑ දෙවොල් කෙනෙක් වෙත් නම්, වැදෑ රජුහු එයට සත්කාර ගුරුකාර බුහුමාන පූජා කෙරෙත්, එයට දුන් විරූ කළ විරූ, දහැමි බිලියම් නො පිරිහෙළත් යැයි මෙය මා විසින් අසන ලදි.

Free Distribution www.aathaapi.org

"යාවකීවඤ්ච ආනන්ද වජ්ජී යානි තානි වජ්ජිනං වජ්ජිචෙතියානි අබ්භන්තරානි චෙව බාහිරානි ච, තානි සක්කරිස්සන්ති ගරුකරිස්සන්ති මානෙස්සන්ති පූජෙස්සන්ති, තෙසඤ්ච දින්නාපුබ්බං කතපුබ්බං ධම්මිකං බලිං නො පරිහාපෙස්සන්ති, වුද්ධියෙව ආනන්ද වජ්ජීනං පාටිකඞ්ඛා, නො පරිහානි." (6)

"කින්නි තෙ ආනන්ද සුතං: වජ්ජීනං අරහන්තෙසු ධම්මිකා රක්ඛාවරණගුත්ති සුසංවිහිතා: කින්ති අනාගතා ච අරහන්තෝ විජිතං ආගච්ඡෙය්යුං, ආගතා ච අරහන්තෝ විජිතෙ ඵාසුං[1] විහරෙය්යුන්ති?"

"සුතමෙමතං භන්තෙ වජ්ජීනං අරහන්තෙසු ධම්මිකා රක්ඛාවරණගුත්ති සුසංවිහිතා: කින්ති අනාගතා ච අරහන්තෝ විජිතං ආගච්ඡෙය්යුං, ආගතා ච අරහන්තෝ විජිතෙ ඵාසුං විහරෙය්යුන්ති."

"යාවකීවඤ්ච ආනන්ද වජ්ජීනං අරහන්තෙසු ධම්මිකා රක්ඛාවරණගුත්ති සුසංවිහිතා භවිස්සන්ති: කින්ති අනාගතා ච අරහන්තෝ විජිතං ආගච්ඡෙය්යුං, ආගතා ච අරහන්තෝ විජිතෙ ඵාසුං විහරෙය්යුන්ති, වුද්ධියෙව ආනන්ද වජ්ජීනං පාටිකඞ්ඛා, නො පරිහානී'ති." (7)

5. අථ ඛො භගවා වස්සකාරං බ්‍රාහ්මණං මගධමහාමත්තං ආමන්තෙසි: "එකමිදාහං බ්‍රාහ්මණ සමයං වෙසාලියං විහරාමි සාරන්දදෙ චෙතියෙ. තත්‍රාහං වජ්ජීනං ඉමෙ සත්ත අපරිහානියෙ ධම්මෙ දෙසෙසිං. යාවකීවඤ්ච බ්‍රාහ්මණ ඉමෙ සත්ත අපරිහානියා ධම්මා වජ්ජීසු ඨස්සන්ති, ඉමෙසු ච සත්තසු අපරිහානියෙසු ධම්මෙසු වජ්ජී සන්දිස්සිස්සන්ති, වුද්ධියෙව බ්‍රාහ්මණ වජ්ජීනං පාටිකඞ්ඛා, නො පරිහානී"ති.

[ඉති වජ්ජීනං සත්ත අ පරිහානියා ධම්මා.]

6. එවං වුත්තෙ වස්සකාරෝ බ්‍රාහ්මණෝ මගධමහාමත්තෝ භගවන්තං එතදවොච: එකමෙකෙනාපි භො ගොතම අපරිහානියෙන ධම්මෙන සමන්නාගතානං වජ්ජීනං වුද්ධියෙව පාටිකඞ්ඛා නො පටිහානි, කො පන වාදෙ සත්තහි අපරිහානියෙහි ධම්මෙහි, අකරණීයා'ව, භො ගොතම වජ්ජී රාජූසු මාගධෙන අජාතසත්තුනා වෙදෙහිපුත්තෙන යදිදං යුද්ධස්ස, අඤ්ඤත්‍ර උපලාපනාය අඤ්ඤත්‍ර මිත්තභෙදා[2].

"හන්ද ච'දානි මයං භො ගොතම ගච්ඡාම, බහුකිච්චා මයං බහුකරණීයා"'ති.

"යස්ස'දානි තුම්හෙ බ්‍රාහ්මණ කාලං මඤ්ඤථ"'ති.

1. ඵාසු විහරෙය්යුං, – ම ජ සං. 2. මිත්තභෙදා, – ම ජ සං.

Free Distribution www.aathaapi.org

''අනඳයෙනි, නුවර ඇතුළතත් බැහැරත් වැදෑ රජුන්ගේ යම් වැදෑ දෙවොල් කෙනෙක් වෙත් නම්, එයට වැදෑ රජුනු යම් කෙනෙක් සත්කාර බහුමාන පූජා කරන්නාහු නම්, එයට දුන් විරූ දැහැමි බලි නො පිරිහෙලන්නාහු නම්, ඒ කෙනෙක් ම වැඳුවනට වැඩීම ම ඇවෙක්සිය යුතු. පිරිහීම නො ඇවෙක්සිය යුතු'' (6)

''අනඳයෙනි, 'කෙසේ නම් සිය රටට නොඇා රහත්හු එන්නාහු ද, ඇා රහත්හුත් සිය රටෙහි පහසුවෙන් වසන්නාහු ද' යි වැදෑ රජුන් විසින් රහතුන් කෙරෙහි (මහණ බමුණන් කෙරෙහි) දැහැමි රකවළ මොනොවට පිහිටුවන ලද යැයි කොප විසින් මෙය අසන ලද ද?''

''වහන්ස, 'කෙසේ නම් සිය රටට නොඇා රහත්හු එන්නාහු ද, ඇා රහත්හුත් සිය රටෙහි පහසු සේ වසන්නාහු ද' යි වැදෑ රජුන් විසින් රහතුන් කෙරෙහි (මහණ බමුණන් කෙරෙහි) දැහැමි රකවළ මොනොවට පිහිටුවන ලදුයේ යැයි මෙය මං විසින් අසන ලදි.''

''අනඳයෙනි, යම් කෙක් සිය රටට නොඇා රහත්හු 'කෙසේ නම් එන්නාහු ද යි, ඇා රහත්හු කෙසේ නම් පහසු සේ වසන්නාහු ද' යි, වැදෑ රජුන් විසින් රහතුන් කෙරෙහි දැහැමි රකවළ මොනොවට පිහිටුවන ලද්දේ වන්නේ ද, අනඳයෙනි, ඒ කෙක් ම වැඳුවනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ඇවෙක්සිය යුතු.'' (7)

5. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මගද මහමැති වස්සකාර බමුණා අමතා, ''බමුණ, එක් සමයෙක මම විසල්පුර සාරන්දද චෛත්‍ය විහාරයෙහි වීසීමි. එහිදී මම වැදෑ රජුනට මේ අපරිහානිය දහම් සත දෙසීමි. බමුණ, යම්කෙක් කල් මේ සත් අපරිහානිය දහම්හු වැඳුවන් කෙරෙහි සිටින්නාහු ද, වැදුවෝ මේ සත් අපරිහානිය දහම්හි (සිටියාහු) දක්නා ලැබෙත් ද, බමුණ, ඒ කෙක් ම වැඳුවනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු' යැ යි (මෙයින් වජ්ජීන්ගේ විනාශය කල් යන බව දැන) වදළ සේක.

1. මේ වජ්ජීන් පිළිබඳ අපරිහානිය දහම් සතය

6. ''මෙසේ (වජ්ජීන් කෙරෙහි අනුකම්පාවෙන්) වදළ කලැ (මෙයින් වජ්ජිනාසයට ක්‍රමයක් සිතාගත්) මගද මහමැති වස්සකාර බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේට ''භවද් ගෞතමයෙනි, මේ එක් එක් අපරිහානිය දහමෙකිනුදු යුත් වූ වැඳුවනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු. අපරිහානිය දහම් සතෙකින් යුත් වූ කලැ කියනුම කවර යැ. භවද් ගෞතමයෙනි, වෛදෙහිපුත්‍ර මගධාධිපති අජාසත් රජුනු විසින් වැදෑරජුනු යිත්ගැන්මෙන් හෝ උත්තුන් බිඳුවාලීමෙන් හෝ විනා යුද්ධයෙකින් වූ කලී ගත නො හැක්කාහු ම ය.

භවද් ගෞතමයෙනි, දත් අපි යම්හ. අපි බොහෝ කෘත්‍ය ඇත්තම්හ' යි කී ය.

''බමුණ, යම් ගමනකට සිතහි නම්, මේ එයට කලැ'' යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

Free Distribution www.aathaapi.org

අථ ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමි.

7. අථ ඛො භගවා අචිරපක්කන්තෙ වස්සකාරෙ බ්‍රාහ්මණෙ මගධමහාමත්තෙ ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ''ගච්ඡ ත්වං ආනන්ද, යාවතිකා භික්ඛු රාජගහං උපනිස්සාය විහරන්ති, තෙ සබ්බෙ උපට්ඨාන-සාලායං සන්තිපාතෙහි''ති.

'එවං භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා යාවතිකා භික්ඛු රාජගහං උපනිස්සාය විහරන්ති, තෙ සබ්බෙ උපට්ඨානසාලායං සන්තිපාතෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: ''සන්නිපාතිතො[1] භන්තෙ භික්ඛුසඞ්ඝො. යස්ස'දානි භන්තෙ භගවා කාලං මඤ්ඤතී''ති.

[1. භික්ඛුනං සත්ත අපරිහානියා ධම්මා:]

8. අථ ඛො භගවා උට්ඨායාසනා යෙන උපට්ඨානසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛු ආමන්තෙසි ''සත්ත වො භික්ඛවෙ අපරිහානියෙ ධම්මෙ දෙසෙස්සාමි. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමි''ති. 'එවං භන්තෙ'ති ඛො තෙ භික්ඛු භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

''යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛු අභිණ්හසන්නිපාතා සන්නිපාතබහුලා භවිස්සන්ති, වුද්ධියෙව භික්ඛුනං පාටිකඞ්ඛා නො පරිහානි. (1)

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛු සමග්ගා සන්නිපතිස්සන්ති සමග්ගා වුට්ඨහිස්සන්ති සමග්ගා සඞ්ඝකරණීයානි කරිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛුනං පාටිකඞ්ඛා නො පරිහානි. (2)

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛු අපඤ්ඤත්තං න පඤ්ඤපෙස්සන්ති[2], පඤ්ඤත්තං න සමුච්ඡින්දිස්සන්ති, යථාපඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදය වත්තිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛුනං පාටිකඞ්ඛා නො පරිහානි. (3)

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛු ථෙරා රත්තඤ්ඤූ චිර-පබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිනායකා[3], තෙ සක්කරිස්සන්ති ගරු-කරිස්සන්ති[4] මානෙස්සන්ති පූජෙස්සන්ති, තෙසඤ්ච සොතබ්බං මඤ්ඤිස්සන්ති, වුද්ධියෙව භික්ඛ භික්ඛුනං පාටිකඞ්ඛා නො පරිහානි. (4)

---

1. සන්නිපාතිතො, සීමු.
2. පඤ්ඤාපෙස්සන්ති, ෆෘ
3. සඞ්ඝපරිණායකා, මජ්ඣං
4. ගරුං කරිස්සන්ති, මජ්ඣං

Free Distribution www.aathaapi.org

ඉක්බිත්තෙන් මගද මහමැති වස්සකාර බමුණු භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගෙන (සිතින් නොව වචනයෙන්) අනුමෝදන් ව ඝුනස්නෙන් නැගී ඉක්මැ ගියේ ය.

7. මගද මහමැති වස්සකාර බමුණා ඉක්මැ ගිය නොබෝ වේලායෙහි භාග්‍යවතුන් වහන්සේ අනඳතෙරුන් බණවා, ''අනඳයෙනි, තෙපි යවු. යම් පමණ මහණහු රජගහ නුවර නිසා වෙසෙත් නම්, ඒ හැම උවටන්-හලට එක්රැස් කරවු''යැ යි වදළ සේක.

'එසේ ය, වහන්සැ' යි අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී රජගහනුවර ඉසා වසන තාක් සියලු මහණුන් උවටන්හලැ රැස් කොට භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹැ වැඳැ පසෙක සිටියහ. පසෙක සිටියා වූ අනඳ තෙරණුවෝ ''වහන්ස, යමකට භාග්‍ය-වතුන් වහන්සේ දැන් කලැයි සිතන සේක් නම්, දැන් ඒ භික්ෂුසඞ්ඝසන්නි-පාතය කරන ලදැ'' යි සැළ කළහ.

8. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ ඝුනස්නෙන් නැගී උවටන්හල කරා එළැඹි සේක. එළැඹ පණවන ලද අස්නැ වැඩහුන් සේක. වැඩහිඳ භික්ෂූන් අමතා 'මහණෙනි, තොපට සත් අපරිහානි දහම් දෙසන්නෙමි. එය අසවු, මොනොවට සිත්හි දරවු, කියන්නෙමි'යි වදළ සේක. 'එසේ ය, වහන්සැ' යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍ය-වතුන් වහන්සේ මෙය වදළ සේක:

''මහණෙනි, යමතාක් මහණහු එක්වන් රැස්වන්නාහු, රැස්වීම බහුල කොටැත්තෝ වන්නාහු ද, මහණෙනි, ඒ තාක් මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු. (1)

මහණෙනි, යමතාක් මහණහු සමග වැ රැස් වන්නාහු ද, සමග වැ නැගී සිටින්නාහු ද, සමග ව සංඝකාර්ය කරන්නාහු ද, මහණෙනි, ඒ තාක් මහණුනට වැඩීම ම ඇවෙක්සියැ යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු. (2)

මහණෙනි, යමතාක් මහණහු නොපැනැවුණක් නො පනවන්නාහු ද, පැනැවුණු දෑ නො සිඳින්නාහු ද, පැනැවූ තාක් සිකපද සමාදන් ව ගෙන පවත්නාහු ද, ඒතාක් මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නොම ඇවෙක්සිය යුතු. (3)

මහණෙනි, චිරරාත්‍රඥ වූ, පැවිදි වූ බොහෝ කල් ඇති, සඞ්ඝපිතෘ වූ, සඞ්ඝපරිනායක වූ යම් තෙරහු වෙත් ද, ඔවුනට මහණහු යමතාක් සත්කාර කරන්නාහු ද, ගරුකාර කරන්නාහු ද, බුහුමන් කරන්නාහු ද, ඔවුන් පුදන්-නාහු ද, ඔවුන් බස ඇසියැ යුතු කොට සිතන්නාහු ද, මහණෙනි, ඒතාක් මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු. (4)

Free Distribution www.aathaapi.org

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛු උපජ්ඣායෙ තණ්හාය පොනොභවිකාය න වසං ගච්ඡන්තී, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. (5)

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛු ආරඤ්ඤකෙසු සෙනාසනෙසු සාපෙක්ඛා භවිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. (6)

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛු පච්චත්තඤ්ඤවව සතිං උපට්ඨාපෙස්සන්ති[1], 'කිත්තී අනාගතා ච පෙසලා සබ්‍රහ්මචාරී ආගච්ඡෙය්යුං, ආගතා ච පෙසලා සබ්‍රහ්මචාරී ඵාසුං විහරෙය්යුන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. (7)

යාවකීවඤ්ච භික්ඛවෙ ඉමෙ සත්ත අපරිහානියා ධම්මා භික්ඛූසු ඨස්සන්ති, ඉමෙසු ච සත්තසු අපරිහානියෙසු ධම්මෙසු භික්ඛූ සන්දිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

[2. අපරෙපි භික්ඛූනං සත්තඅපරිහානියා ධම්මා:]

19. අපරෙ පි වො භික්ඛවෙ සත්ත අපරිහානියෙ ධම්මෙ දෙසෙස්සාමි. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛු භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛු න කම්මාරාමා භවිස්සන්ති න කම්මරතා න කම්මාරාමතං අනුයුත්තා, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. (1)

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛු න භස්සාරාමා භවිස්සන්ති න භස්සරතා න භස්සාරාමතං අනුයුත්තා, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. (2)

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛු න නිද්දාරාමා භවිස්සන්ති න නිද්දරතා න නිද්දාරාමතං අනුයුත්තා, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. (3)

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛු න සඞ්ගණිකාරාමා භවිස්සන්ති න සඞ්ගණිකාරතා න සඞ්ගණිකාරාමතං අනුයුත්තා, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. (4)

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛු න පාපිච්ඡා භවිස්සන්ති න පාපිකානං ඉච්ඡානං වසං ගතා, වුද්ධියෙව භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. (5)

---

1. උපට්ඨාපෙස්සන්ති, ???

Free Distribution www.aathaapi.org

මහණෙනි, යම්තාක් කල් මහණහු පුනර්භවය පිණිස පවත්නා, තමන් කෙරෙහි උපන් තෘෂ්ණාවගේ වශයට නො යෙත් ද, මහණෙනි, ඒ තාක් මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු. (5)

මහණෙනි, මහණහු යම් තාක් වන සෙනසුන්හි අපේක්ෂාසහිත වන්නාහු ද, ඒ තාක් මහණුනට වැඩීම ම ඇවෙක්සියැ යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු. (6)

මහණෙනි, යම්තාක් මහණහු 'කෙසේ නම් (තමන් සෙනස්නට) නොඇ ප්‍රියශීල සබ්‍රහ්මසරුහු එන්නාහු ද, ඇ ප්‍රියශීල සබ්‍රහ්මසරුහු සැප සේ වසන්නාහු ද' යි තමන් තමන් කෙරෙහි ම සිහිය එළවා තබන්නාහු ද, මහණෙනි, ඒ තාක් මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ඇවෙක්සිය යුතු. (7)

මහණෙනි, යම් තාක් මේ සත් අපරිහානිය ධර්මයෝ මහණුන් කෙරෙහි සිටින්නාහු ද, මහණහු මේ අපරිහානිය ධර්ම සතෙහි දක්නා ලැබෙන්නාහු ද, මහණෙනි, ඒ තාක් මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම, ඇවෙක්සිය යුතු.

2. අනෙකුදු අපරිහානිය දහම් සතක්

9. මහණෙනි, තොපට අත් අපරිහානිය දහම් සතක් දෙසන්නෙමි. එය අසවු, මොනොවට මෙනෙහි කරවු, කියන්නෙමි යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. 'එසේ ය, වහන්ස' යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:

මහණෙනි, මහණහු යම්තාක් කර්මාරාම (උද්දේසාදිය හැර සිවුරු කිරීම ආදි කටයුත්තෙහි පමණක් ම යෙදුණේ) නො වන්නාහු ද, මහණෙනි, ඒ තාක් මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ඇවෙක්සිය යුතු. (1)

මහණෙනි, යම් තාක් මහණහු භස්සාරාම (ස්ත්‍රීපුරුෂවර්ණනාදිකථා-යෙහි, කෙළිකවට බස්හි යෙදුණේ) නොවන්නාහු ද, භස්සරත නො වනනාහු ද, මහණෙනි, ඒ තාක් මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු. (2)

මහණෙනි, යම් තාක් මහණහු නිද්දාරාම (නින්දෙහි බෙහෙවින් යෙදුණේ) නො වන්නාහු ද, නිද්දාරත නො වන්නාහු ද, නිද්දාරාමතායෙහි යෙදුණේ නො වන්නාහු ද, මහණෙනි, ඒ තාක් මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු. පිරිහීම නො ඇවෙක්සිය යුතු. (3)

මහණෙනි, යම් තාක් මහණහු ගණසඞ්ගණිකාරාම (බොහෝ දෙනා හා එක් වැ විසීමෙ යෙදුණේ) නො වෙත් ද, ගණසඞ්ගණිකායෙහි ඇලුණේ නො වෙත් ද, ගණසඞ්ගණිකාරාම බවහි යෙදුණේ නො වෙත් ද, මහණෙනි, ඒ තාක් මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු පිරිහීම නො ම ඇවෙක්සිය යුතු. (4)

මහණෙනි, යම් තාක් මහණහු පාපිච්ඡ (ලාමක ඊච්ඡා ඇත්තේ) නො වන්නාහු ද, ලාමක ඊච්ඡාවනට වසඟ නො වන්නාහු ද, මහණෙනි, ඒ තාක් මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු. (5)

Free Distribution www.aathaapi.org

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ න පාපමිත්තා භවිස්සන්ති න පාපසහායා න පාපසම්පවඞ්කා, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. (6)

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛු න ඔරමත්තකෙන විසෙසාධිගමෙන අන්තරා වොසානං ආපජ්ජිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි. (7)

යාවකීවඤ්ච භික්ඛවෙ ඉමෙ සත්ත අපරිහානියා ධම්මා භික්ඛුසු ඨස්සන්ති, ඉමෙසු ච සත්තසු අපරිහානියෙසු ධම්මෙසු භික්ඛු සන්දිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

3. අපරෙපි සත්ත අපරිහානියා ධම්මා

10. අපරෙ පි වො භික්ඛවෙ සත්ත අපරිහානියෙ ධම්මෙ දෙසෙස්සාමි. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමී ති. 'එවං භන්තෙ'ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ සද්ධා භවිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි. යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ හිරිමන භවිස්සන්ති, -පෙ- ඔත්තප්පි භවිස්සන්ති, -පෙ- බහුස්සුතා භවිස්සන්ති, -පෙ- ආරද්ධවිරියා භවිස්සන්ති, -පෙ- උපට්ඨිතසති භවිස්සන්ති, -පෙ- පඤ්ඤවන්තො භවිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.

යාවකීවඤ්ච භික්ඛවෙ ඉමෙ සත්ත අපරිහානියා ධම්මා භික්ඛුසු ඨස්සන්ති, ඉමෙසු සත්තසු අපරිහානියෙසු ධම්මෙසු භික්ඛු සන්දිස්සන්ති, වුද්ධියෙව භිකඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.

4. අපරෙ පි සත්ත අපරිහානියා ධම්මා

11. අපරෙ පි වො භික්ඛවෙ සත්ත අපරිහානියෙ ධම්මෙ දෙසෙස්සාමි. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමී ති. 'එවං භන්තෙ'ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ සතිසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති -පෙ- ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති, -පෙ- විරියසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති, -පෙ- පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති, -පෙ- පස්සද්ධි-සම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති, -පෙ- සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

Free Distribution www.aathaapi.org

මහණෙනි, යම් තාක් මහණහු පාපමිත්‍රයන් ඇත්තෝ නො වන්නාහු ද, පාප සහායයන් ඇත්තෝ නො වන්නාහු ද, පාපයනට නැමුණෝ නො වන්නාහු ද, මහණෙනි, ඒ තාක් මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු. (6)

මහණෙනි, මහණහු යම් තාක් අල්පමාත්‍ර වූ විශෙෂාධිගමයෙන් (රහත්බවට නො පැමිණ) අතර නිමියාවූ කෘත්‍ය ඇති බවට (ධ්‍යානාදි අල්පමාත්‍රලාභයෙන් තෘප්තියට) නො පැමිණෙත්නාහු ද, මහණෙනි, ඒතාක් මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු. (7)

මහණෙනි, යම් තාක් මේ සත් අපරිහානිය ධර්මයෝ මහණුන් කෙරෙහි සිටුනාහු ද, මේ සත් අපරිහානිය ධර්මයන්හි මහණහු දක්නා ලැබෙන්නාහු ද, මහණෙනි, ඒ තාක් මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු. පිරිහීම නොම ඇවෙක්සිය යුතු.

3. අනෙකූදු අපරිහානිය දහම් සතක්

10. මහණෙනි, තොපට අන් අපරිහානිය ධර්ම සතක් ද දෙසන්නෙමි. එය අසවු, මොනොවට මෙනෙහි කරවු, කියන්නෙමි යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. 'එසේ ය, වහන්සැ' යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:

මහණෙනි, යම්තාක් මහණහු සැදහැ ඇත්තෝ වන්නාහු ද, මහණෙනි, ඒතාක් ම මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු. පිරිහීම නො ම ඇවෙක්සිය යුතු. මහණෙනි, යම්තාක් මහණහු පවට පිළිකුල් සිතැතියෝ වන්නාහු ද... පවට බිය ඇත්තෝ වන්නාහු ද ... බොහෝ ඇසු පිරූ තැන් ඇතියෝ වන්නාහු ද, ... ඇරඹූ වැර ඇතියෝ වන්නාහු ද ... එළැඹි සිටි සිහි ඇතියෝ වන්නාහු ද ... ප්‍රඥා ඇතියෝ වන්නාහු ද, මහණෙනි, ඒතාක් මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ඇවෙක්සිය යුතු.

මහණෙනි යම්තෑක් මෙ කී සත් අපරිහානිය ධර්මයෝ මහණුන් කෙරෙහි සිටුනාහු ද, මහණහු මේ සත් අපරිහානිය ධර්ම කෙරෙහි දක්නා ලැබෙන්නාහු ද, මහණෙනි, මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු.

4. අනෙකූදු අපරිහානිය දහම් සතක්

11. මහණෙනි, තොපට අන් අපරිහානිය දහම් සතක් ද දෙසන්නෙමි. එය අසවු, මොනොවට මෙනෙහි කරවු, කියන්නෙමි යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. 'එසේ ය, වහන්සැ' යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:

මහණෙනි, යම්තාක් මහණහු සතිසම්බොජ්ඣඞ්ගය වඩන්නාහු ද ... ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය වඩන්නාහු ද,...විරියසම්බොජ්ඣඞ්ගය වඩන්නාහු ද,... පීතිසම්බොජ්ඣඞ්ගය වඩන්නාහු ද,... පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය වඩන්නාහු ද ... සමාධිසම්බොජ්ඣඞ්ගය වඩන්නාහු ද,... උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩන්නාහු ද, මහණෙනි, ඒතාක් මහණුන් ඩිඟින් වැඩීම ම ඇවෙක්ස්ය යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු.

Free Distribution www.aathaapi.org

යාවකීවඤ්ච භික්ඛවෙ ඉමෙ සත්ත අපරිහානියා ධම්මා භික්ඛූසු ඨස්සන්ති, ඉමෙසු ච අපරිහානියෙසු ධම්මෙසු භික්ඛූ සන්දිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.

[5. අපරෙ පි සත්ත අපරිහානියා ධම්මා:]

12. අපරෙ පි වො භික්ඛවෙ සත්ත අපරිහානියෙ ධම්මෙ දෙසෙස්සාමි. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමී ති. 'එවං භන්තෙ'ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ අනිච්චසඤ්ඤං භාවෙස්සන්ති –පෙ– අනත්තසඤ්ඤං භාවෙස්සන්ති –පෙ– අසුභසඤ්ඤං භාවෙස්සන්ති –පෙ– ආදීනවසඤ්ඤං භාවෙස්සන්ති –පෙ– පහානසඤ්ඤං භාවෙස්සන්ති –පෙ– විරාගසඤ්ඤං භාවෙස්සන්ති –පෙ– නිරොධසඤ්ඤං භාවෙස්සන්ති, වුද්ධියෙව භික්ඛූවෙ භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි:

යාවකීවඤ්ච භික්ඛවෙ ඉමෙ සත්ත අපරිහානියා ධම්මා භික්ඛූසු ඨස්සන්ති, ඉමෙසු ච සත්තසු අපරිහානියෙසු ධම්මෙසු භික්ඛූ සන්දිස්සන්ති වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි.

[6. අපරෙ ඡ අපරිහානියා ධම්මා:]

13. අපරෙ භික්ඛවෙ ඡ අපරිහානියෙ ධම්මෙ දෙසෙස්සාමි. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමී'ති. 'එවං භන්තෙ'ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ මෙත්තං කායකම්මං පච්චුපට්ඨාපෙස්සන්ති සබ්‍රහ්මචාරීසු ආවී චෙව රහො ච, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි. (1)

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ මෙත්තං වචීකම්මං පච්චුපට්ඨාපෙස්සන්ති සබ්‍රහ්මචාරීසු –පෙ– මෙත්තං මනොකම්මං පච්චුපට්ඨාපෙස්සන්ති සබ්‍රහ්මචාරීසු ආවී චෙව රහො ච, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි. (2-3)

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ යෙ තෙ ලාභා ධම්මිකා ධම්මලද්ධා අන්තමසො පත්තපරියාපන්නමත්තම්පි, තථාරූපෙහි ලාභෙහි අප්පටිවිභත්ත-භොගී[1] භවිස්සන්ති සීලවන්තෙහි සබ්‍රහ්මචාරීහි සාධාරණභොගී, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි. (4)

1. න අප්පටිවිභත්තභොගී, සබ්බ.

Free Distribution www.aathaapi.org

මහණෙනි, යම්තාක් මේ සත් අපරිහානීය ධර්මයෝ මහණුන් කෙරෙහි සිටුනාහු ද, මහණහු මේ සත් අපරිහානීය ධර්මයන්හි දක්නා ලැබෙත්නාහු ද, මහණෙනි, ඒතාක් මහණුන් වීසින් වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීමක් නො ම ඇවෙක්සිය යුතු.''

5. අනෙකූදු අපරිහානීය සතක්

12. මහණෙනි, තෙපට අන් අපරිහානීය දහම් සතක් ද දෙසන්නෙමි. එය අසවු, මොනොවට මෙනෙහි කරවු, කියන්නෙමි යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. 'එසේ ය, වහන්සැ' යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:

මහණෙනි, මහණහු යම්තාක් අනිත්‍යසංඥාව වඩන්නාහු ද ... අනාත්මසංඥාව වඩන්නාහු ද ... අශුභසංඥාව වඩන්නාහු ද ... ආදීනව සංඥාව වඩන්නාහු ද ... ප්‍රහාණසංඥාව වඩන්නාහු ද ... විරාගසංඥාව වඩන්නාහු ද ... නිරෝධසංඥාව වඩන්නාහු ද, මහණෙනි, ඒ තාක් මහණුනට වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු.

මහණෙනි, යම්තාක් මේ සත් අපරිහානීය ධර්මයෝ මහණුන් කෙරෙහි සිටුනාහු ද, මහණහු මේ සත් අපරිහානීය ධර්මයන්හි දක්නා ලැබෙන්නාහු ද, මහණෙනි, ඒතාක් මහණුන් විසින් වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු.

6. අනෙක් අපරිහානීය දහම් සයක්

13. මහණෙනි, අන් අපරිහානීය ධර්ම සයක් දෙසන්නෙමි. එය අසවු, මොනොවට මෙනෙහි කරවු, කියන්නෙමි යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. 'එසේ ය, වහන්සැ' යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:

මහණෙනි, මහණහු යම්තාක් සබ්‍රහ්මචාරීන් කෙරෙහි හමුයෙහිත් නොහමුයෙහිත් මෛත්‍රීමය කායකර්මය එළවා තබන්නාහු ද, මහණෙනි, ඒ තාක් මහණුන් විසින වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු. (1)

මහණෙනි, යම්තාක් මහණහු සබ්‍රහ්මචාරීන් කෙරෙහි හමුයෙහිත් නොහමුයෙහිත් මෛත්‍රීමය වාක්කර්මය එළවා තබන්නාහු ද ... සබ්‍රහ්මචාරීන් කෙරෙහි හමුයෙහිත් නොහමුයෙහිත් මෛත්‍රීමය මනඃකර්මය එළවා තබන්නාහු ද, මහණෙනි, ඒතාක් මහණුන් විසින් වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු. (2-3)

මහණෙනි, යම්තාක් යටත්පිරිසෙයින් පාත්‍රයෙහි ඇතුළත් ආහාරමාත්‍ර වූ දෑ යැ යි දැහැමි වූ දැහැමෙන් ලත් යම් ලාභ කෙනෙක් වෙත් නම්, එබඳු ලාභයන් බෙදා නොදී නො වළඳන්නෝ සිල්වත් සබ්‍රහ්මචාරීන් හා සාධාරණභොගී වන්නාහු ද, මහණෙනි, ඒතාක් මහණුන් විසින් වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ඇවෙක්සිය යුතු. (4)

Free Distribution www.aathaapi.org

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ යානි තානි සිලානි අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤූපපසත්ථානි[1] අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි, තථාරූපෙසු සීලෙසු සීලසාමඤ්ඤගතා විහරිස්සන්ති සබ්‍රහ්මචාරීහි ආවී චෙව රහො ච, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි, (5)

යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූනං යායං දිට්ඨි අරියා නියාණිකා නියාති තක්කරස්ස සම්මාදුක්ඛක්ඛයාය, තථාරූපාය දිට්ඨියා දිට්ඨිසාමඤ්ඤගතා විහරිස්සන්ති සබ්‍රහ්මචාරීහි ආවී චෙව රහො ච භික්ඛවෙ වුද්ධියෙව භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි. (6)

යාවකීවඤ්ච භික්ඛවෙ ඉමෙ ඡ අපරිහානියා ධම්මා භික්ඛූසු ඨස්සන්ති, ඉමෙසු ච ඡසු අපරිහානියෙසු ධම්මෙසු භික්ඛූ සන්දිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි කි.

[භික්ඛූනං ධම්මිකථා:]

14. තත්‍ර සුදං භගවා රාජගහෙ විහරන්තො ගිජ්ඣකූටෙ පබ්බතෙ එතදෙව බහුලං භික්ඛූනං ධම්මිං කථං කරොති: ''ඉති සීලං, ඉති සමාධි, ඉති පඤ්ඤා. සීලපරිභාවිතො සමාධි මහප්ඵලො හොති මහානිසංසො. සමාධිපරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති මහානිසංසා. පඤ්ඤාපරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති, සෙය්‍යථිදං[2]: කාමාසවා භවාසවා අවිජ්ජාසවා''ති.

15. අථ බො භගවා රාජගහෙ යථාභිරන්තං විහරිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ආයාමානන්ද යෙන අම්බලට්ඨිකා තෙනුපසඞ්කමිස්සාමාති. 'එවං භන්තෙ'ති බො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ බො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන අම්බලට්ඨිකා තදවසරි තත්‍ර සුදං භගවා අම්බලට්ඨිකායං විහරති රාජාගාරකෙ. තත්‍රපි සුදං[4] භගවා අම්බලට්ඨිකායං විහරන්තො රාජාගාරකෙ එතදෙව බහුලං භික්ඛූනං ධම්මිං කථං කරොති: ''ඉති සීලං, ඉති සමාධි, ඉති පඤ්ඤා සීලපරිභාවිතො සමාධි මහප්ඵලො හොති මහානිසංසො. සමාධිපරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති මහානිසංසා. පඤ්ඤාපරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති, සෙය්‍යථිදං: කාමාසවා භවාසවා අවිජ්ජාසවා''ති.

---

1. විඤ්ඤූපසත්ථානි, ම ස්‍ය සං.
2. සෙය්‍යථිදං, මස්‍යං,
3. භවාසවා දිට්ඨාසවා, සීමු.
4. තත්‍රාපි සුදං, මස්‍යං

Free Distribution www.aathaapi.org

මහණෙනි, නොකඩ වූ නොසිදුරු වූ, සබල නොවූ, නොකැලැල් වූ තෘෂ්ණාදාසත්වයෙන් මිදුණාවූ, පැණවතුන් විසින් පසස්නා ලද්දවූ, තෘෂ්ණා-දෘෂ්ටීන් අපරාමෘෂ්ට වූ සමාධිය පිණිස පවත්නා වූ යම් සිල් කෙනෙක් වෙත් ද, එබඳු ශීලයන්හි සබ්‍රහ්මචාරීන් හා හමුයෙහිත් නොහමුයෙහිත් යම්තාක් ශීලසාමාන්‍යගත වැ (ශීලයෙන් සමාන බවට පැමිණ) වාස කරන්නාහු ද, මහණෙනි, ඒ තාක් මහණුන් විසින් වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු. (5)

මහණෙනි, ආර්ය වූ (නිදෙස් වූ) නෛර්‍යාණික වූ යම් සම්‍යග්දෘෂ්ටි-යෙක් වේ ද, යමෙක් තථාකාරී වූවහුගේ සියලු දුක් නැසීමට යේ ද, මහණහු යම්තාක් එසේ වූ දෘෂ්ටියෙන් සබ්‍රහ්මචාරීන් හා හමුයේත් නො හමුයේත් දෘෂ්ටිසාමාන්‍යගත වැ (සම්දිටුයෙන් සමාන බවට පැමිණ) වසන්නාහු ද, මහණෙනි, ඒතාක් මහණුන් විසින් වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම ඇවෙක්සිය යුතු. (6)

මහණෙනි, යම්තාක් මේ අපරිහාණිය ධර්ම සඳෙහ මහණුන් කෙරෙහි සිටුනාහු ද, මහණහු මේ අපරිහාණිය ධර්ම සයෙහි දක්නා ලැබෙන්නාහු ද, ඒ තාක් මහණුන් විසින් වැඩීම ම ඇවෙක්සිය යුතු, පිරිහීම නො ම ඇවෙක්-සිය යුතු.

භික්ෂූනට දෙසූ දහැමි කථා:

14. භාග්‍යවතුන් වහන්සේ එහි රජගහ නුවර ගිජුකුළු පව්වෙහී වැඩවසන සේක් ''සිල් මෙබඳු ය, සමාධිය මෙබඳු ය, ප්‍රඥාව මෙබඳු ය. ශීලයෙන් වඩන ලද සමාධිය මහත්පල ඇත්තේ මහත් අනුසස් ඇත්තේ වේ. සමාධියෙන් වඩන ලද ප්‍රඥාව මහත් පල ඇති වේ. මහත් අනුසස් ඇති වේ. ප්‍රඥායෙන් වඩන ලද සිත කාමාස්‍රව භවාස්‍රව අවිද්‍යාස්‍රව යන ආස්‍රව කෙරෙන් මොනොවට මිදේ'' යැ යි ශීලසමාධි ආදි වූ මේ දහැමි කතාව ම බහුල කොට වදරන සේක.

15. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ කැමැති තාක් කල් රජගහ නුවර වැස, අනඳ තෙරුන් අමතා ''අනඳයෙනි, යම්හ, අඹයැටිඳයන කරා එළැඹෙන්නමහ'' යි වදළ සේක. 'එසේ ය, වහන්සැ' යි කියා අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහත් මහණමුළුවක් හා අඹයැටිඳයන වෙත එළැඹි සේක. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ අඹයැටි වෙනෙහි රාජාගාරයෙහි වැඩ වසන සේක් - ''ශීලය මෙසේ ය, සමාධිය මෙසේ ය, ප්‍රඥාව මෙසේ ය. ශීල යෙන් වඩන ලද සමාධිය මහත්පල ඇත්තේ මහත් අනුහස් ඇත්තේ වෙයි. සමාධියෙන් වඩන ලද ප්‍රඥාව මහත්පල ඇත්තේ මහත් අනුහස් ඇත්තේ වෙයි. ප්‍රඥායෙන් පුරුදු කරන ලද චිත්තය කාමාස්‍රව භවාස්‍රව අවිද්‍යාස්‍රව යන ආස්‍රව කෙරෙන් මොනොවට මිදේ'' යැ යි මහණුනට මේ දහැමි කතාව ම බහුල කොට කරන සේක.

Free Distribution www.aathaapi.org

16. අථ ඛො භගවා අම්බලට්ඨිකායං යථාභිරන්තං විහරිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි ආයාමානන්ද, යෙන නාලන්ද තෙනුපසඞ්කමිස්සාමා'ති. 'එවං භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන නාලන්ද තදවසරි. තත්‍ර සුදං භගවා නාලන්දයං විහරති පාවාරිකම්බවනෙ.

[සාරිපුත්ත සීහනාදෙ.]

17. අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: 'එවං පසන්නො අහං භන්තෙ භගවති: න චාහු න ච භවිස්සති න චෙතරහි විජ්ජති අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො භගවතා භියොයා'භික්ඤතරො' යදිදං සම්බොධියන්ති.'' උළාරා ඛො තෙ අයං සාරිපුත්ත ආසභී වාචා[2] භාසිතා, එකංසො ගහිතො, සීහනාදෙ නදිතො: ''එවං පසන්නො අහම්භන්තෙ භගවති: න චාහු න ච භවිස්සති න චෙතරහි විජ්ජති අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා භගවතා භියොයා'භික්ඤතරො යදිදං සම්බොධියන්ති.''

කින්නෙ[3] සාරිපුත්ත යෙ තෙ අහෙසුං. අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, සබ්බෙ තෙ භගවන්තො චෙතසා චෙතො පරිච්ච විදිතා: එවංසීලා තෙ භගවන්තො අහෙසුං ඉතිපි, එවංධම්මා – එවංපඤ්ඤා – එවංවිහාරී – එවං විමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉති පී ති?

''නො හෙතං භන්තෙ''.

කිම්පන තෙ සාරිපුත්ත යෙ තෙ භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, සබ්බෙ තෙ භගවන්තො චෙතසා චෙතො පරිච්ච විදිතා: එවංසීලා තෙ භගවන්තො භවිස්සන්ති ඉතිපි, එවංධම්මා – එවම්පඤ්ඤා – එවංවිහාරී – එවංවිමුත්තා තෙ භගවන්තො භවිස්සන්ති ඉති පී ති?

''නො හෙතං භන්තෙ''.

1. භියොයාභික්ඤතරො, ස්‍යා. 2. ආසභිවාචා, ස්‍යා.
3. කින්නු, ස්‍යා, PTS.

Free Distribution www.aathaapi.org

16. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ අඹයැටියෙහි කැමැති තාක් කල් වැස අනඳතෙරුන් අමතා 'අනඳයෙනි, එවු **නාලන්දව** කරා යමිහ' යි වදළ සේක. 'එසේ ය, වහන්ස' යි අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහත් බික්ෂුසඟන කැටුව නාලන්ද නුවරට වැඩිසේක. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ නාලන්ද නුවර **පාඩාරික** අඹවෙනෙහි වැඩ වසන සේක.

ශාරිපුත්‍ර සිංහනාදය

17. එ කල්හි **සැරියුත්** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක හුන්හ. එක් පසෙක හුන්නාවූ සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, සම්බොධි (රහත්මග නුවණ) නම් වූ යමෙක් ඇද්ද, එයින් භාග්‍යවතුන් වහන්සේට වඩා අභිඥතර වූ (උත්තරිතර ඥානයෙන් යුක්ත වූ) අන් මහණෙක් හෝ බමුණෙක් හෝ ඉකුත් කල්හි නො වී ය. මතුත් නො වන්නේ ය, දැනුදු නැතැ යි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මම මෙසේ ප්‍රසන්නයෙමි" යි සැළ කළහ. එවිට "ශාරිපුත්‍රයෙනි, සම්බොධිඥාන යෙන් භාග්‍යවතුන් වහන්සේට වඩා අභිඥතර වූ අන් මහණෙක් හෝ බමුණෙක් හෝ ඉකුත් කල්හි නො වී ය, මතුත් නො වන්නේ ය, දැනුදු නැතැ යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මම ප්‍රසන්නයෙමි" යි තොප විසින් කියන ලද මේ ශ්‍රේෂ්ඨ වචනය මහත් ම එකෙක. මේහි ලා තොප විසින් එකාන්තය ගන්නා ලද්දේ ය (ප්‍රත්‍යක්ෂඥානයෙන් දැන කිවාක් සේ ඒකාන්ත නිශ්චය කථාවෙක් ම කියන ලද්දේය.) සිංහනාදය පවත්වන ලද්දේ ය.

ශාරිපුත්‍රයෙනි, **කිමෙක්ද**, ඉකුත් කලැ යම් රහත් සම්මාසම්බුදු කෙනෙක් වූහු නම්, ඒ භගවත්හු මෙබඳු සිල් ඇත්තෝ වූහ යි කියා ද, ඒ භගවත්හු මෙබඳු දහම් ඇත්තෝ, මෙබඳු ප්‍රඥා ඇත්තෝ, මෙබඳු විහරණ ඇත්තෝ, මෙබඳු විමුක්ති ඇත්තෝ වූහ යි කියාත් ඔබ සිත් තමන් සිතින් පිරිසිඳ ඒ සියලු භගවත්හු තොප විසින් දන්නා ලද්දහු ද? යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

"වහන්ස, මෙය එසේ නො දන්නා ලද්දේ ම යැ" යි සැරියුත් තෙරණුවෝ වදළහ.

කිමෙක් ද ශාරිපුත්‍රයෙනි, මතු කල්හි යම් රහත් සම්මාසම්බුදු කෙනෙක් වන්නාහු නම්, ඒ භගවත්හු මෙබඳු සිල් ඇත්තෝ වන්නාහ, මෙබඳු දහම් ඇත්තෝ, මෙබඳු ප්‍රඥා ඇත්තෝ, මෙබඳු විහරණ ඇත්තෝ, මෙබඳු විමුක්ති ඇත්තෝ වන්නාහ යි ඔබ සිත් සිය සිතින් පිරිසිඳ ඒ සියලු භගවත්හු තොප විසින් දන්නා ලදහු ද? යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

"වහන්ස, මෙය එසේ නො දන්නා ලදැ"යි සැරියුත් තෙරණුවෝ වදළහ.

Free Distribution www.aathaapi.org

කිම්පන තෙ[1] සාරිපුත්ත අහං එතරහි අරහං සම්මාසම්බුද්ධො චෙතසා චෙතො පරිච්ච විදිතො: එවංසීලො භගවා ඉති පි, එවංධම්මො- එවංපඤ්ඤො- එවංවිහාරී- එවංවිමුත්තො භගවා ඉති පි ති?

''නො හෙතං භන්තෙ''

එත්ථ හි[2] තෙ සාරිපුත්ත අතීතානාගතපච්චුප්පන්නෙසු අරහන්තෙසු සම්මාසම්බුද්ධෙසු චෙතොපරියඤ්ඤාණං[3] නත්ථි. අථ, කිඤ්චරහි තෙ අයං සාරිපුත්ත උළාරා ආසභී වාචා භාසිතා, එකංසො ගහිතො, සීහනාදෙ නදිතො: 'එවං පසන්නො අහං භන්තෙ භගවති න චාහු න ච භවිස්සති න චෙතරහි විජ්ජති අඤ්ඤෙ සමණො වා බ්‍රාහ්මණො වා භගවතා[4] භියො' භිඤ්ඤතරො යදිදං සම්බොධියන්ති?''

18. න ඛො පනෙතං භන්තෙ අතීතානාගතපච්චුප්පන්නෙසු අරහන්තෙසු සම්මාසම්බුද්ධෙසු චෙතොපරියඤ්ඤාණං අත්ථි. අපි ච ඛො මෙ භන්තෙ ධම්මන්වයො විදිතො:

සෙය්‍යථාපි භන්තෙ රඤ්ඤො පච්චන්තිමං නගරං දළ්හුදදපං[5] දළ්හපාකාරතොරණං එකදුවාරං, තත්‍රස්ස දෙවාරිකො පණ්ඩිතො බ්‍යත්තො මෙධාවී අඤ්ඤාතානං[6] නිවාරෙතා ඤ්ඤාතානං පවෙසෙතා, සො තස්ස සාමන්තා[7] අනුපරියායපථං[8] අනුක්කමමානො න පස්සෙය්‍ය පාකාරසන්ධිං වා පාකාරවිවරං වා අන්තමසො බිළාරනිස්සක්කනමත්තම්පි,[9] තස්ස එවමස්ස: යෙ කෙචි ඔළාරිකා පාණා ඉමං නගරං පවිසන්ති වා නික්කමන්ති වා සබ්බෙ තෙ ඉමිනා'ව දුවාරෙන පවිසන්ති වා නික්කමන්ති වා'ති, එවමෙව ඛො මෙ භන්තෙ ධම්මන්වයො විදිතො: යෙ තෙ භන්තෙ අහෙසුං අතීත-මද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, සබ්බෙ තෙ භගවන්තො පඤ්චනිවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ, චතුසු සතිපට්ඨානෙසු සුප්පතිට්ඨිතචිත්තා, සත්තසම්බොජ්ඣඞ්ගෙ[10] යථාභූතං භාවෙත්වා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣි සු, යෙ පි තෙ භන්තෙ භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, සබ්බෙ තෙ භගවන්තො පඤ්චනිවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ, චතුසු සතිපට්ඨානෙසු සුප්පතිට්ඨිතචිත්තා, සත්ත සම්බොජ්ඣඞ්ගෙ යථාභූතං භාවෙත්වා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣිස්සන්ති, භගවා පි භන්තෙ එතරහි අරහං සම්මාසම්බුද්ධො පඤ්ච නිවරණෙ පහාය චෙතසො උපක්කි-ලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ, චතුසු සතිපට්ඨානෙසු සුප්පතිට්ඨිතචිත්තො, සත්තසම්බොජ්ඣඞ්ගෙ යථාභූතං භාවෙත්වා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො'ති,

---

1. කිං පන, ස්‍යා PTS.
2. එත්ථ හි මජ්ඣං.
3. චෙතොපරිඤ්ඤායඤ්ඤාණං, ස්‍යා.
4. භගවතො, ස්‍යා.
5. දළ්හුදධාපං මජ්ඣං දළ්හදවාරං ස්‍යා.
6. අඤ්ඤාතානං, ස්‍යා.
7. සමන්තා, ස්‍යා.
8. අනුවරියායපථං, ස්‍යා
9. බිළාරනික්කමතනමත්තං, සීමු.
10. බොජ්ඣඞ්ගෙ, මජ්ඣං

Free Distribution www.aathaapi.org

ශාරිපුත්‍රයෙනි, කිමෙක් ද, භගවත් තෙමේ මෙබඳු සිල් ඇත්තේ යැයි ද, භගවත් තෙමේ මෙබඳු දහම් ඇත්තේ ය යි, මෙබඳු ප්‍රඥා ඇත්තේ යැ යි, මෙබඳු විහරණ ඇත්තේ යැ යි, මෙබඳු විමුක්ති ඇත්තේ යැ යි ද කියා මා සිත තොප සිතින් පිරිසිඳ, මේ කලැ අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ මම තොප විසින් දන්නා ලදුයෙමි ද? යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

''වහන්ස, මෙය එසේ නො ම දන්නා ලදැ'' යි සැරියුත් තෙරණුවෝ වදළහ.

ශාරිපුත්‍රයෙනි, මේ කරුණෙහි ලා තොපට අයුඅනාවත්මත් යන තෙකලට අයත් වූ රහත් සම්මාසම්බුදුවරුන් විෂයයෙහි චෙතස්පර්යාය-ඥානයෙක් නැත. ශාරිපුත්‍රයෙනි, එසේ කලැ තොප විසින් ''වහන්ස, සම්බොධියෙන් භාග්‍යවතුන් වහන්සේට වඩා අභිඥතර වූ අන් මහණෙක් හෝ බමුණෙක් හෝ ඉකුත් කල්හි නො වී ය, මතු කල්හිත් නො වන්නේ ය, දැනුදු නැතැයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙසේ මම් ප්‍රසන්නයෙමි''යි මේ මහත් අභීත වචනය කවර කරුණෙකින් කියන ලද ද? එකාන්තය ගන්නා ලද ද? සිංහනාදය පවත්වන ලද දැ?'' යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

18. ''වහන්ස, අයුඅනාවත්මන් යන තෙකලට අයත් රහත් සම්මා සම්බුදුවරුන් විෂයයෙහි චෙතස්පර්යාය ඥානයෙක් මට නැත. එතෙකුදු වුවත් ධර්මාන්වයය (සර්වඥතාඥානාදිධර්ම පිළිබඳ අනුබොධ ඥානය) මා විසින් ලබන ලද්දේ ය.

වහන්ස, යම්සේ තර වූ පවුරුපා ඇති, දැඩි වූ පවුරු හා තොරණ ඇති, එක් ම දොරක් ඇති පසල් නුවරෙක් වේ ද, පණ්ඩිත වූ කිමෙහි දිණිමෙහි හුරුබුහුටි වූ, තැනට හිසි නුවණ ඇති, තමා නො දන්නවුන් නුවරට එනු නොදී වළක්වාලන, දන්නවුන් නුවරට පිවිස්වන දෙරොටුපල්ලෙක් වන්නේ ද, හෙ තෙම නුවර පවුරුමඟැ හැව්දුනේ, යටත් පිරිසෙයින් බළලකුට නික්මිය හැකි තරම් වූ ප්‍රාකාරඝන්ධියක් (ගඩොල් බැම්ම ඇද හැලුණු තැනක්) හෝ පවුරු සිදුරු වූ තැනක් හෝ නො දක්නේ ද, ඔහුට 'යම් මහත් සිරුර ඇති සත්ත්ව කෙනෙක් මෙ නුවර වදින් හෝ මෙයින් නික්මෙත් හෝ ඒ සියල්ලෝ ම මේ මහ වහසල්දෙරින් ම පිවිසෙන්නාහු හෝ නික්මෙන්නාහු හෝ වෙති' යි මෙසේ සිතෙක් වන්නේ ද, වහන්ස, එ පරිද්දෙන් ම 'ඉකුත් කල්හි යම් රහත් සම්මාසම්බුදු කෙනෙක් වූහු ද, ඒ සියලු භගවත්හු සිත කෙලෙසුන, ප්‍රඥාව දුබල කරන පස් නීවරණයන් පහ කොට, සතර සීවටන්හි මොනොවට පිහිටි සිත් ඇති ව, සත් සම්බොධ්‍යඞ්ගයන් තත් වූ පරිදි බවා නිරුත්තර සම්‍යක්සම්බොධිය සමධිගත කළහ. වහන්ස, මතු කල්හි යම් රහත් සම්මාසම්බුදු කෙනෙක් වන්නාහු නම්, ඒ සියලු භගවත්හු සිත කෙලෙසුන, ප්‍රඥාව දුබල කරන පංච නීවරණයන් පහ කොට, සතර සීවටන්හි මොනොවට පිහිටි සිතැත්තාහු, සත් සම්බොධඟ තත් වූ පරිදි වඩා, නිරුත්තර සම්‍යක්සම්බොධිය සමධිගත කරන්නාහ. වහන්ස, මේ සමයෙහි රහත් සම්මාසම්බුදු වූ භාග්‍යවතුන් වහන්සේ ද සිත කෙලෙසුන නුවණ දුබල කරන පංච නීවරණයන් පහ කොට, සතර සීවටන්හි මොනොවට පිහිටි සිතැති සේක්, තත් වූ පරිදි සත් සම්බොධඟ වඩා නිරුත්තර සම්‍යක්සම්බොධිය සමධි ගතකළ සේකැ යි මා විසින් ධර්මානුබොධය ලබන ලද්දේ යැ'' යි සැරියුත් තෙරණුවෝ කීහ.

Free Distribution www.aathaapi.org

19. තත්‍ර පි සුදං භගවා නාලන්දයං විහරන්තෝ පාවාරිකම්බවනෙ එතදෙව බහුලං භික්ඛූනං ධම්මිං කථං කරොති: ''ඉති සීලං, ඉති සමාධි, ඉති පඤ්ඤා, සීලපරිභාවිතො සමාධි මහප්ඵලො හොති මහානිසංසො: සමාධිපරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති මහානිසංසා. පඤ්ඤාපරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති සෙය්‍යථීදං: කාමාසවා භවාසවා අවිජ්ජාසවා''ති,

20. අථ ඛො භගවා නාලන්දයං යථාභිරන්තං විහරිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ආයාමානන්ද යෙන පාටලිගාමො තෙනුපසඞ්කමිස්සාමාති. 'එවං භන්තෙති' ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන පාටලිගාමො තදවසරි. අස්සොසුං ඛො පාටලිගාමියා උපාසකා 'භගවා කිර පාටලිගාමං අනුප්පත්තො කි, අථ ඛො පාටලිගාමියා උපාසකා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො පාටලිගාමියා උපාසකා භගවන්තං එතදවොචුං: අධිවාසෙතු නො භන්තෙ භගවා ආවසථාගාරන්ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන,

21. අථ ඛො පාටලිගාමියා උපාසකා භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන ආවසථාගාරං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සබ්බසන්ථරිං ආවසථාගාරං සන්ථරිත්වා ආසනානි පඤ්ඤපෙත්වා උදකමණිකං පතිට්ඨාපෙත්වා තෙලප්පදීපං ආරොපෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො පාටලිගාමියා උපාසකා භගවන්තං එතදවොචුං: සබ්බසන්ථරියන්තකං[1] භන්තෙ ආවසථාගාරං, ආසනානි පඤ්ඤත්තානි, උදකමණිකා පතිට්ඨාපිතො, තෙලප්පදීපො ආරොපිතො. යස්ස'දානි භන්තෙ භගවා කාලං මඤ්ඤතී ති.

22. අථ ඛො භගවා සායණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන ආවසථාගාරං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පාදෙ පක්ඛාලෙත්වා ආවසථාගාරං පවිසිත්වා මජ්ඣිමං ථම්භං නිස්සාය පුරත්ථාභිමුඛො නිසීදි. භික්ඛුසඞ්ඝො පි ඛො පාදෙ පක්ඛාලෙත්වා ආවසථාගාරං පවිසිත්වා පච්ඡිමං භිත්තිං නිස්සාය පුරත්ථාභිමුඛො නිසීදි භගවන්තංයෙව පුරක්ඛත්වා.[2] පාටලිගාමියා පි ඛො උපාසකා පාදෙ පක්ඛාලෙත්වා ආවසථාගාරං පවිසිත්වා පුරත්ථිමං භිත්තිං නිස්සාය පච්ඡිමාභිමුඛා නිසීදිංසු භගවන්තංයෙව පුරක්ඛත්වා[2].

1. සබ්බසන්ථරිතං සන්ථතං. සී්‍ය. සබ්බසන්ථරිං සන්ථතං, ඉති්‍ය. 2. පුරෙක්ඛිත්වා ඉති්‍ය.

Free Distribution www.aathaapi.org

19. එසමයෙහි ද භාග්‍යවතුන් වහන්සේ නාලන්ද නුවර පාවාරික අඹවෙනෙහි වැඩ වසන සේක්, ''ශීලය මෙසේ ය, සමාධිය මෙසේ ය, ප්‍රඥාව මෙසේ ය. ශීලයෙන් වඩන ලද සමාධිය මහත් පල මහත් අනුසස් ඇත්තේ වේ. සමාධියෙන් වඩන ලද ප්‍රඥාව මහත් පල මහත් අනුසස් ඇත්තේ වේ. ප්‍රඥායෙන් වඩන ලද සිත කාමාස්‍රව භවාස්‍රව අවිද්‍යාස්‍රව යන සියලු ආස්‍රව කෙරෙන් මොනොවට මිදේ''යැ යි භික්ෂූනට බෙහෙවින් මේ දැහැමි කතාව ම කරන සේක.

20. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ නාලන්ද නුවරෙහි කැමැති තෙක් කල් වැස අනඳ තෙරුන් අමතා ''අනඳයෙනි, එවු, පළොල්ගමට (පාටලිග්‍රාමයට) යමහ'' යි වදළ සේක. 'එසේ ය, වහන්ස' යි කියා අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහත් බික්සහන හා පළොල්ගමට වැඩි සේක. පළොල්ගම් වැසි උවසුවෝ 'භාග්‍යවතුන් වහන්සේ පළොල්ගම් වැඩි සේක් ල 'යි ඇසූහ. ඉක්බිති පළොල්ගැමි උවසුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක උන්හ. එක් පසෙක උන්නාවූ පළොල්ගැමි උවසුවෝ 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අපගේ ආවාස ගෙය ඉවසා වදරන සේක් වා' යි භාග්‍යවතුන් වහන්සේට මෙ බස් කිහ. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසා වදළ සේක.

21. ඉක්බිති පළොල්ගැමි උවසුවෝ භාග්‍යවතුන් වහන්සේගේ ඉවැසීම දැන සුනස්නෙන් නැගි භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ඒක්මැ ගියහ. ගොස් ආවාස ගෙය හැම බුමුතුරුණු අතුරා, අසුන් පණවා, දියසැළක් තබා, තෙල් පහනක් නංවා, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක සිටියහ. එක් පසෙක සිටියාවූ පළොල්ගැමි උවසුවෝ ''වහන්ස, ආවාසගෙය හැම බුමුතුරුණින් වසන ලද්දේ ය. අසුන් පණවන ලද්දේ ය. දියසැළෙක් තබන ලද්දේය. තෙල් පහනෙක් නැංවිණ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ යම් ගමනකට බලාපොරොත්තු සේක් ද, දැන් එයට කල් වේ'' යැ යි මෙ බස් කිහ.

22. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි හැඳ පෙරෙවූ පෑ සිවුරගෙන බික්සහුන් නා ආවාස ගෙය කරා වැඩි සේක. වැඩ, පා දෙවැ ආවාස ගෙට පිවිසැ මැදුම් ටැඹ නිසා පෙරදිගට මුහුණ ලා වැඩහුන් සේක. බික්සහු ද පා දෙවැ ආවාස ගෙට වැද පැසිම් බිත නිසා පෙරදිගට මුහුණ ලා භාග්‍යවතුන් වහන්සේ ම පෙරටු කොට හිඳගත්හ. පළොල්ගැමී උවසුවෝ ද පා දෙවැ ආවාස ගෙට වැද පෙර දිහැ බිත නිසා පැසිම් දිගට මුහුණ ලා භාග්‍යවතුන් වහන්සේ ම පෙරටු කොට හිඳගත්හ.

Free Distribution www.aathaapi.org

[පාටලිගාමියානං උපාසකානං ඔවාදෙ:]

23. අථ ඛො භගවා පාටලිගාමිෙය උපාසකෙ ආමන්තෙසි. පඤ්චිමෙ ගහපතයො ආදීනවා දුස්සීලස්ස සීලවිපත්තියා. කතමෙ පඤ්ච:

ඉධ ගහපතයො දුස්සීලො සීලවිපන්නො පමාදධිකරණං මහතිං භොගජානිං නිගච්ඡති. අයං පඨමො ආදීනවො දුස්සීලස්ස සීල විපත්තියා.

පුනචපරං ගහපතයො දුස්සීලස්ස සීලවිපත්තස්ස පාපකො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති. අයං දුතියො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

පුනචපරං ගහපතයො දුස්සීලො සීලවිපන්නො යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං, අවිසාරදෙ උපසඞ්කමති මඞ්කුභූතො. අයං තතියො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

පුනචපරං ගහපතයො දුස්සීලො සීලවිපන්නො සම්මූළ්හො කාලං කරොති. අයං චතුත්ථො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

පුනචපරං ගහපතයො දුස්සීලො සීලවිපන්නො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. අයං පඤ්චමො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා.

ඉමෙ ඛො ගහපතයො පඤ්ච ආදීනවා දුස්සීලස්ස සීලවිපත්තියා.

24. පඤ්චිමෙ ගහපතයො ආනිසංසා සීලවතො සීලසම්පදාය. කතමෙ පඤ්ච?.

ඉධ ගහපතයො සීලවා සීලසම්පන්නො අප්පමාදධිකරණං මහන්තං භොගක්ඛන්ධං අධිගච්ඡති. අයං පඨමො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

පුනචපරං ගහපතයො සීලවතො සීලසම්පන්නස්ස කල්‍යාණො කිත්ති-සද්දො අබ්භුග්ගච්ඡති. අයං දුතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

පුනචපරං ගහපතයො සීලවා සීලසම්පන්නා යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං, විසාරදෙ උපසඞ්කමති අමඞ්කුභූතො. අයං තතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

පුනචපරං ගහපතයො සීලසම්පන්නො අසම්මූළ්හො කාලං කරොති. අයං චතුත්ථො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

Free Distribution www.aathaapi.org

පළොල්ගම උවසුන්ට අවවාද:

23. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ පළොල්ගැමි උවසුවන් අමතා මෙසේ වදළ සේක: ගැහැවියනි, දුසිල්හුගේ සිල්විපත්හි මේ දෙස් පසෙක. කවර පසෙක් ද?

ගැහැවියෙනි, මෙහි සිල්විපන් දුසිල් තෙමේ පමා කරුණෙන් මහත් භොගහානියට (භොගයෙන් පිරිහීමට) යෙයි මේ දුසිල්හු සිල්විපතැ **පළමු** දෙස වෙයි.

තව ද ගැහැවියනි, සිල්විපන් දුසිල්හට ලාමක කිත්හඬෙක් (අපවාද කථාවෙක්) උස් වැ නැඟෙයි. මේ දුසිල්හු සිල්විපතැ **දෙවෙනි** දෙස වෙයි.

තව ද ගැහැවියනි, සිල්විපන් දුසිල් තෙම කැත්පිරිස කරා හෝ බමුණු පිරිස කරා හෝ ගැහැවිපිරිස කරා හෝ මහණපිරිස කරා හෝ යම් යම් පිරිසක් කරා එළැඹේ නම්, බිය සැක ඇත්තේ, තෙද නැත්තේ එළැඹෙයි. මේ දුසිල්හු සිල් විපත්හි **තෙවැනි** දෙස ය.

තව ද ගැහැවියෙනි, සිල්විපන් දුසිල් තෙම සිහිමුළා වූයේ කලුරිය කෙරෙයි. මේ දුසිල්හු සිල්විපත්හි **සිවුවන** දෙස ය.

තව ද ගැහැවියනි, සිල්විපන් දුසිල් තෙම කා බුන් මරණින් මතු සුව යෙන් පහ වූ, දුකට කරුණු වූ, විවසවැ පතිත වන තැන වූ නිරයට උත්පත්ති විසින් පැමිණෙයි. මේ දුසිල්හු සිල්විපතැ **පස්වන** දෙස වෙයි.

ගැහැවියනි, දුසිල්හු සිල්විපත්හි මේ දෙස් පස වෙයි.

24. ගැහැවියනි, සිල්වත්හුගේ සිල්සම්පත්හි මේ අනුසස් පසෙකි. කවර පසෙක් ද?

ගැහැවියෙනි, මෙහි සිල්සපන් සිල්වත් තෙම නොපමා කරුණින් භොග රැසක් ලබයි. මේ සිල්වත්හුගේ සිල්සපුයෙහි **පළමු** අනුහස ය.

තව ද ගැහැවියනි, සිල්සපන් සිල්වත්හු පිළිබඳ කලණ කිත්හඬෙක් උස් වැ නැඟෙයි. මේ සිල්වත්හුගේ සිල්සපුයෙහි **දෙවෙනි** අනුහස ය.

තව ද ගැහැවියනි, සිල්සපුව ඇති සිල්වත් තෙමේ කැත්පිරිසක් හෝ බමුණුපිරිසක් හෝ ගැහැවි පිරිසක් හෝ මහණපිරිසක් හෝ යම් යම් පිරිසක් කරා එළැඹේ ද, නොබිය වැ තෙදකි වැ එළැඹෙයි. මේ සිල්වත්හුගේ සිල්සපුයෙහි **තෙවෙනි** අනුහස ය.

තව ද ගැහැවියනි, සිල්සපුව ඇති සිල්වත් තෙමේ සිහි මුළා නොවී කලුරිය කෙරෙයි. මේ සිල්වත්හුගේ සිල්සපුයෙහි **සිවුවන** අනුහස ය.

Free Distribution www.aathaapi.org

පුනවපරං ගහපතයො සීලවා සීලසම්පන්නො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. අයං පඤ්චමො ආනිසංසො සීලවතො සීලසම්පදාය.

''ඉමෙ ඛො ගහපතයො පඤ්ච ආනිසංසා සීලවතො සීලසම්පදායා''ති.

25. අථ ඛො භගවා පාටලිගාමියෙ උපාසකෙ බහුදෙව රත්තිං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උය්‍යොජෙසි ''අභික්කන්තා ඛො ගහපතයො රත්ති, යස්ස'දානි තුමෙහ කාලං මඤ්ඤථා''ති. 'එවං භන්තෙ'ති ඛො පාටලිගාමියා උපාසකා භගවතො පටිස්සුත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කමිංසු. අථ ඛො භගවා අචිරපක්කන්තෙසු පාටලිගාමියෙසු උපාසකෙසු සුඤ්ඤාගාරං පාවිසි.

[පාටලීනගරමාපනං]

26. තෙන ඛො පන සමයෙන සුනීධවස්සකාරා[1] මගධමහාමත්තා පාටලිගාමෙ නගරං මාපෙන්ති වජ්ජිනං පටිබාහාය. තෙන ඛො පන සමයෙන සම්බහුලා දෙවතායො සහස්සසහස්සෙව පාටලිගාමෙ වත්ථූනි පරිගණ්හන්ති. යස්මිං පදෙසෙ මහෙසක්ඛා දෙවතා වත්ථූනි පරිගණ්හන්ති, මහෙසක්ඛානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති ගිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ මජ්ඣිමා දෙවතා වත්ථූනි පරිගණ්හන්ති, මජ්ඣිමානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති ගිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ නීචා දෙවතා වත්ථූනි පරිගණ්හන්ති, නීචානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති ගිවෙසනානි මාපෙතුං.

27. අද්දසා ඛො භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත-මානුසකෙන තා දෙවතායෙ සහස්සසහස්සෙව[2] පාටලිගාමෙ වත්ථූනි පරිගණ්හන්තියො. අථ ඛො භගවා රත්තියා පච්චුසසමයං පච්චුට්ඨාය ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: කොනු ඛො[3] ආනන්ද පාටලිගාමෙ නගරං මාපෙන්ති?ති[4] ''සුනීධවස්සකාරා භන්තෙ මගධමහාමත්තා පාටලිගාමෙ නගරං මාපෙන්ති වජ්ජිනං පටිබාහායා''ති.

---

1. සුනීධ වස්සකාරා, මජ්ඣ
2. සහස්සසස්සෙව, සීමු. PTS. සහස්සෙව, මජ්ඣ
3. කොනුඛො, සීමු.
4. මාපෙති, සීමු.

Free Distribution www.aathaapi.org

තව ද ගැහැවියනි, සිල්සපුව ඇති සිල්වත් තෙමේ කාඛුන් මරණින් මතු ශොභන ගති ඇති සග ලොවට යෙයි. මේ සිල්වත්හුගේ සිල්සපුයෙහි පස්වැනි අනුහස යි.

ගැහැවියනි, සිල්වත්හුගේ සිල්සපුයෙහි මේ අනුසස් පස ය.

25. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ පළොල්ගැමි උවසුවනට රෑ බොහෝ වෙලාවක් දෙලෝ වැඩ දක්වා, දැක්වූ වැඩෙහි සිත් ගන්වා, එහි සිත් තියුණු කොට, එහි (යහපතැ යි) සිත සතුටු කොට, ''ගැහැවියෙනි, රෑය බොහෝ ඉක්මිණ. යම් ගමනක් යෑ යුතු නම් එයට කල් දනිවු'' යි නික්ම යෑමට උදොහාගවත් කළ සේක. 'එසේ ය, වහන්සැ' යි කියා ඒ පළොල්ගැමි උවසුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී හුනස්නෙන් නැඟී ඔබ වැඳ පැදකුණු කොට නික්මැ ගියහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පළොල්ගැමි උවසුවන් නික්මුණු නොබෝ කල්හි ශූන්‍යාගාරයට පිවිසි සේක.

පාටලීනගරය මැවීම

26. එ සමයෙහි මගද මහමැති සුනීධ වස්සකාර යන දෙබමුණෝ වැදෑ රජුන් පිළිබහනු පිණිස (වැදෑ රජුන්ගේ ආයමුබ (අය ලැබෙන දෙරටු පයිඳින පිණිස) පළොල්ගමැ නුවරක් කෙරෙති. එ කලැ දහස දහස (වර්ග වශයෙන්) දේවතාවෝ පළොල්ගමැ ගෙවතු තම තමනට වෙන් කොට ගනිත්. යම් පෙදෙසෙක මහ තෙදැති දෙවියෝ ගෙවතු අරක් ගනිත් ද, එහි නිවෙස් කරන්නට මහ තෙදැති රජුන් ගේ රජමහමැතියන් ගේ සිත් නැමේ. යම් පෙදෙසෙක මැදුම් තෙදැති දෙවියෝ ගෙවතු අරක් ගනිත් ද, එහි නිවෙස් නංවන්නට මැදුම් රජුන් ගේ රජමහමැතියන් ගේ සිත් නැමේ. යම් පෙදෙසෙක ඕන තෙදැති දෙවියෝ ගෙවතු අරක් ගනිත් ද, එහි නිවෙස් නංවන්නට ඕන තෙද ඇති රජුන් ගේ රජමහමැතියන් ගේ සිත් නැමේ.

27. භාග්‍යවතුන් වහන්සේ මිනිසැස ඉක්මී පිරිසිදු දිවැසින් පළොල්-ගමැ ගෙවතු පිරිසිඳ ගන්නා දහස් දහස් ගණන් දෙවතාවන් දුටු සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රෑ අලුයමැ නැඟී සිට අනඳ තෙරුන් අමතා ''අනඳයෙනි, කවරහු පළොල්ගමැ නුවරක් කෙරෙද් ද?'' යි අසා වදළ සේක. ''වහන්ස, මගද මහමැති සුනීධ-වස්සකාර යන දෙබමුණෝ වැදෑ රජුන් පිළිබහනුවට පළොල්ගමැ නුවරක් මවති'' යි අනඳ තෙරණුවෝ සැළ කළහ.

Free Distribution www.aathaapi.org

28. සෙය්‍යථාපි ආනන්ද දෙවෙහි තාවතිංසෙහි සද්ධිං මන්තෙත්වා එවමෙව ඛො ආනන්ද සුනීධවස්සකාරා මගධමහාමත්තා පාටලිගාමෙ නගරං මාපෙන්ති වජ්ජීනං පටිබාහාය. ඉධාහං ආනන්ද අද්දසං දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සම්බහුලා දෙවතායො සහස්සසහස්සෙව පාටලිගාමෙ වත්ථූනි පරිගණ්හන්තියො. යස්මිං ආනන්ද පදෙසෙ මහෙසක්ඛා දෙවතා වත්ථූනි පරිගණ්හන්ති, මහෙසක්ඛානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ මජ්ඣිමා දෙවතා වත්ථූනි පරිගණ්හන්ති, මජ්ඣිමානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ නීචා දෙවතා වත්ථූනි පරිගණ්හන්ති, නීචානං තත්ථ රඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යාවතා ආනන්ද අරියං ආයතනං යාවතා වණිප්පථෝ[1] ඉදං අග්ගනගරං භවිස්සති පාටලිපුත්තං පුටභෙදනං. පාටලිපුත්තස්ස ඛො ආනන්ද තයො අන්තරායා භවිස්සන්ති: අග්ගිතො වා උදකතො වා මිත්තභෙදා වාති.

29. අථ ඛො සුනීධවස්සකාරා මගධමහාමත්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො සුනීධවස්සකාරා මගධමහාමත්තා භගවන්තං එතදවොචුං: "අධිවාසෙතු නො භවං ගොතමො අජ්ජතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා"ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

30. අථ ඛො සුනීධවස්සකාරා මගධමහාමත්තා භගවතො අධිවාසනං විදිත්වා යෙන සකො ආවසථො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සකෙ ආවසථෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං අරොචාපෙසුං. 'කාලො භො ගොතම නිට්ඨිතං භත්තන්ති'.

31. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන සුනීධවස්සකාරානං මගධමහාමත්තානං ආවසථො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි අථ ඛො සුනීධවස්සකාරා මගධමහාමත්තා බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසුං සම්පවාරෙසුං.

32. අථ ඛො සුනීධවස්සකාරා මගධමහාමත්තා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො සුනීධවස්සකාරෙ මගධමහාමත්තෙ භගවා ඉමාහි ගාථාහි අනුමොදි:

---

1. වණිප්පථෝ, සී්‍ය.

Free Distribution www.aathaapi.org

28. ''අනඳයෙනි, තවතිසාවැසි දෙවියන් හා මන්ත්‍රණය කොට මවන්නාක් මෙන් මගදමහමැති සුනීධ-වස්සකාර දෙ බමුණෝ වැදුවන් පිළිබඳනුවට (වැදැරජුන්ගේ අයමුඩ වසනු සඳහා) පළොල්ගමැ නුවරක් මවත්. අනඳයෙනි, මෙහි මම මිනිසැස් ඉක්මී පිරිසිදු දිවැසින් පළොල්ගමැ ගෙවතු පිරිසිද ගත්නා බොහෝ දහස් දහස් ගණන් දේවතාවන් දිටිමි. යම් පෙදෙසෙකැ මහ තෙදැති දේවතාවෝ ගෙවතු අරක්ගනිත් ද, එහි නිවෙස් මවන්නට මහ තෙදැති රජුන් ගේ රජමහමැතියන් ගේ සිත් නැමේ. යම් පෙදෙසෙක මැදුම තෙදැති දෙවියෝ ගෙවතු අරක් ගනිත් ද, එහි නිවෙස් මවන්නට මැදුම තෙදැති රජුන්ගේ රජමහමැතියන්ගේ සිත් නැමේ. යම් පෙදෙසෙක හීන තෙදැති දෙවියෝ ගෙවතු අරක් ගනිත් ද, එහි නිවෙස් මවන්නට හීන තෙදැති රජුන් ගේ රජමහමැතියන් ගේ සිත් නැමේ. ආර්‍යයන් ගේ ආයකනය (රැස්වන තැන) යම්තාක් ද, වණික්පථය (ගනුදෙනු කරන වෙළෙඳුන් වසන තැන) යම්තාක් ද ඔවුනතුරෙන් මේ පැළලුප් නුවර (නොයෙක් රටින් ගෙනෙන වෙළෙඳ) බඩුපොදි ලිහා තබන අග්‍ර නගරය වන්නේ ය. අනඳ යෙනි, මේ පැළලුප්නුවරට ගින්නෙන් හෝ, දියෙන් හෝ, අන්‍යොන්‍ය භෙදයෙන් හෝ (තුන් පරිද්දෙකින්) අන්තරාය තුනෙක් වන්නේ යැ'' යි වදළ සේක.

29. එ කලැ මගදමහමැති සුනීධ-වස්සකාර දෙබමුණෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹි භාග්‍යවතුන් වහන්සේ හා සතුටු වූහ. සතුටු විය යුතු සිතැ රැඳවියැ යුතු කථා අවසන් කොට එක් පසෙක සිටියහ. එක් පසෙක සිටියාවූ මගද මහමැති සුනීධ-වස්සකාර දෙදෙන ''භවද් ගෞතමයෝ බික්ඛුන් හා අප ගේ බත අදට ඉවසත්ව'' යි මෙබස් කීහ. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් එය ඉවසා වදළ සේක.

30. ඉක්බිත්තෙන් මගද මහමැති සුනීධ-වස්සකාර දෙදෙන භාග්‍යවතුන් වහන්සේ ඉවැසූ නියා දැන සිය ආවාස ගෙය කරා ගියහ. ගොස් සිය ආවාසයෙහි ප්‍රණීත බාද්‍ය භොජ්‍ය පිළියෙල කරවා 'භවද් ගෞතමයිනි, දැන් කල් වෙයි. බත පිළියෙළ කොට නිමියේ යැ' යි භාග්‍යවතුන් වහන්සේට කල් දන්වා යැවූහ.

31. එ කල්හී භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරෙවූ පාඩිවුරු ගෙන බික්ඛුන් කැටුව මගද මහමැති සුනීධ-වස්සකාර දෙදෙනා ගේ ආවාස ගෙය කරා එළැඹී සේක. එළැඹැ පනවන ලද අස්නෙහි වැඩහුන් සේක. ඉක්බිති මගද මහමැති සුනීධ-වස්සකාර දෙදෙන සියතින් ම ප්‍රණීත බාද්‍යභොජ්‍යයෙන් බුදුපාමොක් බික්ඛුන් සැකැප්වූහ, පෙරැත්ත කොට වැළැඳැවූහ.

32. ඉක්බිති මගද මහමැති සුනීධ-වස්සකාර දෙදෙන වැළැඳූ, පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇති භාග්‍යවතුන් වහන්සේට එක් පසෙක එක්තරා මිටි අස්නක් ගෙන හුන්හ. එක් පසෙක හුන්නාවූ මගද මහමැති සුනීධ-වස්සකාර දෙදෙනාට භාග්‍යවතුන් වහන්සේ මේ ගාථායෙන් අනුමෝදනා වයයෙන් දහම් දෙසුසේක:

Free Distribution www.aathaapi.org

යස්මිං පදෙසෙ කප්පෙති වාසං පණ්ඩිතජාතියො,[1]
සීලවන්තෙත්ථ භොජෙත්වා සඤ්ඤතෙ බ්‍රහ්මචාරයො,[2]
යා තත්ථ දෙවතා ආසුං[3] තාසං දක්ඛිණමාදිසෙ.
තා පූජිතා පූජයන්ති මානිතා මානයන්ති නං,
තතො නං අනුකම්පන්ති[4] මාතා පුත්තං'ව ඔරසං
දෙවතානුකම්පිතො පොසො සදා භද්‍රානි පස්සති'ති.

අථ ඛො භගවා සුනීධවස්සකාරෙ මගධමහාමත්තෙ ඉමාහි ගාථාහි අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමි.

33. තෙන ඛො පන සමයෙන සුනීධවස්සකාරා මගධමහාමත්තා භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධා හොන්ති. 'යෙනජ්ජ සමණො ගොතමො ද්වාරෙන නික්ඛමිස්සති, තං ගොතමද්වාරං නාම භවිස්සති. යෙන තිත්ථෙන ගඞ්ගං නදිං[5] තරිස්සති, තං ගොතමතිත්ථං නාම භවිස්සති'ති.

අථ ඛො භගවා යෙන ද්වාරෙන නික්ඛමි, තං ගොතමද්වාරං නාම අහොසි. අථ ඛො භගවා යෙන ගඞ්ගා නදී තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන ගඞ්ගා නදී පූරා හොති සමාතිත්තිකා කාකපෙය්‍යා. අප්පෙකච්චෙ මනුස්සා නාවං පරියෙසන්ති, අප්පෙකච්චෙ උළුම්පං පරියෙසන්ති, අප්පෙකච්චෙ කුල්ලං බන්ධන්ති ඔරා පාරං[6] ගන්තුකාමා අථ ඛො භගවා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං[7] වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය,[8] එවමෙව ගඞ්ගාය නදියා ඔරිමතීරෙ අන්තරහිතො පාරිමතීරෙ පච්චුට්ඨාසි සද්ධිං භික්ඛුසඞ්ඝෙන.

අද්දසා ඛො භගවා තෙ මනුස්සෙ අප්පෙකච්චෙ නාවං පරියෙසන්තෙ අප්පෙකච්චෙ උළුම්පං පරියෙසන්තෙ, අප්පෙකච්චෙ කුල්ලං බන්ධන්තෙ ඔරා පාරං ගන්තුකාමෙ. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"යෙ තරන්ති අණ්ණවං සරං
සෙතුං කත්වාන විසජ්ජ පල්ලලානි,
කුල්ලං හි ජනො පබන්ධති[9]
තිණ්ණා මෙධාවිනො ජනා'ති."

පඨමභාණවාරං

---

1. පණ්ඩිතජාතිකො, PTS. 2. බ්‍රහ්මචාරිනො මජ්ඣං 3. අසසු, PTS
4. අනුකම්පෙන්ති, සීමු 5. ගඞ්ගානදිං, ස්‍යා 6. පාරාපාරං, සීමු. අපාරාපාරං, මජ්ඣං PTS.
7. සම්ඤ්ජිතං, මජ්ඣං 8. සම්ඤ්ජෙය්‍ය, මජ්ඣං
9. කුල්ලං ජනො වබන්ධති ස්‍යා

* "ගොතමතිත්ථං නාම අහොසි"ති පාළියං න දිස්සති. තථාප "ගොතමතිත්ථාවිදූරෙ" ඉති මහාබොධිවංසාදිසු දිස්සතෙ.

Free Distribution www.aathaapi.org

පණ්ඩිත ස්වභාව ඇති කැනැත්තේ යම් පෙදෙසෙක වාසය කෙරේ ද, එ තන්හිදී සංයත වූ බඹසර රක්නා සිල්වතුන් වළඳවා, එහි යම් දෙවතා කෙනෙක් වූවාහු නම්, ඔවුනට ඒ දනමය පින පමුණුවන්නේ ය. මෙසේ පින්දීමෙන් පුදන ලද ඒ දෙවතාවෝ ඒ පින් දුන්නාහු (ආරක්ෂා කිරීම වශයෙන්) පුදත්. කලින් කලැ බිලියම් කිරීම වශයෙන් මානිත වූ ඒ දෙවතාවෝ (ඔහුගේ උවදුරු දුරු කිරීම වශයෙන්) ඔහුට බුහුමත් කෙරෙත්. ඒ පින් අනුමෝදන් වීමෙන්, මවක් තම කුසින් උපන් දරුවකුට සෙයින් ඔහුට අනුකම්පා කෙරෙත්. මෙසේ දෙවතාවන් විසින් අනුකම්පා කරන ලද පුරුෂ තෙම හැම කල්හි යහපත ම දකී.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මගද මහමැති සුනීධ–වස්සකාර දෙදෙනාට මේ ගාථාවෙන් අනුමෝදනා බණ වදාරා භුනස්තෙන් නැඟී වැඩි සේක.

33. එ කල්හි මගද මහමැති සුනීධ–වස්සකාර දෙදෙනා 'ශ්‍රමණ ගෞතමයෝ යම් දොරෙකින් අද නික්මෙන්නාහු නම්, එය **ගෞතමද්වාර** නම් වන්නේ ය. යම් තොටෙකින් ගංගානදිය තරණය කරන්නාහු නම්, එය **ගෞතමක්ෂිර්ථ** නම් වන්නේ යැ' යි කියා භාග්‍යවතුන් වහන්සේ පසු පස්සෙන් ගියාහු වෙති.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ යම් දොරෙකින් නික්මුණු සේක් ද, ඒ **ගෞතමද්වාර** නම් විය. ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ ගංගානදිය වෙත වැඩි සේක. එ සමයෙහි ගංගානදිය දෙගොඩ කළා ගළනුයේ, කවුඩන් විසින් සුවසේ පිය හැකි සේ පිරුණේ විය. මෙතෙරින් එතෙර යනු රිසි ඇතැම් මිනිස්සු නැව සොයත්. ඇතැම් කෙනෙක් පසුරු සොයත්. ඇතැම් කෙනෙක් පසුරු බඳිත්. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ කාඛලැකියක්ෂු යමසේ වක් කළ අත දික් කරන්නේ ද, දික් කළ අත හෝ වක් කරන්නේ ද, එසේ ම ගංගානදියේ මෙ තෙරැදී බික්සහන හා අතුරුදහන් වූ සේක් එතෙර වැඩ සිටි සේක.

භාග්‍යවතුන් වහන්සේ මෙතෙරින් එතෙර යනු කැමැති වූ ඇතැම් මිනිසුන් නැව සොයන්නවුන් ද ඇතැම් මිනිසුන් පසුරු සොයන්නවුන් ද ඇතැම් මිනිසුන් පසුරු බඳනාවුන් ද දුටු සේක් ම ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලෙහි මෙ උදන් ඇනූ සේක:

''යම් කෙනෙක් ගැඹුරු වූ පුළුල් වූ තෘෂ්ණානදිය තරිත් ද, ඔහු ආර්‍ය්‍ය-මාර්ග නැමැති හෙය කොට දිය කඩිති නො ඇක්ම එ තෙර (නිවන කරා) යෙත්. එහෙත් මේ කුඩා නදියක් තරනුවට මේ ජන තෙම පසුරක් බඳී. ඒසා තෘෂ්ණා මහා නදිය තිණූ ප්‍රඥා ඇති ජනයෝ මේ සුළු නදිය සැණින් තැරුහ''

පළමු බණවර නිමියේ ය.

Free Distribution www.aathaapi.org

(අරියසච්ච පටිවෙධකථා)

34. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: 'ආයාමානන්ද යෙන කොටිගාමො තෙනුපසඞ්කමිස්සාමා'ති. 'එවං භන්තෙ'ති. ඛො ආයස්මා ආනන්දෙ භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන කොටිගාමො තදවසරි. තත්‍රසුදං භගවා කොටිගාමෙ විහරති. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි:

චතූන්නං භික්ඛවෙ අරියසච්චානං අනනුබොධා අපපටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. කතමෙසං චතූන්නං:

දුක්ඛස්ස භික්ඛවෙ අරියසච්චස්ස අනනුබොධා අපපටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. දුක්ඛසමුදයස්ස භික්ඛවෙ අරියසච්චස්ස අනනුබොධා අපපටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. දුක්ඛනිරොධස්ස භික්ඛවෙ අරියසච්චස්ස අනනුබොධා අපපටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. දුක්ඛනිරොධගාමිනියා පටිපදාය භික්ඛවෙ අරියසච්චස්ස අනනුබොධා අපපටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච.

තයිදං භික්ඛවෙ දුක්ඛං අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං දුක්ඛසමුදයො[1] අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං. දුක්ඛනිරොධො[2] අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං. දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං. උච්ඡින්නා භවතණ්හා, ඛීණා භවනෙත්ති. නත්ථිදානි පුනබ්භවො'ති.

ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

චතූන්නං අරියසච්චානං යථාභූතං අදස්සනා
සංසිතං[3] දීඝමද්ධානං තාසු තාසෙවං[4] ජාතිසු
තානි එතානි දිට්ඨානි භවනෙත්ති සමූහතා,
උච්ඡින්නං මූලං දුක්ඛස්ස නත්ථිදානි පුනබ්භවො'ති.

35. තත්‍ර පි සුදං භගවා කොටිගාමෙ විහරන්තො එතදෙව බහුලං භික්ඛූනං ධම්මිං කථං කරොති: "ඉති සීලං, ඉති සමාධි, ඉති පඤ්ඤා; සීලපරිභාවිතො සමාධි මහප්ඵලො හොති මහානිසංසො. සමාධිපරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති මහානිසංසා. පඤ්ඤාපරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති, සෙය්‍යථීදං: කාමාසවා භවාසවා අවිජ්ජාසවා"ති.[5]

---

1. දුක්ඛසමුදයං සීහ. මජ්ඣ. PTS.
2. දුක්ඛනිරොධං, සීහ මජ්ඣ. PTS
3. සංසරිතං සීහ.
4. තාසෙව, PTS
5. කාමාසවා භවාසවා දිට්ඨාසවා අවිජ්ජාසවා, PTS

Free Distribution www.aathaapi.org

ආර්‍යසත්‍ය ප්‍රතිවෙධ කථා

34. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් ඛණවා ''අනඳයෙනි, එවු, කොටිග්‍රාමයට යමහ''යි වදළ සේක. 'එසේ ය වහන්සැ'යි කියා අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහත් මහණමුළුවක් හා කොටිග්‍රාමය කරා වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ එහි කොටිග්‍රාමයෙහි වැඩ වසන සේක. එහිදී භික්ෂූන් අමතා මෙසේ වදළ සේක:

මහණෙනි, සතර ආර්‍යසත්‍යයන් අනුබොධ නො කළ හෙයින්, ප්‍රතිවෙධ නො කළ හෙයින් මාගේ ද තොපගේ ද මෙසේ මේ දික් කලක් සසර දිවැ හැවිදීම, සසර හැසිරීම විය. කවර සතර සත්‍යයන් ද? යත්:

''මහණෙනි, දුඃඛාර්‍යසත්‍යය අනුබොධ ප්‍රතිවෙධ නො කළ හෙයින් මාගේ ද තොපගේ ද මෙසේ මේ දික් කලක් සසර දිවැ හැවිදීම, සසර හැසිරීම විය. මහණෙනි, දුඃඛසමුදයාර්‍යසත්‍යය අනුබොධ ප්‍රතිවෙධ නොකළ හෙයින් මාගේ ද තොපගේ ද මෙසේ මේ දික් කලක් සසර දිවැ හැවිදීම, සසර හැසිරීම විය. මහණෙනි, දුඃඛනිරොධාර්‍යසත්‍යය අනුබොධ ප්‍රතිවෙධ නොකළ හෙයින් මාගේ ද තොපගේ ද මෙසේ මේ දික් කලක් සසර දිවැ හැවිදීම, සසර හැසිරීම විය. මහණෙනි, දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍යසත්‍යය අනුබොධ ප්‍රතිවෙධ නොකළ හෙයින් මාගේ ද තොපගේ ද මෙසේ මේ දික් කලක් සසර දිවැ හැවිදීම, සසර හැසිරීම විය.

මහණෙනි, ඒ දුඃඛාර්‍යසත්‍යය අනුබොධ ප්‍රතිවෙධ කරන ලදි. දුඃඛසමුදයාර්‍යසත්‍යය අනුබොධ ප්‍රතිවෙධ කරන ලදි. දුඃඛනිරොධාර්‍යසත්‍යය අනුබොධ ප්‍රතිවෙධ කරන ලදි. දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍යසත්‍යය අනුබොධ ප්‍රතිවෙධ කරන ලදි. භවතෘෂ්ණාව මුල් සිඳින ලදි. භවනෙත්‍රිය (සතුන් භවයට පමුණුවන තෘෂ්ණා රැහැන) ක්ෂීණ විය. දැන් යලි භවොත්පත්තියෙක් නැත''.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක. ශොභන ගති ඇති ශාස්තෘන් වහන්සේ මෙය වදාරා එයින් මත්තෙහි (ගාථාබන්ධනා වශයෙනුදු) මෙය වදළ සේක:

''සතර සත්‍යයන් තත් වූ පරිදි නොදක්මෙන් ඒ ඒ ජාතින්හි දික් කලක් ම හැසිරීම විය. දැන් සතර සත්‍යයෝ දක්නා ලදුහ. භවනියන්ත්‍රිය (තෘෂ්ණාව) වැනැසිණ. දුක්මුල සිඳිණ. දැන් මෙයින් මතු භවයෙක් නැත''.

35. භාග්‍යවතුන් වහන්සේ එහි ද කොටිග්‍රාමයෙහි වැඩවසන සේක්, ''ශීලය මෙසේ ය, සමාධිය මෙසේ ය, ප්‍රඥාව මෙසේ ය. ශීලයෙන් පුරුදු කරන ලද සමාධිය මහත් පල මහත් අනුසස් ඇත්තේ වෙයි. සමාධියෙන් පුරුදු කරන ලද ප්‍රඥාව මහත්පල මහත් අනුසස් ඇත්තේ වෙයි. ප්‍රඥායෙන් පුරුදු කරන ලද සිත මොනොවට කාමාස්‍රව භවාස්‍රව අවිද්‍යාස්‍රව යන ආස්‍රව කෙරෙන් මිදේ'' යැයි බොහෝ සේ මේ දහැමි කතාව ම වදරන සේක.

Free Distribution www.aathaapi.org

ධම්මාදාස ධම්මපරියායො

36. අථ ඛො භගවා කොටිගාමෙ යථාභිරන්නං විහරිත්වා ආයස්මන්නං ආනන්දං ආමන්නෙසි "ආයාමානන්ද යෙන නාදිකා තෙනුපසඞ්කමිස්සාමා"ති 'එවං භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන නාදිකා තදවසරි. තත්‍රපි සුදං භගවා නාදිකෙ විහරති ගිඤ්ජකාවසථෙ. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්නං අභිවාදෙත්වා එකමන්නං නිසීදි. එකමන්නං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්නං එතදවොච:

සාළෙහා නාම භන්තෙ භික්ඛු නාදිකෙ කාලකතො.[2] තස්ස කා ගති, කො අභිසම්පරායො? **නන්දා** නාම භන්තෙ භික්ඛුනී නාදිකෙ කාලකතා. තස්සා කා ගති, කො අභිසම්පරායො? **සුදත්තො** නාම භන්තෙ උපාසකො නාදිකෙ කාලකතො. තස්ස කා ගති, කො අභිසම්පරායො? **සුජාතා** නාම භන්තෙ උපාසිකා නාදිකෙ කාලකතා. තස්සා කා ගති, කො අභිසම්පරායො? **කකුධො**[3] නාම භන්තෙ උපාසකො නාදිකෙ කාලකතො, තස්ස කා ගති, කො අභිසම්පරායො? **කාලිඞ්ගො**[4] නාම භන්තෙ උපාසකො -පෙ- **නිකටො** නාම භන්තෙ උපාසකො -පෙ- **කටිස්සභො** නාම භන්තෙ උපාසකො -පෙ- **තුට්ඨො** නාම භන්තෙ උපාසකො -පෙ- **සන්තුට්ඨො** නාම භන්තෙ උපාසකො -පෙ- **භද්දො** නාම භන්තෙ උපාසකො -පෙ- **සුභද්දො** නාම භන්තෙ උපාසකො නාදිකෙ කාලකතො. තස්ස කා ගති, කො අභිසම්පරායො?ති.

37. සාළෙහා ආනන්ද භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙසයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. නන්දා ආනන්ද භික්ඛුනී පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤෝජනානං පරික්ඛයා ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිනී අනාවත්තිධම්මා තස්මා ලොකා. **සුදත්තො** ආනන්ද උපාසකො තිණ්ණං සඤ්ඤෝජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සති. **සුජාතා** ආනන්ද උපාසිකා තිණ්ණං සඤ්ඤෝජනානං පරික්ඛයා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා.

---

1. නාතික, ම ජ සං.
2. කාලංකතො, ම ජ සං
3. කුකකුටො ම ජ සං
4. කාළිමෙඛ, ම ජ සං කාරළිමෙඛා, ස්‍යා.

Free Distribution www.aathaapi.org

ධර්මෝදර්ශ ධර්මපර්‍යායය

36. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ කොටිග්‍රාමයෙහි කැමැති තාක් වැස, අනඳ තෙරුන් ඔබවා, "අනඳයෙනි, එව, නාදිකා ගමට යමහ" යි වදළ සේක. 'එසේ ය, වහන්සැ' යි කියා අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහත් බික්සහත හා නාදිකා ගමට වැඩි සේක. වැඩ එහි නාදිකා ගමෑ ගඩොළුයෙන් කළ ආවාසයෙහි වසන සේක. එකලෑ අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ ඔබ වැඳ පසෙක හුන්හ. පසෙක හිඳ භාග්‍යවතුන් වහන්සේට මෙ බස් පැවැසූහ:

වහන්ස, නා දිකායෙහි **සාළ්හ** නම් භික්ෂු කලුරිය කෙළේ ය. ඔහුගේ මෙයින් මතු ගතිය කවර යැ? පරලොවැ පැවැත්ම කවර යැ? වහන්ස, **නන්දා** නම් මෙහෙණ නාදිකා ගමෑ කලුරිය කළා ය. ඇයගේ මෙයින් මතු ගතිය කවර යැ? පරලොවැ පැවැත්ම කරව යැ? වහන්ස, **සුදත්ත** නම් උවසු න දිකායෙහි කලුරිය කෙළේ ය. ඔහුගේ මෙයින් මතු ගතිය කවර යැ? පරලොවැ පැවැත්ම කවර යැ? වහන්ස, **සුජාතා** නම් උවැයි නාදිකායෙහි කලුරිය කළා ය. ඇයගේ මෙයින් මතු ගතිය කවර යැ? පරලොවැ පැවැත්ම කවර යැ? වහන්ස, **කකුධ** නම් උවසු නාදිකායෙහි කලුරිය කෙළේ ය. ඔහුගේ මෙයින් මතු ගතිය කවර යැ? පරලොවැ පැවැත්ම කවර යැ? වහන්ස, **කාලිංග** නම් උවසු නාදිකායෙහි කලුරිය කෙළේ ය. ඔහුගේ මෙයින් මතු ගතිය කවර යැ? පරලොවැ පැවැත්ම කවර යැ? වහන්ස, **නිකට** නම් උවසු නාදිකායෙහි කලුරිය කෙළේ ය. ඔහුගේ මෙයින් මතු ගතිය කවර යැ? පරලොවැ පැවැත්ම කවර යැ? වහන්ස, **කටිස්සභ** නම් උවසු නාදිකායෙහි කලුරිය කෙළේ ය. ඔහුගේ මෙයින් මතු ගතිය කවර යැ? පරලොවැ පැවැත්ම කවර යැ? වහන්ස, **තුට්ඨ** නම් උවසු නාදිකායෙහි කලුරිය කෙළේ ය ... **සන්තුට්ඨ** නම් උවසු ... **භද්‍ර** නම් උවසු ... **සුභද්‍ර** නම් උවසු නාදිකායෙහි කලුරිය කෙළේ ය, ඔහුගේ මෙයින් මතු ගතිය කවර යැ? පරලොවැ පැවැත්ම කවර යැ?".

37. "අනඳයෙනි, **සාළ්හ** මහණ ආස්‍රවයන් **ක්ෂය** කිරීමෙන් අනාස්‍රව වූ චේතෝවිමුක්තිය ද ප්‍රඥාවිමුක්තිය ද මේ අත්බවහි ම තෙමේ වෙසෙසි තුවණින් දැන පසක් කොට සපයා විසි ය. අනඳයෙනි, **නන්ද** මෙහෙණ ඔරම්භාගිය සංයෝජනා පස ක්ෂය කිරීමෙන් (ශුද්ධාවාසයෙහි) උපපාදුක වූවා, එහි පිරිනිවෙන්නී, ඒ ඛඹලොවින් පෙරළා මෙහි නොඑන ස්වභාවය ඇත්තී ය. අනඳයෙනි, **සුදත්ත** උවසු තුන් සංයෝජනයන් ක්ෂය කිරීමෙන්, රාග ද්වේෂ මොහ තුනී වූ බැවින් සකෘදාගාමී වූයේ, එක් වරක් ම මේ ලොවට අවුත් දුක් කෙළවර කරන්නේ ය. අනඳයෙනි, **සුජාතා** උවැයි තුන් සංයෝජනයන් ක්ෂය කිරීමෙන් සෝවාන් වූවා, අවාදුකට නොවැටෙන සුලු වූවා, ධර්මනියමයෙන් රහත්බව ලබනුවට නියත වූවා, සම්බොධිපරායණ (ඉහළ තුන් මගට අවශ්‍යයෙන් ම පැමිණිය යුතු) වූවා ය.

Free Distribution www.aathaapi.org

කකුධෝ නාම ආනන්ද උපාසකෝ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකෝ තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මෝ තස්මා ලෝකා. කාලිඞ්ගෝ ආනන්ද උපාසකෝ -පෙ- නිකටෝ ආනන්ද උපාසකෝ -පෙ- කටිස්සභෝ ආනන්ද උපාසකෝ -පෙ- තුට්ඨෝ ආනන්ද උපාසකෝ -පෙ- සන්තුට්ඨෝ ආනන්ද උපාසකෝ -පෙ- භද්දෝ ආනන්ද උපාසකෝ -පෙ- සුභද්දෝ ආනන්ද උපාසකෝ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකෝ තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මෝ තස්මා ලෝකා.

පරොපඤ්ඤාසං ආනන්ද නාදිකා උපාසකා කාලකතා පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිනෝ අනාවත්තිධම්මා තස්මා ලෝකා.

සාධිකා නවුති ආනන්ද නාදිකා උපාසකා කාලකතා තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදෝසමොහානං තනුත්තා සකදාගාමිනෝ සකිදෙව ඉමං ලෝකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති.

සාතිරෙකානි ආනන්ද පඤ්ච සතානි නාදිකෝ උපාසකා කාලකතා තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා.

38. අනච්ඡරියං වෝ පනෙතං ආනන්ද යං මනුස්සභූතෝ කාලං කරෙය්‍ය, තස්මිඤ්ඤෙව කාලකතෙ තථාගතං උපසඞ්කමිත්වා එතමත්ථං පුච්ඡිස්සථ, විහෙසා වෙසා ආනන්ද තථාගතස්ස. තස්මාතිහානන්ද ධම්මාදාය තාම ධම්මපරියාය දෙසෙස්සාමි යෙන සමන්නාගතෝ අරියසාවකෝ ආකඞ්ඛමානෝ අත්තනා'ව අත්තානං ඛ්‍යාකරෙය්‍ය: 'ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනි ඛීණපෙත්තිවිසයෝ ඛීණාපායදුග්ගතිවිනිපාතෝ, සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මෝ නියතෝ සම්බොධිපරායණෝ'ති.

කතමෝ ච සෝ ආනන්ද ධම්මාදාසෝ ධම්මපරියාසෝ යෙන සමන්නාගතෝ අරියසාවකෝ ආකඞ්ඛමානෝ අත්තනා ව අත්තානං ඛ්‍යාකරෙය්‍ය: ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනි ඛීණපෙත්තිවිසයෝ ඛීණාපායදුග්ගතිවිනිපාතෝ, සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මෝ නියතෝ සම්බොධිපරායණෝ'ති:

Free Distribution www.aathaapi.org

අනාදයෙනි, කකුධ නම් උවසු ඔරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් ශුද්ධාවාසයෙහි උපපාදුක වූයේ, එහිදී පිරිනිවෙන සුලු වූයේ, ඒ ලොවින් මෙහි පෙරළා නො එන ස්වභාවය ඇත්තේ ය. අනාදයෙනි, කාලිංග උවසු තෙම ... නිකට උවසු තෙම ... කවිස්සභ උවසු තෙම ... තුටිය උවසු තෙම ... සන්තුවිය උවසු තෙම ... භද්‍ර උවසු තෙම ... සුභද්‍ර උවසු තෙම ඔරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් ශුද්ධාවාසයෙහි උපපාදුක වූයේ, එහි පිරිනිවෙන සුලු වූයේ, ඒ ලොවින් මෙහි පෙරළා නො එන සුලු වෙයි.

අනාදයෙනි, නාදිකායෙහි පනසකට වැඩි දෙනෙක් උවසුවෝ කලුරිය කළාහු, ඔරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් ශුද්ධාවාසයෙහි උපපාදුක වූවාහු, එහි පිරිනිවෙන සුලු වූවාහු, ඒ ලොවින් මෙහි පෙරළා නො එන සුලු වෙත්.

අනාදයෙනි, වැඩියක් සහිත අතූ දෙනෙක් නාදිකායෙහි කලුරිය කළාහු තුන් සංයෝජනයන් ක්ෂය කිරීමෙන්, රාගද්වේෂමෝහයන් තුනී බැවින් සකෘදාගාමී වූවාහු, එක් වරක් ම උත්පත්ති වශයෙන් මෙ ලොවට අවුත් දුක් කෙළවර කරන්නාහ.

අනාදයෙනි, වැඩියක් සහිත පන්සියක් නාදිකායෙහි උවසුවෝ කලුරිය කළාහු, තුන් සංයෝජනයන් ක්ෂය කිරීමෙන් සෝවාන් වූවාහු, අවාභි නොවැටෙන සුලු වූවාහු, රහත්බවට නියත වූවාහු, සම්බොධිපරායණ (ඉහළ තුන් මහට අවශ්‍යයෙන් පැමිණිය යුතු) වූහ.

38. අනාදයෙනි, විස්මය ජනක යම් හෙයකින් මිනිස් වූයෙක් කලුරිය කරන්නේ නම්, ඉදින් ඒ ඒ මිනිසා කලුරිය කළ කල්හි තථාගතයන් කරා එළැඹ මෙ කරුණ විචාරන්නාහු නම්, ඒ (හැම එකක්හුගේම පරලොව ගතිය කිම) තථාගතයන්ගේ කයට වෙහෙසෙක් ම ය. අනාදයෙනි, එහෙයින් යමෙකින් සමන්විත ආර්‍යශ්‍රාවක කැමැත්තේ 'ක්ෂය කළ නිරය ඇත්තෙමි' යි, 'ක්ෂය කළ තිරිසන් යොන් ඇත්තෙමි'යි 'ක්ෂය කළ ප්‍රෙතවිෂය ය ඇත්තෙමි' යි, 'ක්ෂය කළ අපාය දුර්ගති විනිපාතයන් ඇත්තෙමි' යි, 'මම අවාභි නොවැටෙන සුලු, නියත වූ සම්බොධි පරායණ වූ සෝවන් සුගුලෙකිම් වෙමි' යි තෙමේ ම තමා ප්‍රකාශ කළ හැකි වන්නේ ද, එසේ වූ ධර්මාදර්ශ නම් ධර්මක්‍රමය දෙසන්නෙමි.

අනාදයෙනි, යමෙකින් සමන්විත අරි සවු තෙම කැමැත්තේ 'මම ක්ෂිණ නිරය ඇත්තෙමි, ක්ෂිණ තිරශ්චීනයොනි ඇත්තෙමි, ක්ෂිණ ප්‍රෙතවිෂය ඇත්තෙමි, ක්ෂිණ අපාය දුර්ගති විනිපාත ඇත්තෙමි, අවිනිපාත ස්වභාවය ඇති, නියත වූ, සම්බොධිපරායණ වූ සෝවාන් සුගුලෙකිම් වෙමි'යි තෙමේ ම තමා පැවැසි යැ හැකි වන්නේ නම්, ඒ ධර්මාදර්ශ ධර්මපර්‍යායය කවරේ ද:

Free Distribution www.aathaapi.org

ඉධානන්ද අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ''ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා''ති.

ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ''ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො[1] පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී''ති.

සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ''සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො. යදිදං චත්තාරි පුරිසයුගානි, අට්ඨ පුරිසපුග්ගලා. එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො, පාහුනෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලිකරණීයො, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා''ති.

අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි භුජිස්සෙහි විඤ්ඤුප්පසත්ථෙහි අපරාමට්ඨෙහි සමාධි-සංවත්තනිකෙහි.

අයං බො සො ආනන්ද ධම්මාදාසො ධම්මපරියායො යෙන සමන්නා-ගතො අරියසාවකො ආකඞ්ඛමානො අත්තනා'ව අත්තානං බ්‍යාකරෙය්‍ය 'ඛීණනිරයො'ම්හි ඛීණතිරච්ඡානයොනි ඛීණපෙත්තිවිසයො ඛීණාපායදුග්ගති-විනිපාතො. සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධි-පරායණො'ති.

39. තත්‍ර පි සුදං භගවා නාදිකෙ විහරන්තො ගිඤ්ජකාවසථෙ එතදෙව බහුලං භික්ඛූනං ධම්මිං කථං කරොති: ''ඉති සීලං, ඉති සමාධි, ඉති පඤ්ඤා සීලපරිභාවිතො සමාධි මහප්ඵලො හොති මහානිසංසො. සමාධිපරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති මහානිසංසා. පඤ්ඤාපරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති-සෙය්‍යථීදං: කාමාසවා භවාසවා අවිජ්ජාසවා''ති.

---

1. ඔපනෙය්‍යකො, ච්ඡසං

Free Distribution www.aathaapi.org

අනඳයෙනි, මෙහි අරී සවු තෙම ''ඒ භාග්‍යවත් තෙම මේ මේ කරුණින් අර්හත් ය, සම්‍යක්සම්බුද්ධ ය, විද්‍යාචරණසම්පන්න ය, සුගත ය, ලෝක විත් ය, නිරුත්තර පුරුෂදම්‍යසාරථී ය, දෙවිමිනිස්නට ශාස්තෘ ය, බුද්ධ ය, භගවත් යැ'' යි බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් සමන්විත වෙයි.

''භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනා කොට කියන ලද. තමන් විසින් ම දක්ක යුතු ය. ඵල දෙනුවට කාලාන්තරයක් ඇති නො වේ. 'එව, බලව' යි කීමට නිසි ය. භාවනා වසයෙන් තමසිත්හි එළවනුවට සුදුසු ය. විඥයන් විසින් තමතමා කෙරෙහි දක්ක යුතු යැ''යි ධර්මයෙහි ගුණ දැන පැහැදීමෙන් සමන්විත වෙයි.

''භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසංඝ තෙම සුපිළිපන් ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම ඍජු ව පිළිපන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවකසංඝ තෙම න්‍යායප්‍රතිපන්න ය (නිවන් පිණිස පිළිපන්නේ ය). භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසංඝ තෙම සාමීචිප්‍රතිපන්න ය. යම් මේ ප්‍රථම මාර්ගස්ථ, ප්‍රථම ඵලස්ථ ආදි විසින් පුරුෂයුග සතර දෙනෙක් ඇද්ද, මේ නියාමයෙන් පුරුෂ පුද්ගලයෝ අට දෙනෙකි. භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවකසංඝ තෙම දුරු සිට ද ගෙනවුත් සිල්වත්නට පිරිනැමියැ යුතු සිවුපස පිළිගනුවට සුදුසු ය. අමුත්තනට පිළියෙල කළ දනය පිළිගන්නට සුදුසු ය. පරලොව සුව පතා දෙන දන් පිළිගන්නට සුදුසු ය දෝත් මුදුන් තබා වැන්ද යුත්තේ ය. ලොව නිරුත්තර වූ පින්කෙත යැ'' යි. සංඝයා කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් සමන්විත වෙයි.

කඩ නොවූ, සිදුරු නො වූ (තැනින් තැන සිකපද බිඳීමෙන්) සබල නොවූ, කැලල් රහිත වූ, නිදහස් වූ (තෘෂ්ණාදාසත්වයෙන් මිදුණු), නුවණැතියන් විසින් පසස්නා ලද, තෘෂ්ණාදෘෂ්ටි දෙකින් අපරාමෘෂ්ට වූ, උපචාර අර්පණා මාර්ග ඵල සමාපත්ති පිණිස පවත්නා වූ ආර්‍යයනට ප්‍රිය මනාප වූ ශීලයන්ගෙන් සමන්විත වෙයි.

අනඳයෙනි, යමෙකින් සමන්විත අරී සවු තෙම කැමැත්තේ, 'මම ක්ෂීණ නිරය ඇත්තෙමි, ක්ෂීණ තිරශ්චීන යොනි ඇත්තෙමි, ක්ෂීණ ප්‍රෙතවිෂය ඇත්තෙමි, ක්ෂීණ අපාය දුර්ගති විනිපාත ඇත්තෙමි. අවිනිපාත ස්වභාවය ඇති, නියත වූ, සම්බොධිපරායණ වූ සෝවාන් පුඟුලෙක්මි' යි තෙමේ ම තමා පවසනු හැක්කේ නම්, මේ ඒ ධර්මාදර්ශ ධර්මපර්යාය වේ.

39. භාග්‍යවතුන් වහන්සේ එහි ද නාදිකා ගමෙහි ගඩොළුයෙන් කළ ආවාසයෙහි වසන සේක්, ''ශීලය මෙසේ ය, සමාධිය මෙසේ ය, ප්‍රඥාව මෙසේ ය. ශීලයෙන් පුරුදු කරන ලද සමාධිය මහත් ඵල මහත් අනුසස් ඇත්තේ ය, සමාධියෙන් පුරුදු කරන ලද ප්‍රඥාව මහත් පල මහත් අනුසස් ඇත්තේ ය, ප්‍රඥාවෙන් පුරුදු කරන ලද සිත කාමාස්‍රව භවාස්‍රව අවිද්‍යාස්‍රව යන ආස්‍රව කෙරෙන් මිදේ යැ'' යි භික්ෂූනට බෙහෙවින් මේ දහැමි කතාව ම කරන සේක.

Free Distribution www.aathaapi.org

[අම්බපාලිවනෙ සතිපට්ඨාන දෙසනා]

40. අථ ඛො භගවා නාදිකෙ යථාභිරන්තං විහරිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: 'ආයාමානන්ද, යෙන වෙසාලි තෙනුපසඞ්කමිස්සාමා'ති. 'එවං භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන වෙසාලි තදවසරි. තත්‍ර සුදං භගවා වෙසාලියං විහරති අම්බපාලිවනෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි:

"සතො භික්ඛවෙ භික්ඛු විහරෙය්‍ය සම්පජානො. අයං වො අම්හාකං අනුසාසනී.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සතො හොති: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජ නො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං, වෙදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, චිත්තෙ චිත්තානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සතො හොති.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සම්පජානො හොති: ඉධ භික්ඛවෙ, භික්ඛු අභික්කමෙ පටික්කමෙ සම්පජානකාරී හොති. ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති. සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති. සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති. අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති. උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සම්පජානො හොති.

සතො භික්ඛවෙ, භික්ඛු විහරෙය්‍ය සම්පජානො. අයං වො අම්හාක අනුසාසනී"ති.

Free Distribution www.aathaapi.org

[අම්බපාලිවනයෙහි සිදුවන් දෙසීම]

40. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ භාතිකා ගමෙහි කැමැති තාක් වැස, අනඳ තෙරුන් ඛණවා, 'අනඳයෙනි, එව, **විසල්පුර** කරා එළැඹෙන්නමු' යි වදළ සේක. 'එසේ යැ, වහන්ස' යි අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂූන් හා විසල්පුරට වැඩි සේක. එහි විසල් පුර **අම්බපාලි** වනයෙහි වැඩ වසන සේක. එහි දී භික්ෂූන් අමතා මෙසේ වදළ සේක.

"මහණෙනි, මහණතු සිහි ඇති වැ සම්‍යක් ප්‍රඥා ඇති වැ විසිය යුතු. මේ තොපට අප ගේ අනුශාසනය වේ.

මහණෙනි, මහණ තෙම කෙසේ නම් සිහි ඇත්තේ වේ ද: මහණෙනි, මෙහි මහණ තෙම කෙලෙස් තවන වැර ඇත්තේ, මනා නුවණින් දන්නේ, සිහි ඇත්තේ, ලොවැ (මේ කයෙහි) කාමච්ඡන්දය හා දෙම්නස හා සන්හිදුවා, කයෙහි විදසුන් නුවණින් කය අනුව බලතුයේ වාස කෙරෙයි. කෙලෙස් තවන වැර ඇත්තේ, මනා නුවණින් දනනේ, සිහි ඇත්තේ, වෙදනා ලොවැ කාමච්ඡන්දය හා දෙම්නස හා සන්හිදුවා, වෙදනාවන්හි විදසුන් නුවණින් වෙදනාව අනුව බලතුයේ වාස කෙරෙයි. කෙලෙස් තවන වැර ඇත්තේ, මනා නුවණින් දන්නේ, සිහි ඇත්තේ, ලොවැ කාමච්ඡන්දය හා දෙම්නස හා සන්හිදුවා. සිත්හි විදසුන් නුවණින් සිත අනුව බලතුයේ වාස කෙරෙයි. කෙලෙස් තවන වැර ඇත්තේ, මනා නුවණින් දනනේ, සිහි ඇත්තේ, ලොවැ කාමච්ඡන්දය හා දෙම්නස හා සන්හිදුවා, නීවරණාදී ධර්මයන්හි විදසුන් නුවණින් නීවරණාදිය අනුව බලතුයේ වාස කෙරෙයි. මහණෙනි, මෙසේ මහණ තෙම සිහි ඇත්තේ වේ.

මහණෙනි, මහණතෙම කෙසේ නම් සම්‍යක්ප්‍රඥා ඇත්තේ වේ ද: මහණෙනි, මෙහි මහණ තෙම ඉදිරි ගමනෙහි පෙරළා ඊමෙහි (කය නම් ලත් ඇටසැකිල්ලෙක් යෑම් ආදිය කරන්නේ යැයි) නුවණින් සලකා ම එය කරන්නේ වෙයි. ඉදිරි බැලීමෙහි දෙපස බැලීමෙහි නුවණින් සලකා දන ම එය කරන්නේ වෙයි. අත් පා හැකිලීමෙහි දිගු කිරීමෙහි නුවණින් දන ම එය කරන්නේ වෙයි. සංඝාටිය ද පාත්‍රය ද සිවුරු ද දැරීමෙහි නුවණින් සලකා ම එය කරන්නේ වෙයි. බොජුන් වැළඳීමෙහි ද පැන් පිමෙහි ද විකා කෑ යුතු දැය කෑමෙහි ද මී සකුරු ආදින් රසවිඳීමෙහි ද නුවණින් සලකා ම එය කරන්නේ වෙයි. මල මූ පහ කිරීමෙහි නුවණින් සලකා ම එය කරන්නේ වෙයි. යෑමෙහි ද සිටීමෙහි ද හිඳීමෙහි ද නිදි ගැන්මෙහි ද නිදිවැරීමෙහි ද කීමෙහි ද නිහඬ වීමෙහි ද නුවණින් සලකා ම එය කරන්නේ වෙයි. මහණෙනි, මහණ තෙම මෙසේ සම්‍යක්-ප්‍රඥා ඇත්තේ වෙයි.

මහණෙනි, මහණ සිහි ඇති වැ නුවණ ඇති ව විසිය යුතු. මේ තොපට අප ගේ අනුශාසනය යි.

Free Distribution www.aathaapi.org

[අම්බපාලී ආරාමපටිග්ගහනං]

41. අස්සොසි ඛො අම්බපාලී ගණිකා 'භගවා කිර වෙසාලිං අනුප්පත්තො වෙසාලියං විහරති මය්හං අම්බවනෙ' ති. අථ ඛො අම්බපාලී ගණිකා භද්දානි භද්දානි යානානි යොජාපෙත්වා, භද්දං යානං අභිරූහිත්වා, භද්දෙහි භද්දෙහි යානෙහි වෙසාලියා නිය්‍යාසි. යෙන සකො ආරාමො තෙන පායාසි. යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකා'ව යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අම්බපාලිං ගණිකං භගවා ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො අම්බපාලී ගණිකා භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා භගවන්තං එතදවොච: 'අධිවාසෙතු මෙ භන්තෙ භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා'ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො අම්බපාලී ගණිකා භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

42. අස්සොසුං ඛො වෙසාලිකා ලිච්ඡවී 'භගවා කිර වෙසාලිං අනුප්පත්තො වෙසාලියං විහරති අම්බපාලිවනෙ'ති. අථ ඛො තෙ ලිච්ඡවී භද්දානි භද්දානි යානානි යොජාපෙත්වා, භද්දං භද්දං යානං අභිරූහිත්වා, භද්දෙහි භද්දෙහි යානෙහි වෙසාලියා නීයංසු.[1] තත්‍ර එකච්චෙ ලිච්ඡවී නීලා හොන්ති නීලවණ්ණා නීලවත්ථා නීලාලඞ්කාරා, එකච්චෙ ලිච්ඡවී පීතා හොන්ති පීතවණ්ණා පීතවත්ථා පීතාලඞ්කාරා, එකච්චෙ ලිච්ඡවී ලොහිතා[2] හොන්ති ලොහිතවණ්ණා ලොහිතවත්ථා ලොහිතාලඞ්කාරා, එකච්චෙ ලිච්ඡවී ඔදාතා හොන්ති ඔදාතවණ්ණා ඔදාතවත්ථා ඔදාතාලඞ්කාරා.

43. අථ ඛො අම්බපාලී ගණිකා දහරානං දහරානං ලිච්ඡවීනං අක්ඛෙන අක්ඛං චක්කෙන චක්කං යුගෙන යුගං පතිවට්ටෙසි.[3] අථ ඛො තෙ ලිච්ඡවී අම්බපාලිං ගණිකං එතදවොචුං: 'කිඤ්ඤෙ, අම්බපාලි, දහරානං දහරානං ලිච්ඡවීනං අක්ඛෙන අක්ඛං චක්කෙන චක්කං යුගෙන යුගං පතිවට්ටෙසි?'ති. 'තථා හි පන මෙ අය්‍යපුත්තා, භගවා නිමන්තිනො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා'ති. 'දෙහි ජෙ, අම්බපාලි, එතං භත්තං සතසහස්සෙනා'ති. 'සචෙ'පි මෙ අය්‍යපුත්තා වෙසාලිං සාහාරං දස්සථ, එවමහං තං භත්තං[4] න දස්සාමි'ති. අථ ඛො තෙ ලිච්ඡවී අඞ්ගුලිං[5] පොඨෙසුං 'ජිතමහා වත හො අම්බකාය,[6] ජිතමහා[7] වත හො අම්බකායා'ති.

---

1. නියාසිංසු – PTS. නිය්‍යංසු, මජ්ඣං, ස්‍යා. 2. ලොහිතකා – PTS.
3. පරිවට්ටෙසි, මජ්ඣං – PTS, ස්‍යා 4. එසිමපි මහත්තං – ස්‍යා.
5. අඞ්ගුලී සිමු. PTS 6. අම්බපාලිකාය – ස්‍යා 7. වඤ්චිතමහා – PTS

Free Distribution www.aathaapi.org

[අම්බපාලි ආරාමය පිළිගැනීම]

41. **අම්බපාලී** ගණිකා තොමෝ 'භාග්‍යවතුන් වහන්සේ විසල් පුර වැඩ විසල්පුරට නොදුරු වූ මාගේ අඹවෙනෙහි වසන සේකැ' යි ඇසුවා ය. ඉක්බිති ඕ තොම සොඳුරු සොඳුරු යානයන් යොදවා, සොඳුරු යානය–කට නැඟ, සොඳුරු සොඳුරු යානයන්ගෙන් උපලක්ෂිත වූ විසල්පුරෙන් නික්මුණා ය. සිය අරමැ කරා එළැඹියා ය. යානයට බිම යම් තාක් ද ඒ තාක් යානයෙන් ගොස් එයින් බැස පාගමන් ඇත්තී ම භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියා ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක හුන්නා ය. එක් පසෙක හුන් අම්බපාලිගණිකාවට භාග්‍යවතුන් වහන්සේ දහැමි කතායෙන් දෙලෝවැඩ දක්වා වදළ සේක. එය සිතට ගැන්වූ සේක. එහි සිත් තියුණු කළ සේක. එහි සිත සතුටු කරවූ සේක. මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් දහැමි කතායෙන් දෙලෝ වැඩ දක්වන ලද, එය සිතට ගන්වන ලද, එහි සිත තියුණු කරන ලද, එහි සතුටු කරන ලද අම්බපාලි ගණිකා තොමෝ 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ බික්සහන සමඟ ව සෙට දිනට මගේ ඛත ඉවසන සේක වා' යි අයැද සිටියා ය. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසා වදළ සේක. ඉක්බිති අම්බපාලි ගණිකා තොම භාග්‍යවතුන් වහන්සේ තම අයැදුම ඉවැසූ නියා දැන හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ඉක්මියා ය.

42. විසල්පුර වැසි ලිච්ඡවී රජදරුවෝ භාග්‍යවතුන් වහන්සේ විසල් පුර වැඩිසේක් විසල්පුර අම්බපාලිවනයෙහි වසන සේක් ලැ යි ඇසූහ. ඉක්බිති තෙල ලිච්ඡවීහු උතුම් උතුම් යාන යොදවා, උතුම් උතුම් යානනැඟ, උතුම් උතුම් යානයනගෙන් උපලක්ෂිත වූ විසල්පුරයෙන් නික්මුණාහ. ඔවුන් අතුරෙහි ඇතැම් ලිච්ඡවීහු නිල් අඟරා ඇත්තාහු නිල් වත් දරන්නාහු නිල්මණින් හා නිල්මලින් සැරහුණා හු නිල්වන් වෙති. ඇතැම් ලිච්ඡවීහු රන්වන් අඟරා ඇත්තාහු රන්වන් වත් දරන්නාහු රන්වන් මිණෙන් හා රන්වන් මලින් සැරහුණාහු රන්වන් වෙති. ඇතැම් ලිච්ඡවීහු රත් අඟරා ඇත්තාහු රත් වත් දරන්නාහු රත් මිණෙන් හා රත් මලින් සැරහුණාහු රත්වන් වෙති. ඇතැම් ලිච්ඡවීහු සුදු අඟරා ඇත්තාහු සුදු වත් දරන්නාහු සුදුමිණෙන් හා සුදු මලින් සැරහුණාහු සුදු වත් වෙත්.

43. ඉක්බිති අම්බපාලි ගණිකා තොම තමාට ඉදිරියෙන් රිය නැඟ යන තරුණ තරුණ ලිච්ඡවීන් ගේ යාන තම රියඟසින් ඔවුන් රියඟස් ද, තම රියසකින් ඔවුන් රියසක් ද, තම රියැ වියගසින් ඔවුන් රියැ වියගස් ද හැන ඉවත් කෙරෙමින් ගියා ය. එ කලැ ලිච්ඡවීහු අම්බපාලි ගණිකාවට 'හෙම්බා අම්බපාලිය, තරුණ තරුණ ලිච්ඡවීන්ගේ රියඟසින් රියඟස ද රියසකින් රියසක ද රියවියෙන් රියවිය ද ගටා ඉවත් කෙරෙමින් යුහු යුහු ව කුමට යෙයි ද? යි විවාළාහ. ''ආයුෂ්මත්‍රයිනි, එසේ ම ය. සෙට ඛතට මා විසින් බික්සහන හා භාග්‍යවතුන් වහන්සේ නිමන්තණ ලද සේකැ' යි ඕ කිවු ය. 'හෙම්බා අම්බපාලි ය, මේ ඛත (මේ ඛතට කළ නිමන්ත්‍රණය) කඹවණු ලක්ෂයක් ගෙන අපට දෙව' යි ලිච්ඡවීහු කීහ. 'ආයුෂ්මත්‍රයිනි, මම දනවු සහිත විසල්පුර දෙන්නාහු නුමුවු මෙසේ මහත් අනුසස් ඇති මේ ඛත (ඛතට කළ නිමන්ත්‍රණය) ඔබට පවරා නො දෙමි' යි ඕ කිවු ය. එ කලැ ඒ ලිච්ඡවීහු 'පින්වත්නි, ඒකාන්තයෙන් අපි ස්ත්‍රියක විසින් දිනන ලදුමහ, පින්වත්නි, ඒකාන්තයෙන් අපි ස්ත්‍රියක විසින් දිනන ලදුමහ' යි ඇඟිලි පෙළහ. (අසුර ගැසූහ.)

Free Distribution www.aathaapi.org

44. අථ ඛො තෙ ලිච්ඡවී යෙන අම්බපාලිවනං තෙන පායිංසු. අද්දසා ඛො භගවා තෙ ලිච්ඡවී දූරතොව ආගච්ඡන්තෙ. දිස්වා භික්ඛූ ආමන්තෙසි: 'යෙසං භික්ඛවෙ භික්ඛූනං දෙවා තාවතිංසා අදිට්ඨා,[1] ඔලොකෙථ භික්ඛවෙ, ලිච්ඡවිපරිසං, අවලොකෙථ[2] භික්ඛවෙ, ලිච්ඡවිපරිසං, උපසංහරථ භික්ඛවෙ ලිච්ඡවිපරිසං තාවතිංසසදිසන්ති[3].

45. අථ ඛොතෙ ලිච්ඡවී යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා, පත්තිකා'ව යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො ඉත ලිච්ඡවී භගවා ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො තෙ ලිච්ඡවී භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා භගවන්තං එතදවොචුං: 'අධිවාසෙතු නො භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා'ති. අථ ඛො භගවා තෙ ලිච්ඡවී එතදවොච. 'අධිවුත්ථං ඛො මෙ ලිච්ඡවී ස්වාතනාය අම්බපාලියා ගණිකාය[4] භත්තන්ති.' අථ ඛො තෙ ලිච්ඡවී අඞ්ගුලිං පොථෙසුං: 'ජිතම්හා වත හො අම්බකාය. ජිතම්හා වත හො අම්බකාය්‍යා'ති. අථ ඛො තෙ ලිච්ඡවී භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කමිංසු.

46. අථ ඛො අම්බපාලී ගණිකා තස්සා රත්තියා අච්චයෙන සකෙ ආරාමෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි: 'කාලො භන්තෙ, නිට්ඨිතං භත්තන්ති'. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන අම්බපාලියා ගණිකාය නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො අම්බපාලී ගණිකා බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි. අථ ඛො අම්බපාලී ගණිකා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නා ඛො අම්බපාලී ගණිකා භගවන්තං එතදවොච: ''ඉමාහං භන්තෙ, ආරාමං බුද්ධපමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස දම්මී''ති. පටිග්ගහෙසි භගවා ආරාමං. අථ ඛො භගවා අම්බපාලිං ගණිකං ධම්මියා කථාය සන්දස්සෙසිත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

47. තත්‍ර පි සුදං භගවා වෙසාලියං විහරන්තො අම්බපාලිවනෙ එතදෙව බහුලං භික්ඛූනං ධම්මිං කථං කරොති: 'ඉති සීලං, ඉති සමාධි, ඉති පඤ්ඤා. සීලපරිභාවිතො සමාධි මහප්ඵලො ඉොති මහානිසංසො. සමාධිපරිභාවිතා පඤ්ඤා මහප්ඵලා ඉොති මහානිසංසා පඤ්ඤාපරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති– සෙය්‍යථීදං: කාමාසවා භවාසවා අවිජ්ජාසවා''ති.

---

1. අදිට්ඨපුබ්බා– කත්ථචි. 2. අපලොකෙථ-සිමු 3. තාවතිංසා සදිසා–සිමු තාවතිංසපරිසා–ෆීස
4. අම්බපාලිගණිකාය–සිමු-ෆීස.

Free Distribution www.aathaapi.org

44. ඉක්බිති ඒ ලිච්ඡවීහු අම්බපාලිවනය කරා ගියහ. භාග්‍යවතුන් වහන්සේ දුරින් ම එන ඒ ලිච්ඡවීන් දුටු සේක් ම ය. දැක භික්ෂූන් අමතා 'මහණෙනි, යම් භික්ෂු කෙනෙකුන් විසින් තවුතිසාවැසි දෙවියෝ නොදක්නා ලදහු ද, මහණෙනි, ඒ තෙපි තෙල එන ලිච්ඡවී පිරිස බලවු. තෙල ලිච්ඡවී පිරිස පුනපුනා බලවු. තෙල ලිච්ඡවී පිරිස තවුතිසා වැසි දෙව්-පිරිසට ළං කොට (සම කොට) සලකවු' යැ යි වදළ සේක.

45. ඉක්බිති ඒ ලිච්ඡවීහු යානයට යොග්‍ය බිම යම්තාක් ද, ඒ තාක් යානයෙන් ගොස්, යානයෙන් බැස, පාගමන් ඇත්තාහු ම භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක හුන්හ. පසෙක හුන් ඒ ලිච්ඡවීනට භාග්‍යවතුන් වහන්සේ දැහැමි කතා යෙන් දෙලෝ වැඩ දක්වූ සේක. එහි සමාදන් කරවූ සේක. එහි සිත් තියුණු කරවූ සේක. එහි සතුටු කරවූ සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කතායෙන් දෙලෝ වැඩ දක්වන ලද, එහි සමාදන් කරවන ලද, එහි සිත් තියුණු කරවන ලද, එහි සතුටු කරවන ලද ඒ ලිච්ඡවීහු භාග්‍යවතුන් වහන්සේට 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ බික්සහන හා සෙට දවසට අපගේ බත ඉවසන සේක්ව'' යි කීහ. 'ලිච්ඡවීනි, මා දීසින් සෙට දවසට අම්බපාලි ගණිකාවගේ බත ඉවසන ලදැ' යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. එකල්හි ඒ ලිච්ඡවීහු 'භවත්නි, ඒකාන්තයෙන් ස්ත්‍රියක විසින් දිනන ලද්දමහ. භවත්නි, ඒකාන්තයෙන් ස්ත්‍රියක විසින් දිනන ලද්දමහ'යි ඇඟිලි පෙළූහ. ඉක්බිති ඒ ලිච්ඡවීහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගෙන, අනුමෝදන් ව, හුනස්නෙන් නැඟී, භාග්‍යවතුන් වහසේට වැඳ පැදකුණු කොට නික්මැ ගියහ.

46. ඉක්බිති අම්බපාලි ගණිකා බුදුපාමොක් බික්සහන ප්‍රණීත බාද්‍යයෙන් භෞජ්‍යයෙන් සියතින් සැතැප්වූවා ය. පෙරැත්ත කොට වැළැඳවූවා ය. ඉක්බිත්තෙන් අම්බපාලි ගණිකා තොම බොජුන් වැළැඳූ, පාත්‍රයෙන් ඉවතට ගන්නා ලද අත් ඇති භාග්‍යවතුන්වහන්සේට එකත්පස් වැ එක්තරා මිටි අස්නක් ගෙන උන්නා ය. එසේ එකත්පස්වැ හුන් අම්බපාලී ගණිකා තොම භාග්‍යවතුන් වහන්සේට 'වහන්ස, මේ අරම බුදුපාමොක් බික්සහනට දෙමි'' යි කීවා ය. භාග්‍යවතුන් වහන්සේ අරම පිළිගත් සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අම්බපාලී ගණිකාවට දැහැමි කතායෙන් දෙලෝ වැඩ දක්වා, එහි ඇය සමාදන් කරවා, එහි උත්සාහවත් කරවා සිත සතුටු කරවා හුනස්නෙන් නැඟී වැඩි සේක.

47. භාග්‍යවතුන් වහන්සේ ඒ අම්බපාලිවනයෙහිදු වසමින් ''ශීලය මෙසේ ය, සමාධිය මෙසේ ය, ප්‍රඥාව මෙසේ ය, ශීලයෙන් පුරුදු කරන ලද සමාධිය මහත් පල මහත් අනුසස් ඇත්තේ ය, සමාධියෙන් පුරුදු කරන ලද ප්‍රඥාව මහත් පල මහත් අනුසස් ඇත්තේ ය, ප්‍රඥායෙන් පුරුදු කරන ලද සිත කාමාස්‍රව භවාස්‍රව අවිද්‍යාස්‍රව යන ආස්‍රව කෙරෙන් මිදේ'' යැ යි වදළ සේක.

Free Distribution www.aathaapi.org

[බෙලුවගාමෙ ජීවිතසඞ්ඛාර-අධිට්ඨානං]

48. අථ ඛො භගවා අම්බපාලිවනෙ යථාභිරන්තං විහරිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: 'ආයාමානන්ද, යෙන බෙලුවගාමකො[2] තෙනුපසඞ්කමිස්සාමා'ති. 'එවං භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන බෙලුවගාමකො තදවසරි. තත්‍ර සුදං භගවා බෙලුවගාමකෙ විහරති. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: 'එථ තුම්හෙ භික්ඛවෙ සමන්තා වෙසාලිං යථාමිත්තං යථාසන්දිට්ඨං යථාසමභත්තං වස්සං උපෙථ.[3] අහං පන ඉධෙව බෙලුවගාමකෙ වස්සං උපගච්ඡාමී'ති. 'එවං භන්තෙ'ති ඛො තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා සමන්තා වෙසාලිං යථාමිත්තං යථාසන්දිට්ඨං යථාසමභත්තං වස්සං උපගච්ඡිංසු.[4] භගවා පන තත්‍රෙව බෙලුවගාමකෙ වස්සං උපගඤ්ඡි.[5]

49. අථ ඛො භගවතො වස්සූපගතස්ස ඛරො ආබාධො උප්පජ්ජි. බාළ්හා[6] වෙදනා වත්තන්ති මාරණන්තිකා. තා සුදං[7] භගවා සතො සම්පජානො අධිවාසෙසි[8] අවිහඤ්ඤමානො. අථ ඛො භගවතො එතදහොසි: 'න ඛො මෙතං පතිරූපං යොහං[9] අනාමන්තෙත්වා උපට්ඨාකෙ අනපලොකෙත්වා භික්ඛුසඞ්ඝං පරිනිබ්බායෙය්‍යං. යන්නූනාහං ඉමං ආබාධං වීරියෙන[10] පටිපනාමෙත්වා ජීවිතසඞ්ඛාරං අධිට්ඨාය විහරෙය්‍ය'න්ති. අථ ඛො භගවා තං ආබාධං වීරියෙන පටිපනාමෙත්වා ජීවිතසඞ්ඛාරං අධිට්ඨාය විහාසි. අථ ඛො භගවතො සො ආබාධො පටිපස්සම්භි. අථ ඛො භගවා ගිලානා වුට්ඨිතො අවිරවුට්ඨිතො ගෙලඤ්ඤා විහාරා නික්ඛම්ම විහාරපච්ඡායායං[11] පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

50. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "දිට්ඨා[12] මෙ භන්තෙ භගවතො ඵාසු. දිට්ඨං මෙ භන්තෙ භගවතො ඛමනීයං. අපි ච මෙ භන්තෙ මධුරකජාතො විය කායො. දීසා'පි මෙ න පඤ්ඤායන්ති, ධම්මා'පි මං නපපටිභන්ති භගවතො ගෙලඤ්ඤෙන. අපි ච මෙ භන්තෙ අහොසි කාචි දෙව අස්සාසමත්තා 'න තාව භගවා පරිනිබ්බායිස්සති න යාව භගවා භික්ඛුසඞ්ඝං ආරබ්භ කිඤ්චිදෙව උද්ධරති''ති.

---

1. පරිවෙසනා, PTS
2. වෙළුවගාමකො-මජ්ඣ, 3. උපගච්ඡථ-සබ්බා
4. උපගඤ්ඡුං-PTS
5. උපගච්ඡි-මජ්ඣ 6. පබාළ්හා-කත්ථචි
7. තත්‍ර සුදං-මජ්ඣ 8. අධිවාසෙසි-මජ්ඣ 9. යවාහං-මජ්ඣ
10. විරියෙන-මජ්ඣ 11. විහාරපච්ඡායාය-සබ්බා
12. දිට්ඨා-කත්ථචි

Free Distribution www.aathaapi.org

[බෙලුවගමෙහි ජීවිතසංස්කාර-අධිෂ්ඨානය]

48. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ අම්බපාලිවනයෙහි කැමැති තාක් වැස, අනඳ තෙරුන් ඛණවා 'අනඳයෙනි, එව, බෙලුවගම කරා යන්නෙමු' යි වදළ සේක. 'එසේ ය, වහන්ස' යි අනඳ තෙරණුවෝ පිළිවදන් දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහත් බික්සඟන හා බෙලුව ගමට වැඩි සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ එහි බෙලුව ගමෙහි වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි, තෙපි මෙහි එව. විසල්පුර හාත්පසැ ඒ ඒ මිතුරු පැවිද්දන් ද, දැක හඳුනන පැවිද්දන් ද, දැඩිමිතුරු පැවිද්දන් ද වසන තන්හි වස් එළැඹෙව. මම මේ බෙලුව ගමෙහි ම වස් එළැඹෙමි" යි වදළ සේක. 'එසේ ය, වහන්ස' යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී ඒ මහණහු විසල්පුර හාත්පසැ ඒ ඒ මිතුරන් දැක හඳුනන්නන් දැඩි මිතුරන් වසන තන්හි වස් එළැඹියහ. භාග්‍යවතුන් වහන්සේ ඒ බෙලුව ගමෙහි වස් එළැඹි සේක.

49. එකල්හි වස් එළැඹි භාග්‍යවතුන් වහන්සේට දරුණු ආබාධයෙක් උපන. මරණය වෙතට පැමිණෙවීමෙහි සමත් වූ දැඩි වේදනා පැවැත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ සිහි ඇති ව නුවණින් සලකමින් එයින් නො පෙළෙමින් ඒ වේදනාව ඉවැසූ සේක. එ කල්හි භාග්‍යවතුන් වහන්සේට 'යම්බඳු වූ මම උවටුවන් නො අමතා බික්සඟනට නො දන්වා පිරිනිවෙන්නෙම් නම් එය මට නො සුදුසු ය. මම මේ ආබාධය වීර්‍යයෙන් මැඩලා ජීවිතසංස්කාරය (දිවි පවත්වනුවට සමත් පලසමවත) ඉටා වසන්නෙම් නම් මැනැවැ' යි මේ සිත විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ ආබාධය වීර්‍යයෙන් මැඩ ජීවිතසංස්කාරය ඉටා වූසූ සේක. එ කල්හි භාග්‍යවතුන් වහන්සේගේ ඒ ආබාධය සන්හිඳුණේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ගිලන් බැවින් නැඟී සිටි සේක්, ගිලන් බැවින් නැඟි නොබෝ කල් ඇති සේක්, වෙහෙරෙන් බැහැර වෙහෙර ඉදිරිපසැ සෙවණෙහි පනවන ලද අස්නෙහි වැඩ හුන්සේක.

50. එකල්හි අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියෝ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක හුන්හ. එක් පසෙක හුන් අනඳ තෙරණුවෝ වහන්ස, "භාග්‍යවතුන් වහන්සේගේ පහසුව දක්නා ලදි. භාග්‍යවතුන් වහන්සේගේ සහනය දක්නා ලදි. එහෙත් මගේ සිරුර හටගත් තදබව ඇත්තක්හු මෙන් විය. භාග්‍යවතුන් වහන්සේගේ ගිලන්බව හෙතු කොට ගෙන දිශාවෝ ද මට නො පෙනෙත්. සතිපට්ඨාන ධර්මයෝ ද මට නො වැටහෙත්. වහන්ස, එතෙකුදු වුවත් යම්තාක් භාග්‍යවතුන් වහන්සේ බික්සඟන ඇරැබ කිසි පශ්චිමාවවාදයක් වදරන සේක් ද, ඒතාක් ම නො පිරිනිවෙන සේකැ යි කිසි ආස්වාදමාත්‍රයෙක් මට වී යැ" යි සැළ කළහ.

Free Distribution www.aathaapi.org

51. කිම්පනානන්ද භික්ඛුසඞ්ඝො මයි පච්චාසිංසති:[1] දෙසිතො ආනන්ද, මයා ධම්මො අනන්තරං අබාහිරං කරිත්වා. නත්ථානන්ද[2], තථාගතස්ස ධම්මෙසු ආචරියමුට්ඨි. යස්ස නූන ආනන්ද එවමස්ස: 'අහං භික්ඛුසඞ්ඝං පරිහරිස්සාමී'ති වා, මමුද්දෙසිකො භික්ඛුසඞ්ඝො'ති වා, සො නූන ආනන්ද, භික්ඛුසඞ්ඝං ආරබ්භ කිඤ්චිදෙව උද්දහරෙය්‍ය. තථාගතස්ස ඛො ආනන්ද න එවං හොති: 'අහං භික්ඛුසඞ්ඝං පරිහරිස්සාමී'ති වා මමුද්දෙසිකො භික්ඛුසඞ්ඝො'ති වා. ස කිං[3] ආනන්ද තථාගතො භික්ඛුසඞ්ඝං ආරබ්භ කිඤ්චිදෙව උද්දහරිස්සති?

52. අහං ඛො පනානන්ද, එතරහි ජිණ්ණො වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො. ආසීතිකො මෙ වයො වත්තති. සෙය්‍යථාපි ආනන්ද, ජ්ජ්‍රසකටං වෙක්ඛමිස්සකෙන[4] යාපෙති, එවමෙව ඛො ආනන්ද වෙක්ඛමිස්සකෙන මඤ්ඤෙ තථාගතස්ස කායො යාපෙති. යස්මිං ආනන්ද, සමයෙ තථාගතො සබ්බනිමිත්තානං අමනසිකාරා එකච්චානං වෙදනානං නිරොධා අනිමිත්තං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරති, ඵාසුතරො[5] ආනන්ද, තස්මිං සමයෙ තථාගතස්ස කායො හොති. තස්මාතිහානන්ද, අත්තදීපා විහරථ අත්තසරණා අනඤ්ඤසරණා, ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා.

53. කථඤ්ච ආනන්ද, භික්ඛු අත්තදීපො විහරති අත්තසරණො අනඤ්ඤසරණො, ධම්මදීපො ධම්මසරණො අනඤ්ඤසරණො: ඉධානන්ද භික්ඛු කායෙ කායානුපසසී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපසසී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

54. එවං ඛො ආනන්ද, භික්ඛු අත්තදීපො විහරති අත්තසරණො අනඤ්ඤසරණො, ධම්මදීපො ධම්මසරණො අනඤ්ඤසරණො. යෙ හි කෙචි ආනන්ද, එතරහි වා මමං වා අච්චයෙන අත්තදීපා විහරිස්සන්ති අත්තසරණා අනඤ්ඤසරණා. ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා, තමතග්ගෙ මෙ තෙ ආනන්ද, භික්ඛු භවිස්සන්ති යෙ කෙචි සික්ඛාකාමා'ති.

දුතියභාණවාරං.

---

1. පච්චාසිසති, මජ්ඣං 2. න නත්ථානන්ද, PTS 3. කිං, PTS.
4. වෙධමිස්සකෙන, සිමු; නා: වෙඨමිස්සකෙන, කත්ථචි. වෙඑමිස්සකෙන, ස්‍යා වෙසමිස්සකෙන, PTS වෙබමිස්සකෙන, දී අ; මජ්ඣං
5. ඵාසුකතො, PTS

Free Distribution www.aathaapi.org

51. අනඳයෙනි, භික්ෂුසංඝ තෙම මා කෙරෙහි කුමක් නම් අපෙක්ෂා කෙරෙයි ද? අනඳයෙනි, මා විසින් අභ්‍යන්තර බාහිර යැ යි (ධර්ම වශයෙන් හෝ පුද්ගල වශයෙන් දෙ කොටසක් නො කොට) දහම් දෙසන ලදී. අනඳයෙනි, ධර්මවිෂයයෙහි තථාගතයන් ගේ ආචාර්‍යමුෂ්ටියෙක් නැත. අනඳයෙනි, යම්කුට 'මම් භික්ෂූන පරිහරණය කරන්නෙමි' යි කියා හෝ, 'භික්ෂූන මා උදෙසා වසන්නේ වේව' යි කියා හෝ මේ සිත වන්නේ ද, අනඳයෙනි, හෙ තෙම භික්ෂූන ඇරැබ කිසිවක් ම කියන්නේ ය. අනඳයෙනි, තථාගතයනට "මම භික්ෂූන පරිහරණය කරන්නෙමි" කියා හෝ, "භික්ෂූන මා උදෙසා ම (මා බලා ම) සිටුනේ වේ ව" යි කියා හෝ මෙසේ සිතෙක් නො ම වෙයි. අනඳයෙනි, කවර හෙයින් ඒ තථාගතයෝ භික්ෂූන ඇරැබැ කිසිවක් නම් කියන්නෝ ද?

52. අනඳයෙනි, මම දැන් ජීර්ණයෙමි, වෘද්ධයෙමි, මහලුයෙමි. දික් කලක් ඉක්මියෙමි, පැසිම වියට පැමිණියෙමි. මා වයස දැන් අසූවෙක් වෙයි. අනඳයෙනි, දිරූ ගැලක් චක්‍රබන්ධනාදි පිළිසකරින් යැපෙන්නේ ද, එසේ ම තථාගතයන්ගේ කය රහත්පලසමවත් නැමැති පිළිසකරින් යැපෙන්නේ ය. අනඳයෙනි, තථාගතයෝ රූපනිමිත්තාදි සියලු නිමිති නො මෙනෙහි කිරීමෙන් ඇතැම් වේදනාවන්ගේ නිරෝධයෙන් නිමිති රහිත චිත්තවිමුක්තියට පැමිණ වෙසෙත් ද, අනඳයෙනි, එසමයෙහි තථාගතයන්ගේ කය අතිශයින් පහසු ඇතියෙක් වෙයි. අනඳයෙනි, එහෙයින් තෙපි (ඒ පලසමවත් පිණිස) තමන් ම ද්වීප (පිහිට) කොට ගෙන, තමන් ම ශරණ කොට ඇති ව, අනන්‍යශරණ ව (බාහිර සරණක් නැත්තෝ ව) වසවු ධර්මය ම ද්වීප කොට ඇති ව, ධර්මය ම සරණ කොට ඇති ව, අනන්‍යශරණ ව (අන් සරණක් අපෙක්ෂා නොකරන්නෝ ව) වසවු.

53. අනඳයෙනි, මහණ තෙම කෙසේ නම් තමා ම ද්වීප කොට ඇත්තේ, තමා ම සරණ කොට ඇත්තේ, අනන්‍යශරණ ව, ධර්මය ද්වීප කොට ඇත්තේ, ධර්මශරණ ව අනන්‍යශරණ ව වෙසේ ද යත්: අනඳයෙනි, මෙහි මහණ තෙම කෙලෙස් තවන වැර ඇති ව, මනා නුවණින් දන්නේ, සිහි ඇත්තේ, ලොව කෙරෙහි අභිධ්‍යා ව්‍යාපාද දුරු ලා කයෙහි කායානුපස්සී ව වෙසෙයි. වේදනාවන්හි වේදනානුපස්සී ව . . සිත්හි චිත්තානුපස්සී ව වෙසෙයි. කෙලෙස් තවන වැර ඇති ව, නුවණින් දන්නේ, සිහි ඇත්තේ, ලොවෙහි අභිධ්‍යා ව්‍යාපාද දුරලා (නීවරණාදී) ධර්මයන්හි ධම්මානුපස්සී ව වෙසෙයි.

54. අනඳයෙනි, මෙසේ මහණ තෙම තමා ද්වීප කොට ඇති ව, තමා ශරණ කොට ඇති ව අන් සරණක් නැති ව, ධර්මය ද්වීප කොට ඇති ව, ධර්මය ශරණ කොටඇති ව අන්සරණක් නැති ව වෙසෙයි. අනඳයෙනි, යම් භික්ෂු කෙනෙක් දැන් හෝ මා ඇවැමෙන් හෝ තමන් ද්වීප කොට ඇත්තාහු තමන් සරණ කොට ඇත්තාහු අන් සරණක් නැත්තාහු, ධර්මය ද්වීප කොට ඇත්තාහු ධර්මය සරණ කොට ඇත්තාහු අන් සරණක් නැත්තාහු වසන්නෝ නම්, අනඳයෙනි, ශික්ෂාකාමී වූ සියලු භික්ෂූන් අතුරෙන යතර සිවටන් වඩන ඒ මාගේ ශ්‍රාවක භික්ෂූහු තමොයොග සිද අග්‍රතම (අත්‍යග්‍ර) වන්නාහ.

දෙවෙනි බණවර නිමියේ ය.

Free Distribution www.aathaapi.org

[චාපාලචෛත්‍යෙ ආයුසඞ්ඛාරොසජ්ජනං]

55. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය වෙසාලිං පිණ්ඩාය පාවිසි. වෙසාලියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තෝ ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ''ගණ්හාහි ආනන්ද නිසීදනං, යෙන චාපාලං චෛත්‍යං[1] තෙනුපසඞ්කමිස්සාම දිවාවිහාරායා''ති. ''එවං භන්තෙ''ති ඛො ආයස්මා ආනන්දෝ භගවතෝ පටිස්සුත්වා නිසීදනං ආදාය භගවන්තං පිට්ඨිතෝ පිට්ඨිතෝ අනුබන්ධි. අථ ඛො භගවා යෙන චාපාලං චෛත්‍යං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. ආයස්මා පි ඛො ආනන්දෝ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච:

56. ''රමණීයා ආනන්ද වෙසාලී, රමණීයං උදෙනං චෛත්‍යං, රමණීයං ගොතමකං චෛත්‍යං, රමණීයං සත්තම්බ[2] චෛත්‍යං, රමණීයං බහුපුත්තකං චෛත්‍යං, රමණීයං සාරන්දදං චෛත්‍යං[3] රමණීයං චාපාලං චෛත්‍යං. යස්ස කස්සචි ආනන්ද චත්තාරො ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, සො ආකඞ්ඛමානො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා. තථාගතස්ස ඛො පන ආනන්ද චත්තාරො ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා. සො ආකඞ්ඛමානො ආනන්ද තථාගතො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා''ති.

57. එවං ඛො[4] ආයස්මා ආනන්දෝ භගවතා ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ ඔළාරිකෙ ඔභාසෙ කයිරමානෙ නාසක්ඛි පටිවිජ්ඣිතුං. න භගවන්තං යාචි ''තිට්ඨතු භන්තෙ භගවා කප්පං, තිට්ඨතු සුගතෝ කප්පං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති'' යථා තං මාරෙන පරියුට්ඨිතචිත්තෙන.

58. දුතියම්පි ඛො භගවා -පෙ- තතියම්පි ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ''රමණීයා ආනන්ද වෙසාලි, රමණීයං උදෙනං චෛත්‍යං, රමණීයං ගොතමකං චෛත්‍යං, රමණීයං සත්තම්බං චෛත්‍යං, රමණීයං බහුපුත්තකං චෛත්‍යං, රමණීයං සාරන්දදං චෛත්‍යං, රමණීයං චාපාලං චෛත්‍යං.-

1. චාපාලචෛත්‍යං. සීමු පාචලං චෛත්‍යං, ස්‍යා
2. සත්තම්බකං චෛත්‍යං. PTS
3. ආනන්දචෛත්‍යං සීමු.
4. එවම්පි. සත

Free Distribution www.aathaapi.org

චාපාල චෛත්‍යයෙහිදී ආයුසංස්කාර හැරලීම

55. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරෙව පා සිවුරු ගෙන විසල්පුරට පිඬු පිණිස පිවිසි සේක. විසල්පුර පිඬු පිණිස හැසිර පසුබත්හි පිණ්ඩපාතයෙන් පෙරළා වැඩි සේක්, අනඳතෙරුන් ඔබවා "අනඳයෙනි, නිසීදනය ගනුව, දිවාවිහරණය පිණිස චාපාල චෛත්‍යය කරා එළැඹෙන්නමු" යි වදළ සේක. 'එසේ ය, වහන්සැ' යි කියා අනඳතෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී නිසීදනය ගෙන භාග්‍යවතුන් වහන්සේ අනුව පසුපසින් ගියහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ චාපාලචෛත්‍යය කරා එළැඹි සේක. එළැඹි පනවන ලද අස්නෑ වැඩ හුන් සේක. අනඳ තෙරණුවෝ ද භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්හ. එකත්පසෙක හුන් අනඳ තෙරුනට භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:

56. "අනඳයෙනි, විසල්පුර රම්‍ය ය, උදෙන චෛත්‍යය (සමවත් සුවයට) රම්‍ය ය, ගෞතමක චෛත්‍යය රම්‍ය ය, සත්තම්බ චෛත්‍යය රම්‍ය ය, බහුපුත්‍ර චෛත්‍යය රම්‍ය ය, සාරන්දද චෛත්‍යය රම්‍ය ය, චාපාල චෛත්‍යය රම්‍ය ය. අනඳයෙනි, යමකු විසින් සතර ඉදුපාහු වඩන ලදහු ද, පුනපුනා වඩන ලදහු ද, යුක්ත යානයක් සේ කරන ලදහු ද, තහවුරු කොට පිහිටුවන ලදහු ද, අනුෂ්ඨිත ද, පුරුදු කරන ලදහු ද, මොනොවට සම්පූර්ණ කරන ලදහු ද, හේ කැමැත්තේ ආයුෂ්කල්පයක් හෝ ආයුෂ්කල්පයකට මදක් වැඩි වූ කලක් හෝ සිටුනේ ය. අනඳයෙනි, තථාගතයන් විසින් සතර ඉදුපාහු භාවිතය හ, බහුලීකෘතය හ, යානීකෘතය හ, වාස්තුකෘතය හ, අනුෂ්ඨිතය හ, පරිචිතය හ, සුසමාරබ්ධය හ. අනඳයෙනි, ඒ තථාගතයෝ කැමැත්තාහු නම්, කල්පයක් හෝ කල්පාවශෙෂයක් හෝ සිටුනාහ" යනු යි.

57. භාග්‍යවතුන් වහන්සේ විසින් (පිරිනිවන්පෑනා බවට) මෙසේ ඔදෙරික නිමිති ඔදෙරික අවභාස කරනු ලබන කල්හි ද, මරහු විසින් මඩනා ලද සිතැතියක්හු සේ, අනඳ තෙරණුවෝ එය දැන ගන්නට නො හැකි වූහ. 'වහන්ස, බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව්මිනිස්සනට වැඩ පිණිස, හිත පිණිස, සුව පිණිස භාග්‍යවතුන් වහන්සේ කල්පයක් වැඩ සිටින සේක්ව'යි, 'සුගතයන් වහන්සේ කල්පයක් වැඩ සිටින සේක්ව' යි භාග්‍යවතුන් වහන්සේ නො යැදූහ.

58. භාග්‍යවතුන් වහන්සේ දෙවෙනි වර ද . . . තෙවෙනි වර ද "අනඳයෙනි, විසල්පුර සිත්කලු ය, උදෙන චෛත්‍යය සිත්කලු ය, ගෞතම චෛත්‍යය සිත්කලු ය, සත්තම්බ චෛත්‍යය සිත්කලු ය, බහුපුත්‍ර චෛත්‍යය සිත්කලු ය, සාරන්දද චෛත්‍යය සිත්කලු ය, චාපාල චෛත්‍යය සිත්කලු ය.

Free Distribution www.aathaapi.org

යස්ස කස්සචි ආනන්ද චත්තාරො ඉද්ධිපාද භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, සො ආකඞ්ඛමානො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා. තථාගතස්ස ඛො ආනන්ද චත්තාරො ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා. සො ආකඞ්ඛමානො ආනන්ද තථාගතො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා''ති.

59. එවම්පි ඛො ආයස්මා ආනන්දෙ භගවතා ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ ඔළාරිකෙ ඔභාසෙ කයිරමානෙ නාසක්ඛි පටිවිජ්ඣිතුං. න භගවන්තං යාචි ''තිට්ඨතු භන්තෙ භගවා කප්පං, තිට්ඨතු සුගතො කප්පං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති'' යථා තං මාරෙන පරියුට්ඨිතචිත්තො.

60. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ''ගච්ඡ ත්වං, ආනන්ද, යස්සදානි කාලං මඤ්ඤසී''ති. 'එවං භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දෙ භගවතො පටිසුත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා අවිදූරෙ අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි. අථ ඛො මාරො පාපිමා අචිරපක්කන්තෙ ආයස්මන්තෙ ආනන්දෙ යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො මාරො පාපිමා භගවන්තං එතදවොච:

61. ''පරිනිබ්බාතු'දානි භන්තෙ භගවා. පරිනිබ්බාතු සුගතො. පරිනිබ්බානකාලො'දානි භන්තෙ භගවතො. ''භාසිතා ඛො පනෙසා භන්තෙ භගවතා වාචා: 'න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි යාව මෙ භික්ඛූ න සාවකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරද බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො, සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානීකරිස්සන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්ති. එතරහි ඛො පන භන්තෙ භික්ඛූ භගවතො සාවකා වියත්තා විනීතා විසාරද බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛන්ති දෙසෙන්ති පඤ්ඤපෙන්ති පට්ඨපෙන්ති විවරන්ති විභජන්ති උත්තානීකරොන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙන්ති. පරිනිබ්බාතු'දානි භන්තෙ භගවා. පරිනිබ්බාතු සුගතො. පරිනිබ්බානකාලො' දානි භන්තෙ භගවතො.''

Free Distribution www.aathaapi.org

අනඳයෙනි, යමක්හු විසින් සතර ඉද්ධිපාදයහු භාවිත ද, බහුලීකෘත ද, යානීකෘත ද, වාස්තුකෘත ද අනුෂ්ඨිත ද, පරිචිත ද, සුසමාරබ්ධ ද, හේ කැමැත්තේ කල්පයක් හෝ කල්පාවශේෂයක් හෝ සිටුනේ ය. අනඳයෙනි, තථාගතයන් විසින් සතර ඉද්ධිපාදයහු භාවිතයහ, බහුලීකෘතයහ, යානීකෘතයහ, වාස්තුකෘතයහ, අනුෂ්ඨිතයහ, පරිචිතයහ, සුසමාරබ්ධයහ. අනඳයෙනි, ඒ තථාගතයෝ කැමැති වන්නාහු නම්, කල්පයක් හෝ කල්පාවශේෂයක් හෝ සිටුනාහ''යි අනඳ තෙරුනට වදළ සේක.

59. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ ඖදාරික නිමිත්තය ඖදාරිකාවභාසය කරනු ලබන කල්හි දු මරහු විසින් මඩනා ලද සිතැත්තක්හු සෙයින් අනඳ තෙරණුවෝ එය දැනගනනට නො හැකි වූහ. භාග්‍යවතුන් වහන්සේට ''වහන්ස, බොහෝ දෙනාට වැඩ පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙවිමිනිස්නට වැඩ පිණිස, හිත පිණිස, සුව පිණිස භාග්‍යවතුන් වහන්සේ කල්පයක් වැඩසිටුනා සේක් වා. සුගතයන් වහන්සේ කල්පයක් වැඩසිටුනා සේක් වා'' යි යාච්ඤා නො කළහ.

60. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් බණවා, ''අනඳයෙනි, දැන් යම් විවේකයකට කල් සලකවු නම්, ඒ සඳහා යවු'' යි වදළ සේක. 'එසේ ය, වහන්ස' යි කියා අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී, හුනස්නෙන් නැඟී, භාග්‍යවතුන් වහන්සේ වැඳ, පැදකුණු කොට, නොදුරෙහි එක්තරා රුක්මුලෙක හුන්හ. එ කල්හි අනඳ තෙරුන් ගිය නොබෝ කල්හි පවිටු වූ වසවත් මර තෙම භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹි පසෙක සිටියේ ය. පසෙක සිටියා වූ මර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කී:

61. ''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දැන් පිරිනිවෙන සේක් වා. සුගතයන් වහන්සේ පිරිනිවෙන සේක් වා. වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේට පිරිනිවෙන්නට කල් ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'පවිටු මරුව, යමතාක් මාගේ භික්ෂූහු ව්‍යක්ත වූ විනීත වූ විශාරද වූ බහුශ්‍රැත වූ ධර්මධර වූ ධර්මානුධර්මප්‍රතිපන්න වූ සාමීචිප්‍රතිපන්න වූ අනුධර්මචාරී වූ ශ්‍රාවකයෝ නො වන්නාහු ද, ස්වකීය ආචාර්‍යවාදය ඉගෙන නො කියන්නාහු ද, නො දෙසන්නාහු ද, නො ඳනවන්නාහු ද, නො පිහිටුවන්නාහු ද, විවෘත කොට නො දක්වන්නාහු ද, බෙද නො දක්වන්නාහු ද, ප්‍රකට කොට නො දක්වන්නාහු ද, පහළ වූ පරප්‍රවාදය කරුණු සහිත ව මැඩලා ප්‍රාතිහාර්‍ය සහිත (තෛර්‍යාණික කොට) දහම් නො දෙසන්නාහු ද, ඒ තාක් නො පිරිනිවෙන්නෙමි'' යි මේ වචනය භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදි. වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක භික්ෂූහු ව්‍යක්තහ, විනීතහ, විශාරදහ, බහුශ්‍රැතහ, ධර්මධරහ, ධර්මානුධර්මප්‍රතිපන්නහ, සාමීචිප්‍රතිපන්නහ, අනුධර්මාචාරීහ, ස්වකීය ආචාර්‍යවාදය ඉගෙන කියත්, දෙසත්, ඳනවත්, පිහිටුවත්, විවෘත කෙරෙත්, විභාග කොට දක්වත්, හෙළි කෙරෙත්, උපන් පරප්‍රවාදය කරුණු සහිත ව මොනොවට මැඩ තෛර්‍යාණික කොට දහම් දෙසත්. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවෙන සේක් වා. සුගතයන් වහන්සේ පිරිනිවෙන සේක් වා. වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේට පිරිනිවනට කල් ය.''

Free Distribution www.aathaapi.org

62. ''භාසිතා ඛො පනෙසා භග්ගෙන භගවතා වාචා: 'න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි යාව මෙ භික්ඛුනියො න සාවිකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනියො, සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානිං කරිස්සන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්ති'ති. එතරහි ඛො පන භග්ගෙන භික්ඛුනියො භගවතො සාවිකා වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනියො, සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛන්ති දෙසෙන්ති පඤ්ඤපෙන්ති පට්ඨපෙන්ති විවරන්ති විභජන්ති උත්තානිකරොන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙන්ති. පරිනිබ්බාතු'දානි භග්ගෙන භගවා. පරිනිබ්බාතු සුගතො. පරිනිබ්බානකාලො'දානි භග්ගෙන භගවතො''

63. ''භාසිතා ඛො පනෙසා භග්ගෙන භගවතා වාචා: 'න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි යාව මෙ උපාසකා න සාවකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො, සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානිං කරිස්සන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්ති'ති. එතරහි ඛො පන භග්ගෙන උපාසකා භගවතො සාවකා වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො, සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛන්ති දෙසෙන්ති පඤ්ඤපෙන්ති පට්ඨපෙන්ති විවරන්ති විභජන්ති උත්තානිං කරොන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙන්ති. පරිනිබ්බාතු' දානි භග්ගෙන භගවා. පරිනිබ්බාතු සුගතො. පරිනිබ්බානකාලො'දානි භග්ගෙන භගවතො.''–

64. ''භාසිතා ඛො පනෙසා භග්ගෙන භගවතා වාචා: 'න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි යාව මෙ උපාසිකා න සාවිකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනියො, සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානිකරිස්සන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්ති'ති.–

Free Distribution www.aathaapi.org

62. ''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'පවිටු මරුව, යම්තාක් මගේ භික්ෂුණීහු ව්‍යක්ත වූ විනීත වූ විශාරද වූ බහුශ්‍රැත වූ ධර්මධර වූ ධර්මානුධර්මප්‍රතිපන්න වූ සාමීචි ප්‍රතිපන්න වූ අනුධර්මචාරී වූ ශ්‍රාවිකාවෝ නො වන්නාහු ද, ස්වකීය ආචාර්‍ය්‍ය වාදය ඉඟෙන නො කියන්නාහු ද, නො දෙසන්නාහු ද, නො පනවන්නාහු ද, නො පිහිටුවන්නාහු ද, විවෘත කොට නො දක්වන්නාහු ද, බෙද නො දක්වන්නාහු ද, ප්‍රකට කොට නො දක්වන්නාහු ද, පහළ වූ පරප්‍රවාදය කරුණු සහිත ව මැඩලා නෛර්‍යාණික කොට දහම් නො දෙසන්නාහු ද, ඒ තාක් නො පිරිනිවෙන්නෙමි' යි මේ වචනය භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදී. වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවිකා මෙහෙණියෝ ව්‍යක්ත ය, විනීත ය, විශාරද ය, බහුශ්‍රැත ය, ධර්මධර ය, ධර්මානුධර්ම ප්‍රතිපන්න ය, සාමීචිප්‍රතිපන්න ය, අනුධර්මචාරී ය, ස්වකීය ආචාර්‍ය්‍ය-වාදය ඉඟෙන කියත්, දෙසත්, පනවත්, පිහිටුවත්, මතු කෙරෙත්, බෙද දක්වත්, උපන් පරප්‍රවාදය කරුණු සහිතව මොනෙවට මැඩ නෛර්‍යාණික කොට දහම් දෙසත්. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දැන් පිරිනිවෙන සේක් වා. සුගතයන් වහන්සේ දැන් පිරිනිවෙන සේක් වා වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේට පිරිනිවෙන්නට කල් ය.''

63. ''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'පවිටු මරුව, යම්තාක් මගේ ශ්‍රාවක උපාසකයෝ ව්‍යක්ත විනීත විසාරද බහුශ්‍රැත ධර්මධර ධර්මානු ධර්මප්‍රතිපන්න සාමීචිප්‍රතිපන්න අනුධර්මචාරීහු නො වන්නාහු ද, ස්වකීය ආචාර්‍ය්‍යවාදය ඉඟෙන නො කියන්නාහු ද, නො දෙසන්නාහු ද නො පිහිටුවන්නාහු ද, විවෘත කොට නො දක්වන්නාහු ද, බෙද නො දක්වන්නාහු ද, නො හෙළි කරන්නාහු ද. පහළ වූ පරප්‍රවාදය කරුණු සහිත ව මැඩලා නෛර්‍යාණික කොට දහම් නො දෙසන්නාහු ද, ඒ තාක් නො පිරිනිවෙන්නෙමි' යි මේ වචනය භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදී. වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක වූ උපාසකයෝ ව්‍යක්ත ය, විනීත ය, විශාරද ය, බහුශ්‍රැත ය, ධර්මධර ය, ධර්මානු-ධර්මප්‍රතිපන්න ය, සාමීචිප්‍රතිපන්න ය, අනුධර්මචාරී ය, ස්වකීය ආචාර්‍ය්‍යවාදය ඉඟෙන කියත්, දෙසත්, පණවත්, පිහිටුවත්, මතු කෙරෙත්, බෙද දක්වත්. උපන්පරප්‍රසාද කරුණු සහිතව මොනොවට මැඩ, නෛර්‍යාණික කොට දහම් දෙසත්. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දැන් පිරිනිවෙන සේක් වා, සුගතයන් වහන්සේ දැන් පිරිනිවෙන සේක් වා. වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේට පිරිනිවෙන්නට කල් ය.''

64. ''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'පවිටු මරුව, යම්තාක් මගේ ශ්‍රාවිකා වූ උවැසියෝ ව්‍යක්ත විනීත විසාරද බහුශ්‍රැත ධර්මධර ධර්මානුධර්මප්‍රතිපන්න සාමීචිප්‍රතිපන්න අනුධර්මචාරිණීහු නො වන්නාහු ද, ස්වකීය ආචාර්‍යවාදය ඉඟෙන නො කියන්නාහු ද, නො දෙසන්නෝ ද, නො පණවන්නෝ ද, නො පිහිටුවන්නෝ ද, විවෘත කොට නො දක්වන්නෝ ද, බෙද නො දක්වන්නෝ ද, නො හෙළි කරන්නෝ ද, පහළ වූ පර-ප්‍රවාදය කරුණු සහිත ව මැඩලා නෛර්‍යාණික කොට දහම් නො දෙසන්නෝ ද, ඒ තාක් නො පිරිනිවෙන්නෙමි' යි මේ වචනය භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදී.

Free Distribution www.aathaapi.org

එතරහි ඛො පන භන්තෙ උපාසිකා භගවතො සාවිකා වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා අනුධම්ම-චාරිනියො, සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛන්ති දෙසෙන්ති පඤ්ඤ-පෙන්ති පටඨපෙන්ති විවරන්ති විභජන්ති උත්තානීකරොන්ති, උපපන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙන්ති පරිනිබ්බාතු'දානි භන්තෙ භගවා. පරිනිබ්බාතු සුගතො. පරිනිබ්බානකාලො'දානි භන්තෙ භගවතො.''

65. භාසිතා ඛො පනෙසා භන්තෙ භගවතා වාචා: 'න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි යාව මෙ ඉදං බ්‍රහ්මචරියං න ඉද්ධං චෙව භවිස්සති ඵීතඤ්ච විත්ථාරිකං[1] බාහුජඤ්ඤං පුථුභූතං, යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතන්ති', එතරහි ඛො පන භන්තෙ භගවතො බ්‍රහ්මචරියං ඉද්ධඤ්චෙව ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතං. පරිනිබ්බාතු'දානි භන්තෙ භගව. පරිනිබ්බාතු සුගතො. පරිනිබ්බානකාලො'දානි භන්තෙ භගවතො''ති.

66. එවං වුත්තෙ භගවා මාරං පාපිමන්තං එතදවොච: අප්පොස්සුක්කො ත්වං පාපිම හොහි. න චිරං තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති. ඉතො තිණ්ණං මාසානං අච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සතී''ති.

67. අථ ඛො භගවා චාපාලෙ චෙතියෙ සතො සම්පජානො ආයු-සඞ්ඛාරං ඔස්සජී. ඔස්සට්ඨෙ ච භගවතා ආයුසඞ්ඛාරෙ මහාභූමිචාලො අහොසි භිංසනකො සලොමහංසො[2]. දෙවදුන්දුභියොත[3] ච ඵලිංසු. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

තුලමතුලඤ්ච සම්භවං
භවසඞ්ඛාරමවස්සජී මුනි,
අජ්ඣත්තරතො සමාහිතො
අභින්දි කවචමිවත්තසම්භවන්ති.

[භූමිචාලස්ස අට්ඨ හෙතූ]

68. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: අච්ඡරියං වත භො, අබ්භුතං වත භො. මහා වතායං භූමිචාලො, සුමහා වතායං භූමිචාලො, භිංසනකො සලොමහංසො. දෙවදුන්දුභියො ච ඵලිංසු. කො නු ඛො හෙතු කො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවාය ති. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ. මහා වතායං භන්තෙ භූමිචාලො, සුමහා වතායං භන්තෙ භූමිචාලො භිංසනකො සලොමහංසො. දෙවදුන්දුභියොත ච ඵලිංසු. කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො මහතො භූමිචාලස්ස පාතුභාවාය?'' ති.

1. විත්ථාරිකං, සීමු 2. ලොමහංසො, මජ්ඣං 3. දෙවදුභියොත, සීමු

Free Distribution www.aathaapi.org

වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවිකා වූ උවැසියෝ ව්‍යක්ත විනීත විශාරද බහුශ්‍රැත ධර්මධර ධර්මානුධර්මප්‍රතිපන්න සාමීචිප්‍රතිපන්න අනුධර්ම-චාරිණීහු වෙත්. ස්වකීය ආචාර්‍යවාදය ඉගෙන කියත්, දෙසත්, පණවත්, පිහිටුවත්, බෙද දක්වත්, මතු කෙරෙත්. උපන් පරප්‍රවාදය කරුණු සහිත ව මොනොවට මැඩ නෛර්‍යාණික කොට දහම් දෙසත්. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දැන් පිරිනිවෙන සේක්වා. සුගතයන් වහන්සේ දැන් පිරිනිවෙන සේක්වා. වහන්ස, භාග්‍යවතුන් වහන්සේට දැන් පිරිනිවෙන්නට කල් ය.''

65. ''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'පව්වුව, යම් තාක් මාගේ මේ **ශාසනබ්‍රහ්මචර්‍යය** සමෘද්ධ නො වන්නේ ද, වෘද්ධිප්‍රාප්ත නො වන්නේ ද, විස්තීර්ණ නො වන්නේ ද, බොහෝ දෙනා විසින් දැන ගන්නා ලද්දක් නො වන්නේ ද, පෘථුල නො වන්නේ ද, ඇති තාක් නුවණැති හැම දෙවිමිනිසුන් විසින් සුප්‍රකාශිත නො වන්නේ ද, ඒ තාක් නො පිරිනිවෙන්නෙමි'' යි මේ වචනය වදරන ලද්දේ ම ය. වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ ශාසනබ්‍රහ්මචර්‍යය සමෘද්ධ ද වෘද්ධිප්‍රාප්ත ද විස්තෘත ද බාහුජන්‍ය ද පෘථුල ද, ඇති තාක් නුවණැති දෙවිමිනිසුන් විසින් සුප්‍රකාශිත ද වේ. වහන්ස, දැන් භාග්‍යවතුන්වහන්සේ පිරිනිවෙන සේක් වා. සුගතයන් වහන්සේ පිරිනිවෙන සේක් වා. දැන් භාග්‍යවතුන් වහන්සේට පිරිනිවෙන්නට කල් යැ'' යි කී ය.

66. මෙසේ කී කලැ භාග්‍යවතුන් වහන්සේ පව්වු මරදෙව්පුතුට ''පව්ට, තෝ මන්දෙත්සාඛීවව. නොබෝ කල්හි තථාගතයන්ගේ පිරිනිවීම වන්නේය. මෙයින් තෙමසක් ඇවැමෙන් තථාගතයෝ පිරිනිවෙන්නාහ'' යි වදළ සේක.

67. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ චාපාල චෛත්‍යයෙහි දී සිහි ඇති සේක් මනානුවණින් දන්නා සේක් ම ආයුසංස්කාරය හළ සේක. (මෙ තැන් පටන් කොට තෙමසක් ම සමවත් සමවදිමින් දිවි පවත්වමි. එයින් මත්තෙහි සමවතට නො සමවදිමි' යි සිත ඉපිදවූ සේක.) භාග්‍යවතුන් වහන්සේ ආයුස්සංස්කාරය හළ කෙණෙහි ම බිහිසුණු වූ ලොමුදහ ගන්වන මහත් භූමිකම්පනයෙක් විය. දෙවඹෙර පැළිණ (නොකල්හිවැයි වට). එ කලැ භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ දැන ඒ වේලෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කළ සේක:

''බුද්ධමුනි තෙම නිවන ද භවය ද තුලනා කරනුයේ (තීරණය කරනුයේ) භවසංස්කාරකර්මය (ඛෝමඩදීම) හළේ ය. විදර්ශනා විසින් නිජකා-ධ්‍යාත්මයෙහි ඇලුණේ ශමථ වශයෙන් සමාහිත වූයේ, (මෙසේ ශමථ-විදර්ශනා බලයෙන්) කවචයක් (යුදසැටයක්) මෙන් තම අත් බව වැළඳ සිටි සියලු කෙලෙස් බිඳ හළේ ය. (එහෙයින් අභීත ව ආයුසංස්කාරය හළේ ය.)

(භූමිවලනයෙහි හෙතු අට)

68. එකල්හි අනඳ තෙරුනට ''භවත්නි, ආශ්චර්‍ය්‍ය ය, භවත්නි, අද්භූත ය. මේ භූමිවලනය මහත් ය. මේ භූමිකම්පනය ඉතා මහත් ය, බිහිසුණු ය, ලොමුදහ ගන්වන සුලු ය. දෙවඹෙර ද පැළිණ (නොකල් වැයි වට). මහත් භූමිවලනය ඇති වන්නට හෙතු කවර ය, ප්‍රත්‍යය කවර යැ'' යි මේ සිත වී ය. ඉක්බිති අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ වැඳ පසෙක හුන්හ. පසෙක හිඳ, ''වහන්ස, ආශ්චර්‍ය්‍ය ය, වහන්ස, අද්භූත ය. වහන්ස, මේ භූමිවලනය මහත් ය, මේ භූමිවලනය ඉතා මහත් ය. බිහිසුණු ය, ලොමුදහ ගන්වන සුලු ය. දෙව් බෙර ද පැළිණ. වහන්ස, මහත් භූමිකම්පනයට හෙතු කවර ය? ප්‍රත්‍යය කවර ය?' යි මෙය විචාළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:

Free Distribution www.aathaapi.org

69. අට්ඨ මෙ ඉමෙ ආනන්ද හෙතු අට්ඨ පච්චයා මහතෝ භූමි-චාලස්ස පාතුභාවාය. කතමෙ අට්ඨ?

අයං ආනන්ද මහාපථවී උදකෙ පතිට්ඨිතා. උදකං වාතෙ පතිට්ඨිතං. වාතෝ ආකාසට්ඨෝ හොති. හොති මෙ සෝ ආනන්ද සමයෝ යං මහාවාතා වායන්ති, මහාවාතා වායන්තා උදකං කම්පෙන්ති, උදකං කම්පිතං පථවිං කම්පෙති. අයං පඨමෝ හෙතු පඨමෝ පච්චයෝ මහතෝ භූමිචාලස්ස පාතුභාවාය. (1)

පුනචපරං ආනන්ද සමණෝ වා හොති බ්‍රාහ්මණෝ වා ඉද්ධිමා චෙතෝ-වසිප්පත්තෝ, දෙවෝ වා මහිද්ධිකෝ මහානුභාවෝ, තස්ස පරිත්තා පථවී-සඤ්ඤා භාවිතා හොති, අප්පමාණා ආපොසඤ්ඤා. සෝ ඉමං පථවිං කම්පෙති සංකම්පෙති සම්පකම්පෙති සම්පවෙධෙති. අයං දුතියෝ හෙතු දුතියෝ පච්චයෝ මහතෝ භූමිචාලස්ස පාතුභාවාය. (2)

පුනාවපරං ආනන්ද යදා බොධිසත්තෝ තුසිතා කායා චවිත්වා සතෝ සම්පජානෝ මාතුකුච්ඡිං ඔක්කමති, තදා'යං පථවී කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං තතියෝ හෙතු තතියෝ පච්චයෝ මහතෝ භූමිචාලස්ස පාතුභාවාය. (3)

පුනාවපරං ආනන්ද යදා බොධිසත්තෝ සතෝ සම්පජානෝ මාතුකුච්ඡිසම්හි නික්ඛමති, තදයං පථවී කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං චතුත්ථෝ හෙතු චතුත්ථෝ පච්චයෝ මහතෝ භූමිචාලස්ස පාතුභාවාය. (4)

පුනාවපරං ආනන්ද යදා තථාගතෝ අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣති, තදයං පථවී කම්පති සඞ්කම්පති සම්පකම්පති සම්පවෙධති. අයං පඤ්චමෝ හෙතු පඤ්චමෝ පච්චයෝ මහතෝ භූමිචාලස්ස පාතුභාවාය. (5)

පුනාවපරං ආනන්ද යදා තථාගතෝ අනුත්තරං ධම්මචක්කං පවත්තෙති, තදයං පථවී කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං ඡට්ඨෝ හෙතු ඡට්ඨෝ පච්චයෝ මහතෝ භූමිචාලස්ස පාතුභාවාය. (6)

පුනාවපරං ආනන්ද යදා තථාගතෝ සතෝ සම්පජානෝ ආයුසඞ්ඛාරං ඔස්සජ්ජති, තදයං පථවී කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං සත්තමෝ හෙතු සත්තමෝ පච්චයෝ මහතෝ භූමිචාලස්ස පාතුභාවාය. (7)

---

1. මහාපරිබ්බ මජ්ඣං.

Free Distribution www.aathaapi.org

69. අනඳයෙනි, මහද්භූමිකම්පනය ඇති වන්නට මේ හෙතු අටෙක, ප්‍රත්‍යය අටෙක. කවර අටෙක් ද යත්:

අනඳයෙනි, මේ මහ පොළොව දිය ආධාර කොට පිහිටියේ වෙයි. දිය වාතය ආධාර කොට පිහිටියේ වෙයි. වාතය අහසෙහි සිටියේ වෙයි. අනඳයෙනි, යම් විටෙක මහා වාතයෝ හමත් ද, මහා වාතයෝ හමන්නාහු දිය සොලොවත් ද, දිය සෙලෙවුණේ පොළොව සොලොවා ද, එසේ වූ කාලයෙක් වෙයි. මහත් භූමිකම්පනය ඇති වනුවට මේ පළමු හෙතුව, පළමු ප්‍රත්‍යය වෙයි. (1)

තව ද අනෙකක් කියමි. අනඳයෙනි, සෘද්ධිමත් චිත්තවශිතා ලත් මහණෙක් හෝ බමුණෙක් වෙයි ද, මහත් සෘද්ධි ඇති මහානුභාව ඇති දෙවියෙක් හෝ වෙයි ද, ඔහු විසින් පෘථිවිසංඥාව මඳ ලෙස වඩන ලද්දේ වේ ද, අප්සංඥාව අප්‍රමාණ කොට වඩන ලද්දේ වේ ද, හෙතෙම මේ පොළොව සොලොවයි. උඩු දෙසට සොලොවා යවයි. උඩු යට දෙදෙසට යවමින් හාත්පසින් සොලොවයි. වඩාත් වෙද්දිල්වයි. මහත් භූමිකම්පනයට මේ දෙවෙනි හෙතුව, දෙවෙනි ප්‍රත්‍යය වෙයි. (2)

තව ද අනෙකක් කියමි. අනඳයෙනි, යම් කලෙක්හි බෝසත් තෙම තුසි දෙවනකායෙන් සැව, සිහි ඇත්තේ නුවණ ඇත්තේ මවු කුසට බසී ද, එකල්හි මේ පොළොව සැලෙයි, හාත්පසින් සැලෙයි, හාත්පස වඩාත් සැලෙයි, වෙවුලයි. මහද්භූමිකම්පනය ඇති වන්නට මේ තෙවෙනි හෙතුව, තෙවෙනි ප්‍රත්‍යය වෙයි. (3)

තව ද අනෙකක් කියමි. අනඳයෙනි, යම් කලෙක බෝසත් තෙම සිහි ඇත්තේ නුවණ ඇත්තේ මවු කුසින් බිහි වේ ද, එකල්හි මේ පොළොව සැලෙයි, හාත්පසින් සැලෙයි. හාත්පසින් වඩාත් සැලෙයි, වෙවුලයි. මහද්භූමිකම්පනය පහළ වන්නට මේ සිවුවන හෙතුව, සිවුවන ප්‍රත්‍යය වෙයි. (4)

තව ද අනෙකක් කියමි. අනඳයෙනි, යම් කලෙක තථාගත තෙම නිරුත්තර සම්‍යක්සම්බෝධිසමධිගමය කෙරේ ද, එකල්හි මේ පොළොව සැලෙයි, හාත්පසින් සැලෙයි, වඩාත් සැලෙයි, වෙවුලයි. මහද්භූමිකම්පනය ඇති වන්නට මේ පස්වන හෙතුව, පස්වන ප්‍රත්‍යය වෙයි. (5)

තව ද අනෙකක් කියමි. අනඳයෙනි, යම් කලෙක තථාගත තෙම නිරුත්තර දහමසක් පවත්වා ද, එකල්හි මේ පොළොව සැලෙයි, හාත්පසින් සැලෙයි, වඩාත් සැලෙයි, වෙවුලයි. මේ මහද්භූමිකම්පනය ඇති වන්නට සවන හෙතුව සවන ප්‍රත්‍යය වෙයි. (6)

තව ද අනෙකක් කියමි. අනඳයෙනි, යම් කලෙක තථාගත තෙම සිහි ඇත්තේ මනා නුවණ ඇත්තේ ආයුසංස්කාරය හරි ද, එ කල්හි මේ පොළොව සැලෙයි, හාත්පසින් සැලෙයි, වඩාත් සැලෙයි, වෙවුලයි. මේ මහද්භූමිකම්පනය ඇති වන්නට සත්වන හෙතුව සත්වන ප්‍රත්‍යය වෙයි. (7)

Free Distribution www.aathaapi.org

පුනචපරං ආනන්ද යද තථාගතෝ අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායති, තද'යං පඨවී කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං අට්ඨමෝ හෙතු අට්ඨමෝ පච්චයෝ මහතෝ භූමිචාලස්ස පාතුභාවාය. (8)

ඉමෙ ඛො ආනන්ද අට්ඨ හෙතු අට්ඨ පච්චයා මහතෝ භූමිචාලස්ස පාතුභාවායා ති.

[අට්ඨපරිසා]

70. අට්ඨ ඛො ඉමා ආනන්ද පරිසා. කතමා අට්ඨ? ඛත්තියපරිසා බ්‍රාහ්මණපරිසා ගහපතිපරිසා සමණපරිසා චාතුම්මහාරාජිකපරිසා තාවතිංසපරිසා මාරපරිසා බ්‍රහ්මපරිසා.

අභිජානාමි ඛො පනාහං ආනන්ද අනෙකසතං ඛත්තියපරිසං උපසඞ්කමිතා[1]. තත්‍රාපි මයා සන්නිසින්නපුබ්බඤ්ඤෙව සල්ලපිතපුබ්බඤ්ඤ සාකච්ඡා ච සමාපජ්ජිතපුබ්බා. තත්‍ර යාදිසකෝ තෙසං වණ්ණෝ හොති, තාදිසකෝ මයං වණ්ණෝ හොති. යාදිසකෝ තෙසං සරෝ හොති, තාදිසකෝ මයං සරෝ හොති. ධම්මියා ච[2] කථාය සන්දස්සෙසිං. සමාදපෙසිං සමුත්තෙජෙසිං සම්පහංසෙසිං. භාසමානඤ්ච මං න ජානන්ති 'කෝ නු ඛො අයං භාසති දෙවෝ වා මනුස්සෝ වා' ති. ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා අන්තරධායාමි. අන්තරහිතඤ්ච මං න ජානන්ති 'කෝ නු ඛො අයං අන්තරහිතෝ දෙවෝ වා මනුස්සෝ වා'ති.

අභිජානාමි ඛො පනාහං ආනන්ද අනෙකසතං බ්‍රාහ්මණපරිසං -පෙ- ගහපතිපරිසං -පෙ- සමණපරිසං -පෙ- චාතුම්මහාරාජිකපරිසං -පෙ- තාවතිංසපරිසං -පෙ- මාරපරිසං -පෙ- බ්‍රහ්මපරිසං උපසඞ්කමිතා. තත්‍රාපි මයා සන්නිසින්නපුබ්බඤ්ඤෙව සල්ලපිතපුබ්බඤ්ඤ සාකච්ඡා ච සමාපජ්ජිතපුබ්බා. තත්‍ර යාදිසකෝ තෙසං වණ්ණෝ හොති, තාදිසකෝ මයං වණ්ණෝ හොති. යාදිසකෝ තෙසං සරෝ හොති තාදිසකෝ මයං සරෝ හොති. ධම්මියා ච කථාය සන්දස්සෙසිං සමාදපෙසිං සමුත්තෙජෙසිං සම්පහංසෙසිං. භාසමානඤ්ච මං න ජානන්ති 'කෝ නු ඛො අයං භාසති දෙවෝ වා මනුස්සෝ වා'ති ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා අන්තරධායාමි. අන්තරහිතඤ්ච මං න ජානන්ති 'කෝ නු ඛො අයං අන්තරහිතෝ දෙවෝ වා මනුස්සෝ වා'ති.

ඉමා ඛො ආනන්ද අට්ඨ පරිසා.

---

1. උපසඞ්කමිත්වා, සෘෂ්. ෆ්‍රෑ. 2. ධම්මියා, එවමුපරි.

Free Distribution www.aathaapi.org

තව ද අනෙකක් කියමි. අනඳයෙනි, යම් කලෙක තථාගත තෙම අනුපාදිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවෙයි ද, එකලැ මේ පොළොව සැලෙයි, හාත්පසින් සැලෙයි. වඩාත් සැලෙයි, වෙවුලයි. මේ මහද්‍භූමිකම්පනය ඇති වන්නට අටවැනි හෙතුව, අටවැනි ප්‍රත්‍යය වෙයි.

අනඳයෙනි, මේ මහද්භූමිකම්පනය ඇති වන්නට හෙතු වූ ප්‍රත්‍යය වූ කරුණු අට ය.

[පිරිස් අට]

70. අනඳයෙනි, මේ පිරිස් අටෙක. කවර අටෙක් ද යත්: කැත්-පිරිස බමුණුපිරිස ගැහැවිපිරිස මහණපිරිස සියුමහරැසිපිරිස චවිතිසාපිරිස මරපිරිස බඹපිරිස යන මොහු ය.

අනඳයෙනි, මා නොයෙක් සිය ගණන් කැත්පිරිස් කරා එළැඹුණා දනිමි (සිහි කෙරෙමි). එහි ද මා විසින් හුන් විරූ ද, කතාබස් කළ විරූ ද, සාකච්ඡා කළ විරූ ද වෙයි. එහි ඔවුන්ගේ පැහැ යම් බඳු වේ ද මගේ පැහැ ද එබඳු වෙයි. ඔවුන්ගේ කටහඬ යම් බඳු වේ ද මගේ කටහඬ ද එබඳු වෙයි. එහි ඔවුනට දහැමි කතායෙන් ද කරුණු දක්වමි, එය ඔවුනට ගන්වමි, එහි ඔවුන් තියුණු කෙරෙමි, එහි ඔවුන් තුටුපහටු කෙරෙමි. එසේ කියන මා ඔහු 'මේ කවරෙක් කතා කෙරේ ද, දෙවියෙක් ද නොහොත් මිනිසෙක් ද' යි නො දනිත්. දහැමි කතායෙන් කරුණු දක්වා, කරුණු ගන්වා, එහි ඔවුන් තියුණු කොට, තුටු පහටු කොට අතුරුදහන් වෙමි. අතුරුදහන් වූ ද මා 'කවරෙක් නම මේ අතුරුදහන් වී ද දෙවියෙක් ද නොහොත් මිනිසෙක් ද' යි ඔහු නො දනිත්.

අනඳයෙනි, මා නොයෙක් සියගණන් බමුණුපිරිස් . . . ගැහැවිපිරිස් ... මහණ පිරිස් ... සිවුමහරැසි පිරිස් ... චවිතිසාපිරිස් ... මරපිරිස් ... බඹ-පිරිස් කරා එළැඹුණා දනිමි. එහි ද මා විසින් හුන්විරූ ද, කතාබස් කළ විරූ ද, සාකච්ඡා කළ විරූ ද වෙයි. එහි ඔවුන්ගේ පැහැ යම්බඳු වේ ද මගේ පැහැ ද එබඳු වෙයි. ඔවුන්ගේ කටහඬ යම්බඳු වේ ද මගේ කටහඬ ද එබඳු වෙයි. එහි ඔවුනට දහැමි කතායෙන් ද කරුණු දක්වමි, එය ඔවුනට ගන්වමි, එහි ඔවුන් තියුණු කෙරෙමි, තුටුපහටු කෙරෙමි. එසේ කියන මා ඔහු 'මේ කවරෙක් කියා ද, දෙවියෙක් ද නො හොත් මිනිසෙක් ද' යි නො දනිත්. දහැමි කතායෙන් කරුණු දක්වා කරුණු ගන්වා එහි ඔවුන් තියුණු කොට, තුටු පහටු කොට අතුරුදහන් වෙමි. අතුරුදහන් වූ ද මා 'කවරෙක් නම මේ අතුරුදහන් වී ද දෙවියෙක් ද නොහොත් මිනිසෙක් ද' යි නො දනිත්. අනඳයෙනි, මේ අට පිරිස් ය.

Free Distribution www.aathaapi.org

[අට්ඨඅභිභායතනානි]

71. අට්ඨ ඛෝ ඉමානි ආනන්ද අභිභායතනානි. කතමානි අට්ඨ?

අජ්ඣත්තං රූපසඤ්ඤී එකෝ බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය 'ජානාමි පස්සාමී'ති එවංසඤ්ඤී හොති. ඉදං පඨමං අභිභායතනං. (1)

අජ්ඣත්තං රූපසඤ්ඤී එකෝ බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය 'ජානාමි පස්සාමී'ති එවංසඤ්ඤී හොති. ඉදං දුතියං අභිභායතනං. (2)

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකෝ බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය 'ජානාමි පස්සාමී'ති එවංසඤ්ඤී හොති. ඉදං තතියං අභිභායතනං. (3)

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකෝ බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය 'ජානාමි පස්සාමී'ති එවංසඤ්ඤී හොති, ඉදං චතුත්ථං අභිභායතනං. (4)

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකෝ බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි. සෙය්‍යථාපි නාම උම්මා-පුප්ඵං[1] නීලං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං, සෙය්‍යථාපි වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං නීලං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං, එවමෙව අජ්ඣත්තං අරූපසඤ්ඤී එකෝ බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි. තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී'ති එවංසඤ්ඤී හොති. ඉදං පඤ්චමං අභිභායතනං. (5)

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකෝ බහිද්ධා රූපානි පස්සති පීතානි පීත-වණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි. සෙය්‍යථාපි නාම කණිකාරපුප්ඵං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං, සෙය්‍යථාපි වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං, එවමෙව අජ්ඣත්තං අරූපසඤ්ඤී එකෝ බහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි. තානි අභිභුය්‍ය 'ජානාමි පස්සාමී'ති එවංසඤ්ඤී හොති. ඉදං ඡට්ඨං අභිභායතනං. (6)

---

1. උම්මාපුප්ඵං මජ්ඣිමං

Free Distribution www.aathaapi.org

[අභිභායතන අට]

71. අනඳයෙනි, මේ අභිභායතන අටෙකි. කවර අටෙක් ද? යත්:

එකෙක් අධ්‍යාත්ම රූපයෙහි පරිකර්ම වශයෙන් රූපසංඥා ඇත්තේ පිටත්හි සුවර්ණ හෝ දුර්වර්ණ හෝ පරිත්තාරම්මණ ප්‍රතිභාග නිමිති දකී. ඒ නිමිති මැඩ 'දනිමි යි දකිමි' යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ පළමු අභිභායතනය යි. (1)

එකෙක් අධ්‍යාත්මයේ රූපසංඥා ඇත්තේ පිටත්හි අප්‍රමාණ වූ සුවර්ණ දුර්වර්ණ නිමිත්තරූපයන් දකී. ඒ රූප මැඩ 'දනිමියි දකිමි' යි මෙසේ සංඥා ඇත්තේ වේ. මේ දෙවෙනි අභිභායතනය යි. (2)

එකෙක් අධ්‍යාත්ම අරමුණෙහි පරිකර්ම සංඥා නැත්තේ පිටත්හි වූ සුවර්ණ හෝ දුර්වර්ණ වූ පරිත්ත වූ පරිකර්ම නිමිති ද ප්‍රතිභාග නිමිති ද දකී. ඒ අරමුණු මැඩ 'දනිමි යි දකිමි' යි මෙබඳු සංඥා ඇත්තේ වෙයි. මේ තෙවෙනි අභිභායතනය යි. (3)

එකෙක් අධ්‍යාත්ම අරමුණෙහි රූපසංඥා නැත්තේ පිටත්හි වූ අප්‍රමාණ වූ සුවර්ණ දුර්වර්ණ රූපයන් දකී. ඒ රූප අභිභවා 'දනිමි දකිමි' යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ සතරවන අභිභායතනය යි. (4)

එකෙක් අධ්‍යාත්ම රූපයෙහි පරිකර්මසංඥා නැත්තේ, නිල් වූ නිල්වන් නිල්දැකුම් ඇති නිල් පැහැ ඇති පිටත්හි රූප දකී. නිල්, නිල්වන්, නිල්-දැකුම් ඇති, නිල් පැහැ ඇති දියමෙරලිය මලක් යම් සේ වේද, දෙපිට ම මොළොක් කසිවතෙක් යම්සේ නිල් වේ ද, නිල්වන් වේ ද, නිල් දැකුම් ඇත්තේ වේ ද, නිල් පැහැ වේ ද, එසේ ම එකෙක් අධ්‍යාත්මරූපයෙහි පරිකර්මසංඥා නැත්තේ නිල් වූ නිල්වන් වූ නිල්දැකුම් ඇති නිල් පැහැති බාහිර නීලකසිණාලම්බන රූප දකී. ඒ රූප අභිභවා 'දනිමි දකිමි' යි මෙබඳු සංඥා ඇත්තේ වෙයි. මේ පස්වන අභිභායතනය යි. (5)

එකෙක් අධ්‍යාත්මරූපයෙහි පරිකර්මසංඥා නැත්තේ, රන්වන් වූ, රන්වන් දැකුම් ඇති, රන්පැහැති බාහිර පීත රූප දකී. රන්වන් වූ රන්වන් දැකුම් ඇති, රන්පැහැ ඇති පීත වූ කිණිහිරි මලෙක් යම් සේ වේ ද, දෙපස මට සිලිටි වූ රන්වන් වූ රන්වන් දැකුම් ඇති රන්පැහැති පීත වූ කසිවතෙක් හෝ යම්සේ ද, එසේ ම එකෙක් අධ්‍යාත්මරූපයෙහි රූපසංඥා නැත්තේ, රන්වන්, රන්වන් දැකුම් ඇති රන්පැහැති බාහිර පීත කසිණ රූපයන් දකී. ඔවුන් මැඩැ 'දනිමි යි දකිමි' යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ සවන අභිභායතනය යි. (6)

Free Distribution www.aathaapi.org

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකෝ බහිද්ධා රූපානි පස්සති ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතකානිදස්සනානි ලොහිතකනිභාසානි. සෙය්‍යථාපි නාම බන්ධුජීවකපුප්ඵං ලොහිතකං ලොහිතකවණ්ණං ලොහිතක-නිදස්සනං ලොහිතකනිභාසං, සෙය්‍යථාපි වා පන නං වත්ථං බාරාණ-සෙය්‍යකං උභතොභාගවිමට්ඨං ලොහිතකං ලොහිතකවණ්ණං ලොහිතක-නිදස්සනං ලොහිතකනිභාසං, එවමෙව අජ්ඣත්තං අරූපසඤ්ඤී එකෝ බහිද්ධා රූපානි පස්සති ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතක-නිදස්සනානි ලොහිතකනිභාසානි. තානි අභිභුය්‍ය 'ජානාමි පස්සාමී'ති එවං සඤ්ඤී හොති ඉදං සත්තමං අභිභායතනං. (7)

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකෝ බහිද්ධා රූපානි පස්සති ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි. සෙය්‍යථාපි නාම ඔසධි තාරකා ඔදාතවණ්ණා ඔදාතනිදස්සනා ඔදාතනිභාසා සෙය්‍යථාපි වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං ඔදාතං ඔදාතවණ්ණං ඔදාතනිදස්සනං ඔදාතනිභාසං, එවමෙව අජ්ඣත්තං අරූපසඤ්ඤී එකෝ බහිද්ධා රූපානි පස්සති ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි. තානි අභිභුය්‍ය 'ජානාමි පස්සාමී'ති එවංසඤ්ඤී හොති. ඉදං අට්ඨමං අභිභායතනං.

ඉමානි ඛො අට්ඨ ආනන්ද අභිභායතනානි.

(අට්ඨ විමොක්ඛා)

72. අට්ඨ ඛො ඉමෙ ආනන්ද විමොක්ඛා. කතමෙ අට්ඨ?

රූපී රූපානි පස්සති. අයං පඨමෝ විමොක්ඛෝ (1)

අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති. අයං දුතියෝ විමොක්ඛෝ. (2)

සුභන්තෙව අධිමුත්තෝ හොති. අයං තතියෝ විමොක්ඛෝ. (3)

සබ්බසෝ රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තෝ ආකාසෝ'ති ආකාසා-නඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං චතුත්ථෝ විමොක්ඛෝ. (4)

සබ්බසෝ ආකාසානඤ්චායතනං සමතික්කම්ම 'අනන්තං විඤ්ඤා-ණන්ති' විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං පඤ්චමෝ විමොක්ඛෝ. (5)

Free Distribution www.aathaapi.org

එකෙක් අධ්‍යාත්මරූපයෙහි රූපසංඥා නැත්තේ රතු වූ රත්වන් වූ රත්වන් දකුම් ඇති රත්පැහැති බාහිර රූපයන් දකී. රතු වූ රත්වන් වූ රත්වන් දකුම් ඇති රත්පැහැ වූ බදුවද මලෙක් යම්සේ වේ ද, දෙපසැ මට සිලිටි වූ රතු වූ රත්වන් වූ රත්වන් දකුම් ඇති රත්පැහැ වූ කසිවතෙක් හෝ යම්සේ වේද, එසේම එකෙක් අධ්‍යාත්ම රූපයෙහි රූපසංඥා නැත්තේ, රතු වූ රත්වන් වූ රත්වන් දකුම් ඇති, රත්පැහැ වූ බාහිර රූපයන් දකී. ඔවුන් මැඩ 'දනිමි යි දකිමි' යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ සත්වන අභිභායතනය යි. (7)

එකෙක් අධ්‍යාත්මරූපයෙහි රූපසංඥා නැත්තේ, සුදු වූ සුදුවන් වූ සුදුවන් දකුම් ඇති සුදුපැහැ වූ බාහිර රූපාලම්බනයන් දකී. සුදු වූ සුදුවන් දකුම් ඇති සුදු පැහැ වූ ඔසයි කාරකාව යම සේ ද, දෙපසැ මට සිලිටි වූ සුදු වූ සුදුවන් වූ සුදුවන් දකුම් ඇති සුදුපැහැති කසිවතෙක් හෝ යම සේ වේ ද, එසේ ම සුදු වූ සුදුවන් වූ සුදුදකුම් ඇති සුදුපැහැ වූ බාහිර කසිණ රූපයන් දකී. ඔවුන් මැඩ 'දනිමි යි දකිමි' යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ අටවැනි අභිභායතනය යි. (8)

අනඳයෙනි, මොහු අටදෙන අභිභායතනයෝ ය.

[විමොක්ෂ අට]

72. අනඳයෙනි, මේ විමොක්ෂයෝ අට දෙනෙකි. කවර අට දෙනෙක් ද යත්:

රූපධ්‍යාන ඇත්තේ නිලකසිණාදි රූපයන් ධ්‍යාන ඇසින් දකී. මේ පළමුවන විමොක්ෂය යි. (1)

අධ්‍යාත්මයෙහි රූපසංඥා නැත්තේ බාහිර රූප දකී. මේ දෙවෙනි විමොක්ෂය යි. (2)

පිරිසිදු වූ කසිණ අරමුණු දහත් ඇසින් දක්නේ, 'ශුභ ම යැ' යි එහි ඇලුණේ වෙයි. මේ තෙවෙනි විමොක්ෂය යි. (3)

සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් ඉක්මීමෙන් ප්‍රතිඝසංඥාවන් පහ වැ යෑමෙන් නානාත්වසංඥාවන් නො මෙනෙහි කිරීමෙන් 'අහස අනන්ත ය'යි ආකාසානඤ්චායතන ධ්‍යානයට පැමිණ වෙසෙයි. මේ සිවුවන විමොක්ෂය යි. (4)

සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මැ 'විඤ්ඤාණය අනන්ත යැ යි විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයට පැමිණ වෙසෙයි. මේ පස්වන විමොක්ෂය යි. (5)

Free Distribution www.aathaapi.org

සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං ඡට්ඨො විමොක්ඛො. (6)

සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං සත්තමො විමොක්ඛො. (7)

සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. අයං අට්ඨමො විමොක්ඛො. (8)

ඉමෙ ඛො ආනන්ද අට්ඨ විමොක්ඛා.

[මාරයාචනා]

73. එකමිදහං ආනන්ද සමයං උරුවෙලායං විහරාමි නජ්ජා නෙරඤ්ජරාය තීරෙ අජපාලනිග්‌රොධමූලෙ පඨමාභිසම්බුද්ධො. අථ ඛො ආනන්ද මාරො පාපිමා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො ආනන්ද මාරො පාපිමා මං එතදවොච: පරිනිබ්බාතු'දානි භන්තෙ භගවා, පරිනිබ්බාතු සුගතො. පරිනිබ්බානකාලො'දානි භන්තෙ භගවතො'ති.

එවං වුත්තො'හං ආනන්ද මාරං පාපිමන්තං එතදවොච: "න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි යාව මෙ භික්ඛු න සාවකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරද බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො, සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති[1] පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානිකරිස්සන්ති,[2] උප්පන්නං පරපවාදං සහධම්මෙන සුනිග්ගහිතං[3] නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්ති.

න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි. යාව මෙ භික්ඛුනියො න සාවිකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරද බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනියො, සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානිකරිස්සන්ති, උප්පන්නං පරපවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්ති.

---

1. පඤ්ඤපෙස්සන්ති මජ්ඣ.
2. උත්තානීං කරිස්සන්ති, සී කත්ථචි උත්තානිකරිස්සන්ති, ?ts
3. සුනිග්ගහීතං, ?ts

Free Distribution www.aathaapi.org

සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මැ 'කිසිත් නැතැ' යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසෙයි. මේ සවන විමොක්ෂය යි. (6)

සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මැ නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වෙසෙයි. මේ සත්වන විමොක්ෂය යි. (7)

සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මැ සංඥාවේදයිත නිරෝධයට පැමිණ වෙසෙයි. මේ අටවන විමොක්ෂය යි. (8)

අනඳයෙනි, මොහු අෂ්ට විමෝක්ෂයෝ ය.

[මාර ආයාචනය]

73. අනඳයෙනි, එක් කලෙක මම බුදු වැ පළමු කොට ම **උරුවෙල්** දනව්වෙහි **නිල්දලා** නී තෙර **අජපල්** නුගරුක්මුලැ වෙසෙමි. අනඳයෙනි, එ කලැ පවිටු මරු මා වෙත එළැඹියේ ය. එළැඹ එකත්පස් වැ සිටියේ ය. අනඳයෙනි, එකත්පස් වැ සිටියාවූ ම මර තෙම "වහන්ස, භගවත්හු දන් පිරිනිවෙත් වා, සුගත්හු පිරිනිවෙත් වා දන් භගවත්නට පිරිනිවෙන්නට කල් ය" යි මේ බස් කී ය.

අනඳයෙනි, මෙසේ කියන ලද මම පවිටු මරහට මෙය කීමි. "පවිට, මා සවු මහණහු යමතාක් කල් ව්‍යක්ත ද විනීත ද විසාරද ද බහුශ්‍රැත ද ධර්මධර ද ධර්මානුධර්මප්‍රතිපන්න ද සම්‍යක්ප්‍රතිපන්න ද අනුධර්මචාරි ද නො වන්නාහු නම්, ස්වකීය ආචාර්‍යවාදය ඉගෙන නො කියන්නාහු නම්, නො දෙසන්නාහු නම්, නො පණවන්නාහු නම්, නො පිහිටුවන්නාහු නම්, විවෘත නො කරන්නාහු නම්, බෙදා නො දක්වන්නාහු නම්, ප්‍රකට නො කරන්නාහු නම්, පහළ වූ පරප්‍රවාදය කරුණු සහිත ව මොනොවට නිගහා නෛයාන්‍යිකා කොට දහම් නො දෙසන්නාහු නම්, ඒ තාක් නො පිරිනිවෙන්නෙමි.

මා සවු මෙහෙණහු යමතාක් ව්‍යක්ත ද විනීත ද විසාරද ද බහුශ්‍රැත ද ධර්මධර ද ධර්මානුධර්මප්‍රතිපන්න ද සම්‍යක්ප්‍රතිපන්න ද අනුධර්මචාරි ද නො වන්නාහු නම්, ස්ව ආචාර්‍යවාදය ඉගෙන නො කියන්නාහු නම්, නො දෙසන්නාහු නම්, නො පණවන්නාහු නම්, නො පිහිටුවන්නාහු නම්, විවෘත නො කරන්නාහු නම්, බෙදා නො දක්වන්නාහු නම්, ප්‍රකට නො කරන්නාහු නම්, පහළ වූ පරප්‍රවාදය කරුණු දක්වා මොනොවට නිගහා නෛයාන්‍යිකා කොට දහම් නො දෙසන්නාහු නම්, ඒ තාක් නො පිරිනිවෙන්නෙමි.

Free Distribution www.aathaapi.org

න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි– යාව මෙ උපාසකා න සාවකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරද බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො, සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානීකරිස්සන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්ති.

න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි– යාව මෙ උපාසිකා න සාවිකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරද බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා අනුධම්ම-චාරිණියො, සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානීකරිස්සන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්ති.

න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි– යාව මෙ ඉදං බ්‍රහ්මචරියං න ඉද්ධඤ්චෙව භවිස්සති ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං[1] පුථුභූතං යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතන්ති.'

74. ඉදනෙව ඛො ආනන්ද අජ්ජ වාපාලෙ[2] චෙතියෙ මාරො පාපිමා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො ආනන්ද මාරො පාපිමා මං එතදවොච: ''පරිනිබ්බාතු'දානි භන්තෙ භගවා, පරිනිබ්බාතු සුගතො. පරිනිබ්බානකාලො'දානි භන්තෙ භගවතො. භාසිතා ඛො පනෙසා භන්තෙ භගවතා වාචා: න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි යාව මෙ භික්ඛු න සාවකා භවිස්සන්ති -පෙ- යාව මෙ භික්ඛුනියො න සාවිකා භවිස්සන්ති –පෙ– යාව මෙ උපාසකා න සාවකා භවිස්සන්ති –පෙ– යාව මෙ උපාසිකා න සාවිකා භවිස්සන්ති -පෙ- යාව මෙ ඉදං බ්‍රහ්මචරියං න ඉද්ධඤ්චෙව භවිස්සති ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතන්ති.–

එතරහි ඛො පන භන්තෙ භගවතා බ්‍රහ්මචරියං ඉද්ධඤ්චෙව ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාව දෙවමනුස්සෙහි සුප්පකාසිතං. පරිනිබ්බාතු'දානි භන්තෙ භගවා, පරිනිබ්බාතු සුගතො පරිනිබ්බානකාලො'දානි භන්තෙ භගවතො''ති.

---

1. බාහුජඤ්ඤං, ස්‍යා
2. පාවාලෙ, ස්‍යා

Free Distribution www.aathaapi.org

මා සවු උවසුහු යම්තාක් ව්‍යක්ත ද විනීත ද විසාරද ද බහුශ්‍රැත ද ධර්මධර ද ධර්මානුධර්මප්‍රතිපන්න ද සම්‍යක්ප්‍රතිපන්න ද අනුධර්මචාරී ද නොවන්නාහු නම්, ස්ව ආචාර්‍යවාදය ඉඟෙන නොකියන්නාහු නම්, නොදෙසන්නාහු නම්, නොපණවන්නාහු නම්, නොපිහිටුවන්නාහු නම්, විවෘත නොකරන්නාහු නම්, බෙදනොදක්වන්නාහු නම්, ප්‍රකට නොකරන්නාහු නම්, පහළ වූ පරප්‍රවාදය කරුණු සහිත කොට මොනොවට නිගහ නෙයය්‍යානික කොට දහම් නොදෙසන්නාහු නම්, ඒ තාක් නොපිරිනිවෙන්නෙමි.

මා සවු උවැසීහු යම්තාක් ව්‍යක්ත ද විනීත ද විසාරද ද බහුශ්‍රැත ද ධර්මධර ද ධර්මානුධර්මප්‍රතිපන්න ද සම්‍යක්ප්‍රතිපන්න ද අනුධර්මචාරී ද නොවන්නාහු නම්, ස්ව ආචාර්‍යවාදය ඉඟෙන නොකියන්නාහු නම්, නොදෙසන්නාහු නම්, නොපණවන්නාහු නම්, නොපිහිටුවන්නාහු නම්, විවෘත නොකරන්නාහු නම්, බෙදනොදක්වන්නාහු නම් ප්‍රකට නොකරන්නාහු නම්, පහළ වූ පරප්‍රවාදය කරුණු සහිත කොට මොනොවට නිගහ නෙයය්‍යානික කොට දහම් නොදෙසන්නාහු නම්, ඒ තාක් නොපිරිනිවෙන්නෙමි.

යම්තාක් මගේ මේ සසුන්බඹුසර සමෘද්ධ නොවන්නේ ද, ස්ඵීත නොවන්නේ ද, විස්තාරික නොවන්නේ ද, බොහෝ දෙනා අතර පැතුරුණේත් පෘථුභූතත් නොවන්නේ ද, යම්තාක් දෙවමිනිසුන් විසින් සුප්‍රකාශිතත් නොවන්නේ ද, ඒ තාක් නොපිරිනිවෙන්නෙමි'' යි කීමි.

74. අනඳයෙනි, දැනුදු අද වාපාල චෛත්‍යයෙහි මරතෙම මා කරා එළැඹියේ ය. එළැඹ එකත්පස් වැ සිටියේ ය. එකත්පස් ව සිටියේ ම 'වහන්ස, භගවත්හු දැන් පිරිනිවෙත් වා, සුගත්හු පිරිනිවෙත් වා. දැන් භගවත්නාට පිරිනිවෙන්නට කල් ය. වහන්ස, භාග්‍යවතුන්වහන්සේ විසින් ''පවිට, යම්තාක් මා සවු මහණහු . . . මෙහණහු . . . උවසුහු . . . උවැසිහු ව්‍යක්ත ද විනීත ද ... තොර්යාණිකකොට දම් නොදෙසන්නාහු නම් ඒ තාක් නොපිරිනිවෙන්නෙමි. යම්තාක් මගේ මේ සසුන්බඹුසර සමෘද්ධ නොවන්නේ ද, ස්ඵීත නොවන්නේ ද, විස්තාරික නොවන්නේ ද, බොහෝ දෙනා අතර පැතුරුණේත් පෘථුභූතත් නොවන්නේ ද, යම් තාක් දෙවමිනිසුන් විසින් සුප්‍රකාශිතත් නොවන්නේ ද, ඒ තාක් නොපිරිනිවෙන්නෙමි''යි මේ වචන භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දේ ය.

වහන්ස, දැන් වනාහි භාග්‍යවතුන් වහන්සේගේ සසුන් බඹුසර සමෘද්ධ ද ස්ඵීත ද විස්තාරික ද බහුජන්‍ය ද පෘථුභූත ද දෙවමිනිසුන් විසින් සුප්‍රකාශිත ද වේ. වහන්ස, දැන් භගවත්හු පිරිනිවෙත් වා, සුගත්හු පිරිනිවෙත් වා. වහන්ස, දැන් භගවත්නාට පිරිනිවෙන්නට කල්වේ යැ''යි කීය.

Free Distribution www.aathaapi.org

එවං වුත්තෙ අහං ආනන්ද මාරං පාපිමන්තං එතදවොචං: "අපජ්ජාසසුක්කෝ භව පාපිම හොහි. න චිරං තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති. ඉතෝ තිණ්ණං මාසානං අච්චයෙන තථාගතෝ පරිනිබ්බා-යිස්සති"ති. ඉදඤෙව බෝ ආනන්ද අජ්ජ වාපාලෙ චෙතියෙ තථාගතෙන සතෙන සම්පජානෙන ආයුසඞ්ඛාරෝ ඔස්සට්ඨෝ"ති.

[ආනඤ්ජයාචනා]

75. එවං වුත්තෙ ආයස්මා ආනන්දෝ භගවන්තං එතදවොච: "තිට්ඨතු භන්තෙ භගවා කප්පං, තිට්ඨතු සුගතෝ කප්පං, බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙව-මනුස්සානා"ති.

අලං ආනන්ද, මා තථාගතං යාචි. අකාලෝ'දානි ආනන්ද තථාගතං යාචනායා'ති.

දුතියම්පි බෝ ආයස්මා ආනන්දෝ -පෙ- තතියම්පි බෝ ආයස්මා ආනන්දෝ භගවන්තං එතදවොච: "තිට්ඨතු භන්තෙ භගවා කප්පං, තිට්ඨතු සුගතෝ කප්පං, බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානා"ති.

සද්දහසි ත්වං ආනන්ද තථාගතස්ස බොධිත්තෙ? "එවම්භන්තෙ". අථ කිඤ්චරහි ත්වං ආනන්ද තථාගතං යාවතතියකං අභිනිපජ්ජෙසි? ති.

සම්මුඛා මෙතං භන්තෙ භගවතෝ සුතං සම්මුඛා පටිග්ගහිතං: "යස්ස කස්සචි ආනන්ද චත්තාරෝ ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, සෝ ආකඞ්ඛමානෝ කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා. තථාගතස්ස බෝ ආනන්ද චත්තාරෝ ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා. සෝ ආකඞ්ඛමානෝ ආනන්ද තථාගතෝ කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා"ති.

සද්දහසි ත්වං ආනන්ද?ති. "එවම්භන්තෙ".

Free Distribution www.aathaapi.org

අනඳයෙනි, මෙසේ කී කල්හි මම ''පව්ට, තෝ මන්දෙත්සාහ වව. නොබෙ‍ාෝ කල්හි තථාගතයන්ගේ පිරිනිවන වන්නේ ය. මෙයින් තුන් මසක් ඇවැමෙන් තථාගතයෝ පිරිනිවෙන්නාහ යි කීමි. අනඳයෙනි, අද මේ දැන් චාපාල චෛත්‍යයෙහි දී තථාගතයන් සිහි ඇතියවුන් නුවණින් දන්නවුන් විසින් ආයුසංස්කාරය හරන ලද්දේ යැ යි වදළහ.

(ආනන්ද-ආශ්වාසය)

75. මෙසේ වදළ කලැ අනඳ තෙරණුවෝ 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙවමිනිස්නට අර්ථ පිණිස , හිත පිණිස, සුව පිණිස කපක් වැඩ සිටුනා සේක් වා, සුගතයන් වහන්සේ කපක් වැඩ සිටුනා සේක් ව'' යි කීහ.

''අනඳයෙනි, කම් නැත, තථාගතයන් නො යදින්න, අනඳයෙනි, තථාගතයන් යදනට දන් කල් නො වේ'' යි වදළහ.

දෙවනු ද...තෙවනු ද අනඳ තෙරණුවෝ ''වහන්ස, බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව මිනිස්නට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස ... කපක් වැඩ සිටුනා සේක් ව'' යි කීහ.

එවිට භගවත්හු ''අනඳයෙනි, තථාගතයන්ගේ බොධිය හඳහවු දැයි'' අසා වදළහ. ''එසේය, වහන්සැ'' යි අනඳ තෙරණුවෝ කීහ. ''එසේ නම් අනඳයෙනි, තෙපි කවර හෙයින් තෙවෙනි වර තෙක් තථාගතයන් පෙළවු ද?'' යි අසා වදළහ.

වහන්ස, ''අනඳයෙනි යමක්හු විසින් සතර සෘද්ධිපාදයෝ වඩන ලද්දාහු, යානයක් බඳු කරන ලද්දාහු, වාස්තුවක් බඳු කරන ලද්දාහු, පිළිපදනා ලද්දාහු, පුරුදු කරන ලද්දාහු, මොනොවට පුරන ලද්දාහු නම්, ඒ කැමැත්තේ කපක් හෝ කපකට වැඩිතරම් හෝ සිටිය හැකි වන්නේ ය. අනඳයෙනි, තථාගතයන් විසින් වනාහි සතර සෘද්ධිපාදයෝ භාවිත හ, බහුලීකෘත හ, යානීකෘත හ, වාස්තුකෘත හ, අනුෂ්ඨිත හ, පරිචිත හ, සුසමාරබ්ධ හ. අනඳයෙනි, ඒ තථාගතයෝ කැමැත්තෝ කපක් හෝ කපකට වැඩිතරම් කලක් හෝ සිටිය හැකි වන්නාහ'' යන මේ වචනය භාග්‍යවතුන් වහන්සේ හමුයෙන් මා විසින් අසන ලදී, භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි මා විසින් පිළිගන්නා ලදී'' යි අනඳ තෙරණුවෝ කීහ.

''අනඳයෙනි, තෙපි මෙය හඳහවු ද?'' යි බුදුරජාණන් අසා වදළහ. 'එසේ ය, වහන්සැ' යි අනඳ තෙරණුවෝ පිළිවදන් දුන්හ.

Free Distribution www.aathaapi.org

තස්මාතිහානන්ද තුය්හෙවෙතං දුක්කටං, තුය්හෙවෙතං අපරද්ධං, යං ත්වං තථාගතෙන එවං ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ,[1] ඔළාරිකෙ ඔභාසෙ කයිරමානෙ නාසකෙව පටිවිජ්ඣිතුං. න තථාගතං යාචි 'තිට්ඨතු භන්තෙ භගවා කප්පං, තිට්ඨතු සුගතො කප්පං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං'ති. සචෙ ත්වං ආනන්ද තථාගතං යාචෙය්‍යාසි, දෙවව තෙ වාචා තථාගතො පටික්ඛිපෙය්‍ය, අථ තතියකං අධිවාසෙය්‍ය. තස්මාතිහානන්ද තුය්හෙවෙතං දුක්කටං, තුය්හෙවෙතං අපරද්ධං.

76. එකමිදහං ආනන්ද සමයං රාජගහෙ විහරාමි ගිජ්ඣකූටෙ පබ්බතෙ. තත්‍ර පි ඛො තාහං ආනන්ද ආමන්තෙසිං: රමණීයං ආනන්ද රාජගහං රමණීයො ගිජ්ඣකූටො පබ්බතො. යස්ස කස්සචි ආනන්ද චත්තාරො ඉද්ධිපාද භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, සො ආකඞ්ඛමානො වා කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා. තථාගතස්ස ඛො ආනන්ද චත්තාරො ඉද්ධිපාද භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා. සො ආකඞ්ඛමානො ආනන්ද තථාගතො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා'ති. එවම්පි ඛො ත්වං ආනන්ද තථාගතෙන ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ ඔළාරිකෙ ඔභාසෙ කයිරමානෙ නාසකෙව පටිවිජ්ඣිතුං. න තථාගතං යාචි: 'තිට්ඨතු භන්තෙ භගවා කප්පං තිට්ඨතු සුගතො කප්පං බහුජනහිතාය, බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං'ති. සචෙ ත්වං ආනන්ද තථාගතං යාචෙය්‍යාසි, දෙවව තෙ වාචා තථාගතො පටික්ඛිපෙය්‍ය, අථ තතියකං අධිවාසෙය්‍ය. තස්මාතිහානන්ද තුය්හෙවෙතං දුක්කටං, තුය්හෙවෙතං අපරද්ධං.

එකමිදහං ආනන්ද සමයං තත්‍රෙව රාජගහෙ විහරාමි ගොතම-නිග්‍රොධෙ -පෙ- තත්‍රෙව රාජගහෙ විහරාමි චොරපපාතෙ -පෙ- තත්‍රෙව රාජගහෙ විහරාමි වෙභාරපස්සෙ සත්තපණ්ණිගුහායං -පෙ- තත්‍රෙව රාජගහෙ විහරාමි ඉසිගිලිපස්සෙ කාළසිලායං -පෙ- තත්‍රෙව රාජගහෙ විහරාමි සීතවනෙ සප්පසොණ්ඩිකපබ්භාරෙ -පෙ- තත්‍රෙව රාජගහෙ විහරාමි තපොදාරාමෙ -පෙ- තත්‍රෙව රාජගහෙ විහරාමි වෙළුවනෙ කලන්දකනිවාපෙ -පෙ- තත්‍රෙව රාජගහෙ විහරාමි ජීවකම්බවනෙ -පෙ- තත්‍රෙව රාජගහෙ විහරාමි මද්දකුච්ඡිස්මිං මිගදායෙ. තත්‍රාපි[2] ඛො තාහං ආනන්ද ආමන්තෙසිං: රමණීයං ආනන්ද රාජගහං, රමණීයො ගොතමකනිග්‍රොධො -පෙ- රමණීයා චොරපපාතො -පෙ- රමණීයා වෙභාරපස්සෙ සත්තපණ්ණිගුහා -පෙ- රමණීයා ඉසිගිලිපස්සෙ කාළසිලා -පෙ- රමණීයො සීතවනෙ සප්පසොණ්ඩිකපබ්භාරෙ -පෙ- රමණීයො තපොදාරාමෙ -පෙ- රමණීයො වෙළුවනෙ කලන්දකනිවාපො -පෙ- රමණීයං ජීවකම්බවනං -පෙ- රමණීයෙ මද්දකුච්ඡිස්මිං මිගදායෙ. යස්ස කස්සචි ආනන්ද චත්තාරො ඉද්ධිපාද භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, සො ආකඞ්ඛමානො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා. තථාගතස්ස ඛො ආනන්ද චත්තාරො ඉද්ධිපාද භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා. සො ආකඞ්ඛමානො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා'ති.

1. කරියමානෙ, සී්වූ . 2. නිග්‍රොධාරාමෙ, PTS 3. තත්‍ර, PTS.

Free Distribution www.aathaapi.org

''අනඳයෙනි, එබැවින් මෙහි තෙපි තථාගතයන් විසින් මෙසේ ඖදරික නිමිති කරනු ලබන කල්හි, ඖදරිකාවභාසය කරනු ලබන කල්හි, යම් හෙයකින් එය පිළිවිදිනුවට නො හැකි වූහු ද, 'වහන්ස, භාග්‍යවත්හු බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙවිමිනිස්නට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස කපක් වැඩ සිටින් වා, සුගත්හු කපක් වැඩ සිටින් වා' යි තථාගතයන් නො යැදූහු ද, එය තොපගේ ම දුෂ්කෘතය, තොපගේ ම වරද ය. අනඳයෙනි, ඉදින් තෙපි තථාගතයන් යැදූහු නම්, තථාගතයෝ තොපගේ වචන දෙකක් පිළිකෙව්නාහ. වැලි තෙවැන්න ඉවසන්නාහ. එහෙයින් අනඳයෙනි, මෙහි මෙය තොපගේ ම දුෂ්කෘතය, තොපගේ ම වරද ය.

76. අනඳයෙනි, එක් සමයෙක මම රජගහ නුවර ගිජුකුළු පව්වෙහි වෙසෙමි. එහි දී ද මම තොප බණවා ''අනඳයෙනි, රජගහ පුර සිත්කලු ය. ගිජුකුළු පව්ව සිත්කළු ය. අනඳයෙනි, යම් කිසිවක්හු විසින් සතර සෘද්ධිපාද භාවිත බහුලීකෘත යානීකෘත වාස්තුකෘත අනුෂ්ඨිත පරිචිත සුසමාරබ්ධ නම්, හේ කැමැත්තේ කපක් හෝ කපට වැඩියක් කල් සිටිය හැකි වන්නේ යැ' යි කිමි. අනඳයෙනි, මෙසේත් තථාගතයන් විසින් ඖදරික නිමිත්ත කරනු ලබන කල්හි, ඖදරික අවභාසය කරනු ලබන කල්හි එය දනගන්නට නො හැකි වූහු. තථාගතයනට ''වහන්ස, බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙවිමිනිස්නට අර්ථ පිණිස හිත පිණිස සුව පිණිස භගවත්හු කපක් වැඩසිටින් වා, සුගත්හු කපක් වැඩ සිටින් වා' යි යාචනා නො කළහු ය. අනඳයෙනි, ඉදින් තෙපි තථාගතයන් යැදූහු නම්,තථාගතයෝ තොප වචනදෙකක් ම පිළිකෙව්නාහ, වැලි තෙවැන්න ඉවසන්නාහ. අනඳයෙනි, එබැවින් මෙහි තොපගේ ම දුෂ්කෘත ය, තොපගේ ම වරද ය.

අනඳයෙනි, එක් සමයෙක්හි මම ඒ රජගහ නුවර ම ගෞතම න්‍යග්‍රොධය මුලැ වෙසෙමි ... ඒ රජගහ නුවර ම චොරප්‍රපාතයෙහි වෙසෙමි...ඒ රජගහ නුවර ම වෛභාර පර්වතද්වාර්ශ්වයෙහි සප්තපර්ණිගුහායෙහි වෙසෙමි – ඒ රජගහ නුවර ම ඍෂිගිරිපාර්ශ්වයෙහි කාලශිලායෙහි වෙසෙමි ... ඒ රජගහ නුවර ම ශීතවනයෙහි සප්පසෞණ්ඩික පබ්භාරයෙහි වෙසෙමි ... ඒ රජගහ නුවර ම තපොදාරාමයෙහි වෙසෙමි.... ඒ රජගහ නුවරෙහි කලන්දක නිවාප නම් වූ වෙළුවනයෙහි වෙසෙමි...ඒ රජගහ නුවරෙහි ම මද්දකුච්ඡි මුවලැවුහි වෙසෙමි. අනඳයෙනි, එහි දී ද තොප බණවා 'අනඳයෙනි, රජගහ පුර සිත්කලු ය, අනඳයෙනි, ගෞතම න්‍යග්‍රොධය සිත්කලු ය, ... චොරප්‍රපාතය සිත්කලු ය ... වෛභාරපාර්ශ්වයෙහි සප්තපර්ණිගුහාව සිත්කලු ය ... ඍෂිගිරිපාර්ශ්වයෙහි කාලශිලාව සිත්කලු ය. ... ශීතවනයෙහි සප්පසෞණ්ඩිකපබ්භාරය සිත්කලු ය. ... තපොදාරාමය සිත්කලු ය ... කලන්දකනිවාප නම් වූ වෙළුවනය සිත්කලු ය ... මද්දකුච්ඡි මුවවනය සිත්කලු ය. අනඳයෙනි, යම් කිසිවක්හු විසින් සතර සෘද්ධිපාද භාවිත ද බහුලීකෘත ද යානීකෘත ද වාස්තුකෘත ද, අනුෂ්ඨිත ද පරිචිත ද සුසමාරබ්ධ ද හේ කැමැත්තේ කපක් හෝ කපකට වැඩියක් කල් හෝ සිටිය හැකි වන්නේ යැ' යි කිමි.

Free Distribution www.aathaapi.org

එවම්පි ඛො ආනන්ද තථාගතෙන, ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ –පෙ– නාසකඞ් පටිවිජ්ඣිතුං. න තථාගතං යාව් 'තිට්ඨතු භගවා කප්පං, තිට්ඨතු සුගතො කප්පං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති' සඤ්ඤං ආනන්ද තථාගතං යාචෙය්‍යාසි, දෙව තෙ වාචා තථාගතං පටික්ඛිපෙය්‍ය, අථ තතියකං අධිවාසෙය්‍ය. තස්මාතිහානන්ද තුය්හෙවෙතං දුක්කටං, තුය්හෙවෙතං අපරද්ධං.

77. එකමිදහං ආනන්ද සමයං ඉධෙව වෙසාලියං විහරාමි උදෙන–චෙතියෙ. තත්‍රපි ඛො තාහං ආනන්ද ආමන්තයිඃ: රමණීයා ආනන්ද වෙසාලී, රමණීයං උදෙනං චෙතියං. යස්ස කස්සචි ආනන්ද චත්තාරො ඉද්ධිපාද භාවිතා –පෙ– සුසමාරද්ධා, සො ආකඞ්ඛමානො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා තථාගතස්ස ඛො ආනන්ද චත්තාරො ඉද්ධිපාද භාවිතා –පෙ– සුසමාරද්ධා. සො ආකඞ්ඛමානො ආනන්ද තථාගතො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා'ති. එවම්පි ඛො තං ආනන්ද තථාගතෙන ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ –පෙ– නාසකඞ් පටිවිජ්ඣිතුං –පෙ– තස්මාතිහානන්ද තුය්හෙවෙතං දුක්කටං, තුය්හෙවෙතං අපරද්ධං.

එකමිදහං ආනන්ද සමයං ඉධෙව වෙසාලියං විහරාමි ගොතමකෙ චෙතියෙ. –පෙ– ඉධෙව වෙසාලියං විහරාමි සත්තඹෙ චෙතියෙ. –පෙ– ඉධෙව වෙසාලියං විහරාමි බහුපුත්තෙ චෙතියෙ. –පෙ– ඉධෙව වෙසාලියං විහරාමි සාරන්දදෙ චෙතියෙ –පෙ– ඉදඤ්ච ඛො තාහං ආනන්ද අජ්ජ වාපාලෙ චෙතියෙ ආමන්තෙසිං: රමණීයා ආනන්ද වෙසාලී, රමණීයං වාපාලං චෙතියං. යස්ස කස්සචි ආනන්ද චත්තාරො ඉද්ධිපාද භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා, සො ආකඞ්ඛමානො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා. තථාගතස්ස ඛො ආනන්ද චත්තාරො ඉද්ධිපාද භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා පරිචිතා සුසමාරද්ධා. සො ආකඞ්ඛමානො ආනන්ද තථාගතො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා'ති. එවම්පි ඛො තං ආනන්ද තථාගතෙන ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ, ඔළාරිකෙ ඔභාසෙ කයිරමානෙ නාසකඞ් පටිවිජ්ඣිතුං. න තථාගතං යාව්; තිට්ඨතු භගවා කප්පං, තිට්ඨතු සුගතො කප්පං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති, සඤ්ඤං තං ආනන්ද තථාගතං යාචෙය්‍යාසි, දෙවං තෙ වාචා තථාගතං පටික්ඛිපෙය්‍ය, අථ තතියකං අධිවාසෙය්‍ය තස්මාතිහානන්ද තුය්හෙවෙතං දුක්කටං, තුය්හෙවෙතං අපරද්ධං.

Free Distribution www.aathaapi.org

අනඳයෙනි, මෙසේක් තථාගතයන් විසින් ඖදරික නිමිත්ත කරනු ලබන කල්හි ... එය දැනගන්නට නො හැකි වූහ. 'භගවත්හු බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙවිමිනිස්නට වැඩ පිණිස හිත පිණිස සුව පිණිස කපක් හෝ කපකට වැඩියක් වැඩ සිටිත් වා' යි තථාගතයන් නො ම යැදූහ. අනඳයෙනි, ඉදින් තෙපි තථාගතයන් යැදූහු නම්, තොපගේ වචන දෙකක් ම තථාගතයෝ පිළිකෙව්නාහ, වැලි තෙවැන්න ඉවසන්නාහ. එහෙයින් අනඳයෙනි, මෙහි තොපගේ ම දුෂ්කෘතය වෙයි, තොප ගේ ම වරද වෙයි.

77. අනඳයෙනි, එක් සමයෙක්හි මේ විසල්පුරෙහි ම උදෙන චෛත්‍යයෙහි වෙසෙමි. එහි දී ද අනඳයෙනි, තොප බණුවා "අනඳයෙනි, විසල් පුර සිත්කලු ය, උදෙන චෛත්‍යය සිත්කලු ය. අනඳයෙනි, යම්ක්හු විසින් සතර සෘද්ධිපාද භාවිත ... සුසමාරබ්ධ වී නම්, හේ කැමැත්තේ කපක් හෝ කපකට වැඩි කල් සිටිය හැකි වන්නේ ය. අනඳයෙනි, තථාගතයන් විසින් වනාහි සතර සෘද්ධිපාදයෝ භාවිත හ ... සුසමාරබ්ධ හ. ඔබ කැමැත්තාහු කපක් හෝ එයට වැඩියක් කල් හෝ සිටියැ හැකි වන්නාහ" යි කීමි. අනඳයෙනි, මෙසේ තථාගතයන් විසින් ඖදරික නිමිත්ත කරනු ලබන කල්හි ... එය දැනගන්නට නො හැකි වූහ. එහෙයින් අනඳයෙනි, මෙහි මේ තොපගේ ම දුෂ්කෘතය ය, මේ තොපගේ ම වරද ය.

අනඳයෙනි, මම් එක් සමයෙක මෙහි විසල්පුර ගෞතමක චෛත්‍යයෙහි වෙසෙමි ... මේ විසල්පුරෙහි ම සප්තාම්බචෛත්‍යයෙහි වෙසෙමි ... මේ විසල්පුරයෙහි ම බහුපුත්‍රක චෛත්‍යයෙහි වෙසෙමි ... මේ විසල්පුරයෙහි ම සාරන්දද චෛත්‍යයෙහි වෙසෙමි ... අනඳයෙනි, අද දැන් මේ චාපාල චෛත්‍යයෙහි දී තොප බණුවා 'අනඳයෙනි, විසල්පුර සිත්කලු ය, චාපාලචෛත්‍යය සිත්කලු ය. අනඳයෙනි, යම් කිසිවක්හු විසින් සතර සෘද්ධිපාද භාවිත බහුලීකෘත යානීකෘත වාස්තුකෘත අනුෂ්ඨිත පරිචිත සුසමාරබ්ධ නම්, හේ කැමැත්තේ කපක් හෝ කපකට වැඩියක් කල් සිටියැ හැකි වන්නේ ය. අනඳයෙනි, තථාගතයන් විසින් සතර සෘද්ධිපාද භාවිත ය, බහුලීකෘත ය, යානීකෘත ය, වාස්තුකෘත ය, අනුෂ්ඨිත ය, පරිචිත ය, සුසමාරබ්ධ ය. අනඳයෙනි, ඒ තථාගතයෝ කැමැත්තාහු නම් කපක් හෝ එයට වැඩියක් කල් සිටිය හැකි වන්නාහ' යි කීමි. අනඳයෙනි, මෙසේක් තථාගතයන් විසින් ඖදරික නිමිත්තය කරනු ලබන කල්හි, ඖදරිකාවභාසය කරනු ලබන කල්හි, එය දැනගන්නට නො හැකි වූහු. 'බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුග්‍රහ පිණිස, දෙවිමිනිස්නට වැඩ පිණිස, හිත පිණිස, සුව පිණිස, භගවත්හු කපක් වැඩසිටිත් වා, සුගත්හු කපක් වැඩසිටිත් ව' යි තථාගතයන් නො යැදූහු. අනඳයෙනි, ඉදින් තෙපි යැදූහු නම්, තථාගතයෝ තොප කී බස දෙවරක් ම පිළිකෙව්නාහ. තෙවෙනි වර ඉවසන්නාහ. එහෙයින් අනඳයෙනි, මෙහි මේ තොපගේ ම දුෂ්කෘතය වෙයි, තොපගේ ම වරද වෙයි.

Free Distribution www.aathaapi.org

78. නප්වතෙං ආනන්ද මයා පටිගච්චෙව අක්ඛාතං: සබ්බෙහෙව පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො අඤ්ඤථාභාවො. තං කුතෙත්ථ ආනන්ද ලබ්භා යං තං ජාතං භූතං සඞ්ඛතං පලොකධම්මං. තං වත මා පලුජ්ජිතී. නෙතං ඨානං විජ්ජති. යං බො පනෙතං ආනන්ද තථාගතෙන චත්තං වන්තං මුත්තං පහීණං පටිනිස්සට්ඨං, ඔස්සට්ඨො ආයුසඞ්ඛාරො, එකංසෙන වාචා තථාගතෙන භාසිතා 'න චිරං තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති, ඉතො තිණ්ණං මාසානං අච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සතී'ති. තඤ්චෙනං[1] තථාගතො ජීවිතහෙතු පුන පච්චාවමිස්සතී'ති නෙතං ඨානං විජ්ජති.

79. ආයාමානන්ද යෙන මහාවනං කූටාගාරසාලා තෙනුපසඞ්කමිස්සාමා'ති. "එවං භන්තෙ"ති බො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි අථ බො භගවා ආයස්මතා ආනන්දෙන සද්ධිං යෙන මහාවනං කූටාගාරසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි; ගච්ඡ ත්වං ආනන්ද, යාවතිකා භික්ඛු වෙසාලිං උපනිස්සාය විහරන්ති, තෙ සබ්බෙ උපට්ඨානසාලායං සන්නිපාතෙහී"ති. "එවං භන්තෙ"ති බො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා, යාවතිකා භික්ඛු වෙසාලිං උපනිස්සාය විහරන්ති, තෙ සබ්බෙ උපට්ඨානසාලායං සන්නිපාතෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො බො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච; "සන්නිපාතිතො භන්තෙ භික්ඛුසඞ්ඝො, යස්ස'දානි භන්තෙ භගවා කාලං මඤ්ඤතී"ති.

[බ්‍රහ්මචරියචිරට්ඨිතික-ධම්මදෙසනා]

80. අථ බො භගවා යෙන උපට්ඨානාසලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ බො භගවා භික්ඛු ආමන්තෙසි: "තස්මාතිහ භික්ඛවෙ යෙ තෙ[2] මයා ධම්මා අභිඤ්ඤා දෙසිතා, තෙ වො සාධුකං උග්ගහෙත්වා ආසෙවිතබ්බා භාවෙතබ්බා බහුලීකාතබ්බා යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං. තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං කතමෙ ච තෙ භික්ඛවෙ ධම්මා මයා අභිඤ්ඤා[3] දෙසිතා, යෙ වො[4] සාධුකං උග්ගහෙත්වා ආසෙවිතබ්බා භාවෙතබ්බා බහුලීකාතබ්බා යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං. තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. සෙය්‍යථිදං, චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාද පඤ්චින්ද්‍රියානි, පඤ්ච බලානි. සත්ත බොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො.

---

1. තංචෙනං, ස්‍යා තං වචනං, PTS සීමු.
2. යෙ වො, PTS
3. අභිඤ්ඤාය, PTS.
4. තෙ වො, සීමු.

Free Distribution www.aathaapi.org

78. අනඳයෙනි, ප්‍රිය වූ මන වඩන්නාවූ සියලු දැය කෙරෙන් වෙන් වීම, ඉවත් වීම, අන් සැටියෙකින් වීම යන මෙය මා විසින් කල් තබා ම තොපට කියන ලද්දේ නො වේ ද? අනඳයෙනි, යමක් උපන්නේ ද, වූයේ ද, සැකැසුණේ ද, පලුදු වන සුලු ද, 'එය පලුදු නො වේ වා' යි යන මෙය කොයින් ලැබෙන්නේ ද? මෙ කරුණ විද්‍යමාන නො වේ. අනඳයෙනි, යමක් තථාගතයන් විසින් හරන ලද ද, බැහැර කරන ලද ද, මුදන ලද ද, පහ කරන ලද ද, දුරු ලන ලද ද,යම් ආයුසංස්කාරයෙක් හරන ලද ද, නොබෝ කල්හි තථාගතයන්ගේ පිරිනිවීම වන්නේ යැ යි. මෙයින් තෙමසක් ඇවෑමෙන් තථාගතයෝ පිරිනිවෙන්නාහ' යි යම් එකාන්ත වචනයෙක් තථාගතයන් විසින් කියන ලද ද, ඒ වචනය තථාගතයෝ දිවි හෙයින් නුමුදු වළහන්නාහ යන මෙය නැත්තේ ය. මේ කාරණය අවිද්‍යමාන ය.

79. 'අනඳයෙනි, යමු, මහාවනය යම් තැනෙක ද, කුළාරහල් වෙහෙර යම් තැනෙක ද, එ තැනට එළැඹෙන්නම්හ' යි බුදුරජුහු වදළාහ. 'එසේ ය වහන්සැ' යි අනඳ තෙරණුවෝ භාග්‍යවත් බුදුරජුනට පිළිවදන් දුන්හ. එකල්හි භාග්‍යවත්හු ආයුෂ්මත් අනඳ තෙරුන් හා මහ වෙනෙහි කුළාරහල් වෙහෙර කරා වැඩියහ. වැඩ අනඳ තෙරුන් බණවා, 'අනඳයෙනි, යවු, යම් පමණ මහණහු විසල්පුර නිසා වෙසෙත් ද, ඔවුන් හැම උවටන්හලැ රැස්කරවු' යි වදළහ. 'එසේ ය, වහන්සැ' යි අනඳ තෙරණුවෝ බුදුරජුනට පිළිවදන් දී විසල්පුර වසනා තාක් හැම මහණුන් උවටන්හලැ රැස් කොට භාග්‍යවත් බුදුරජුන් කරා එළැඹ වැඳ පසෙක සිටියාහ. පසෙකැ සිටියාවූ අනඳ තෙරණුවෝ භගවත් බුදුරජුනට 'වහන්ස, බික්සඟ රැස් කරන ලද්දේ ය. යමක් පිණිස භාග්‍යවතුන් වහන්සේ දැන් කල් සිතන සේක් නම් මේ ඒ කලැ'' යි සැළ කළහ.

[බ්‍රහ්මවර්‍යාචිරස්ථායි ධර්මදෙශනා]

80. ඉක්බිති භගවත්හු උවටන්හල කරා එළැඹියහ. එළැඹ, පණවා තුබුණු අස්නැ වැඩහුන්හ. වැඩහිඳ ම මහණුන් බණවා, ''මහණෙනි, යම් සේ මේ සසුන්බඹසර බොහෝ කල් පැවැත්ත හෙන්නේ ද, චිරස්ථිතික වන්නේ ද, එසේ මෙහි මා විසින් යම් ධර්ම කෙනෙක් වෙසෙසි නුවණින් දැන දෙසන ලද ද, තොප විසින් ඒ මොනොවට ඉගෙන ආසෙවන කළ යුතු, භාවනා විසින් වැඩිය යුතු, බහුල වශයෙන් කළ යුතු. එය බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සැප පිණිස, ලොවට අනුකම්පා පිණිස දෙව්මිනිස්නට අර්ථ පිණිස, හිත පිණිස සුව පිණිස වන්නේ ය. මහණෙනි, යම්සේ මේ සසුන් බඹසර බොහෝ කල් පැවැත්ත හෙන්නේ ද, චිරස්ථිතික වන්නේ ද, එය බොහෝ දෙනාට සැප පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව්මිනිස්නට අර්ථ පිණිස, හිත පිණිස, සුව පිණිස වන්නේ ද, එසේ ඒ යම් ධර්ම කෙනෙක් තොප විසින් මොනොවට ඉගෙන ආසෙවන කළ යුතු ද, වැඩිය යුතු ද, බහුල කළ යුතු ද, මහණෙනි, මා විසින් වෙසෙසි නුවණින් දැන දෙසන ලද ඒ ධර්මයෝ කවුරු ද යත්: ඔහු නම් සතර සතිපට්ඨානයෝ ය, සතර සම්‍යක්ප්‍රධානයෝ ය, සතර සෘද්ධිපාදයෝ ය, පංච ඉන්ද්‍රියයෝ ය, පඤ්ච බල ය, සප්ත බොධ්‍යඞ්ග ය, ආර්‍ය අෂ්ටාංගික මාර්ගය ය යන මොහු ය.

Free Distribution www.aathaapi.org

ඉමෙ ඛො භික්ඛවෙ ධම්මා මයා අභිඤ්ඤා දෙසිතා. තෙ වො සාධුකං උග්ගහෙත්වා ආසෙවිතබ්බා බහුලීකාතබ්බා යථායිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං, තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති''.

81. අථ ඛො භගවා භික්ඛු ආමන්තෙසි: ''හන්ද'දානි භික්ඛවෙ ආමන්ත-යාමි වො. වයධම්මා සඞ්ඛාරා. අප්පමාදෙන සම්පාදෙථ. නචිරං තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති. ඉතො තිණ්ණං මාසානං අච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සති''ති. ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා[1]:

පරිපක්කො වයො මයහං පරිත්තං මම ජීවිතං
පහාය වො ගමිස්සාමි කතමෙම සරණමත්තනො.
අප්පමත්තා සතිමන්තො සුසීලා හොථ භික්ඛවො,
සුසමාහිතසඞ්කප්පා සචිත්තමනුරක්ඛථ.
යො ඉමස්මිං ධම්මවිනයෙ අප්පමත්තො විහස්සති[2],
පහාය ජාතිසංසාරං දුක්ඛස්සන්තං කරිස්සති ති.

තතියභාණවාරො.

1. ඉතො පරං ස්‍යාමපොත්ථකෙ අයං අධිතො පාඨො'පි දිස්සතෙ;
''දහරා පි ච යෙ වුඩ්ඪා යෙ බාලා යෙ ච පණ්ඩිතා
අඩ්ඪා චෙව දළිද්ද ච සබ්බෙ මච්චුපරායණා
යථා පි කුම්භකාරස්ස කතං මත්තිකභාජනං
බුද්දකං ච මහන්තං වයඤ්ච පකකඤ්චආමකං
සබ්බං භෙදනපරියන්තං එවං මච්චාන ජීවිතං
අථාපරං එතදවොච'' සත්ථා

2. විහරිස්සති ස්‍යා, විහෙසසති සීමු. සද්දනීතියං 1038 – ''විහරසස ඝ – විපුබ්බසස හර ධාතුස්ස 'ඝ' ඉච්චාදෙසො හොති වා සසතිමහි විහත්තියං – අප්පමත්තො විහසසති''

Free Distribution www.aathaapi.org

මහණෙනි, මේ ධර්මයෝ වනාහී මා විසින් වෙසෙසි නුවණින් දැන දෙසන ලදහ. ඔහු තොප විසින් මේ සත්‍යාවබෝධයෙර බොහෝ කල් පවත්නා පිණිස, චිරස්ථිතික වනු පිණිස, මොනොවට ඉගෙන ආසෙවන කළ යුතු, වැඩියැ යුතු, බහුල කළ යුතු. එය බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙවමිනිස්නට අර්ථ පිණිස හිත පිණිස සැප පිණිස වන්නේ යැ''යි වදළහ.

81. ඉක්බිති භගවත්හු භික්ෂූන් ඔණවා, ''මහණෙනි, දැන් තොප අමතමි. සංස්කාරයෝ නැසෙන සුල්ලහ. නොපමායෙන් තුන්සික සපයවු. නොබෝ කල්හි තථාගතයන්ගේ පිරිනිවන වන්නේ ය. මෙයින් තුන් මස් ඇවැමෙන් තථාගතයෝ පිරිනිවෙන්නාහ'' යි වදළහ. භගවත්හු මෙය වදළහ. සුගත්හු මෙය වදරා ඉක්බිති ඒ ශාස්තෘහු ගාථාබන්ධන වශයෙන් අනෙකක් වූ මේ වචන ද වදළහ:

''මගේ වයස මුහුකෙළේ ය. මගේ ජීවිතකාලය (තව) ස්වල්පයකි. තොප හැර යන්නෙමි. මා විසින් තමහට පිහිට කරන ලද්දේ ය.

මහණෙනි, නොපමා වවු, සිහි ඇත්තෝ වවු, සුසිල් වවු, මොනොවට පිහිටුවූ සම්‍යක්කල්පනා ඇත්තෝ තමන් සිත රැකගනිවු.

යමෙක් මේ සස්නෙහි නොපමා ව වෙසෙන්නේ නම්, හෙතෙම ජාතිසංසාරය (ඉපැත්ම ද සසර ද නොහොත් ජාතිසංඛ්‍යාත සසර) හැරලා දුක් කෙළවර කරන්නේ ය.''

තෙවෙනි බණවර යි.

Free Distribution www.aathaapi.org

[චතුත්තාරො අරියධම්මා]

82. අථ ඛො භගවා පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය වෙසාලිං පිණ්ඩාය පාවිසි. වෙසාලියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නාගාපලොකිතං[1] වෙසාලිං අපලොකෙත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ඉදං පච්ඡිමකං ආනන්ද තථාගතස්ස වෙසාලියා දස්සනං භවිස්සති. ආයාමානන්ද යෙන භණ්ඩගාමො[2] තෙනුපසඞ්කමිස්සාමා'ති. 'එවම්භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන භණ්ඩගාමො තදවසරි. තත්‍ර සුදං භගවා භණ්ඩගාමෙ විහරති.

තත්‍ර ඛො භගවා භික්ඛු ආමන්තෙසි: "චතුන්නං භික්ඛවෙ ධම්මානං අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. කතමෙසං චතුන්නං? අරියස්ස භික්ඛවෙ සීලස්ස අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. අරියස්ස භික්ඛවෙ සමාධිස්ස අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච – අරියාය භික්ඛවෙ පඤ්ඤාය -පෙ- අරියාය භික්ඛවෙ විමුත්තියා -පෙ-

තයිදං භික්ඛවෙ අරියං සීලං අනුබුද්ධං. පටිවිද්ධං අරියො සමාධි අනුබුද්ධො පටිවිද්ධො. අරියා පඤ්ඤා අනුබුද්ධා පටිවිද්ධා. උච්ඡින්නා භවතණ්හා ඛීණා භවනෙත්ති. නත්ථිදානි පුනබ්භවො''ති. ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

''සීලං සමාධි පඤ්ඤා ච විමුත්ති ච අනුත්තරා
අනුබුද්ධා ඉමෙ ධම්මා ගොතමෙන යසස්සිනා,

ඉති බුද්ධො අභිඤ්ඤාය ධම්මමක්ඛාසි භික්ඛුනං
දුක්ඛස්සන්තකරො සත්ථා චක්ඛුමා පරිනිබ්බුතො''ති.

1. නාගාවලොකිතං, ස්‍යා
2 භණ්ඩුගාමො, මජ්ඣං

Free Distribution www.aathaapi.org

[ආයුෂ්ධර්ම සතර]

82. ඉක්බිත්තෙන් භගවත්හු පෙරවරු සමයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙන විසල්පුර පිඬු පිණිස පිවිසියහ. විසල්පුර පිඬු පිණිස හැසිර පසුබත්හි පිඬුවායෙන් පෙරළා වැඩියහු, නාගාපලෝකනයෙන් විසල්පුර බලාවදාරා, අනඳ තෙරුන් බණවා, ''අනඳයෙනි, මේ තථාගතයන්ගේ පශ්චිම වෛශාලිදර්ශනය වත්තේ ය. යමු, අනඳයෙනි, භණ්ඩගාමය වෙත එළඹෙන්නමු'' යි වදළහ. 'එසේ ය වහන්සැ' යි කියා අනඳ තෙරණුවෝ භගවත් බුදුරජුනට පිළිවදන් ඇස්වූහ. ඉක්බිති භගවත්හු මහත් ඕක්සහන කැටුව භණ්ඩ ගම වෙත වැඩියහ. භගවත්හු එහි භණ්ඩ ගමෙහි වැඩවෙසෙති.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් බණවා, ''මහණෙනි, සතර ධර්මයන් අනුබොධ නොකිරීමෙන් ප්‍රතිවෙධ නොකිරීමෙන් මෙසේ මේ දික් කලක් මගේ ද තොපගේ ද සසර සැරුම් විය. කවර සතර ධර්මයන්ගේ (අනනුබොධයෙන් අප්‍රතිවෙධයෙන්) ද යත්: මහණෙනි, ආර්‍ය්‍ය ශීලයාගේ අනනුබොධයෙන් අප්‍රතිවෙධයෙන් මෙසේ මේ දික් කලක් මගේ ද තොප ගේ ද සසර දිවැ හැවිදීම, සසර සැරිම විය. මහණෙනි, ආර්‍ය්‍ය සමාධිහුගේ අනනුබොධයෙන් අප්‍රතිවෙධයෙන් මෙසේ මේ දික් කලක් මගේ ද තොපගේ ද සසර දිවැ හැවිදීම, සසර සැරුම් විය - මහණෙනි, ආර්‍ය්‍ය ප්‍රඥාවගේ . . මහණෙනි, ආර්‍ය්‍ය විමුක්තිය ගේ අනනුබොධයෙන් අප්‍රතිවෙධයෙන් මෙසේ මේ දීර්ඝ කාලයක් මගේ ද තොප ගේ ද සසර දිව හැවිදීම, සසර සැරිම විය.

මහණෙනි, ඒ ආර්‍ය්‍ය ශීලය මා විසින් ද තොප විසින් ද අනුබුද්ධ ය, ප්‍රතිවිද්ධ ය. ඒ ආර්‍ය්‍ය සමාධිය මා විසින් ද තොප විසින් ද අනුබුද්ධ ය, ප්‍රතිවිද්ධ ය. ඒ ආර්‍ය්‍ය ප්‍රඥාව මා විසින් ද තොප විසින් ද අනුබුද්ධ ය, ප්‍රතිවිද්ධ ය. භවතෘෂ්ණාව සිදුනා ලදි, භවනෙත්තිය ක්ෂීණ විය. දැන් පුනර්භවයෙක් නැතැ'' යි වදළහ. භගවත්හු මෙය, වදළාහ. සුගත්හු මෙය වදාරා, යළිදු ගාථා බන්ධන විසින් අනෙකක් වූ මේ වචන වදළාහ:

''ලොවුතුරු ශීලය ද ලොවුතුරු සමාධිය ද ලොවුතුරු ප්‍රඥාව ද ලොවුතුරු විමුක්තිය ද යන මේ දහමිහු කීර්තිමත් ගෞතමයන් විසින් අනුබෝධ කරන ලදුහ.

මෙසේ බුදුහු වෙසෙසින් දැන මහණුනට දහම් දෙසූහ. පසැස් ඇති, දුක් නැසූ ඒ ශාස්තෘහු කෙලෙස් පිරිනිවනින් පිරිනිවියාහ.''

Free Distribution www.aathaapi.org

තත්‍රාපි සුදං භගවා භණ්ඩගාමෙ විහරන්නො එතදෙව බහුලං භික්ඛුනං ධම්මං කථං කරොති: "ඉති සීලං, ඉති සමාධි, ඉති පඤ්ඤා. සීලපරිභාවිතො සමාධි මහප්ඵලො හොති මහානිසංසො. සමාධිපරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති මහානිසංසා. පඤ්ඤාපරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති සෙය්‍යථීදං කාමාසවා භවාසවා අවිජ්ජාසවා'ති.

[චත්තාරො මහාපදෙසා]

83. අථ ඛො භගවා භණ්ඩගාමෙ යථාභිරන්නං විහරිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: 'ආයාමානන්ද යෙන හත්ථිගාමො, යෙන අම්බගාමො, යෙන ජම්බුගාමො, යෙන භොගනගරං තෙනුපසඞ්කමිස්සාමා''ති. "එවම්භන්තෙ''ති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන භොගනගරං තදවසරි. තත්‍රසුදං භගවා භොගනගරෙ විහරති ආනන්දෙ චෙතියෙ.

තත්‍ර ඛො භගවා භික්ඛු ආමන්තෙසි: "චත්තාරො' මෙ භික්ඛවෙ මහාපදෙසෙ දෙසිස්සාමි. තං සුණාථ සාධුකං මනසි කරොථ, භාසිස්සාමී''ති. 'එවම්භන්තෙ''ති ඛො තෙ භික්ඛු භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

ඉධ භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: "සම්මුඛා මෙතං ආවුසො භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං, අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාස-නන්ති'' තස්ස භික්ඛවෙ භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං න පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි[1] විනයෙ සන්දස්සෙතබ්බානි. තානි චෙ සුත්තෙ ඔතාරියමානානි[2] විනයෙ සන්දස්සියමානානි න චෙව සුත්තෙ ඔතරන්ති[3] න ච විනයෙ සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: අද්ධා ඉදං න චෙව තස්ස භගවතො වචනං, ඉමස්ස ච භික්ඛුනො දුග්ග-හිතන්ති. ඉති හෙතං භික්ඛවෙ ඡඩෙඩය්‍යාථ. තානි චෙ සුත්තෙ ඔතාරිය-මානානි විනයෙ සන්දස්සියමානානි සුත්තෙ චෙව ඔතරන්ති විනයෙ ච සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: 'අද්ධා ඉදං තස්ස භගවතො වචනං. ඉමස්ස ච භික්ඛුනො සුග්ගහිත'න්ති. ඉමං භික්ඛවෙ පඨමං මහාපදෙසං ධාරෙය්‍යාථ. (1)

1. ඔසාරෙතබ්බානි, මජ්ඣං
2. ඔසාරියාමානානි
3. ඔසරන්ති.

Free Distribution www.aathaapi.org

භාග්‍යවතුන්වහන්සේ ඒ හණ්ඩගාමයෙහි වසන සේක් "ශීලය මෙබඳු යැ, සමාධිය මෙබඳු යැ, ප්‍රඥාව මෙබඳු යැ. ශීලයෙන් පරිභාවිත සමාධිය මහත් පල ඇත්තේ ය, මහත් අනුසස් ඇත්තේ ය, සමාධියෙන් පරිභාවිත ප්‍රඥාව මහත් ඵල ඇත්තේ ය, මහත් අනුසස් ඇත්තේ ය, ප්‍රඥායෙන් පරිභාවිත සිත ක මාස්‍රවය කෙරෙන් ද භවාස්‍රවය කෙරෙන් ද අවිද්‍යාස්‍රවය කෙරෙන් දැ යි මෙසේ මේ කී ආස්‍රවකෙරෙන් මොනොවට මිදේ යැ" යැ යි භික්ෂූනට මෙය ම බහුල කොටැති ධර්මකථාවක් කරන සේක.

සතර මහා අපදේශ

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හණ්ඩගාමයෙහි කැමැති තාක් රැඳී හිඳ, අනඳ තෙරුන් ඛණවා, 'අනඳයෙනි, එවු යමු, **හත්ථිග්‍රාමය** යම් තැනෙක ද එ තැනට එළැඹෙන්නමු' යි වදළ සේක. ... **අම්බගාමය** යම් තැනෙක ද එ තැනට ... **ජම්බුගාමය** යම් තැනෙක ද එ තැනට ... **භෝග නගරය** යම් තැනෙක ද එහි යන්නමු' යි වදළ සේක. 'එසේ යැ, වහන්ස' යි අනඳ තෙරණුවෝ භගවත් බුදුරජුනට පිළිවදන් දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ඝසඝන කැටුව භෝග නගරය කරා වැඩි සේක. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ භෝග නගරයෙහි **ආනන්ද චෛත්‍යස්ථානයෙහි** වැඩ වෙසෙන සේක.

83. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණුන් ඛණවා, "මහණෙනි, සතර මහා අපදේශයන් දෙසන්නෙමි. එය අසවු, මොනොවට සිත්හි කරවු, කියන්නෙමි' යි වදළ සේක. 'එසේ යැ වහන්ස' යි ඒ මහණහු භගවත් බුදුරජුනට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක: "මහණෙනි, මෙහි මහණෙක්, 'ඇවැත්නි, ධර්මය මේ යැ විනය මේ යැ, ශාස්තෘශාසනය මේ යැ' යි භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි සිට මා විසින් මෙය අසන ලද්දේය භාග්‍යවතුන්වහන්සේ හමුයෙහිදී පිළිගන්නා ලද්දේ යැ' යි මෙසේ කියන්නේ නම්, මහණෙනි, (එ පමණින්) එ මහණහුගේ වචනය නො ම පිළිගත යුතු, අනා ද පිළිකෙවු කළ යුතු. නො ම පිළිගෙන, නො ද පිළිකෙවු කොට, ඒ පද ව්‍යංජන මොනොවට ඉගෙන සූත්‍රයෙහි බහා ලියැ යුතු, විනයෙහි සැසැඳියැ යුතු. ඉදින් සූත්‍රයෙහි බහාලනු ලබන්නාහු, විනයයෙහි සසඳනු ලබන්නාහු සූත්‍රයෙහි නො බස්නාහු ද, විනයෙහි නො සැසැඳෙන්නාහු ද, එ විටැ 'ඒකාන්තයෙන් මෙය ඒ භාග්‍යවතුන් වහන්සේ ගේ වචන නො වේ, මෙය මේ මහණහු වරදවා ගත් දැයෙකැ' යි මෙහි නිෂ්ඨාවට පැමිණියැ යුතු. මහණෙනි, මෙසේ මෙය බැහැරැ කරවු. ඉදින් ඒ පද ව්‍යඤ්ජනයෝ සූත්‍රයෙහි බහාලනු ලබන්නාහු, විනයෙහි සසඳනු ලබන්නාහු, සූත්‍රයෙහිත් බැසැඟනිත් ද විනයෙහිත් සැසැඳෙත් ද, එ විටැ 'ඒකාන්තයෙන් මෙය ඒ භාග්‍යවතුන් වහන්සේ ගේ වචන යැ යි, මේ මහණහු විසින් මෙය මොනොවට උගන්නා ලද' යි නිෂ්ඨාවට යා යුතු. මහණෙනි, මෙසේ මේ පළමු මහා අපදේශය සිත්හි ලා දරවු. (1)

Free Distribution www.aathaapi.org

ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: අමුකස්මිං නාම ආවාසෙ සඞ්ඝා විහරති සථෙරා සපාමොජ්ජා. තස්ස මෙ සඞ්ඝස්ස සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං 'අයං ධම්මෝ අයං විනයෝ ඉදං සත්ථුසාසන'න්ති තස්ස භික්ඛවෙ භික්ඛුනෝ භාසිතං නෙව අභිනන්දිතබ්බං නප්පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි[1] විනයෙ සන්දස්සෙතබ්බානි තානි වෙ සුත්තෙ ඔතාරියමානානි[2] විනයෙ සන්දස්සියමානානි න වෙව සුත්තෙ ඔතරන්ති[3] න ච විනයෙ සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: 'අද්ධා ඉදං න වෙව තස්ස භගවතෝ වචනං, තස්ස ච සඞ්ඝස්ස දුග්ගහිත'න්ති. ඉති හෙතං භික්ඛවෙ ඡඩ්ඩෙය්‍යාථ. තානි වෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි සුත්තෙ වෙව ඔතරන්ති විනයෙ ච සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: 'අද්ධා ඉදං තස්ස භගවතෝ වචනං, තස්ස ච සඞ්ඝස්ස සුග්ගහිත'න්ති. ඉදං භික්ඛවෙ දුතියං මහාපදෙසං ධාරෙය්‍යාථ. (2)

ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: අමුකස්මිං නාම ආවාසෙ සම්බහුලා ථෙරා භික්ඛු විහරන්ති බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනය-ධරා මාතිකාධරා. තෙසං මෙ ථෙරානං සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං 'අයං ධම්මෝ අයං විනයෝ ඉදං සත්ථුසාසන'න්ති. තස්ස භික්ඛවෙ භික්ඛුනෝ භාසිතං නෙව අභිනන්දිතබ්බං නප්පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි විනයෙ සන්දස්සෙතබ්බානි. තානි වෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි න වෙව සුත්තෙ ඔතරන්ති න ච විනයෙ සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: "අද්ධා ඉදං න වෙව තස්ස භගවතෝ වචනං, තෙසඤ්ච ථෙරානං දුග්ගහිත'න්ති. ඉති හෙතං භික්ඛවෙ ඡඩ්ඩෙය්‍යාථ තානි වෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි සුත්තෙ වෙව ඔතරන්ති විනයෙ ච සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: 'අද්ධා ඉදං තස්ස භගවතෝ වචනං, තෙසඤ්ච ථෙරානං සුග්ගහිත'න්ති. ඉදං භික්ඛවෙ තතියං මහාපදෙසං ධාරෙය්‍යාථ. (3)

1. ඔසාරෙතබ්බානි මජ්ඣං
2. ඔසාරියමානානි, මජ්ඣං
3. ඔසරන්ති, මජ්ඣං

Free Distribution www.aathaapi.org

මහණෙනි, මෙහි මහණෙක් 'තෙරුන් සහිත ගණුපාමොක් මහණක්හු සහිත භික්ෂුසංඝයා අසෝ නම් ආවාසයෙහි වෙසෙයි. 'මේ දහමැ යි, මේ විනයැ යි, මේ ශාස්තෘශාසන යැ යි ඒ සඟන හමුයෙහි සිටි මා විසින් අසන ලදී, අසා ඒ සඟන හමුයෙහි මැ පිළිගන්නා ලදැ' යි කියන්නේ වී නම් මහණෙනි, (එ පමණින්) ඒ මහණහු ගේ වචනය නො ම පිළිගත යුතු, නො ද පිළිකෙවු කළ යුතු. නො ම පිළිගෙන, නො ද පිළිකෙවු කොට, ඒ පද ව්‍යඤ්ජන මොනොවට ඉගෙන, සූත්‍රයෙහි බහාලියැ යුතු, විනයෙහි සැසැඳිය යුතු. ඔහු සූත්‍රයෙහි බහාලනු ලබන්නාහු, විනයෙහි සසඳනු ලබන්නාහු, සූත්‍රයෙහි නො ම බැස ගන්නාහු නම් විනයෙහි නො ද සැසැඳෙත් නම්, 'ඒකාන්තයෙන් මේ භාග්‍යවතුන් වහන්සේ ගේ වචන නො වේ' යැ යි ද 'ඒ සඟන විසිනුත් වරදවා ගන්නා ලද්දෙකැ' යි ද කියා මෙහි නිෂ්ඨාවට යෑ යුතු. මහණෙනි, මෙසේ මෙය ද බැහැර ලවු. ඉදින් ඔහු සූත්‍රයෙහි බහාලනු ලබන්නාහු විනයෙහි සසඳනු ලබන්නාහු, සූත්‍රයෙහිත් බැස ගනිත් නම්, විනයෙහිත් සැසැඳෙත් නම්, 'ඒකාන්තයෙන් මෙය ඒ භාග්‍යවතුන් වහන්සේ ගේ වචන යැ, මෙය ඒ සඟන විසිනුත් මොනොවට උගන්නා ලද්දේ යැ'යි මෙහි නිෂ්ඨාවට යෑ යුතු. මහණෙනි, මෙසේ මේ දෙවෙනි මහ අපදේශය සිත්හි ලා දරවු. (2)

මහණෙනි, මෙහි මහණෙක් 'අසෝ නම් ආවාසයෙහි බොහෝ ඇසූ පිරූ තන් ඇති, වාචෝද්ගත කළ ආගමය ඇති, ධර්මධර විනයධර මාතෘකා ධර බොහෝ ස්ථවිර භික්ෂූහු වෙසෙත්. 'මේ ධර්මයැ' යි 'මේ විනය යැ' යි මේ ශාස්තෘශාසනයැ' යි ඒ තෙරුන් හමුයෙහි සිටි මා විසින් අසන ලදී, මා විසින් පිළිගන්නා ලදැ' යි කියන්නේ නම්, මහණෙනි, ඒ මහණහු ගේ වචනය නො මැ පිළිගත යුතු, නො ද පිළිකෙවු කළ යුතු, නො ම පිළිගෙන, නො ද පිළිකෙවු කොට, ඒ පද ව්‍යඤ්ජන මොනොවට ඉගෙන සූත්‍රයෙහි බහාලිය යුතු, විනයෙහි සැසැඳිය යුතු. ඔහු සූත්‍රයෙහි බහාලනු ලබන්නාහු, විනයෙහි සසඳනු ලබන්නාහු, සූත්‍රයෙහි නො බැසැ ගනිත් ද, විනයෙහි නො සැසැඳෙත් ද, එ විටැ 'ඒකාන්තයෙන් මේ ඒ භාග්‍යවතුන් වහන්සේ ගේ වචනය නො වේ, ඒ තෙරවරුන් විසින් ද මෙය වරදවා ගන්නා ලදසේ යැ' යි මෙහි නිෂ්ඨාවට පැමිණියැ යුතු. මහණෙනි, මෙසේ මෙය බැහැර කරවු. ඉදින් ඔහු සූත්‍රයෙහි බහාලනු ලබන්නාහු, විනයෙහි සසඳනු ලබන්නාහු, සූත්‍රයෙහි බැසැ ගනිත් ද, විනයෙහි සැසැඳෙත් ද, 'ඒකාන්තයෙන් මේ ඒ භාග්‍යවතුන් වහන්සේ ගේ වචන යි, ඒ තෙරවරුන් විසිනුත් මොනොවට උගන්නා ලද සේ යැ' යි මෙහි නිෂ්ඨාවට යෑ යුතු. මහණෙනි, මෙසේ මේ තෙවෙනි මහා අපදේශය සිත්හි ලා දරවු. (3)

Free Distribution www.aathaapi.org

ඉධ පන භික්ඛවෙ භික්ඛු එවං වදෙය්‍ය: 'අමුකස්මිං නාම ආවාසෙ එකෝ ථෙරෝ භික්ඛු විහරති බහුස්සුතෝ ආගතාගමෝ ධම්මධරෝ විනය-ධරෝ මාතිකාධරෝ. තස්ස මේ ථෙරස්ස සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං 'අයං ධම්මෝ අයං විනයෝ ඉදං සත්ථුසාසන'න්ති .තස්ස භික්ඛවෙ භික්ඛුනෝ භාසිතං නෙව අභිනන්දිතබ්බං නප්පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්ප-ටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙ-තබ්බානි. විනයෙ සන්දස්සෙතබ්බානි. තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි න චෙව සුත්තෙ ඔතරන්ති න ච විනයෙ සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: 'අද්ධා ඉදං න චෙව තස්ස භගවතෝ වචනං, තස්ස ච ථෙරස්ස දුග්ගහිත'න්ති. ඉති හෙතං භික්ඛවෙ ඡඩ්ඩෙය්‍යාථ. තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි සුත්තෙ චෙව ඔතරන්ති විනයෙ ච සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: 'අද්ධා ඉදං තස්ස භගවතෝ වචනං, තස්ස ච ථෙරස්ස සුග්ගහිත'න්ති. ඉදං භික්ඛවෙ චතුත්ථං මහාපදෙසං ධාරෙය්‍යාථ. (4) ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරෝ මහාපදෙසෙ ධාරෙය්‍යාථා''ති.

තත්‍රපි සුදං භගවා ඔභාගතාගරෙ විහරන්තෝ ආනන්දෙ චෙතිය්‍යෙ එතදෙව බහුලං භික්ඛූනං ධම්මිං කථං කරොති: 'ඉති සීලං, ඉති සමාධි, ඉති පඤ්ඤා. සීලපරිභාවිතෝ සමාධි මහප්ඵලෝ ඔහාති මහානිසංසෝ. සමාධිපරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති මහානිසංසා. පඤ්ඤාපරිභාවිතං චිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති. සෙය්‍යථීදං කාමාසවා භවාසවා අවිජ්ජාසවා'ති.

[චුන්ද-කම්මාරපුත්තසුත්තං]

84. අථ ඛො භගවා ඔභාගතාගරෙ යථාභිරන්තං විහරිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ''ආයාමානන්ද යෙන පාවා, තෙනුපසඞ්කමිස්සාමා''ති. ''එවමභන්තෙ''ති ඛො ආයස්මා ආනන්දෙ භගවතෝ පච්චස්සොසි. අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන පාවා තදවසරි. තත්‍ර සුදං භගවා පාවායං විහරති චුන්දස්ස කම්මාරපුත්තස්ස අම්බවනෙ. අස්සොසි ඛො චුන්දෙ කම්මාරපුත්තෙ 'භගවා කිර පාවං අනුප්පත්තෝ පාවායං විහරති මය්හං අම්බවනෙ'ති. අථ ඛො චුන්දෙ කම්මාරපුත්තෙ යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො චුන්දං කම්මාරපුත්තං භගවා ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො චුන්දෙ කම්මාරපුත්තෙ භගවතා ධම්මියා කථාය සන්දස්සිතෝ සමාදපිතෝ සමුත්තෙජිතෝ සම්පහංසිතෝ භගවන්තං එතදවොච: 'අධිවාසෙතු මෙ භන්තෙ භගවා චාතුන්නාය භත්තං සද්ධිං භික්ඛු සඞ්ඝෙනා'ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො චුන්දෙ කම්මාර-පුත්තෙ භගවතෝ අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවා-දෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

Free Distribution www.aathaapi.org

මහණෙනි, මෙහි මහණෙක් 'අසෝ නම් ආවාසයෙහි බොහෝ ඇසූ පිරූ තත් ඇති, වාචෝද්ගත ආගමය ඇති, ධර්මධර විනය ධර මාතෘකාධර එක් ස්ථවිර භික්ෂූ නමෙක් වෙසෙයි. 'මේ ධර්මය යැ, මේ විනය යැ, මේ ශාස්තෘශාසනය යැ' යි ඒ තෙරුන් හමුයෙහි සිටි මා විසින් අසන ලදී, ඒ තෙරුන් හමුයෙහි මා විසින් පිළිගත්නා ලදැ' යි මෙසේ කියන්නේ නම්, මහණෙනි, ඒ මහණහු ගේ වචනය එ පමණින් නො ම පිළිගත යුතු, නො ද පිළිකෙවු කළ යුතු. නො ම පිළිගෙන, නො ද පිළිකෙවු කොට, ඒ පද ව්‍යඤ්ජන මොනොවට ඉගෙන, සූත්‍රයෙහි බහා ලියැ යුතු, විනයෙහි සැසැඳියැ යුතු. ඉදින් ඔහු සූත්‍රයෙහි බහා දැනු ලබන්නාහු, විනයයෙහි සසඳනු ලබන්නාහු, සූත්‍රයෙහි නො ම බැසගතිත් ද, විනයෙහිත් නො ම සැසැඳෙත් ද, එ විටැ 'මෙය ඒකාන්තයෙන් ඒ භාග්‍යවතුන් වහන්සේ ගේ වචන නො වේ, ඒ තෙරහු විසින් ද වරදවා ගන්නා ලද්දෙකැ' යි මෙහි නිෂ්ඨාවට යැ යුතු. මහණෙනි, මෙසේ මෙය බැහැර කරවූ. ඉදින් ඔහු සූත්‍රයෙහි බහාලනු ලබන්නාහු, විනයෙහි සසඳනු ලබන්නාහු, සූත්‍රයෙහි බැසගනිත් ද, විනයයෙහිත් සැසැඳෙත් ද, එ විට 'මෙය ඒකාන්තයෙන් ඒ භාග්‍යවතුන් වහන්සේ ගේ වචන යැ. ඒ තෙරහු විසිනුත් මොනොවට ඉගෙන ඇති නියා යැ' යි මෙහි නිෂ්ඨාවට යැ යුතු. මහණෙනි, මෙසේ මේ සිවුවන මහා අපදේශය සිත්හි ලා දරවූ. (4) මහණෙනි, මේ සතර මහා අපදේශයන් සිත්හි දරවූ'' යනු යි.

භාග්‍යවතුන් වහන්සේ ඒ භෝග නගරයෙහි අනඳ සෑයෙහි වසන සේක්, ''සිල් නම් මෙසේ යැ, සමාධි නම් මෙසේ යැ, ප්‍රඥාව මෙසේ යැ, ශීලයෙන් පරිභාවිත සමාධිය මහත් පල හා මහත් අනුසස් හා ඇත්තේ වේ, සමාධියෙන් පරිභාවිත ප්‍රඥාව මහත් පල හා මහත් අනුසස් හා ඇති වේ, ප්‍රඥායෙන් පරිභාවිත සිත කාමාස්‍රව භවාස්‍රව අවිද්‍යාස්‍රව යන ආස්‍රවකෙරෙන් මොනොවට මිදේ'' යැ යි මහණුනට මේ ධර්මකථාව ම බහුල කොට කරන සේක.

චුන්ද කර්මාරපුත්‍ර කථාව

84. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ භෝග නගරයෙහි කැමැතිතාක් කල් රැඳී සිට, අනඳ තෙරුන් අමතා, 'අනඳයෙනි, එවු, යමු, පාවා නුවර කරා යන්නමිහ' යි වදළ සේක. 'එසේ යැ වහන්සැ' යි අනඳ තෙරණුවෝ භගවත් බුදුරජුනට පිළිවදන් දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහත් බික්ඛසඟන කැටුව පාවා නුවර කරා වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ එහි පාවා නුවර චුන්ද නම් කර්මාර පුත්‍රයා ගේ අඹ වෙනෙහි වැඩ වෙසෙන සේක. චුන්ද කර්මාර පුත්‍ර තෙම 'භගවත්හු පාවා නුවරට වැඩියාහු, පාවා නුවර මගේ අඹවෙනෙහි වෙසෙත් ලු'යි ඇසී ය. එ කලැ චුන්ද කර්මාර පුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේ වෙත ගියේ ය. ගොස් ඔබ වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන්නා වූ ම චුන්ද කර්මාර පුත්‍රයාට භාග්‍යවතුන් වහන්සේ දැහැමි කතායෙන් දෙලෝ වැඩ දක්වූ සේක. දක්වූ වැඩෙහි සිත් ගැන්වූ සේක. එහි සිත තියුණු කළ සේක. එහි සිත සතුටු කළ සේක. එ කල්හි චුන්ද කර්මාර පුත්‍ර තෙම භගවත් බුදුරජුන් වහන්සේ විසින් දැහැමි කතායෙන් දෙලෝ වැඩ දක්වන ලදුයේ, දෙලෝ වැඩෙහි සිත ගැන්වුණේ, එහි සිත තියුණු කරන ලදුයේ, එහි සිත සතුටු කරන ලදුයේ, 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සෙට දවසට බික්ඛසඟන හා මා බත ඉවසන සේක් වා' යි කී ය. භාග්‍යවතුන් වහන්සේ නිහඬ බැවින් එය ඉවැසූ සේක. ඉක්බිති චුන්ද කර්මාර පුත්‍ර තෙම භගවත් බුදුරජුන් ගේ ඉවැසීම දැන, හුනස්නෙන් නැගී ඔබ වැඳ, පැදකුණු කොට නික්මියේ ය.

Free Distribution www.aathaapi.org

අථ ඛො චුන්දෙ කම්මාරපුත්තෙන තස්සා රත්තියා අච්චයෙන සකෙ නිවෙසනෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා පහූතඤ්ච සූකරමද්දවං, භගවතො කාලං අරොචාපෙසි: කාලො භන්තෙ, නිට්ඨිතං භත්තන්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන චුන්දස්ස කම්මාරපුත්තස්ස නිවෙසනං තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා චුන්දං කම්මාරපුත්තං ආමන්තෙසි: 'යන්තෙ චුන්ද සූකරමද්දවං පටියත්තං, තෙන මං පරිවිස. යං පනඤ්ඤං ඛාදනීයං භොජනීයං පටියත්තං, තෙන භික්ඛුසඞ්ඝං පරිවිසා'ති. 'එවම්භන්තෙ'ති ඛො චුන්දො කම්මාරපුත්තො භගවතො පටිස්සුත්වා යං අහොසි සූකරමද්දවං පටියත්තං, තෙන භගවන්තං පරිවිසි. යං පනඤ්ඤං ඛාදනීයං භොජනීයං පටියත්තං, තෙන භික්ඛුසඞ්ඝං පරිවිසි.

අථ ඛො භගවා චුන්දං කම්මාරපුත්තං ආමන්තෙසි: යන්තෙ චුන්ද සූකරමද්දවං අවසිට්ඨං, තං සොඛෙන භූමිනාභි. නාහං තං චුන්ද පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ, සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යස්ස තං පරිභුත්තං සම්මා පරිණාමං ගච්ඡෙය්‍ය අඤ්ඤත්‍ර තථාගතස්සා'ති. 'එවම්භන්තෙ'ති ඛො චුන්දො කම්මාරපුත්තො භගවතො පටිස්සුත්වා, යං අහොසි සූකරමද්දවං අවසිට්ඨං තං ගොඛෙන භූමිනාභිං, යෙන භගවා තෙනුපසඞ්කමි: උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො චුන්දං කම්මාරපුත්තං භගවා ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

[ලොහිතපක්ඛන්දිකා ආබාධො]

85: අථ ඛො භගවතො චුන්දස්ස කම්මාරපුත්තස්ස භත්තං භුත්තාවිස්ස ඛරො ආබාධො උප්පජ්ජි ලොහිතපක්ඛන්දිකා. පබාළ්හා වෙදනා වත්තන්ති මාරණන්තිකා. තා සුදං භගවා සතො සම්පජානො අධිවාසෙසි අවිහඤ්ඤමානො.

අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ''ආයාමානන්ද යෙන කුසිනාරා තෙනුපසඞ්කමිස්සාමා''ති. 'එවම්භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි.

Free Distribution www.aathaapi.org

ඉක්බිති චුන්ද කර්මාර පුත්‍ර තෙම එ රෑය ඇවෑමෙන් සිය ගෙහි ප්‍රණීත වූ ඛාද්‍ය භෝජ්‍ය ද ඛොහෝ සූකරමාර්දව ද පිළියෙළ කරවා, 'වහන්ස, වඩනාට කල් පැමිණියේ ය, බත පිළියෙළ කොට නිමැවිණැ' යි කියා භගවත් බුදුරජුනට කාලය දන්වා යැවී ය. භාග්‍යවතුන් වහන්සේ ද පෙරවරු සෙමෙහි හැඳැ පෙරවැ පා සිවුරු ගෙන බික්සහන කැටුව චුන්ද කර්මාර පුත්‍රයාගේ ගෙට වැඩි සේක. වැඩ ප්‍රඥප්ත අසුන්හි හිඳගත් සේක. හිඳැගෙන (ඒ සූකරමාර්දවය ඒ කිසිදු භික්ෂූනමක් විසින් දිරවා ගත නොහෙනු දක), චුන්ද කර්මාර පුත්‍රයා බණවා, ''චුන්දයෙනි, කොප විසින් යම් සූකරමාර්දවයෙක් පිළියෙල කරන ලද ද, එයින් මා වළඳවව, යම් අන් ඛාද්‍යයෙක් භෝජ්‍යයෙක් පිළියෙල කරන ලද ද, එයින් බික්සහන වළඳවව' යි වදළ සේක. චුන්ද කර්මාරපුත්‍ර ද 'එසේ යැ, වහන්සැ' යි භගවත් බුදුරජුනට පිළිවදන් දී, පිළියෙල කරන ලද යම් සූකරමාර්දවයෙක් වී ද එයින් භගවත් බුදුරජුන් වැළැඳැවී ය. යම් අන් ඛාද්‍ය භෝජනයෙක්, පිළියෙල කරන ලද ද, එයින් බික්සහන වැළැඳැවී ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ චුන්ද කර්මාර පුත්‍රයා අමතා,' චුන්දයෙනි, කොප පිළියෙල කළ යම් සූකරමාර්දවයෙක් ඉතිරි වැ ඇද්ද, එය වළෙකැ ලව. චුන්දයෙනි, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොවැ, මහණ බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත සත්මුළුයෙහි, තථාගතයන් හැර අන් යමක්හු විසින් ඒ සූකරමාර්දවය වළඳන ලද්දේ ජඨරාග්නියෙන් මැනැවින් දිරීමට යන්නේ නම්, එ වැන්නක්හු මම නො දකිමි' යි වදළ සේක. 'එසේ යැ වහන්සැ' යි කියා ම චුන්ද කර්මාර පුත්‍ර භගවත් බුදුරජුනට පිළිවදන් දී, යම් ඉතිරි වැ තුබුණු සූකරමාර්දවයෙක්වීද, එය වළෙකැ ලා භගවත් බුදුරජුන් කරා එළැඹියේ ය. එළැඹැ ඔබ වැඳ පසෙක හුන්නේ ය. පසෙකැ හුන් චුන්ද කර්මාරපුත්‍රයාට භාග්‍යවතුන් වහන්සේ දැහැමි කථායෙන් දන් අනුහස් දක්වා එහි සිත් ගන්වා, එහි සිත තියුණු කොට, එහි සිත සතුටු කොට, හුනස්නෙන් නැඟී වැඩි සේක.

ලෝහිත පක්ඛන්දිකා ආඛාධය

85. චුන්ද කර්මාරපුත්‍රයා ගේ ඛොජුන වැළැඳු භාග්‍යවතුන් වහන්සේට ක්‍රූර වූ ලෝහිත පක්ඛන්දිකා රෝගයෙක් උපන. මරණය කෙළවර කොටැති ඉතා දැඩි දුක් වේදනාවෝ පවත්නාහ. භාග්‍යවතුන් වහන්සේ එළැඹැ සිටි සිහි ඇති සේක්, නුවණින් දන්නා සේක්. ඒ රෝගයෙන් නො ම ගැහැටෙන සේක්, ඒ දුක් වේදනාවන් ඉවැසූ සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් ඇමැතූ සේක. අමතා, 'අනඳයෙනි, එමු, කුසිනාරාව කරා යන්නමු' යි වදළ සේක. 'එසේ යැ වහන්සැ' යි අනඳ තෙරණුවෝ භගවත් බුදුරජුනට පිළිවදන් දුන්හ.

Free Distribution www.aathaapi.org

"චුන්දස්ස භත්තං භුඤ්ජිත්වා කම්මාරසාහි මෙ සුතං,
ආබාධං සම්ඵුසී ධීරො පබාළ්හං[1] මාරණන්තිකං.

භුත්තස්ස ච සූකරමද්දවෙන
බ්‍යාධිපබාළ්හො උදපාදි සත්ථුනො.
විරිඤ්චමානො[2] භගවා අවොච
ගච්ඡාමහං කුසිනාරං නගරන්ති."

[ආනන්දෙන පානීයාහරණං]

86. අථ ඛො භගවා මග්ගා ඔක්කම්ම යෙනඤ්ඤතරං රුක්ඛමූලං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: "එහි ත්වං මෙ ත්වං ආනන්ද චතුගඟුණං සඞ්ඝාටිං පඤ්ඤපෙහි. කිලන්තොස්මි ආනන්ද, නිසීදිස්සාමී"ති. 'එවම්භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා චතුගඟුණං සඞ්ඝාටිං පඤ්ඤපෙසි. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: "එහි ත්වං මෙ ත්වං ආනන්ද පානීයං ආහර, පිපාසිතොම්හි ආනන්ද පිවිස්සාමී'ති එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "ඉදානි භන්තෙ පඤ්චමත්තානි සකටසතානි අතික්කන්තානි. තං චක්කඛිත්තං උදකං පරිත්තං ලුළිතං ආවිලං සන්දති. අයං භන්තෙ කකුත්ථා නදී අවිදූරෙ අච්ඡොදකා[3] සාතොදකා සීතොදකා සෙතකා[4] සුපතිත්ථා[5] රමණීයා. එත්ථ භගවා පානීයඤ්ච පිවිස්සති, ගත්තානි ච සීතිකරිස්සතී"ති. දුතියම්පි ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: 'එහි ත්වං මෙ ත්වං ආනන්ද පානීයං ආහර, පිපාසිතොස්මි ආනන්ද පිවිස්සාමී'ති දුතියම්පි ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "ඉදානි භන්තෙ පඤ්චමත්තානි සකටසතානි අතික්කන්තානි. තං චක්කඛිත්තං උදකං පරිත්තං ලුළිතං ආවිලං සන්දති. අයං භන්තෙ කකුත්ථා නදී අවිදූරෙ අච්ඡොදකා සාතොදකා සීතොදකා සෙතකා[4] සුපතිත්ථා[5] රමණීයා. එත්ථ භගවා පානීයඤ්ච පිවිස්සති, ගත්තානි ච සීතිකරිස්සතී"ති.

තතියම්පි ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: 'එහි ත්වං මෙ ත්වං ආනන්ද පානීයං ආහර, පිපාසිතොස්මි ආනන්ද පිවිස්සාමී"ති 'එවම්භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා පත්තං ගහෙත්වා යෙන සා නදිකා තෙනුපසඞ්කමි.

---

1. සම්බාළ්හං, සී්‍ය.
2. විරෙවමානො මජ්ඣං, සී්‍යු. විරිවමානො, දී අ
3. අවෙච්ඡදිකා – මජ්ඣං 4. සෙතොදකා, මජ්ඣං 5. සුපතිත්ථා, මජ්ඣං

Free Distribution www.aathaapi.org

චුන්ද කර්මාරපුත්‍රයා ගේ ඔත වැළැඳීමෙන් යිර වූ බුදුරජුහු මරණය කෙළවර කොටැති ඉතා දැඩි ආබාධයක් ස්පර්ශ කළහ' යි මා විසින් අසන ලදි.

සූකරමාර්දවය හා බොජුන් වැළැඳූ ශාස්තෘන් වහන්සේට ඉතා දරුණු වූ ව්‍යාධියෙක් උපන. භගවත්හු එක්වන් පැවැති ලෝහිත විරේචන ඇත්තාහු, මම කුසිනාරා නුවර යමි' යි වදළහ.''

අනඳ තෙරුන් පැන් ගෙනෑ වීම

86. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මඟින් ඉවත් වැ, එක්තරා රුකක් මුලට වැඩිසේක. වැඩ අනඳ තෙරුන් බණවා අනඳයෙනි, මා සඟළ සිවුර සිවු ගුණ කොට පණවවු, ක්ලාන්තයෙමි, අනඳයෙනි, හිඳගන්නෙමි' යි වදළ සේක. 'එසේ යැ වහන්සැ' යි අනඳ තෙරණුවෝ බුදුරජුනට පිළිවදන් දී, සඟළ සිවුර සිවුගුණ කොට පැණැවූහ. එසේ පැණැවුණු අස්නෙහි භගවත්හු වැඩහුන්හ. භගවත්හු වැඩහිඳ ම ආයුෂ්මත් අනඳ තෙරුන් අමතා, 'අනඳයෙනි, තෙපි මට පැන් ගෙනෙවු, පවස් ඇතියෙමි, පැන් බොන්නෙමි' යි වදළ සේක. මෙසේ වදළ කල්හි, අනඳ තෙරණුවෝ බුදුරජුනට ''වහන්ස, පන්සියක් පමණ ගැල්හු ඉක්මියාහ. ගැල් සකින් සිඳුණු මඳ වූ ජලය කැලැඹුණේ බොරවැ ගලා යයි. වහන්ස, මේ කකුත්ථා නදිය නොදුරෙහි ය, පහන් දිය ඇත්තේ ය, මිහිරි දිය ඇත්තේ ය, සිසිල් දිය ඇත්තේ ය, මඩ නැත්තේ ය, මනා තොට ඇත්තේ ය, සිත්කලු ය. භාග්‍යවතුන් වහන්සේ ඒ මේ කකුත්ථා නදියෙහි දී පැන් වැළැඳිය හැකි වන සේක, ඇඟ සිසිල් කැරගත හැකි වන සේකැ'' යි කීහ. භාග්‍යවතුන් වහන්සේ දෙවෙනි වර ද අනඳ තෙරුන් අමතා, 'අනඳයෙනි, මට පැන් ගෙනෙවු, පවස් ඇතියෙමි, පැන් බොන්නෙමි' යි වදළ සේක. දෙවෙනි වර ද අනඳ තෙරණුවෝ බුදුරජුනට, 'වහන්ස, දැන් පන්සියක් පමණ ගැල්හු ඉක්මියාහ. ගැල්සකින් සිඳුණු මඳ වූ ජලය කැලැඹුණේ බොර වැ ගලා යෙයි. වහන්ස, මේ කකුත්ථා නදිය නොදුරෙහි ය, පහන් දිය ඇත්තේ ය, මිහිරි දිය ඇත්තේ ය, සිසිල් දිය ඇත්තේ ය, මඩ නැත්තේ ය, මනා තොට ඇත්තේ ය, සිත්කලු ය, භාග්‍යවතුන් වහන්සේ ඒ මේ කකුත්ථා නදියෙහි දී පැන් වැළැඳියැ හැකි වන සේක, ඇඟ සිසිල් කැරගත හැකි වන සේකැ'' යි කීහ.

තෙවෙනි වර ද භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරුන් අමතා, 'අනඳයෙනි, තෙපි මට පැන් ගෙනෙවු. පවස් ඇතියෙමි, පැන් බොන්-නෙමි' යි වදළ සේක. 'එසේ යැ, වහන්සැ' යි කියා ම අනඳ තෙරණුවෝ භගවත් බුදුරජුනට පිළිවදන් දී, පාත්‍රය ගෙන ඒ ඛුඩා නදිය වෙතට වැඩියාහ.

Free Distribution www.aathaapi.org

අථ බො සා නදිකා වක්කඛලිත්ථා පරිත්තා ලුළිතා ආවිලා සන්දමානා ආයස්මන්තෙන ආනන්දෙ උපසඞ්කමන්තෙ අච්ඡා විප්පසන්නා අනාවිලා සන්දිත්ථ. අථ බො ආයස්මා, ආනන්දස්ස එතදහොසි: 'අච්ඡරියං වත හො, අබ්භුතං වත හො, තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා. අයං හි සා නදිකා වක්කඛලිත්ථා පරිත්තා ලුළිතා ආවිලා සන්දමානා මයි උපසඞ්කමන්තෙ අච්ඡා විප්පසන්නා අනාවිලා සන්දති'ති. පත්තෙන පානීයං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: "අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා. ඉදානි සා භන්තෙ නදිකා වක්කඛලිත්ථා පරිත්තා ලුළිතා ආවිලා සන්දමානා මයි උපසඞ්කමන්තෙ අච්ඡා විප්පසන්නා අනාවිලා සන්දිත්ථ. පිවතු භගවා පානීයං, පිවතු සුගතො පානීයන්ති''. අථ බො භගවා පානීයං අපායි.

[පුක්කුසමල්ලපුත්තකථා]

87. තෙන බො පන සමයෙන පුක්කුසො මල්ලපුත්තො ආළාරස්ස කාලාමස්ස සාවකො කුසිනාරාය පාවං අද්ධානමග්ගපටිපන්නො හොති. අද්දසා බො පුක්කුසො මල්ලපුත්තො භගවන්තං අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසින්නං. දිස්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො බො පුක්කුසො මල්ලපුත්තො භගවන්තං එතදවොච: "අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, සන්තෙන වත භන්තෙ පබ්බජිතා විහාරෙන විහරන්ති. භූතපුබ්බං භන්තෙ, ආළාරො කාලාමො අද්ධානමග්ගපටිපන්නො මග්ගා ඔක්කම්ම අව්දූරෙ අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි. අථ බො භන්තෙ පඤ්චමත්තානි සකටසතානි ආළාරං කාලාමං නිස්සාය නිස්සාය අතික්කමිංසු. අථ බො භන්තෙ අඤ්ඤතරො පුරිසො තස්ස සකටසත්थස්ස පිට්ඨිතො පිට්ඨිතො ආගච්ඡන්තා යෙන ආළාරො කාලාමො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආළාරං කාලාමං එතදවොච: "අපි භන්තෙ පඤ්චමත්තානි සකටසතානි අතික්කමන්තානි අද්දසා?'ති 'න බො අහං ආවුසො අද්දසන්ති.' 'කිමපන භන්තෙ සද්දං අසොසී?'ති. 'න බො අහං ආවුසො සද්දං අසොසී'න්ති. 'කිමපන භන්තෙ සුත්තො අහොසි?'ති. න බො අහං ආවුසො සුත්තො අහොසි'න්ති 'කිමපන භන්තෙ සඤ්ඤී අහොසි?'ති 'එවමාවුසො'ති. 'සො වං භන්තෙ සඤ්ඤී සමානො ජාගරො පඤ්චමත්තානි සකටසතානි නිස්සාය නිස්සාය අතික්කමන්තානි නෙව අද්දස න පන සද්දං අසොසි අපියසු තෙ භන්තෙ සඞ්ඝාටි රජෙන ඔකිණ්ණා?ති. 'එවමාවුසො'ති. අථ බො භන්තෙ තස්ස පුරිසස්ස එතදහොසි: අච්ඡරියං වත හො, අබ්භුතං වත හො, සන්තෙන වත හො පබ්බජිතා විහාරෙන විහරන්ති, යත්ර හි නාම සඤ්ඤී සමානො ජාගරො පඤ්චමත්තානි සකටසතානි නිස්සාය නිස්සාය අතික්කමන්තානි නෙව දක්ඛිති, න පන සද්දං සොස්සති'ති ආළාරෙ කාලාමෙ උළාරං පසාදං පවෙදිත්වා පක්කාමි''ති.

Free Distribution www.aathaapi.org

එ කල්හි ගැල් සකින් සිදුණු ස්වල්ප ජලය ඇති, කැළැඹුණු, බොර වූ ඒ කුඩා නදිය ගලනුයේ, අනඳ තෙරුන් එළැඹෙන විටැ පහන් වැ, වෙසෙසින් පැදුණු දියැති වැ කැලැඹුම් නැති වැ ගැලිය. එ විටැ අනඳ තෙරුනට භවත්නි, තථාගතයන් වහන්සේ ගේ මහර්ද්ධි ඇති බව මහත් අනුභාව ඇති බව ආශ්චර්‍ය්‍ය යැ, අද්භූත යැ. ස්වල්ප දිය ඇති, ගැල් සකින් සිදුණු කැලැඹුණු, බොර වැ ගලන මේ නදිය මා එළැඹෙන විට පහන් විය, වෙසෙසින් පැදුණු දිය ඇති විය, කැලැඹුම් නැති වැ ගලා යැ'' යි මේ සිත විය. ඉක්බිති තෙරණුවෝ පාත්‍රයෙන් පැන් ගෙන භගවත් බුදුරජුන් වෙත එළැඹියහ. එළැඹැ ඔබට, ''වහන්ස, තථාගතයන් වහන්සේ ගේ මහර්ද්ධි ඇති බව, මහත් අනුභාව ඇති බව ආශ්චර්‍ය්‍ය යැ, අද්භූත යැ! වහන්ස, දැන් ගැල්සකින් සිඳී ගිය ජලය ඇති, ස්වල්ප ජලය ඇති, කැළැඹුණු බොර වැ ගලන ඒ කුඩා නදිය මා එළැඹෙන කලැ පහන් වැ, වෙසෙසින් පැදුණු දිය ඇති වැ කැළැඹුම් නැති වැ බොර නැති වැ ගැලී ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පැන් වළඳන සේක් වා, සුගතයන් වහන්සේ පැන් වළඳන සේක් වා'' යි කිහ. එ විටැ භාග්‍යවතුන් වහන්සේ පැන් වැළැඳූ සේක.

පුක්කුස මල්ල පුත්‍ර කථාව

87. එකලැ වනාහි ආළාරකාලාම තවුසාණන් ගේ ශ්‍රාවක වූ පුක්කුස නම් මල්ල පුත්‍රයෙක් කුසිනාරායෙන් පාවා නුවරට යන දික් මහට පිළිපන්නේ වෙයි. පුක්කුස මල්ලපුත්‍ර තෙමේ එක්තරා රුකක් මුලැ වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දැක ඔබ වෙතට ගියේ ය. ගොස් ඔබ වැඳ පසෙක හිඳ ගත. එක් පසෙක හුන්නා වූ ම පුක්කුස මල්ල පුත්‍ර තෙමේ භගවත් බුදුරජුනට මෙසේ කීය: වහන්ස, ආශ්චර්‍ය්‍යයි! වහන්ස, අද්භූත යි!! වහන්ස, පැවිද්දෝ ශාන්ත වූ විහරණයෙන් වෙසෙත්. වහන්ස, පෙරැ වූවක් කියම්. ''පෙරැ ආළාර කාලාමයෝ දික් මහකට පිළිපන්නාහු, මහින් ඉවත් වැ නොදුරෙහි වූ එක්තරා රුකක් මුලැ දිවාවිහරණය පිණිස හුන්හ. වහන්ස, එ කල්හි එක්තරා පුරුෂයෙක් ඒ ගැල්සාත්තුව පසු පයින් එනුයේ, ආළාර කාලාමයන් කරා එළැඹියේ ය එළැඹ, 'වහන්ස, (මේ පෙදෙස) ගැටි ගැටි ඉක් මැ යන පන්සියයක් පමණ ගැල් දුටු සේක් දෝ?' යි විචාළේ ය. 'ඇවැත්නි, මම නො ම දිටිමි' යි ආළාරකාලාමයෝ වදළාහ. 'වහන්ස, කිම? ගැල්සක් හඬ ඇසූ සේක් දෝ?' යි හේ විචාළේ ය. 'ඇවැත්නි, ගැල්සක් හඬද නො ම ඇසිමි' යි ආළාරකාලාමයෝ වදළාහ. 'වහන්ස, කිමෙක් ද? නිද්‍රෝපගත වැ හොත් සේක් දෝ?' යි හේ පුළුවුත. 'ඇවැත්නි, මම නිද්‍රෝපගත ද නො වීමි' යි ආළාරකාලාමයෝ වදළහ. 'කිමෙක් ද? වහන්ස, ඔබ සංඥා ඇති වැ හුන් සේක් ද?'' යි හේ පුළුවුත. 'එසේ යැ, ඇවැත්නි' යි ආළාර කාලාමයෝ වදළහ. 'වහන්ස, ඔබ සංඥා ඇති වන්නාහු ම, පිබිදු හුන්නාහු ම ගැටි ගැටි ඉක්මැ යන පන්සියයක් පමණ ගැල් නො දුටුවාහ, ගැල්සක් හඬ නො ම ඇසුවාහ. වහන්ස, එහෙත් ඔබ සහළ සිවුරු ධූලියෙන් වැකුණේ යැ!' යි හේ කිය. 'එසේ යැ ඇවැත්නි' යි ආළාර කාලාමයෝ වදළහ. වහන්ස, එ විටැ ඒ පුරුෂයාට මේ සිත විය. 'භවත්නි, ආශ්චර්‍ය්‍ය යැ! භවත්නි, පුදුම යැ!! යමෙක් සංඥාව ම පිබිදු හුන්නේ ම ගැටි ගැටී ඉක්මෙන පන්සියයක් පමණ ගැල් නො ම දිටී ද, ගැල් හඬක් නො ම ඇසී ද, එ බදු වූ ශාන්ත විහරණයෙකින් මේ පැවිද්දෝ වෙසෙති!!! යි මේ සිත විය. හේ මෙසේ ආළාරකාලාමයන් කෙරෙහි මහත් ප්‍රසාදය පළ කොට එතැනින් නික්මියේ ය'' යනු යැ.

Free Distribution www.aathaapi.org

තං කිම්මඤ්ඤසි පුක්කුස, කතමන්නු ඛො දුක්කරතරං වා දුරභි-සම්භවතරං වා යො සඤ්ඤී සමානො ජාගරො පඤ්චමත්තානි සකටසතානි නිස්සාය නිස්සාය අතික්කමන්නාති නෙව පස්සෙය්‍ය, න පන සද්දං සුණෙය්‍ය, යො වා සඤ්ඤී සමානො ජාගරො දෙවෙ වස්සන්තෙ දෙවෙ ගලගලායන්තෙ විජ්ජුතාසු[1] නිච්ඡරන්තීසු අසණියා ඵලන්තියා නෙව පස්සෙය්‍ය න පන සද්දං සුණෙය්‍යා?ති.

''කිඤ්හි භන්තෙ කරිස්සන්ති පඤ්ච වා සකටසතානි ඡ වා සකටසතානි සත්ත වා සකටසතානි අට්ඨ වා සකටසතානි නව වා සකටසතානි සකටසහස්සං වා සකටසතහස්ස වා. අථ ඛො එතදෙව දුක්කරතරං චෙව දුරභිසම්භවතරඤ්ච යො සඤ්ඤී සමානො ජාගරො දෙවෙ වස්සන්තෙ දෙවෙ ගලගලායන්තෙ විජ්ජුතාසු නිච්ඡරන්තීසු අසණියා ඵලන්තියා නෙව පස්සෙය්‍ය න පන සද්දං සුණෙය්‍යා''ති.

එකමිදාහං පුක්කුස සමයං ආතුමායං විහරාමි භුසාගාරෙ. තෙන ඛො පන සමයෙන දෙවෙ වස්සන්තෙ දෙවෙ ගලගලායන්තෙ විජ්ජුතාසු නිච්ඡරන්තීසු අසණියා ඵලන්තියා අවිදූරෙ භුසාගාරස්ස දෙව කස්සකා භාතරො භතා චත්තාරො ච බලිවද්දා. අථ ඛො පුක්කුස ආතුමාය මහාජනකායො නික්ඛමිත්වා යෙන තෙ දෙව කස්සකා භාතරො භතා චත්තාරා ච බලිවද්දා, තෙනුපසඞ්කමි. තෙන ඛො පනාහං පුක්කුස සමයෙන භුසාගාරා නික්ඛමිත්වා භුසාගාරද්වාරෙ අඛෙහාකාසෙ චඞ්කමාමි අථ ඛො පුක්කුස අඤ්ඤතරො පුරිසො තම්හා මහාජනකායා යෙනාහ. තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි එකමන්තං ඨිතං ඛො අහං පුක්කුස තං පුරිසං එතදවොචං 'කින්නුඛො සො ආවුසො මහාජනකායො සන්නිපතිතො?ති. ඉදානි භන්තෙ දෙවෙ වස්සන්තෙ දෙවෙ ගලගලායන්තෙ විජ්ජුතාසු නිච්ඡරන්තීසු අසණියා ඵලන්තියා දෙව කස්සකා භාතරො භතා චත්තාරො ච බලිවද්දා. එත්ථෙසො මහාජනකායො සන්නිපතිතො. ත්වම්පන භන්තෙ කුහිං අහොසි?'ති. 'ඉධෙව ඛො අහං ආවුසො අහොසි'න්ති. 'කිම්පන භන්තෙ න අද්දසා?ති. 'න ඛො අහං ආවුසො අද්දසන්නි'. 'කිම්පන භන්තෙ සද්දං අස්සොසි?'ති. 'න ඛො අහං ආවුසො සද්දං අස්සොසින්නි'. 'කිම්පන භන්තෙ සුත්තො අහොසි?ති. 'න ඛො අහං ආවුසො සුත්තො අහොසින්නි'. 'කිම්පන භන්තෙ සඤ්ඤී අහොසි?'ති. 'එවමාවුසො'ති. 'සො ත්වං භන්තෙ සඤ්ඤී සමානො ජාගරො දෙවෙ වස්සන්තෙ දෙවෙ ගලගලායන්තෙ විජ්ජුතාසු නිච්ඡරන්තීසු අසණියා ඵලන්තියා නෙව අද්දස, න පන සද්දං අස්සොසි?'ති. 'එවමාවුසො'ති.

---

1. විජ්ජුලලතාසු, මජ්ඣං

Free Distribution www.aathaapi.org

''පුක්කුසයෙනි, එය තෙපි කිමැ යි සිත වූ ද? යමෙක් සංඥාවන්නේ ම පිබිඳ ඉන්නේ ම ව දිව දී යන පන්සියයක් පමණ ගැල් නො ම දක්නේත් නො ම අසන්නේ ත් වේ ද, යමෙක් හෝ සංඥා වැ ම, පිබිඳ ඉන්නේ ම, (වියැලි ගැහුම් කොට අතරින් පතර) වැසි වස්නා කල්හි, මේ ගැහුම් පවත්නා කල්හි, විදුලිය නික්මෙන කල්හි, හෙණ පුපුරන කල්හි, එය නො ම දක්නේ ද, එහි හඬ හෝ නො ම අසන්නේ ද, මේ දෙකින් කිමෙක් නම් වඩා දුෂ්කර ද, වඩා දුර්ලභ ද?'' යි භාග්‍යවතුන් වහන්සේ අසා වදළ සේක.

''වහන්ස, පන් සියයෙක් හෝ හසියයෙක් හෝ හත් සියයෙක් හෝ අට සියයෙක් හෝ නව සියයෙක් හෝ දහසෙක් හෝ සිය දහසෙක් හෝ ගැල්හු කුමක් කරන්නාහු ද? වැලි දු යමෙක් සංඥා ව ම, පිබිඳ හිඳ ම, වැසි වස්නා කල්හි, මේ ගැහුම් පවත්නා කල්හි විදුලිය නික්මෙන කල්හි, හෙණ පුපුරන කල්හි එය නො දක්නේ නම්, එහි හඬත් නො අසන්නේ නම්, මෙය ම වඩා දුෂ්කර යැ, වඩා දුර්ලභ යැ' යි පුක්කුස කී ය.

එවිට, භාග්‍යවතුන් වහන්සේ වදරන සේක්, 'පුක්කුසයෙනි, මම එක් සමයෙක ආතුමා නම් නුවර පිදුරුකිළියෙකැ වෙසෙන්නෙම් වීමි. එ සමයෙහි වැසි වස්නා කලැ, මේ ගැහුම් පවත්නා කලැ, විදුලිය හැසිරෙන කලැ, හෙණ පුපුරන කලැ ඒ පිදුරු කිළියට නොදුරෙහි ගොවිදෙබෑ කෙනෙක් ද ගොන්නු සිවු දෙනෙක් ද නැසුණහ. පුක්කුසයෙනි, එ කලැ ආතුමා නුවරින් මහජන මුළුවෙක් නික්මැ අවුත් ඒ මළා වූ ගොවි දෙබෑයන් ද සිවු ගවයන් ද හෝනා කැනට අය. පුක්කුසයෙනි, එ වෙලෙහි මම, පිදුරු කිළියෙන් නික්මැ, එහි දෙර එළිමහනේ සක්මන් කෙරෙමි. පුක්කුසයෙනි, එ කලැ ඒ මහ ජන මුළුවෙන් එක්තරා මිනිසෙක් මා කරා ආ ය. අවුත් මා වැඳ පසෙක සිටියේ ය. පසෙක සිටි ඒ මිනිසා ඛණවා, ''ඇවැත්නි, කවර හෙයින් මහජනමුළුවෙක් රැස් විණි ද?'' යි ඇසීමි. ''වහන්ස, දැන් වැසි වස්නා කල්හි, මේ ගැහුම් පවත්නා කල්හි, විදුලිය නික්මෙන කල්හි, හෙණ වැටෙන කල්හි, දෙ බෑ ගොවි කෙනෙක් ද සිවු දෙනෙක් ගවයෝ ද නටහ. එහි තෙල මහජන මුළුව රැස් විය. වහන්ස, ඔබ කොහි වූ හු ද?' යි ඒ මිනිසා කී ය. ''ඇවැත්නි, මම මෙහි ම වීමි'' යි මම කීමි. ''වහන්ස කිම? එය ඔබ නො දුටු සේක් දෝ?'' යි හේ පුළුවුත. ''මම නොදිටිමි. ඇවැත්නි'' යි මම කීමි. ''කිමෙක් ද? වහන්ස, ඔබ-වහන්සේ ඒ හඬ ඇසූ සේක් ද?'' යි හේ පුළුවුත. ''ඇවැත්නි, මම ඒ හඬ නො ඇසීමි'' යි කීමි. ''කිමෙක් ද, වහන්ස, ඔබ සංඥා වූහු ද?'' යි හේ පුළුවුත. 'එසේ ය ඇවැත්නි' යි මම කීමි. ''වහන්ස, ඒ ඔබ වහන්සේ ස ඥා වන සේක් ම පිබිඳ හුන් සේක් ම, වැසි වස්නා කලැ මේ ගැහුම් පවත්නා කලැ, විදුලිය හැසිරෙන කලැ, හෙණ පුපුරන කලැ එය නොම දුටු සේක් ද? හඬ හෝ නො ම ඇසූ සේක් ද?'' යි හේ විවාළේ ය. ''එසේ ය, ඇවැත්නි'' යි මම කීමි. පුක්කුසයෙනි, එ විටැ ''භවත්නි, යමෙක් සංඥව ම, පිබිඳ හුන්නේ ම, වැසි වස්නා කල්හි, මේ ගැහුම් පවත්නා කල්හි, විදුලිය හැසිරෙන කල්හි, හෙණ පුපුරන කල්හි එය නො ම දුටුයේ ද, එහි හඬත් නො ම ඇසුයේ ද, එ බඳු වූ ශාන්ත විහරණයෙකින් පැවිද්දෝ වෙයෙත්'' යැ යි ඒ පුරුෂයාට මේ සිත විය. ඉක්බිති හෙ තෙම මා කෙරෙහි මහත් ප්‍රසාදය පහළ කොට, මා වැඳ පැදකුණු කොට නික්මියේ යැ'' යි වදළ සේක.

Free Distribution www.aathaapi.org

අථ ඛො පුක්කුස, තස්ස පුරිසස්ස එතදහොසි. 'අච්ඡරියං වත භො අබ්භුතං වත භො, සත්ථතා වත භො පබ්බජිතා විහාරෙන විහරන්ති, යත්ර හි නාම සඤ්ඤී සමානෝ ජාගරෝ දෙවෙ වස්සන්තෙ දෙවෙ ගළගළායන්තෙ විජ්ජුතාසු නිච්ඡරන්තීසු අසණියා ඵලන්තියා නෙව දක්ඛිති න පන සද්දං සොස්සති'ති මයි උළාරං පසාදං පවෙදෙත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි'ති.

එවං වුත්තෙ පුක්කුසො මල්ලපුත්තො භගවන්තං එතදවොච: 'එසාහං භන්තෙ යො මෙ ආළාරෙ කාලාමෙ පසාදෙ, තං මහාවාතෙ වා ඔපුනාමි, සීසසොතාය වා නදියා පවාහෙමි. අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛිනතීති, එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති. අථ ඛො පුක්කුසො මල්ලපුත්තො අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි. 'ඉඞ්ඝ මෙ ත්වං භණෙ සිඞ්ගීවණ්ණං යුගං මට්ඨං ධාරණීයං ආහාර'ති. 'එවං භන්තෙ'ති ඛො සො පුරිසො පුක්කුසස්ස මල්ලපුත්තස්ස පටිස්සුත්වා තං සිඞ්ගීවණ්ණං යුගං මට්ඨං ධාරණීයං ආහරි. අථ ඛො පුක්කුසො මල්ලපුත්තො තං සිඞ්ගීවණ්ණං යුගං මට්ඨං ධාරණීයං භගවතො උපනාමෙසි 'ඉදමභන්තෙ සිඞ්ගීවණ්ණං යුගං මට්ඨං ධාරණීයං. තමෙව භන්තෙ භගවා පතිග්ගණ්හාතු අනුකම්පං උපාදාය'ති. 'තෙන හි පුක්කුස එකෙන මං අච්ඡාදෙහි එකෙන ආනන්දන්ති'. 'එවම්භන්තෙ'ති ඛො පුක්කුසො මල්ලපුත්තො භගවතො පටිස්සුත්වා එකෙන භගවන්තං අච්ඡාදෙසි එකෙන ආයස්මන්තං ආනන්දං. අථ ඛො භගවා පුක්කුසං මල්ලපුත්තං ධම්මියා කථාය සන්දස්සෙසි, සමාදපෙසි, සමුත්තෙජෙසි, සම්පහංසෙසි. අථ ඛො පුක්කුසො මල්ලපුත්තො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

88. අථ ඛො ආයස්මා ආනන්දො අචිරපක්කන්තෙ පුක්කුසෙ මල්ලපුත්තෙ තං සිඞ්ගීවණ්ණං යුගං මට්ඨං ධාරණීයං භගවතො කායං උපනාමෙසි තං භගවතො කායං උපනාමිතං විකච්චිකං විය ඛායති.

Free Distribution www.aathaapi.org

මෙසේ වදළ කල්හි, පුක්කුස මල්ලපුත්‍ර තෙම ''වහන්ස, ආළාර කාලාමයන් කෙරෙහි මගේ යම් පැහැදීමෙක් වී ද, එය මහ ගුළඟෙහි පොළා හරිමි. සැඩ දිය පෑර ඇති නදියෙක හෝ පා කොට යවමි. වහන්ස, අභික්කන්ත යැ, වහන්ස, අභික්කන්ත යැ. වහන්ස, යම් සේ මුහුණින් නමා තබන ලද්දක් උඩුකුරු කොට තබන්නේ ද, පිළිසන් වූවක් හෝ විවෘත කරන්නේ ද, මං මුළා වූවකුට මඟ හෝ කියන්නේ ද, 'ඇස් ඇතියන් රූප දකිති' යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේ ද, එසේ ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කරුණින් දහම් පැවැසිණ. වහන්ස, ඒ මම් භාග්‍යවතුන් වහන්සේ ද ධර්මය ද බික්ඛුසඟන ද සරණ්‍යයෙමි. අද පටන් කොට, දිවි හිමින් සරණ ගිය උවැසුවකු කොට භාග්‍යවතුන් වහන්සේ මා සලකා වදරන සේක් වා'' යි කී ය.

ඉක්බිති පුක්කුස මල්ල පුත්‍ර තෙම එක්තරා පුරුෂයකු බණවා, ''සගය යව, රන්වන් වූ මට සිලිටි වූ මහුල් උළෙල ඇඳ මා විසින් දැරියැ යුතු වූ වස්ත්‍ර යුගලය ගෙනෙව'' යි කී ය. 'එසේ යැ, ස්වාමීනි' යි කියා සේ පුරුෂ තෙම ඒ රන්වන් මට සිලිටි වත් යුවල ගෙනායේ ය. ඉක්බිති, පුක්කුස මල්ල පුත්‍ර තෙම රන්වන් මට සිලුටු (උත්සවාදින්හි) දැරියැ යුතු ඒ වත් යුවල ගෙන, ''වහන්ස, මේ රන්වන් වූ මට සිලුටු වූ, (උත්සවාදියෙහි මා විසින්) දැරියැ යුතු වූ වස්ත්‍ර යුග්මයෙක. වහන්ස, මා සතු වස්ත්‍ර යුග්මය මට අනුකම්පා සඳහා භාග්‍යවතුන් වහන්සේ පිළිගන්නා සේක් වා'යි එය භගවත් බුදුරජුනට එළැවී ය. ''එසේ වී නම්, පුක්කුසයෙනි, එයින් එකෙකින් මා පුදව. අනෙකින් අනඳයන් පුදව'' යි භගවත්හු වදළහ. ''එසේ යැ වහන්සැ'' යි පුක්කුස මල්ල පුත්‍ර තෙම භගවත් බුදුරජුනට පිළිවදන් දී, එකෙකින් භගවත් බුදුරජුන් පිදී ය. (එකක් භඳනා පොරෝනා පිණිස භගවත් බුදුරජුනට දුන), එකෙකින් අනඳ තෙරුන් පිදීසි. (භඳනා පොරොනා පිණිස එකක් අනඳ තෙරුනට දුන). ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පුක්කුස මල්ල පුත්‍රයාට වස්ත්‍රානුමෝදනා ධර්මකථායෙන් කරුණු දක් වූ සේක. එහි සිත් ගැන් වූ සේක. එහි සිත් තියුණු කැරැවූ සේක, එහි සිත් සතුටු කැරැවූ සේක. මල්ල පුත්‍ර පුක්කුස තෙමේ ද භගවත් බුදුරජුන් විසින් දහම් කතායෙන් කරුණු දක්වන ලදුයේ, එහි සිත් ගැන්වුණේ, එහි සිත් තියුණු කරවන ලදුයේ, එහි සිත් සතුටු කරවන ලදුයේ, හුනස්නෙන් නැඟි භගවත් බුදුරජුන් වැඳැ පැදකුණු කොට නික්මැ ගියේ ය.

88. ඉක්බිති අනඳ තෙරණුවෝ පුක්කුස මල්ල පුත්‍රයා නික්මගිය නොබෝ කල්හි, ඒ (ඔහු විසින් උළෙල ඇඳි) දරිය යුතු වැ තුබුණු මට සිලිටි රන්වන් වත් යුවල භගවත් බුදු රජුන් ගේ සිරි සිරුරට එළැවී ය. එය භගවත් බුදුරජුන් ගේ සිරි සිරුරට එළවන ලදුයේ, පහ වූ සිළු ඇති ගිනි අඟුරු රැසක් මෙන් පැණෙයි.

Free Distribution www.aathaapi.org

අථ ඛො ආයස්මා ආනන්දෝ භගවන්තං එතදවොච: 'අච්ඡරියමිහන්න, අබ්භුතමිහන්න, යාවපරිසුද්ධා භන්තෙ තථාගතස්ස ඡවිවණ්ණා පරියොදාතා. ඉදමිහන්න සිඛරිවණ්ණෙ යුගං මට්ඨං ධාරණියං භගවතො උපනාමිතං චිකච්චිකං විය බායති'ති.

"එවමෙතං ආනන්ද. ද්වීසු ඛො ආනන්ද කාලෙසු අතිවිය තථාගතස්ස කායො පරිසුද්ධා හොති ඡවිවණ්ණා පරියොදාතා. කතමෙසු ද්වීසු? යඤ්ච ආනන්ද රත්තිං තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣති, යඤ්ච රත්තිං තථාගතො අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායති ඉමෙසු ඛො ආනන්ද ද්වීසු කාලෙසු අතිවිය තථාගතස්ස කායො පරිසුද්ධා හොති ඡවිවණ්ණා පරියොදාතා. අජ්ජ ඛො පන්නානන්ද රත්තියා පච්ඡිමෙ යාමෙ කුසිනාරායං උපවත්තනෙ මල්ලානං සාලවනෙ අන්තරෙන යමකසාලානං තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති. ආයාමානන්ද යෙන කකුත්ථා නදී තෙනුපසඞ්කමිස්සාමා''ති. ''එවම්හන්තෙ''ති ඛො ආයස්මා ආනන්දෙ භගවතො පච්චස්සොසි.

"සිඛරිවණ්ණං යුගං මට්ඨං පුක්කුසො අභිහාරයි,
තෙන අච්ඡාදිතො සත්ථා හෙමවණ්ණා අසොභථා''ති.

[අම්බවනුපගමනං]

89. අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන කකුත්ථා නදී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා කකුත්ථං නදිං අජ්ඣොගාහෙත්වා නහාත්වා ච පිවිත්වා ච පච්චුත්තරිත්වා යෙන අම්බවනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං චුන්දකං ආමන්තෙසි. 'එහිස මෙ චුන්දක චතුගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙහි. කිලන්තොස්මි චුන්දක නිපජ්ජිස්සාමී'ති. 'එවම්හන්තෙ'ති ඛො ආයස්මා චුන්දකො භගවතො පටිස්සුත්වා චතුගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙසි. අථ ඛො භගවා දකඛිණෙන පසෙසන සීහසෙය්යං කප්පෙසි පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසි කරිත්වා. ආයස්මා පන චුන්දකො තත්ථෙව භගවතො පුරතො නිසීදි.

Free Distribution www.aathaapi.org

එ කලැ අනඳ තෙරණුවෝ භගවත් බුදුරජුනට 'වහන්ස, තථාගතයන් වහන්සේ ගේ ඡවිවර්ණය කොතරම් පිරිසිදු ද, කොතරම් ප්‍රභාස්වර ද යනු ආශ්චය්‍ර්‍ය යැ, වහන්ස, අද්භූත යැ. වහන්ස, මේ රත්වන් වූ, මට සිලිටි වූ ධාරණීය (උතුම් මංගල) වස්ත්‍ර යුගලය භාග්‍යවතුන් වහන්සේ ගේ කයට එළවන ලදුයේ, පහවූ සිළු ඇති, ඖනි අඟුරු රැසක් මෙන් පැනේ'' යැ යි කීහ.

''අනඳයෙනි, අවස්ථා දෙකෙක්හි ම තථාගතයන් ගේ සිරුර පිරිසිදු වෙයි, ඡවිවර්ණය ප්‍රභාස්වර වෙයි. කවර අවස්ථා දෙකෙක් හි ද යත්: අනඳයෙනි, යම් රැයෙක තථාගතයෝ නිරුත්තර සම්‍යක් සම්බෝධිය අධිගම කෙරෙත් ද, යම් රැයෙක තථාගතයෝ අනුපාදිශේෂ නිර්වාණ-ධාතුයෙන් පිරිනිවෙත් ද, අනඳයෙනි, මේ අවස්ථා දෙක්හි ම තථාගතයන් ගේ සිරුර ඉතා ම පිරිසිදු වෙයි, ඡවිවර්ණය ප්‍රභාස්වර වෙයි. අනඳයෙනි, අද වනාහි රෑ පැයිම යමහි කුසිනාරාහි **උපවර්තන** නම් මල්ල රජුන් ගේ සල් වෙනෙහි යමා සල් රුක් අතර තථාගතයන් ගේ පිරිනිවීම වන්නේ ය. අනඳයෙනි, එවු, යමු. කකුත්ථා නදිය කරා එළැඹෙන්නමු'' යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. ''එසේ යැ, වහන්සැ'' යි අනඳ තෙරණුවෝ භගවත් බුදුරජුනට පිළිවදන් දුන්හ.

එහෙයින් සංගීතිකාරකයෝ කීහ:

> '' රත්වන් මට සිලිටි වත් යුවලක් පුක්කුස තෙමේ එළැවී ය.
> එය හැඳැ පෙර වූ ශාස්තෘහු රන් පැහැ වූහු, හෙබියාහ. ''

අඹවනයට එළැඹීම

89. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මහ බික්ඛසඟන කැටුව කකුත්ථා නදිය වෙතට වැඩි සේක. වැඩ, ඒ නදියට බැස, දිය සනහා, පැන් වළඳා, එයින් ඔබ නැහ, අඹ වනය කරා වැඩි සේක. වැඩැ (වෙතැ සිටි) චුන්දක තෙරුන් බණවා ''චුන්දකයෙනි, මට සඟළ සිවුර සතර පට කොට පණවවු. චුන්දකයෙනි, ක්ලාන්තයෙමි, වැඳහෙන්නෙමි''යි වදළ සේක. එසේ යැ වහන්සැ'' යි ම චුන්දක තෙරුණුවෝ භගවත්නට පිළිවදන් දී, සඟළ සිවුර සතර ගුණ කොට පැනැවූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දකුණු සිරිපා ඒ වම සිරි පා මඳක් මෑත් කොට පිහිටුවා, එළැඹැ සිටි සිහි ඇති සේක්, තුවණින් දන්නා සේක්, නැඟී සිටුනා සංඥාව සිත්හි කොට දකුණුළඟයෙන් සිංහශය්‍යාව කළ සේක. චුන්දක තෙරණුවෝ ද එහි ම භගවත් බුදුරජුන් ඉදිරියෙහි හුන්හ.

Free Distribution www.aathaapi.org

''ගච්ඡාහි ත්වං ආනන්ද, යෙන කුසිනාරා තෙනුපසඞ්කම; උපසඞ්කමිත්වා කුසිනාරං පවිසාහි. පවිසිත්වා කුසිනාරාය අවිදූරෙ අඤ්ඤතරං උපවත්තනං මල්ලානං සාලවනං අත්ථි, යෙනුපසඞ්කම; උපසඞ්කමිත්වා මල්ලෙ සඤ්ඤාපෙහි: 'අජ්ජ වාසෙට්ඨා පච්ඡිමා වෙලා තථාගතස්ස පරිනිබ්බානාය. තෙන හි, වාසෙට්ඨා, ආගච්ඡථ, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ තථාගතස්ස කාලඞ්කිරියාය. තථාගතස්ස හි, වාසෙට්ඨා, ඒවරූපා විප්පටිසාරා උප්පජ්ජෙය්යුං යථරූපස්ස තථාගතස්ස අප්පටිමස්ස මනුස්සභූතස්ස අප්පටිපුග්ගලස්ස දෙසයමානස්ස සාවකා සාසනකරා ඔවාදපටිකරා අමතං පරිභුඤ්ජන්තා පරිභුඤ්ජන්තා පරිනිබ්බායෙය්යුං යථරූපස්ස භගවතො සාවකා සාසනකරා ඔවාදපටිකරා අමතං පරිභුඤ්ජන්තා පරිභුඤ්ජන්තා පරිනිබ්බුතා, තථරූපස්ස භගවතො සාවකා සාසනකරා ඔවාදපටිකරා අමතං පරිභුඤ්ජන්තා පරිභුඤ්ජන්තා න

[එහෙයින් කිහු සංගීතිකාරකයෝ:]

"මෙ ලොවැ අප්‍රතිම ශාස්තෘ වූ තථාගත බුදු රජ්ජු කකුක්ථා නදිය කරා වැඩ, ඉතා ක්ලාන්ත ස්වභාවය ඇත්තාහු, එහි දියට බටහ.

ශාස්තෘහු දිය සතහා පැන් වළඳා, බික් සඟන මැද පෙරට වැ සිටියෝ, නදියෙන් ගොඩ නැංගාහ. මෙහි ධර්මයේ ප්‍රවක්තෘ වූ මහර්ෂි වූ භගවත් ශාස්තෘහු අඹවනයට වැඩියහ.

චුන්දක නම් මහණහු බණවා මෑ සඟළ සිවුර සිවු ගුණ කොට අතුරවා වැදහෙන්නෙමි' යි වදළාහ. භාවිතාත්ම වූ ඒ බුදුරජ්ජු විසින් මෙහෙයන ලද ඒ චුන්දක තෙර වහා ම සඟළ සිවුර සිවු ගුණ කොට පැනැවී ය. ඉතා ක්ලාන්ත ස්වභාවය ඇති ශාස්තෘහු එහි සැතැපුණාහ. චුන්ද තෙර ද ඔබ ඉදිරියෙහි හුන්නේ ය."

සමවිපාක ඇති පිණ්ඩපාත දෙක

90. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් බණවා මෙසේ වදළ සේක: "අනඳයෙනි, චුන්ද කර්මාර පුත්‍ර හට 'ඇවැත් චුන්දයිනි, තථාගතයෝ යමක්හු ගේ අන්තිම පිණ්ඩපාතය (භෝජනය) වළඳා පිරිනිවියෝ ද, ඒ ඔබට (එයින්) අලාභයෝ යැ, ඒ තොප විසින් මිනිසත් බව නපුරු ඉකොට ලබන ලද සේ යැ' යි කිසිවෙක් විපිළිසරක් උපදවන්නේ ය යන්න වියැ හැක්ක. අනඳයෙනි, චුන්ද කර්මාර පුත්‍රයා ගේ විපිළිසර මෙසේ දුරු කටයුතු ය:

"යම් බදු ඔබ ගේ පශ්චිම පිණ්ඩපාතය වළඳා තථාගතයෝ පිරිනිවියෝ ද, ඒ ඔබට ලාභයෙක, ඒ ඔබ විසින් මිනිසත් බව මොනොවට ලද සේ ය. අන් හැම පිණ්ඩපාතයනට වඩා ඉමහත් ඵල ඇති, වඩා ඉමහත් අනුසස් ඇති, හැම අයුරින් සම පල වූ සමවිපාක වූ මේ පිණ්ඩපාත දෙකෙක. කවර දෙකෙක් ද යත්: යම් පිණ්ඩපාතයක් වළඳා තථාගතයෝ අනුත්තර සම්‍යක් සම්බොධියට පැමිණෙත්ද, යම් පිණ්ඩපාතයක් වළඳා තථාගතයෝ නිරුපාදිශේෂ නිර්වාණධාතුයෙන් පිරිනිවෙත් ද, මේ අන් හැම පිණ්ඩපාතයනට වඩා ඉතා මහත් පල ඇති ඉතා මහත් විපාක ඇති හැම ලෙසින් ම සම ඵල ඇති, සම අනුසස් ඇති පිණ්ඩපාත දෙක ය.

Free Distribution www.aathaapi.org

ආයුසංවත්තනිකං පනායසම්භා චුද්දෙන කම්මාරපුත්තෙන කම්මං උපච්චිතං සුඛසංවත්තනිකං පනායසම්භා චුද්දෙන කම්මාරපුත්තෙන කම්මං උපච්චිතං. වණ්ණසංවත්තනිකං පනායසම්භා චුද්දෙන කම්මාරපුත්තෙන කම්මං උපච්චිතං. යසසංවත්තනිකං පනායසම්භා චුද්දෙන කම්මාරපුත්තෙන කම්මං උපච්චිතං. ආධිපතෙය්‍යසංවත්තනිකං පනායසම්භා චුද්දෙන කම්මාරපුත්තෙන කම්මං උපච්චිතන්ති'. චුන්දස්ස ආනන්ද කම්මාරපුත්තස්ස එවං විපටිසාරෝ පටිවිනෙතබ්බෝ''ති

අථ ඛෝ භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

''දදතෝ පුඤ්ඤං පවඩ්ඪති සඤ්ඤමතෝ වෙරං න චීයති,
කුසලෝ ච ජහාති පාපකං රාගදෝසමෝහක්ඛයා ස නිබ්බුතෝ'ති.

ආළාරවෙදලුභාණවාරෝ චතුත්ථෝ.

Free Distribution www.aathaapi.org

'මෙයින් ආයුෂ්මත් චුන්ද කර්මාර පුත්‍රයන් විසින් දීර්ඝායුෂ පිණිස පවත්නා කර්මයෙක් රැස් කරන ලද්දේ ය, ආයුෂ්මත් චුන්ද කර්මාර පුත්‍රයන් විසින් පැහැපත් බව පිණිස පවත්නා කර්මයෙක් රැස් කරන ලද්දේ ය, ආයුෂ්මත් චුන්ද කර්මාර පුත්‍රයන් විසින් සුවය පිණිස පවත්නා කර්මයෙක් රැස් කරන ලද්දේ ය, ආයුෂ්මත් චුන්ද කර්මාර පුත්‍රයන් විසින් ස්වර්ගය පිණිස පවත්නා කර්මයෙක් රැස් කරන ලද්දේ ය, ආයුෂ්මත් චුන්ද කර්මාරපුත්‍රයන් විසින් අධිපති බව පිණිස පවත්නා කර්මයෙක් රැස් කරන ලද්දේයැ ඇවැත් චුන්දයෙනි, භාග්‍යවතුන් වහන්සේ ගේ හමුයෙන් ම මා විසින් මෙය අසනලද්දේ ය, භාග්‍යවතුන් වහන්සේ හමුයෙන් ම මා විසින් මෙය පිළිගන්නාලද්දේ යැ යි කියා මෙසේ චුන්ද කර්මාර පුත්‍රයා ගේ විපිළිසර දුරු කටයුතු යැ'' යනු යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණ සලකා එ වේලෙහි මේ උදන් ඇනූ සේක:

''දන් දෙන්නහුට පින් වැඩේ. සිල් රක්නහු සිතැ වෙර නො පවතී. නුවණැත්තේ වෙර (පව) දුරු ලයි. හේ මෙසේ (පව) දුරු ලා රාග ද්වේෂ මොහ මුල් ඉදිරීමෙන් කෙලෙස් පිරිනිවනින් ද එයට පසු කඳ පිරිනිවනින් ද පිරිනිවියේ වෙයි'' යනු යි.

සතර වැනි බණවර යි.

Free Distribution www.aathaapi.org

[කුසිනාරා ගමනං]

91. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි ආයාමානන්ද යෙන හිරඤ්ඤවතියා නදියා පාරිමං තීරං, යෙන කුසිනාරා, යෙන උපවත්තනං මල්ලානං සාලවනං, තෙනුපසඞ්කමිස්සාමා'ති. 'එවමභන්තෙ'ති ඛො ආයස්මා ආනන්දෙ භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන හිරඤ්ඤවතියා නදියා පාරිමං තීරං, යෙන කුසිනාරා, යෙන උපවත්තනං මල්ලානං සාලවනං, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. "ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද අන්තරෙන යමකසාලානං උත්තරසීසකං මඤ්චකං පඤ්ඤපෙහි. කිලන්තොස්මි ආනන්ද නිපජ්ජිස්සාමී'ති. 'එවම්භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දෙ භගවතො පච්චස්සොසි අන්තරෙන යමකසාලානං උත්තරසීසකං මඤ්චකං පඤ්ඤපෙසි. අථ ඛො භගවා දක්ඛිණෙන පස්සෙන සීහසෙය්යං කප්පෙසි පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො.

92. තෙන ඛො පන සමයෙන යමකසාලා සබ්බඵාලිඵුල්ලා හොන්ති අකාලපුප්ඵෙහි. තෙ තථාගතස්ස සරීරං ඔකිරන්ති අභිකිරන්ති අභිපකිරන්ති තථාගතස්ස පූජාය. දිබ්බානි පි මන්දාරවපුප්ඵානි අන්තලික්ඛා පපතන්ති, තානි තථාගතස්ස සරීරං ඔකිරන්ති අභිකිරන්ති අභිපකිරන්ති තථාගතස්ස පූජාය දිබ්බානි පි චන්දනචුණ්ණානි අන්තලික්ඛා පපතන්ති. තානි තථාගතස්ස සරීරං ඔකිරන්ති අභිකිරන්ති අභිපකිරන්ති තථාගතස්ස පූජාය. දිබ්බානි පි තූරියානි අන්තලික්ඛෙ වජ්ජන්ති තථාගතස්ස පූජාය, දිබ්බානි පි සඞ්ගීතානි අන්තලික්ඛෙ වත්තන්ති තථාගතස්ස පූජාය. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: සබ්බඵාලිඵුල්ලා ඛො ආනන්ද යමකසාලා අකාලපුප්ඵෙහි තෙ තථාගතස්ස සරීරං ඔකිරන්ති අභිකිරන්ති අභිපකිරන්ති තථාගතස්ස පූජාය. දිබ්බානිපි මන්දාරවපුප්ඵානි අන්තලික්ඛා පපතන්ති, තානි තථාගතස්ස සරීරං ඔකිරන්ති අභිකිරන්ති අභිපකිරන්ති තථාගතස්ස පූජාය. දිබ්බානිපි චන්දනචුණ්ණානි අන්තලික්ඛා පපතන්ති, තානි තථාගතස්ස සරීරං ඔකිරන්ති අභිකිරන්ති අභිපකිරන්ති තථාගතස්ස පූජාය. දිබ්බානි පි තූරියානි අන්තලික්ඛෙ වජ්ජන්ති තථාගතස්ස පූජාය. දිබ්බානිපි සඞ්ගීතානි අන්තලික්ඛෙ වත්තන්ති තථාගතස්ස පූජාය. න ඛො ආනන්ද එත්තාවතා තථාගතො සක්කතො වා හොති ගරුකතො වා මානිතො වා පූජිතො වා අපචිතො වා, යො ඛො ආනන්ද භික්ඛු වා භික්ඛුනී වා උපාසකො වා උපාසිකා වා ධම්මානුධම්මපටිපන්නො විහරති සාමීචිපටිපන්නො අනුධම්මචාරී, සො තථාගතං සක්කරොති ගරුකරොති මානෙති පූජෙති අපචියති පරමාය පූජාය. තස්මාතිහානන්ද ධම්මානුධම්මපටිපන්නා විහරිස්සාම සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො නි, එවං හි වො ආනන්ද සික්ඛිතබ්බන්ති.

Free Distribution www.aathaapi.org

යමා සල්රුක්

91. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ ඇවැත් අනඳ තෙරුන් ඛණවා ''අනඳයෙනි, යමහ. හිරණ්‍යවතී නදිය පර තෙරට (නදියෙන් එගොඩට) එහි කුසිනාරා නුවරට, එහි මල්ල රජුන්ගේ උපවර්තන නම් සල්උයනට එළැඹෙන්නමු'' යි වදළ සේක. 'එසේ ය වහන්සැ' යි කියා ම අනඳ තෙරණුවෝ පිළිවදන් ඇස්වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහත් බික්ඛු සඟන කැටුව හිරණ්‍යවතී නදියෙන් එතෙර කුසිනාරා නුවර මල්ලයන්ගේ උපවර්තන නම් සල්උයන කරා වැඩියාහ. වැඩ අනඳතෙරුන් අමතා ''අනඳයෙනි, යමා සල් රුක් අතර හිස උතුරු දෙසට සිටුනා සේ කොට මට ඇඳක් පනවවු. අනඳයෙනි, ක්ලාන්තයෙමි, වැදැහෙනු කැමැත්තෙමි'' යි වදළ සේක. 'එසේ ය, වහන්සැ' යි කියා ම අනඳ තෙරණුවෝ භගවත් බුදුරජුනට පිළිවදන් දී, යමා සල්රුක් අතර උතුරු දෙසට හිස සිටුනා සේ කොට ඇඳක් පැනවූහ. ඉක්බිති භගවත්හු දකුණු පයින් වම් පය මදක් ඉක්මැ පිහිටුවා සිහි නුවණින් යුතු වැ දකුණැලයෙන් සිංහ ශය්‍යාව කළාහ. (සිංහශය්‍යායෙන් සැතැපුණුසේක.) එ වේලෙහි වනාහි යමා සල් රුක් හු නොකල් මලින් මුළුල්ල ම ගැවැසුණාහු වෙත්. ඔහු තථාගතයනට පූජා විසින් ඔබ සිරුර මත්තෙහි වැටෙත්, විසිරෙත්, වෙසෙසින් විසිරෙත්. දිව මඳරා මලුදු අහසින් හෙයි. ඔහු තථාගතයනට පුද පිණිස ඔබ සිරුර මත වැටෙත්, විසිරෙත් වෙසෙසින් විසිරෙත්. දිව සඳුන් සුණු අහසින් හෙයි. ඔහු තථාගතයනට පුද පිණිස ඔබ සිරුර මත හෙත්, විසිරෙත්, වෙසෙසින් විසිරෙත්. දිව තූරුඹු ද තථාගතයනට පුද පිණිස අහසැ වැයෙත්. දිව ගැයුම්හු ද තථාගතයනට පුද පිණිස අහසැ පැවැතෙත්.

92. එ කලැ භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් ඛණවා ''අනඳයෙනි, යමාසල්රුක්හු නොකල් මලින් මුළුල්ල හැසුණාහු ගැවැසුණාහු වෙත්. ඔහු තථාගතයනට පුද පිණිස ඔබ සිරුර මතැ හෙත්, විසිරෙත්, වෙසෙසින් විසිරෙත්. දිව මඳරා මලුදු අහසින් හෙයි . . දිව සඳුන් සුණු ද අහසින් හෙයි . . දිව තූරු ගොසු ද . . දිව ගැයුම්දු තථාගතයනට පුද පිණිස අහසැ වැටෙයි. අනඳයෙනි, මෙතෙකින් තථාගතයෝ සත්කෘත හෝ ගුරුකෘත හෝ මානිත හෝ පූජිත හෝ අපචිත හෝ නො වෙත්. අනඳයෙනි, යම් මහණෙක් හෝ මෙහෙණක් හෝ උවසුවෙක් හෝ උවැසියක් හෝ ධර්මානුධර්ම ප්‍රතිපන්න වැ සම්‍යක් ප්‍රතිපන්න වැ අනුධර්මචාරී වැ වෙසෙයි ද හේ මැ පරම පූජායෙන් තථාගතයනට සත්කාර කෙරෙයි, ගරු කෙරෙයි, බුහුමන් කෙරෙයි, පූජා කෙරෙයි, අපචායන කෙරෙයි. අනඳයෙනි, එ බැවින් මෙහි ලා ධර්මානුධර්ම ප්‍රතිපන්න වැ සම්‍යක් ප්‍රතිපන්න වැ අනුධර්මචාරී ව වසන්නමෝ' යි, මෙසේ ම තොප විසින් හික්මියැ යුතු'' යි වදළ සේක.

Free Distribution www.aathaapi.org

උපවාණ ථෙරො

93. තෙන ඛො පන සමයෙන ආයස්මා උපවාණො භගවතො පුරතො ඨිතො හොති භගවන්තං වීජමානො. අථ ඛො භගවා ආයස්මන්තං උපවාණං අපසාදෙසි: 'අපෙහි භික්ඛු. මා මෙ පුරතො අට්ඨාසී'ති. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: 'අයං ඛො ආයස්මා උපවාණො දීඝරත්තං භගවතො උපට්ඨාකො සන්තිකාවචරො සමීපචාරී. අථ ච පන භගවා පච්ඡිමෙ කාලෙ ආයස්මන්තං උපවාණං අපසාදෙසි: අපෙහි භික්ඛු, මා මෙ පුරතො අට්ඨාසීති. කො නු ඛො හෙතු කො පච්චයො යං භගවා ආයස්මන්තං උපවාණං අපසාදෙසි.[1] අපෙහි භික්ඛු මා මෙ පුරතො අට්ඨාසීති. අථ ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: අයං හන්ත ආයස්මා උපවාණො දීඝරත්තං භගවතො උපට්ඨාකො සන්තිකාවචරො සමීපචාරී, අථ ච පන භගවා පච්ඡිමෙ කාලෙ ආයස්මන්තං උපවාණං අපසාදෙති: අපෙහි භික්ඛු, මා මෙ පුරතොඅට්ඨාසීති. කො නු ඛො හන්ත හෙතු කො පච්චයො යං භගවා ආයස්මන්තං උපවාණං අපසාදෙති අපෙහි භික්ඛු මා මෙ පුරතො අට්ඨාසි ති? යෙභුය්‍යෙන ආනන්ද දසසු සහස්සිසු ලොකධාතූසු දෙවතා සන්නිපතිතා තථාගතං දස්සනාය, යාවතා ආනන්ද කුසිනාරා උපවත්තනං මල්ලානං සාලවනං සමන්තතො දවාදසයොජනා නි නත්ථි සො පදෙසො වාළග්ග-කොටිනිත්තුදන මත්තොපි මහෙසක්ඛාහි දෙවතාහි අපථුථො. දෙවතා ආනන්ද උජ්ඣායන්ති දූරා ච වතමහා ආගතා තථාගතං දස්සනාය. කදාචි කරහචි තථාගතා ලොකෙ උප්පජ්ජන්ති අරහන්තො සම්මාසම්බුද්ධා අජ්ජ ච රත්තියා පච්ඡිමෙ යාමෙ තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති, අයඤ්ච මහෙසක්ඛො භික්ඛු භගවතො පුරතො ඨිතො ඔවාරෙන්නො, න මයං ලභාම පච්ඡිමෙ කාලෙ තථාගතං දස්සනාය ති.

94. කථං භූතා පන භන්තෙ භගවා දෙවතා මනසි කරොතී'ති.

"සන්නානන්ද දෙවතා ආකාසෙ පථවීසඤ්ඤිනියො, කෙසෙ පකිරිය කන්දන්ති, බාහා පග්ගය්හ කන්දන්ති, ඡින්නපාතං පපතන්ති ආවට්ටන්ති විවට්ටන්ති අතිවිපකං භගවා පරිනිබ්බායිස්සති, අතිවිපකං සුගතො පරිනිබ්බායිස්සති, අතිවිපකං චක්ඛු ලොකෙ අන්තරධායිස්සති' ති සන්නානන්ද දෙවතා පථවියං පථවිසඤ්ඤිනියො, කෙසෙපකිරිය කන්දන්ති, බාහා පග්ගය්හ කන්දන්ති, ඡින්නපාතං පපතන්ති ආවට්ටන්ති විවට්ටන්ති:

1. අපසාරෙසි. ඡස්සුචි.

Free Distribution www.aathaapi.org

උපවාන තෙරණුවෝ

93. එ සමයෙහි වනාහි උපවාණ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පවන් සලනුවෝ ඔබ ඉදිරියේ සිටියාහු වෙත්. එ කලැ භාග්‍යවතුන් වහන්සේ උපවාණ තෙරුන් බණවා, 'මහණ, ඉවත් වන්න, මා ඉදිරියේ නො සිටින්නැ' යි උපවාණ තෙරුන් ඉවත් කළ සේක. එ විටැ 'මේ උපවාණ තෙරණුවෝ වූ කලි බොහෝ කලක් වෙතැ ගැවැසෙන, ළඟ හැසිරෙන, භාග්‍යවතුන් වහන්සේ ගේ උවටුවෙකි. එහෙත් පැසිම සෙමෙහි භාග්‍යවතුන් වහන්සේ 'මහණ, ඉවත්වන්න, මා ඉදිරියේ නො සිටින්නැ' යි උපවාණ තෙරුන් ඉවත් කළ සේක. භාග්‍යවතුන් වහන්සේ 'මහණ, ඉවත් වන්න, මා ඉදිරියේ නො සිටින්නැ' යි උපවාණ තෙරුන් ඉවත් කළ සේක' යන යමෙක් ඇද්ද, එයට හේතුව කවර යැ, එයට කාරණය කවර යැ, යි අනඳ තෙරුනට මේ සිත විය. ඉක්බිති අනඳ තෙරණුවෝ 'වහන්ස, මේ උපවාණ තෙරණුවෝ බොහෝ කලක් වෙතැ ගැවැසෙන, ළඟ හැසිරෙන භාග්‍යවතුන් වහන්සේගේ උවටුවෙක. එතෙකුදු වුවත් භාග්‍යවතුන් වහන්සේ පැසිම සමයෙහි 'මහණ, ඉවත් වන්න, මා ඉදිරියේ නො සිටින්නැ' යි උපවාණ තෙරුන් ඉවත් කරන සේක. වහන්ස, . . . එයට හේතුව, එයට කාරණය කවර යැ?' යි භගවත් බුදුරජුන් පුළුවුක්හ. ''අනඳයෙනි, ලෝද දස දහසෙක දෙවියෝ තථාගතයන් දක්නා පිණිස බොහෝ සෙයින් රැස්වූවාහු වෙත්. අනඳයෙනි, කුසිනාරා නුවර යම් පමණ ද, මල්ලවයන්ගේ උපවර්තන ශාලවනය යම් පමණ ද භාත්පස දෙළොස් යොදුන් වූ ඒ සියලු පෙදෙස යම් පමණ ද, එහි මහායශස්ක දේවතාවන් වැද නොගත්, සිදි අගක් එළාලන පමණ වූ ද ඒ තැනෙක් නැත. අපි වූ කලි භාග්‍යවතුන් වහන්සේ දක්නට දුරැ සිට ද ආමිහ. රහත් සම්මා සම්බුදුවූ තථාගතවරු (බොහෝ කල් ඉක්මැ) කිසි කලෙක්හි ම ලොවැ පහළ වෙත්. අද රෑ ම පැසිමයම්හි තථාගතයන් වහන්සේ ගේ පිරිනිවීම වන්නේ ය, මේ මහ තෙදැති මහණ භාග්‍යවතුන් වහන්සේ ඉදිරියේ ඔබ මුවහ කරනුයේ සිටියේ වෙයි. (එ හෙයින්) අපි (මේ) පැසිම සමයෙහි තථාගතයන් වහන්සේ දක්නට නො ලබමෝ' යි දෙවියෝ (උපවාණ මහණහට) දෙස් නහත්'' යැ යි භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුනට වදළ සේක.

94. 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ කෙසේ වූ දේවතා කෙනකුන් මෙනෙහි කරන සේක් ද?' යි අනඳ තෙරණුවෝ පුළුවුක්හ.

'අනඳයෙනි, අහසෙහි පෘථිවි යැ' යි සංඥා ඇති දේවතා කෙනෙක් ඇත. ඔහු 'ඉතා වහා භාග්‍යවතුන් වහන්සේ පිරිනිවෙන සේක, ඉතා වහා සුගතයන් වහන්සේ පිරිනිවෙන සේක.

Free Distribution www.aathaapi.org

අතිවිපං භගවා පරිනිබ්බායිස්සති, අතිවිපං සුගතො පරිනිබ්බායිස්සති, අතිවිපං චක්ඛු[1] ලොකෙ අන්තරධායිස්සතීති!

යා පන තා දෙවතා වීතරාගා, තා සතා සම්පජානා අධිවාසෙන්ති: අනිච්චා සඞ්ඛාරා තං කුතෙත්ථ ලබ්භා?ති,

95. "පුබ්බෙ භන්තෙ දිසාසු වස්සං වුත්ථා භික්ඛූ ආගච්ඡන්ති තථාගතං දස්සනාය. තෙ මයං ලභාම මනොභාවනියෙ භික්ඛූ දස්සනාය ලභාම පයිරුපාසනාය, භගවතො පන මයං භන්තෙ අච්චයෙන න ලභිස්සාම මනොභාවනියෙ භික්ඛූ දස්සනාය න ලභිස්සාම පයිරුපාසනාය"ති.

"චත්තාරිමානි ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයානි සංවෙජනීයානි ඨානානි. කතමානි චත්තාරි:

'ඉධ තථාගතො ජාතො'ති ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං.

'ඉධ තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො'ති ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං.

'ඉධ තථාගතෙන අනුත්තරං ධම්මචක්කං පවත්තිතන්ති' ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං.

'ඉධ තථාගතො අනුපාදිසෙසාය නිබ්බානධාතුයා' පරිනිබ්බුතොති ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං.

ඉමානි බො ආනන්ද චත්තාරි සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයානි සංවෙජනීයානි ඨානානි.

ආගමිස්සන්ති බො ආනන්ද සද්ධා භික්ඛූ භික්ඛුනියො උපාසකා උපාසිකාඅයා ඉධ තථාගතො ජාතො ති පි, ඉධ තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො ති පි, ඉධ තථාගතෙන අනුත්තරං ධම්මචක්කං පවත්තිතන්තිපි, ඉධ තථාගතො අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බුතො ති පි. යෙ හි කෙචි ආනන්ද චෙතියවාරිකං ආහිණ්ඩන්තා පසන්නචිත්තා කාලං කරිස්සන්ති, සබ්බෙ තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සන්තීති.

---

1. චක්ඛුමං – සී.ඵු.
චක්ඛු – ඉ

Free Distribution www.aathaapi.org

ඉතා වහා ලොවැ ඇස අතුරු දහන් වන්නේ යැ' යි භිස කෙස් මුදහඩත්, දෙහොත් නහා හඩත්, මැදින් සිඳී වැටුණුවුන් සේ වැටෙත්, පෙරළෙන්නාහු වැටුණු තැනට ම එත්, වැටුණු තැනින් ඇතට ද පෙරළී යෙත්.

යම් දේවතා කෙනෙක් පහ වූ රාගය ඇත්තාහු ද, ඔහු සිහි ඇත්තාහු නුවණින් දන්නාහු, 'සංස්කාරයෝ අනිත්‍යය හ. එහෙයින් මෙහි ස්ථිරතාවෙක් කොයින් ලැබෙන්නේ ද!" යි ඉවසත් යැ" යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

95. "වහන්ස, පෙරැ ඒ ඒ දෙසැ වස් වූසු භික්ෂූහු තථාගතයන් වහන්සේ දක්නට එත්. අපි මෙත් බවුන් විසින් සිත් වඩනා (සමාධිය වඩනා) ඒ භික්ෂූන් දක්නට ලබම්හ, එළැඹැ පිළිදග්නට ලබම්හ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ගේ ඇවැමෙන් ඒ මෙත් බවුනෙන් සිත වඩනා භික්ෂූන් දක්නට නො ලබන්නමු. එළැඹැ පිළිදග්නට නො ලබන්නමු" යි අනඳ තෙරණුවෝ කිහ.

එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළ සේක: "අනඳයෙනි, සැදැහැවත් කුලපුතක්හට දක්නට සුදුසු,සංවේග උපදවන මේ තැන් සතරෙකි. කවර සතරෙක් ද? යත්:

'අනඳයෙනි, 'තථාගතයන් වහන්සේ මෙහි උපන් සේකැ' යි (ඒ උපන් තැන) සැදැහැවත් කුල පුත්හට දක්නට සුදුසු සංවේග උපදවන තැනෙකි.

'තථාගතයන් වහන්සේ මෙහි නිරුත්තර සම්‍යක්සම්බෝධිය අවබොධ කළ සේකැ' යි, අනඳයෙනි, මෙය සැදැහැවත් කුලපුත්හට දක්නට සුදුසු සංවේගය උපදවන තැනෙකි.

'මෙහි තථාගතයන් වහන්සේ විසින් නිරුත්තර ධර්මචක්‍රය පවත්වන ලදැ' යි, අනඳයෙනි, මෙය සැදැහැවත් කුලපුතුට දක්නට සුදුසු සංවේග උපදවන තැනෙකි.

'මෙහි තථාගතයන් වහන්සේ අනුපාදිශේෂ නිර්වාණධාතුයෙන් පිරිනිවන් පෑ සේකැ' යි, අනඳයෙනි, මෙය සැදැහැවත් කුලපුත් හට දක්නට සුදුසු සංවේග උපදවන තැනෙකි.

අනඳයෙනි, මොහු සැදැහැවත් කුලපුතක්හට දක්නට සුදුසු සංවේග උපදවන තැන් සතර ය.

අනඳයෙනි, සැදැහැවත් මහණහු ද මෙහෙණහු ද උවැසියෝ ද 'මෙහි තථාගතයන් වහන්සේ උපන් සේකැ' යි ද, මෙහි තථාගතයන් වහන්සේ නිරුත්තර සම්‍යක්සම්බෝධිය අවබෝධ කළ සේකැ' යි ද, මෙහි තථාගතයන් වහන්සේ විසින් නිරුත්තර ධර්මචක්‍රය පවත්වන ලදැ' යි ද, මෙහි තථාගතයන් වහන්සේ අනුපාදිශේෂ නිර්වාණධාතුයෙන් පිරිනිවි සේකැ යි ද සලකා මේ තැන් කරා එන්නාහු ම ය. අනඳයෙනි, යම් කෙනෙක් වනාහි චෛත්‍යචාරිකාව කරන්නාහු (සෑ වඳිමින් පුදමින් ඇවිදුනාහු) පහන් සිතැත්තෝ කලුරිය කරන්නාහු ද, ඒ සියල්ලෝ කඹුන් මරණින් මතු මනාප ගති ඇති යග ලොවට පැමිණෙන්නාහ."

Free Distribution www.aathaapi.org

ආනන්දපුච්ඡා කථා

96. "කථං මයං භන්තෙ මාතුගාමෙ පටිපජ්ජාමා?"ති

"අදස්සනං ආනන්දා"ති.

"දස්සනෙ භගවා සති කථං පටිපජ්ජිතබ්බන්ති?"

"අනාලාපො ආනන්දා"ති.

"ආලපන්තෙන පන භන්තෙ කථං පටිපජ්ජිතබ්බන්ති?"

"සති ආනන්ද උපට්ඨපෙතබ්බා"ති.

"කථං මයං භන්තෙ තථාගතස්ස සරීරෙ පටිපජ්ජාමා?"ති

"අබ්‍යාවටා තුම්හෙ ආනන්ද හොථ තථාගතස්ස සරීරපූජාය. ඉධ්‍ය තුම්හෙ ආනන්ද සදත්ථෙ, සථථ[1] සදත්ථපරායණා, සදත්ථ[2] අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරථ, සන්තානන්ද බහත්තියපණ්ඩිතා පි බ්‍රාහමණපණ්ඩිතා පි ගහපතිපණ්ඩිතා පි තථාගතෙ අභිප්පසන්නා තෙ තථාගතස්ස සරීරපූජං කරිස්සන්ති"ති.

"කථං පන භන්තෙ තථාගතස්ස සරීරෙ පටිපජ්ජිතබ්බන්ති?"

"යථා ඛො ආනන්ද රඤ්ඤො චක්කවත්තිස්ස සරීරෙ පටිපජ්ජන්ති, එවං තථාගතස්ස සරීරෙ පටිපජ්ජිතබ්බන්ති" "කථං පන භන්තෙ රඤ්ඤො චක්කවත්තිස්ස සරීරෙ පටිපජ්ජන්ති?"ති "රඤ්ඤො ආනන්ද චක්කවත්තිස්ස සරීරං අහතෙන වත්ථෙන වෙඨෙන්ති. අහතෙන වත්ථෙන වෙඨෙත්වා විහතෙන කප්පාසෙන වෙඨෙන්ති. විහතෙන කප්පාසෙන වෙඨෙත්වා අහතෙන වත්ථෙන වෙඨෙන්ති.

---

1. චකඛුම, (මජ්ඣ.) චක්ඛුරත්තෙරධිගතී (සම්බුද්ධිවාදිතං මහාපරිනිබ්බානසුත්තෙන)
2. සාරත්තෙ සථර අත්තුත්තපර (මී ජ සං)
3. සාරත්තෙ (මජ්ඣ.)

Free Distribution www.aathaapi.org

ආනන්ද පෘච්ඡා කථාව

96. ඉක්බිති, අනඳ තෙරණුවෝ ''වහන්ස, අපි මාගම කෙරෙහි කෙසේ පිළිපදුමෝ ද?'' යි විචාළහ.

''අනඳයෙනි, මාගම නොදක්ම යැ'' යි භගවත්හු වදළාහ.

''භාග්‍යවතුන් වහන්ස, දක්මක් ඇති කල්හි කෙසේ පිළිපැද්ද යුතු ද?'' යි අනඳ තෙරණුවෝ විචාළාහ.

''අනඳයෙනි, ඇය හා කතා නො කිරීම යැ'' යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

(''කතා කළ යුතු ම තැනක් වුව) වහන්ස, කතා කරන මහණහු විසින් කෙසේ පිළිපැද්ද යුතු ද?'' යි අනඳ තෙරණුවෝ පුළුවුත්හ.

''අනඳයෙනි, (ඇය ගේ) වයස අනුව මේ මව යැ යි හෝ සොහොයුරි යැ යි හෝ දූ යැ යි හෝ සලකා) සිහිය එළැඹැවියැ යුතු යැ'' යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

97. ''වහන්ස, අපි කෙසේ නම් තථාගතයන් වහන්සේ ගේ සිරුරෙහි පිළිපදුමෝ ද?'' යි අනඳ තෙරණුවෝ පුළුවුත්හ.

''අනඳයෙනි, තෙපි තථාගතයන් ගේ සිරුර පූජනයෙහි නිරුත්සාහ වවු. අනඳයෙනි, තෙපි වූ කලි තමහට වැඩෙහි (රහත්බව ලබනුයෙහි) තැත් කරවු, තමහට වැඩෙහි පුනපුනා යෙදෙවු (රහත්බව පිණිස පිළිවෙත් කරවු, ඔවුන් බවවු), තමහට වැඩෙහි (රහත්බව ලැබීමෙහි) නොපමා වූවාහු, කෙලෙස් තවන වැර ඇත්තාහු, නිවන් කරා මෙහෙයූ සිතැත්තාහු වසවු. අනඳයෙනි, තථාගතයන් කෙරෙහි වෙසෙසින් පහන් වූ නුවණැති කැත්තු ද, නුවණැති බමුණෝ ද, නුවණැති ගැහැවියෝ ද ඇත. ඔහු තථාගතයන් ගේ සිරුරට පූජා සත්කාර කරන්නාහ'' යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

''වහන්ස, (ඔවුන් විසින්) තථාගතයන් වහන්සේ ගේ සිරුරෙහි කෙසේ පිළිපැද්ද යුතු ද?'' යි අනඳ තෙරණුවෝ පුළුවුත්හ.

''අනඳයෙනි, සක්විති රජක්හු ගේ සිරුරෙහි යම්සේ පිළිපදිත් ද, තථාගතයන් ගේ සිරුරෙහි එසේ ම පිළිපැද්ද යුතු යැ'' යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. ''වහන්ස, සක්විති රජක්හු ගේ සිරුර කෙසේ පිළිපදිත් ද?' යි අනඳ තෙරණුවෝ පුළුවුත්හ.

Free Distribution www.aathaapi.org

එතෙනූපායෙන පඤ්චහි යුගසතෙහි රඤ්ඤො චක්කවත්තිස්ස සරීරං[1] වෙඨෙත්වා ආයසාය තෙලදෙණියා පකඛිපිත්වා අඤ්ඤිස්සා ආයසාය දෙණියා පටිකුජ්ජිත්වා සබ්බගන්ධානං චිතකං කරිත්වා රඤ්ඤො චක්කවත්තිස්ස සරීරං ඣාපෙන්ති. චාතුම්මහාපථෙ[2] රඤ්ඤො චක්කවත්තිස්ස ථූපං කරොන්ති. එවං ඛො ආනන්ද රඤ්ඤො චක්කවත්තිස්ස සරීරෙ පටිපජ්ජන්ති. යථා ඛො ආනන්ද රඤ්ඤො චක්කවත්තිස්ස සරීරෙ පටිපජ්ජන්ති එවං තථාගතස්ස සරීරෙ පටිපජ්ජිතබ්බං චාතුම්මහාපථෙ තථාගතස්ස ථූපො කාතබ්බො. තත්ථ යෙ මාලං වා ගන්ධං වා වුණ්ණකං[3] වා ආරොපෙස්සන්ති වා අභිවාදෙස්සන්ති වා, චිත්තංවා පසාදෙස්සන්ති, තෙසන්තං භවිස්සති දීඝරත්තං හිතාය සුඛායා''ති.

ථූපාරහා පුග්ගලා.

97. "චත්තාරො'මෙ ආනන්ද ථූපාරහා. කතමෙ චත්තාරො? තථාගතො අරහං සම්මාසම්බුද්ධො ථූපාරහො. පච්චෙකසම්බුද්ධො ථූපාරහො, තථාගතස්ස සාවකො ථූපාරහො, රාජා චක්කවතති ථූපාරහො'ති.

කිඤ්චානන්ද අත්ථවසං පටිච්ච තථාගතො අරහං සම්මාසම්බුද්ධො ථූපාරහො? අයං තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස ථූපො ති ආනන්ද බහූ ජනා චිත්තං පසාදෙන්ති, තෙ තත්ථ චිත්තං පසාදෙත්වා කායස්ස භෙද පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. ඉදං ඛො ආනන්ද අත්ථවසං පටිච්ච තථාගතො අරහං සම්මාසම්බුද්ධො ථූපාරහො.

කිඤ්චානන්ද අත්ථවසං පටිච්ච පච්චෙකසම්බුද්ධො ථූපාරහො? අයං තස්ස භගවතො පච්චෙකසම්බුද්ධස්ස ථූපො ති ආනන්ද බහූජනා චිත්තං පසාදෙන්ති. තෙ තත්ථ චිත්තං පසාදෙත්වා කායස්ස භෙද පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. ඉදං ඛො ආනන්ද අත්ථවසං පටිච්ච පච්චෙකසම්බුද්ධො ථූපාරහො.

---

1. සරීරෙ (ඝ්‍යා, කං)
2. චාතුම්මහාපත්ථ (මජ්ඣං)
3. වණ්ණකං (PTS)

Free Distribution www.aathaapi.org

''අනඳයෙනි, සක්විති රජක්හු ගේ සිරුර අළුත් පිළියෙන් වෙළත්. අළුත් පිළියෙන් වෙළා පොළාලූ (මොනොවට නහා පාදන ලද) කපු පුළුනෙන් වෙළත්. පොළා ලූ කපුපුළුනෙන් වෙළා අළුත් පිළියෙන් වෙළත්. මේ නයින් යුගල පන්සියෙකින් සක්විති රජු ගේ සිරුර වෙළා, රන්මුවා දෙණෙක බහා අන් රන්මුවා දෙණෙකින් වසා, හැම වර්ගයේ සුවඳ දරින් චිතකයක් කොට ඒ සිරුර දවත්. සක්විති රජහට (සක්විති රජු ගේ සිරුර ද ඉතිරි වූ ධාතු තැන්පත් කොට) සතර මං හන්දියෙක තුඹක් (ස්තූපයක්) කරත්. අනඳයෙනි, මෙසේ ම සක්විති රජුගේ සිරුරෙහි පිළිපදිත්. අනඳයෙනි, යම්සේ සක්විති රජුගේ සිරුරෙහි පිළිපදිත් ද, එසේ ම තථාගතයන් ගේ සිරුරෙහි පිළිපැද්ද යුතු. තථාගතයනට ඒවූ මං සන්දියෙක තුඹක් කැරැවියැ යුතු. යම කෙනෙක් එහි මල් හෝ සුවඳ හෝ සුවඳ සුණු හෝ තහන්නාහු (පුදන්නාහු) හෝ වෙත් ද, ආදරයෙන් වඳින්නාහු හෝ වෙත් ද, සිත හෝ පහදවන්නාහු වෙත් ද, එය ඔවුනට බොහෝ කල් වැඩ පිණිස සුව පිණිස වන්නේ යැ'' යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

තුඹට සුදුසු පුහුලෝ.

97. ''අනඳයෙනි, තුඹ (ස්තූප) කොට පුදනු ලබන්නට සුදුසු වූ මේ පුහුලෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක් ද යත්: අර්හත් සම්‍යක්-සම්බුද්ධ තථාගත තෙමේ තුඹින් (ස්තූපයෙන්) පුදනු ලබනුවට සුදුසු ය. පසේ බුදුරජ තෙමේ තුඹින් පුදනු ලබන්නට සුදුසු ය. තථාගත සම්මා-සම්බුදුන්ගේ සවු තෙමේ තුඹින් පුදනු ලබන්නට සුදුසු ය, සක්විති රජ තෙමේ තුඹින් පුදනු ලබන්නට සුදුසු ය.

අනඳයෙනි, කවර කරුණක් නිසා අර්හත් සම්‍යක්සම්බුද්ධ තථාගත තෙමේ තුඹින් පුදනු ලබනුවට සුදුසු වෙයි ද යත්: අනඳයෙනි, 'මේ ඒ භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ ස්තූප යැ' යි බොහෝ දෙනා සිත පහදත්, සිත පහද කබුන් මරණින් මතු මනාගති ඇති සග ලොවට පැමිණෙත්.

අනඳයෙනි, මේ කරුණ නිසා ම අර්හත් සම්‍යක්සම්බුද්ධ තථාගත තෙමේ තුඹින් පුදනු ලබනුවට සුදුසු ය. අනඳයෙනි, කවර කරුණක් නිසා පසේ සම්බුදුරජ තුඹින් පුදනු ලබනුවට සුදුසු ද යත්: අනඳයෙනි, මේ ඒ භගවත් පසේ බුදුරජු ගේ ස්තූප යැ' යි බොහෝ දෙනා සිත පහදත්. ඔහු එහි සිත පහද කා බුන් මරණින් මතු මනා ගති ඇති සග ලොවට පැමිණෙත්. අනඳයෙනි, මෙ කරුණ නිසා ම පසේබුදු රජ තුඹින් පුදනු ලබනුවට සුදුසු ය.

Free Distribution www.aathaapi.org

කිඤ්චානන්ද අත්ථවසං පටිච්ච තථාගතස්ස සාවකො ථූපාරහො? අයං තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස සාවකස්ස ථූපො ති ආනන්ද බහූ ජනා චිත්තං පසාදෙන්ති.[1] තෙ තත්ථ චිත්තං පසාදෙත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. ඉදං ඛො ආනන්ද අත්ථ-වසං පටිච්ච තථාගතස්ස සාවකො ථූපාරහො,[2]

කිඤ්චානන්ද අත්ථවසං පටිච්ච රාජා චක්කවත්ති ථූපාරහො? අයං ධම්මි-කස්ස ධම්මරඤ්ඤො ථූපො ති ආනන්ද බහූ ජනා චිත්තං පසාදෙන්ති, තෙ තත්ථ චිත්තං පසාදෙත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති.

ඉදං ඛො ආනන්ද අත්ථවසං පටිච්ච රාජා චක්කවත්ති ථූපාරහො. ඉමෙ ඛො ආනන්ද චත්තාරො ථූපාරහා''ති.

ආනන්දත්ථෙරස්ස අච්ඡරියධම්මා.

98. අථ ඛො ආයස්මා ආනන්දො විහාරං පවිසිත්වා කපිසීසං ආලම්බිත්වා රොදමානො අඨාසි: ''අහඤ්ච වතම්හි සෙඛො සකරණීයො, සත්ථු ච මෙ පරිනිබ්බානං භවිස්සති යො මමං[3] ආනුකම්පකො''ති, අථ ඛො භගවා භික්ඛු ආමන්තෙසි: 'කහන්නු ඛො භික්ඛවෙ ආනන්දො''ති ''එසො භන්තෙ ආයස්මා ආනන්දො විහාරං පවිසිත්වා කපිසීසං ආලම්බිත්වා රොදමානො ඨිතො: 'අහඤ්ච වතම්හි සෙඛො සකරණීයො සත්ථු ච මෙ පරිනිබ්බානං භවිස්සති යො මමං ආනුකම්පකො''ති. අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි: ''එහි ත්වං භික්ඛු, මම වචනෙන ආනන්දං ආමන්තෙහි: සත්ථා තං ආවුසො ආනන්ද ආමන්තෙතී''ති ''එවම්භන්තෙ'ති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙනායස්මා ආනන්දො තෙනුප-සඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතදවොච: සත්ථා තං ආවුසො ආනන්ද ආමන්තෙතී''ති. 'එවමාවුසො'ති ඛො ආයස්මා ආනන්දො තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්තං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච:

---

1. බහුජනො චිත්තං පසාදෙති (PTS)
2. සාවකථූපො. (PTS)
3. මම (මජ්ඣං)

Free Distribution www.aathaapi.org

අනඳයෙනි, කවර කරුණක් නිසා තථාගතයන් ගේ සව්වා තුඹින් සුදනු ලබන්නට සුදුසු ද යත්: අනඳයෙනි, 'මේ ඒ භගවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ ගේ සව්වක්හු ගේ ස්තූපයෙකැ' යි බොහෝ දෙනා සිත පහදත්. ඔහු එහි සිත පහද කා බුන් මරණින් මතු මනා ගති ඇති සඟලොවට පැමිණෙත්. අනඳයෙනි, මේ කරුණ නිසා ම තථාගතයන් ගේ සව්වා තුඹින් සුද ලබනුවට සුදුසු ය.

අනඳයෙනි, කවර කරුණක් නිසා සක්විති රජ තුඹින් සුදනු ලබනුවට සුදුසු වෙයි ද යත්: අනඳයෙනි, 'මේ දැහැමි වූ දස රජ දහමින් ජනන් රැඳැවූ සක්විති රජු ගේ ස්තූප යැ' යි බොහෝදෙනා සිත පහදත්. ඔහු එහි සිත පහ ද කා බුන් මරණින් මතු මනා ගති ඇති සඟ ලොවට පැමිණෙත්. අනඳයෙනි, මේ කරුණ නිසා සක්විති රජ තුඹින් සුද ලබනුවට සුදුසු ය.

අනඳයෙනි, මේ ස්තූපාර්හ පුද්ගල සතර දෙනා යැ'' යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

අනඳ තෙරුන් ගේ අසිරි දහම

98. ඉක්බිති ආයුෂ්මත් අනඳ තෙරණුවෝ වෙහෙර වැද දෙරැ අගුළුකණුවැ එල්බැ ගෙන ''අහෝ! මම රහත්බව ලබනුවට කළ යුතු දෑ ඇති ශෛක්ෂයෙකිමි වෙමි. මට අනුකම්පා කරන මගේ ශාස්තෘන් වහන්සේ ගේ පිරිනිවන ද වන්නේ යැ'' යි හඬමින් සිටියේ ය. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ ''මහණෙනි, ආනන්දයෝ කොහි ද?'' යි භික්ෂූන් අමතා වදළ සේක. ''වහන්ස, තෙල අනඳ තෙරණුවෝ වෙහෙර වැද දෙරැ අගුළු කණුවැ එල්බැගෙන 'අහෝ! මම කළ යුත දෑ ඇති ශෛක්ෂයෙකිමි වෙමි, මට අනුකම්පා කරන මගේ ශාස්තෘන් වහන්සේ ගේ පිරිනිවන ද වන්නේ යැ' යි හඬමින් සිටියාහු'' යැ යි භික්ෂූහු සැළ කළාහ. එ විටැ භාග්‍යවතුන් වහන්සේ එක්තරා මහණක්හු බණවා ''මහණ, මෙහි එව, 'ඇවැත්නි, ශාස්තෘහු ඔබ කැඳවති' යි කියා මගේ වචනයෙන් අනඳයන් කැඳවා ගෙනව'' යි වදළ සේක. 'එසේ යැ වහන්සැ' යි එ මහණ භගවත් බුදුරජුනට පිළිවදන් දී, අනඳ තෙරුන් කරා එළැඹ, 'ඇවැත්නි, අනඳයෙනි, ශාස්තෘන් වහන්සේ ඔබ කැඳවන සේකැ' යි සැළ කළේ ය. 'එසේ යැ ඇවැත්නි' යි අනඳ තෙරණුවෝ එ මහණ හට පිළිවදන් දී, භගවත් බුදුරජුන් වෙත එළැඹියහ. එළැඹ ඔබ ආදර සහිත වැ වැඳ පසෙක ඉඳගත්හ. පසෙක හුන් ම අනඳ තෙරුනට භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:

Free Distribution www.aathaapi.org

"අලං ආනන්ද මා සොචි, මා පරිදෙවි. නනු එතං ආනන්ද මයා පටිකච්චෙව අක්ඛාතං සබ්බෙහෙව පියෙහි මනාපෙහි නානාභාවෝ විනාභාවෝ අඤ්ඤථාභාවෝ. තං කුතෙත්ථ ආනන්ද ලබ්භා 'යන්නං ජාතං භූතං සඞ්ඛතං පලොකධම්මං, තං වත තථාගතසසාපි සරීරං මා පලුජී'ති. නෙතං ඨානං විජ්ජති. දීඝරත්තං බො තෙ ආනන්ද තථාගතො පච්චුපට්ඨිතො මෙත්තෙන කායකම්මෙන වත්තෙන සුඛෙන අද්ධයෙන අපමාණෙන, මෙත්තෙන වචීකම්මෙන -පෙ- මෙත්තෙන මනොකම්මෙන වත්තෙන සුඛෙන අද්ධයෙන අපමාණෙන. කතපුඤ්ඤසි'සි තං ආනන්ද පධානමනුයුඤ්ජ, වීපං හෙහිසි[1] අනාසවො''ති.

99. අථ බො භගවා භික්ඛූ ආමන්තෙසි: ''යෙ පි තෙ භික්ඛවෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙසම්පි භගවන්තානං එතපරමායෙව උපට්ඨාකා අහෙසුං සෙය්‍යථාපි මය්හං ආනන්දො. යෙ පි තෙ භික්ඛවෙ භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙසම්පි භගවන්තානං එතපරමායෙව උපට්ඨාකා භවිස්සන්ති සෙය්‍යථාපි මය්හං ආනන්දො. පණ්ඩිතො භික්ඛවෙ ආනන්දො, මෙධාවී භික්ඛවෙ ආනන්දො, ජානාති 'අයං කාලො තථාගතං දස්සනාය උපසඞ්කමිතුං භික්ඛූනං, අයං කාලො භික්ඛුනීනං අයං කාලො උපාසකානං, අයං කාලො උපාසිකානං, අයං කාලො රඤ්ඤං රාජමහාමත්තානං තිත්ථියානං තිත්ථියසාවකානන්ති.'

100. චත්තාරොමෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ කතමෙ චත්තාරො? සචෙ භික්ඛවෙ භික්ඛුපරිසා ආනන්දං දස්සනාය උපසඞ්කමති, දස්සනෙන සා අත්තමනා හොති. තත්‍ර චෙ ආනන්දෙ ධම්මං භාසති, භාසිතෙන පි සා අත්තමනා හොති, අච්ඡරිය'ව භික්ඛවෙ භික්ඛුපරිසා හොති. අථ බො ආනන්දෙ තුණ්හී හොති. සචෙ භික්ඛවෙ භික්ඛුනීපරිසා, උපාසකපරිසා, උපාසිකාපරිසා ආනන්දං දස්සනාය උපසඞ්කමති, දස්සනෙන සා අත්තමනා හොති, තත්‍ර චෙ ආනන්දෙ ධම්මං භාසති භාසිතෙනපි සා අත්තමනා හොති. අච්ඡරිය'ව භික්ඛවෙ උපාසිකා-පරිසා හොති. අථ බො ආනන්දෙ තුණ්හී හොති. ඉමෙ බො භික්ඛවෙ චත්තාරො අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ.

1. හොහිසි (ම්‍යා.)

Free Distribution www.aathaapi.org

''අනඳයෙනි, හැඬීමෙන් වැඩෙක් නැත. ශෝක නොකරවු, නොහඬවු. අනඳයෙනි, ප්‍රිය මනාප සියලු දෑයෙන් ඉවත් වීම, වෙන් වීම, අන් සැටියකට පෙරැළීම කල් තබා ම මා කීවා නොවේ ද? අනඳයෙනි, යමෙක් උපන්නේ නම්, වූයේ නම්, සකස් වූයේ නම්, පලුදු වන සුලු වී නම්, ඒ ස්වභාවය ම ඇති තථාගත ශරීරය ද නොනැසේ ව යි පැතුව ද, එය කොයින් ලැබෙන්නේ ද? මෙ කරුණ අවිද්‍යමාන ය (මේ නොවන දෑයෙකි) අනඳයෙනි, තොප විසින් හිතවත් වූ, සුව ගෙන දෙන්නා වූ, දෙසැටියක් නැති, (මුව දෝනා පැන් එළැවීම ආදි) අප්‍රමාණ වූ මෛත්‍රී සහගත කාය කර්මයෙන් තථාගත තෙමේ ප්‍රත්‍යුපස්ථිත (නිතර උවටැන් කරනු ලදුයේ) වෙයි. හිතවත් වූ, සුව ගෙන දෙන, දෙසැටියක් නැති, (මේ මුවදෝනා කලැ යි සැළකිරීම ආදි විසින් පැවැත්වූණු) අප්‍රමාණ වූ මෛත්‍රී සහගත වාක් කර්මයෙන් ද . . . (මගේ ශාස්තෘන් වහන්සේ නිදුක් නිරෝග වන සේක්වා යන ආදි විසින් පැවැත් වුණු) අප්‍රමාණ වූ මෛත්‍රී සහගත මනඃකර්මයෙන් ද තථාගත තෙමේ ප්‍රත්‍යුපස්ථිත වී ය. අනඳයෙනි, තෙපි කෘතපුණ්‍යයහ (බොහෝ පින් කළ කෙනෙක), ප්‍රධන් වඩනුයෙහි යෙදෙවු. වහා රහත් වන්නහුය'' (යනු යි.)

99. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මහණුන් අමතා මෙසේ වදළ සේක. ''මහණෙනි, ගිය කලැ යම් රහත් සම්මාසම්බුදු කෙනෙක් වූහු ද, ඒ භගවත් බුදුවරුනට ද, මට අනඳයන් සේ, මෙවැන්නක්හු පරම කොටැති උවටැවෝ වූහ. මහණෙනි, මතු දවසැ යම් රහත් සම්මාසම්බුදු කෙනෙක් පහළ වන්නාහු ද, ඒ භගවත් බුදුවරුනට ද, මට අනඳයන් සේ, මෙබන්දක්හු පරම කොටැති උවටැවෝ වන්නාහ. මහණෙනි, අනඳයෝ නුවණැත්තෝ ය. මහණෙනි, අනඳයෝ පියෙවියෙන් ම නැණවත් හ. 'තථාගතයන් දක්නා පිණිස එළැඹෙන්නට මහණුනට සුදුසු කල් මේ යැ, මෙහෙණියනට සුදුසු කල් මේ යැ, උවසුවනට සුදුසු කල මේ යැ, උවැසියනට සුදුසු කල මේ යැ, රජක්හට, රජමහ මැත්තනට තොටුවනට, තොටු සව්වනට සුදුසු කල මේ යැ' යි දනිති.

100. මහණෙනි, අනඳයන් කෙරෙහි මේ අසිරිමත් පුදුම සතර දහම් කෙනෙක් වෙත්. කවර සතර දෙනෙක් ද යත්: මහණෙනි, ඉදින් මහණ පිරිසෙක් අනඳයන් දක්නට එළැඹෙයි නම්, ඔබ දැක්මෙන් ම එ පිරිස ආරාධික සිතැති වෙයි. ඉදින් එහි අනඳයෝ දහම් දෙසත් නම්, ඔබ වචනයෙන් ද එ පිරිස සතුටු වෙයි. මහණෙනි, ඒ මහණ පිරිස අපිරියත් ම (අතෘප්ත ම) වෙයි. එ කල්හි අනඳයෝ නිහඬ වෙත්. මහණෙනි, ඉදින් මෙහෙණ පිරිසෙක්, උවසු පිරිසෙක්, උවැසි පිරිසෙක් අනඳයන් දක්නා වස් එළැඹෙයි ද, දැක්මෙන් ම එ පිරිස සතුටු වෙයි. ඉදින් එහි අනඳයෝ දහම් දෙසත් නම්, ඔබ දම් දෙස්මෙනුදු එ පිරිස සතුටු වෙයි. මහණෙනි, උවැසි පිරිස අතෘප්තම වෙයි. එ කලැ අනඳයෝ නිහඬ වෙත්. මහණෙනි, මේ අසිරිමත් පුදුම සතර දෙනෙක් අනඳයන් කෙරෙහි වෙත්.

Free Distribution www.aathaapi.org

චත්තාරෝ'මෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භුතා ධම්මා රඤ්ඤෙ චක්ක-වත්තිම්හි. කතමෙ චත්තාරෝ? සචෙ භික්ඛවෙ ඛත්තියපරිසා රාජානං චක්කවත්තිං දස්සනාය උපසඞ්කමති, දස්සනෙන සා අත්තමනා හොති. තත්‍ර වෙ රාජා චක්කවත්තී භාසති භාසිතෙනපි සා අත්තමනා හොති අතිත්තා'ව භික්ඛවෙ ඛත්තියපරිසා හොති. අථ ඛො රාජා චක්කවත්තී තුණ්හී හොති. සචෙ භික්ඛවෙ බ්‍රාහ්මණපරිසා, ගහපතිපරිසා, සමණ-පරිසා රාජානං චක්කවත්තිං දස්සනාය උපසඞ්කමති, දස්සනෙන සා අත්තමනා හොති. තත්‍ර වෙ රාජා චක්කවත්තී භාසති භාසිතෙන පි සා අත්තමනා හොති, අතිත්තා'ව භික්ඛවෙ සමණපරිසා හොති. අථ ඛො රාජා චක්කවත්තී තුණ්හී හොති. එවමෙව ඛො භික්ඛවෙ චත්තාරෝ 'මෙ අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ. සචෙ භික්ඛවෙ භික්ඛුපරිසා ආනන්දං දස්සනාය උපසඞ්කමති, දස්සනෙන සා අත්තමනා හොති, තත්‍ර වෙ ආනන්දෙ ධම්මං භාසති, භාසිතෙන පි සා අත්තමනා හොති, අතිත්තා'ව භික්ඛවෙ භික්ඛුපරිසා හොති. අථ ඛො ආනන්දෙ තුණ්හී හොති. සචෙ භික්ඛුනීපරිසා, උපාසකපරිසා, උපාසිකාපරිසා ආනන්දං දස්සනාය උපසඞ්කමති, දස්සනෙන සා අත්තමනා හොති, තත්‍ර වෙ ආනන්දෙ ධම්මං භාසති භාසිතෙනපි සා අත්තමනා හොති අතිත්තා'ව භික්ඛවෙ උපාසිකාපරිසා හොති. අථ ඛො ආනන්දෙ තුණ්හී හොති. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරෝ අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ' ති.

[මහාසුදස්සන සුත්තස්ස දෙසනා.]

101. එවං වුත්තෙ ආයස්මා ආනන්දෙ භගවන්තං එතදවොච: ''මා භන්තෙ භගවා ඉමස්මිං කුඩ්ඩනගරකෙ[1] උජ්ජඞ්ගලනගරකෙ සාඛා-නගරකෙ පරිනිබ්බායී.[2] සන්ති භන්තෙ අඤ්ඤානි මහානගරානි, සෙය්‍යථීදං චම්පා රාජගහං සාවත්ථී සාකෙතං කොසම්බී බාරාණසී. එත්‍ථ භගවා පරිනිබ්බාතු. එත්‍ථ බහූ ඛත්තියමහාසාලා බ්‍රාහ්මණමහාසාලා ගහපති-මහාසාලා තථාගතෙ අභිප්පසන්නා. තෙ තථාගතස්ස සරීරපූජං කරිස්සන්ති'' ති. ''මාහෙවං ආනන්ද අවච, මාහෙවං ආනන්ද අවච කුඩ්ඩනගරකං උජ්ජඞ්ගල-නගරකං සාඛානගරකන්ති.''

'භූතපුබ්බං ආනන්ද රාජා මහාසුදස්සනො නාම අහොසි චක්ක-වත්තී ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරිය-ප්පත්තො සත්තරතනසමන්නාගතො,

1. බුද්ධනගරකෙ (මජ්ඣං)
2. කුසිනාරායං (මජ්ඣං)

Free Distribution www.aathaapi.org

"මහණෙනි, මේ අසිරිමත් පුදුම දහම් සතර දෙනෙක් සක්විති රජක්හු කෙරෙහි වෙත්. කවර සතර දෙනෙක් ද යත්: මහණෙනි, ඉදින් කැත් පිරිසෙක් සක්විති රජුහු දක්නට එළැඹෙයි ද, එ පිරිස ඔහු දැක්මෙන් ම සතුටු වෙයි. එහි ඉදින් සක්විති රජ කතා කෙරෙයි නම්, ඔහු කතායෙනුදු එ පිරිස සතුටු වෙයි. මහණෙනි, කැත් පිරිස එයින් අතෘප්ත ම වෙයි. එ කල්හි සක්විති රජ නිහඬ වෙයි. මහණෙනි, ඉදින් බමුණු පිරිසෙක්, ගැහැවි පිරිසෙක් මහණ පිරිසෙක් සක්විති රජු දක්නට එළැඹෙයි ද, එ පිරිස ඔහු දැක්මෙන් ම සතුටු වෙයි. එහි ඉදින් සක්විති රජ ඔවුනට කතා කෙරෙයි ද, ඔහු ගේ කතායෙනුදු එ පිරිස සතුටු වෙයි. එ මහණ පිරිස අතෘප්ත ම වෙයි. එ කල්හි සක්විති රජ නිහඬ වෙයි. මහණෙනි, එසේ ම අනඳයන් කෙරෙහි මේ අසිරිමත් පුදුම දහම් සතර දෙනෙක් වෙත්: මහණෙනි, ඉදින් මහණ පිරිසෙක් අනඳයන් දක්නට එළැඹෙයි නම්, ඔබ දැක්මෙන් ම එ පිරිස සතුටු වෙයි. මහණ පිරිස (ඔබ දැක්මෙහි) අතෘප්ත ම වෙයි. එහි ඉදින් අනඳයෝ දහම් දෙසත් නම්, දහම කතායෙනුදු එ පිරිස සතුටු වෙයි. එ මහණ පිරිස අතෘප්ත ම වෙයි. එ කලැ අනඳයෝ නිහඬ-වෙත්. ඉදින් මෙහෙණ පිරිසෙක්, උවසු පිරිසෙක්, උවැසි පිරිසෙක් අනඳයන් දක්නට එළැඹෙයි නම්, දැක්මෙන් ම එ පිරිස සතුටු වෙයි, එහි ඉදින් අනඳයෝ දහම් කියත් නම්, ඔබ දහම් කතායෙනුදු එ පිරිස සතුටු වෙයි, උවැසි පිරිස එහි ලා අතෘප්ත ම වෙයි. එ කල්හි යැ අනඳයන් නිහඬ වනුයේ. මහණෙනි, මේ අසිරිමත් පුදුම සතර දහම් හු අනඳයන් කෙරෙහි වෙත්" යනු යි.

මහ සුදසුන් දෙසුම

101. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළ කලැ අනඳ තෙරණුවෝ "වහන්ස, (ගල් සෙල් ආදියෙන් විසම බැවින්) රළු නුවරක් වූ (මහරුක්හි ශාඛාවක් බඳු) අතුනුවරක් වූ මේ කුඩා නුවරෙහි නො පිරිනිවෙන සේක්වා. වහන්ස, **චම්පා, රජගහ, සැවැත්, සාකේත, කොසොඹෑ, බරණැස්** යන ආදි අන් මහ නුවරහු ඇත. ඒ එකෙක භාග්‍යවතුන් වහන්සේ පිරිනිවෙන සේක් වා. මේ නුවරන්හි තථාගතයන් වහන්සේ කෙරෙහි වෙසෙසින් පහන් වූ බොහෝ කැත් මහසල්හු ද බමුණු මහසල්හු ද ගැහැවි මහසල්හු ද ඇත. ඔහු තථාගතයන් වහන්සේ ගේ සිරුරට පූජාසත්කාර කරන්නාහ" යි සැළ කළහ.

"අනඳයෙනි, කුඩා නුවරෙකැ යි, රළු නුවරෙකැ යි අතු නුවරෙකැ' යි මෙසේ නහමක් කියවු. අනඳයෙනි, බොහෝ පෙර දවසැ මෙහි මුදුනැ අභිසෙස් ලත්, සයුරහිම යිවු මහදිවයිනට හිමි, පසමිකුරන් දිනූ, දනවුහි තහ-වුරු බවට පැමිණි, සත්රුවනින් සමනා වූ **මහ සුදසුන්** නම් කැත්රජක් විය.

Free Distribution www.aathaapi.org

රඤ්ඤො ආනන්ද මහාසුදස්සනස්ස අයං කුසිනාරා කුසාවතී නාම රාජධානී අහොසි. පුරත්ථිමෙන ච පච්ඡිමෙන ච අමාදසයොජනානි ආයාමෙන, උත්තරෙන ච දක්ඛිණෙන ච සත්තයොජනානි විත්ථාරෙන, කුසාවතී ආනන්ද රාජධානී ඉද්ධා චෙව අහොසි ඵිතා ච බහුජනා ච ආකිණ්ණමනුස්සා ච සුභික්ඛා ච. සෙය්‍යථාපි ආනන්ද දෙවානං ආළකමන්ද නාම රාජධානී ඉද්ධා චෙව ඵිතා ච බහුජනා ච ආකිණ්ණයක්ඛා ච සුභික්ඛා ච, එවමෙව ඛො ආනන්ද කුසාවතී රාජධානී ඉද්ධා චෙව අහොසි ඵිතා ච බහුජනා ච ආකිණ්ණමනුස්සා ච සුභික්ඛා ච. කුසාවතී ආනන්ද රාජධානී දසහි සද්දෙහි අවිවිත්තා අහොසි දිවා චෙව රත්තිඤ්ච: සෙය්‍යථීදං හත්ථිසද්දෙන අස්සසද්දෙන රථසද්දෙන භෙරිසද්දෙන මුදිඞ්ගසද්දෙන වීණාසද්දෙන ගීතසද්දෙන සඞ්ඛසද්දෙන සම්මසද්දෙන තාලසද්දෙන අස්නාථ පිවථ ඛාදථාති දසමෙන සද්දෙන. ගච්ඡ ත්වං ආනන්ද, කුසිනාරාං පවිසිත්වා කොසිනාරකානං මල්ලානං ආරොචෙහි: අජ්ජ ඛො වාසෙට්ඨා රත්තියා පච්ඡිමෙ යාමෙ තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති. අභික්කමථ වාසෙට්ඨා අභික්කමථ වාසෙට්ඨා, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ: අම්හාකඤ්ච නො ගාමක්ඛෙත්තෙ තථාගතස්ස පරිනිබ්බානං අහොසි, න මයං ලභිම්හා පච්ඡිමෙ කාලෙ තථාගතං දස්සනායා''ති.

"එවම්භන්තෙ" ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා නිවාසෙත්වා පත්තචීවරමාදය අත්තදුතියො කුසිනාරං පාවිසි.

මල්ලානං වන්දනා

102. තෙන ඛො පන සමයෙන කොසිනාරකා මල්ලා සන්ථාගාරෙ සන්නිපතිතා හොන්ති කෙනචිදෙව කරණීයෙන. අථ ඛො ආයස්මා ආනන්දො යෙන කොසිනාරකානං මල්ලානං සන්ථාගාරං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා කොසිනාරකානං මල්ලානං ආරොචෙසි "අජ්ජ ඛො වාසෙට්ඨා රත්තියා පච්ඡිමෙ යාමෙ තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති. අභික්කමථ වාසෙට්ඨා, අභික්කමථ වාසෙට්ඨා. මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ!'අම්හාකඤ්ච නො ගාමක්ඛෙත්තෙ තථාගතස්ස පරිනිබ්බානං අහොසි, නං මයං ලභිම්හා පච්ඡිමෙ කාලෙ තථාගතං දස්සනායා''ති.

Free Distribution www.aathaapi.org

අනඳයෙනි, මේ කුසිනාරා නුවර මහසුදස්සන් රජුහු ගේ **කුශාවතී** නම් රජදහන විය. අනඳයෙනි, කුශාවතී රජදහන පෙර දිගින් ද පැසිම් දිගින් ද අයමින් දෙළොස් යොදුන් විය. උතුරු දිගින් ද දකුණු දිගින් ද විතරින් සත් යොදුන් විය. අනඳයෙනි, කුශාවතී රජදහන සමෘද්ධ ද සැපතින් පිරුණේ ද බොහෝ ජනයා ඇත්තේ ද මිනිසුන් ගෙන් ගැවැසුණේ ද සුලභ ආහාර පාන ඇත්තේ ද විය. අනඳයෙනි, දෙවියන් ගේ ආලකමන්ද රාජධානිය යම්සේ සමෘද්ධ ද, ස්ඵීත ද, බහුජනවත් ද, යක්ෂාකීර්ණ ද, සුභික්ෂ ද, අනඳයෙනි, එසේ ම කුසාවතී රජදහනත් සමෘද්ධ ද ස්ඵීත ද බහු ජනවත් ද මනුෂ්‍යාකීර්ණ ද සුභික්ෂ ද විය. අනඳයෙනි, කුශාවතී රජදහන ඇත්හඬින් අස් හඬින් රිය හඬින් බෙර හඬින් මිහිඟුබෙර හඬින් වෙණ හඬින් ගී හඬින් සක්හඬින් කස් තල් හඬින් අත්තාලම් ඇ හඬින් 'බුදිවු බොවු කවු' යි දසවැනි හඬින් දූ යි දස හඬින් නිරතුරු විය. අනඳයෙනි, තෙපි යවු. කුසිනාරාවට පිවිස, කුසිනාරා වාසී මල්ලයනට ''වාසිෂ්ටයෙනි, අද රෑ පැසිම් යම්හි තථාගතයන් ගේ පිරිනිවන වන්නේ ය, වාසිෂ්ටයෙනි, පිටත් වැ එවු. වාසිෂ්ටයෙනි, පිටත් වැ එවු. ''අප ගම්කෙතෙහි තථාගත-යන් ගේ පිරිනිවන වී ය. පැසිම් සෙමෙහි අපි ඔබ දක්නට නො ලදුම්හ' යි පසු වැ විපිළිසැරි නො වවු' යි සැළ කරවු'' යැ යි භාග්‍යවකුන් වහන්සේ වදළ සේක.

අනඳ තෙරණුවෝ 'වහන්ස, එසේ යැ' යි ම භගවත් බුදුරජුනට පිළිවදන් අස්වා, හැඳ පෙරවැ පා සිවුරු ගෙන තමා දෙවෙනි කොටැති ව කුසිනාරාවට වන්හ.

මල්ලයන් ගේ වැඳීම

102. එ සමයෙහි කුසිනාරාවාසී මල්ලයෝ කිසි කරුණකින් සන්ථාගාරයෙහි (කාරණාකාරණ විචාරණ පිණිස රැස් වන හලෙහි) කැටි වූවාහු වෙත්. එ කලැ අනඳ තෙරණුවෝ කුසිනාරා වැසි මල්ලයන් ගේ සන්ථානාගාරය වෙත වැඩියාහ. වැඩ, ''වාසිෂ්ටයෙනි, අද රෑ පැසිම් යම්හි තථාගතයන් වහන්සේ ගේ පිරිනිවන වන්නේ ය. වාසිෂ්ටයෙනි, නික්මැ යවු, වාසිෂ්ටයෙනි, නික්මැ යවු. 'අප ගම්කෙතැ තථාගතයන් වහන්සේ ගේ පිරිනිවන වී ය. අපි පැසිම් සමයෙහි තථාගතයන් වහන්සේ දක්නට නො ලදුම්හ' යි පසු වැ විපිළිසර ඇතියෝ නො වවු'' යි කුසිනාරා වැසි මල්ලයනට සැළ කළහ.

Free Distribution www.aathaapi.org

ඉදමායස්මතො ආනන්දස්ස සුත්වා මල්ලා ච මල්ලපුත්තා ච මල්ලසුණිසා ච මල්ලපජාපතියො ච අඝාවිනො දුම්මනා චෙතොදුක්ඛසමප්පිතා අප්පෙකච්චෙ කෙසෙ පකිරිය කන්දන්ති, බාහා පග්ගය්හ කන්දන්ති, ඡින්නපාතං පතන්ති ආවට්ටන්ති විවට්ටන්ති "අතිබ්පපං භගවා පරිනිබ්බායිස්සති, අතිබ්පපං සුගතො පරිනිබ්බායිස්සති, අතිබ්පපං චක්ඛු[1] ලොකෙ අන්තරධායිස්සති"ති.

අථ ඛො මල්ලා ච මල්ලපුත්තා ච මල්ලසුණිසා ච මල්ලපජාපතියො ච අඝාවිනො දුම්මනා චෙතොදුක්ඛසමප්පිතා යෙන උපවත්තනං මල්ලානං සාලවනං යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමිංසු. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: සවෙ ඛො අහං කොසිනාරකෙ මල්ලෙ එකමෙකං භගවන්තං වන්දාපෙස්සමිං, අවන්දිතො'ව භගවා කොසිනාරකෙහි මල්ලෙහි භවිස්සති. අථායං රත්ති විභායිස්සති. යන්නූනාහං කොසිනාරකෙ මල්ලෙ කුලපරිවත්තසො කුලපරිවත්තසො ඨපෙත්වා භගවන්තං වන්දාපෙය්‍යං 'ඉත්ථන්නාමො භන්තෙ මල්ලො සපුත්තො සභරියො සපරිසො සාමච්චො භගවතො පාදෙ සිරසා වන්දති'ති.

අථ ඛො ආයස්මා ආනන්දො කොසිනාරකෙ මල්ලෙ කුලපරිවත්තසො කුලපරිවත්තසො ඨපෙත්වා භගවන්තං වන්දාපෙසි: 'ඉත්ථන්නාමො භන්තෙ මල්ලො සපුත්තො සභරියො සපරිසො සාමච්චො භගවතො පාදෙ සිරසා වන්දති'ති. අථ ඛො ආයස්මා ආනන්දො එතෙන උපායෙන පඨමෙනෙව යාමෙන කොසිනාරකෙ මල්ලෙ භගවන්තං වන්දාපෙසි.

සුභද්ද පරිබ්බාජක වත්ථු

103. තෙන ඛො පන සමයෙන සුභද්දො නාම පරිබ්බාජකො කුසිනාරායං පටිවසති. අස්සොසි ඛො සුභද්දො පරිබ්බාජකො: 'අජ්ජ කිර රත්තියා පච්ඡිමෙ යාමෙ සමණස්ස ගොතමස්ස පරිනිබ්බානං භවිස්සති'ති. අථ ඛො සුභද්දස්ස පරිබ්බාජකස්ස එතදහොසි: "සුතං ඛො පන මෙ'තං පරිබ්බාජකානං වුද්ධානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං කදාචි කරහචි තථාගතා ලොකෙ උප්පජ්ජන්ති අරහන්තො සම්මාසම්බුද්ධා ති. අජ්ජෙව රත්තියා පච්ඡිමෙ යාමෙ සමණස්ස ගොතමස්ස පරිනිබ්බානංභවිස්සති.

1. චක්ඛුමා (මජසං)

Free Distribution www.aathaapi.org

අනඳ තෙරුන් ගේ මේ වචන අසා, මල්ලයෝ ද මල්ල ලෙහෙලියෝ ද (විවා නො පත් මල්ල තරුණියෝ ද) මල්ල බිරියෝ ද දුක් ඇත්තාහු, දෙම්නස් ඇත්තාහු, සිතැ උපන් ශොක ඇත්තාහු, 'ඉතා වහා භාග්‍යවතුන් වහන්සේ පිරි නිවෙන සේක, ඉතා වහා සුගතයන් වහන්සේ පිරිනිවෙන සේක, ඉතා වහා ලොවැ ඇස අතුරුදහන් වන්නේ යැ' යි කෙහෙ උවා (කෙස් මුදා) හඬත්, දෙහොත් හුවා (දෙ අත් හිසැ තබා) හඬත්, මැදින් බිඳුණුවුන් සේ ඇද වැටෙත්, පෙරළෙන්නාහු වැටී හොත් තෙනට ම පෙරළී එත්, වැටී හොත් තැනින් ඉවතට ද පෙරළී යෙත්.

ඉක්බිති මල්ලයෝ ද මල්ල පුත්හු ද මල්ල ලෙහෙලියෝ ද මල්ල බිරියෝ ද දුක් ඇත්තාහු, දෙම්නස් ඇත්තාහු, සිතැ උපන් ශෝකයෙන් යුක්ත වූවාහු, මල්ලයන් ගේ උපවර්තන නම් සල් වනයට, අනඳතෙරුන් වෙතට එළැඹුණාහ. එ කල්හි, "ඉදින් මම් කුසිනාරා වැසි එකක් එකක්හු ලවා භාග්‍යවතුන් වහන්සේ වැන්දැවීම් නම්, කුසිනාරා පුර මල්ලයන් විසින් නො වඳනා ලද සේක් ම වන්නාහ. එ කල්හි මේ රෑ පාන් වන්නේ ය. මම් කුසිනාරා වැසි මල්ලයන් කුල පරම්පරා විසින් වෙන වෙන ම සිටුවා 'වහන්ස, මෙ නම් මල්ල තෙම අඹුදරු සහිත වැ, පිරිස සහිත වැ, ඇමැත්තන් සහිත වැ භාග්‍යවතුන් වහන්සේ ගේ සිරිපා හිස බිමැ තබා වඳී' යැ යි සැළ කෙරෙමින් භාග්‍යවතුන් වහන්සේ වැන්දැවීම් නම් යෙහෙකැ'' යි අනඳ තෙරුනට මේ සිත විය.

ඉක්බිති අනඳ තෙරණුවෝ කුසිනාරා වැසි මල්ලයන් කුල පරපුර විසින් වෙන වෙන ම සිටුවා 'වහන්ස, මෙ නම් මල්ල තෙම දරුවන් සහිත වැ, බිරිය සහිත වැ, පිරිස සහිත වැ, ඇමැත්තන් සහිත වැ භාග්‍යවතුන් වහන්සේ ගේ සිරිපා හිස බිමැ තබා වඳී'' යැ යි කියා භගවත් (බුදුරජුන්) වැන්දැවූහ. එ කල්හි අනඳ තෙරණුවෝ මෙ නයින් පළමු යම්හි ම කුසිනාරා නුවර මල්ලයන් ලවා භගවත් බුදුරජුන් වැන්දැවූහ.

සුභද්‍ර පරිව්‍රාජක වස්තුව

103. එ සමයෙහි සුභද්‍ර නම් පිරිවැජියෙක් කුසිනාරායෙහි වෙසෙයි. ''අද රෑ පැසිම් යම්හි ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගේ පිරිනිවන වෙතැ''යි සුභද්‍ර පිරිවැජි ඇසුයේ ම ය. ඉක්බිති ඔහුට ''කිසි කලෙක ම (කලාතුරෙකින් ම) තථාගත අර්හත් සම්මාසම්බුදුවරයෝ ලොවැ උපදනාහ'' යි වයසින් වැඩී සිටි මහළු වූ ආචාර්‍ය්‍ය ප්‍රාචාර්‍ය්‍ය පිරිවැජියන් කියන වචනයෙක් මා විසින් අසන ලද්දේ ම ය. අද රෑ ම පැසිම් යම්හි මහණ ගොයුමාණන් වහන්සේගේ පිරිනිවන වන්නේ ය.

Free Distribution www.aathaapi.org

අත්ථි ච මෙ අයං කඞ්ඛාධම්මො උප්පන්නො. එවං පසන්නො අහං සමණෙ ගොතමෙ 'පහොති මෙ සමණො ගොතමො තථා ධම්මං දෙසෙතුං යථාහං ඉමං කඞ්ඛාධම්මං පජහෙය්යන්ති'. අථ ඛො සුභද්දො පරිබ්බාජකො යෙන උපවත්තනං මල්ලානං සාලවනං යෙන ආයස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතදවොච: සුතං මෙතං භො ආනන්ද පරිබ්බාජකානං වුද්ධානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං: "කදාචි කරහචි තථාගතා ලොකෙ උප්පජ්ජන්ති අරහන්තො සම්මාසම්බුද්ධා" ති. අජ්ජව රත්තියා පච්ඡිමෙ යාමෙ සමණස්ස ගොතමස්ස පරිනිබ්බානං භවිස්සති. අත්ථි ච මෙ අයං කඞ්ඛාධම්මො උප්පන්නො, "එවං පසන්නො අහං සමණෙ ගොතමෙ, පහොති මෙ සමණො ගොතමො තථා ධම්මං දෙසෙතුං යථාහං ඉමං කඞ්ඛාධම්මං පජහෙය්යං. සාධාහං භො ආනන්ද ලභෙය්යං සමණං ගොතමං දස්සනාය" ති.

එවං වුත්තෙ ආයස්මා ආනන්දො සුභද්දං පරිබ්බාජකං එතදවොච: 'අලං ආවුසො සුභද්ද, මා තථාගතං විහෙඨෙසි. කිලන්තො භගවා" ති. දුතියම්පි ඛො සුභද්දො පරිබ්බාජකො -පෙ- තතියම්පි ඛො සුභද්දො පරිබ්බාජකො ආයස්මන්තං ආනන්දං එතදවොච: "සුතං මෙතං භො ආනන්ද පරිබ්බාජකානං වුද්ධානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං: කදාචි කරහචි තථාගතා ලොකෙ උප්පජ්ජන්ති අරහන්තො සම්මාසම්බුද්ධා ති. අජ්ජව රත්තියා පච්ඡිමෙ යාමෙ සමණස්ස ගොතමස්ස පරිනිබ්බානං භවිස්සති. අත්ථි ච මෙ අයං කඞ්ඛා ධම්මො උප්පන්නො, එවං පසන්නො අහං සමණෙ ගොතමෙ, 'පහොති මෙ සමණො ගොතමො තථා ධම්මං දෙසෙතුං යථාහං ඉමං කඞ්ඛා ධම්මං පජහෙය්යං'. සාධාහං භො ආනන්ද ලභෙය්යං සමණං ගොතමං දස්සනාය" ති. තතියම්පි ඛො ආයස්මා ආනන්දො සුභද්දං පරිබ්බාජකං එතදවොච: "අලං ආවුසො සුභද්ද, මා තථාගතං විහෙඨෙසි කිලන්තො භගවා" ති.

104. අස්සොසි ඛො භගවා ආයස්මතො ආනන්දස්ස සුභද්දෙන පරිබ්බාජකෙන සද්ධිං ඉමං කථාසල්ලාපං. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: "අලං ආනන්ද මා සුභද්දං වාරෙයි, ලභතං ආනන්ද සුභද්දො තථාගතං දස්සනාය. යං කිඤ්චි මං සුභද්දො පුච්ඡිස්සති, සබ්බන්තං අඤ්ඤාපෙක්ඛො'ව පුච්ඡිස්සති නො විහෙසාපෙක්ඛො. යඤ්චස්සාහං පුට්ඨො ඛ්‍යාකරිස්සාමි, තං විප්පමෙව ආරාධිස්සති" ති.

Free Distribution www.aathaapi.org

මට උපන් සැකයෙක් ද ඇත. යම්සේ මේ සැකය දුරලියැ හෙම් ද එසේ මට දහම්දෙසන්නට මහණ ගොයුමන් වහන්සේ හැකි සේකැ' යි ''මෙසේ මම මහණ ගොයුම් වහන්සේ කෙරෙහි පැහැදුණෙම් වෙමි'' යි මෙ සිත විය. ඉක්බිත්තෙන් සුභද්‍ර පිරිවැජි තෙම මල්ල රජුන් ගේ උපවර්තන සල්වනය යම් තැනෙක ද, අනඳ තෙරණුවෝ යම් තැනෙක ද, එ තැනට එළැඹියේ ය. එළැඹි අනඳ තෙරුන් අමතා ''පින්වත් අනඳයෙනි, කිසි කලෙක්හි ම තථාගත අර්හත් සම්මාසම්බුදුවරයෝ ලොවැ උපදනාහ'' යි වයසින් වැඩි සිටි මහළු වූ ආචාර්‍ය්‍ය ප්‍රාචාර්‍ය්‍ය පිරිවැජියන් කියන මෙ වචනය මා ඇසුවා ඇත. අද රෑ ම පැයිම යම්හි මහණ ගොයුමන් වහන්සේ ගේ පිරිනිවන වන්නේ ය. මට උපන් සැකයෙක් ද ඇත. මේ සැකය මගෙන් දුරු වී යන පරිදි දහම් දෙසන්නට මහණගොයුමන් වහන්සේ හැකි සේකැ' යි මෙසේ මහණ ගොයුමන් වහන්සේ කෙරෙහි මම පැහැදුණෙකිම් වෙමි. පින්වත් අනඳයෙනි, මහණ ගොයුමන් වහන්සේ දක්නට ලබන්නෙම නම් මැනැවැ' යි මෙ වචන කී ය.

මෙසේ කී කල්හි අනඳ තෙරණුවෝ 'ඇවැත් සුභද්‍රයෙනි, කම් නැත. තථාගතයන් වහන්සේ නො වෙහෙසන්න. භාග්‍යවතුන් වහන්සේ ක්ලාන්ත වැ හෝනා සේකැ' යි වදළාහ. දෙවෙනි වර ද සුභද්‍ර පිරිවැජි . . තෙවෙනි වර ද සුභද්‍ර පිරිවැජි අනඳ තෙරුනට ''පින්වත් අනඳයෙනි, කිසි කලෙක්හි ම තථාගත අර්හත් සම්මාසම්බුදු වරු ලොවැ උපදනාහ' යි වයෝවෘද්ධ වූ මහළු වූ ආචාර්‍ය්‍ය ප්‍රාචාර්‍ය්‍ය පිරිවැජියන් කියන මෙ බස් මා ඇසුවා ඇත. අද රෑ ම පැයිම යම්හි මහණ ගොයුමන් වහන්සේ ගේ පිරිනිවන වන්නේ ය. මට උපන් සැකයෙක් ද ඇත. මේ සැකය මගෙන් දුරු වන පරිදි දහම් දෙසන්නට මහණ ගොයුමන් වහන්සේ සමත් සේකැ' යි මෙසේ ඔබ කෙරෙහි මම පැහැදුණෙම් වෙමි. පින්වත් අනඳයෙනි, මහණ ගොයුමන් වහන්සේ දක්නට ලබන්නෙම නම් මැනැවැ' යි මෙ බස් පැවැසී ය. තෙවෙනි වර ද අනඳ තෙරණුවෝ සුභද්‍ර පිරිවැජියාට 'ඇවැත් සුභද්‍රයෙනි, කම් නැත. තථාගතයන් වහන්සේ නො වෙහෙසන්න. භාග්‍යවතුන් වහන්සේ ක්ලාන්ත වැ හෝනා සේකැ' යි වදළහ.

104. සුභද්‍ර පිරිවැජියා හා පැවැති අනඳ තෙරුන් ගේ මේ කථා සංවාදය භගවත් බුදුරජුහු ඇසූහු ම ය. ඉක්බිති භගවන්හු අනඳ තෙරුන් බණවා, ''අනඳයෙනි, කම් නැත. **සුභද්‍රයා නහමක්** වළක්වවු. **සුභද්‍ර** තෙමේ තථාගතයන් දක්නට ලබා වා. සුභද්‍රයා යම් කිසිවක් මා විචාරන්නේ ද, ඒ සියල්ල දැනගනුයෙහි අපේක්ෂා ඇත්තේ ම, වෙහෙසන අදහසක් නැත්තේ ම විචාරයි. විචාරනු ලැබූ මම යමක් ඔහුට හෙළි කරන්නෙම් ද, යුහු ව ම හේ එය දැනගන්නේ යැ'' යි වදළ සේක.

Free Distribution www.aathaapi.org

අථ ඛො ආයස්මා ආනන්දො සුභද්දං පරිබ්බාජකං එතදවොච: ගච්ඡාවුසො සුභද්ද, කරොති තෙ භගවා ඔකාසන්ති. අථ ඛො සුභද්දො පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සුභද්දො පරිබ්බාජකො භගවන්තං එතදවොච: 'යෙ' මෙ භො ගොතම සමණබ්‍රාහ්මණා සඞ්ඝිනො ගණිනො ගණාචරියා ඤාතා යසස්සිනො තිත්ථකරා සාධුසම්මතා බහුජනස්ස, සෙය්‍යථීදං පූරණො කස්සපො, මක්ඛලි ගොසාලො, අජිතො කෙසකම්බලො, පකුධො කච්චායනො, සඤ්ජයො බෙලට්ඨපුත්තො, නිගණ්ඨො නාතපුත්තො, සබ්බෙ තෙ සකාය පටිඤ්ඤාය අබ්භඤ්ඤංසු, සබ්බෙව න අබ්භඤ්ඤංසු, උදාහු එකච්චෙ අබ්භඤ්ඤංසු එකච්චෙ නාබ්භඤ්ඤංසු?''ති

''අලං සුභද්ද තිට්ඨතෙතං සබ්බෙ තෙ සකාය පටිඤ්ඤාය අබ්භඤ්ඤංසු, සබ්බෙව න අබ්භඤ්ඤංසු, උදාහු එකච්චෙ අබ්භඤ්ඤංසු එකච්චෙ නාබ්භඤ්ඤංසු''ති. ධම්මං තෙ සුභද්ද දෙසිස්සාමි. තං සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමි''ති. 'එවං භන්තෙ'ති ඛො සුභද්දො පරිබ්බාජකො භගවතො පච්චස්සොසි, භගවා එතදවොච:

105. ''යස්මිං ඛො සුභද්ද ධම්මවිනයෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගො න උපලබ්භති, සමණොපි න උපලබ්භති, දුතියොපි තත්ථ සමණො න උපලබ්භති, තතියොපි තත්ථ සමණො න උපලබ්භති, චතුත්ථොපි තත්ථ සමණො න උපලබ්භති. යස්මිඤ්ච ඛො සුභද්ද ධම්මවිනයෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගො උපලබ්භති, සමණොපි තත්ථ උපලබ්භති, දුතියොපි තත්ථ සමණො උපලබ්භති, තතියොපි තත්ථ සමණො උපලබ්භති, චතුත්ථොපි තත්ථ සමණො උපලබ්භති. ඉමස්මිං ඛො සුභද්ද ධම්මවිනයෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගො උපලබ්භති. ඉධෙව සුභද්ද සමණො, ඉධ දුතියො සමණො, ඉධ තතියො සමණො ඉධ චතුත්ථො සමණො. සුඤ්ඤා පරප්පවාදා සමණෙභි අඤ්ඤෙහි. ඉමෙව[1] සුභද්ද භික්ඛූ සම්මා විහරෙයුං අසුඤ්ඤො ලොකො අරහන්තෙභි අස්සා''ති.

1. ඉමෙ (සී•)

Free Distribution www.aathaapi.org

එ කල්හි අනඳ තෙරණුවෝ සුභද්‍ර පිරිවැජියාට, ''ඇවැත්නි, සුභද්‍රයෙනි, යන්නැ. ඔබට භාග්‍යවතුන් වහන්සේ අවසර දෙන සේකැ'' යි කීහ. එ විටැ සුභද්‍ර පිරිවැජි තෙම භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ ඔබ හා සතුටු වන්නට නිසි, සිතැ රැඳෙන්නට නිසි කථා නිම කොට එක් පසෙක ඉඳ ගත්තේ ය. එක් පසෙක හිඳ ම සුභද්‍ර පිරිවැජි තෙම භගවත් බුදුරජුනට කථා කොට ''භවද් ගෞතමයිනි, ශ්‍රාවක සංඝයා ඇති, සවු ගණ ඇති, ගණැදුරු වූ, ප්‍රකට වූ, යශස් ඇති බොහෝ දෙනා විසින් සාධු යැ යි සම්මත වූ, කාශ්‍යපගෝත්‍රික පූරණ, **ගෝශාලමස්කරී**, කේශකම්බල දරු **අජිත** කාත්‍යායන ගෝත්‍රික **පකුධ**, වෛරාටීපුත්‍ර **සංයය**, **ඥාතපුත්‍ර නිර්ග්‍රන්ථ** යන යම් මේ තීර්ථංකර කෙනෙක් වූහු ද, ඔහු හැම දෙනා තමන් පිළිණ කළ සේ සත්‍යය දන ගත්තාහු ද? ඔහු හැම දෙනා ම එසේ නො ම දන ගත්තාහු ද? නො හොත් (ඔවුන් අතුරෙන්) එක්තරා කෙනෙක් දන ගත්තාහු එක්තරා කෙනෙක් නො ම දන ගත්තාහු ද?'' යි මෙ පැණය විචාළේ ය.

''සුභද්‍රයෙනි, එයින් වැඩෙක් නැත. 'ඒ සියලු දෙනා තමන් පිළින කරන පරිදි සත්‍යය දන ගත්තාහු ද? සියල්ලෝම නො දන ගත්තාහු ද? නො හොත් එක්තරා කෙනෙක් දන ගත්තාහු, එක්තරා කෙනෙක් නො දන ගත්තාහු ද?' යනා මේ කරුණ සිටී වා (පසෙකැ තැබේ වා). සුභද්‍රයෙනි, තොපට දහමක් දෙසන්නෙමි. එය අසවු මෙනෙහි කරවු. කියන්නෙමි'' යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. ''එසේ ය, වහන් සැ'' යි ම සුභද්‍ර පිරිවැජි තෙම භගවත් බුදු රජුනට පිළිවදන් ඇස්වී ය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:

105. ''සුභද්‍රයෙනි, යම් ධර්ම විනයයෙක (යම් සස්නෙක) අරී අටැඟි මඟ නො ලැබෙයි ද, එහි (පළමු වන) සෝවාන් මහණ ද නො ලැබේ (නො මැත), දෙවෙනි සෙදගැමී මහණ ද එහි නැත, තෙවෙනි අනැගැමි මහණ ද එහි නැත, සතර වන රහත් මහණ ද එහි නැත. වැලි දු සුභද්‍රයෙනි, යම් සස්නෙක අරී අටැඟි මඟ ඇද්ද, එහි (පළමු) සෝවාන් මහණ ද ඇත. දෙවෙනි සෙදගැමි මහණ ද ඇත, තෙවැනි අනගැමි මහණ ද ඇත, සතරවන රහත් මහණ ද ඇත. සුභද්‍රයෙනි, මෙ (දහම් විනය ඇති) සස්නෙහි අරී අටැඟි මඟ ඇත. සුභද්‍රයෙනි, මෙහි ම (පළමු) සෝවාන් මහණ ද ඇත, මෙහි ම දෙවෙනි සෙදැගැමි මහණ ද ඇත. මෙහි ම තෙවෙනි අනැගැමි මහණ ද ඇත. මෙහි ම සිවු වැනි රහත් මහණ ද ඇත. මේ සතර මහණුන්ගෙන් අන්‍ය වූ පරප්‍රවාදයෝ (පර තන්ත්‍රයෝ) සත්‍යයෙන් ශූන්‍ය හ. සුභද්‍රයෙනි, මේ මහණහු ද නිසි පරිදි වසන්නාහු නම් ලොව රහතුන් ගෙන් හිස් නො වන්නේ ය.''

Free Distribution www.aathaapi.org

"එකූනතිංසො වයසා සුභද්ද
යං පබ්බජිං කිං කුසලානුඑසී
වස්සානි පඤ්ඤස සමාධිකානි
යතො අහං පබ්බජිතො සුභද්ද
ඤායස්ස ධම්මස්ස පදෙසවත්තී
ඉතො බහිද්ධා සමණො පි නත්ථි.[4]
දුතියො පි සමණො නත්ථි,
තතියො පි සමණො නත්ථි,
චතුත්ථො පි සමණො නත්ථි.
සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ
ඉමෙ ච සුභද්ද භික්ඛු සම්මා විහරෙය්‍යුං
අසුඤ්ඤෙ ලොකො අරහන්තෙහි"ති[3]

106. එවං වුත්තෙ සුභද්දෙ පරිබ්බාජකො භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ සෙය්‍යථා පි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛිත්තී ති, එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්‍යාහං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං, ලභෙය්‍යං උපසම්පදන්ති.

"යො ඛො සුභද්ද අඤ්ඤතිත්ථියපුබ්බො ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛති, පබ්බජ්ජං, ආකඞ්ඛති උපසම්පදං, සො චත්තාරො මාසෙ පරිවසති. චතුත්තං මාසානං අච්චයෙන ආරද්ධවිත්තා භික්ඛු පබ්බාජෙන්ති උපසම්පාදෙන්ති භික්ඛුභාවාය. අපි ච මෙත්ථ පුග්ගලවෙමත්තතා විදිතා"ති. "සචෙ භන්තෙ අඤ්ඤතිත්ථියපුබ්බා ඉමස්මිං ධම්මවිනයෙ, ආකඞ්ඛන්තා පබ්බජ්ජං, ආකඞ්ඛන්තා උපසම්පදං, චත්තාරො මාසෙ පරිවසන්ති, චතුත්තං මාසානං අච්චයෙන ආරද්ධවිත්තා භික්ඛු පබ්බාජෙන්ති උපසම්පාදෙන්ති භික්ඛුභාවාය, අහං චත්තාරි වස්සානි පරිවසිස්සාමි, චතුත්තං වස්සානං අච්චයෙන ආරද්ධවිත්තා භික්ඛු පබ්බාජෙන්තු උපසම්පාදෙන්තු භික්ඛුභාවායා"ති.

---

3. අසුඤ්ඤෙ ලොකො, අරහන්තෙතාහි අස්සාති (PTS මජ්ඣං)
4. එකූනත්‍රිංශො වයසානුප්‍රාපෙතා (මහාවස්තු) එකොන ත්‍රිංශත්කො වයසා සුභද්ද යත් ප්‍රාවුජං කිං කුශලං ගවෙමි, පංචාශද් වර්ෂාණි සමාධිකානි, යසමාදහං ප්‍රවුජිතඃ සුභද්ද, ආර්යස්‍ය ධර්මස්‍ය, ප්‍රදෙශවර්තති ඉතො බහිර් වෛ ග්‍රමණෝ ස්ති නාන්‍යඃ (අවදානශතක)

Free Distribution www.aathaapi.org

"සුභද්‍රයෙනි, කුසල් නම් (නිවත් මඟ නම්) කිම් ද යි සොයනුයෙම් මෙ පැවිදි වීම් යන යමක් ඇද්ද, එය වයසින් එකුන්තිසක් ඇත්තෙම් කෙළෙමි. සුභද්‍රයෙනි, යම් කලෙක මම පැවිදි වීම් ද, එ දා සිට මෙ දැතුරෙහි මදක් වැඩි පස් පනස් වසෙක් ඉකුත් විය. අරිමඟ දහමැ විවසුන් වැඩීම් වශයෙන් ඒකදේශයෙක්හි දු (එක් කොටසෙක නමුදු) පවත්නා මහණෙක් මෙ සස්නෙන් බැහැරැ නැත. පළමු මහණ ද මෙ සස්නෙන් බැහැරැ නැත. දෙවෙනි මහණ ද නැත. තෙවෙනි මහණ ද නැත. සිවුවන මහණ ද නැත. මේ සතර මහණුන් ගෙන් අන්‍ය වූ පරප්‍රවාදයෝ හිස් හ. සුභද්‍රයෙනි, මේ මහණහු නිසි පරිදි (සම්‍යක්ප්‍රතිපන්න වැ) වසන්නා හු නම්, ලොව රහතුන් ගෙන් නොයිස් වන්නේ ය."

106. මෙසේ වදළ කල්හි සුභද්‍ර පිරිවැජි තෙම භගවත් බුදුරජුනට, "වහන්ස, දම් දෙසුම් ඉතා මනාය, වහන්ස, දම් දෙසුම් ඉතා මනා ය. යම් සේ මුණින් නමා තුබූ බඳුනක් උඩුකුරු කොට තබන්නේ ද, වැසුණු දෑයක් විවෘත කරන්නේ ද, මං මුළා වූවක් හට මඟ කියන්නේ ද, ඇස් ඇත්තන් රූප දකිති යි අඳුරෙහි තෙල් පහනක් හෝ දල්වන්නේ ද, එසේ ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කරුණින් මට දහම් පැවැසිණ. වහන්ස එයැසු මම් භාග්‍යවතුන් වහන්සේ ද ධර්මය ද භික්ෂූ සංඝයා ද සරණ යෙමි. වහන්ස, මම් භාග්‍යවතුන් වහන්සේ වෙතැ පැවිද්ද ලබම් වා, උපසපුව ලබම් වා" යි කී ය.

"සුභද්‍රයෙනි, පෙරැ අන් තොටු වූයෙක් මෙ සස් නැ පැවිද්ද කැමැත්තේ නම්, උපසපුව කැමැත්තේ නම්, හේ සිවු මසක් පිරිවෙස් වෙසෙයි. සිවු මස ඇවැමෙන් සතුටු වූ මහණහු ඔහු භික්ෂුභාවය පිණිස පැවිදි කෙරෙත්, උපසපන් කෙරෙත්. වැළිදු මෙහි ලා මා විසින් සුහුල් වෙසෙස දන්නා ලද්දේ යැ" යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක, "ඉදින් වහන්ස, පෙරැ අන් තොටු වූවාහු මෙ සස්නැ පැවිද්ද පතන්නාහු, උපසපුව පතන්නාහු, සිවු මසක් පිරිවෙස් වසන්නාහු නම්, සිවු මස ඇවැමෙන් සතුටු සිතැති මහණහු භික්ෂුත්වය පිණිස පැවිදි කරන්නාහු, උපසපන් කරන්නාහු නම්, මම (සිවුමසක් නො ව) සිවුවසක් ම පිරිවෙස් වසන්නෙමි. සිවු වස ඇවැමෙන් සතුටු වූ සිතැති මහණහු භික්ෂුභාවය පිණිස මා පැවිදි කෙරෙත් වා, උපසපන් කෙරෙත් වා" යි පිරිවැජි කී ය.

Free Distribution www.aathaapi.org

අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: තෙන හානන්ද සුභද්දං පරිබ්බාජකං ආජානාහි. 'එවම්භන්තෙ'ති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ ඛො සුභද්දො පරිබ්බාජකො, අයස්මන්තං ආනන්දං එතදවොච: ''ලාභා වො ආවුසො ආනන්ද, සුලද්ධං වො ආවුසො ආනන්ද, යෙ[1] එසො සත්ථු සම්මුඛා අත්තෙවාසාභිසෙකෙන අභිසිඤ්චා ති.[2]

අලඤ්ච ඛො සුභද්දෙ පරිබ්බාජකො භගවන්තං සත්ථාරං පබ්බජ්ජං, අලඤ්ච උපසම්පදං. අචිරූපසම්පන්නෙ ඛො පනායස්මති සුභද්දෙ එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තෙ, නචිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ඛො පනායස්මා සුභද්දෙ අරහතං අහොසි. සො ච[3], භගවතො පච්ඡිමො සක්ඛිසාවකො අහොසි ති.

පඤ්චමො භාණවාරො.

1. යෙ, (PTS) 2. අභිසිත්තෙ (PTS) 3. සො (මජ්ඣ.)

Free Distribution www.aathaapi.org

ඉක්බිති භගවත්හු අනඳ තෙරුන් බණවා, ''අනඳයෙනි, එසේ වී නම් සුභද්‍රයා පැවිදි කරන්නැ'' යි වදළහ. ''එසේ ය වහන්ස'' යි කියා ම අනඳ තෙරණුවෝ භගවත් බුදුරජුනට පිළිවදන් දුන්හ. එ කල්හි සුභද්‍ර පිරිවැජි තෙම අනඳ තෙරුනට ''ඇවැත් අනඳයෙනි, යම් කෙනෙක් මෙහි ශාස්තෘන් හමුයෙහි අන්තෙවාසිකාභිසෙකයෙන් අභිෂික්ත ද, ඒ ඔබට මහත් ලාභ කෙනෙක, ඒ ඔබ විසින් ලද සේ මැනැවැ'' යි කී ය.

සුභද්‍ර පිරිවැජි තෙම භගවත් බුදුරජුන් වෙතැ පැවිද්ද ලැබී ය, උපසපුව ලැබී ය. ආයුෂ්මත් සුභද්‍ර තෙම උපසපන් වූ නොබෝ කල් ඇත්තේ ම හුදෙකලා වූයේ ගණයා කෙරෙරෝ වෙන් වැ නොපමා වැ කෙලෙස් තවන වැර ඇති වැ කමටහන කරා මෙහෙයූ සිතැති වැ වසතුයේ, යමක් පිණිස කුලදරුවෝ මනා ව ම ගිහිගෙන් නික්ම සසුන් වදනා හු ද, ඒ මහඛඔසරු කෙළවර වූ ලොවුතුරා රහත් බව මේ අත් බවහි ම නොබෝ කල්හි ම තෙමේ ම තුවණින් දැන පසක් කොට ලැබ වීසී ය. හේ 'ඉපැත්ම නැවැතිණ, මහ ඛඔසර වැස නිමැවිණ. කළ යුතු දෑ කොට නිමැවිණ. මේ රහත් බව පිණිස තව කළ යුතු දැයෙක් නැතැ'' යි වෙසෙසින් දත්තේය. ආයුෂ්මත් සුභද්‍රයෝ රහතුන්ගෙන් එක්තරා කෙනෙක් වූ හ. ඔබ භගවත් බුදුරජුන් ගේ අන්තිම ප්‍රත්‍යක්ෂ ශ්‍රාවක (ඔබ ධරමාණ කල්හි ම රහත් වූ අන්තිම ශ්‍රාවක) වූහ.

පස් වන බණවර යි.

Free Distribution www.aathaapi.org

තථාගතස්ස පච්ඡිමා වාචා

107. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි.

"සියා ඛො පනානන්ද තුම්හාකං එවමස්ස, අතීතසත්ථුකං පාවචනං, නත්ථි නො සත්ථාති. න ඛො පනෙතං ආනන්ද එවං දට්ඨබ්බං. යො ඛො ආනන්ද මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො සො වො මමච්චයෙන සත්ථා. යථා ඛො පනානන්ද එතරහි භික්ඛූ අඤ්ඤමඤ්ඤං ආවුසොවාදෙන සමුදාචරන්ති, න ඛො මමච්චයෙන එවං සමුදාචරිතබ්බං. ථෙරතරෙන ආනන්ද භික්ඛුනා නවකතරො භික්ඛු නාමෙන වා ගොත්තෙන වා ආවුසොවාදෙන වා සමුදාචරිතබ්බො, නවකතරෙන භික්ඛුනා ථෙරතරො භික්ඛු භන්තෙති වා ආයස්මාති වා සමුදාචරිතබ්බො.

ආකඞ්ඛමානො ආනන්ද සඞ්ඝො මමච්චයෙන ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි සමූහනතු.[1] ඡන්නස්ස ආනන්ද භික්ඛුනො මමච්චයෙන බ්‍රහ්මදණ්ඩා දාතබ්බා" ති. "කතමො පන භන්තෙ බ්‍රහ්මදණ්ඩො?" ති. "ඡන්නො ආනන්ද භික්ඛු යං ඉච්ඡෙය්‍ය තං වදෙය්‍ය, සො භික්ඛූහි නෙව වත්තබ්බො න ඔවදිතබ්බො න අනුසාසිතබ්බො" ති.

108. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: සියා ඛො පන භික්ඛවෙ එකභික්ඛුස්සාපි කඞ්ඛා වා විමති වා බුද්ධෙ වා ධම්මෙ වා සඞ්ඝෙ වා මග්ගෙ වා පටිපදාය වා, පුච්ඡථ භික්ඛවෙ, මා පච්ඡා විපටිසාරිනො අහුවත්ථ: සම්මුඛීභූතො නො සත්ථා අහොසි, න මයං සකථිමහ භගවන්තං සම්මුඛා පටිපුච්ඡිතුන්ති. එවං වුත්තෙ තෙ භික්ඛු තුණ්හී අහෙසුං. දුතියම්පි ඛො භගවා -පෙ- තතියම්පි ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: සියා ඛො පන භික්ඛවෙ එකභික්ඛුස්සාපි කඞ්ඛා වා විමති වා බුද්ධෙ වා ධම්මෙ වා සඞ්ඝෙ වා මග්ගෙ වා පටිපදාය වා පුච්ඡථ භික්ඛවෙ මා පච්ඡා විපටිසාරිනො අහුවත්ථ, සම්මුඛීභූතො නො සත්ථා අහොසි, න මයං සකථිමහ භගවන්තං සම්මුඛා පටිපුච්ඡිතුන්ති. තතියම්පි ඛො තෙ භික්ඛූ තුණ්හී අහෙසුං. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි 'සියා ඛො පන භික්ඛවෙ සත්ථුගාරවෙනාපි න පුච්ඡෙය්‍යාථ. සහායකොපි භික්ඛවෙ සහායකස්ස ආරොචෙතූ'ති. එවං වුත්තෙ තෙ භික්ඛූ තුණ්හී අහෙසුං.

1. සමූහනතු (PTS)

Free Distribution www.aathaapi.org

තථාගතයන් වහන්සේ ගේ අන්තිම වචනය

107. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් ඔණවා මෙසේ වදළ සේක:

''අනඳයෙනි, ප්‍රවචනය (පෙළ දහම) ඉකුත් වූ ශාස්තෘහු ඇති එකෙකැ යි 'අපගේ ශාස්තෘහු නැතැ' යි තොපට මෙ බඳු සිතක් ඇති විය හැක්කේ ම ය. අනඳයෙනි, එය එසේ දක්ක යුතු නො වෙයි. අනඳයෙනි, මා විසින් යම් දහමෙකුත් විනයෙකුත් දෙසිණි ද පැණැවිණි ද එය මා ඇවැමෙන් තොපට ශාස්තෘ වෙයි. අනෙකක් කියම්. අනඳයෙනි, දැන් මහණහු උනුනට ආවුසොවාදයෙන් (ඇවැත්නි යි යන වචනයෙන්) කතා කෙරෙත් ද, මා ඇවැමෙන් එසේ කතා නො කළ යුතු. අනඳයෙනි, (උපසපුයෙන්) වඩා මහළු වූ මහණහු විසින් (උපසපුඉයන්) වඩා බාල වූ මහණ තෙම සංඥානාමයෙන් හෝ ඔහු අයත් ගොත්‍රයේ නමින් හෝ ආවුසෝවාදයෙන් හෝ ඇමැතියැ යුතු. වඩා බාල මහණහු විසින් වඩා මහළු මහණ තෙම 'වහන්ස,' යි හෝ 'ආයුෂ්මත්නි' යි හෝ කියා ඇමැතියැ යුතු.

අනඳයෙනි, ඉදින් සංඝ තෙමේ කැමැති වන්නේ නම්, මා ඇවැමෙන් කුඩා අනු කුඩා සික පද සමූහනනය කෙරේ වා (උදුරා ඉවත් කෙරේවා)

අනඳයෙනි, මා ඇවැමෙන් ඡන්න මහණහට බ්‍රහ්මදණ්ඩනය දියැ යුතු. 'වහන්ස, බ්‍රහ්මදණ්ඩනය නම් කවරේ ද' යි අනඳ තෙරුණුවෝ පුළුවුත්හ. 'අනඳයෙනි: ඡන්න මහණ යමක් කැමැත්තේ ද එය කියා වා. මහණුන් විසින් හෙ තෙම කිසිවක් නො කියැ යුතු (ඔහු හා කතා නො කළ යුතු), නො ම ඔවා දියැ යුතු, අනුශාසන නො ම කට යුතු. (බ්‍රහ්ම දණ්ඩන නම් මේ යැ.)'

108. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'මහණුන් ඔණවා වදරනසේක්, 'මහණෙනි, එක් මහණකුට නමුදු බුදුන් කෙරෙහි හෝ දහම් කෙරෙහි හෝ සඟන කෙරෙහි හෝ මාර්ගය කෙරෙහි හෝ පිළිවෙත කෙරෙහි හෝ සැකයෙක් හෝ විමතියෙක් ඇත් නම්, මහණෙනි, එය විචාරවු. 'ශාස්තෘහු අපට හමු වූහ. අපි ඒ භාග්‍යවතුන් වහන්සේ වෙතින් විචාරන්නට නො හැකි වූ මු' යි පසු වැ විපිළිසැරි නො වවු' යි වදළ සේක. මෙසේ වදළකල්හි ඒ මහණහු නිහඬ වූහ. භගවත්හු දෙවෙනි වර ද . . තෙවෙනි වර ද 'මහණෙනි එක් මහණකුට නමුදු බුදුන් කෙරෙහි හෝ දහම් කෙරෙහි හෝ සඟන කෙරෙහි හෝ මාර්ගය කෙරෙහි, පිළිවෙත කෙරෙහි හෝ සැකයෙක් හෝ විමතියෙක් හෝ ඇත් නම් එය විචාරවු. 'ශාස්තෘහු අපට හමු වූහ, අපි ඒ භාග්‍යවතුන් වහන්සේ වෙතින් විචාරන්නට නො හැකි වූමු' යි පසු වැ විපිළිසැරි නො වවු' යි වදළහ. තෙවෙනි වර ද ඒ මහණහු නිහඬ වූහු. එ විට භාග්‍යවතුන් වහන්සේ මහණුන් ඔණවා, 'මහණෙනි, ශාස්තෘහු කෙරෙහි ගෞරවයෙනුදු තොප නො විචාරනු විය හැක්ක. (එසේ කලැ) යහලු මහණ තෙමේ යහලු මහණකුට හෝ සැළ කෙරේ වා' යි වදළ හ. මෙසේ වදළ කල්හිද ඒ මහණහු නිහඬ වූහ.

Free Distribution www.aathaapi.org

108. අථ ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: ''අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, එවං පසන්නො අහං භන්තෙ ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ 'නත්ථි එකභික්ඛුස්සාපි කඞ්ඛා වා විමති වා බුද්ධෙ වා ධම්මෙ වා සඞ්ඝෙ වා මග්ගෙ වා පටිපදාය වා'ති. ''පසාද ඛො ත්වං ආනන්ද වදෙසි. ඤාණමෙව හෙත්ථ ආනන්ද තථාගතස්ස නත්ථි ඉමස්මිං භික්ඛු සඞ්ඝෙ එකභික්ඛුස්සාපි කඞ්ඛා වා විමති වා බුද්ධෙ වා ධම්මෙ වා සඞ්ඝෙ වා මග්ගෙ වා පටිපදාය වා. ඉමෙසං හි ආනන්ද පඤ්චන්නං භික්ඛුසතානං යො පච්ඡිමකො භික්ඛු සො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො'ති.

අථ ඛො භගවා භික්ඛු ආමන්තෙසි: ''හන්ද'දානි භික්ඛවෙ ආමන්තයාමි වො, වයධම්මා සඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙථා''ති.

අයං තථාගතස්ස පච්ඡිමා වාචා[2].

භගවතො පරිනිබ්බානං.

109. අථ ඛො භගවා පඨමං ඣානං සමාපජ්ජි. පඨමජ්ඣානා වුට්ඨහිත්වා දුතියං ඣානං සමාපජ්ජි. දුතියජ්ඣානා වුට්ඨහිත්වා තතියං ඣානං සමාපජ්ජි. තතියජ්ඣානා වුට්ඨහිත්වා චතුත්ථං ඣානං සමාපජ්ජි. චතුත්ථජ්ඣානා වුට්ඨහිත්වා ආකාසානඤ්චායතනං සමාපජ්ජි. ආකාසානඤ්චායතනසමාපත්තියා වුට්ඨහිත්වා විඤ්ඤාණඤ්චායතනං සමාපජ්ජි. විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා වුට්ඨහිත්වා අකිඤ්චඤ්ඤායතනං සමාපජ්ජි. ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා වුට්ඨහිත්වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපජ්ජි. නෙවසඤ්ඤානාඤ්ඤායතනසමාපත්තියා වුට්ඨහිත්වා සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජි.

අථ ඛො ආයස්මා ආනන්දො ආයස්මන්තං අනුරුද්ධං එතදවොච, ''පරිනිබ්බුතො භන්තෙ අනුරුද්ධ භගවා'ති. ''න ආවුසො ආනන්ද භගවා පරිනිබ්බුතො සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො''ති.

---

2. සබ්බත්ථිකවාදීනං, මහාපරිනිබ්බානසුත්තෙ, එවං, දීඝසතෙ:
අථ භගවානුත්තරාසංගතඃ සුවණ්ණවණ්ණං බාහුං නිසසාය්‍ය තාන් භික්ෂුනවොචත්: තථාගතස්‍ය දර්ශනං ලොකෙ කදාචිදෙව භවති යථා උදුම්බරපුෂපං කදාචිදෙව ප්‍රාදුර්භවති අරුණවණ්ණ- බාහුං නිසසාය්‍ය බුද්ධඃ ප්‍රාදුරකරොත් අදභුතං නිමිත්තම් ආගන්තුකා සංස්කාරාඃ අනිත්‍යා උත්පද්‍ය විනශ්‍යන්ති මා ප්‍රමාදෙථාඃ ඉති තසමාද් භික්ෂවඃ අප්‍රමාදෙන සම්පාදයත. නාභං ප්‍රාමදම් තෙන සම්‍යක්සම්බුද්ධඃ අසංඛ්‍යෙයගුණො ජාතඃ. ව්‍යයධර්මාඃ සංස්කාරාඃ අප්‍රමාදෙන සම්පාදෙථාඃ ඉයමස්ති තථාගතස්‍ය පශ්චිමා වාක්.

Free Distribution www.aathaapi.org

108. එ කල්හි අනඳ තෙරණුවෝ 'වහන්ස, ආශ්චර්‍යය! වහන්ස, අද්භූත ය! වහන්ස, බුදුරජුන් කෙරෙහි හෝ දහම් කෙරෙහි හෝ සඟන කෙරෙහි හෝ මහ කෙරෙහි හෝ පිළිවෙත කෙරෙහි හෝ එක් මහණක්හට දු සැකයෙක් හෝ විමතියෙක් හෝ නැතැ' යි මෙසේ මේ භික්ෂු සංඝයා කෙරෙහි මම පැහැදුණෙමි' යි භගවත් බුදුරජුනට සැළ කළහ.

''අනඳයෙනි, තෙපි පැහැදීමෙන් (ප්‍රසාදය හේතු කොට ගෙන) මෙසේ කියවු. අනඳයෙනි, තථාගතයන් ගේ වූකලි මේ කරුණෙහි ලා 'මේ මහණ මුළුයෙහි එක් මහණකුට ද බුදුන් කෙරෙහි හෝ දහම් කෙරෙහි හෝ සඟන කෙරෙහි හෝ මගෙහි හෝ පිළිවෙතෙහි හෝ සැකයෙක් හෝ විමතියෙක් හෝ නැත. අනඳයෙනි, මේ පන්සියක් මහණුන් අතුරෙ යම් පැසිම් සවු මහණෙක් වේ ද, හේ සිවු අවාභි නො වැටෙන සුලු සම්‍යක්ත්ව නියමයෙන් නියත වූ, සම්බොධිය (ඉදිරි මාර්ගත්‍රයය) ප්‍රතිඛ්ඨා කොට ඇත්තෙ මැ යි දනිම ඇත්තෙකු යි වදළ සේක.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මහණුන් ඇමැතූ සේක: ''මහණෙනි, දැන් තොප අමතමි (තොපට උපදෙස් දෙමි). සංස්කාරයෝ නැසෙන සුලු හ. (ඒ බැවින්) නො පමායෙන් (එළැඹුවූ සිහියෙන්) රහත් බව පිණිස කළ යුතු දෑ සපය වු (සපුරවු)''

මේ භාග්‍යවතුන් වහන්සේගේ අන්තිම වචනය විය.

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවීම

109. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පළමු දහන් සම වැදුණු සේක. පළමු දෙහැනෙන් නැඟී දෙවෙනි දහන් සම වැදුණු සේක. දෙවෙනි දෙහැනෙන් නැඟී තෙවෙනි දහන් සමවැදුණු සේක. තෙවෙනි දෙහැනෙන් නැඟී සිවුවැනි දහන් සමවන් සේක. සිවුවැනි දෙහැනෙන් නැඟී ආකාසානඤ්චායතන දහන් සමවන් සේක. ආකාසානඤ්චායතන සමවතින් නැඟී විඤ්ඤාණඤ්චායතනයට සමවන් සේක. විඤ්ඤාණඤ්චායතන සමවතින් නැඟී ආකිඤ්චඤ්ඤායතනයට සමවන් සේක. ආකිඤ්චඤ්ඤායතන සමවතින් නැඟී නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවන් සේක. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමවතින් නැඟී සඤ්ඤාවෙදයිතනිරොධයට සමවන් සේක.

එ කල්හි අනඳ තෙරණුවෝ 'අනුරුද්ධයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි සේක් ද?' යි අනුරුත් තෙරුන් විචාළහ. 'ඇවැත් අනඳයිනි, භාග්‍යවතුන් වහන්සේ නො පිරිනිවි සේක. සඤ්ඤාවෙදයිත නිරොධයට සමවන් සේකැ' යි අනුරුත් තෙරණුවෝ වදළහ.

Free Distribution www.aathaapi.org

අථ ඛො භගවා සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨහිත්වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපජ්ජි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන-සමාපත්තියා වුට්ඨහිත්වා ආකිඤ්චඤ්ඤායතනං සමාපජ්ජි. ආකිඤ්චඤ්ඤා-යතනසමාපත්තියා වුට්ඨහිත්වා විඤ්ඤාණඤ්චායතනං සමාපජ්ජි. විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා වුට්ඨහිත්වා ආකාසානඤ්චායතනං සමාපජ්ජි. ආකාසානඤ්චායතනසමාපත්තියා වුට්ඨහිත්වා චතුත්ථං ඣානං සමාපජ්ජි. චතුත්ථජ්ඣානා වුට්ඨහිත්වා තතියං ඣානං සමාපජ්ජි. තතියජ්ඣානා වුට්ඨහිත්වා දුතියං ඣානං සමාපජ්ජි. දුතියජ්ඣානා වුට්ඨහිත්වා පඨමං ඣානං සමාපජ්ජි. පඨමජ්ඣානා වුට්ඨහිත්වා දුතියං ඣානං සමාපජ්ජි. දුතියජ්ඣානා වුට්ඨහිත්වා තතියං ඣානං සමාපජ්ජි. තතියජ්ඣානා වුට්ඨහිත්වා චතුත්ථං ජ්ඣානං සමාපජ්ජි. චතුත්ථජ්ඣානා වුට්ඨහිත්වා තං සමනන්තරා භගවා පරිනිබ්බායි.

110. පරිනිබ්බුතෙ භගවති සහ පරිනිබ්බානා මහාභූමිචාලො අහොසි, භිංසනකො සලොමහංසො දෙවදුන්දුභියො චංඵලිංසු. පරිනිබ්බුතෙ භගවති සහ පරිනිබ්බානා බ්‍රහ්මා සහම්පති ඉමං ගාථං අභාසි:

''සබ්බෙව නික්ඛිපිස්සන්ති භූතා ලොකෙ සමුස්සයං[1]
යථා එතාදිසො සත්ථා ලොකෙ අප්පටිපුග්ගලො
තථාගතො බලප්පත්තො සම්බුද්ධො පරිනිබ්බුතො''ති.

පරිනිබ්බුතෙ භගවති සහ පරිනිබ්බානා සක්කො දෙවානම්න්දො ඉමං ගාථං අභාසි:

''අනිච්චා වත සඞ්ඛාරා උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛො''ති.

පරිනිබ්බුතෙ භගවති සහ පරිනිබ්බානා ආයස්මා අනුරුද්ධො ඉමා ගාථායො අභාසි:

''නාහු අස්සාසපස්සාසො ඨිතචිත්තස්ස තාදිනො,
අනෙජො සන්තිමාරබ්භ යං කාලමකරි මුනි.
අසල්ලීනෙන චිත්තෙන වෙදනං අජ්ඣවාසයි,
පජ්ජොතස්සෙව නිබ්බානං විමොක්ඛො චෙතසො අහු''ති.[2]

1. විකඛුමා ලොකෙ අන්තරහිතො ති (මජ්ඣං)
2. අසංලීනෙන කායෙන වෙදනාමධිවාසයන් ප්‍රද්‍යොතස්යෙව විමොක්ෂස්තස්‍ය චෙතසඃ (මධ්‍යමිකාවෘත්ති)

Free Distribution www.aathaapi.org

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තියෙන් නැඟී සිට නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවන් සේක. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමවතින් නැඟී ආකිඤ්චඤ්ඤායතන සමවතට සමවන් සේක. ආකිඤ්චඤ්ඤායතන සමවතින් නැඟී විඤ්ඤාණඤ්චායතනයට සමවන් සේක. විඤ්ඤාණඤ්චායතන සමවතින් නැඟී ආකාසානඤ්චායතනයට සමවන් සේක. ආකාසානඤ්චායතන සමවතින් නැඟී සිවුවැනි දහනට සමවන් සේක. සිවුවැනි දහනෙන් නැඟී තෙවෙනි දහනට සමවන් සේක. තෙවෙනි දහනින් නැඟී දෙවෙනි දහනට සමවන් සේක. දෙවෙනි දහනින් නැඟී පළමු දහනට සමවන් සේක. පළමු දහනින් නැඟී දෙවෙනි දහනට සමවන් සේක. දෙවෙනි දහනින් නැඟී තෙවෙනි දහනට සමවන් සේක. තෙවෙනි දහනින් නැඟී සිවුවැනි දහනට සමවන් සේක. සිවුවැනි දහනින් නැඟී එයට අනතුරු වැ පිරිනිවි සේක.

110. භගවත් බුදුරජුන් පිරිනිවි කල්හි, පිරිනිවෙනු හා මැ බිහිසුනු වූ ලොමුදහ ගැනුම් ඇති කරන මහද් භූමිචලනයෙක් විය. දෙවඹෙර පැළිණ. භගවත් බුදුරජුන් පිරිනිවි කල්හි, පිරිනිවන හා මැ සහම්පති මහ බඹ ''සබ්බෙව නික්ඛිපිස්සන්ති . . . සම්බුද්ධෝ පරිනිබ්බුතෝ'' යි මේ ගය ගැයී ය.

එහි අදහස: ''ලොවැ හැම සත්හු ම යම් සේ (ජීවිතෙන්ද්‍රිය-පරිහාණියෙන්) සිරුර හැරදමත් ද, එසේ ම දශවැදෑරුම් ඥානබලයට පැමිණි, ලොවැ ඔබට සමසුතුලක්හු නැති, තථාගත වූ සම්බුද්ධ වූ මේ බුදු වූ ශාස්තෘන් වහන්සේ පිරිනිවි සේක ''

භගවත් බුදුරජුන් පිරිනිවි කල්හි, පිරිනිවෙනු හා මැ සක්දෙවිඳු ''අනිච්චාවත සංඛාරා . . තෙසං වූපසමෝ සුඛෝ'' යි මේ ගය කී ය.

එහි අදහස: ''සසයෙන් හටගත් සියලු දෑ ඒකාන්තයෙන් ඉපැදෙන වැනැසෙන සුලු ය. ඔහු ඉපැද නැසෙත්. ඔවුන්ගේ සංසිඳීම සුව ගෙන දෙයි.''

භගවත් බුදුරජුන් පිරිනිවි කල්හි පිරිනිවෙනු හා මැ අනුරුත් තෙරණුවෝ ''නාහු අස්සාසපස්සාසා . . . විමොක්ඛෝ චෙතසෝ අහූ'' යි මේ ගාථා වදළහ:

එහි අදහස: ''තහවුරු සිතැති, අවලෝ දහමින් නොසැලෙන බුදුරජුන්ගේ ආශ්වාස ප්‍රශ්වාසයෝ නැවැතුණාහ (නො පැවැත්මට පැමිණියාහ). ඒ මුනිහු තෘෂ්ණා නැතියානු, නිවන් අරමුණු කොට කලුරිය කළාහ ඔබ (නො හැකුලුණු සිතින් මරණාන්තික) වේදනාව ඉවැසූහ. පහනක් නිවෙනු සෙයින් ඔබ සිතැ මිදීම විය.''

Free Distribution www.aathaapi.org

පරිනිබ්බුතෙ භගවති සහ පරිනිබ්බානා ආයස්මා ආනන්දෙ ඉමං ගාථං අභාසි:

''තදසි යං භිංසනකං තදසි ලොමහංසනං
සබ්බාකාරවරූපෙතෙ සම්බුද්ධෙ පරිනිබ්බුතෙ''ති.

111. ''පරිනිබ්බුතෙ භගවති යෙ තෙ තස්ථ භික්ඛූ අවීතරාගා අපෙතකෙව බාහා පග්ගය්හ කන්දන්ති ඡින්නපාතං පතන්ති ආවට්ටන්ති විවට්ටන්ති:' අතිබ්බිපං භගවා පරිනිබ්බුතො, අතිබ්බිපං සුගතො පරිනිබ්බුතො අතිබ්බිපං චක්ඛු ලොකෙ අන්තරහිතන්ති. යෙ පන තෙ භික්ඛූ වීතරාගා තෙ සතා සම්පජානා 'අධිවාසෙන්ති අනිච්චා සඞ්ඛාරා, තං කුතෙත්ථ ලබ්භා'ති.

112. අථ බො ආයස්මා අනුරුද්ධො භික්ඛූ ආමන්තෙසි; අලං ආවුසො මා සොච්ථ මා පරිදෙවිත්ථ. නනු එතං ආවුසො භගවතා පටිගච්චෙව අක්ඛාතං, සබ්බෙහෙව පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො අඤ්ඤථාභාවො, තං කුතෙත්ථ ආවුසො ලබ්භා යන්නං ජාතං භූතං සඞ්ඛතං පලොකධම්මං තං වත මා පලුජ්ජීති නෙතං ඨානං විජ්ජති. දෙවතා ආවුසො උජ්ඣායන්තී''ති

''කථම්භූතා පන භන්තෙ අනුරුද්ධ දෙවතා මනසි කරොති? සන්නාවුසො ආනන්ද දෙවතා ආකාසෙ පඨවිසඤ්ඤිනියො කෙසෙ පකිරිය කන්දන්ති බාහා පග්ගය්හ කන්දන්ති' ඡින්නපාතං පතන්ති, ආවට්ටන්ති: විවට්ටන්ති අතිබ්බිපං භගවා පරිනිබ්බුතො, අතිබ්බිපං සුගතො පරිනිබ්බුතො, අතිබ්බිපං චක්ඛු ලොකෙ අන්තරහිතන්ති. සන්නාවුසො ආනන්ද දෙවතා පඨවියා පඨවි-සඤ්ඤිනියො කෙසෙ පකිරිය-පෙ- අන්තරහිතො ති. යා පන දෙවතා වීතරාගා තා සතා සම්පජානා අධිවාසෙන්ති 'අනිච්චා සඞ්ඛාරා තං කුතෙත්ථ ලබ්භා'ති.

Free Distribution www.aathaapi.org

භගවත් බුදුරජුන් පිරිනිවි කල්හි ඔබ පිරිනිවෙන්නා හා මැ අනඳ තෙරණුවෝ මේ "කදාසි යං භිංසනකං . . . සම්බුද්ධෝ පරිනිබ්බුතෙ" යි මේ ගය වදළහ:

එහි අදහස: "(සිල් ආදි) සියලු උතුම් කරුණින් යුත් සම්මාසම්බුදු රජුන් පිරිනිවි කල්හි, එ කෙණෙහි මහත් බිහිසුනු පොළෝ සැලීමෙක් විය. එ කෙණෙහි මහත් ලොමුදහ ගැන්මෙක් විය."

111. එහි නොපහ වූ රාගය ඇති යම් මහණ කෙනෙක් වූහු ද, ඔහු භගවත් බුදුරජුන් පිරිනිවි කල්හි, "භාග්‍යවතුන් වහන්සේ ඉතා යුහු වැ පිරිනිවි සේක! සුගතයන් වහන්සේ ඉතා යුහු වැ පිරිනිවි සේක!! ලොවේ ඇස ඉතා යුහු වැ අතුරුදහන් වී යැ!!!" යි ඇතැම් කෙනෙක් දෙහොත් හුවා හඬත්, මැදින් බිඳී වැටුණුවුන් සේ වැටෙත්. (පෙරළෙන්නාහු) වැටුණ තැනට ම පෙරළී එත්, වැටුණු තැනින් ඔබ්බට ද පෙරළී යෙත්. යම් මහණ කෙනෙක් පහ වූ රාග ඇත්තාහු ද, ඔහු එළැඹැවූ සිහි ඇත්තාහු නුවණින් සලකන්නාහු, 'සංස්කාරයෝ අනිත්‍යහ. ඔවුන් නොනැසෙන ඛවෙක් කොයින් ලැබෙන්නේ ද' යි සලකන්නෝ ඉවසත්.

112. ඉක්බිති අනුරුත් තෙරණුවෝ භික්ෂූන් අමතා, "ඇවැත්නි, හැඬුමෙන් වැඩෙක් නැත. නො ම සොව්වූ. නො ම වැලැපෙවූ. ප්‍රිය මනාප හැම දෑයෙන් ඉවත් වීම, වෙන් වීම, අන් සැටියෙකින් වීම යන මෙය කල් තබා ම භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදුයේ නො වේ ද? ඇවැත්නි, යමෙක් උපන්නේ ද, වූයේ ද පසයෙන් සකස් වූයේ ද, නැසෙන සුලු ද, එය නො නැසේ ව' යි යන්න කොයින් ලැබෙන්නේ ද? මේ කරුණ අවිද්‍යමාන ය. ඇවැත්නි, දේවතාවෝ ද තොප හැඬුමට දෙස් කියත්" යී වදළාහ.

"වහන්ස, අනුරුත් තෙරුනි, ඔබ කෙසේ වූ දේවතා කෙනකු මෙනෙහි කරත් ද?" යි අනඳ තෙරණුවෝ පුළුවුත්හ. "ඇවැත් අනඳයිනි, අහ සැ පොළොවැ යි සංඥා ඇති දේවතා කෙනෙක් ඇත. ඔහු 'භාග්‍යවතුන් වහන්සේ ඉතා වහා පිරිනිවි සේකැ යි, සුගතයන් වහන්සේ ඉතා වහා පිරිනිවි සේකයි, ලොවැ ඇස ඉතා වහා අතුරු දහන් වී යැ' යි කෙහෙ මුදු වැලැපෙත්. හිසැ අත් හුවා වැලැපෙත්. මැදින් බිඳුණුවුන් සේ ඇද වැටෙත්. බිමැ පෙරළෙන්නාහු වැටී හොත් තැනට ම පෙරළී එත්, වැටී හොත් තැනින් ඔබ්බට ද පෙරළී යෙත්. අනඳයෙනි, පොළොවෙහි පොළොවැ යි සංඥ ඇති දේවතා කෙනෙක් ඇත. ඔහු " . . අතුරුදහන් වී යැ" යි කෙස් මුදු වැලැපෙත්. යම් දේවතා කෙනෙක් පහ වූ රාග ඇත්තෝ ද (අනාගාමී හෝ රහත් වූ වෝ ද), ඔහු "සංස්කාරයෝ අනිත්‍යහ, (ඔහු නො නැසෙත් යන) එය මෙහි කොයින් ලැබේ ද?" යි එළැඹැවූ සිහි ඇත්තාහු, නුවණින් දන්නාහු ඉවසත්.

Free Distribution www.aathaapi.org

113. අථ ඛෝ ආයස්මා ච අනුරුද්ධෝ ආයස්මා ච ආනන්දෝ තං රත්තිංවසයසං ධම්මියා කථාය වීතිනාමෙසුං. අථ ඛෝ ආයස්මා අනුරුද්ධෝ ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: ගච්ඡාවුසෝ ආනන්ද කුසිනාරං. කුසිනාරං පවිසිත්වා කොසිනාරකානං මල්ලානං ආරොචෙහි: 'පරිනිබ්බුතෝ වාසිට්ඨා භගවා, යස්ස'දානි කාලං මඤ්ඤථා'ති. එවම්භන්තෙ ති ඛෝ ආයස්මා ආනන්දෝ ආයස්මතෝ අනුරුද්ධස්ස පටිස්සුත්වා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය අත්තතියෝ කුසිනාරං පාවිසි. තෙන ඛෝ පන සමයෙන කොසිනාරකා මල්ලා සන්ථාගාරෙ සන්නිපතිතා හොන්ති තෙනෙව කරණීයෙන. අථ ඛෝ ආයස්මා ආනන්දෝ යෙන කොසිනාරකානං මල්ලානං සන්ථාගාරං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා කොසිනාරකානං මල්ලානං ආරොචෙසි: "පරිනිබ්බුතෝ වාසිට්ඨා භගවා, යස්ස'දානි කාලං මඤ්ඤථා"ති. ඉදමායස්මතෝ ආනන්දස්ස වචනං සුත්වා මල්ලා ච මල්ලපුත්තා ච මල්ලසුණිසා ච මල්ලපජාපතියෝ ච අසාචිනෝ දුම්මනා චෙතෝ දුක්ඛසමපිතා අපෙපකච්චෙව කෙසෙ පකිරිය කන්දන්ති, බාහා පග්ගය්හ කන්දන්ති, ඡින්නපාතං පතන්ති ආවට්ටන්ති විවට්ටන්ති අතිඛිපං භගවා පරිනිබ්බුතෝ, අතිඛිපං සුගතෝ පරිනිබ්බුතෝ, අතිඛිපං චක්ඛු ලොකෙ අන්තරහිතන්ති."

114. අථ ඛෝ කොසිනාරකා මල්ලා පුරිසෙ ආණාපෙසුං "තෙනහි භණෙ කුසිනාරායං ගන්ධමාලඤ්ච සබ්බඤ්ච තාළාවචරං සන්නිපාතෙථා"ති. අථ ඛෝ කොසිනාරකා මල්ලා ගන්ධමාලඤ්ච සබ්බඤ්ච තාළාවචරං පඤ්ච ච දුස්සයුගසතානි ආදාය යෙන උපවත්තනං මල්ලානං සාලවනං යෙන භගවතෝ සරීරං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතෝ සරීරං නච්චෙහි ගීතෙහි වාදිතෙහි මාලෙහි ගන්ධෙහි සක්කරොන්තා ගරුකරොන්තා මානෙන්තා පූජෙන්තා චෙලවිතානානි කරොන්තා මණ්ඩලමාළෙ පටියාදෙන්තා 'එකදිවසං වීතිනාමෙසුං. අථ ඛෝ කොසිනාරකානං මල්ලානං එතදහොසි. 'අතිච්ඡාලො ඛෝ අජ්ජ භගවතෝ සරීරං ඣාපෙතුං, සෙවදානි මයං භගවතෝ සරීරං ඣාපෙපසාමා"ති. අථ ඛෝ කොසිනාරකා මල්ලා භගවතෝ සරීරං නච්චෙහි ගීතෙහි වාදිතෙහි මාලෙහි ගන්ධෙහි සක්කරොන්තා ගරුකරොන්තා මානෙන්තා පූජෙන්තා චෙලවිතානානි කරොන්තා මණ්ඩලමාළෙ පටියාදෙන්තා දුතියම්පි දිවසං වීතිනාමෙසුං, තතියම්පි දිවසං වීතිනාමෙසුං, චතුත්ථම්පි දිවසං වීතිනාමෙසුං, පඤ්චමම්පි දිවසං වීතිනාමෙසුං, ඡට්ඨම්පි දිවසං වීතිනාමෙසුං අථ ඛෝ සත්තමං දිවසං කොසිනාරකානං මල්ලානං එතදහොසි: මයං භගවතෝ සරීරං නච්චෙහි ගීතෙහි වාදිතෙහි මාලෙහි ගන්ධෙහි සක්කරොන්තා ගරුකරොන්තා මානෙන්තා පූජෙන්තා, දක්ඛිණෙන දක්ඛිණං නගරස්ස හරිත්වා බාහිරෙන බාහිරං දක්ඛිණතෝ නගරස්ස භගවතෝ සරීරං ඣාපෙපසාමා'ති.

Free Distribution www.aathaapi.org

113. එ කල්හි අනුරුත් තෙරණුවෝ ද අනඳ තෙරණුවෝ ද ඒ රැය ඉතිරි කොටස දැහැමි කතායෙන් ගෙවූහ. ඉක්බිති අනුරුත් තෙරණුවෝ අනඳ තෙරුන් අමතා, ''ඇවැත්නි, අනඳයෙනි, කුසිනාරාවට යන්න. කුසිනාරාවට වැද, ''වාසිෂ්ඨයිනි, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි සේක. එහි යම් ගමනකට අදහස් කරවු ද එයට (දැන් කාලය වේ යැ යි) කාලය දනිවු'' යැ යි කුසිනාරාවාසී මල්ල රජුනට සැළ කරවු'' යැයි වදළාහ. 'එසේ යැ වහන්සැ' යි ම අනඳ තෙරණුවෝ අනුරුත් තෙරුනට පිළිවදන් දී, පෙරවරුයෙහි හැඳ පෙරෙවූ පාසිවුරු ගෙන, තමා දෙවැනි කොටැකි වැ, කුසිනාරාවට පිවිසියාහ. එ සමයෙහි කුසිනාරා වැසි මල්ලයෝ ඒ කටයුත්තෙන් ම සන්ථාගාරයෙහි රැස්වූවාහු වෙත්. එ කලැ අනඳ තෙරණුවෝ කුසිනාරා වැසි මල්ලයන් ගේ සන්ථාගාරය කරා එළැඹියාහ. එළැඹ ඔවුනට 'වාසිෂ්ඨයෙනි, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි සේක. එහි යම් ගමනකට අදහස් කරවු නම් එයට කල් දනිවු'' යැ යි සැළ කළාහ. අනඳ තෙරුන්ගේ මේ වචන අසා, මල්ල රජහු ද, මල්ල රජුන් පුත්තු ද, මල්ල රජුන් ලෙහෙළියෝ ද, මල්ල රජුන් බිරියෝ ද, දුක් ඇත්තාහු දෙමනස් ඇත්තාහු, සිත්හි උපන් දුකින් යුක්ත වූවාහු, ''ඉතා වහා භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි සේක! ඉතා වහා සුගතයන් වහන්සේ පිරිනිවි සේක!! ඉතා වහා ලොවැ ඇස අතුරුදහන් වී යැ!!!'' යි ඇතැම් කෙනෙක් කෙහෙ මුදු හඬත්, ඇතැම් කෙනෙක් දෙහොත් හුවා හඬත්, ඇතැම් කෙනෙක් මැදින් බිඳුණුවුන් සේ ඇද වැටෙත්, වැටී හොත් තැනට පෙරළී එත්, වැටී හොත් තැනින් ඔබ්බට පෙරළී යෙත්.

114. එයට පසු කුසිනාරා වාසී මල්ලයෝ පුරුෂයන් බණවා ''සගයෙනි, එසේ වී නම් තෙපි කුසිනාරායෙහි සුවඳ දෑ හා මල් ද සියලු තූර්‍ය්‍ය-භාණ්ඩ ද රැස්කරවු යැ'' යි ඇණැවූහ. ඉක්බිති කුසිනාරා පුරවැසි මල්ලයෝ සුවඳ ද මල් ද සියලු තූර්‍ය්‍ය භාණ්ඩ ද කාසික වස්ත්‍ර යුගල පන්සියයක් ද ගෙන මල්ලයන් ගේ උපවර්තන සල් උයන යම් තැනෙක ද, භගවත් බුදුරජුන්ගේ ශ්‍රී දෙහය යම් තැනෙක ද, එ තැනට එළැඹියාහ. එළැඹ, භගවත් බුදුරජුන්ගේ සිරි සිරුරට නැටුමින් ගීයෙන් වැයුමෙන් මලින් සුවඳින් සත්කාර කරන්නාහු, ගෞරව කරන්නාහු, බුහුමන් කරන්නාහු, පූජා කරන්නාහු මහඟු වතින් වියන් බඳනාහු, මඩුලුමල් පිළියෙල කරන්නාහු එක් දවසක් ගෙවූහ. ඉක්බිති කුසිනාරා වැසි මල්ලයනට 'අද භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රී දේහය ආදහන කරන්නට ඉතා නො කල් ය. සෙට දවසැ අපි භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රී දේහය ආදහන කරන්නමු'' යි මේ සිත විය. එයට පසු කුසිනාරා වැසි මල්ලයෝ භගවත් බුදුරජුන් සිරි සිරුරට නැටුම් ගැයුම් වැයුම් මල් සුවඳ යන මෙයින් සත්කාර ගරුකාර කරන්නාහු, බුහුමන් කරන්නාහු, පූජා කරන්නාහු, මහඟු වතින් වියන් බඳනාහු, මඩුලුමල් පිළියෙල කරන්නාහු, දෙවෙනි දවස ද ගෙවූහ, තෙවෙනි දවස ද ගෙවූහ, සතරවැනි දවස ද ගෙවූහ, පස්වැනි දවස ද ගෙවූහ, සවැනි දවස ද ගෙවූහ. ඉක්බිති සත්වැනි දවසෙහි කුසිනාරා වැසි මල්ලයනට ''අපි භාග්‍යවතුන් වහන්සේගේ සිරි සිරුර නැටුම් ගී වැයුම් මල් සුවඳ යන මෙයින් සත්කාර ගරුකාර මානන පූජන කරන්නමෝ, නුවර දකුණු දෙසින් දකුණු දිගට වැඩම කරවා, (ඇතුළු නුවරට නො පිවිස්වා) නුවර බැහැරින් ම බැහැරට පමුණුවා, නුවරට දකුණු දිග්හි දී ආදහන කරන්නමු'' යි මේ සිත විය.

Free Distribution www.aathaapi.org

115. තෙන ඛො පන සමයෙන අටඨ මල්ලපාමොක්ඛා සීසං නහාතා අහතානි වත්ථානි නිවත්ථා 'මයං භගවතො සරීරං උච්චාරෙස්සාමා'ති නාසක්ඛිංසූති උච්චාරෙතුං. අථ ඛො කොසිනාරකා මල්ලා ආයස්මන්තං අනුරුද්ධං එතදවොචුං: කො නු ඛො භන්තෙ අනුරුද්ධ හෙතු කො පච්චයො යෙනිමෙ අට්ඨ මල්ලපාමොක්ඛා සීසං නහාතා අහතානි වත්ථානි නිවත්ථා 'මයං භගවතො සරීරං උච්චාරෙස්සාමා'ති න සක්ඛිංසූති උච්චාරෙතුන්ති?'' ''අත්ථදත්ථා ඛො වාසිට්ඨා තුම්හාකං අධිපපායො, අත්ථදත්ථා දෙවතානං අධිපපායො''ති.'' ''කථං පන භන්තෙ දෙවතානං අධිපපායො''ති. ''තුම්හාකං ඛො වාසිට්ඨා අධිපපායො: ''මයං භගවතො සරීරං නච්චෙහි ගීතෙහි වාදිතෙහි මාලෙහි ගන්ධෙහි සක්කරොන්තා ගරුකරොන්තා මානෙන්තා පූජෙන්තා දක්ඛිණෙන දක්ඛිණං නගරස්ස හරිත්වා, බාහිරෙන බාහිරං දක්ඛිණතො නගරස්ස භගවතො සරීරං ඣාපෙස්සාමා''ති. දෙවතානං ඛො වාසිට්ඨා අධිපපායො ''මයං භගවතො සරීරං දිබ්බෙහි නච්චෙහි ගීතෙහි වාදිතෙහි මාලෙහි ගන්ධෙහි සක්කරොන්තා ගරුකරොන්තා මානෙන්තා පූජෙන්තා, උත්තරෙන උත්තරං නගරස්ස හරිත්වා, උත්තරෙන වාරෙන නගරං පවෙසෙත්වා, මජ්ඣෙන මජ්ඣං නගරස්ස හරිත්වා, පුරත්ථිමෙන වාරෙන නික්ඛාමෙත්වා, පුරත්ථිමතො නගරස්ස මකුටබන්ධනං නාම මල්ලානං චෙතියං, එත්ථ භගවතො සරීරං ඣාපෙස්සාමා''ති. ''යථා භන්තෙ දෙවතානං අධිපපායො, තථා හොතූ''ති.

116. තෙන ඛො පන සමයෙන කුසිනාරා යාව සන්ධිසමලසංකටීරා ජණුස්සොණිපරියන්තා ඔධිනා මන්දාරවපුප්ඵෙහි සන්ථතා හොති අථ ඛො දෙවතා ච කොසිනාරකා ච මල්ලා භගවතො සරීරං දිබ්බෙහි ච මානුසකෙහි ච නච්චෙහි ගීතෙහි වාදිතෙහි මාලෙහි ගන්ධෙහි සක්කරොන්තා ගරුකරොන්තා මානෙන්තා පූජෙන්තා, උත්තරෙන උත්තරං නගරස්ස හරිත්වා උත්තරෙන වාරෙන නගරං පවෙසෙත්වා, මජ්ඣෙන මජ්ඣං නගරස්ස හරිත්වා, පුරත්ථිමෙන වාරෙන නික්ඛමිත්වා, පුරත්ථිමතො නගරස්ස මකුටබන්ධනං නාම මල්ලානං චෙතියං,[1] තත්ථ භගවතො සරීරං නිකඛිපිංසු.

1. උත්තරෙණ දවාරෙණ නගරා නිෂ්ක්‍රම්‍ය නදීං හිරණ්‍යවතීං උපසඞ්ක්‍රම්‍ය මුකුටබන්ධනෙ චෛත්‍යෙ (සඞ්ඝභේදවස්තු මහාපරිනිර්වාණසූත්‍රාන්ත)

Free Distribution www.aathaapi.org

115. එ සමයෙහි පාමොක් මල්ල රජුහු අට දෙනෙක් ඉස් සෝදා නා අළුත් වස්ත්‍ර හැඳගත්තාහු, ''අපි භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රී දේහය ඔසොවා ගෙන යන්නමිහ' යි තැත් කරන්නාහු ද එය ඔසොවන්නට නො හැකි වෙත්. එ විට කුසිනාරා වැසි මල්ලයෝ 'වහන්ස, අනුරුද්ධ-යෙනි, මේ පාමොක් මල්ලයෝ අට දෙන හිස් සෝදා නා අළුත් වත් හැඳ ''අපි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී දේහය ඔසොවන්නමු' යි තැත් කරන්නාහු එය ඔසොවන්නට යම් හෙයෙකින් නො හැකි වෙත් ද, එයට හේතුව කවර යැ? එයට ප්‍රත්‍යයය කවර යැ?'' යි අනුරුත් තෙරුන් විවාළාහ. ''වාසිෂ්ඨයෙනි, තොප අදහස අන් සැටියෙක. දෙවියන් අදහස අන් සැටියෙකැ'' යි අනුරුත් තෙරණුවෝ වදළහ. ''වහන්ස, දෙවියන් අදහස කෙසේද?''යි මල්ලයෝ විවාළාහ. වාසිෂ්ඨයෙනි, 'අපි භාග්‍යවතුන් වහන්සේ ගේ සිරි සිරුර නැටුම් ගී වැයුම් මල් සුවඳ යන මෙයින් සත්කාර ගුරුකාර බහුමාන පූජා කෙරෙමින් නුවර දකුණු දෙසින් දකුණු දිගට වැඩම කරවා නුවර බැහැරින් ම බැහැරට පමුණුවා නුවරට දකුණු දිග්හි දී ආදහන කරන්නමු' යි තොප අදහස ය. ''අපි භාග්‍යවතුන් වහන්සේ ගේ සිරි සිරුර දෙව් නැටුමින් දෙව් ගැයුමින්, දෙව් මලින් දෙව් සුවඳින් සත්කාර ගුරුකාර බහුමාන පූජනා කෙරෙමින් නුවර උතුරින් උතුරු දිගට වැඩම කරවා, උතුරු දෙරින් නුවරට පිවිස්වා, නුවරට මැදින් නුවර මැදට පමුණුවා, නැගෙනහිර දිගැ දෙරින් පිටතට වැඩම කරවා, නුවරට පෙරදිගැ මල්ලයන් ගේ **මුකුට බන්ධන** නම් යම් සෑයෙක් ඇද්ද, එහි ආදහනය කරන්නමිහ' යනු දේවතාවන් ගේ අදහස යැ'' යි අනුරුත් තෙරණුවෝ වදළාහ. ''වහන්ස, දේවතාවන්ගේ අදහස යම්සේ ද එසේ වේ වා'' යි මල්ලයෝ කීහ.

116. එ සමයෙහි වනාහි කුසිනාරා නුවර ගෘහසන්ධි ද වැසිකිළි කාණු ද කැලිකසළ දමන තැන් ද දක්වා ම දනක් පමණ බහල කොට මදුරා මලින් අතුරන ලද්දේ විය. ඉක්බිති දෙවියෝ ද කුසිනාරා පුර මල්ල රජදරුවෝ ද භගවත් බුදු රජුන්ගේ ශ්‍රී ශරීරය දිව්‍ය වූ ද මානුෂක වූ ද නැටුමෙන් ගැයුමෙන් වැයුමෙන් මලින් සුවඳින් සත්කාර කරන්නාහු, ගෞරව කරන්නාහු, බුහුමන් කරන්නාහු, පුදන්නාහු නුවර උතුරින් උතුරු දිගට වැඩම කරවා, උතුරු වහසල් දෙරින් නුවරට පිවිස්වා, නුවර මැදින් නුවර මැදට පමුණුවා පෙරදිගැ වහසල් දෙරින් පිටතට වැඩම කරවා, නුවරට පෙර දිගැ වූ මල්ල රජුන්ගේ මුකුටබන්ධන නම් යම් සෑයෙක් (මංගල ශාලාවෙක්) වී ද එහි *තැන් පත් කළා හ.*

Free Distribution www.aathaapi.org

117. අථ ඛො කොසිනාරකා මල්ලා ආයස්මන්තං ආනන්දං එතදවොචුං: "කථං මයං භන්තෙ ආනන්ද තථාගතස්ස සරීරෙ පටිපජ්ජාමා?"ති. "යථා ඛො වාසිට්ඨා රඤ්ඤො චක්කවත්තිස්ස සරීරෙ පටිපජ්ජන්ති, එවං තථාගතස්ස සරීරෙ පටිපජ්ජිතබ්බන්ති." "කථං පන භන්තෙ ආනන්ද රඤ්ඤො චක්කවත්තිස්ස සරීරෙ පටිපජ්ජන්ති"ති. "රඤ්ඤො වාසිට්ඨා චක්කවත්තිස්ස සරීරං අහතෙන වත්ථෙන වෙඨෙන්ති, අහතෙන වත්ථෙන වෙඨෙත්වා විහතෙන කප්පාසෙන වෙඨෙන්ති. විහතෙන කප්පාසෙන වෙඨෙත්වා අහතෙන වත්ථෙන වෙඨෙන්ති. එතෙන උපායෙන පඤ්චහි යුගසතෙහි රඤ්ඤො චක්කවත්තිස්ස සරීරං වෙඨෙත්වා ආයසාය තෙලදෙණියා පකබ්පිත්වා අඤ්ඤිස්සා ආයසාය දෙණියා පටිකුජ්ජෙත්වා, සබ්බගන්ධානං චිතකං කරිත්වා රඤ්ඤො චක්කවත්තිස්ස සරීරං ඣාපෙන්ති. චාතුම්මහාපථෙ රඤ්ඤො චක්කවත්තිස්ස ථූපං කරොන්ති. එවං ඛො වාසිට්ඨා රඤ්ඤො චක්කවත්තිස්ස සරීරෙ පටිපජ්ජන්ති. යථා ඛො වාසිට්ඨා රඤ්ඤො චක්කවත්තිස්ස සරීරෙ පටිපජ්ජන්ති, එවං තථාගතස්ස සරීරෙ පටිපජ්ජිතබ්බං. චාතුම්මහාපථෙ තථාගතස්ස ථූපො කාතබ්බො. තත්ථ යෙ මාලං වා ගන්ධං වා චූණ්ණකං වා ආරොපෙස්සන්ති වා අභිවාදෙස්සන්ති වා චිත්තං වා පසාදෙස්සන්ති, තෙසන්තං භවිස්සති දීඝරත්තං හිතාය සුඛායා"ති.

අථ ඛො කොසිනාරකා මල්ලා පුරිසෙ ආණාපෙසුං "තෙන හි භණෙ මල්ලානං විහතං කප්පාසං සන්නිපාතෙථා"ති. අථ ඛො කොසිනාරකා මල්ලා භගවතො සරීරං අහතෙන වත්ථෙන වෙඨෙසුං. අහතෙන වත්ථෙන වෙඨෙත්වා විහතෙන කප්පාසෙන වෙඨෙසුං. විහතෙන කප්පාසෙන වෙඨෙත්වා අහතෙන වත්ථෙන වෙඨෙසුං. එතෙන උපායෙන පඤ්චහි යුගසතෙහි භගවතො සරීරං වෙඨෙත්වා ආයසාය තෙලදෙණියා පකබ්පිත්වා[1] අඤ්ඤිස්සා ආයසාය දෙණියා පටිකුජ්ජෙත්වා සබ්බගන්ධානං චිතකං කරිත්වා භගවතො සරීරං චිතකං ආරොපෙසුං.

මහාකස්සපාගමනං.

118. තෙන ඛො පන සමයෙන ආයස්මා මහාකස්සපො පාවාය කුසිනාරං අද්ධානමග්ගප්පටිපන්නො හොති මහතා භික්ඛුසඞ්ඝෙන සඞ්ං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි. අථ ඛො ආයස්මා මහාකස්සපො මග්ගා ඔක්කම්ම අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො ආජීවකො[2] කුසිනාරාය මන්දරවපුප්ඵං ගහෙත්වා පාවං අද්ධානමග්ගප්පටිපන්නො හොති. අද්දසා ඛො ආයස්මා මහාකස්සපො තං ආජීවකං දූරතො'ව ආගච්ඡන්තං. දිස්වා තං ආජීවකං එතදවොච: 'අපාවුසො අමහාකං සත්ථාරං ජානාසි?'ති. ආම ආවුසො ජානාමි.

1. සුවණ්ද්‍රොණ්‍යාං නිධාය තෙලෙන පූරයිත්වා තාං සුවණ්ද්‍රොණිං උත්ථාප්‍ය දවතීයස්‍යාං මහාද්‍රොණ්‍යාං ප්‍රක්ෂිප්‍ය (සබ්බත්ථිවාදිතං මහාපරිනිබ්බානසුත්තෙ)

Free Distribution www.aathaapi.org

117. ඉක්බිති කුසිනාරා පුර මල්ල රජුහු "අනඳ තෙරුන් වහන්ස, කෙසේ අපි තථාගතයන් වහන්සේගේ සිරි සිරුරෙහි පිළිපදිමු ද?" යි අනඳ තෙරුන් විචාළාහ. "වාසිෂ්ඨයෙනි, සක්විති රජුගේ සිරුරෙහි යම් සේ පිළිපදිත් ද, තථාගතයන් වහන්සේගේ සිරි සිරුරෙහි ද එසේ ම පිළිපැදියැ යුතු" යැ යි අනඳ තෙරුණුවෝ වදළාහ. 'අනඳ තෙරුන් වහන්ස, සක්විති රජුගේ සිරුරෙහි කෙසේ පිළිපදිත් ද?' යි මල්ල රජුහු විචාළාහ. "වාසිෂ්ඨයිනි, සක්විත්තහු ගේ සිරුර අළුත් වතින් වෙළත්. අළුත් වතින් වෙළා, මොනොවට නහා පැදූ කපුපුළුනින් වෙළත්. නහා පැදූ කපුපුළුනින් වෙළා (යළි) අළුත් වතින් වෙළත්. මේ නයින් යුගල පන් සියෙකින් සක්විති රජුගේ සිරුර වෙළා, රන්මුවා තෙල් දෙණෙක බහා අන් රන්මුවා දෙණෙකින් වසා, සියලු වගයේ සුවඳ දරින් දර සැයක් තනා, සක්විති රජුගේ සිරුර දවත්. සිවුමං හන්දියෙක සක්විති රජුට (ඔහු සිරුර ඉතිරි වූ අලු ඇ නිදන් කොට) ස්තූපයක් නංවත්. වාසිෂ්ඨයෙනි, සක්විති රජුගේ සිරුරෙහි මෙසේ පිළිපදිත්. වාසිෂ්ඨයෙනි, සක්විති රජුගේ සිරුරෙහි යම් සේ පිළිපදිත් ද, එසේම තථාගතයන් වහන්සේගේ ශ්‍රී දෙහයෙහි ද පිළිපැද්ද යුතු. සිවුමං හන්දියෙකැ තථාගතයන් වහන්සේට (ඔබ ශාරීරික ධාතූන් නිදහන් කොට ස්තූපයක් කළ මනා ය. එහි යම් කෙනෙක් මල් හෝ සුවඳ හෝ . . . නහන්නාහු (පුදන්නාහු) හෝ වෙත් ද, ආදරයෙන් වඳින්නාහු හෝ වෙත් ද, සිත පහදවන්නාහු හෝ වෙත් ද, එය ඔවුනට බොහෝ කල් වැඩ පිණිස සුව පිණිස වන්නේ යැ" යි අනඳ තෙරණුවෝ වදළාහ.

ඉක්බිති කුසිනාරා පුර වැසි මල්ල රජුහු පුරුෂයන් ඛණවා 'එසේ නම් සඟයිනි, මල්ල රටැ ඇති නහා පාදන ලද කපුපුළුන් එක් තැන් කරවු' යැ යි ඇණැවූහ. එයට පසු කුසිනාරා පුර වැසි මල්ල රජුහු භගවත් බුදුරජුන් සිරි සිරුර අළුත් වතින් වෙළූහ. අළුත් වතින් වෙළා නහා පාදන ලද කපු පුළුනෙන් වෙළූහ. නහා පාදන ලද කපු පුළුනෙන් වෙළා, නවමු වතින් යලි වෙළූහ. මෙ නයින් යුගල පන්සියෙකින් භගවත් බුදුරජුන් සිරි සිරුර වෙළා, රන්මුවා තෙල් දෙණෙකැ බහා අන් රන්මුවා දෙණෙකින් වසා සියලු වගයේ සුවඳ දරින් චිතකයක් කොට, භගවත් බුදුරජුන්ගේ ශ්‍රී දෙහය එයට නැඟුහ.

මහසුප් තෙරුන් වැඩම කිරීම

118. එ සමයෙහි වූ කලි මහසුප් තෙරණුවෝ පාවා නුවරින් කුසිනාරාව බලා පන්සියක් පමණ වූ මහ බික්ඛු සඟන කැටුවැ දික් මඟට පිළිපන්නාහු වෙත්. එ කලැ මහසුප් තෙරණුවෝ මහ මඟින් ඉවත් වැ, එක්තරා රුකක් මුලැ වැඩ හුන්හ. එ සමයෙහි එක්තරා ආජීවකයෙක් කුසිනාරා නුවරින් මදරා මලක් ගෙන පාවා නුවර බලා අදන් මහට පිළිපන්නේ වෙයි. මහසුප් මහතෙරණුවෝ දුරැ ම එන ඒ ආජීවකයා දුටූහු. දැක 'ඇවැත්නි, අප ශාස්තෘන් වහන්සේ දනිවු ද" යි විචාළාහ. "එසේ ය, ඇවැත්නි, දනිමි.

Free Distribution www.aathaapi.org

අජ්ජ සත්තාහපරිනිබ්බුතො සමණො ගොතමො. තතො මෙ ඉදං මන්දාරවපුප්ඵං ගහිතන්ති''. තත්ථ යෙ තෙ භික්ඛු අවීතරාගා අපෙකවෙව බාහා පග්ගය්හ කන්දන්ති, ඡින්නපාතං පතන්ති, ආවට්ටන්ති විවට්ටන්ති: අතිබිප්පං භගවා පරිනිබ්බුතො, අතිබිප්පං සුගතො පරිනිබ්බුතො, අතිබිප්පං චක්ඛු ලොකෙ[3] අන්තරහිතන්ති, යෙ පන තෙ භික්ඛු වීතරාගා, තෙ සතා සම්පජානා අධිවාසෙන්ති: අනිච්චා සඞ්ඛාරා, තං කුතෙත්ථ ලබ්භා'ති.

119. තෙන ඛො පන සමයෙන සුභද්දො නාම බුඩ්ඪබ්බජිතො' තස්සං පරිසායං නිසින්නො හොති. අථ ඛො සුභද්දො බුඩ්ඪපබ්බජිතො තෙ භික්ඛු එදතවොච:'' අලං ආවුසො මා සොච්ත්ථ, මා පරිදෙව්ත්ථ. සුමුත්තා මයං තෙන මහාසමණෙන. උපද්දුතා ච හොම ඉදං වො කප්පති, ඉදං වො න කප්පතී ති. ඉදානි පන මයං යං ඉච්ඡිස්සාම තං කරිස්සාම, යං න ඉච්ඡිස්සාම න තං කරිස්සාමා''ති. අථ ඛො ආයස්මා මහාකස්සපො භික්ඛූ ආමන්තෙසි: 'අලං ආවුසො මා සොච්ත්ථ, මා පරිදෙව්ත්ථ. නනු එතං ආවුසො භගවතා පටිගච්චෙ ච අක්ඛාතං: සබ්බෙහෙව පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො අඤ්ඤථාභාවො. තං කුතෙත්ථ ආවුසො ලබ්භා යන්තං ජාතං භූතං සඞ්ඛතං පලොකධම්මං, තං තථාගතස්සාපි සරීරං මා පලුජ්ජීති නෙතං ඨානං විජ්ජතී''ති.

120. තෙන ඛො පන සමයෙන චත්තාරො මල්ලපාමොක්ඛා සීසං නහාතා අහතානි වත්ථානි නිවත්ථා මයං භගවතො චිතකං ආලිම්පෙස්සාමාති න සක්කොන්ති ආලිම්පෙතුං. අථ ඛො කොසිනාරකා මල්ලා ආයස්මන්තං අනුරුද්ධං එතදවොචුං: කො නු ඛො භන්තෙ අනුරුද්ධ හෙතු, කො පච්චයො, යෙනිමෙ චත්තාරො මල්ලපාමොක්ඛා සීසං නහාතා අහතානි වත්ථානි නිවත්ථා මයං භගවතො චිතකං ආලිම්පෙස්සාමාති න සක්කොන්ති ආලිම්පෙතුන්ති''? ''අඤ්ඤථා ඛො වාසිට්ඨා දෙවතානං අධිප්පායො''ති. ''කථං පන භන්තෙ දෙවතානං අධිප්පායො?''ති. ''දෙවතානං ඛො වාසිට්ඨා අධිප්පායො: අයං ආයස්මා මහාකස්සපො පාවාය කුසිනාරං අඩානමග්ගපටිපන්නො මහතා භික්ඛුසඞ්ඝෙන සඩ්ං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි. න තාව භගවතො චිතකො පජ්ජලිස්සති යාවායස්මා මහාකස්සපො භගවතො පාදෙ සිරසා න වන්දිස්සතී''ති. ''යථා භන්තෙ දෙවතානං අධිප්පායො තථා හොතු'' ති.

---

2. අථ බලු මාගෙ, න්‍යතරො නිර්ග්‍රන්ථ ශ්‍රාවකඃ මන්දාර පුෂ්පංආදය (සබ්බත්ථි වාදීන මහාපරිනිබ්බානසුත්තෙ)
4. චක්ඛුමා ලොකෙ අන්තරහිතො (මජ්ඣං) ලොකෙචක්ෂුරන්තර්හිතම් (සබ්බත්ථිවාදීනං මහාපරිනිබ්බානසුත්තෙ)
1. බුද්ධපබ්බජිතො (මජ්ඣං)

Free Distribution www.aathaapi.org

අදට මහණ ගොයුමාණෙන් පිරිනිවී සත් දවසක් ඇත්තෝ යැ. මා විසින් එ තැනින් මේ මදරා මල ගන්නා ලද යැ'' යි ආජීවක කී ය. එහි යම් අවීතරාග මහණ කෙනෙක් වූහු ද, ඔහු ''ඉතා වහා භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි සේක, ඉතා වහා සුගතයන් වහන්සේ පිරිනිවි සේක, ඉතා වහා ලොව ඇස අතුරුදහන් වියැ'' යි ඇතැම් කෙනෙක් දෝත් හුවා හඬත්, ඇතැම් කෙනෙක් මැදින් බුන් රුකක් සෙයින් ඇද වැටෙත්, හොත් තැනට පෙරළී එත් හොත් තැනින් ඔබ්බට පෙරළී යෙත්. යම් වීතරාග මහණ කෙනෙක් වූහු ද, ඔහු ' සංස්කාරයෝ අනිත්‍යහ. ඔහු නො නැසෙත් යන යමෙක් ඇද්ද, එය මෙහි කොයින් ලැබේ ද! ''යි එළැඹැවූ සිහි ඇත්තාහු, නුවණින් දන්නාහු ඉවසා සිටිත්.

119. එ සමයෙහි සුභද්‍ර නම් වූ මහළු කලැ පැවිදි වූයෙක් එ පිරිසැ හුන්නේ වෙයි. එ විටැ සුභද්‍ර මහළු පැවිදි තැන ඒ භික්ෂූනට ''ඇවැත්නි, කම් නැත. නහමක් සොව්වු, නහමක් වැලැපෙවු. අපි ඒ මහා ශ්‍රමණයා ගෙන් මොනොවට මිදුණෙමහ. 'මෙය තොපට කැප වෙයි, මෙය තොපට නො කැප වේ' යැ යි අපි ඔහුගෙන් උපද්‍රැතයෝ වමු. දැන් වනාහි යමක් අපි කැමැති වන්නමෝ ද, එය කරන්නමු, යමක් නො කැමැති වන්නමෝ ද, එය නො කරන්නමු'' යි කීය. එ කලැ මහසුප් තෙරණුවෝ භික්ෂූන් අමතා ''ඇවැත්නි, කම් නැත. නහමක් සොඳ්වු, නහමක් වැලැපෙවු. ඇවත්නි, ප්‍රිය මනාප හැම දැයින් ම ඉවත් වීම, වෙන් වීම, අන් සැටියෙකින් වීම යන යමෙක් ඇද්ද, මෙය කල් තබා ම භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දේ නො වේ ද? යමෙක් උපන්නේ ද, වූයේ ද, සැකැසුණේ ද, පලුදු වන සුලු ද, එසේ වූ තථාගතයන් වහන්සේ ගේ සිරුර ද පලුදු නො වේව' යි යන ඒ කරුණ කොයින් මෙහි ලැබෙන්නේ ද? මෙ කරුණ විද්‍යමාන නො වේ'' යැ යි වදළාහ.

120. එසමයෙහි පාමොක් මල්ල රජුහු සිවු දෙනෙක් හිස් සෝදා නා නවමු වත් හැඳ 'අපි භාග්‍යවතුන් වහන්සේගේ චිතකයට ගිනි අවුලුවන්නමහ' යි (යත්න කරන්නාහු ද) ගිනි අවුලුවන්නට නො හැකි වෙත්. එ විට කුසිනාරාවැසි මල්ල රජුහු 'වහන්ස, අනුරුත් තෙරුනි, මේ පාමොක් මල්ල රජුහු සතර දෙනා හිස් සෝදා නා නවමු වත් හැඳ 'අපි භාග්‍යවතුන් වහන්සේ ගේ චිතකයට ගිනි අවුලුවන්නමහ' යි යත්න කරන්නාහු ද, යම් හෙයෙකින් ගිනි අවුලුවන්නට නො හැකි වෙත් ද, ඒ හේතුව කවර යැ? ඒ ප්‍රත්‍යයය කවර යැ?'' යි අනුරුත් තෙරුන් විචාළාහ. ''වාසිෂ්ඨයෙනි, දේවතාවන්ගේ අදහස අන් පරිද්දෙකිනැ'' යි අනුරුත් තෙරණුවෝ වදළහ. ''වහන්ස, දේවතාවන් ගේ අදහස කෙසේ වේ ද?'' යි මල්ල රජුහු සූළුවුත්හ. ''වාසිෂ්ඨයෙනි, මේ මහසුප් තෙරණුවෝ පාවා නුවරින් නික්මැ කුසිනාරාව බලා පන්සියක් පමණ වූ මහ භික්ඝණා සමග අදන් මහ පිළිපන්හ. 'මහසුප් මහ තෙරණුවන් භාග්‍යවතුන් වහන්සේ ගේ සිරිපා නො වඳනා තාක් භාග්‍යවතුන් වහන්සේගේ චිතකය ගිනි නො ගනී වා' යනු දේවතාවන් ගේ අදහස වේ යැ'' යි අනුරුත් තෙරණුවෝ වදළාහ. ''වහන්ස දේවතාවන්ගේ අදහස යම් සේ ද, එසේ වේ වා'' යි මල්ල රජුහු කිහ.

Free Distribution www.aathaapi.org

121. අථ ඛො ආයස්මා මහාකස්සපො යෙන කුසිනාරා මකුට-බන්ධනං නාම මල්ලානං චෙතියං යෙන භගවතො චිතකො තෙනු-පසඞ්කමි. උපසඞ්කමිත්වා එකං සං චීවරං කත්වා අඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං චිතකං පදක්ඛිණං කත්වා, පාදතො විවරිත්වා භගවතො පාදෙ සිරසා වන්දි. තානි පි ඛො පඤ්ච භික්ඛුසතානි එකංසං චීවරං කත්වා අඤ්ජලිම්පණාමෙත්වා තික්ඛත්තුං චිතකං පදක්ඛිණං කත්වා භගවතො පාදෙ සිරසා වන්දිංසු. වන්දිතෙසු[1] ච පනායස්මතා මහා-කස්සපෙන තෙහි පි පඤ්චහි භික්ඛුසතෙහි, සයමෙව භගවතො චිතකො පජ්ජලි.

122. ඣායමානස්ස ඛො පන භගවතො සරීරස්ස, යං අහොසි ජවීති වා චම්මන්ති වා මංසන්ති වා නහරූ ති වා ලසිකා ති වා තස්ස නෙව ඡාරිකා පඤ්ඤායිත්ථ, න මසි. සාරීරානෙව අවසිස්සිංසු. සෙය්‍යථාපි නාම සපිස්ස වා තෙලස්ස වා ඣායමානස්ස නෙව ඡාරිකා පඤ්ඤායති න මසි, එවමෙව භගවතො සරීරස්ස ඣායමානස්ස යං අහොසි ජවීති වා චම්මන්ති වා මංසන්ති වා නහාරූති වා ලසිකාති වා තස්ස නෙව ඡාරිකා පඤ්ඤායිත්ථ'න මසි, සාරීරානෙව අවසිස්සිංසු. තෙසඤ්ච පඤ්චන්නං දුස්සයුගසතානං චෙව දුස්සානි න ඩයහිංසු යඤ්ච සබ්බබහන්තරිමං[2] යඤ්ච බාහිරං. දඩ්ඪ ච ඛො පන භගවතො සරීරෙ අන්තළිස්ඛා උදකධාරා පාතුභවිත්වා භගවතො චිතකං නිබ්බාපෙසි. උදකං සාලතො පි අබහුත්තමිත්වා භගවතො චිතකං නිබ්බාපෙසි. කොසිනාරකා පි මල්ලා සබ්බගන්ධොදකෙන භගවතො චිතකං නිබ්බාපෙසුං.

අථ ඛො කොසිනාරකා මල්ලා භගවතො සාරීරානි සත්තාහං සන්ථාගාරෙ සන්තිපඤ්ජරං කරිත්වා ධනුපාකාරං පරික්ඛිපාපෙත්වා නච්චෙහි ගීතෙහි වාදිතෙහි මාලෙහි ගන්ධෙහි සක්කරිංසු ගරුකරිංසු මානෙසුං පූජෙසුං.

සාරීරිකධාතුවිභජනා

122. අස්සොසි ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො: "භගවා කිර කුසිනාරායං පරිනිබ්බුතො"ති. අථ ඛො රාජා මාගධො: අජාසත්තු වෙදෙහිපුත්තො කොසිනාරතානං මල්ලානං දූතං පාහෙසි "භගවා පි ඛත්තියො අහම්පි ඛත්තියො. අහම්පි අරහාමි භගවතො සාරීරානං භාගං, අහම්පි භගවතො සාරීරානං ථූපඤ්ච මහඤ්ච කරිස්සාමි" ති.

1. වන්දිතෙ ච (මජසං PTS)
2. සබ්බබහන්තරිමං (මජසං) සබ්බං අබහන්තරිමං (PTS)

Free Distribution www.aathaapi.org

121. ඉක්බිත්තෙන් මහසුප් තෙරණුවෝ කුසිනාරා නුවරැ මුකුට බන්ධන නම් මල්ලයන් ගේ චෛත්‍යය යම් තැනෙක ද, භාග්‍යවතුන් වහන්සේ ගේ චිතකය යම් තැනෙක ද, එතැනට එළැඹියාහ. එළැඹ සිවුර එකස් කොට දෙහොත් නහා තුන් වටක් චිතකය පැදකුණු කොට, හිස් නමා භගවත් බුදු රජුන් ගේ සිරි පා වැන්දහ. ඒ පන්සියක් භික්ෂූහු ද සිවුර එකස් කොට දෙහොත් නහා තුන් වටක් චිතකය පැදකුණු කොට, හිස නමා භගවත් බුදුරජුන් ගේ සිරි පා වැන්දහ. මහසුප් තෙරුන් විසින්ද ඒ පන්සියක් භික්ෂූන් විසින් ද භාග්‍යවතුන් වහන්සේගේ සිරි පා වඳනා ලද කල්හි, භගවත් බුදුරජුන් ගේ චිතකය තෙමේ ම ගිනි ගත.

122. දැවෙන්නා වූ, භගවත් බුදුරජුන් සිරි සිරුර සිවියැ යි හෝ සමැ යි හෝ මසැ යි හෝ නහරැ යි හෝ සඳමිදුලුයැ යි යමෙක් වී ද, එහි අළු නො ම පැනිණ, දැලි ද නො ම පැනිණ. ශාරීරික ධාතුහු ම ඉතිරි වූහ. යම් සේ දැවෙන ගිතෙලැ හෝ තලතෙලැ අළුයෙක් නො ම පැනේ ද, දැලියෙක් නො ම පැනේ ද, එසේ ම දැවෙන; භගවත් බුදුරජුන් සිරි සිරුරැ සිවි යැ යි හෝ සමැ යි මසැ යි නහරැ යි හෝ සඳමිදුලු යැ යි යමෙක් වී ද, එහි අළු ද නො පැනිණ, දැලි ද නො පැනිණ, ශාරීරික ධාතුහු ම ඉතිරි වූහ. ඒ පන්සියක් වස්ත්‍ර යුගලයන් අතුරෙන් ද යම් වස්ත්‍රයෙක් හැමට යැටින් වී ද, යම් වස්ත්‍රයෙක් හැමට පිටින් වී ද, ඒ වස්ත්‍ර දෙක ම නො දැවිණ. භගවත් බුදුරජුන් සිරි සිරුර දවුණු කල්හි අහසින් දිය දහර පහළ වැ චිතකය නිවී ය. වටා සිටි සල් රුක් හි අතු පතරින් ද ජලය මතු වී චිතකය නිවී ය. කුසිනාරාවාසි මල්ල රජුහු ද හැම වර්ගයේ සුවඳ කැවු සුවඳ දියෙන් භගවත් බුදුරජුන් ගේ චිතකය නිවූහ.

ඉක්බිති කුසිනාරා වැසි මල්ල රජදරුවෝ සන්ථාගාරයේ අඩියැටි මැදිරියක් කොට දුනුපවුරක් වටා ලවා භගවත් බුදුරජුන්ගේ ශාරීරික ධාතූන් එහි තුළට වැඩම කරවා නැටුමෙන් ගීයෙන් වැයුමෙන් මලින් සුවඳින් සුරා සත් දිනක් ගරු කළහ, බුහුමන් කළහ, පිදූහ.

ශාරීරිකධාතූන් බෙදීම

122. වේදේහී පුත්‍ර වූ මගධාධිපති අජාසත් රජ 'භාග්‍යවතුන් වහන්සේ කුසිනාරාහි දී පිරිනිවි සේක් ලැ'යි ඇසී ය. එ කලැ වේදේහී පුත්‍ර මගධාධිපති අජාසත් රජ කුසිනාරා වැසි මල්ල රජදරුවනට ''භාග්‍යවතුන් වහන්සේ ද ක්ෂත්‍රිය වූ සේක. මම ද ක්ෂත්‍රියයෙකිමි. මම් ද භාග්‍යවතුන් වහන්සේ ගේ ශාරීරික ධාතූන් ගෙන් කොටසක් ලබන්නට සුදුස්සෙමි. මම් ද භාග්‍යවතුන් වහන්සේ ගේ ශාරීරික ධාතූන් පිණිස ස්තූපයක් ද පූජ උළෙලක් ද කරන්නෙමි'' යි කියා දූතයකු යැවී ය.

Free Distribution www.aathaapi.org

අසෙසාසුං බො වෙසාලිකා ලිච්ඡවී: 'භගවා කිර කුසිනාරායං පරිනිබ්බුතො'ති. අථ බො වෙසාලිකා ලිච්ඡවී කොසිනාරකානං මල්ලානං දූතං පාහෙසුං: "භගවා පි ඛත්තියො මයම්පි ඛත්තියා. මයම්පි අරහාම භගවතො සාරීරානං භාගං. මයම්පි භගවතො සාරීරානං ථූපඤ්ච මහඤ්ච කරිස්සාමා" ති.

අසෙසාසුං බො කාපිලවත්ථවා සක්යා: "භගවා කිර කුසිනාරායං පරිනිබ්බුතො"ති. අථ බො කාපිලවත්ථවා සක්යා කොසිනාරකානං මල්ලානං දූතං පාහෙසුං: "භගවා අම්හාකං ඤාතිසෙට්ඨො. මයම්පි අරහාම භගවතො සාරීරානං භාගං. මයම්පි භගවතො සාරීරානං ථූපඤ්ච මහඤ්ච කාරිස්සාමා"ති.

අසෙසාසුං බො අල්ලකප්පකා බුලයො "භගවා කිර කුසිනාරායං පරිනිබ්බුතො" ති. අථ බො අල්ලකප්පකා බුලයො කොසිනාරකානං මල්ලානං දූතං පාහෙසුං: "භගවා පි ඛත්තියො මයම්පි ඛත්තියා. මයම්පි අරහාම භගවතො සාරීරානං භාගං. මයම්පි භගවතො සාරීරානං ථූපඤ්ච මහඤ්ච කරිස්සාමා"ති.

අසෙසාසුං බො රාමගාමකා කොලියා "භගවා කිර කුසිනාරායං පරිනිබ්බුතො" ති. අථ බො රාමගාමකා කොලියා කොසිනාරකානං මල්ලානං දූතං පාහෙසුං: "භගවා පි ඛත්තියො, මයම්පි ඛත්තියා. මයම්පි අරහාම භගවතො සාරීරානං භාගං. මයම්පි භගවතො සාරීරානං ථූපඤ්ච මහඤ්ච කරිස්සාමා"ති.

අසෙසාසි බො වෙථදීපකො බ්‍රාහ්මණො: "භගවා කිර කුසිනාරායං පරිනිබ්බුතො"ති. අථ බො වෙථදීපකො බ්‍රාහ්මණො කොසිනාරකානං මල්ලානං දූතං පාහෙසි: "භගවා තු[1] ඛත්තියො. අහමසම්හි බ්‍රාහ්මණො, අහම්පි අරහාමි භගවතො සාරීරානං භාගං. අහම්පි භගවතො සාරීරානං ථූපඤ්ච මහඤ්ච කරිස්සාමී" ති.

1. භගවාපි (මජ්ඣං)

Free Distribution www.aathaapi.org

විසල් පුර වැසි ලිච්ඡවී රජදරුවෝ 'භාග්‍යවතුන්වහන්සේ කුසිනාරාහිදී පිරිනිවී සේක් ලැ' යි ඇසූහ. එ කලැ විසල් පුර වැසි ලිච්ඡවී රජුහු කුසිනාරා වැසි මල්ලයනට ''භාග්‍යවතුන් වහන්සේ ද ක්ෂත්‍රිය යෝ ය, අපි දු ක්ෂත්‍රිය-යම්හ. අපි දු භාග්‍යවතුන් වහන්සේ ගේ ශාරීරික ධාතුන් කොටසක් ලබන්-නට සුදුස්සම්හ. අපි දු භාග්‍යවතුන් වහන්සේ ගේ ශාරීරික ධාතුනට ස්තූපයක් ද කරන්නමු. පුද උළෙල ද කරන්නමු'' යි දූතයකු යැවූහ.

කිඹුල්වත් පුර වැසි ශාක්‍ය රජදරුවෝ ''භාග්‍යවතුන් වහන්සේ කුසිනාරාහි දී පිරිනිවි සේක් ලැ'' යි ඇසූහ. ඉක්බිති කිඹුල්වත් වැසි ශාක්‍යයෝ කුසිනාරාහි වැසි මල්ලයනට ''භාග්‍යවතුන් වහන්සේ අපේ ශ්‍රෙෂ්ඨ නෑයෝ ය. අපි දු භාග්‍යවතුන් වහන්සේ ගේ ශාරීරික ධාතුන් ගෙන් කොටසක් ලබන්නට සුදුස්සම්හ. අපි දු භාග්‍යවතුන් වහන්සේ ගේ ශාරීර ධාතුනට ස්තූපයක් ද කරන්නමු, පුද උළෙලක් ද කරන්නමු'' යි කියා දූතයකු යැවූහ.

අල්ලකප්ප රට වැසි බුලි රජුහු ''භාග්‍යවතුන් වහන්සේ කුසිනාරාහි දී පිරිනිවි සේක් ලැ''යි ඇසූහ. ඉක්බිති අල්ලකප්ප රට වැසි බුලි රජදරුවෝ කුසිනාරාහි වැසි මල්ලයනට ''භාග්‍යවතුන් වහන්සේ ද ක්ෂත්‍රියයෝ ය, අපි ද ක්ෂත්‍රියම් හ. අපි දු භාග්‍යවතුන් වහන්සේ ගේ ශාරීර ධාතුන් කොටසකට සුදුසු වමු. අපි දු භාග්‍යවතුන් වහන්සේ ගේ ශාරීර ධාතුනට ස්තූපයක් ද කරන්නමු, පුද උළෙල ද කරන්නමු'' යි දූතයකු අත කියා යැවූහ.

රඹගම් නුවර වැසි **කෝලිය** රජුහු ''භාග්‍යවතුන් වහන්සේ කුසිනාරා හිදී පිරිනිවී සේක් ලැ'' යි ඇසූහ. ඉක්බිති රඹගම් වැසි කෝලිය රජදරුවෝ ''භාග්‍යවතුන් වහන්සේ ද ක්ෂත්‍රිය වූ සේක. අපි දු ක්ෂත්‍රියයම් හ. අපි දු භාග්‍යවතුන් වහන්සේ ගේ ශාරීරික ධාතුන් කොටසක් ලබන්නට සුදුසු වමු. අපි දු භාග්‍යවතුන් වහන්සේගේ ශාරීර ධාතුනට ස්තූපයක් කරන්නමු, පුද උළෙලක් ද කරන්නමු'' යි දූතයකු අතැ කියා යැවූහ.

වේඨදීප නගරාධිපති බ්‍රාහ්මණ තෙමේ ''භාග්‍යවතුන් වහන්සේ කුසිනා-හි දී පිරිනිවි සේක් ලැ'' යි ඇසී ය. ඉක්බිති වේඨදීපක බමුණු තෙමෙ ''භාග්‍යවතුන් වහන්සේ වූ කලි ක්ෂත්‍රියයෙක. මම් බමුණෙකිමි. මම් දු භාග්‍යවතුන් වහන්සේ ගේ ශාරීර ධාතුන් කොටසක් ලබන්නට සුදුස්සෙමි. මම් දු භාග්‍යවතුන් වහන්සේ ගේ ධාතුනට ස්තූපයක් කරන්නෙමි, පුද උළෙල ද කරන්නෙමි''යි කියා කුසිනාරා පුරවැසි මල්ලයනට දූතයකු යැවී ය.

Free Distribution www.aathaapi.org

අථෙසාසුං බො පාවෙය්‍යකා මල්ලා ''භගවා කිර කුසිනාරායං පරිනිබ්බුතො'' ති. අථ බො පාවෙය්‍යකා මල්ලා කොසිනාරකානං මල්ලානං දූතං පාහෙසුං. භගවා පි ඛත්තියො මයම්පි ඛත්තියා. මයම්පි අරහාම භගවතො සාරීරානං භාගං, මයම්පි භගවතො සාරීරානං ථූපඤ්ච මහඤ්ච කරිස්සාමාති.

එවං වුත්තෙ කොසිනාරකා මල්ලා තෙ සඞ්ඝෙ ගණෙ එතදවොචුං, භගවා අම්හාකං ගාමක්ඛෙත්තෙ පරිනිබ්බුතො, න මයං දස්සාම භගවතො සාරීරානං භාගන්ති.

123. එවං වුත්තෙ දොණො බ්‍රාහ්මණො තෙ සඞ්ඝෙ ගණෙ එතදවොච:

සුණන්තු භොන්තො මම එකවාක්‍යං[1]
අම්හාක බුද්ධා අහු ඛන්තිවාදෙ.
න හි සාධු'යං උත්තමපුග්ගලස්ස
සරීරභාගෙ සියා සම්පහාරො.

සබ්බෙව භොන්තො සහිතා සමග්ගා
සම්මොදමානා කරොමට්ඨභාගෙ.
විත්ථාරිකා හොන්තු දිසාසු ථූපා
බහූ ජනා චක්ඛුමතො පසන්නා''ති.

124. ''තෙන හි බ්‍රාහ්මණ තුය්හෙවඤ්ඤව භගවතො සාරීරානි අට්ඨධා සමං සුවිභත්තං විභජාහි'' ති. 'එවං භො'ති බො දොණො බ්‍රාහ්මණො තෙසං සඞ්ඝානං ගණානං පටිස්සුත්වා භගවතො සාරීරානි අට්ඨධා සමං සුවිභත්තං විභජිත්වා තෙ සඞ්ඝෙ ගණෙ එතදවොච: ''ඉමං මෙ භොන්තො තුම්බං දදන්තු, අහම්පි තුම්බස්ස ථූපඤ්ච මහඤ්ච කරිස්සාමී''ති. අදංසු බො තෙ දොණස්ස බ්‍රාහ්මණස්ස තුම්බං.

අථෙසාසුං බො පිප්පලිවනියා[2] මොරියා: 'භගවා කිර කුසිනාරායං පරිනිබ්බුතො'ති. අථ බො පිප්පලිවනියා මොරියා කොසිනාරකානං මල්ලානං දූතං පාහෙසුං: භගවා පි ඛත්තියො මයම්පි ඛත්තියා. මයම්පි අරහාම භගවතො සාරීරානං භාගං, මයම්පි භගවතො සාරීරානං ථූපඤ්ච මහඤ්ච කරිස්සාමා'ති. ''නත්ථි භගවතො සාරීරානං භාගො, විභත්තානි භගවතො සාරීරානි, ඉතො අඞ්ගාරං හරථා''ති. තෙ තතො අඞ්ගාරං හරිංසු:[3]

1. වාචං, ම ජ්ඣං
2. පිප්පලිවනියා, ස්‍යා
3. ආහරිංසු ස්‍යා.කං

Free Distribution www.aathaapi.org

පාවා නුවර වැසි **මල්ලරජහු** ''භාග්‍යවතුන් වහන්සේ කුසිනාරාහි දී පිරිනිවි සේක් ලැ'' යි ඇසූහ. ඉක්බිති පාවා පුර වැසි මල්ලයෝ ''භාග්‍යවතුන් වහන්සේ ද ක්ෂත්‍රිය වූ සේක. ඇපි දු ක්ෂත්‍රියයමිහ. ඇපි දු භාග්‍යවතුන් වහන්සේ ගේ ශාරීර ධාතූන් කොටසක් ලබන්නට සුදුස්සමිහ. ඇපි දු භාග්‍යවතුන් වහන්සේ ගේ ශාරීර ධාතූනට ස්තූපයක් කරන්නමු, පුද උළෙල ද කරන්නෙමු'' යි කියා කුසිනාරා වැසි මල්ලයනට දූතයකු යැවූහ.

මෙසේ කී කල්හි කුසිනාරා වැසි මල්ල රජුහු ඒ රාජ සමූහයනට, ඒ රාජගණයනට ''භාග්‍යවතුන් වහන්සේ අප ගම්කෙතෙහි පිරිනිවි සේක. අපි භාග්‍යවතුන් වහන්සේ ගේ ශාරීර ධාතු කොටස් නො දෙන්නමු'' යි කීහ.

123. මෙසේ කී කල්හි ද්‍රෝණ බ්‍රාහ්මණ තෙමේ ඒ රාජසමූහයන් ඒ රාජගණයන් බණවා මෙ වදන් පැවැසී ය:

'' පින්වත්නි, මගේ මේ එක් වචනය අසත් වා.
අප බුදුරජුහු ක්ෂාන්තිවාද වූහ.
උතුම් පුඟුලක්හුගේ සිරුරු කොටස්
නිමිති කොට අවියෙන් ඇන කොටා ගැන්මෙක්
වන්නේ නම්, මෙය නො මැනැවි.
භවත්නි, අපි හැම දෙනා ම එක්සිත් වැ එකමුතු වැ,
සතුටු වෙමින් ධාතූන් අට කොටසක් කරමු.
ඒ ඒ දෙසැ ස්තූපයෝ පැතිර පවත්නෝ වෙත් වා.
(ඒ හැම දෙසැ) පසැසියාණන් වහන්සේට
පැහැදුණු බොහෝ ජනයෝ වෙත්'' යනු යි.

124. (බමුණු මෙසේ කී කල්හි) ''බමුණාණනි, එසේ වී නම් ඔබ ම භාග්‍යවතුන් වහන්සේ ගේ ශාරීර ධාතූන් අට කොටසකට සම සේ මනා කොට බෙදන්නැ'' යි ඒ රජදරුවෝ කිහු. 'එසේ යැ, පින්වත්නි' යි කියා ම ද්‍රෝණ බ්‍රාහ්මණ තෙම ඒ රජමුළුවනට ඒ ගණයනට පිළිවදන් දී, භගවත් බුදුරජුන් ගේ ශාරීරික ධාතූන් සම සේ අට කොටසකට මොනොවට බෙදා ඒ රාජ සමූහයන් ගණයන් බණවා, ''භවත්නි, මට මේ (ධාතු බෙදූ) නැළිය දෙත්වා. මම ද මේ නැළියට ස්තූපයක් කරන්නෙමි, පුද උළෙලක් ද කරන්නෙමි'' යි මේ බස් පැවැසී ය. ඔහු ද්‍රෝණ බ්‍රාහ්මණයාට නැළිය දුන්නාහු ම ය.

පිප්පලි වන නගර වාසී **මෝරිය** රජ දරුවෝ ''භාග්‍යවතුන් වහන්සේ කුසිනාරාහි දී පිරිනිවි සේක් ලැ'' යි ඇසූහ. ඉක්බිති පිප්පලිවන නුවර වැසි මෝරිය රජුහු කුසිනාරා වැසි මල්ල රජුනට ''භාග්‍යවතුන් වහන්සේ ද ක්ෂත්‍රිය වූ සේක. අපි දු ක්ෂත්‍රියයම් හ. අපිදු භාග්‍යවතුන් වහන්සේ ගේ ශාරීරික ධාතු කොටසක් ලබන්නට සුදුස්සමිහ. අපි දු භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූනට ස්තූපයක් කරන්නමු, පුද උළෙල ද කරන්නමු'' යි කියා දූතයකු යැවූහ. ''භාග්‍යවතුන් වහන්සේ ගේ ශාරීරික ධාතු කොටසක් (ඉතිරි වැ) නැත. භාග්‍යවතුන් වහන්සේ ගේ සියලු ශාරීර ධාතූහු බෙදා දෙන ලදහ. මෙයින් අඟුරු ගෙනයවු'' යැ යි මල්ල රජුහු කියා යැවූහ. ඒ පිප්පලිවනික රජුහු ද (ආදහනස්ථානයෙන්) අඟුරු ගෙන ගියහ.

Free Distribution www.aathaapi.org

ධාතුවෙතිය පූජා

124. අථ ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො රාජ-ගහෙ භගවතො සාරීරානං ථූපඤ්ච මහඤ්ච අකාසි. වෙසාලිකා පි ලිච්ඡවී වෙසාලියං භගවතො සාරීරානං ථූපඤ්ච මහඤ්ච අකංසු. කාපිලවත්ථවා පි සක්‍යා කපිලවත්ථුස්මිං භගවතො සාරීරානං ථූපඤ්ච මහඤ්ච අකංසු. අල්ලකප්පකා පි බුලයො අල්ලකප්පෙ භගවතො සාරීරානං ථූපඤ්ච මහඤ්ච අකංසු. රාමගාමකා පි කොලියා රාමගාමෙ භගවතො සාරීරානං ථූපඤ්ච මහඤ්ච අකංසු. වෙඨදීපකො පි බ්‍රාහ්මණො වෙඨදීපෙ භගවතො සාරීරානං ථූපඤ්ච මහඤ්ච අකාසි. පාවෙය්‍යකා පි මල්ලා පාවායං භගවතො සාරීරානං ථූපඤ්ච මහඤ්ච අකංසු. කොසිනාරකා පි මල්ලා කුසිනාරායං භගවතො සාරීරානං ථූපඤ්ච මහඤ්ච අකංසු. දෙණො පි බ්‍රාහ්මණො තුම්බස්ස ථූපඤ්ච මහඤ්ච අකාසි. පිප්පලිවනියා පි මොරියා පිප්පලිවනෙ අඞ්ගාරානං ථූපඤ්ච මහඤ්ච අකංසු. ඉති අඪ සරීරථූපා නවමො තුම්බථූපො දසමො අඞ්ගාරථූපො. එවමෙතං භූතපුබ්බන්ති.

125. "අඪ දෙණා[1] චක්ඛුමතො සරීරා
සත්තදෙණං ජම්බුදීපෙ මහෙන්ති,
එකඤ්ච දෙණං පුරිසවරුත්තමස්ස
රාමගාමෙ නාගරාජා මහෙන්ති.

එකා හි දඨා තිදිවෙහි පූජිතා
එකා පන ගන්ධාරපුරෙ මහීයති,
කාලිඞ්ගරඤ්ඤෙ විජිතෙ පුනෙකං
එකං පුන නාගරාජා මහෙන්ති.

තස්සෙව තෙජෙන අයං වසුන්ධරා
ආයාගසෙඪෙහි මහී අලංකතා
එවං ඉමං චක්ඛුමතො සරීරං
සුසක්කතං සක්කතසක්කතෙහි.

දෙව්න්දනාගින්දනරින්ද පූජිතො
මනුස්සසෙඪෙහි තථෙව පූජිතො,
තං[2] වන්දථ පඤ්ජලිකා භවිත්වා
බුද්ධො හවෙ කප්පසතෙහි දුල්ලභො'ති.

චත්තාළීස සමා දන්තා කෙසා ලොමා ච සබ්බසො,
දෙවා හරිංසු එකෙකං චක්කවාලපරම්පරා''ති.

මහාපරිනිබ්බානසුත්තං තතියං.

---

1. අඪදෙණං චක්ඛුමතො සරීරං (මජසං)
2. තං තං (ස්‍යා)

Free Distribution www.aathaapi.org

ද සැ පුද

124. ඉක්බිත්තෙන් වෛදේහී පුත්‍ර වූ මගධාධිපති අජාසත් රජ රජගහ පුරයෙහි භගවත් බුදුරජුන් ගේ ශාරීරික ධාතූනට ස්තූපයක් ද පූජ උළෙලක් ද කෙළේ ය. විසල් පුර වැසි ලිච්ඡවීහු ද භගවත් බුදුරජුන් ගේ ශාරීරික ධාතූනට විසල් පුර ස්තූපයක් ද පූජ උළෙලක් ද කළාහ. කිඹුල්වත් වැසි ශාක්‍යයෝ ද භගවත් බුදුරජුන් ගේ ශාරීරික ධාතූනට ස්තූපයක් ද පූජ උළෙලක් ද කිඹුල්වත් පුර කළාහ. අල්ලකප්ප රටැ බුලි රජුහු ද අල්ලකප්ප නුවර භගවත් බුදුරජුන් ගේ ශාරීරික ධාතූනට ස්තූපයක් ද පූජ උළෙලක් ද කළාහ. රඹගම වැසි කෝලිය රජුහු ද රඹගම් නුවර භගවත් බුදුරජුන් ගේ ධාතූනට ස්තූපයක් ද පූජ උළෙලක් ද කළාහ. වෙයදීප නුවර වැසි බමුණු ද වෙයදීපයෙහි භගවත් බුදුරජු ගේ ශාරීරික ධාතූනට ස්තූපයක් ද පූජ උළෙලක් ද කළාහ. පාවා නුවර වැසි මල්ලයෝ ද පාවා නුවර භගවත් බුදුරජුන් ගේ ධාතූනට ස්තූපයක් ද පූජ උළෙලක් ද කළාහ. කුසිනාරා පුර වැසි මල්ල රජුහු ද භගවත් බුදුරජුන් ගේ ධාතූනට ස්තූපයක් ද පූජ උළෙලක් ද කළාහ. ද්‍රෝණ බමුණු ද (ධාතූන් මිනූ) නැළියට සතූපයක් ද පූජ උළෙලක් ද කළාහ. පිප්පලිවන නුවර වැසි මොරිය රජුහු ද පිප්පලිවන නුවරෙහි (ආදහන කළ තැනින් ගෙනා) අඟුරු පිණිස ස්තූපයක් ද පූජ උළෙලක් ද කළාහ. මෙසේ ශාරීරික ධාතූන් තැන්පත් කළ ස්තූප අටෙක, නැළිය තැන් පත් කළ නව වැනි ස්තූපය, දස වැනි අංගාර ස්තූපයැයි සියලු ස්තූප දශයෙක. මෙසේ මේ දස ස්තූප පළමුවෙන් වී ය.

125. පසැස් ඇති බුදුරජුන් ගේ සිරුර ධාතූහු ද්‍රෝණ අටෙකි. එයින් ද්‍රෝණ සතක් ධාතූන් දඹදිවැ පුදත්. පුරුෂ ශ්‍රේෂ්ඨයන් වහන්සේ ගේ එක් ද්‍රෝණයක් ධාතූන් රඹගමැ නාරජුහු පුදති. එක් දළදයෙක් වූ කලි දෙවියන් විසින් පුදනු ලැබේ. එක් දළදයෙක් ගන්ධාර පුරයෙහි පුදනු ලැබේ. යලි තව ද දළදයෙක් කලිඟු රජුගේ රටෙහි පුදනු ලැබේ. තව එක් දළදවක් (නාලොවැ) නා රජුහු පුදති. ඒ සකර දළද වහන්සේ ගේ තෙදින් මේ මුළු පොළොව ශ්‍රේෂ්ඨ පූජොත්සවයෙන් සැරසුණේය. මෙසේ පසැසියාණන්ගේ සිරුරුදැ සෙසු ජනයා විසින් මොනොවට සත්කාර කරනු ලැබේ. දෙවියන් විසින් ද රජුන් විසින් ද මනා,ව සත්කෘත විය. දෙවිදු විසින් ද නයිදුන් විසින් ද නිරිදුන් විසින් ද එසේ ම උතුම් මිනිසුන් විසින් ද පූදන ලද ඒ බුදු රජතෙම ඒකාන්තයෙන් කල්ප සිය ගණනෙකිනුදු දුර්ලභ ය. දෙහොත් මුදුනැ තබාගත්තෝ වැ ඔබ නමදි වූ.

සම සාළිස් දන්තධාතූන් ද කේශ ධාතූන් ද ලෝමධාතූන් ද එක එකක් පාසා සක්වළ පිළිවෙළින් දෙවියෝ ගෙන ගියාහ.

තෙවෙනි මහ පිරිනිවන් සූත්‍ර නිමියේ යි.

Free Distribution www.aathaapi.org

4

මහාසුදස්සනසුත්තං

1. එවං මේ සුතං එකං සමයං භගවා කුසිනාරායං විහරති උපවත්තනෙ මල්ලානං සාලවනෙ අන්තරෙන යමකසාලානං පරිනිබ්බානසමයෙ.

අථ බො ආයස්මා ආනන්දෙ යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො බො ආයස්මා ආනන්දෙ භගවන්තං එතදවොච, ''මා භන්තෙ භගවා ඉමස්මිං කුඩ්ඩනගරකෙ උජ්ජඞ්ගලනගරකෙ සාඛානගරකෙ පරිනිබ්බායි. සන්ති භන්තෙ අඤ්ඤානි මහානගරානි, සෙය්‍යථීදං, චම්පා රාජගහං සාවත්ථී සාකෙතං කොසම්බී බාරාණසී, එත්ථ භගවා පරිනිබ්බායතු. එත්ථ බහූ ඛත්තියමහාසාලා බ්‍රාහ්මණමහාසාලා ගහපතිමහාසාලා තථාගතෙ අභිප්පසන්නා, තෙ තථාගතස්ස සරීරපූජං කරිස්සන්ති''ති.

2. ''මා හෙවං ආනන්ද අවච මා හෙවං ආනන්ද අවච කුඩ්ඩනගරකං උජ්ජඞ්ගලනගරකං සාඛා නගරකන්ති.

කුසාවති රාජධානි

භූතපුබ්බං ආනන්ද රාජා මහාසුදස්සනො නාම අහොසි ඛත්තියො මුද්ධාවසිත්තො[1] චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො. රඤ්ඤො ඛො ආනන්ද මහාසුදස්සනස්ස අයං කුසිනාරා කුසාවතී නාම රාජධානී අහොසි. සා බො ආනන්ද කුසාවතී පුරත්ථිමෙන ච පච්ඡිමෙන ච බාදසයොජනානි අහොසි ආයාමෙන, උත්තරෙන ච දක්ඛිණෙන ච සත්තයොජනානි විත්ථාරෙන. කුසාවතී ආනන්ද රාජධානී ඉද්ධා චෙව අහොසි ඵීතා ච බහුජනා ච ආකිණ්ණමනුස්සා ච සුභික්ඛා ච.

---

1. මුද්ධාභිසිත්තො (සී)
2. ඉද්ධා චෙව අහොසි ඵීතා ච (සබ්බ)

Free Distribution www.aathaapi.org

4

මහාසුදස්න සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී:

එක් කලෙක පිරිනිවන් සමයෙහි භාග්‍යවතුන් වහන්සේ කුසිනාරා නුවර සමීපයෙහි වූ මල්ල රජුන් ගේ **උපවර්තන** නම් සල් වෙනෙහි යමා සල්රුක් අතර වැඩ වසන සේක.

එ කල්හි අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹුණහ. එළඹැ ඔබ සාදර වැ වැඳ එක් පසෙක උන්හ. එක් පසෙක හුන්නාවූ ම අනඳ තෙරණුවෝ, ''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ගල් සෙල් ඇයෙන් විසම වූ ශාඛා නගරයක් වූ මේ කුඩා නුවර දී නො පිරිනිවෙන සේක් වා. වහන්ස, **චම්පා රාජගෘහ ශ්‍රාවස්ති සාකේත කෞශාම්බි වාරාණසි** යන අන් මහ නුවරවල් ඇත. මේ නුවරෙක භාග්‍යවතුන් වහන්සේ පිරිනිවෙන සේක් වා. මේ නුවරවල තථාගතයන් වහන්සේ කෙරෙහි වෙසෙසින් පැහැදුණු බොහෝ කැත් මහසල්හු, බමුණු මහසල්හු ගැහැවි මහසල්හු ඇත. ඔහු තථාගතයන් වහන්සේ ගේ සිරුරට පූජා කරන්නාහ'' යි භාග්‍යවතුන් වහන්සේට සැළ කළාහ.

2. ''අනඳයෙනි, කුඩා නුවරෙකැ යි ගල් සෙල් ඇයින් විසම නුවරෙකැ යි අතු නුවරෙකැ යි මෙසේ නොකිය වු'' (යැයි වදරා මතු දක්වෙන ඉකුත් වත් වදළ සේක:)

කුශාවතී රාජධානිය

''පෙර වූවක් කියමි. අනඳයෙනි, (පෙර) **මහිසැ** අභිසෙස් ලද, සයුර හිම කොට සතර මහදිවයිනට අදිපති වූ, පසමිතුරන් දිනූ, දනවුහි තහවුරු බවට පැමිණි, සත්රුවනින් සමන්වාගත වූ **මහසුදසුන්** නම් කැත් රජෙක් විය. අනඳයෙනි, මේ කුසිනාරාව මහසුදසුන් රජු ගේ **කුශාවතී** නම් රජදහන විය. අනඳයෙනි, ඒ කුශාවතී රජදහන පෙර දෙසින් ද පැසිම දෙසින් ද දිගින් දෙළොස් යොදුන් විය, උතුරු දෙසින් ද දකුණු දෙසින් ද පුලුලින් සත් යොදුන් විය. අනඳයෙනි, කුශාවතී රජදහන සමෘද්ධ ද හැම සැපතින් පිරුණේ ද, බොහෝ ජනයන් ඇත්තේ, මිනිසුන් ගෙන් ගැවැසුණේ ද, **සුභික්ෂ** ද විය.

Free Distribution www.aathaapi.org

සෙය්‍යථාපි ආනන්ද දෙවානං ආළකමන්ද නාම රාජධානී ඉද්ධා චෙව ඵිතා ච බහුජනා ච ආකිණ්ණයක්ඛා ච සුභික්ඛා ච, එවමෙව ඛො ආනන්ද කුසාවතී රාජධානී ඉද්ධා චෙව අහොසි ඵිතා ච බහුජනා ච ආකිණ්ණමනුස්සා ච සුභික්ඛා ච. කුසාවතී ආනන්ද රාජධානී දසහි සද්දෙහි අවිච්ඡිත්තා අහොසි දිවා චෙව රත්තිං ච. සෙය්‍යථීදං, හත්ථිසද්දෙන අස්සද්දෙන රථසද්දෙන භෙරිසද්දෙන මුදිඞ්ගසද්දෙන වීණාසද්දෙන ගීතසද්දෙන සම්මසද්දෙන තාලසද්දෙන (සඞ්ඛසද්දෙන) අසනාථ පිවථ බාදථාති දසමෙන සද්දෙන.

3. කුසාවතී ආනන්ද රාජධානී සත්තහි පාකාරෙහි පරික්ඛිත්තා අහොසි. එකො පාකාරො සොවණ්ණමයො, එකො රූපියමයො, එකො වෙළුරියමයො, එකො එළිකමයො, එකො ලොහිතඞ්කමයො[1] එකො මසාරගල්ලමයො, එකො සබ්බරතනමයො. කුසාවතියා ආනන්ද රාජධානියා චතුන්නං වණ්ණානං ද්වාරානි අහෙසුං. එකං ද්වාරං සොවණ්ණමයං, එකං රූපියමයං, එකං වෙළුරිය මයං, එකං එළිකමයං. එකෙකස්මිං ද්වාරෙ සත්ත සත්ත එසිකා නිඛාතා අහෙසුං. තිපොරිසඞ්ඛා තිපොරිසනිඛාතා චාදසපොරිසා උබ්බෙධෙන. එකා එසිකා සොවණ්ණමයා, එකා රූපියමයා, එකා වෙළුරියමයා, එකා එළිකමයා, එකා ලොහිතඞ්කමයා, එකා මසාරගල්ලමයා, එකා සබ්බරතනමයා.

කුසාවතී ආනන්ද රාජධානී සත්තහි තාලපන්තිහි පරිකඛිත්තා අහොසි. එකා තාලපන්ති සොවණ්ණමයා, එකා රූපියමයා, එකා වෙළුරියමයා එකා එළිකමයා, එකා ලොහිතඞ්කමයා, එකා මසාරගල්ලමයා, එකා සබ්බරතනමයා. සොවණ්ණමයස්ස තාලස්ස සොවණ්ණමයො ඛන්ධො අහොසි, රූපියමයානි පත්තානි ච ඵලානි ච රූපියමයස්ස තාලස්ස රූපියමයො ඛන්ධො අහොසි සොවණ්ණමයානි පත්තානි ච ඵලානි ච. වෙළුරියමයස්ස තාලස්ස වෙළුරියමයො ඛන්ධො අහොසි එළිකමයානි පත්තානි ච ඵලානි ච. එළිකමයස්ස තාලස්ස එළිකමයො ඛන්ධො අහොසි. වෙළුරියමයානි පත්තානි ච ඵලානි ච. ලොහිතඞ්කමයස්ස තාලස්ස ලොහිතඞ්කමයො ඛන්ධො අහොසි මසාරගල්ලමයානි පත්තානි ච ඵලානි ච. මසාරගල්ලමයස්ස තාලස්ස මසාරගල්ලමයො ඛන්ධො අහොසි ලොහිතඞ්කමයානි පත්තානි ච ඵලානි ච සබ්බරතනමයස්ස තාලස්ස සබ්බරතනමයො ඛන්ධො අහොසි සබ්බරතනමයානි පත්තානි ච ඵලානි ච. තාසං ඛො පනානන්ද තාලපන්තීනං වාතෙරිතානං සද්දො අහොසි වගගු ච රජනීයො ච කමනීයො ච[2] මදනීයො ච. සෙය්‍යථාපි ආනන්ද පඤ්චඞ්ගිකස්ස තූරියස්ස සුවිනීතස්ස සුප්පටිතාළිතස්ස කුසලෙහි සමන්නාහතස්ස සද්දො හොති වගගු ච රජනීයො ච කමනීයො ච මදනීයො ච. එවමෙව ඛො ආනන්ද තාසං තාලපන්තීනං වාතෙරිතානං සද්දො අහොසි වගගු ච රජනීයො ච කමනීයො ච මදනීයො ච. යෙ ඛො පනානන්ද තෙන සමයෙන කුසාවතියා රාජධානියා ධුත්තා අහෙසුං සොණ්ඩා පිපාසා, තෙ තාසං තාලපන්තීනං වාතෙරිතානං සද්දෙන පරිවාරෙසුං.

---

1. ලොහිතඞ්කමයො (කං)
2. ඛමනීයො (මජසං)

Free Distribution www.aathaapi.org

අනඳයෙනි, දෙවියන්ගේ ආලකමන්දා නම් රාජධානිය යම්සේ සමෘද්ධත් හැම සැපතින් පිරුණේත් බොහෝ ජනයන් ඇත්තේත් යකුන් ගෙන් ගැවැසුණේත් සුභික්ෂත් වේ ද, එසේම අනඳයෙනි, කුශාවතී රාජධානිය සමෘද්ධ ද, සියලු සැපතින් පිරුණේ ද, බොහෝ ජනයන් ඇත්තේ ද, මිනිසුන් ගෙන් ගැවැසුණේ ද, සුභික්ෂ ද විය. අනඳයෙනි, කුශාවතී රාජධානිය රෑ ද දහවල් ද ඇත්හඬින් ද අස් හඬින් ද රියහඬින් ද බෙර හඬින් ද මිහිඟුබෙර හඬින් ද වෙණ හඬින් ද ගී හඬින් ද(යහළුව යහළු වැ යි කෑදවන) පිය බස් හඬින් ද කස්තලු ආදියේ හඬින් ද 'වළඳවු, කවු, බොවු' යන දස වැනි හඬින් ද යි දස හඬින් නොසිස් විය.

3. අනඳයෙනි, කුශාවතී රාජධානිය සත් පවුරෙකින් පිරිකෙවුණේ විය. ඔවුන් අතුරෙන් එක් පවුරෙක් රන්මුවා විය. එකෙක් රිදීමුවා විය, එකෙක් වෙරළුමිණිමුවා විය, එකෙක් පළිඟුමුවා විය, එකෙක් රත්මිණිමුවා විය, එකෙක් මැසිරිගල්මුවා විය, එකෙක් සියල්රුවන්මුවා විය. අනඳයෙනි, කුශාවතී රාජධානියෙහි සතර වර්ණයන් සම්බන්ධ දෙරවල් වූහ. එක් දෙරෙක් රන්මුවා විය, එකෙක් රිදීමුවා විය, එකෙක් වෙරළුමිණිමුවා විය, එකෙක් පළිඟුමුවා විය. එක් එක් දෙරෙහි පුරුෂප්‍රමාණ තුනක් (පසොළොස් රියනක්) වට වූ, පුරුෂ ප්‍රමාණ තුනක් (පසළොස් රියනක්) යට සිටුවන ලද, උසින් දෙළොස් පුරුෂ ප්‍රමාණ (සැට රියන්) වූ සතෙක් සතෙක් ඉන්ද්‍රකීලයෝ බිම කැන සිටුවන ලද්දාහු වූහ.

අනඳයෙනි, කුශාවතී රාජධානිය තල්රුක් සත් පෙලෙකින් පරික්ෂිප්ත විය. එක් තල්රුක් පෙලෙක් රන්මුවා විය, එකෙක් රිදීමුවා විය, එකෙක් වෙරළුමිණිමුවා විය, එකෙක් පළිඟුමුවා විය. එකෙක් රත්මිණිමුවා විය, එකෙක් මැසිරිගල්මුවා විය, එකෙක් සවිරුවන්මුවා විය. රන්මුවා තල් රුකා කඳ රන් මුවා විය, කොළ ද පල ද රිදීමුවා වූහ, රිදීමුවා තල්රුකැ කඳ රිදීමුවා විය, කොළ ද පල ද රන්මුවා වූහ. වෙරළුමිණිමුවා තල්රුකැ කඳ වෙරළුමිණිමුවා විය, කොළ ද පල ද පළිඟුමුවා වූහ. පළිඟු මුවා තල්රුකැ කඳ පළිඟුමුවා විය. කොළ ද පල ද වෙරළුමිණිමුවා වූහ. රන්මිණිමුවා තල් රුකැ කඳ රත්මිණිමුවා විය, කොළ ද පල ද මැසිරිගල්මුවා වූහ. මැසිරිගල්මුවා තල්රුකැ කඳ මැසිරිගල්මුවා විය, කොළ ද පල ද මැසිරිගල්මුවා වූහ. සවිරුවන්මුවා තල්රුකැ කඳ සවිරුවන් මුවා විය. කොළ ද පල ද සවිරුවන්මුවා වූහ. අනඳයෙනි, සුළඟින් සැලුණු ඒ තාලවෘක්ෂ පංක්තීන් ගේ මිහිරි වූ ද ඉත් අලවන්නා වූ ද කමනීය වූ ද සිත මත් කරන්නා වූ ද හඬෙක් විය. අනඳයෙනි, (ඇදීම් ලිහිල් කිරීම් ආදීයින්) සුමුස්නා ලද මැදුම් පමණ ගන්වනු පිණිස මොනොවට සුන සුනා තළන ලද ඉකා සමත් වයුවන් විසින් වයන ලද පංචාඞ්ගික තූර්‍යයාගේ යම්සේ මිහිරි වූ ද ඉත් අලවන්නා වූ ද කමනීය වූ ද සිත මත් කරන්නා වූ ද හඬෙක් වේ ද, එසේ ම සුළඟින් සැලුණු ඒ තාලවෘක්ෂ පඬික්තීන්ගේ ද මිහිරි වූ ඉත් අදනා කමනීය වූ ඉත් මත් කරන හඬෙක් විය. අනඳයෙනි ඒ සමයෙහි කුශාවතී රාජධානියෙහි සුරා සොඬ වූ, සුන සුනා සුරා බොනු රිසි යම් ධූර්ත කෙනෙක් වූහු ද, ඔහු සුළඟින් සැලුණු ඒ තල්රුක් පෙලවල හඬින් අත් පා සොලොවා නටමින් ක්‍රීඩා කළහ.

Free Distribution www.aathaapi.org

චක්කරතනං

4. රාජා ආනන්ද මහාසුදස්සනො සත්තහි රතනෙහි සමන්නාගතො අහොසි චතුහි ච ඉද්ධීහි. කතමෙහි සත්තහි? ඉධානන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස තදහුපොසථෙ පණ්ණරසෙ සීසං නහාතස්ස උපොසථිකස්ස උපරිපාසාදවරගතස්ස දිබ්බං චක්කරතනං පාතුරහොසි සහස්සාරං සනෙමිකං සනාභිකං සබ්බාකාරපරිපූරං, දිස්වා රඤ්ඤො මහාසුදස්සනස්ස එතදහොසි: "සුතංබො පනෙතං: යස්ස රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාභිසිත්තස්ස තදහුපොසථෙ පණ්ණරසෙ සීසං නහාතස්ස උපොසථිකස්ස උපරිපාසාදවරගතස්ස දිබ්බං චක්කරතනං පාතු භවති සහස්සාරං සනෙමිකං සනාභිකං සබ්බාකාරපරිපූරං, සො හොති රාජා චක්කවත්තීති. අස්සං නු ඛො අහං රාජා චක්කවත්තී"ති.

5. අථ ඛො ආනන්ද රාජා මහාසුදස්සනො උට්ඨායාසනා, එකංසං උත්තරාසඞ්ගං කරිත්වා, වාමෙන හත්ථෙන සුවණ්ණ භිඞ්කාරං ගහෙත්වා දක්ඛිණෙන හත්ථෙන චක්කරතනං අබ්භුක්කිරි: පවත්තතු භවං චක්ක රතනං, අභිවිජිනාතු භවං චක්කරතනන්ති. අථ ඛො තං ආනන්ද චක්කරතනං පුරත්ථිමං දිසං පවත්ති'?[1] අත්වදෙව[2] රාජා මහාසුද-ස්සනො සඞ්ං චතුරඞ්ගිනියා සෙනාය. යස්මිං ඛො පනානන්ද පදෙසෙ චක්කරතනං පතිට්ඨාසි තත්ථ රාජා මහාසුදස්සනො වාසං උපගඤ්ජි සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය. යෙ ඛො පනානන්ද පුරත්ථිමාය දිසාය පටිරාජානො තෙ රාජානං මහාසුදස්සනං උපසඞ්කමිත්වා එවමාහංසු: එහි ඛො මහාරාජ, ස්වාගතං, තෙ මහාරාජ, සකන්තෙ මහාරාජ, අනු සාස මහාරාජාති. රාජා මහාසුදස්සනො එවමාහ පාණො න හන්තබ්බා අදින්නං නාදාතබ්බං කාමෙසු මිච්ඡා න චරිතබ්බා. මුසා න භාසිතබ්බා. මජ්ජං න පාතබ්බං. යථා භුත්තඤ්ච භුඤ්ජථාති. යෙ ඛො පනානන්ද පුරත්ථි-මාය දිසාය පටිරාජානො රත රඤ්ඤො මහාසුදස්සනස්ස අනුයන්තා අහෙසුං. අථ ඛො තං ආනන්ද චක්කරතනං පුරත්ථිමං සමුද්දං අජ්ඣොගාහෙත්වා[4] පච්චුත්තරිත්වා දක්ඛිණං දිසං පවත්ති, දක්ඛිණං සමුද්දං අජ්ඣොගාහෙත්වා පච්චුත්තරිත්වා පච්ඡිමං දිසං පවත්ති, පච්ඡිමං සමුද්දං අජ්ඣොගාහෙත්වා පච්චුත්තරිත්වා උත්තරං දියං පවත්ති අත්වදෙව රාජා මහාසුදස්සනො සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය යස්මිං ඛො පනානන්ද පදෙසෙ චක්කරතනංපතිට්ඨාසි, තත්ථ රාජා මහාසුදස්සනො වාසං උපගඤ්ජි සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය. යෙ ඛො පනානන්ද උත්තරාය දිසාය පටිරාජානො, තෙ රාජානං මහා සුදස්සනං උපසඞ්කමිත්වා එවමාහංසු: එහි ඛො මහාරාජ, ස්වාගතං තෙ මහාරාජ, සකං තෙ මහාරාජ, අනුසාස මහාරාජාති. රාජා මහාසුදස්සනො එවමාහ: පාණො න හන්තබ්බා, අදින්නං නාදාතබ්බං, කාමෙසු මිච්ඡා න චරි-තබ්බා, මුසා න භාසිතබ්බා, මජ්ජං න පාතබ්බං, යථා භුත්තඤ්ච භුඤ්ජථා ති යෙ ඛො පනානන්ද උත්තරාය දිසාය පටිරාජානො තෙ රඤ්ඤො මහාසුදස්සනස්ස අනුයන්තා[5] අහෙසුං.

---

1. පවත්තති (ස්‍යා කං)
2. අනුදෙව (ස්‍යා)
3. සංගතං (PTS)
4. අජ්ඣොගාහෙත්වා (PTS)
5. ආකයන්ත (මජ්ජං)

Free Distribution www.aathaapi.org

සත්රුවන

4. අනඳයෙනි, මහසුදසුන් රජ සත් රුවනින් ද සතර ඉදුහයෙන් ද යුත් විය. කවර සත් රුවනෙකින් ද? යත්: අනඳයෙනි, ඒ පසොළොස් වක් පොහෝ ද (සුවඳදියෙන්) හිස් සෝද නා සමාදන් වූ පෙහෙවස් ඇති ව මහඳු පහයෑ මතු මහල්තලයට පැමිණි මහසුදසුන් රජුට දහසක් අර ඇති නිම්වලලු සහිත, නෑබ මඩුලු සහිත, මෙසේ සියලු අයුරින් පිරිසුන් දෙව සක් රුවන පහළ විය. එය දැක්මෙන් මහසුදසුන් රජහට මේ සිත විය, ''පුණු පසළොස්වක් පොහො දිනෑ ඉස් සෝ ද නා පෙහෙවස් සමාදන් කොට ගෙන පහයෑ මතු මහල් තලයට පැමිණෑ උන් මුදුනෑ අබිසෙස් ලත් යම් කැත් රජක්හට දහසක් අර දැකි නිම්වළලු සහිත නෑබ මඩුලු සහිත මෙසේ සියලු අයුරින් පිරිසුන් දෙව සක්රුවන පහළ වන්නේ නම් ඔහු සක්විති රජු වෙති යි මෙය මා විසින් අසන ලද්දේ ම ය. මම් සක්විති වන්නෙම් දෝ?'' යනු යි.

5. අනඳයෙනි, ඉක්බිත්තෙන් මහ සුදසුන් රජ හුනස්නෙන් නැඟිසිට උතුරුසහ එකස් කොට වමතින් කෙංඩිය ගෙන, 'භවත් සක්රුවන, පෙරළේ වා, භවත් සක් රුවන, සතර මහ දිවයින දිනා දේ වා'යි කියා දකුණතින් සක් රුවනට දිය ඉස්සේ ය. අනඳයෙනි, එ කල්හි එ සත්රුවන පෙර දිගට පෙරළිණ. මහ සුදසුන් රජ සිවුරහ සෙන් හා එය අනුව ම නික්මුණේ ය. අනඳයෙනි, යම් පෙදෙසෙක සක්රුවන පිහිටියේ ද (රැඳී සිටියේ ද) මහසුදසුන් රජ සිවුරහ සෙන් හා එහි නවා තැනට එළැඹියේ ය. අනඳයෙනි, පෙර දිගැ යම් පිළිමල් රජ කෙනෙක් වූහු ද, ඔහු මහසුදසුන් රජු කරා එළැඹ ''මහරජාණනි, වඩින්නැ! මහරජාණනි, ඔබ වැඩි සේ යහපත! මෙය ඔබගේ ය. අපට අනුශාසන කළ මැනැවැ'' යි කී හ. මහසුදසුන් රජ තෙමේ ඔවුනට ''පණිවා නො කළ යුතු, අයිනාදන් නො කළ යුතු, කාමයන්හි වැරැද්ද නො හැසිරි යැ යුතු මුසවා නො බිණි යැ යුතු මත් පැන් නො පියැ යුතු. තොප වැලැඳු පරිදි ම මත්තෙහි ද රට වැලැ දියැ යුතු යැ''යි මෙසේ කී ය. අනඳයෙනි, පෙර දිගැ යම් පිළිමල් රජ කෙනෙක් වූහු ද, ඔහු මහ සුදසුන් රජු අනුව යන්නෝ වූහ. අනඳයෙනි, ඉක්බිති සක්රුවන පෙරදිග මුහුදට බැස යළි ගොඩ නැඟ දකුණු දිගට පෙරළිණ. . . . දකුණු දිග මුහුදට බැස පෙරළා ගොඩ නැඟ පැසිම් දිගට පෙරළිණ . . . පැසිම් මුහුදට බැස ගොඩ නැඟ උතුරු දිගට පෙරළිණ. මහසුදසුන් රජ ද සිවුරහ සෙන් හා එය අනුව ම ගියේ ය. අනඳයෙනි, යම් පෙදෙසෙක සක්රුවන පිහිටියේ ද (රැඳී සිටියේ ද) මහසුදසුන් රජ සිවුරහ සෙන් හා එහි නවාතැනට එළැඹියේ ය. අනඳයෙනි, උතුරු දිගැ යම් පිළිමල් රජ කෙනෙක් වූහු ද, ඔහු මහසුදසුන් රජු කරා එළැඹ ''මහ රජාණනි, වඩින්නැ. මහරජාණනි, ඔබ වැඩි සේ යහපත මෙය ඔබ සතු ය. අපට අනුශාසනා කළ මැනැවැ'' යි කීහ. මහසුදසුන් රජ තෙමේ ඔවුනට ''පණිවා නො කළ යුතු, අයිනාදන් නො කළ යුතු, කාමයන්හි වැරැදෑ නො හැසිරියැ යුතු, මුසවා නො බිණියැ යුතු, මත් පැන් නො පියැ යුතු. තොප වැළැඳු පරිදි ම මත්තෙහි ද රට වැළැදියැ යුතු යැ'' සි මෙසේ කී ය. අනඳයෙනි, උතුරු දිගැ යම් පිළිමල් රජ කෙනෙක් වූහු ද, ඔහු මහසුදසුන් රජු අනුවැ යන්නෝ වූහ.

Free Distribution www.aathaapi.org

6. අථ ඛො තං ආනන්ද චක්කරතනං සමුද්දපරියන්තං පඨවිං අභිවිජිනිත්වා කුසාවතිං රාජධානිං පච්චාගන්ත්වා රඤ්ඤො මහාසුදස්සනස්ස අන්තෙපුරද්වාරෙ අට්ඨකරණීපමුඛෙ අක්ඛාහතං මඤ්ඤෙ අට්ඨාසි. රඤ්ඤො මහාසුදස්සනස්ස අන්තෙපුරං උපසොභයමානං. රඤ්ඤො ආනන්ද මහාසුදස්සනස්ස එවරූපං චක්කරතනං පාතුරහොසි.

හත්ථිරතනං

7. පුන ච පරං ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස හත්ථිරතනං පාතුරහොසි, සබ්බසෙතො සත්තපතිට්ඨො ඉද්ධිමා වෙහාසඞ්ගමො උපොසථො නාම නාගරාජා. තං දිස්වා රඤ්ඤො මහාසුදස්සනස්ස චිත්තං පසීදි: භද්දකං වත භො හත්ථියානං සචෙ දමථං උපෙය්‍යාති අථ ඛො තං ආනන්ද හත්ථිරතනං සෙය්‍යථාපි නාම භද්දෙ හත්ථාජානීයො දිසරත්තං සුපරිදන්තෙ, එවමෙව දමථං උපගඤ්ඡි. භූතපුබ්බං ආනන්ද රාජා මහාසුදස්සනො තමෙව හත්ථිරතනං වීමංසමානො පුබ්බණ්හසමයං අභිරුහිත්වා සමුද්දපරියන්තං පඨවිං අනුයායිත්වා කුසාවතිං රාජධානිං පච්චාගන්ත්වා පාතරාසමකාසි. රඤ්ඤො ආනන්ද මහාසුදස්සනස්ස එවරූපං හත්ථිරතනං පාතුරහොසි.

අස්සරතනං

8. පුන ච පරං ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස අස්සරතනං පාතුරහොසි, සබ්බසෙතො කාළසීසො මුඤ්ජකෙසො ඉද්ධිමා වෙහාසඞ්ගමො වලාහකො නාම අස්සරාජා. තං දිස්වා රඤ්ඤො මහාසුදස්සනස්ස චිත්තං පසීදි: භද්දකං වත භො අස්සයානං සචෙ දමථං උපෙය්‍යාති. අථ ඛො තං ආනන්ද අස්සරතනං සෙය්‍යථාපි නාම භද්දෙ අස්සාජානීයො දිසරත්තං සුපරිදන්තෙ එවමෙව දමථං උපගඤ්ඡි. භූතපුබ්බං ආනන්ද රාජා මහාසුදස්සනො තමෙව අස්සරතනං වීමංසමානො පුබ්බණ්හසමයං අභිරුහිත්වා සමුද්දපරියන්තං පඨවිං අනුයායිත්වා කුසාවතිං රාජධානිං පච්චාගන්ත්වා පාතරාසමකාසි. රඤ්ඤො ආනන්ද මහාසුදස්සනස්ස එවරූපං අස්සරතනං පාතුරහොසි.

මණිරතනං

9. පුන ච පරං ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස මණිරතනං පාතුරහොසි. සො අහොසි මණි වෙඵරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො සබ්බාකාරසම්පන්නො. කස්ස ඛො පන ආනන්ද මණිරතනස්ස ආභා සමන්තා යොජනං ඵුටා අහොසි. භූතපුබ්බං ආනන්ද රාජා මහාසුදස්සනො තමෙව මණිරතනං වීම සමානෙ චතුරඞ්ගිනිං සෙනං සන්නයහිත්වා මණිං ධජග්ගං ආරොපෙත්වා රත්තන්ධකාරතිමිසායං පායාසි. යෙ ඛො පන ආනන්ද සමන්තා ගාමා අහෙසුං, තෙ තෙනොභාසෙන කම්මන්තෙ පයොජෙසුං දිවාති මඤ්ඤමානා. රඤ්ඤො ආනන්ද මහාසුදස්සනස්ස එවරූපං මණිරතනං පාතුරහොසි.

Free Distribution www.aathaapi.org

6. අනඳයෙනි, ඉක්බිති ඒ සක්රුවන මුහුද හිමි කොට පොළොව දිනා, කුශාවතී රාජධානියට පෙරළා අවුත් මහසුදස්සන් රජුගේ ඇතොවුර දෙරැ විනිසමඬල ඉදිරියෙහි ඇතොවුර හොඛවතුයේ අකුරැ ගැසූ කලෙක සෙයින් සිටියේ ය. අනඳයෙනි, මහසුදස්සන් රජුට මෙ බඳු සක්රුවනෙක් පහළ විය.

ඇත්රුවන

7. තවද අනෙකක් කියම්. අනඳයෙනි, මහසුදස්සන් රජුට සිරුර මුළුල්ල සුදු වූ, කය සත් තැනෙකින් පොළොව පහස්නා, ඉදුමත්, අහසින් යන, උපෝසථ කුලයට අයත් ඇත් රජෙක් වූ ඇත්රුවනෙක් පහළ විය. එය දැක්මෙන්, 'ඉදින් හිලෑ බවට පැමිණියේ වී නම් ඒකාන්තයෙන් යහපත් වූ ඇත් යානයෙකැ'යි මහසුදස්සන් රජුගේ සිත පැහැදිණ. අනඳයෙනි, ඉක්බිත්තෙන් ඒ ඇත්රුවන බොහෝ කලක් මොනොවට හික්මුණු සොඳුරු අජානී ඇතෙක් යම් සේ ද එසේ ම හික්මුණු බවට පැමිණියේය. අනඳයෙනි, පෙරැ වූ දයක් කියම්. මහසුදස්සන් රජ එ ම ඇත් රුවන විමසතුයේ පෙරවරු වේලෙහි උහු අරා ගොස් මුහුද හිමි කොට ඇති මුළු පොළොව වටා හැවිද කුශාවතී රාජධානියට පෙරළා අවුත් උදේ බොජුන් වැළැඳීම කෙළේ ය. අනඳයෙනි, මහසුදස්සන් රජහට මෙබඳු ඇත්රුවනෙක් පහළ විය.

අස්රුවන

8. තව ද අනෙකක් කියම්. අනඳයෙනි, මහසුදස්සන් රජුට අස් රුවනෙක් පහළ විය. ඒ කය මුළුල්ල සුදු වූ, කළු හිසක් ඇති, මුදු තෘණ බඳු කෙහෙ ඇති, ඉදුමත්, අහසින් යන, වලාහක නම් අස් රජ ය. උහු දැක්මෙන් 'ඉදින් හික්මුණු බවට පැමිණියේ වී නම්, සොඳුරු අස් යානයෙකැ' යි මහසුදස්සන් රජුගේ සිත පැහැදුණේ ය. අනඳයෙනි, එ කල්හි ඒ අස් රුවන බොහෝ කලක් මනා ව දමුණු සොඳුරු අජානී අසක්හු මෙන් ම දමුණු බවට පැමිණියේ ය. ඒ පෙරැ වූ දයක් කියම්. අනඳයෙනි, මහසුද-සුන් රජ එ ම අස්රුවන විමසතුයේ පෙරවරු සෙමෙහි උහු අරා මුහුද හිමි කොටැති පොළොව වටා ගොස් කුශාවතී රාජධානියට පෙරළා අවුත් උදේ බොජුන් වැළැඳී ය. අනඳයෙනි, මහ සුදස්සන් රජුට මෙබඳු අස්-රුවනෙක් පහළ විය.

මිණිරුවන

9. තව ද අනෙකක් කියම්. අනඳයෙනි, මහසුදස්සන් රජුට මිණි රුවනෙක් පහළ විය. එය සොඳුරු වූ පිරිසිදු ආකරයෙහි උපන, අටැස්, මොනොවට පිරියම් කරන ලද, පැහැදිලි වූ, වෙසෙසින් පහන් වූ, සියලු අයුරින් සම්පූර්ණ වූ වෙරළුමිණෙක. අනඳයෙනි, ඒ මිණිරුවනේ එළිය හාත්පස යොත්නක් තැන් පැතිරැ පැවැත්තේ විය. අනඳයෙනි, ඒ පෙරැ දයක් කියම්. මහසුදස්සන් රජ එ ම මිණිරුවන විමසතුයේ, සිවුරඟ සෙන් සන්නාහ සන්නද්ධ කොට, මිණි රුවන දද මුදුනට නංවා, රෑ ගනදුරෙහි නික්මුණේ ය. අනඳයෙනි, හාත්පසැ යම් ගම් කෙනෙක් වූහු ද, ඔහු 'දහවලැ' යි හඟනාහු, ඒ එළියෙන් වැඩ ඇරිඹූහු. අනඳයෙනි, මහසුදස්සන් රජුට මෙ බඳු වූ මිණිරුවනෙක් පහළ විය.

Free Distribution www.aathaapi.org

ඉත්ථිරතනං

10. පුන ච පරං ආනන්ද රඤ්ඤෝ මහාසුදස්සනස්ස ඉත්ථිරතනං පාතුරහොසි, අභිරූපා දස්සනීයා පාසාදිකා පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතා, නාතිදීඝා නාතිරස්සා නාතිකිසා නාතිථූලා නාතිකාළී නාවෙවාදතා අතික්කන්තා මානුසං වණ්ණං[1] අප්පත්තා දිබ්බං වණ්ණං. තස්ස ඛො පනානන්ද ඉත්ථිරතනස්ස එවරූපො කායසම්ඵස්සො හොති, සෙය්යථාපි නාම තූලපිචුනො වා කප්පාසපිචුනො වා. තස්ස ඛො පනානන්ද ඉත්ථිරතනස්ස සීතෙ උණ්හානි ගත්තානි හොන්ති, උණ්හෙ සීතානි. තස්ස ඛො පනානන්ද ඉත්ථිරතනස්ස කායතො චන්දනගන්ධො වායති. මුඛතො උප්පලගන්ධො. තං ඛො පනානන්ද ඉත්ථිරතනං රඤ්ඤෝ මහාසුදස්සනස්ස පුබ්බුට්ඨායිනී අහොසි පච්ඡානිපාතිනී කිංකාරපටිස්සාවිනී මනාපචාරිනී පියවාදිනී. තං ඛො පනානන්ද ඉත්ථිරතනං රාජානං මහාසුදස්සනං මනසාපි නො දූසේසි[2], කුතො පන කායෙන. රඤ්ඤෝ ආනන්ද මහාසුදස්සනස්ස එවරූපං ඉත්ථිරතනං පාතුරහොසි.

ගහපතිරතනං

11. පුන ච පරං ආනන්ද රඤ්ඤෝ මහාසුදස්සනස්ස ගහපතිරතනං පාතුරහොසි. තස්ස කම්මවිපාකජං දිබ්බචක්ඛු පාතුරහොසි, යෙන නිධිං පස්සති සස්සාමිකම්පි අස්සාමිකම්පි. සො රාජානං මහාසුදස්සනං උපසඞ්කමිත්වා එවමාහ: අප්පොස්සුක්කො ත්වං දෙව හොහි, අහං තෙ ධනෙන ධනකරණීයං කරිස්සාමීති. භූතපුබ්බං ආනන්ද රාජා මහාසුදස්සනො තමෙව ගහපතිරතනං වීමංසමානො නාවං අභිරුහිත්වා මජ්ඣෙ ගඞ්ගාය නදියා සොතං ඔගාහිත්වා ගහපතිරතනං එතදවොච: අප්පො මෙ ගහපති· භිරඤ්ඤසුවණ්ණනාති' තෙන හි මහාරාජ එකං තීරං නාව උපෙතූති ඉධෙව මෙ ගහපති අප්පො භිරඤ්ඤසුවණ්ණනාති. අථ ඛො තං ආනන්ද ගහපතිරතනං උභොහි හත්ථෙහි උදකං ඔමසිත්වා පුරං භිරඤ්ඤස්ස වණ්ණස්ස කුම්භිං උද්ධරිත්වා රාජානං මහාසුදස්සනං එතදවොච: අලමෙත්තාවතා මහාරාජ, කතමෙත්තාවතා මහාරාජ, පූජිතමෙත්තාවතා මහාරාජාති. රාජා මහාසුදස්සනො එවමාහ: අලමෙත්තාවතා ගහපති, කතමෙත්තාවතා ගහපති පූජිතමෙත්තාවතා ගහපතීති. රඤ්ඤෝ ආනන්ද මහාසුදස්සනස්ස එවරූපං ගහපතිරතනං පාතුරහොසි.

---

1. මානුසකිවණ්ණං – සී්‍ය., මානුසිවණ්ණං (මජ්ඣ.)
2. අභිවදි – කං

Free Distribution www.aathaapi.org

ඉතිරි රුවන

10. තව ද අනෙකක් කියමි. අනඳයෙනි, මහසුදසුන් රජුට වෙසෙයි රූ ඇති, දැකුම්කලු, සිත පහදවන, උතුම් පැහැසපුයෙන් යුත්, ඉතා නො උස්, ඉතා නොමිටි, ඉතා කෙට්ටු නොවූ, ඉතා නො තර, ඉතා නො කලු, ඉතා නොසුදු, මිනිස් පැහැසපුව ඉක්මැවූ, දෙව් පැහැසපුවට නො පැමිණි ස්ත්‍රියක් වූ ඉතිරි රුවන පහළ විය. අනඳයෙනි, ඉඹුල් පුලුනෙහි හෝ කපු පුලුනෙහි සෙයින් ඒ ඉතිරිරුවනගේ මොළොක් පහස වෙයි. අනඳයෙනි, ශීත සමයෙහි ඒ ඉතිරි රුවන ගේ ගාත්‍රයෝ උණුසුම් වෙත්, උෂ්ණ සමයෙහි සිසිල් වෙත්. අනඳයෙනි, ඒ ස්ත්‍රිරත්නයා ගේ කයින් සඳුන් සුවඳ හමයි, මුවින් මහනෙල් මල් සුවඳ හමයි. අනඳයෙනි, ඒ ස්ත්‍රිරත්නය මහසුදසුන් රජුට කලින් ම නැඟී සිටිනුයේ ද, වතාවත් නිමවා පසු වැ හිඳුනෙ ද, කුමක් කරම් ද' යි විමසා ම කරනුයේ ද, රජුට මන වඩනා දෑ ම කරනුයේද, පිය බස් ම තෙපලනුයේද වෙයි. අනඳයෙනි, ඒ ඉතිරි රුවන සිතිනුදු මහ සුදසුන් රජු ඉක්මැ නො හැසිරෙන්නේ වීය (සිතිනුදු අනෙකකු නො පැතීය). කයින් එසේ හැසිරීමෙක් කොයින් ලැබේ ද? අනඳයෙනි, මහසුදසුන් රජුට මෙබඳු ඉතිරි රුවනෙක් පහළ විය.

ගැහැවිරුවන

11. තව ද අනෙකක් කියමි. අනඳයෙනි, ඒ මහසුදසුන් රජුට ගැහැවි රුවනෙක් පහළ විය. යමෙකින් භිමියන් ඇත්තාවූ ද භිමියන් නැත්තා වූ ද නිධාන දක්නේ ද එසේ වූ කර්මවිපාකජ දිවැසෙක් ඒ ගැහැවි රුවනට පහළ විය. හේ මහසුදසුන් රජු කරා එළැඹ ' දෙවියනි, ඔබ මන්-දෙත්සාහ වන්න, ඔබට ධනයෙන් කටයුතු දෑ මම ධනයෙන් කැරැදෙන්-නෙමි'' යි මෙසේ සැළ කෙළේ ය. ඒ පෙර වූවක් කියමි. අනඳයෙනි, මහසුදසුන් රජ එ ම ගැහැවි රුවන විමසනුයේ, නැවක නැඟ ගංගා නදිය මැද දිය පහරට බැස, ගැහැවිරුවන බණවා, 'ගැහැවිය, මට අමු රනින් හා ශුද්ධ කළ රනින් ප්‍රයෝජන ඇතැ' යි කී ය. 'මහරජුනි, එසේ වී නම් එක් තෙරකට නැව එළැඹේව' යි හේ කී ය. 'ගැහැවිය, මෙහි දී ම මට හිරණ්‍ය ස්වර්ණයෙන් වැඩෙක් ඇතැ' යි රජ කීය. අනඳයෙනි, එ කල්හි ඒ ගැහැවිරුවන දෝතින් දිය ස්පර්ශ කොට හිරණ්‍ය ස්වර්ණයෙන් පිරුණු සැළියක් ඔසොවා ගෙන මහසුදසුන් රජුට ''මහරජුනි, මෙතෙකින් සෑහේ ද? මෙ තෙකින් කටයුත්ත කරන ලද්දේ වේ ද? මහරජුනි, මෙතෙකින් ඔබ වචනය පිදුණේ ද?'' යි කී ය. මහසුදසුන් රජ ''ගැහැවිය මෙ තෙකින් සෑහෙයි, ගැහැවිය මෙතෙකින් කටයුත්ත කරන ලද ය, ගැහැවිය, මෙතෙකින් මා වචන පිදිණැ'' යි කී ය. අනඳයෙනි, මහසුදසුන් රජුට මෙබඳු වූ ගැහැවිරුවනෙක් පහළ විය.

Free Distribution www.aathaapi.org

පරිනායකරතනං

12. පුන ච පරං ආනන්ද රඤ්ඤෝ මහාසුදස්සනස්ස පරිනායකරතනං පාතුරහොසි පණ්ඩිතො වියත්තො මෙධාවී පටිබලො රාජානං මහාසුදස්සනං උපයාපෙතබ්බං උපයාපෙතුං අපයාපෙතබ්බං අපයාපෙතුං. සො රාජානං මහාසුදස්සනං උපසඞ්කමිත්වා එවමාහ: අප්පොස්සුක්කො ත්වං දෙව හොහි, අහමනුසාසිස්සාමීති, රඤ්ඤෝ ආනන්ද මහාසුදස්සනස්ස එවරූපං පරිනායකරතනං පාතුරහොසි; රාජා ආනන්ද මහාසුදස්සනො ඉමෙහි සත්තහි රතනෙහි සමන්නාගතො අහොසි.

ඉද්ධිසමන්නාගමො

13. පුන ච පරං ආනන්ද රාජා මහාසුදස්සනො චතූහි ඉද්ධීහි සමන්නාගතො අහොසි. කතමාහි චතූහි ඉද්ධීහි? ඉධ ආනන්ද රාජා මහාසුදස්සනො අභිරූපො අහොසි දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො අතිවිය අඤ්ඤෙහි මනුස්සෙහි. රාජා ආනන්ද මහාසුදස්සනො ඉමාය පඨමාය ඉද්ධියා සමන්නාගතො අහොසි.

පුන ච පරං ආනන්ද රාජා මහාසුදස්සනො දීඝායුකො අහොසි චිරට්ඨිතිකො අතිවිය අඤ්ඤෙහි මනුස්සෙහි. රාජා ආනන්ද මහාසුදස්සනො ඉමාය දුතියාය ඉද්ධියා සමන්නාගතො අහොසි.

පුන ච පරං ආනන්ද රාජා මහාසුදස්සනො අප්පාබාධො අහොසි අප්පාතඞ්කො සමවෙපාකිනියා ගහණිසා සමන්නාගතො නාතිසීතාය නාවචුණ්ණාය අතිවිය අඤ්ඤෙහි මනුස්සෙහි. රාජා ආනන්ද මහාසුදස්සනො ඉමාය තතියාය ඉද්ධියා සමන්නාගතො අහොසි.

පුන ච පරං ආනන්ද රාජා මහාසුදස්සනො බ්‍රාහ්මණගහපතිකානං පියො අහොසි මනාපො. සෙය්‍යථාපි ආනන්ද පිතා පුත්තානං පියො හොති. මනාපො, එවමෙව ඛො ආනන්ද රාජා මහාසුදස්සනො බ්‍රාහ්මණගහපතිකානං පියො අහොසි මනාපො රඤ්ඤෝ පි ආනන්ද මහාසුදස්සනස්ස බ්‍රාහ්මණගහපතිකා පියා අහෙසුං මනාපා. සෙය්‍යථාපි ආනන්ද පිතු පුත්තා පියා හොන්ති මනාපා එවමෙව ඛො ආනන්ද රඤ්ඤෝ මහාසුදස්සනස්ස බ්‍රාහ්මණගහපතිකා පියා අහෙසුං මනාපා. සෙය්‍යථාපි ආනන්ද පිතු පුත්ත පියා හොන්ති මනාපා එවමෙව ඛො ආනන්ද රඤ්ඤෝ මහාසුදස්සනස්ස බ්‍රාහ්මණගහපතිකා පියා අහෙසුං මනාපා. භූතපුබ්බං ආනන්ද රාජා මහාසුදස්සනො චතුරඞ්ගිනියා සෙනාය උය්‍යානභූමිං නිය්‍යාසි. අථ ඛො ආනන්ද බ්‍රාහ්මණගහපතිකා රාජානං මහාසුදස්සනං උපසඞ්කමිත්වා එවමාහංසු 'අතරමානො දෙව යාහි යථා තං මයං චිරතරං පස්සෙය්‍යාමා'ති රාජා පි ආනන්ද මහාසුදස්සනො සාරථිං ආමන්තෙසි අතරමානො සාරථි රථං පෙසෙහි යථාහං බ්‍රාහ්මණගහපතිකෙහි චිරතර පස්සී යය්‍යන්ති. රාජා ආනන්ද මහාසුදස්සනො ඉමාය චතුත්ථියා[1] ඉද්ධියා සමන්නාගතො අහොසි.

රාජා ආනන්ද මහාසුදස්සනො ඉමාහි චතූහි ඉද්ධීහි සමන්නාගතො අහොසි.

---

1. චතුත්ථාය (ස්‍යා)

Free Distribution www.aathaapi.org

පිරිනා රුවන

12. තව ද අනඳයෙනි, පණ්ඩිත වූ, ව්‍යක්ත වූ, ප්‍රකෘති ප්‍රඥා ඇති, මහසුදස්සන් රජ්ජු කරා එළැඹිය යුත්තහු එළඹවනානට ද, බැහැර කළ යුත්තහු බැහැර කරවන්නට සමර්ථ වූ පරිනායක රත්නය ද (පුත්‍ර රත්නය ද) පහළ විය. ඉහ තෙම මහ සුදස්සන් රජු කරා එළැඹ 'දෙවයිනි, ඔබ මන්දෙක්සාහ වන්න, මම රට අනුසස්නෙමි' යි මෙසේ කී ය. අනඳයෙනි, මහසුදස්සන් රජුට මෙබඳු පරිනායක රත්නයෙක් පහළ විය. අනඳයෙනි, මහසුදස්සන් රජ මේ සත් රුවනින් සමන්විත විය.

සෘද්ධිසමන්වාගමය

13. තව ද, අනඳයෙනි, මහසුදස්සන් රජ සතර සෘද්ධින්ගෙන් සමන්විත විය. කවර සතර සෘද්ධින්ගෙන් ද? යත්: අනඳයෙනි, මෙහි මහ සුදස්සන් රජ වෙසෙස් රූ ඇත්තේ, (අකෘත්තිකර දසුන් ඇතියෙන්) දක්නට සුදුසු වූයේ, දුටුවන් පහදවනුයේ, සෙසු මිනිස්නට වඩා අතිසයින් උතුම් පැහැ සටහනින් සමන්විත වූයේ වී ය. අනඳයෙනි, මහසුදස්සන් රජ මේ පළමු වන සෘද්ධියෙන් සමන්විත වී ය.

තව ද අනඳයෙනි, මහසුදස්සන් රජ සෙසු මිනිස්නට වඩා දීර්ඝ ආයුෂ ඇත්තේ බොහෝ කල් සිටුනේ වී ය. අනඳයෙනි, මහ සුදස්සන් රජ මේ දෙවෙනි සෘද්ධියෙන් සමන්විත වී ය.

තව ද අනඳයෙනි, මහ සුදස්සන් රජ ආබාධ නැත්තේ, රොග නැත්තේ, ඉතා ශීත ද නොවූ, ඉතා උෂ්ණ ද නොවූ, සෙසු මිනිස්නට වැඩි කරම් වූ සම ලෙස අහර පැසවන උදරාග්නියෙන් සමන්විත වී ය. අනඳයෙනි, මහසුදස්සන් රජ මේ තෙවෙනි සෘද්ධියෙන් සමන්විත වී ය.

තව ද අනඳයෙනි, මහ සුදස්සන් රජ බමුණනට ද ගැහැවියනට ද ප්‍රිය ද මනාප ද වී ය. අනඳයෙනි, පියා පුතුනට යමසේ ප්‍රියත් මනාපත් වේ ද, එසේ ම මහසුදස්සන් රජ බමුණනටත් ගැහැවියනටත් ප්‍රිය ද මනාප ද වී ය. අනඳයෙනි, මහසුදස්සන් රජුට ද බමුණෝත් ගැහැවියෝත් පිය දමනාප ද වූහ. අනඳයෙනි, යමසේ පියාට පුත්‍රයෝ ප්‍රියත් මනාපත් වෙත් ද, එසේ ම මහ සුදස්සන් රජුට ද බමුණෝත් ගැහැවියෝත් ප්‍රිය ද මනාප ද වූහ.

අනඳයෙනි, පෙරැ දවසැ මහ සුදස්සන් රජ සිවුරහ සෙනඟින් උපලක්ෂිත වැ උයන් බිම බලා නික්මුණේ ය. අනඳයෙනි, එ කල්හි බමුණෝත් ගැහැවියෝත් මහසුදස්සන් රජු කරා එළැඹ, දෙවයිනි, යමසේ අපි බොහෝ වේලාවක් ඔබ දක්කැ හැකි වන නමෝ ද, එසේ නො යුහු වැ වඩින්නැ' යි මෙසේ කිහ. අනඳයෙනි, මහසුදස්සන් රජ ද රියැදුරා අමතා, 'සැරිය, යම් සේ මම බමුණු ගැහැවියන් විසින් බොහෝ වේලා දක්නා ලබනු හැකි වන්නෙම් ද, එසේ සෙමෙන් රිය යවව' යි මෙසේ කී ය. අනඳයෙනි, මහ සුදස්සන් රජ මේ සතර වන සෘද්ධියෙන් සමන්විත වී ය.

අනඳයෙනි, මහසුදස්සන් රජ මේ සතර සෘද්ධින් ගෙන් සමන්විත වී ය.

Free Distribution www.aathaapi.org

පොක්ඛරණිමාපනං

14. අථ ඛො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස එතදහොසි: යන්නූනාහං ඉමාසු තාලත්තරිකාසු ධනුසතෙ ධනුසතෙ පොක්ඛරණියො මාපෙය්යන්ති. මාපෙසි ඛො ආනන්ද රාජා මහාසුදස්සනො තාසු තාලත්තරිකාසු ධනුසතෙ ධනුසතෙ පොක්ඛරණියො. තා ඛො පනානන්ද පොක්ඛරණියො චතූහං වණ්ණෙහි අහෙසුං, එකා ඉට්ඨකාමයි චිතා අහෙසුං, එකා සොවණ්ණමයා, එකා රූපියමයා, එකා වෙළුරියමයා, එකා ඵළිකමයා' තාසු ඛො පනානන්ද පොක්ඛරණීසු චත්තාරි චත්තාරි ච සොපාණානි අහෙසුං චතූහං වණ්ණෙහි. එකං සොපාණං සොවණ්ණමයං එකං රූපියමයං එකං වෙළුරියමයං එකං ඵළිකමයං. සොවණ්ණමයස්ස සොපාණස්ස සොවණ්ණමයා ථම්භා අහෙසුං රූපියමයා සූචි-මයා ච උණ්හීසඤ්ච රූපියමයස්ස සොපාණස්ස රූපියමයා ථම්භා අහෙසුං, සොවණ්ණමයා සූචියා ච උණ්හීසඤ්ච වෙළුරියමයස්ස සොපාණස්ස වෙළුරියමයා ථම්භා අහෙසුං, ඵළිකමයා සූචියා ච උණ්හීසඤ්ච. ඵළිකමයස්ස සොපාණස්ස ඵළිකමයා ථම්භා අහෙසුං, වෙළුරියමයා සූචියා ච උණ්හීසඤ්ච. තා ඛො පනානන්ද පොක්ඛරණියො දළ්හාහි වෙදිකාහි පරික්ඛිත්තා අහෙසුං එකා වෙදිකා සොවණ්ණමයා එකා රූපියමයා. සොවණ්ණමයාය වෙදිකාය සොවණ්ණමයා ථම්භා අහෙසුං රූපියමයා සූචියා ච උණ්හීසඤ්ච රූපියමයාය වෙදිකාය රූපියමයා ථම්භා අහෙසුං සොවණ්ණමයා සූචියා ච උණ්හීසඤ්ච. අථ ඛො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස එතදහොසි "යන්නූනාහං ඉමාසු පොක්ඛරණීසු එවරූපං මාලං රොපාපෙය්යං: උප්පලං පදුමං කුමුදං පුණ්ඩරීකං සඵෙඛාතුකං සබ්බජනස්ස අනාවටන්ති රොපාපෙසි ඛො ආනන්ද රාජා මහාසුදස්සනො තාසු පොක්ඛරණීසු එවරූපං මාලං උප්පලං පදුමං කුමුදං පුණ්ඩරීකං සඵෙඛාතුකං සබ්බජනස්ස අනාවටං.

15. අථ ඛො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස එතදහොසි: "යන්නූනාහං ඉමාසං පොක්ඛරණීනං තීරෙ නහාපකෙ පුරිසෙ යාපෙය්යං යෙ ආගන්තාගතං ජනං නහාපෙස්සන්තී"ති. යාපෙසි ඛො ආනන්ද රාජා මහාසුදස්සනො තාසං පොක්ඛරණීනං තීරෙ නහාපකෙ පුරිසෙ යෙ ආගන්තාගතං ජනං නහාපෙසුං.

අථ ඛො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස එතදහොසි: යන්නූනාහං ඉමාසං පොක්ඛරණීනං තීරෙ එවරූපං දානං පට්ඨපෙය්යං අන්නං අන්නත්ථිකස්ස[1] පානං පානත්ථිකස්ස වත්ථං වත්ථත්ථිකස්ස යානං යානත්ථිකස්ස සයනං සයනත්ථිකස්ස ඉත්ථිං ඉත්ථත්ථිකස්ස භිරඤ්ඤං භිරඤ්ඤත්ථිකස්ස සුවණ්ණං සුවණ්ණත්ථිකස්සාති. පට්ඨපෙසි ඛො ආනන්ද රාජා මහාසුදස්සනො තාසං පොක්ඛරණීනං තීරෙ එවරූපං දානං: අන්නං අන්නත්ථිකස්ස පානං පානත්ථිකස්ස වත්ථං වත්ථත්ථිකස්ස යානං යානත්ථිකස්ස සයනං සයනත්ථිකස්ස ඉත්ථිං ඉත්ථත්ථිකස්ස භිරඤ්ඤං භිරඤ්ඤත්ථිකස්ස සුවණ්ණං සුවණ්ණත්ථිකස්සාති.

1. අන්නත්ථිකස්ස (සී॰, කං॰,PTS)

Free Distribution www.aathaapi.org

පොකුණු මැවීම

14. අනඳයෙනි, එ කල්හි මහසුදස්සුන් රජහට, 'මේ තල්රුක් අතර දුනු සියක් දුනු සියක් තන්හි පොකුණු කැරැවීම් නම් යෙහෙකැ' යි මේ සිත විය. අනඳයෙනි, මහසුදස්සුන් රජ තෙම ඒ තල්රුක් අතර දුනු සියයක් දුනුසියයක් තැනැ පොකුණු කැරැවී ය. අනඳයෙනි, ඒ පොකුණු සිවුවණක් ගඩොළුයෙන් බඳනා ලද්දහු වූහ. එක් ගඩොළු කෙනෙක් රන්මුවා වූහ. එක් ගඩොළු කෙනෙක් රිදීමුවා වූහ, එක් ගඩොළු කෙනෙක් වෙරළුමිණි මුවා වූහ. එක් ගඩොළු කෙනෙක් පළිඟුමුවා වූහ. අනඳයෙනි, ඒ පොකුණුවලැ සිවු පැහැයෙන් නිමි සිවු සිවු හිණිමං කෙනෙක් වූහ. (එහි) එක් හිමණක් රන්මුවා විය. එකෙක් රිදීමුවා විය, එකෙක් වෙරළුමිණිමුවා විය, එකෙක් පළිඟුමුවා විය. රන්මුවා හිණෙහි රන්මුවා ටැම්හු ද රිදීමුවා පියගැට ද හිණිහිස ද වූහ. රිදීමුවා හිණෙහි රිදීමුවා ටැම්හු ද රන්මුවා පියගැටද හිණිහිස ද වූහ. වෙරළුමිණිමුවා හිණෙහි වෙරළුමිණිමුවා ටැම්හු ද පළිඟුමුවා පියගැට ද හිණිහිස ද වූහ. පළිඟුමුවා හිණෙහි පළිඟුමුවා ටැම්හු ද වෙරළුමිණිමුවා පියගැට ද හිණිහිස ද වූහ.

අනඳයෙනි, ඒ පොකුණුහු වූ කලි පිල්කඩ දෙකෙකින් පිරිකෙවුණෝ වූහ. එක් පිල්කඩෙක් රන්මුවා ද එක් පිල්කඩෙක් රිදීමුවා ද විය. රන්මුවා පිල්කඩෙහි රන්මුවා ටැම්හු ද රිදීමුවා පියගැට ද මුදුන ද වූහ. රිදීමුවා පිල් කඩෙහි රිදීමුවා ටැම්හු ද රන්මුවා පියගැට ද මුදුන ද වූහ. අනඳයෙනි, එ කල්හි මහසුදස්සුන් රජහට 'මේ පොකුණුවලැ හැම සෘතුයෙහි ම පිපෙන සේ වූ උපුල් පියුම් කුමුදු පඬෙර (හෙළ පියුම්) යන මෙ බදු මල් ගස් හැම දෙනාට ඇවුරුම් නැතිසේ සාධාරණ කොට රොපණ කැරැවීම් නම් යෙහෙකැ' යි මේ සිත විය. අනඳයෙනි, මහසුදස්සුන් රජ ඒ පොකුණුවලැ ඇවුරුම් නැතිසේ හැම දෙනාට සාධාරණ කොට හැම සෘතුයෙහි ම පිපෙන සේ වූ උපුල් පියුම් කුමුදු පඬෙර යන මෙ බදු මල්ගස් රොපණ කැරැවී ය.

15. අනඳයෙනි, එ කල්හි මහසුදස්සුන් රජුට මේ පොකුණුතෙරැ ආ ආ ජනයා නැවන ස්ථාපයකයන් තැබීම් නම් යෙහෙකැ' යි මේ සිත විය. අනඳයෙනි, මහසුදස්සුන් රජ පොකුණු තෙරැ ආ ආ ජනයා නැවන ස්ථාපකයන් තැබී ය.

ඉක්බිති 'මේ පොකුණු තෙරැ අහර කැමැත්තහුට අහර ද, පැන් කැමැත්තහුට පැන් ද, වස්ත්‍ර කැමැත්තහුට වස්ත්‍ර ද, යාන කැමැත්තහුට යාන ද, යහන් කැමැත්තහුට යහන් ද, ස්ත්‍රියක කැමැත්තහුට ස්ත්‍රිය ද, අමුරන් කැමැත්තහුට අමුරන් ද, රත්රන් කැමැත්තහුට රත්රන් ද යි මෙසේ වූ දනයක් පිහිටුවීම් නම් යෙහෙකැ යි මහසුදස්සුන් රජුට මේ සිත විය. අනඳයෙනි, මහසුදස්සුන් රජ ඒ පොකුණුතෙරැ අහර කැමැත්තහුට අහර ද, පැන් කැමැත්තහුට පැන් ද, වස්ත්‍ර කැමැත්තහුට වස්ත්‍ර ද, යාන කැමැත්තහුට යාන ද, යහන් කැමැත්තහුට යහන් ද, ස්ත්‍රියක කැමැත්තහුට ස්ත්‍රිය ද, අමුරන් කැමැත්තහුට අමුරන් ද, රත්රන් කැමැත්තහුට රත්රන් ද යි මෙසේ වූ දනයක් පිහිටුවී ය.

Free Distribution www.aathaapi.org

16. අථ ඛො ආනන්ද බ්‍රාහ්මණගහපතිකා පහූතං සාපතෙය්‍යං ආදාය රාජානං මහාසුදස්සනං උපසඞ්කමිත්වා එවමාහංසු; ඉදං දෙව පහූතං සාපතෙය්‍යං දෙවඤ්ඤෙව උද්දිස්ස ආහතං, තං දෙවො පටිඝණ්හා-තූති. "අලං ගො, මමපිදං පහූතං සාපතෙය්‍යං ධම්මකෙන බලිනා අභිසඞ්ඛතං තං වො හොතු, ඉතො ච භියොා හරථා"ති. තෙ රඤ්ඤා පටිකඛිත්තා එකමන්තං අපක්කම්ම එවං සමචින්තෙසුං: 'න ඛො එතං අම්හාකං පතිරූපං, යං මයං ඉමානි සාපතෙය්‍යානි පුනදෙව සකානි ඝරානි පටිහරෙය්‍යාමාති, යන්නූන මයං රඤ්ඤො මහාසුදස්සනස්ස නිවෙසනං මාපෙය්‍යාමා"ති. තෙ රාජානං මහාසුදස්සනං උපසඞ්කමිත්වා එවමාහංසු 'නිවෙසනන්තෙ දෙව මාපෙස්සාමා'ති. අධිවාසෙසි ඛො ආනන්ද රාජා මහාසුදස්සනො තුණ්හීභාවෙන. අථ ඛො ආනන්ද සක්කො දෙවා-නමින්දො රඤ්ඤො මහාසුදස්සනස්ස චෙතසා චෙතො පරිචිතක්කම-ඤ්ඤාය විස්සකම්මං[1] දෙවපුත්තං ආමන්තෙසි, එහි ත්වං සම්ම විස්ස-කම්ම රඤ්ඤො මහාසුදස්සනස්ස නිවෙසනං මාපෙහි ධම්මං නාම පාසාදන්ති.

'එවං භදන්තෙ'ති ඛො ආනන්ද විස්සකම්මා දෙවපුත්තො සක්කස්ස දෙවානමින්දස්ස පටිස්සුත්වා, සෙය්‍යථාපි නාම බලවා පුරිසො සමිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සමිඤ්ජෙය්‍ය, එව-මෙවං දෙවෙසු තාවතිංසෙසු අන්තරහිතො, රඤ්ඤො මහාසුදස්සනස්ස පුරතො පාතුරහොසි. අථ ඛො ආනන්ද විස්සකම්මා දෙවපුත්තො රාජානං මහාසුදස්සනං එතදවොච, නිවෙසනන්තෙ දෙව මාපෙ-ස්සාමි ධම්මං නාම පාසාදන්ති. අධිවාසෙසි ඛො ආනන්ද රාජා මහා සුදස්සනො තුණ්හීභාවෙන. මාපෙසි ඛො ආනන්ද විස්සකම්මා දෙව-පුත්තො රඤ්ඤො මහාසුදස්සනස්ස නිවෙසනං ධම්මං නාම පාසාදං.

17. ධම්මො ආනන්ද පාසාදො පුරත්ථිමෙන ච පච්ඡිමෙන ච යොජනං ආයාමෙන අහොසි, උත්තරෙන ච දක්ඛිණෙන ච අද්ධයොජනං විත්ථා-රෙන, ධම්මස්ස ආනන්ද පාසාදස්ස තිපොරිසං උච්චත්තෙන චත්ථූ චිතං අහොසි චතුත්තං වණ්ණානං ඉට්ඨකාහි, එකා ඉට්ඨකා සොවණ්ණ-මයා එකා රූපියමයා එකා වෙළුරියමයා එකා එළිකමයා.

ධම්මස්ස ආනන්ද පාසාදස්ස චතුරාසීති ථම්භසහස්සානි අහෙසුං චතුත්තං වණ්ණානං, එකො ථම්භො සොවණ්ණමයො, එකො රූපියමයො, එකො වෙළුරියමයො, එකො එළිකමයො. ධම්මො ආනන්ද පාසාදො චතුත්තං වණ්ණානං ඵලකෙහි සන්ථතො අහොසි'

1. චතුත්ථාය – PTS
1. විසුකම්මං – (කා)

Free Distribution www.aathaapi.org

16. අනඳයෙනි, එ කල්හි බමුණෝ ද ගැහැවියෝ ද බොහෝ වස්තුව ගෙන මහ සුදස්සන් රජු කරා එළැඹ, 'දෙවයිනි, මේ බොහෝ වස්තුව දෙවයන් වහන්සේ ම උදෙසා ගෙනෙන ලද්දේ ය. එය දෙවයන් වහන්සේ පිළිගන්නා සේක් වා' යි මෙසේ කීහ. 'භවත්නි, කම් නැත. මගේ ද මේ බොහෝ වස්තුව දැහැමි අය බද්දෙන් පිළියෙල කැරුණේ ය, එය තොපට වේ වා, මෙයින් වැඩි පුර ද ගෙන යවු' යැ යි රජ ඔවුන් දුන් වස්තුව පිළිකෙවී ය. රජු විසින් පිළිකෙවුණු ඔහු එක් පසකට ගොස්, 'මේ වස්තූන් අපි නැවැත සිය ගෙවලට පෙරළා ගෙන යන්නමු යන යමෙක් ඇද්ද, මෙය අපට නො සුදුසු ම ය, අපි (මෙයින්) මහසුදස්සන් රජුට ගෙයක් කරන්නමෝ නම් යෙහෙකැ' යි මෙසේ සිතූහ. ඔහු මහසුදස්සන් රජු වෙත එළැඹ 'දෙව යිනි, ඔබට ගෙයක් කරන්නමු' යි මෙසේ සැළ කළාහ. අනඳයෙනි, මහසුදස්සන් රජ නිහඬ බැවින් එය ඉවැසී ය.

අනඳයෙනි, එ කලැ සක්දෙවිඳු සිය සිතින් මහසුදස්සන් රජුගේ සිතැ කල්පනාව දැන, විස්සම් දෙවිපුතු බණවා, 'යහලු විස්සම්, තෝ මෙහි එව, මහසුදස්සන් රජුට දහම් පා නම් ගෙයක් මවව' යි කී ය. අනඳයෙනි, ' එසේ ය, වහන්සැ' යි කියා ම විස්සම් දෙවිපුත් සක් දෙවිඳුට පිළිවදන් දී ශක්තිමත් පුරුෂයකු විසි කළ අතක් දික් කරනු හෝ දික් කළ අතක් විසි කරනු සේ යුහු ව තව්තිසා දෙව්ලොවැ අතුරු දහන් වැ, මහසුදස්සන් රජු ඉදිරියේ පහළ විය. අනඳයෙනි, ඉක්බිත්තෙන් විස්සම් දෙවිපුත් මහ සුදස්සන් රජුට, 'දෙවයිනි, ඔබට නිවහනක්, දහම් නම් පහයක් මවන්-නෙම්' යි මේ වචන කී ය, අනඳයෙනි, මහසුදස්සන් රජ නිහඬ බැවින් (එය) ඉවැසී ය.

17. අනඳයෙනි, විස්සම් දෙවිපුත් මහසුදස්සන් රජුට නිවහනක්, දහම් නම් පහයක් මැවී ය. අනඳයෙනි, දහම් පහය පෙර දෙසින් ද පැසිම් දෙසින් ද දිගින් යොදුනෙක් විය, උතුරු දෙසින් ද දකුණු දෙසින් ද පුලුලින් අඩ යොදුන් විය. අනඳයෙනි, දහම් පහයේ ගෙඛිම එක්තරා ගඩොළුයෙක් රන්මුවා ද, එක්තරා ගඩොළුයෙක් රිදීමුවා ද එක්තරා ගඩොළුයෙක් වෙරළුමිණිමුවා ද, එක්තරා ගඩොළුයෙක් පළිඟුමුවා ද යි සිවුවණක් ගඩොළුයෙන් උසින් තුන් ඛඹයක් නංවන ලද්දේ විය.

අනඳයෙනි, දහම් පහයේ සිවුවත් ගඩොළුයෙන් නැංවුණු අසූසාර දහසෙක් ටැම්හු වූහ. එක් ටැඹක් රන්මුවා විය, එක් ටැඹක් රිදීමුවා ද එක් ටැඹක් වෙරළුමිණි මුවා ද එක් ටැඹක් පළිඟුමුවා ද විය. අනඳයෙනි, දහම් පහය, එක්තරා පෝරු කෙනෙක් රන්මුවා ද, එක්තරා පෝරු කෙනෙක් රිදීමුවා ද, එක්තරා පෝරු කෙනෙක් වෙරළුමිණිමුවා ද, එක්තරා පෝරු කෙනෙක් පළිඟුමුවා ද යි සිවුවණක් පෝරුයෙන්අතුරන ලද්දේ විය.

Free Distribution www.aathaapi.org

එකං එලකං සොවණ්ණයං, එකං රුපියමයං, එකං වෙළුරියමයං එකං එළිකමයං. ධම්මස්ස ආනන්ද පාසාදස්ස චතුවීසති සොපාණානි අහෙසුං චතුන්නං වණ්ණානං, එකං සොපාණං සොවණ්ණමයං එකා රුපියමයං, එකං වෙළුරියමයං, එකං එළිකමයං–පෙ–එළිකමයස්ස සොපාණස්ස එළිකමයා ථම්භා අහෙසුං වෙළුරියමයා සූචියො ච උණ්හීසඤ්ච.

ධම්මෙ ආනන්ද පාසාදෙ චතුරාසීතිකූටාගාරසහස්සානි අහෙසුං චතුන්නං වණ්ණානං: එකං කූටාගාරං සොවණ්ණමයං, එකං රුපියමයං, එකං වෙළුරියමයං, එකං එළිකමයං, සොවණ්ණමයෙ කූටාගාරෙ රුපියමයො පල්ලඞ්කො පඤ්ඤත්තො අහොසි රුපියමයෙ කූටාගාරෙ සොවණ්ණමයො පල්ලඞ්කො පඤ්ඤත්තො අහොසි, වෙළුරියමයෙ කූටාගාරෙ දන්තමයො පල්ලඞ්කො පඤ්ඤත්තො අහොසි, එළිකමයෙ කූටාගාරෙ මසාරගල්ලමයො පල්ලඞ්කො පඤ්ඤත්තො අහොසි, සොවණ්ණමයස්ස කූටාගාරස්ස ද්වාරෙ රුපියමයො තාලො ඨිතො අහොසි තස්ස රුපියමයො ඛන්ධො. සොවණ්ණමයානි පත්තානි ච එලානි ච. රුපියමයස්ස කූටාගාරස්ස ද්වාරෙ සොවණ්ණමයො තාලො ඨිතො අහොසි, තස්ස සොවණ්ණමයො ඛන්ධො, රුපියමයානි පත්තානි ච එලානි ච, වෙළුරියමයස්ස කූටාගාරස්ස ද්වාරෙ එළිකමයො තාලො ඨිතො අහොසි, තස්ස එළිකමයො ඛන්ධො, වෙළුරියමයානි පත්තානි ච, එලානි ච. එළිකමයස්ස කූටාගාරස්ස ද්වාරෙ වෙළුරියමයො තාලො ඨිතො අහොසි, තස්ස වෙළුරියමයො ඛන්ධො, එළිකමයානි පත්තානි ච එලානි ච.

18. අථ ඛො ආනන්දරඤ්ඤො මහාසුදස්සනස්ස එතදහොසි: යන්නූනාහං මහාවියූහස්ස කූටාගාරස්ස ද්වාරෙ සබ්බසොවණ්ණමයං තාලවනං මාපෙය්‍යං යත්ථ දිවාවිහාරං නිසීදිස්සාමීති. මාපෙසි ඛො ආනන්ද රාජා මහාසුදස්සනො මහාවියූහස්ස කූටාගාරස්ස ද්වාරෙ සබ්බසොවණ්ණමයං තාලවනං යත්ථ දිවාවිහාරං නිසීදී. ධම්මො ආනන්ද පාසාදෙ දවීහි වෙදිකාහි පරිකඛිත්තො අහොසි. එකා වෙදිකා සොවණ්ණමයා එකා රුපියමයා. සොවණ්ණමයාය වෙදිකාය සොවණ්ණමයා ථම්භා අහෙසුං, රුපියමයා සූචියො ච උණ්හීසඤ්ච. රුපියමයාය වෙදිකාය රුපියමයා ථම්භා අහෙසුං, සොවණ්ණමයා සූචියො ච උණ්හීසඤ්ච.

19 ධම්මො ආනන්ද පාසාදෙ දවීහි කිංකිණිකජාලෙහි[1] පරිකඛිත්තො අහොසි, එකං ජාලං සොවණ්ණමයං එකං රුපියමයං සොවණ්ණමයස්ස ජාලස්ස රුපියමයා කිංකිණියො අහෙසුං, රුපියමයස්ස ජාලස්ස සොවණ්ණමයා කිංකිණියො අහෙසුං.

1. කිංකණිකජාලෙහි (ස්‍යා, කා)

Free Distribution www.aathaapi.org

අනඳයෙනි, දහම් පහයේ එක්තරා භිණෙක් රන්මුවා ද එක්තරා භිණෙක් රිදීමුවා ද එක්තරා භිණෙක් වෙරළුමිණිමුවා ද එක්තරා භිණෙක් පළිඟුමුවා ද යි සතර වගයෙකින් නිමි සුවිසි භිණිමං කෙනෙක් වූහ. රන්මුවා භිණෙහි රන්මුවා ටැම්හු ද . . . පළිඟුමුවා භිණෙහි පළිඟුමුවා ටැම්හු ද වෙරළු මිණි මුවා පියගැට ද භිණිභිස් ද වූහ.

අනඳයෙනි, දහම්පහයෙහි එක් කුළුගෙයෙක් රන්මුවා ද, එකෙක් රිදීමුවා ද එකෙක් වෙරළුමිණිමුවා ද එකෙක් පළිඟුමුවා ද යි සිවුවගයෙක සුවාසූ දහසෙක් කුළුගෙවල් වූහ. රන්මුවා කුළුගෙහි රිදීමුවා පළඟෙක් පැනැවුණේ විය. රිදීමුවා කුළුගෙහි රන්මුවා පළඟෙක් පැනැවුණේ විය. වෙරළුමිණිමුවා කුළුගෙහි ඇත්දළමුවා පළඟෙක් පැනැවුණේ විය. පළිඟුමුවා කුළුගෙහි මැසිරිගල්මුවා පළඟෙක් පැනැවුණේ විය. රන්මුවා කුළුගෙහි දෙරැ රිදීමුවා තල්රුකෙක් සිටියේ විය. එහි කඳ රිදීමුවා ද පත්‍ර හා ඵල හා රන්මුවා ද වූහ. රිදීමුවා කුළුගෙයැ දෙරැ රන්මුවා තල් රුකෙක් සිටියේ විය. එහි කඳ රන්මුවා ද පත්‍ර හා ඵල හා රිදීමුවා ද වූහ. වෙරළුමිණිමුවා කුළුගෙයැ දෙරැ පළිඟුමුවා තල්රුකෙක් සිටියේ විය. එහි කඳ පළිඟුමුවා ද පත්‍ර හා ඵල හා වෙරළුමිණිමුවා ද වූහ. පළිඟුමුවා කුළුගෙයැ දෙරැ වෙරළුමිණිමුවා තල්රුකෙක් සිටියේ විය. එහි කඳ වෙරළුමිණිමුවා ද පත්‍ර හා ඵල හා පළිඟුමුවා ද වූහ.

18. අනඳයෙනි, ඒ කල්හි මහසුදසුන් රජුට ''යම් තැනෙක මම දිවාවිහරණ පිණිස හිඳිනෙම් ද, එහි සියල්ල රන්මුවා තල් වනයක් කැරැවීම් නම් යෙහෙකැ'' යි මෙ සිත විය. අනඳයෙනි, ඉක්බිති, යම් තැනෙක මහසුදසුන් රජ දිවා විහරණය පිණිස හිඳුනේ ද, එහි මහාවනුහ කුළුගෙයැ දෙරැ තල්වනයක් කැරැවී ය. අනඳයෙනි, දහම් පහය වෙදිකා (පිල්) දෙකෙකින් පිරිකෙවුණේ විය. එක් වෙදිකායෙක් රන්මුවා විය. අනෙක රිදීමුවා විය. රන්මුවා වෙදිකායෙහි රන්මුවා ටැම්හු ද රිදීමුවා පියගැට හා කණු භිස් හා වූහ. රිදීමුවා වෙදිකායෙහි රිදීමුවා ටැම්හු ද රන්මුවා පියගැට හා කණු භිස් හා වූහ.

19. අනඳයෙනි, දහම්පාය කිකිණි දැල් දෙකෙකින් පිරිකෙවුණේ විය. එක් දැලෙක් රන්මුවා ද එක් දැලෙක් රිදීමුවා ද විය. රන්මුවා දැලෙහි රිදීමුවා කිකිණි (රහුගෙඩි) විය. රිදීමුවා දැලෙහි රන්මුවා කිකිණි (රහුගෙඩි) විය.

Free Distribution www.aathaapi.org

තෙසං බො පනානන්ද කිංකිණිකජාලානං වාතෙරිතානං සද්දෝ අහොසි වග්ගු ච රජනීයෝ ච කමනීයෝ ච මදනීයෝ ච සෙය්‍යථාපි ආනන්ද පඤ්චඞ්ගිකස්ස තූරියස්ස සුවිනීතස්ස සුපපටිතාළිතස්ස සුකුසලෙහි[1] සමන්නාහතස්ස සද්දෝ හොති වග්ගු ච රජනීයෝ ච කමනීයෝ ච මදනීයෝ ච එවමෙව බො ආනන්ද තෙසං කිංකිණිකජාලානං වාතෙරිතානං සද්දෝ අහොසි වග්ගු ච රජනීයෝ ච කමනීයෝ ච මදනීයෝ ච. යෙ බො පනානන්ද තෙන සමයෙන කුසාවතියං රාජධානියා ධුත්තා අහෙසුං සොණ්ඩා පිපාසා. තෙ තෙසං කිංකිණිකජාලානං වාතෙරිතානං සද්දෙන පරිචාරෙසුං

නිට්ඨිතෙ බො පනානන්ද ධම්මෙ පාසාදෙ දුද්දිකෙඛා අහොසි මුසති චක්ඛුනි. සෙය්‍යථාපි ආනන්ද වස්සානං පච්ඡිමෙ මාසෙ සරදසමයෙ වික්ඛ විගතවලාහකෙ දෙවෙ ආදිච්චෝ නභං අබ්භුග්ගච්ඡමානෝ[2] දුද්දිකෙඛා[3] හොති, මුසති චක්ඛුනි, එවමෙව බො ආනන්ද ධම්මෙ පාසාදෙ දුද්දිකෙඛා අහොසි මුසති චක්ඛුනි.

20. අථ බො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස එතදහොසි: යන්නූනාහං ධම්මස්ස පාසාදස්ස පුරතො ධම්මං නාම පොක්ඛරණිං මාපෙය්‍යන්ති. මාපෙසි බො ආනන්ද රාජා මහාසුදස්සනො ධම්මස්ස පාසාදස්ස පුරතො ධම්මං නාම පොක්ඛරණිං. ධම්මා ආනන්ද පොක්ඛරණී පුරත්ථිමෙන ච පච්ඡිමෙන ච යොජනං ආයාමෙන අහොසි, උත්තරෙන ච දක්ඛිණෙන ච අද්ධයොජනං විත්ථාරෙන. ධම්මා ආනන්ද පොක්ඛරණී චතූහි වණ්ණෙහි උවට්ඨාසි චිත්තා අහොසි, එකා ඉට්ඨකා සොවණ්ණමයා එකා රූපියමයා, එකා වෙළුරියමයා එකා එළිකමයා,

ධම්මාය ආනන්ද පොක්ඛරණියා චත්තාරි සොපාණානි අහෙසුං චතූහි වණ්ණෙහි, එකං සොපාණං සොවණ්ණමයං, එකං වෙළුරියමයං, එකං එළිකමයං. සොවණ්ණමයස්ස සොපාණස්ස සොවණ්ණමයා ථම්භා අහෙසුං රූපියමයා සූචියො ච උණ්හීසඤ්ඣ, රූපියමයස්ස සොපාණස්ස රූපියමයා ථම්භා අහෙසුං සොවණ්ණමයා සූචියො ච උණ්හීසඤ්ඣ, වෙළුරියමයස්ස සොපාණස්ස වෙළුරියමයා ථම්භා අහෙසුං එළිකමයා සූචියො ච උණ්හීසඤ්ඣ, එළිකමයස්ස සොපාණස්ස එළිකමයා ථම්භා අහෙසුං වෙළුරියමයා සූචියො ච උණ්හීසඤ්ඣ.

ධම්මා ආනන්ද පොක්ඛරණී දවීහි වෙදිකාහි පරික්ඛිත්තා අහොසි, එකා වෙදිකා සොවණ්ණමයා, එකා රූපියමයා. සොවණ්ණමයාය වෙදිකාය සොවණ්ණමයා ථම්භා අහෙසුං රූපියමයා සූචියො ච උණ්හීසඤ්ඣ, රූපියමයාය වෙදිකාය රූපියමයා ථම්භා අහෙසුං සොවණ්ණමයා සූචියො ච උණ්හීසඤ්ඣ.

---

1. කුසලෙහි. (සීමු, සයා කා, PTS) 2 අබ්භුස්සක්කමානෝ (මජ්ඣං)
3. දුද්දිකෙඛා. PTS.

Free Distribution www.aathaapi.org

අනඳයෙනි, සුළඟින් සැලුණු ඒ කිකිණි දැල්හි මියුරු සිත්කලු මන වඩනා, (ප්‍රීතියෙන්) කුල්මත් කරන හඬෙක් විය. අනඳයෙනි, දක්ෂ වාදකයකු විසින් මොනොවට වැයූ මොනොවට ගැයූ පසැඟි තුරුවන් හඬ යමසේ මියුරුත් සිත් අලවනුත් කන්කලුත් සිත කුල්මත් කරනුත් වේ ද, අනඳයෙනි, එසේ ම සුළඟින් සැලුණු ඒ කිකිණි දැලුන් හඬ මියුරු ද සිත් අලවනු ද මන වඩනු ද සිත් කුල්මත් කරනු ද විය. අනඳයෙනි, එ සමයෙහි කුසාවතී රජදහනැ සුරාසොඬ වූ මත් පැනෙහි ගිජු වූ ධූර්තයෝ වූහ. ඔහු ඒ සුළඟින් සැලුණු කිකිණි දැලුන් හඬින් ඉඳුරන් හැසිරැවූහ (ඊ වටා කිකිණිදැලුන් හඬ අනුව නැටීම් ආදිය කළාහ.)

අනඳයෙනි, නිමියා වූ දහම් පහය බැලිය නො හැකි විය. එය (අධික දීප්තියෙන්) ඇස් අඳුරු කෙරෙයි. අනඳයෙනි, වැසි සාරමසින් පැසිම් මසෙහි සරත් සමයෙහි බැබලුණු, පහ වූ වලා ඇති අහසැ නැඟෙන හිරු යමසේ බැලිය නො හැකි ද, ඇස් අඳුරු කෙරෙයි ද, එසේ ම අනඳයෙනි, දහම් පහය බැලිය නොහැකි විය, ඇස් අඳුරු කරන්නේ විය.

20. අනඳයෙනි, ඉක්බිති මහ සුදසුන් රජුට, 'දහම් පහය ඉදිරියෙහි දහම් නම් පොකුණක් කරවන්නෙම් වීම් නම් යෙහෙකැ' යි මේ සිත විය. අනඳයෙනි, මහසුදසුන් රජ දහම් පාය ඉදිරියෙහි දහම් නම් පොකුණක් කැරැවිය. අනඳයෙනි, පෙර දෙසින් ද පැසිම් දෙසින් ද අයමින් යොදුනෙක් විය. උතුරු දිගින් ද දකුණු දිගින් ද පුලුලින් අඩයොදුන් විය. අනඳයෙනි, දහම් පොකුණ ඇතැම් උළු කෙනෙක් රන්මුවා ද ඇතැම් කෙනෙක් රිදීමුවා ද ඇතැම් කෙනෙක් වෙරළුමිණි මුවා ද ඇතැම් කෙනෙක් පළිඟුමුවා ද යි සිවුවණක් ගඩොළුයෙන් නංවන ලද්දේ විය.

අනඳයෙනි, දහම් පොකුණෙහි, ඇතැම් කෙනෙක් රන්මුවා ද ඇතැම් කෙනෙක් රිදීමුවා ද ඇතැම් කෙනෙක් වෙරෙළුමිණි මුවා ද ඇතැම් කෙනෙක් පළිඟුමුවා ද යි සිවුවණක් රුවනින් නිමියා වූ සුවිසි හිණි කෙනෙක් වූහ. රන්මුවා හිණෙහි රන්මුවා ටැම්හු ද රිදීමුවා පියගැට ද හිස් ද වූහ. රිදීමුවා හිණෙහි රිදීමුවා ටැම්හු ද රන්මුවා පියගැට ද හිස් ද වූහ. වෙරළු මිණිමුවා හිණෙහි වෙරෙළුමිණිමුවා ටැම්හු ද පළිඟුමුවා පියගැට ද හිස් ද වූහ. පළිඟුමුවා හිණෙහි පළිඟුමුවා ටැම්හු ද වෙරෙළුමිණිමුවා පියගැට ද හිස් ද වූහ.

අනඳයෙනි, දහම් පොකුණ එකක් රුවන්මුවා ද එකක් රිදීමුවා ද යි පිල් දෙකෙකින් පිරිකෙවුණේ විය. රන්මුවා පිලෙහි රන්මුවා ටැම්හු ද රිදීමුවා පියගැට ද හිස් ද වූහ. රිදීමුවා පිලෙහි රිදී මුවා ටැම්හු ද රන්මුවා පිය ගැට ද හිස් ද වූහ.

Free Distribution www.aathaapi.org

ධම්මා ආනන්ද පොක්ඛරණී සත්තහි තාලපන්තීහි පාරිකින්නා අහොසි, එකා තාලපන්ති සොවණ්ණමයා, එකා රූපියමයා, එකා වෙළුරියමයා, එකා එළිකමයා, එකා ලොහිතඞ්කමයා, එකා මසාරගල්ලමයා, එකා සබ්බරතනමයා. සොවණ්ණමයස්ස තාලස්ස සොවණ්ණමයො බන්ධො අහොසි රූපියමයානි පත්තානි ච ඵලානි ච. රූපියමයස්ස තාලස්ස රූපියමයො බන්ධො අහොසි සොවණ්ණමයානි පත්තානි ච ඵලානි ච. වෙළුරියමයස්ස තාලස්ස වෙළුරියමයො බන්ධො අහොසි එළිකමයානි පත්තානි ච ඵලානි ච. එළිකමයස්ස තාලස්ස එළිකමයො බන්ධො අහොසි වෙළුරියමයානි පත්තානි ච ඵලානි ච. ලොහිතඞ්කමයස්ස තාලස්ස ලොහිතඞ්කමයො බන්ධො අහොසි මසාරගල්ලමයානි පත්තානි ච ඵලානි ච. මසාරගල්ලමයස්ස තාලස්ස මසාරගල්ලමයො බන්ධො අහොසි ලොහිතඞ්කමයානි පත්තානි ච ඵලානි ච. සබ්බරතනමයස්ස තාලස්ස සබ්බරතනමයො බන්ධො අහොසි සබ්බරතනමයානි පත්තානි ච ඵලානි ච. තාසං ඛො පන ආනන්ද තාලපන්තීනං වාතෙරිතානං සද්දො අහොසි වග්ගු ච රජනීයො ච කමනීයො ච මදනීයො ච. සෙය්‍යථාපි ආනන්ද පඤ්චඞ්ගිකස්ස තූරියස්ස සුවිනීතස්ස සුපට්ඨිතාළිතස්ස කුසලෙහි සමන්නාහතස්ස සද්දො හොති වග්ගු ච රජනීයො ච කමනීයො ච මදනීයො ච, එවමෙව ඛො ආනන්ද තාසං තාලපන්තීනං වාතෙරිතානං සද්දො අහොසි වග්ගු ච රජනීයො ච කමනීයො ච මදනීයො ච. යෙ ඛො පනානන්ද තෙන සමයෙන කුසාවතියා රාජධානියා ධුත්තා අහෙසුං සොණ්ඩා පිපාසා, තෙ තාසං තාලපන්තීනං වාතෙරිතානං සද්දෙසු පරිවාරෙසුං.

නිට්ඨිතෙ ඛො පනානන්ද ධම්මෙ ච පාසාදෙ ධම්මාය ච පොක්ඛරණියා රාජා මහාසුදස්සනො. යෝ[1] තෙන සමයෙන සමණෙසු වා සමණසම්මතා ව්‍රාහ්මණෙසු වා ව්‍රාහ්මණසම්මතා තෙ සබ්බකාමෙහි සන්තප්පෙත්වා ධම්මං පාසාදං අභිරුහි.

පඨමභාණවාරෝ.

1. යෙ ඛො පනානන්ද. (ස්‍යා., කා.)

Free Distribution www.aathaapi.org

අනඳයෙනි, දහම් පොකුණ එක් තල්පෙලක් රන්මුවා ද එක් තල්පෙලක් රිදීමුවා ද එක් තල්පෙලක් වෙරළුමිණිමුවා ද එක් තල්පෙලක් පළිඟුමුවා ද එක් තල්පෙලක් රතුමිණිමුවා ද එක් තල් පෙලක් මැසිරිගල්මුවා ද එක් තල්පෙලක් සියලු රුවන්මුවා ද යි සත් තල්පෙලෙකින් පිරිකෙවුණේ විය. රන්මුවා තල්රුකැ රන්මුවා කඳ ද රිදීමුවා පත්‍ර ද එල ද වූහ. රිදීමුවා තල් රුකෙහි රිදීමුවා කඳ ද රන්මුවා පත්‍ර ද එල ද වූහ. වෙරෙළුමිණිමුවා තල්රුකැ වෙරළුමිණිමුවා කඳ ද පළිඟුමුවා පත්‍ර ද එල ද වූහ. පළිඟුමුවා තල්රුකැ පළිඟුමුවා කඳ ද වෙරෙළුමිණිමුවා පත්‍ර ද එල ද වූහ. රත්මිණිමුවා තල්රුකැ රත්මිණිමුවා කඳ ද මැසිරිගල්මුවා පත්‍ර ද එල ද වූහ. මැසිරිගල්මුවා තල්රුකැ මැසිරිගල්මුවා කඳ ද රත්මිණිමුවා පත්‍ර ද එල ද වූහ. සියලු රුවන් මුවා තල් රුකැ සවිරුවන්මුවා කඳ ද සවිරුවන්මුවා පත් ද පල ද වූහ. අනඳයෙනි, සුළඟින් සැලුණු ඒ තල්රුක් පෙලේ මිහිරි වූ සිත් අලවන, කන්කලු වූ, සිත් මත් කරන හඬෙක් විය. අනඳයෙනි, සමත් තුරුවායකු විසින් මොනොවට වැයූ මොනොවට ගැයූ පසඟතුරුවන් ගොස යමසේ මියුරුත් සිත් අලවනුත් කන්කලුත් සිත කුල්මත් කරනුත් වේ ද, අනඳයෙනි, එසේ ම සුළඟින් සැලුණු ඒ තල්රුක් පෙලේ හඬ මියුරු ද සිත් අලවනු ද කන්කලු ද සිත් කුල්මත් කරනු ද විය. අනඳයෙනි, එසමයෙහි කුසාවතී රජදහනැ සුරාසොඬ වූ මත් පැනෙහි ගිජු වූ යම් ධූර්ත කෙනෙක් වූහු ද, ඔහු ඒ තල්රුක් පෙලැ හඬින් එහි රැස් වැ ඉඳුරන් හැසිරුවූහ (නැටුම් ඇ කළාහ.)

අනඳයෙනි, දහම් පහය ද දහම් පොකුණ ද කරවා නිමැවූ කලැ මහ සුදසුන් රජ, එ සමයෙහි මහණුන් අතුරු මහණ යැ යි සම්මත වූ ද බමුණන් අතුරු බමුණු යැ යි සම්මත වූ ද යම් කෙනෙක් වූහු නම්, ඔවුන් රිසි රිසි හැම දැයින් සකපා, දහම් පහයට නැංගේ ය.

පළමු බණවර යැ.

Free Distribution www.aathaapi.org

ඣානසම්පත්තිපටිලාභෝ

21. අථ ඛෝ ආනන්ද රඤ්ඤෝ මහාසුදස්සනස්ස එතදහෝසි: කිස්ස නු ඛෝ මේ ඉදං කම්මස්ස ඵලං, කිස්ස කම්මස්ස විපාකෝ, යෙනාහං එතරහි එවං මහිද්ධිකෝ එවං මහානුභාවෝ තිඃ අථ ඛෝ ආනන්ද රඤ්ඤෝ මහාසුදස්සනස්ස එතදහෝසි: තිණ්ණං ඛෝ මේ ඉදං කම්මානං ඵලං තිණ්ණං කම්මානං විපාකෝ, යෙනාහං එතරහි එවං මහිද්ධිකෝ එවං මහානුභාවෝ, සෙය්යථීදං: දානස්ස දමස්ස සංයමස්සාති. අථ ඛෝ ආනන්ද රාජා මහාසුදස්සනෝ යෙන මහාවියූහං කූටාගාරං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මහාවියූහස්ස කූටාගාරස්ස ද්වාරෙ ඨිතෝ උදානං උදානෙසි. 'තිට්ඨ කාමවිතක්ක, තිට්ඨ ව්‍යාපාදවිතක්ක, තිට්ඨ විහිංසාවිතක්ක, එත්තාවතා කාමවිතක්ක, එත්තාවතා ව්‍යාපාදවිතක්ක, එත්තාවතා විහිංසාවිතක්කා'ති.

22. අථ ඛෝ ආනන්ද රාජා මහාසුදස්සනෝ මහාවියූහං කූටාගාරං පවිසිත්වා සොවණ්ණමයෙ පල්ලඞ්කෙ නිසින්නෝ විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහාසි. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහාසි. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහාසි. සතො ච සම්පජානෝ සුඛඤ්ච කායෙන පටිසංවෙදෙසි. යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකා සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහාසි, සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛා සතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහාසි.

23. අථ ඛෝ ආනන්ද රාජා මහාසුදස්සනෝ මහාවියූහා කූටාගාරා නික්ඛමිත්වා සොවණ්ණමයං කූටාගාරං පවිසිත්වා රූපියමයෙ පල්ලඞ්කෙ නිසින්නෝ මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහාසි. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහාසි, කරුණාසහගතෙන චෙතසා, -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහාසි. තථා දුතියං, තථා තතියං තථා චතුත්ථං, ඉති උද්ධමධොම තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහාසි.

Free Distribution www.aathaapi.org

දහන් සමවත් ලැබීම

21. අනඳයෙනි, ඉක්බිති "යම් හෙයෙකින් මම් දැන් මෙසේ මහර්ධි ඇතියෙම් ද මහත් ආනුභාව ඇතියෙම් ද, මෙය මගේ කවර කර්මයෙක ඵලයෙක් ද? කවර කර්මයෙක විපාකයෙක් දැ?" යි මහ සුදසුන් රජුට මේ සිත විය. ඉක්බිති අනඳයෙනි, මහසුදසුන් රජුට යම් හෙයෙකින් මම් දැන් මෙසේ මහත් සෘද්ධි ඇතියෙම්, මෙසේ මහත් ආනුභාව ඇතියෙම් වෙම් ද, මෙය දැන දම් සංයම් යන තුන් පින් කම්වල ඵල ය, මේ තුන්-පින්කම් වල විපාකය යැ' යි මේ සිත විය. අනඳයෙනි, ඉක්බිති මහසුදසුන් රජ **මහාව්‍යූහ** කුළුගෙය කරා එළැඹියේ ය. එළැඹ, මහාව්‍යූහ කුළුගෙයැ දෙරැ සිටියේ, "කාමවිතර්කය සිටු. ව්‍යාපාද විතර්කය, සිටු. විහිංසා-විතර්කය, සිටු. කාමවිතර්කය, මෙතෙකින් නවතුව, ව්‍යාපාදවිතර්කය, මෙතෙකින් නවතුව, විහිංසාවිතර්කය, මෙ තෙකින් නවතුව' යි උදන් ඇනී ය.

22. අනඳයෙනි, එයට පසු මහසුදසුන් රජ මහාව්‍යූහ කුළුගෙයට වැද, රන්මුවා පළඟැ හුන්නේ, කාමයන් ගෙන් වෙන් වැ ම, අකුසල් දහමුන් ගෙන් වෙන් වැ ම, විතර්ක සහිත විචාර සහිත, විවෙකයෙන් උපන්, ප්‍රීති-යත් චිත්ත සුඛයත් දැති, පළමු වන දහන ලැබ විසීය. විතර්ක විචාරයන් සංසිඳීමෙන්, තමා තුළැ පැහැදීම ඇති කරන, සිතැ එකඟ බව ඇති විතර්ක රහිත, විචාර රහිත, සමාධියෙන් උපන්, ප්‍රීතියත් සුඛයත් ඇති, දෙවෙනි දහන ලැබ විසී ය. ප්‍රීතිය ද පහ වීමෙන් උපෙක්ෂා ඇත්තේ ද විසී ය. සිහි ඇත්තේ නුවණින් දන්නේ සුවය නාම කයින් විත්දේ ය. 'උපෙක්ෂක වූයේ සිහි ඇත්තේ සුව වූසුම් ඇත්තේ යැ' යි යමක්හු ඇරැඹැ ආර්‍යයෝ කියත් ද, ඒ තෙවෙනි දහන ලැබ විසී ය. සුඛවේදනා ද පහ කිරීමෙන්, දුඃඛවේදනා ද පහ කිරීමෙන් කල් තබා ම සොම්නස් දෙම්නසුන් බැහැරැ ලීමෙන් දුඃඛ වේදනා ද නැති සුඛ වේදනා ද නැති, උපේක්ෂා ව ද සිහිය ද යන දෙදෙනා ගේ පිරිසිදු බව් ඇති සතර වැනි දහන ලැබ විසී ය.

23. අනඳයෙනි, ඉක්බිති මහසුදසුන් රජ මහාව්‍යූහ කූටාගාරයෙන් නික්මැ රන්මුවා කුළුගෙට වැද රිදීමුවා පළඟෙහි හුන්නේ, මෙත් සහගිය සිතින් එක් දෙසක් පැතිරැ විසී ය. එසේ දෙවෙනි දෙස ද තෙවෙනි දෙස ද සිවුවැනි දෙස ද, මෙසේ උඩ ද යට ද සරස ද හැම දෙසැ හැම දෙනා ම ආත්මසමතායෙන් (මේ අන් එකෙකැ යි වෙනසක් නොසිතා තමා හා සමඟවට පැමිණැවීමෙන්) වෛර නැති ව්‍යාපාද නැති, මහත් වූ මහද්ගත වූ අප්‍රමාණ වූ මෙත්සහගිය සිතින් පැතිර විසී ය. එසේ ම කරුණා සහගත සිතින් . . . මුදිතා සහගත සිතින් . . . උපෙක්ෂා සහගත සිතින් එක් දෙසක් පැතිරැ විසී ය. එසේ දෙවෙනි දෙස ද. එසේ තෙවෙනි දෙස ද එසේ සිවුවැනි දෙස ද, මෙසේ උඩ ද යට ද සරස ද හැම දෙසෙහි ම හැම දෙනා ම ආත්මසමතායෙන් (මේ අන් එකෙකැ යි විභාග නො කොට තමා හා සමඟවට පැමිණැවීමෙන්) වෛර නැති ව්‍යාපාද නැති මහත් වූ මහද්ගත වූ අප්‍රමාණ වූ උපෙක්ෂාසහගත සිතින් පැතිර විසී ය.

Free Distribution www.aathaapi.org

නගරාදීනි

24. රඤ්ඤො, ආනන්ද මහාසුදස්සනස්ස චතුරාසීතිනාගරසහස්සානි අහෙසුං කුසාවතීරාජධානිපමුඛානි, චතුරාසීතිපාසාදසහස්සානි අහෙසුං ධම්මපාසාදපමුඛානි, චතුරාසීතිකූටාගාරසහස්සානි අහෙසුං මහාවියූහකූටාගාරපමුඛානි.

චතුරාසීතිපල්ලඞ්කසහස්සානි අහෙසුං සොවණ්ණමයානි රූපියමයානි දන්තමයානි සාරමයානි ගොණකත්ථතානි පටිකත්ථතානි පටලිකත්ථතානි කාදලිමිගපවරපච්චත්ථරණානි සඋත්තරච්ඡදානි උභතොලොහිතකූපධානානි. චතුරාසීතිනාගසහස්සානි අහෙසුං සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි උපොසථනාගරාජපමුඛානි, චතුරාසීතිඅස්සසහස්සානි අහෙසුං සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි වලාහකඅස්සරාජපමුඛානි, චතුරාසීතිරථසහස්සානි අහෙසුං සීහවම්මපරිවාරානි බ්‍යග්ඝවම්මපරිවාරානි දීපිචම්මපරිවාරානි පණ්ඩුකම්බලපරිවාරානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි වෙජයන්තරථපමුඛානි, චතුරාසීතිමණිසහස්සානි අහෙසුං මණිරතනපමුඛානි, චතුරාසීතිඉත්ථීසහස්සානි අහෙසුං සුභද්දාදෙවීපමුඛානි, චතුරාසීතිගහපතිසහස්සානි අහෙසුං ගහපතිරතනපමුඛානි, චතුරාසීතිඛත්තියසහස්සානි අහෙසුං අනුයන්තානි පරිනායකරතනපමුඛානි, චතුරාසීතිධේනුසහස්සානි අහෙසුං ධුවයඤ්ඤානි[1] කංසූපධාරණානි, චතුරාසීතිවත්ථකොටිසහස්සානි අහෙසුං කොම්සුඛුමානං කපාසිකසුඛුමානං කොසෙය්‍යසුඛුමානං කම්බලසුඛුමානං. රඤ්ඤො, ආනන්ද මහාසුදස්සනස්ස චතුරාසීතිථාලිපාකසහස්සානි සායං පාතං භත්තාභිහාරො අභිහරීයිත්ථ.

25. තෙන ඛො පනානන්ද සමයෙන රඤ්ඤො මහාසුදස්සනස්ස චතුරාසීති නාගසහස්සානි සායං පාතං උපට්ඨානං ගච්ඡන්ති. අථ ඛො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස එතදහොසි: ඉමානි ඛො මෙ චතුරාසීති නාගසහස්සානි සායං පාතං උපට්ඨානං ආගච්ඡන්ති. යන්නූන වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන දෙව්වත්තාරිසං නාගසහස්සානි දෙව්වත්තාරිසං නාගසහස්සානි සකිං සකිං උපට්ඨානං ආගච්ඡෙය්‍යුන්ති. අථ ඛො ආනන්ද රාජා මහාසුදස්සනො පරිනායකරතනං ආමන්තෙසි, 'ඉමානි ඛො මෙ සම්ම පරිනායකරතන චතුරාසීතිනාගසහස්සානි සායං පාතං උපට්ඨානං ආගච්ඡන්ති. තෙන හි සම්ම පරිනායකරතන වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන දෙව්වත්තාරිසං නාගසහස්සානි දෙව්වත්තාරිසං නාගසහස්සානි සකිං සකිං උපට්ඨානං ආගච්ඡන්තු ති. 'එවං දෙව,ති ඛො ආනන්ද පරිනායකරතනං රඤ්ඤො මහාසුදස්සනස්ස පච්චස්සොසි. අථ ඛො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස අපරෙන සමයෙන වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන දෙව්වත්තාරිසං නාගසහස්සානි දෙව්වත්තාරිසං නාගසහස්සානි සකිං සකිං උපට්ඨානං ආගමංසු.

1. ධුවසඤ්ඤානි – මජ්ඣං ධුතුලයඤ්ඤානි PTS.

Free Distribution www.aathaapi.org

නගරාදීනු

24. අනඳයෙනි, මහසුදස්සුන් රජුට කුසාවතී රාජධානිය ප්‍රමුඛ කොටැති අසූසාර දහසෙක් නුවරවල් වූහ. දහම් පාය පාමොක් කොටැති සූවාසූ දහසෙක් ප්‍රාසාදයෝ වූහ. මහාව්‍යූහ කූටාගාරය ප්‍රමුඛ කොටැති සූවාසූ දහසෙක් කුළගෙවල් වූහ.

රන්මුවා වූ ද රිදීමුවා වූ ද ඇත්දත්මුවා වූ ද දුවමුවා වූ ද කොඳපලස් අතුළ, සුදු එළලොම්මුවා ඇතිරි අතුළ, ඝන පුප් එළලොම් ඇතිරි අතුළ, කෙහෙල් මුවසමින් කළ උතුම් පසතුරුණු ඇති, උඩුවියන් සහිත, හිස් දෙර පාමුල යන දෙපසැ රතු කත්වයින් ඇති සූවාසූදහසෙක් පළඟහු වූහ. රන් අබරණින් සැදුණු රන් දඳ සහිත, රන්දැලින් වසන ලද, උපොසථ ඇත් රජු පාමොක් කොටැති සූවාසූ දහසෙක් ඇත්තු වූහ. රන් අබරණින් සරසන ලද, රන් දඳ සහිත, රන්දැලින් පිළිසත් වලාහක අස්රජු පාමොක් කොටැති සූවාසූ දහසෙක් අස්සු වූහ. සිංහ සමින් වසන ලද, ව්‍යාඝ්‍ර සමින් වසන ලද, දිවි සමින් වසන ලද, පඩු පැහැ කම්බලයෙන් වසන ලද, රන් අබරණ ඇති, රන් දඳ ඇති, රන් දැලින් වසන ලද, විජයොත් රිය පාමොක් කොටැති රිය සූවාසූ දහසෙක් වූහ. මිණිරුවන පාමොක් කොටැති සූවාසූදහසෙක් මිණිහු වූහ. සුභද්‍රා දේවිය පාමොක් කොටැති සූවාසූ දහසෙක් ස්ත්‍රීහු වූහ. ගැහැවිරුවන පාමොක් කොටැති සූවාසූ දහසෙක් ගැහැවියෝ වූහ. පරිනායක රත්නය පාමොක් කොටැති අනුව යන සූවාසූ දහසෙක් කැත්හු වූහ. හැම කල්හි කිරි දෙවා ගත හැකි රන් සැට-යෙන් සරසන ලද සූවාසූ දහසෙක් දෙන්නූ වූහ. සියුම් කොමු පිළි ද සියුම් කපු පිළි ද සියුම් පට පිළි ද සියුම් කම්බල දූ යි පිළි සූවාසූ කෙළ දහසෙක් විය. අනඳයෙනි, මහසුදස්සුන් රජුට උදේ සවස එළැවෙන බත්තලි සූවාසූ දහසෙක් විය.

25. එ සමයෙහි මහ සුදස්සුන් රජුට සූවාසූ දහසෙක් ඇත්තු උදේ සවස උවටනට යෙත්. එ කලැ මහසුදස්සුන් රජුට ''මේ සූවාසූ දහසෙක් ඇත්තු උදේ සවස මට උවටනට එත්. හවුරුදු සියයක් සියයක් ඇවැමෙන් සතළිස් දෙදහසෙක් සතළිස් දෙදහසෙක් ඇත්තු එක් වරක් එක් වරක් මට උවටනට එන්නාහු නම් මැනැවැ'' යි මේ සිත විය. ඉක්බිති අනඳයෙනි, මහසුදස්සුන් රජ පරිනායක රුවින බණවා, ''සඟය පරිනායක රත්නය, මේ සූවාසූ දහසෙක් ඇත්තු උදේ සවස උවටනට එත්. සඟය, පරිනායක රත්නය, එ බැවින් හවුරුදු සියයක් සියයක් ඇවැමෙන් දෙසාළිස් දහසෙක් දෙසාළිස් දහසෙක් ඇත්තු එක් වරක් එක් වරක් උවටනට එත් වා'' යි කී ය. අනඳයෙනි, 'එසේ ය, දෙවයිනි' යි කියා පරිනායක රත්නය මහසුදස්සුන් රජුට පිළිවදන් ඇස්විය. අනඳයෙනි, එයට පසු කලැ හවුරුදු සියයක් සියයක් ඇවැමෙන් ඇත්තු දෙසාළිස් දහසෙක් දෙසාළිස් දහසෙක් එක් වරක් එක් වරක් උවටනට ආහ.

Free Distribution www.aathaapi.org

සුභද්‍ද ගුපසඞ්කමනං

26. අථ ඛො ආනන්‍දො සුභද්‍දය දෙවියා බහුන්නං වය්‍යානං බහුන්නං වස්සසහස්සානං අච්චයෙන එතදහොසි: චිරදිට්ඨො ඛො මෙ රාජා මහාසුදස්සනො. යන්නූනාහං රාජානං මහාසුදස්සනං දස්සනාය උපසඞ්කමෙය්‍යන්ති. අථ ඛො ආනන්‍දො සුභද්‍ද දෙවී ඉත්ථාගාරං ආමන්තෙසි, ''එථ තුමෙහ යීසානි නහායථ, පීතානි වත්ථානි පාරුපථ, චිරදිට්ඨො නො රාජා මහාසුදස්සනො. රාජානං මහාසුදස්සනං දස්සනාය උපසඞ්කමිස්සාමා'ති. එවං අය්‍යෝ'ති ඛො ආනන්‍දො ඉත්ථාගාරං සුභද්‍දය දෙවියා පටිස්සුත්වා යීසානි නහායිත්වා පීතානි වත්ථානි පාරුපිත්වා යෙන සුභද්‍ද දෙවී තෙනුපසඞ්කමි. අථ ඛො ආනන්‍දො සුභද්‍ද දෙවී පරිනායකරතනං ආමන්තෙසි: ''කප්පෙහි සම්ම පරිණායකරතන චතුරඞ්ගිනිං සෙනං, චිරදිට්ඨො නො රාජා මහාසුදස්සනො, රාජානං මහාසුදස්සනං දස්සනාය උපසඞ්කුමිස්සාමා''ති. 'එවං දෙවී'ති ඛො ආනන්‍දො පරිනායකරතනං සුභද්‍දය දෙවියා පටිස්සුත්වා චතුරඞ්ගිනිං සෙනං කප්පාපෙත්වා, සුභද්‍දය දෙවියා පටිවෙදෙසි. 'කප්පිතා ඛො දෙවී චතුරඞ්ගිනී සෙනා, යස්ස'දානි කාලං මඤ්ඤසී'ති. අථ ඛො ආනන්‍දො සුභද්‍ද දෙවී චතුරඞ්ගිනියා සෙනාය සද්ධිං ඉත්ථාගාරෙන යෙන ධම්මා පාසාදෙ තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ධම්මං පාසාදං අභිරුහිත්වා යෙන මහාවියූහං කූටාගාරං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා මහාවියූහස්ස කූටාගාරස්ස ද්වාරබාහං ආලම්බිත්වා අට්ඨාසි.

අථ ඛො ආනන්‍දො රාජා මහාසුදස්සනො සද්දං සුත්වා කීත්තිං ඛො මහතො විය ජනකායස්ස සඤ්ඤාති, මහාවියූහකූටාගාරා නික්ඛමිත්වා අද්දස සුභද්‍දං දෙවිං ද්වාරබාහං ආලම්බිත්වා ඨිතං, දිස්වාන සුභද්‍දං දෙවිං එතදවොච: 'එසෙව දෙවි තිට්ඨ මා පාවිසී'ති. අථ ඛො ආනන්‍දො රාජා මහාසුදස්සනො අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: 'එහි භං අමෙහා පුරිස, මහාවියූහා කූටාගාරා සොවණ්ණමයං පල්ලඞ්කං නීහරිත්වා සබ්බසොවණ්ණමයෙ තාලවනෙ පඤ්ඤපෙහී'ති. 'එවං දෙවා'ති ඛො ආනන්‍දො සො පුරිසො රඤ්ඤො මහාසුදස්සනස්ස පටිස්සුත්වා මහාවියූහා කූටාගාරා සොවණ්ණමයං පල්ලඞ්කං නීහරිත්වා සබ්බසොවණ්ණමයෙ තාලවනෙ පඤ්ඤපෙසි. අථ ඛො ආනන්‍දො රාජා මහාසුදස්සනො දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙසි පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො.

අථ ඛො ආනන්‍දො සුභද්‍දය දෙවියා එතදහොසි: වීපපස්සන්නානි ඛො රඤ්ඤො මහාසුදස්සනස්ස ඉන්ද්‍රියානි පරිසුද්ධා ඡවිවණ්ණො පරියොදාතො, මා හෙව ඛො රාජා මහාසුදස්සනො කාලමකාසීති. රාජානං මහාසුදස්සනං එතදවොච: ඉමානි ඛො තෙ දෙව චතුරාසීතිනගරසහස්සානි කුසාවතීරාජධානිපමුඛානි. එසා දෙව ඡන්‍දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි ඉමානි තෙ දෙව චතුරාසීතිපාසාදසහස්සානි ධම්මපාසාදපමුඛානි, එසා ඡන්‍දං ජනෙහි

Free Distribution www.aathaapi.org

සුභද්‍රාව එළැඹීම

26. අනඳයෙනි, එ කලැ බොහෝ හවුරුදු ගණනෙක බොහෝ හවුරුදු දහස් ගණනෙක ඇවැමෙන් සුභද්‍රා දේවියට, ''මහ සුදසුන් රජ මා විසින් දුටු බොහෝ කල් ඇත්තේ ය. මම මහසුදසුන් රජු දක්නට ගියෙම් වීම් නම් යෙහෙකැ'' යි මේ සිත විය. අනඳයෙනි, ඉක්බිති සුභද්‍රා දෙවී ඇතොවුර බණවා, ''තෙපි එවු. භිස් සෝද නාවු. රන්වන් පිළි හැඳ පොරොවවු. මහසුදසුන් රජ අප විසින් දක්නා ලද බොහෝ කල් ඇත්තේ ය. මහ සුදසුන් රජු දක්නට එළැඹෙන්නම්හ'' යි කිවු ය. 'එසේ යැ ආයෂ්මැනි' යි ම ඇතොවුර සුභද්‍රා දෙවියට පිළිවදන් දී, භිස් සෝද නා, රන්වන් පිළි හැඳ පෙරෙවැ සුභද්‍රා දේවිය කරා එළැඹියාහ. අනඳයෙනි, ඉක්බිති සුභද්‍රා දේවී පරිනායක රත්නය බණවා ''සඟය පරිනායක රත්නය සිවුරහ සෙන් සදව. අප විසින් මහසුදසුන් රජ දක්නා ලද බොහෝ කල් ඇත්තේ ය. මහසුදසුන් රජු දක්නට එළැඹෙන්නම්හ'' යි කිවු ය. 'එසේ යැ, දේවිනි' යි කියා ම පරිනායක රත්නය සුභද්‍රා දේවියට පිළිවදන් දී, සිවුරහ සෙන් සදවා, 'දේවියනි, සිවුරහ සෙන් සරසන ලදි. යම් ගමනකට සිතවු ද, එයට කල් වේ' යැ යි සැළ කෙළේ ය. අනඳයෙනි, ඉක්බිති සුභද්‍රා දේවී සිවුරහ සෙන් ද ඇතොවුර ද කැටුව දහම්පාය කරා එළැඹුණා ය. එළැඹ දහම්පහය නැහ, මහාව්‍යූහ කුළඟෙය කරා එළැඹ, එහි දෙරබාවැ එල්බැ සිටියා ය.

අනඳයෙනි, එ කල්හි මහ සුදසුන් රජ ඔවුන් එන හඬ අසා, 'කිමෙක් ද? මහ ජන මුළුවෙක හඬ නියා!' යි සිතා, මහාව්‍යූහ කුළඟෙයින් නික්මෙන්නේ, දෙර බා වැ එල්බැ සිටි සුභද්‍රා දේවිය දුටුයේය. දැක, ''දේවිය, ඔහි ම සිටු, ඇතුළට නො වදුව' යි කී ය. අනඳයෙනි, ඉක්බිති මහසුදසුන් රජ එක්තරා මිනිසකු බණවා, 'හෙම්බා මිනිස, තෝ මෙහි එව. මහාව්‍යූහ කුළඟෙන් රන්මුවා පළහක් ගෙනවුත් සියල්ල රන්මුවා වූ තල් වෙනෙහි පණවව' යි කී ය. 'දේවයිනි, එසේ යැ' යි කියා ම එ මිනිසා මහ සුදසුන් රජුට පිළිවදන් දී, මහාව්‍යූහ කුළඟෙයින් රන්මුවා පළහක් ගෙනවුන් සියල්ල රන්මුවා තල්වෙනෙහි පැණැවී ය. අනඳයෙනි, ඉක්බිති මහසුදසුන් රජ දකුණු පයෙහි වම් පය මඳක් හයා තබා සිහි නුවණ ඇති වැ දකුණැලයෙන් සිංහශය්‍යායෙන් ශයනය කෙළේ ය.

අනඳයෙනි, එ කලැ සුභද්‍රා දේවියට ''මහසුදසුන් රජුගේ ඉදුරෝ වෙසෙසින් පහන්හ. සිවිපැහැය පිරිසිදු ය, පබසර ය. මහ සුදසුන් රජ කලුරිය නො කෙරේ වා'' යි මේ පිත විය. ඕ මහසුදසුන් රජුට මෙසේ කිවු ය: ''දේවයිනි, කුශාවති රජදහන පාමොක් කොටැති මේ ඔබ සතු නුවර සූවාසූ දහසෙකි. දේවයිනි, මෙහි ඇල්ම උපදවන්න, දිවියෙහි අපේක්ෂාව කරන්න. දේවයිනි, දහම් පාය පාමොක් කොටැති ඔබ සතු මේ ප්‍රාසාද සූවාසූ දහයෙකි. දේවයිනි, මෙහි

Free Distribution www.aathaapi.org

ජීවිතෙ අපෙක්ඛං කරොහි, ඉමානි තෙ දෙව චතුරාසීතිකූටාගාරසහස්සානි මහාවියූහකූටාගාරප්පමුඛානි, එත්ථ දෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි, ඉමානි තෙ දෙව චතුරාසීතිපල්ලඞ්කසහස්සානි සොවණ්ණමයානි රූපියමයානි දන්තමයානි සාරමයානි ගොණකත්ථතානි පටිකත්ථතානි පටලිකත්ථතානි කාදලිමිගපවරපච්චත්ථරණානි සඋත්තරච්ඡදනිඋභතොලොහිතකූපධානානි. එත්ථ දෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි ඉමානි තෙ දෙව චතුරාසීතිනාගසහස්සානි සොවණ්ලඞ්කාරාණි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි උපොසථනාගරාජප්පමුඛානි, එත්ථ දෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි. ඉමානි තෙ දෙව චතුරාසීතිඅස්සසහස්සානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි වලාහකඅස්සරාජප්පමුඛානි, එත්ථ දෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි. ඉමානි තෙ දෙව චතුරාසීතිරථසහස්සානි සීහචම්මපරිවාරානි බ්‍යග්ඝචම්මපරිවාරානි දීපිචම්මපරිවාරානි පණ්ඩුකම්බලපරිවාරානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි වෙජයන්තරථප්පමුඛානි,[1] එත්ථ දෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි, ඉමානි තෙ දෙව චතුරාසීතිමණිසහස්සානි මණිරනතප්පමුඛානි, එත්ථ දෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි, ඉමානි තෙ දෙව චතුරාසීතිඉත්ථිසහස්සානි ඉත්ථිරතනප්පමුඛානි, එත්ථ දෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි, ඉමානි තෙ දෙව චතුරාසීතිගහපතිසහස්සානි ගහපතිරතනප්පමුඛානි, එත්ථ දෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි. ඉමානි තෙ දෙව චතුරාසීතිඛත්තියසහස්සානි අනුයන්තානි පරිනායකරතනප්පමුඛානි, එත්ථ දෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි. ඉමානි තෙ දෙව චතුරාසීතිධෙනුසහස්සානි ධුවසන්දනානි කංසුපධාරණානි, එත්ථ දෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි. ඉමානි තෙ දෙව චතුරාසීතිවත්ථකොටිසහස්සානි ඛොමසුඛුමානං කප්පාසිකසුඛුමානං කොසෙය්‍යසුඛුමානං කම්බලසුඛුමානං, එත්ථ දෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහි. ඉමානි තෙ දෙව චතුරාසීතිථාලිපාකසහස්සානි සායං පාතං භත්තාභිහාරො අභිහරීයති, එත්ථ දෙව ඡන්දං ජනෙහි ජීවිතෙ අපෙක්ඛං කරොහී''ති

1. වෙජයන්තරථප්පමුඛානි (බහුසු) අඤ්ඤෙසු ඊදිසෙසු ඨානෙසු පකාරසස දම්ත්තං දිසසතෙං

Free Distribution www.aathaapi.org

ඇල්ම උපදවන්න, ජීවිතය කෙරෙහි අපෙක්ෂාව කරන්න. දේවයිනි, මහාව්‍යූහ කුළඟෙය පාමොක් කොටැති ඔබ සතු මේ කළඟෙ සුවාසූ දහසෙක් වෙයි. මෙහි ඇල්ම උපදවන්න, ජීවිතයෙහි අපේක්ෂාව කරන්න. දේවයිනි, රන්මුවා ද රිදීමුවා ද ඇත්දත්මුවා ද දැවමුවා ද වූ කොදුපලස් අතුළ, සුදු එළලොමිමුවා ඇතිරි අතුළ, කෙහෙල්මුව සමින් කළ උතුම් පසතුරුණු ඇති උඩුවියන් සහිත, හිස්දෙර පාමුල යන දෙ පසැ රතු කන්වයින් ඇති, සුවාසූ දහසෙක් ඔබ සතු පළඟහු ඇත. දේවයිනි, මෙහි ඡන්දය උපදවන්න, ජීවිතයෙහි අපේක්ෂාව කරන්න. දෙවයිනි, රන් අබරණ ඇති, රන් දද ඇති, රන් දැලින් පිළිසත් උපොසථ ඇත්රජු පාමොක් කොටැති මේ ඔබගේ සුවාසූ දහසෙක් ඇත්තු වෙති. දේවයිනි, මොවුන් කෙරෙහි ඇල්ම දනවන්න, ජීවිතයෙහි අපේක්ෂාව කරන්න. දේවයිනි, රන් අබරණ පලන්, රන් දද ඇති, රන් දැලින් පිළිසන්, වලාහක අස්රජු පාමොක් කොටැති, ඔබගේ මේ සුවාසූ දහසෙක් අස්සු වෙති. දේවයිනි, මොවුන් කෙරෙහි ඇල්ම දනවන්න, ජීවිතය කෙරෙහි අපේක්ෂාව කරන්න. දේවයිනි, සිංහ සමින් වසන ලද, ව්‍යාඝ්‍ර සමින් වසන ලද, දිවි සමින් වසන ලද, පඬු පැහැ කම්බලයෙන් වසන ලද, රන් අබරන සහිත, රන් දද සහිත, රන් දැලිනි පිළිසන්, විජයොත් රිය පාමොක් කොටැති, ඔබ සතු මේ රිය සුවාසූ දහස් කෙනෙක් වෙති. දේවයිනි, මෙහි ඡන්දය උපදවන්න, ජීවිතයෙහි අපේක්ෂාව කරන්න. දේවයිනි, මිණිරුවන පාමොක් කොටැති මේ ඔබ සතු සුවාසූ දහසෙක් මිණිහු වෙති. දෙවයිනි, මෙහි ඇල්ම දනවන්න, ජීවිතයෙහි අපේක්ෂාව කරන්න. දේවයිනි, ස්ත්‍රීරත්න ප්‍රමුඛ මේ ඔබගේ සුවාසූ දහසෙක් ස්ත්‍රීහු වෙති. දේවයිනි, මෙහි ඡන්දය දනවන්න, ජීවිතයෙහි අපේක්ෂාව කරන්න. දේවයිනි, ගැහැවිරුවන පාමොක් කොටැති මේ ඔබගේ ගැහැවියෝ සුවාසූදහසෙක් වෙත්. දේවයිනි, මොවුන් කෙරෙහි ඡන්දය උපදවන්න., ජීවිතයෙහි අපේක්ෂාව කරන්න. දේවයිනි, පිරිනාරුවන් පාමොක් මේ ඔබගේ අනුඝාම් වූ සුවාසූ දහසෙක් කැප්හු වෙති. දේවයිනි, මොවුන් කෙරෙහි ඡන්දය දනවන්න, ජීවිතයෙහි අපේක්ෂාව කරන්න. දේවයිනි, හැම කල්හි කිරි දොවාගත හැකි, රන් සැළිටයෙන් සරසන ලද, ඔබ සතු මේ සුවාසූ දහසෙක් දෙන්නු වෙති. දේවයිනි, මෙහි ඡන්දය දනවන්න, ජීවිතයෙහි අපේක්ෂාව කරන්න. දේවයිනි, සියුම් කොමු පිළි ද සියුම් කපුපිළි ද සියුම් පටපිළි ද සියුම් කම්බල දූ යි සුවාසූ කෙළ දහසෙක් මේ ඔබ සතු පිළි ඇත. දේවයිනි, මෙහි ඡන්දය උපදවන්න, ජීවිතයෙහි අපේක්ෂාව කරන්න දේවයිනි, මේ බත්සැළි සුවාසූ දහසක් වූ බතෙක් උදේ සවස දෙක්හි ම ඔබට එළැවෙයි දේවයිනි, මෙහි ඡන්දය දනවන්න, ජීවිතයෙහි අපේක්ෂාව කරන්නැ'' යි (සුභද්‍රා දේවී කිවු ය).

Free Distribution www.aathaapi.org

27. එවං වුත්තෙ ආනන්ද රාජා මහාසුදස්සනො සුභද්දං දෙවිං එතදවොච: දීඝරත්තං ඛො මං භද්දෙ දෙවි ඉට්ඨෙහි කන්තෙහි පියෙහි මනාපෙහි සමුදාචරිත්ථ, අථ ච පන මං භද්දෙ පච්ඡිමෙ කාලෙ අනිට්ඨෙහි අකන්තෙහි අප්පියෙහි අමනාපෙහි සමුදාචරසි"ති. "කථඤ්හරහි තං දෙව සමුදාචරාමී"ති. "එවං ඛො මං භද්දෙ දෙවී, සමුදාචර: සබ්බඤ්හෙව දෙව පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො අඤ්ඤථාභාවො. මා ඛො භද්දෙ දෙව යාපෙක්ඛා කාලමකාසි, දුක්ඛා සාපෙක්ඛස්ස කාලකිරියා, ගරහිතා ච සාපෙක්ඛස්ස කාලකිරියා. ඉමානි තෙ දෙව චතුරාසීතිනගරසහස්සානි කුසාවතීරාජධානිපමුඛානි. එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි, ඉමානි තෙ දෙව චතුරාසීති-පාසාදසහස්සානි ධම්මපාසාදපමුඛානි, එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි. ඉමානි තෙ දෙව චතුරාසීතිකූටාගාරසහස්සානි මහා-ව්යූහකූටාගාරපමුඛානි, එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි, ඉමානි තෙ දෙව චතුරාසීතිපල්ලඞ්කසහස්සානි සොවණ්ණමයානි රූපියම-යානි දන්තමයානි සාරමයානි ගොණකත්ථතානි පටිකත්ථතානි පටලිකත්ථතානි කාදලිමිගපවරපච්චත්ථරණානි සඋත්තරච්ඡදානි උභතොලොහිතකූපධානානි, එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි, ඉමානි තෙ දෙව චතුරාසී-තිනාගසහස්සානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාල පටිච්ඡන්නානි උපොසථනාගරාජපමුඛානි, එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි. ඉමානි තෙ දෙව චතුරාසීතිඅස්සසහස්සානි සොවණ්ණා-ලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි වලාහකඅස්සරා-ජපමුඛානි, එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි, ඉමානි තෙ දෙව චතුරාසීතිරථසහස්සානි සීහවම්මපරිවාරානි ඛ්‍යග්ඝවම්මපරිවාරානි දීපිවම්මපරිවාරානි පණ්ඩුකම්බලපරිවාරානි සොවණ්ණාලඞ්කාරානි සොව ණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි, වෙජයන්තරථපපමුඛානි. එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි, ඉමානි තෙ දෙව චතුරාසීති-මණිසහස්සානි මණිරතනපපමුඛානි, එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි, ඉමානි තෙ දෙව චතුරාසීතිඉත්ථීසහස්සානි සුභද්ද දෙවීපමුඛානි, එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි, ඉමානි තෙ දෙව චතුරාසීතිගහපතිසහස්සානි ගහපතිරතනපපමුඛානි. එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි, ඉමානි තෙ දෙව චතුරා-සීතිඛත්තියසහස්සානි අනුයන්තානි පරිනායකරතනපපමුඛානි. එත්ථ දෙව ඡන්ද. පජහ ජීවිතෙ අපෙක්ඛං මාකාසි, ඉමානි තෙ දෙව චතුරාසීතිධඤ්ඤසහස්සානි ධුවසාලිනානි කංසූපධාරණානි. එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි, ඉමානි තෙ දෙව චතුරාසීතිවත්ථකොටිසහස්සානි ඛොමසුඛුමානං කපාසිකසුඛුමානං කොසෙය්‍යසුඛුමානං කම්බලසුඛුමානං, එත්ථ දෙව ඡන්දං පජහ ජීවිතෙ අපෙක්ඛං මාකාසි. ඉමානි තෙ දෙව චතුරාසීතිථාලිපාක-සහස්සානි යායං පාතං හත්ථාභිහාරො අභිහරීයති එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි ති.

Free Distribution www.aathaapi.org

27. අනඳයෙනි, ඇය මෙසේ කී කල්හි මහසුදස්සන් රජ සුභද්‍රා දේවියට මේ බස් පැවැසී ය: ''දේවිනි, තෙපි මට දික් කලක් ම ඉෂ්ට ප්‍රිය මනාප වචනයෙන් කතා කළහු ය. එහෙත් තෙපි මට මේ පැයිම් සමයෙහි අනිෂ්ට අකාන්ත අප්‍රිය අමනාප වචනයෙන් කතා කරහු. ''දේවයිනි, කෙසේ ඔබට කතා කරම් ද?'' යි සුභද්‍රා දේවී විචාළා ය. ''දේවිනි, මෙසේ මට කතා කරන්න: 'දේවයිනි, ප්‍රිය මනාප සියලු දෙයින් වෙන් වීම, බැහැර වීම, අන් පරිද්දෙකින් වීම ස්වභාවයෙක. දේවයිනි, ඔබ අපේක්ෂා ඇතිව නහමක් කලුරිය කෙරේ වා. අපේක්ෂා ඇත්තහුගේ කාල ක්‍රියාව දුක් ඔහන දෙයි, සාපෙක්ෂ වූවහුගේ කාලක්‍රියාව ගර්හිත ය. දේවයිනි, කුශාවතී නගරය ප්‍රමුඛ කොටැති මේ ඔබගේ තුවර සුවාසූදහසෙක් ඇත. දේවයිනි, මෙහි ඇල්ම පියන්න. ජීවිතයෙහි අපේක්ෂාව නො කරන්න. දේවයිනි, දහම් පහා පාමොක් මේ පහා සුවාසූදහසෙක් ඔබට ඇත. මෙහි ඇල්ම පියන්න. ජීවිතයෙහි අපේක්ෂාව නො කරන්න. දේවයිනි, මහාවියූහ කූටාගාර ප්‍රමුඛ මේ ඔබ සතු කූටාගාර සූවාසූ දහසෙක. මෙහි ඇල්ම පියන්න. ජීවිතයෙහි අපේක්ෂාව නහමක් කරන්න. දේවයිනි, රන්මුවා ද රිදීමුවා ද ඇත්දත්මුවා ද දුවමුවා ද , කොඳුපලස් අතුළ, සුදු එළලොම්මුවා ඇතිරි අතුළ, ගනපුප් එළලොම් ඇතිරි අතුළ, කෙහෙල්මුව සම්මුවා උතුම් පසතුරුණු අතුළ, උඩුවියන් සහිත, හිස්දෙර පාමුල යන දෙපසැ රතු කොට්ට ඇති සුවාසූදහසෙක් පළඟහු ඇත. දේවයිනි, මෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නහමක් කරන්න. දේවයිනි, රන් අබරණින් සැදුණු රන් දඳ ඇති රන් දැලින් පිළිසන් උපොසථ ඇත්රජු පාමොක් කොටැති ඔබගේ මේ සුවාසූදහසෙක් ඇත්තු ඇත. දේවයිනි, මෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නහමක් කරන්න. දේවයිනි, රන් අබරණ පලන්, රන් දඳ සහිත, රන් දැලින් පිළිසන්, වලාහක අස්රජු පාමොක් කොටැති ඔබගේ මේ සුවාසූදහසෙක් අස්සු වෙති. මොවුන් කෙරෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නහමක් කරන්න. දේවයිනි, සිංහසමින් වසන ලද, ව්‍යාඝ්‍රසමින් වසන ලද, දිවිසමින් වසන ලද, පාණ්ඩුකම්බලයෙන් වසන ලද, රන්අබරණින් සදන ලද, රන්දඳ සහිත රන් දැලින් පිළිසන් විජයොත්රිය පාමොක් සුවාසූදහසෙක් රිය ඔබට ඇත. දේවයිනි, මෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂා නො කරන්න. දේවයිනි, මිණිරුවන් පාමොක් මේ සුවාසූදසහසෙක් මිණිහු ඔබට ඇත. මෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නො කරන්න. දේවයිනි, සුභද්‍රා දේවිය ප්‍රමුඛ සුවාසූදහසෙක් ස්ත්‍රීහු ඔබට ඇත. මෙහි ඇල්ම පියන්න ජීවිතයෙහි අපේක්ෂාව නො කරන්න. දේවයිනි, ගැහැවිරුවන්පාමොක් සුවාසූ දහසෙක් ගැහැවිහු ඔබට ඇත. මෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නො කරන්න. දේවයිනි, පිරිනාරුවන් පාමොක් මේ අනුගාමී කැත්හු සුවාසූදහසෙක් ඔබට ඇත. මෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නහමක් කරන්න. දේවයිනි, හැම කල්හි දෙවියෑ හැකි කිරි ඇති රන්සැට්ට ඇඟ ලැවුණු මේ සුවාසූදහසෙක් දෙන්නු ඔබට ඇත. මෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නො කරන්න. දේවයිනි, සියුම් කොමුපිළි ද සියුම් කපුපිළි ද සියුම් පටපිළි ද සම්බන්ධ මේ සුවහස් කෙළක් පිළී ඔබට ඇත. මෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නො කරන්නැ යි කියන්නැ'' යි මහසුදස්සන් රජ කී ය.

Free Distribution www.aathaapi.org

28. එවං වුත්තෙ ආනන්ද සුභද්‍ර දෙවී පරොදි අස්සූනි පවත්තෙසි. අථ ඛො ආනන්ද සුභද්‍රදෙවී අස්සූනි පමජ්ජිත්වා රාජානං මහාසුදස්සනං එතදවොච:

සඛ්ඛෙහෙව දෙව පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො අඤ්ඤථාභාවො, මා ඛො ත්වං දෙව සාපෙක්ඛො කාලමකාසි, දුක්ඛා සාපෙක්ඛස්ස කාලකිරියා, ගරහිතා ච සාපෙක්ඛස්ස කාලකිරියා, ඉමානි තෙ දෙව චතුරාසීතිනගරසහස්සානි කුසාවතීරාජධානිප්පමුඛානි, එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි. ඉමානි තෙ දෙව චතුරාසීතිපාසාදසහස්සානි ධම්මපාසාදප්පමුඛානි, එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි, ඉමානි තෙ දෙව චතුරාසීතිකූටාගාරසහස්සානි මහාවියූහකූටාගාරප්පමුඛානි, එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි. ඉමානි තෙ දෙව චතුරාසීතිපලලඞ්කසහස්සානි සොවණ්ණමයානි රූපියමයානි දන්තමයානි සාරමයානි ගොණකත්ථතානි පටිකත්ථතානි පටලිකත්ථතානි කාදලිමිගපවරපවවත්ථරණානි සඋත්තරච්ඡදානි උභතොලොහිතකූපධානානි, එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි. ඉමානි තෙ දෙව චතුරාසීතිනාගසහස්සානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි උපොසථනාගරාජප්පමුඛානි. එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි. ඉමානි තෙ දෙව චතුරාසීතිඅස්සසහස්සානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි වලාහකඅස්සරාජප්පමුඛානි. එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි. ඉමානි තෙ දෙව චතුරාසීතිරථසහස්සානි සීහචම්මපරිවාරානි ඛ්‍යග්ඝචම්මපරිවාරානි දීපිචම්මපරිවාරානි පණ්ඩුකම්බලපරිවාරානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි වෙජයන්තරථප්පමුඛානි. එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි. ඉමානි තෙ දෙව චතුරාසීතිමණිසහස්සානි මණිරතනප්පමුඛානි. එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි. ඉමානි තෙ දෙව චතුරාසීතිඉත්ථිසහස්සානි ඉත්ථිරතනප්පමුඛානි, එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි. ඉමානි තෙ දෙව චතුරාසීතිගහපතිසහස්සානි ගහපතිරතනප්පමුඛානි. එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි. ඉමානි තෙ දෙව චතුරාසීතිඛත්තියසහස්සානි අනුයන්තානි පරිනායකරතනප්පමුඛානි. එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි. ඉමානි තෙ දෙව චතුරාසීතිධෙනුසහස්සානි ධුවසන්දනානි කංසුපධාරණානි. එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි. ඉමානි තෙ දෙව චතුරාසීතිවත්ථකොටිසහස්සානි ඛොමසුඛුමානං කප්පාසිකසුඛුමානං කොසෙය්‍යසුඛුමානං කම්බලසුඛුමානං. එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසි. ඉමානි තෙ දෙව චතුරාසීතිථාලිපාකසහස්සානි සායං පාතං හත්තාභිහාරො අභිහරියති. එත්ථ දෙව ඡන්දං පජහ, ජීවිතෙ අපෙක්ඛං මාකාසීති.

---

1. පුඤ්ඤජිත්වා – මජ්ඣං

Free Distribution www.aathaapi.org

28. අනඳයෙනි, රජු මෙසේ කී කල්හි සුභද්‍රා දේවී හැඬුවා ය, කඳුළු හෙළුවා ය. අනඳයෙනි, ඉක්බිති සුභද්‍රා දේවී කඳුළු පිසැදමා මහසුදස්සන් රජුට මෙසේ කිවු ය:

''දේවයිනි, ප්‍රිය මනාප හැම දෑ කෙරෙන් නානාභාවය විනාභාවය අන්‍යථාභාවය වේ. දේවයිනි, ඔබ අපේක්ෂා ඇති ව නහමක් කලුරිය කරන්න. සාපෙක්ෂයාගේ කාලක්‍රියාව දුක් එළවයි. සාපෙක්ෂයාගේ කාලක්‍රියාව ගර්හිත ද වේ. දේවයිනි, කුශාවතී රාජධානීප්‍රමුඛ මේ ඔබේ නුවර සුවාසූදහසෙක් ඇත. දේවයිනි, මෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නො කරන්න. දේවයිනි, ධර්මප්‍රාසාදප්‍රමුඛ ඔබ සතු මේ ප්‍රාසාද සුවාසූදහසෙක. දේවයිනි, මෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නො කරන්න. දේවයිනි, මහාව්‍යූහ කූටාගාර ප්‍රමුඛ ඔබේ මේ කූටාගාර සුවාසූදහසෙක. මෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නහමක් කරන්න. දේවයිනි, ස්වර්ණමය ද රජතමය ද දන්තමය ද සාරමය ද වූ, කොදුපලස් අතුළ, සුදු එළලොම්මුවා ඇතිරි අතුළා කෙහෙල් මුව සමින් කළ උතුම් පසතුරුණු ඇති, උඩුවියන් සහිත, හිස්දෙර පාමුල යන දෙපසැ රතු කන්වයින් බඳන ලද ඔබගේ මේ පළඟ සුවාසූදාහසෙකි. මෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නො කරන්න. දේවයිනි, පලන් රන් අබරණ ඇති රන් දද සහිත රන්දැලින් පිළිසන්, උපොසථ ඇත් රජ ප්‍රමුඛ ඔබ සතු මේ සුවාසූදහසෙක් ඇත්තු ඇත. මොවුන් කෙරෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නහමක් කරන්න. දේවයිනි, රන්අබරණ පලන් රන්දද සහිත, රන්දැලින් පිළිසන් වලාහක අස්රජ පාමොක් කොටැති, මේ ඔබ සතු සුවාසූ දහසෙක් අස්සු ඇත. මොවුන් කෙරෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නහමක් කරනන. දේවයිනි, සිහසමින් වැසූ, වඟසමින් වැසූ, දිවිසමින් වැසූ, පාණ්ඩුකම්බලයෙන් වැසූ, රන්අබරණින් සැදුණු, රන්දද සහිත, රන්දැලින් පිළිසන් විජයොත්රිය පාමොක් ඔබ සතු මේ රිය සුවාසූදහසෙක. දේවයිනි, මෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නො කරන්න. දේවයිනි, මිණිරුවන් පාමොක් ඔබ සතු මේ සුවාසූදහසෙක් මිණිරුවන්හු ඇත. මෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නො කරන්න. දේවයිනි, ස්ත්‍රීරත්නප්‍රමුඛ ඔබ සතු මේ සුවාසූ දහසෙක් ස්ත්‍රීහු ය. දේවයිනි, මොවුන් කෙරෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නො කරන්න. දේවයිනි, ගැහැවිරුවන් පාමොක් ඔබ සතු මේ ගැහැවිහු සුවාසූදහසෙක. මොවුන් කෙරෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නො කරන්න, දේවයිනි, පිරිනාරුවන් පාමොක් ඔබගේ මේ අනුගාමී සුවාසූදහසෙක් කැත්හු ය. මොවුන් කෙරෙහි ඇල්ම පියන්න, ජීවිතයෙහි අපේක්ෂාව නො කරන්න. දේවයිනි, හැම ද ම දෙවියැ හැකි කිරි ඇති, රන් සැට්ට ඇහැ ලැවුණු, මේ ඔබ ගේ සුවාසූදහසෙක් දෙන්නු ඇත. මොවුන් කෙරෙහි ඇල්ම පියන්න, ජීවිතය කෙරෙහි අපේක්ෂාව නො කරන්න. දේවයිනි, සියුම් කොමුපිළි ද සියුම් කපු පිළි ද සියුම් පට්පිළි ද සියුම් කම්බල ද සම්බන්ධ ඔබ සතු සුවාසූ කෙළ දහසෙක් පිළි ඇත. දේවයිනි, මෙහි ඇල්ම පියන්න, ජීවිතය කෙරෙහි අපෙක්ෂාව නො කරන්නැ'' යනු යැ.

Free Distribution www.aathaapi.org

බ්‍රහ්මලොකූපගමනං

29. අථ ඛො ආනන්ද රාජා මහාසුදස්සනො න චිරස්සෙව කාලමකාසි. සෙය්‍යථාපි ආනන්ද ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා මනුඤ්ඤං භොජනං භුත්තාවිස්ස හත්ථසම්මදෙ හොති, එවමෙව ඛො ආනන්ද රඤ්ඤො මහාසුදස්සනස්ස මාරණත්ථිකා වෙදනා අහොසි. කාලකතො ච ආනන්ද රාජා මහාසුදස්සනො සුඛිතං බ්‍රහ්මලොකං උපපජ්ජි. රාජා ආනන්ද මහාසුදස්සනො චතුරාසීතිවස්සසහස්සානි කුමාරකීළිතං[1] කීළි. චතුරාසීතිවස්සසහස්සානි ඔපරජ්ජං කාරෙසි. චතුරාසීතිවස්සසහස්සානි රජ්ජං කාරෙසි. චතුරාසීතිවස්සසහස්සානි ගිහීභූතො[2] ධම්මෙ පාසාදෙ බ්‍රහ්මචරියං චරී.[3] සො ච ඛ්‍යානරො බ්‍රහ්මවිහාරෙ භාවෙත්වා කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මලොකූපගො අහොසි.

30. සියා ඛො පනානන්ද එවමස්ස අඤ්ඤො නූන තෙන සමයෙන රාජා මහාසුදස්සනො අහොසීති. න ඛො පනෙතං ආනන්ද එවං දට්ඨබ්බං, අහං තෙන සමයෙන රාජා මහාසුදස්සනො අහොසිං. මම තානි චතුරාසීතිනගරසහස්සානි කුසාවතිරාජධානිපමුඛානි, මම තානි චතුරාසීතිපාසාදසහස්සානි ධම්මපාසාදපපමුඛානි, මම තානි චතුරාසීතිකූටාගාරසහස්සානි මහාවියූහකූටාගාරපපමුඛානි, මම තානි චතුරාසීතිපල්ලඞ්කසහස්සානි සොවණ්ණමයානි රූපියමයානි දන්තමයානි සාරමයානි ගොණකත්ථතානි පටිකත්ථතානි පටලිකත්ථතානි කාදලිමිගපවරපච්චත්ථරණානි සඋත්තරච්ඡදානි උභතොලොහිතකූපධානානි, මම තානි චතුරාසීතිනාගසහස්සානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි උපොසථනාගරාජපමුඛානි, මම තානි චතුරාසීතිඅස්සසහස්සානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි වලාහකඅස්සරාජපමුඛානි, මම තානි චතුරාසීතිරථසහස්සානි සීහචම්මපටිවාරානි බ්‍යග්ඝචම්මපරිවාරානි දිපිචම්මපරිවාරානි පණ්ඩුකම්බලපරිවාරානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි වෙජයන්තරථපමුඛානි, මම තානි චතුරාසීතිමණිසහස්සානි මණිරතනපපමුඛානි, මම තානි චතුරාසීතිඉත්ථීසහස්සානි සුභද්දෙවිපමුඛානි, මම තානි චතුරාසීතිගහපතිසහස්සානි ගහපතිරතනපමුඛානි, මම තානි චතුරාසීතිඛත්තියසහස්සානි අනුයන්තානි පරිනායකරතනපමුඛානි, මම තානි චතුරාසීතිධෙනුසහස්සානි ධුවසන්දනානි කංසූපධාරණානි මම තානි චතුරාසීතිවත්ථකොටිසහස්සානි ඛොමසුඛුමානං කප්පාසිකසුඛුමානං කොසෙය්‍යසුඛුමානං කම්බලසුඛුමානං මම තානි චතුරාසීතිථාලිපාකසහස්සානි සායං පාතං භත්තාභිහාරො අභිහරීයිත්ථ.

---

1. කුමාරකීළං – මජ්ඣං
2. ගිහිභූතා – මජ්ඣං
3. බ්‍රහ්මචරියමචරී – කං

Free Distribution www.aathaapi.org

බඹලොව යෑම

29. අනඳයෙනි, ඉක්බිති නොබෝ කලෙකින් මහ සුදස්සුන් රජ කලුරිය කෙළේ ය. අනඳයෙනි, මනහර බොජුනක් වැළැඳූ ගැහැවියකුට හෝ ගැහැවි පුතක්හට යම්සේ බත්මතය වේ ද මහසුදස්සුන් රජුට ද එබඳු මවූ මරණය අවසන් කොට ඇති වේදනාවෙක් විය. අනඳයෙනි, කලුරිය කළාවූ ද මහසුදස්සුන් රජ බඹලොවැ උපනි. අනඳයෙනි, මහසුදස්සුන් රජ සුවාසූදහසක් හවුරුදු කුමරකෙළි කෙළීය. සුවාසූදහසක් හවුරුදු යුවරජය කැරැවිය. සුවාසූදහසක් හවුරුදු රජය කැරැවිය. ගිහි ව මැ සුවාසූදහසක් හවුරුදු දහම් පායෙහි බඹසර හසළේ ය. හේ සතර බඹවෙහෙර බවා කාබුන් මරණින් මතු බඹලෝ ගියේ විය.

30. අනඳයෙනි, 'එ සමයෙහි අනෙකෙක් මහසුදස්සුන් රජ වී 'යැ යි (තොපට මෙ බඳු සිතක්) වියැ හැක්ක. අනඳයෙනි, එය එසේ නො දත යුතු. එ සමයෙහි මම මහසුදස්සුන් රජ වීමි. කුශාවතීරාජධානිප්‍රමුඛ ඒ සුවාසූදහසෙක් නගරයෝ මගේ ය. ධර්මප්‍රාසාදප්‍රමුඛ සුවාසූදහසෙක් ප්‍රාසාදයෝ මගේ ය. මහාව්‍යූහකූටාගාරප්‍රමුඛ සුවාසූදහසෙක් කුළුගෙවල් මගේ ය. ස්වර්ණමය ද රජතමය ද දන්තමය ද සාරමය ද වූ කොදුපලස් අතුළ සුදුඑළුලොමින් කළ ඇතිරි අතුළ, ගනපුප් එළුලොම් ඇතිරි අතුළ, උතුම් කෙසෙල්මුව සමින් කළ පසතුරුණු ඇති, උඩුවියන් සහිත, ඉස්දෙර පාමුල යතා දෙපසැ රතුකොවිට තැබූ ඒ සුවාසූදහසෙක් පළඟහු මගේ ය. රන් අබරණින් සැදි, රන්දද සහිත, රන්දලින් පිළිසත් උපොසථ ඇත් රජ ප්‍රමුඛ ඒ සුවාසූදහසෙක් ඇත්තු මගේ ය. රන් අබරණින් සැදි, රන්දද සහිත, රන්දලින් පිළිසත් වලාහක අස්රජ ප්‍රමුඛ ඒ සුවාසූදහසෙක් අස්සු මගේ ය. සිසමින් සත්, වඟසමින් සත්, දිවිසමින් සත්, පඬුඇඹුලින් සත්, රනබරණින් සැදි රන්දදුති, හෙමදලින් පිළිසත් විජයොත්රියපාමොක් ඒ සුවාසූදහසෙක් රියහු මගේ ය. මිණිරුවන්පාමොක් ඒ සුවාසූදහසෙක් මිණිහු මගේ ය. සුභද්‍රාදේවිප්‍රමුඛ සුවාසූදහසෙක් ඒ ස්ත්‍රීහු මා අයත් වූහ. ගැහැවිරුවන් පාමොක් ඒ සුවාසූ දහසෙක් ගැහැවියෝ මා සතු වූහ. පරිණායකරත්න ප්‍රමුඛ අනුයන්තෘ වූ ඒ සුවාසූදහසෙක් කැත්තු මගේ ය. හැම ද දෙවියැකි කිරි ඇති රන්සැට්ට ඇඟ ලැවුණු ඒ සුවාසූ දහසෙක් දෙන්නු මා සතු වූහ. සියුම් කොමුපිළි ද සියුම් කපුපිළි ද සියුම් පටපිළි ද සියුම් කම්බල ද වූ සුවාසූ පිළි කෙළ දහස මා සතු විය. මට උදේ සවස ඒ තලි සුවාසූ දහසක් වූ බතෙක් එළැවිණ.

Free Distribution www.aathaapi.org

31. තෙසං මෙ පනානන්ද චතුරාසීතිනගරසහස්සානං එකමෙකෙ තව නගරෙ හොති යං තෙන සමයෙන අජ්ඣාවසාමි යදිදං කුසාවතී රාජධානී.

තෙසං මෙ පනානන්ද චතුරාසීතිපාසාදසහස්සානං එකොයෙව සො පාසාදෙ හොති යත්තෙන සමයෙන අජ්ඣාවසාමි යදිදං ධම්මො පාසාදෙ.

තෙසං මෙ පනානන්ද චතුරාසීතිකූටාගාරසහස්සානං එකමෙකෙ තව කූටාගාරෙ හොති, යත්තෙන සමයෙන අජ්ඣාවසාමි යදිදං මහාවියූහං කූටාගාරං.

තෙසං මෙ පනානන්ද චතුරාසීතිපල්ලඞ්කසහස්සානං, එකො යෙව සො පල්ලඞ්කො හොති යත්තෙන සමයෙන පරිභුඤ්ජාමි යදිදං සොවණ්ණමයො වා රූපියමයො වා දන්තමයො වා සාරමයො වා.

තෙසං මෙ පනානන්ද චතුරාසීතිනාගසහස්සානං එකො යෙව සො නාගො හොති යත්තෙන සමයෙන අභිරුහාමි යදිදං උපොසථො නාගරාජා.

තෙසං මෙ පනානන්ද චතුරාසීතිඅස්සසහස්සානං එකො යෙව සො අස්සො හොති යත්තෙන සමයෙන අභිරුහාමි යදිදං වලාහකො අස්සරාජා.

තෙසං මෙ පනානන්ද චතුරාසීතිරථසහස්සානං එකො යෙව සො රථො හොති යත්තෙන සමයෙන අභිරුහාමි යදිදං වෙජයන්තරථො.

තෙසං මෙ පනානන්ද චතුරාසීතිඉත්ථීසහස්සානං එකා යෙව සා ඉත්ථී හොති, යා තෙන සමයෙන පච්චුපට්ඨාසි. භත්තකිත්තිනී[1] වා වෙස්සිනී[2] වා.

තෙසං මෙ පනානන්ද චතුරාසීතිවත්ථකොටිසහස්සානං එකං යෙව ක්‍ෂෞමදුස්සයුගං හොති යත්තෙන සමයෙන පරිදහාමි සොමස්සුවුම් වා කපපාසිකස්සුවුම් වා කොසෙය්‍යස්සුවුම් වා කම්බලස්සුවුම් වා.

තෙසං මෙ පනානන්ද චතුරාසීතිරාලිපාකසහස්සානං එකො යෙව සො රාලිපාකො හොති යත්ථ නාලිකොදනපරම භුඤ්ජාමි තදුපියඤ්ච සූපෙය්‍යං.

---

1. භත්තියානී – මීඵසං භත්තිකාරිකා – සී්‍ර.
2. වෙස්සාකිනී – සී්‍ර.

Free Distribution www.aathaapi.org

31. අනඳයෙනි, එ සමයෙහි කුශාවතී රාජධානිය වූ යම් නගරයෙක විසීම් ද, ඒ නුවර සුවාසූ දහසින් මේ එක් නගරයේ ම මම විසීමි. (සෙසු නුවර වලැ දුපුත් ආදිහු වූසුහ.)

අනඳයෙනි, ඒ සුවාසූදහසක් ප්‍රාසාද අතුරෙන් යම් ධර්මනම් ප්‍රාසාදයෙක් වී ද මම එහි ම විසීමි (සෙසු පහයන්හි අඹුදරු ආදිහු වූසුහ).

අනඳයෙනි, ඒ සුවාසූදහසක් කුළුගෙවලින් යම් මහාවූහ නම් කුළුගෙයෙක් වී ද, මම එහි විසීමි.

අනඳයෙනි, ඒ පළඟ සුවාසූදහසින්, රන්මුවා හෝ රිදීමුවා හෝ ඇත්දත්මුවා හෝ දුවමුවා හෝ යම් පළඟෙක් වී ද, ඒ එකක් මම පරිභෝග කෙළෙමි.

අනඳයෙනි, ඒ ඇතුන් සුවාසූදහසින්, උපොසථ නම් යම් ඇත් රජෙක් වී ද, උහු ම මම නැංගෙමි.

අනඳයෙනි, ඒ අසුන් සුවාසූදහසින්, යම් වලාහක නම් අස්රජෙක් වී ද, උහු ම මම නැංගෙමි.

අනඳයෙනි, ඒ රිය සුවාසූදහසින් යම් විජයොත් නම් රියෙක් වී ද, එය ම මම නැංගෙමි.

අනඳයෙනි, ඒ සුවාසූදහසක් ස්ත්‍රීන් අතුරෙන්, කැත්කුලැ වූ හෝ වෙළෙඳ කුලැ වූ හෝ යම් එකියක් මට උවටන් කළා ද, ඒ එක් ස්ත්‍රියක් ම විය.

අනඳයෙනි, ඒ සුවාසූ පිළි කෙළ දහසින් සියුම් කොමුපිළියක් හෝ සියුම් කපුපිළියක් හෝ සියුම් පටපිළියක් හෝ සියුම් කම්බලයක් හෝ ඒ එක් පිළියුවලක් ම මම හැන්දෙමි, පෙරැවීමි.

අනඳයෙනි, ඒ සුවාසූ බත්සැළි දහසින් යමෙකින් නැලියක් පරම කොටැති (නැලියකට නොවැඩී) බතකුත් එයට පමණ වූ සූපත් වැළැඳීම් නම් ඒ එක් බත් තලියෙක් ම විය.

Free Distribution www.aathaapi.org

32. පස්සානන්ද සබ්බෙ තෙ සඞ්ඛාරා අතීතා නිරුද්ධා විපරිණතා. එවං අනිච්චා වෝ ආනන්ද සඞ්ඛාරා, එවංඅද්ධුවා වෝ ආනන්ද සඞ්ඛාරා. එවං අනස්සාසිකා වෝ ආනන්ද සඞ්ඛාරා, යාවඤ්චිදං ආනන්ද අලමෙව සබ්බ-සඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතුං. ජක්ඛත්තුං වෝ පන්නාහං ආනන්ද අභිජානාමි ඉමස්මිං පදෙසෙ සරීරං නික්ඛිපිතා, තඤ්ච වෝ රාජා'ව සමානෝ චක්කවත්තී ධම්මිකෝ ධම්මරාජා චාතුරන්තා විජිතාවී ජනපදත්ථාවරියපත්තෝ සත්තරතනසමන්නාගතෝ. අයං සත්තමෝ සරීරනික්ඛෙපෝ. න වෝ පන්නාහං ආනන්ද තං පදෙසං සමනුපස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යත්ථ තථාගතෝ අට්ඨමං සරීරං නික්ඛිපෙය්‍යාති.

ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතෝ අථාපරං එතදවොච සත්ථා:

අනිච්චා වත සඞ්ඛාරා උප්පාදවයධම්මිනෝ,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමෝ සුඛෝ ති.

මහාසුදස්සනසුත්තං නිට්ඨිතං චතුත්ථං.

Free Distribution www.aathaapi.org

32. බලවු අනඳයෙනි, ඒ සියලු සඛරහු ඉකුත් වූහ, නිරුද්ධ වූහ, පෙරළුණහ. අනඳයෙනි, මෙසේ සඛරහු අනිත්‍ය ම ය, අනඳයෙනි, සඛරහු මෙසේ අධ්‍රැව ම ය. අනඳයෙනි, මෙසේ සඛරහු ආශ්වාස විරහිත ම ය. අනඳයෙනි, සියලු සඛර දහමුත් කෙරෙහි කලකිරෙන්නට ඉතා ම සුදුසු ය, නො ඇලෙන්නට ඉතා ම සුදුසු ය, එයින් මිදෙන්නට ඉතා ම සුදුසු ය, අනඳයෙනි, සවරක් ම මෙ පෙදෙසෙහි සිරුර බහා ලූයෙමි යි දනිමි. ඒ ද ධාර්මික වූ ධර්මරාජ වූ සයුරුඟිම සිවුමහදිවයිනට අධිපති වූ, පසමිතුරන් දිනූ, දනවුහි තහවුරු බවට පැමිණි, සත්රුවනින් සමන්විත සක්විති රජෙක් වැ ම කෙළෙමි. මේ සත්වැනි ශරීරනිඃක්ෂෙපය යැ. අනඳයෙනි, තථාගතයෝ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොවෙහි, මහණබමුණන් සහිත දෙවිමිනිසුන් සහිත සත්වප්‍රජාවෙහි යම් තැනෙක අටවැනිවරෙක සිරුර බහාලන්නෝ ද, එසේ වූ තැනක් මම නො ම දකිමි.''

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක. මෙය වදරා, සුගතයන් වහන්සේ නැවැත ගාථාබන්ධන විසින් අනෙකක් වූ මෙය වදළ සේක:

'' ඒකාන්තයෙන් සංස්කාරයෝ අනිත්‍යහ.
ඉපැත්ම වැනැස්ම සඛ ධොටැත්තාහ.
ඉපිද නැසෙත්.
ඒ සංස්කාරයන් ගේ සංහිඳීම සුව එළවන්නේ යි. ''

සතර වැනි මහසුදස්සන් සූත්‍ර නිමියේ ය.

Free Distribution www.aathaapi.org

5.

ජනවසභසුත්තං

1. එවං මේ සුතං; එකං සමයං භගවා නාතිකෙ[1] විහරති ගිඤ්ජකාවස-ථෙ. තෙන ඛො පන සමයෙන භගවා පරිතො පරිතො ජනපදෙසු පරිවා-රෙන අඛහතිතෙ කාලකතෙ උපපත්තීසු බ්‍යාකරොති, කාසිකොසලෙසු වජ්ජිමලෙලෙසු චෙතිවංසෙසු[2] කුරුපඤ්චාලෙසු මච්ඡසූරසෙනෙසු අසු අමුත්ර උපපන්නෙතා අසු අමුත්ර උපපන්නෙතා ති. පරොප ඤ්ඤුසං නාතිකියා පරිවාරකා අඛහතිතා කාලකතා පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිනො අනාවත්තිධම්මා තස්මා ලොකා. සාධිකා නවුති නාතිකියා පරිවාරකා අඛහතිතා කාලකතා තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමිනො සකිදෙව[3] ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති, සාතිරෙකානි පඤ්චසතානි නාතිකියා පරිවාරකා අඛහතිතා කාලකතා, තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතා-පන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධිපරායණා ති.

2. අස්සොසුං ඛො නාතිකියා පරිවාරකා: භගවා කිර පරිතො පරිතො ජනපදෙසු පරිවාරෙන අඛහතිතෙ කාලකතෙ උපපත්තීසු බ්‍යාකරොති කාසි-කොසලෙසු වජ්ජිමලෙලෙසු චෙතිවංසෙසු කුරුපඤ්චාලෙසු මච්ඡසූරසෙනෙසු අසු අමුත්ර උපපන්නෙතා අසු අමුත්ර උපපන්නෙතා'ති. පරොප ඤ්ඤුසං නාතිකියා පරිවාරකා අඛහතිතා කාලකතා පඤ්චන්නං ඔරම්භාගියානං සං-යොජනානං පරික්ඛයා ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිතා අනාවත්තිධම්මා තස්මා ලොකා. සාධිකා නවුති නාතිකියා පරිවාරකා අඛහතිතා කාල-කතා තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමිනො සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරි-ස්සන්ති. සාතිරෙකානි පඤ්චසතානි නාතිකියා පරිවාරකා අඛහතිතා කාලකතා තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නා අවිනි-පාතධම්මා නියතා සම්බොධිපරායණා''ති. අථ ඛ නාතිකියා පරිවා-රකා අත්තමනා අහෙසුං පමුදිතා පීතිසොමනස්සජාතා භගවතා පඤ්හවෙය්‍යාකරණං[4] සුත්වා.

---

1. නාදිකෙ සීමු. සා්‍ය. PTS.
2. චෙතියවංසෙසු -- මච්ඡසං
3. සකිංදෙවං (කා.)
4. පඤ්හාවෙය්‍යාකරණං (සා්‍ය කා)

Free Distribution www.aathaapi.org

5.

ජනවසභ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ **ඳාතිකා** ගමැ ගෙඩිගෙහි වැඩ වසන සේක. එ සෙමෙහි භාග්‍යවතුන් වහන්සේ **කාසි කෝසල වජ්ජිමල්ල චෙති වංස කුරු පඤ්චාල මච්ඡ සූරසේන** යන වටා වටා දනවුහි ඉකුත් කලැ වූසූ කලුරිය කළ උවසුවන් ඇරබැ 'අසෝ තැනැත්තේ අසෝ තැනැ උපන, අසෝ තැනැත්තේ අසෝ තැනැ උපනැ' යි ඔවුන් ගේ උපපත්ති විෂයයෙහි කරුණු හෙළි කැරැ වදරන සේක. ඳාතිකාවාසි වූ ද පනසකට වැඩි තරම් වූ, ඉකුත් කලැ වූ, කලුරිය කළ උවසුවෝ අවරභාගික සංයෝජන පස නැසූ හෙයින් ඒ ශුද්ධාවාසයෙහි උපන්නාහු, එහි ම පිරිනිවෙන සුලු වූවාහු, එ ලොවින් වටාලා නො එන සුලු වෙත්. ඉකුත් කලැ සිටි, කලුරිය කළ, ඳාතිකාග්‍රාමවාසි අධිකයක් සහිත අනූවක් (අනුවකට වැඩි) උවසුවෝ, තුන් සංයෝජනයන් නැසූ හෙයින් රාග ද්වේෂ මෝහ තුනී වූ හෙයින්, සෙදගැමි වූවාහු, එක් වරක් ම මෙලොවට අවුත් දුක් කෙළවර කරන්නාහ. අතිරේකයක් සහිත පන්සියක් ඳාතිකාවාසි උපාසකයෝ ඉකුත් කලැ සිට කලුරිය කළාහු, තුන් සංයෝජනයන් නැසූ හෙයින් සෝවාන් වූවාහු, අපායට නොවැටෙන සුලු වූවාහු, රහත්බවට නියත වූවාහු, රහත් බව පිණිට කොටැත්තාහු වෙත්'' යි ද වදළ සේක.

2. ''භාග්‍යවතුන් වහන්සේ කාසි කෝසල දෙරටෙහි ද වජ්ජි මල්ල දෙ රටේහි ද චෙති වංස දෙ රටෙහි ද කුරු පංචාල දෙ රටෙහි ද මච්ඡ සූරසේන දෙ රටෙහි ද යන වටා වටා දනවුහි ළඟ ඉකුත් කලැ සිටි, කලුරිය කළ උවසුවන් 'අසෝ තැනැත්තේ අසෝ තැනැ උපන, අසෝ තැනැත්තේ අසෝ තැනැ උපනැ යි උපපත්ති නිමිත්තෙන් ඔවුන් (මරණින් පසු තතු) හෙළි කරන සේක. ළඟ ඉකුත් කලැ සිටි, කලුරිය කළ ඳාතිකාවාසි පනසකට වැඩි ගණනක් උවසුවෝ, අවරභාගික සංයෝජන පස නැසූ හෙයින් ශුද්ධාවාසයෙහි උපන්නාහු, එහි දී පිරිනිවෙන සුලු වූවාහු, වටාලා එයින් මෙහි නො එන සුලු වෙත්. ඉකුත් කලැ සිටි, කලුරිය කළ, ඳාතිකාවාසි අනූවකට වැඩි ගණනක් උවසුවෝ තුන් සංයෝජන නැසූයෙන්, රාග ද්වේෂ මොහ තුනී වූයෙන්, සෙද ගැමි වූවාහු, එක් වරක් ම මෙ ලොවට අවුත් දුක් කෙළවර කරන්නාහ. ඉකුත් කලැ සිටි, කලුරිය කළ පන්සියකට වැඩි ගණනක් ඳාතිකාවාසි උවසුවෝ, තුන් සංයෝජන නැසූයෙන් සෝවාන් වූවාහු, අපායට නොවැටෙන සුලු වූවාහු, රහත් බවට නියත වූවාහු, රහත්ඵලය ප්‍රතිඡ්ඨා කොටැත්තාහු වෙත් යැ යි වදරන සේකැ'' යි ඳාතිකාග්‍රාමවාසි උපාසකයෝ භගවත් බුදුරජුන් ගේ ප්‍රශ්නව්‍යාකරණය අසා එයින් ද ගත්නා ලද සිතැත්තාහු, සතුටු වූවාහු, හටගත් ප්‍රීති හා සොමනස් හා ඇත්තෝ වූහ.

Free Distribution www.aathaapi.org

3. අස්සොසි ඛො ආයස්මා ආනන්දො: භගවා කිර පරිතො පරිතො ජනපදෙසු පරිචාරකෙ අඛ්භතීතෙ කාලකතෙ උපපත්තීසු ඛ්‍යාකරොති. කාසිකොසලෙසු වජ්ජීමල්ලෙසු චෙතිවංසෙසු කුරුපඤ්චාලෙසු මච්ඡසුර-සෙනෙසු අසු අමුත්‍ර උපපන්නො අසු අමුත්‍ර උපපන්නො ති, පරොපඤ්ඤාස-නාතිකියා පරිචාරකා අඛ්භතීතා කාලකතා පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤාජනානං පරික්ඛයා ඔපපාතිකා තත්ථ පරිනිබ්බායිනො අනාවත්තිධම්මා තස්මා ලොකා. සාධිකා නවුති නාතිකියො පරිචාරකා අඛ්භතීතා කාලකතා තිණ්ණං සඤ්ඤාජනානං පරික්ඛයා රාගදෙසමොහානං තනුත්තා සකද-ගාමීනො සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති, සාතිරෙකානි පඤ්චසතානි නාතිකියා පරිචාරකා අඛ්භතීතා කාලකතා තිණ්ණං සඤ්ඤාජනානං පරික්ඛයා සොතාපන්නා අවිනිපාතධම්මා නියතා සම්බොධි-පරායණා ති. තෙන ච නාතිකියා පරිචාරකා අත්තමනා අහෙසුං පමුදිතා පීතිසොමනස්සජාතා භගවතො පඤ්හවෙය්‍යාකරණං සුත්වා ''ති.

ආනන්ද පරිකථා

4. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: ඉමෙ ඛො පනාපි[1] අහෙසුං මාගධකා පරිචාරකා බහූ චෙව රත්තඤ්ඤූ ච අඛ්භතීතා කාල-කතා. සුඤ්ඤූ මඤ්ඤෙ අඞ්ගමගධා අඞ්ගමාගධකෙහි[2] පරිචාරකෙහි අඛ්භතීතෙහි කාලකතෙහි. තෙ ඛො පනාපි අහෙසුං බුද්ධෙ පසන්නා ධම්මෙ පසන්නා සඞ්ඝෙ පසන්නා සීලෙසු පරිපූරකාරිනො තෙ අඛ්භ-තීතා කාලකතා භගවතා අඛ්‍යාකතා. තෙසම්පස්ස[3] සාධු වෙය්‍යා-කරණං. බහුජනො පසීදෙය්‍ය තතො ගච්ඡෙය්‍ය සුගතිං. අයං ඛො පනාපි අහොසි රාජා මාගධො සෙනියො බිම්බිසාරො ධම්මිකො ධම්ම-රාජා හිතො බ්‍රාහ්මණගහපතිකානං නෙගමානඤ්චෙව ජානපදානඤ්ච. අපිස්සුදං මනුස්සා කිත්තයමානරූපා විහරන්ති 'එවං නො සො ධම්මිකො ධම්මරාජා සුඛාපෙත්වා කාලකතො, එවං මයං තස්ස ධම්මිකස්ස ධම්මරඤ්ඤො විජිතෙ ඵාසු[4] විහරිම්හා'ති. සො ඛො පනාපි අහොසි බුද්ධෙ පසන්නො ධම්මෙ පසන්නො සඞ්ඝෙ පසන්නො සීලෙසු පරිපූර-කාරී. අපිස්සුදං මනුස්සා එවමාහංසු 'යාව මරණකාලාපි රාජා මාගධො සෙනියො බිම්බිසාරො භගවන්තං කිත්තයමානරූපො කාලකතො'ති.

---

1. පනපි – PTS
2. අඞ්ගමාගධිකෙහි – ස්‍යා
3. තෙසම්පිස්ස – මජ්ජිසං
4. ඵාසුකං – ස්‍යා

Free Distribution www.aathaapi.org

3. ''භාග්‍යවතුන් වහන්සේ කාසි කෝසල දෙ රටෙහි ද වජ්ජි මල්ල දෙ රටෙහි ද චෙති වංස දෙ රටෙහි ද කුරු පංචාල දෙ රටෙහි ද මච්ඡ සුරසෙන දෙ රටෙහි ද යන වටා වටා දනවුහි ළඟ ඉකුත් කලැ සිටි කලුරිය කළ උවසුවන් 'අසෝ තැනැත්තේ අසෝ කැනැ උපන, අසෝ තැනැත්තේ අසෝ තැන උපනැ' යි ද උපපත්ති නිමිත්තෙන් (ඔවුන්ගේ මරණින් පසු ගතිය) හෙළි කරන සේක. ඉකුත් කලැ සිටි, කලුරිය කළ ඥාතිකාවාසි වූ පනසකට වැඩි ගණනක් උවසුවෝ අවරභාගික සංයෝජන පස නැසූ හෙයින් ශුද්ධාවාසයෙහි උපන්නාහු, එහි දී පිරිනිවෙන සුලු වූවාහු, වටාලා එයින් මෙහි නොඑන සුලු වෙතැ යි ද, ඉකුත් කලැ සිටි කලුරිය කළ ඥාතිකවාසී අනුවකට වැඩි ගණනක් උවසුවෝ තුන් සංයෝජන නැසූ හෙයින්, රාග ද්වේෂ මෝහ තුනී වූ හෙයින් සෙදගැමි වූවාහු, එක් වරක් ම මෙ ලොවට අවුත් දුක් කෙළවර කරන්නාහ' යි ද, ළඟ ඉකුත් කලැ සිටි, කලුරිය කළ පන්සියයකට වැඩි ගණනක් ඥාතිකාවාසි උවසුවෝ තුන් සංයෝජන නැසූ හෙයින් සෝවාන් වූවාහු, අපායට නොවැටෙන සුලු වූවාහු, රහත් බවට නියත වූවාහු, රහත්ඵලය ප්‍රතිඥා කොටැති යාහු වෙතැ යි ද වදරන සේක් ල, භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රශ්නව්‍යාකරණය අසා එයින් ඥාතිකාවාසි උවසුවෝ ආරාධිත සිතැත්තාහු, සතුටු වූවාහු, හටගත් ප්‍රීති හා සොම්නස් හා ඇත්තාහු ද වෙත් ලැ'' යි අනඳ තෙරණුවෝ ඇසූහ.

ආනන්ද පරිකථාව

4. -එ කල්හි වනාහි අනඳ තෙරුනට මේ සිත විය: ''ළඟ ඉකුත් කලැ සිටි, කලුරිය කළ, මගද රටැ වැසි විරරාත්‍රඥ බොහෝ උවසුවෝ ද වූහ. ළඟ ඉකුත් කලැ සිට කළුරිය කළ අඳු මගද දෙරටැ වුසු (අරිසවු) උවසුවන් ගෙන් මෙ දෙ රට හිස් වූ නියා යැ (හිස් වූවාක් මෙන් අන්‍යයනට පෙනෙයි). ඒ අඳු මගද දෙර ටැ වැසියෝ ද බුදුරජුන් කෙරෙහි පහන් ද දහමහි පහන් ද සඟුන් කෙරෙහි පහන් ද සිල් පුරන සුලුද වූහ. ළඟ ඉකුත් කලැ කලුරිය කළ ඔහු භාග්‍යවතුන් වහන්සේ විසින් නො ම හෙළි කරන ලදුහ. ඔවුන් ගේ ද උපපත්තිය හෙළි කරනු මනා යැ. බොහෝ දෙනා පහදිනු ඇත. එයින් සුගතියට යනු ඇත. මේ මගධාධිපති ශ්‍රෙණික බිම්බිසාර රජ ධාර්මික ද ධර්මරාජ ද බමුණු ගැහැවියනටත් නිගමවාසී ජනපදවාසි ජනයාටත් හිතකාමී ද විය. මිනිස්සුද දැහැමී වූ, දැහැමින් රැජැයූ අපේ රජ රට සුවපත් කොට මෙසේ කලුරිය කෙළේ යැ' යි ද, 'මෙසේ අපි දැහැමී වූ දැහැමෙන් රජ වූ ඔබේ රටැ සුව සේ වුසුමහ' යි ද, එ රජුහු ගුණ වණන්නාහු ද වෙසෙත්. ඒ රජ ද බුදුරජුන් කෙරෙහි පහන් ද දහමහි පහන් ද සඟුන් කෙරෙහි පහන් ද සිල් පුරන සුලු ද විය. කලුරිය කරන තෙක් දු මගධාධිපති ශ්‍රෙණික බිම්බිසාර රජ භාග්‍යවතුන් වහන්සේගේ ගුණ වණන සුලු වැ වැස කලුරිය කෙළේ යැ' යි මිනිස්සු ද මෙසේ කියත්.

Free Distribution www.aathaapi.org

සෝ අඛ්භතීතෝ කාලකතෝ භගවතා අබ්‍යාකතෝ. තස්ස ජස්ස සාධු-වෙය්‍යාකරණං. බහූජනෝ පසීදෙය්‍ය, තතෝ ගවෙජ්‍යය සුගතිං. භග-වතෝ බෝ පන සම්බොධි මගධෙසු. යත්‍ර බෝ භගවතෝ සම්බොධි මගධෙසු, කථං තත්‍ර භගවා මාගධකෙ පරිවාරකෙ අඛ්භතීතෙ කාල-කතෙ උපපත්තීසු න බ්‍යාකරෙය්‍ය? භගවා වෙව බෝ පන මාගධකෙ පරිවාරකෙ අඛ්භතීතෙ කාලකතෙ උපපත්තීසු න බ්‍යාකරෙය්‍ය දීන-මනා තෙනස්සු මාගධකා පරිවාරකා. යෙන බෝ පනස්සු දීනමනා මාගධකා පරිවාරකා කථං තෙ භගවා න බ්‍යාකරෙය්‍යාති.

5. ඉදමාවුසමා ආනන්දෙ මාගධකෙ පරිවාරකෙ ආරබ්භ එකෝ රහෝ අත්‍රවිවිත්තෝ ඒවා රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය යෙන භගවා තෙනුප-සඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නෝ බෝ ආයස්මා ආනන්දෙ භගවන්තං එතදවොච:

සුතමෙතං භන්තෙ භගවා කිර පරිත්තා පරිත්තා ජනපදෙසු පරිවාරකෙ අඛ්භතීතෙ කාලකතෙ උපපත්තීසු බ්‍යාකරොති කාසිකොසලෙසු වජ්ජිම-ලෙලසු වෙතිවංසෙසු කුරුපඤ්චාලෙසු මච්ඡසුරසෙනෙසු. අසු අමුත්ර උපපන්නෝ අසු අමුත්ර උපපන්නෝ ති. පරොපඤ්ඤාසං නාතිකියා පරි-වාරකා අඛ්භතීතා කාලකතා පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනා-නානං පරික්ඛයා ඔපපාතිකා තත්‍ර පරිනිබ්බායිනෝ අනාවත්තිධම්මා තස්මා ලෝකා. සාධිකා නවුති නාතිකියා පරිවාරකා අඛ්භතීතා කාල-කතා තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදෙසමොහානං තනුත්තා සකදාගාමිනෝ සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරි-ස්සන්ති. සාතිරෙකානි පඤ්චසතානි නාතිකියා පරිවාරකා අඛ්භතීතා කාලකතා තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නා අවිනි-පාතධම්මා නියතා සම්බොධිපරායණාති. තෙන ච නාතිකියා පරිවා-රකා අත්තමනා අහෙසුං පමුදිතා පීතිසොමනස්සජාතා භගවතෝ භාසිතං අභිනන්දෙය්‍යුං. ඉමෙ බෝ පනාපි භන්තෙ අහෙසුං මාග-ධකා පරිවාරකා බහූ වෙව රත්තාඤ්ඤූ ච අඛ්භතීතා කාලකතා සුඤ්ඤූ මඤ්ඤූ අඛ්භමාගධා අඛ්භමාගධකෙහි පරිවාරකෙහි අඛ්භතීතෙහි කාල-කතෙහි. තෙ බෝ පනාපි භන්තෙ අහෙසුං බුද්ධෙ පසන්නා ධම්මෙ පසන්නා සඞ්ඝෙ පසන්නා සීලෙසු පරිපූරකාරිනෝ. තෙ අඛ්භතීතා කාලකතා භගවතා අබ්‍යාකතා.

Free Distribution www.aathaapi.org

හේ ළඟ ඉකුත් කල්හි කලුරිය කෙළේ, භාග්‍යවතුන් වහන්සේ විසින් (මොහුගේ උපපත්තිය මෙසේ යැ යි) නො ම හෙළි කරන ලද්දේ ය. ඔහුගේ උපපත්තිය ද හෙළි කරනු මනා යැ. බොහෝ දෙනා පහදිනු ඇත. එයින් සුගතියට යනු ඇත. භාග්‍යවතුන් වහන්සේගේ සම්බොධිය මගද රටෙහි විය. යම් මගද රටෙක භාග්‍යවතුන් වහන්සේගේ සම්බොධිය වී ද, එහි සම්පාතීත වූ කලුරිය කළ උවසුවන් කෙසේ නම් භාග්‍යවතුන් වහන්සේ (ඔවුන්ගේ) උපපත්තීන් නිමිත්තෙන් නො ම හෙළි කළ යුතු වන සේක් ද? භාග්‍යවතුන් වහන්සේ වනාහි සම්පාතීතයෙහි කලුරිය කළ මගද රට වැසි උවසුවන් ඔවුන්ගේ උපපත්ති නිමිත්තෙන් නො හෙළි කරන සේක් වූ නම්, එයින් මගද රටැ වැසි උවසුවෝ බැගෑපත් සිතැති වන්නාහ. මගද රටැ වැසි උවසුවෝ යම් කරුණෙකින් බැගෑපත් සිතැති වන්නාහු ද, භාග්‍යවතුන් වහන්සේ කෙසේ නම් ඒ (උපපත්ති නිමිත්තෙන්) උවසුවන් හෙළි නො කරන සේක් ද? යනු යැ.

5. අනඳ තෙරණුවෝ මගද රටැ වැසි උවසුවන් ඇරැබැ හුදෙකලා වැ රහසිගත වැ මෙසේ පුනපුනා සිතා, රෑ අලුය මැ නැඟී සිට, භගවත් බුදුරජුන් කරා එළැඹියාහ. එළැඹ ඔබ වැඳ, පසෙකැ හිඳගත්හ. පසෙකැ හිඳ ම භගවත් බුදුරජුනට මෙ බස් පැවැසූහ:

''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ කාසි කෝසල දෙ රටෙහි ද වජ්ජි මල්ල දෙ රටෙහි ද චෙති වංස දෙ රටෙහි ද කුරු පංචාල දෙ රටෙහි ද මච්ඡ සූරසේන දෙ රටෙහි ද යන වටා වටා දනවුහි ළඟ ඉකුත් කලැ සිටී, කලුරිය කළ උවසුවන් 'අසෝ තැනැත්තේ අසෝ තැනැ උපන, අසෝ තැනැත්තේ අසෝ තැනැ උපනැ' යි උපපත්ති නිමිත්තෙන් (ඔවුන් මරණින් පසු තතු) හෙළි කරන සේක. ළඟ ඉකුත් කලැ සිටී, කලුරිය කළ ඳාතිකාවාසී පනසකට වැඩි ගණනෙක් උවසුවෝ අවරභාගික සංයොජන පස නැසූයෙන් ශුද්ධාවාසයෙහි උපන්නාහු, එහි දී පිරිනිවෙන සුලු වූවාහු, වටාලා එයින් මෙහි නො එන සුලු වෙත්. ඉකුත් කලැ සිටී, කලුරිය කළ, ඳාතිකාවාසී අනූවකට වැඩි ගණනක් උවසුවෝ, තුන් සංයෝජන නැසූයෙන්, රාග ද්වේෂ මොහ තුනී වූයෙන්, සෙදගැමි වූවාහු, එක් වරක් ම මෙ ලොවට අවුත් දුක් කෙළවර කරන්නාහ. ඉකුත් කලැ සිටී, කලුරිය කළ, පන්සියයට වැඩි ගණනක් ඳාතිකවාසී උවසුවෝ, තුන් සංයෝජන නැසූයෙන්, සෝවාන් වූවාහු, රහත් ඵලය ප්‍රතිඡ්ඨා කොටැත්තාහු වෙත්'' යැ යි වදරන සේක. එයින් ඳාතිකාවාසී උවසුවෝ භාග්‍යවතුන් වහන්සේ ගේ ප්‍රශ්න ව්‍යාකරණය අසා ආරාධිත සිතැත්තෝ ප්‍රමුදිතයෝ උපන් ප්‍රීති හා සොමනස් හා ඇත්තෝ වූහ. වහන්ස, ළඟ ඉකුත් කලැ කලුරිය කළ මගද රටැ වැසි ත්‍රිරාත්‍රඥ වූ මේ බොහෝ උවසුවෝ වූහ. අඟු මගද දෙරට ළඟ ඉකුත් කලැ කලුරිය කළ අඟුමගද වැසි උවසුවන් ගෙන් හිස් වූ සේ ය. වහන්ස, ඔහු ද බුදු රජු කෙරෙහි පැහැදුණා වූ, දහමෙහි පැහැදුණාහු, සඟන කෙරෙහි පැහැදුණාහු, සිල් සුරන්නාහු වූහ. ළඟ ඉකුත් කලැ කලුරිය කළ ඔහු භාග්‍යවතුන් වහන්සේ විසින් නො හෙළි කරන ලදහ.

Free Distribution www.aathaapi.org

තෙසම්පස්ස සාධු වෙය්‍යාකරණං බහුජනො පසීදෙය්‍ය තතො ගච්ඡෙය්‍ය සුගතිං අයං ඛො පනාපි භන්තෙ අහොසි රාජා මාගධො සෙනියො බිම්බිසාරො ධම්මිකො ධම්මරාජා භිතො බ්‍රාහ්මණ-ගහපතිකානං නෙගමානඤ්චෙව ජානපදානඤ්ච අපිස්සුදං මනුස්සා කිත්තයමානරූපා විහරන්ති. 'එවං නො සො ධම්මිකො ධම්මරාජා සුඛාපෙත්වා කාලකතො, එවං මයං තස්ස ධම්මිකස්ස ධම්ම-රඤ්ඤෙ විජිතෙ ඵාසු විහරිම්හා'ති. සො ඛො පනාපි භන්තෙ අහොසි බුඩෙ පසන්නො ධම්මෙ පසන්නො සඞ්ඝෙ පසන්නො සීලෙසු පරිපූර-කාරී. අපිස්සුදං මනුස්සා එවමාහංසු 'යාව මරණකාලා පි රාජා මාගධො සෙනියො බිම්බිසාරො භගවන්තං කිත්තයමානරූපො කාලකතො'ති. සො අඛ්‍යාතීතො කාලකතො භගවතා අඛ්‍යාකතො, තස්ස පස්ස සාධු වෙය්‍යාකරණං බහුජනො පසීදෙය්‍ය තතො ගච්ඡෙය්‍ය සුගතිං, භගවතො ඛො පන භන්තෙ සම්බොධි මගධෙසු. යත්ථ ඛො පන භන්තෙ භගවතො සම්බොධි මගධෙසු කථං තත්ථ භගවා මාගධකෙ පරිචා-රකෙ අඛ්‍යාතීතෙ කාලකතෙ උප්පත්තීසු න ඛ්‍යාකරෙය්‍ය. භගවා වෙ ඛො පන භන්තෙ මාගධකෙ පරිචාරකෙ අඛ්‍යාතීතෙ කාලකතෙ උප-පත්තීසු න ඛ්‍යාකරෙය්‍ය, දීනමනා[1] තෙනස්සු මාගධකා පරිචාරකා. යෙන ඛො පනස්සු භන්තෙ දීනමනා මාගධකා පරිචාරකා, කථං තෙ භගවා න ඛ්‍යාකරෙය්‍යා''ති.

ඉදමායස්මා ආනන්දො මාගධකෙ පරිචාරකෙ ආරබ්භ භගවතො සම්මුඛා පරිකථං කත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

6. අථ ඛො භගවා අචිරපක්කන්තෙ ආයස්මන්තෙ ආනන්දෙ පුබ්බන්හ-සමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය නාතිකං පිණ්ඩාය පාවිසි. නාතිකෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො පාදෙ පක්ඛාලෙත්වා ගිඤ්ජකාවසථං පවිසිත්වා මාගධකෙ පරිචාරකෙ ආරබ්භ අට්ඨිකත්වා මනසි කත්වා සබ්බං චෙතසො සමන්නාහරිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි "ගතිං තෙසං ජානිස්සාමි අභිසම්පරායං යංගතිකා තෙ භවන්තො යංඅභිසම්පරා-යා''ති. අද්දසා ඛො භගවා මාගධකෙ පරිචාරකෙ යංගතිකා තෙ භවන්තො යංඅභිසම්පරායාති. අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො ගිඤ්ජකාවසථා නික්ඛමිත්වා විහාරපච්ඡායායං පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

---

1. නිත්තමනා. ස්‍යා.
දීනමානා PTS.

Free Distribution www.aathaapi.org

ඔවුන්ගේ ද (උපපත්තිය) හෙළි කිරීම වේ වෘ යි යදිමි. එයින් බොහෝ දෙනා පහදිනු ඇත. සුගතියට යනු ඇත. වහන්ස, මගධාධිපති වූ මේ ශ්‍රේණික බිම්බිසාර රජ දැහැමි විය, දැහැමෙන් රජයන්නේ විය. බමුණනට ද ගැහැවියනට ද නියම්ගම්වැසියනට ද දනවු වැසියනට ද වැඩ කැමැති විය. තව ද මිනිස්සු 'මෙසේ ඒ දැහැමි වූ, දැහැමෙන් රැජයූ බිම්සර රජ අප සුව පත් කොට කලුරිය කෙළේ ය. මෙසේ අපි දැහැමෙන් රැජයූ ඒ දැහැමි රජුගේ රටෙහි පහසුවෙන් වුසුම්හ' යි ඔහු ගුණ වණන සුලු ව වෙසෙත්. වහන්ස, තව ද එ රජ බුදුරජාණන් වහන්සේ කෙරෙහි පැහැදුණෙක, දහමෙහි පැහැදුණෙක, සඟන කෙරෙහි පැහැදුණෙක, සිල් පිරුයෙක. තව ද මිනිස්සු 'මියැ යන තාක් ම මගධාධිපති වූ ශ්‍රේණික බිම්බිසාර රජ භාග්‍යවතුන් වහන්සේ වර්ණනා කරන සුලු වැ වාස කලුරිය කෙළේ යැ' යි මෙසේ කියත්. ළඟ ඉකුත් කලැ සිටි, කලුරිය කළ හෙතෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් හෙළි නො කරන ලදී. ඔහුගේ ද උපපත්තිය හෙළි කිරීම වේව යි යදිමි. බොහෝ දෙනා පහදිනු ඇත. එයින් සුගතියට යනු ඇත. වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ සම්බොධිය (බුදු බව ලැබීම) වූයේ මගද රටෙහි ය. වහන්ස, යම් මගද රටෙක භාග්‍යවතුන් වහන්සේගේ සම්බොධිය වී නම්, එ මගද රටැ වුසූ, ළඟ ඉකුත් කල්හි වූ, කලුරිය කළ උවසුවන් කෙසේ නම් උපපත්තිය නිමිත්තෙන් හෙළි නො කරන සේක් ද? වහන්ස, ඉදින් භාග්‍යවතුන් වහන්සේ ළඟ ඉකුත් කල්හි වූ, කලුරිය කළ මගද රටැ වුසූ උවසුවන් උපපත්ති නිමිත්තෙන් හෙළි නො කරන සේක් වී නම්, මගද රටැ වැසි උවසුවෝ එයින් බැගෑපත් සිතැත්තෝ වන්නාහ. වහන්ස, යම් හෙයකින් මගද රටැ වැසි උවසුවෝ බැගෑපත් සිතැත්තෝ වන්නාහු නම්, කෙසේ නම් භාග්‍යවතුන් වහන්සේ ඔවුන් (උපපත්ති නිමිත්තෙන්) හෙළි නො කරන සේක් ද?''

අනඳ තෙරණුවෝ මගද රටැ වැසි උවසුවන් ඇරැබැ භගවත් බුදුරජුන් හමුයෙහි මේ විස්තර කථාව කොට, හුනස්නෙන් නැඟී, ඔබ වැඳ පැදකුණු කොට නික්මියාහ.

6. එ කලැ භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් නික්මැ ගිය නොබෝ කල්හි, පෙර වරු සමයෙහි හැඳැ පෙරෙ වැ පා සිවුරු ගෙන, ඳාතිකි ගමට පිඬු පිණිස පිවිසි සේක. ඳාතික ගමෙහි පිඬු පිණිස හැසිර, පසුබත්හි පිඬු පා ගමනින් පෙරළා ඇක්මුණු සේක්, පා සෝද ගිඤ්ජකාවසථයට (ගඩොළු ගෙට) වැඩ, මගද රට වැසි උවසුන් ඇරැබ, කරුණු සලකා මෙනෙහි කොට, සියල්ල සිතින් එක් කොට ගෙන, 'ඒ භවත්හු යම්බඳු ඳානගතියක් ඇත්තාහු ද, යම්බඳු පරලොව ගතියක් ඇත්තාහු ද, ඔවුන්ගේ ඒ ඳානගතිය, ඒ පරලොව ගතිය දැනගන්නෙමි' යි සිතා පනවන ලද අස්නෙහි වැඩ හුන් සේක. ඒ භවත්හු යම් ඳානගතියක් ඇත්තාහු ද, යම් පරලෝ ගතියක් ඇත්තාහු ද, එසේ වූ මගද රටැ වුසූ ඒ උවසුවන් භාග්‍යවතුන් වහන්සේ දුටු සේක. එයින් පසු සවස් වේලේ සමවතින් නැඟී සිටි සේක්, ගඩොළු ගෙයින් නික් මැ වෙහෙර ඉදිරි පසැ සෙවණෙහි පනවන ලද අස්නෙහි වැඩ හුන් සේක.

Free Distribution www.aathaapi.org

7. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච. ''උපසන්ත-පදිසෙසං[1] භන්තෙ භගවා, භාතිරිව භගවතො මුඛවණ්ණා විප්පසන්නත්තා ඉන්ද්‍රියානං. සන්නෙන නූනජ්ජ භන්තෙ භගවා විහාරෙන විහාසි''ති. ''යදෙව ඛො මෙ තුවං ආනන්ද මාගධකෙ පරිචාරකෙ ආරබ්භ සම්මුඛා පරිකථං කත්වා උට්ඨායාසනා පක්කමෙය්‍යා, තදෙවාහං නාතිකෙ පිණ්ඩාය චරිත්වා පච්ඡා-භත්තං පිණ්ඩපාතපටික්කන්තෙ පාදෙ පක්ඛාලෙත්වා ගිඤ්ජකාවසථං පවිසිත්වා මාගධකෙ පරිචාරකෙ ආරබ්භ අවසික්කිත්වා[2] මනසි කත්වා සඛඛං චෙතසො සමන්නාහරිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදිං 'ගතිං තෙසං ජානිස්සාමි අභිසම්පරායං, යංගතිකා තෙ භවෙය්‍යුං යංඅභිසම්පරායා'ති. අද්දසං ඛො අහං ආනන්ද මාගධකෙ පරිචාරකෙ යංගතිකා තෙ භවෙය්‍යුං යංඅභිසම්පරායාති.

ජනවසභාගමනං

8. අථ ඛො ආනන්ද අඤ්ඤතරා ඉත්ථී යෙඛා සද්දමනුස්සාවෙසි: ''ජනවසභො අහං භගවා, ජනවසභො අහං සුගතා''ති. ''අභිජානාසි නො ත්වං ආනන්ද ඉතො පුබ්බෙ එවරූපං නාමධෙය්‍යං සුතං යදිදං ජනවස-භො'' ති ''න ඛො අහං භන්තෙ අභිජානාමි ඉතො පුබ්බෙ එවරූපං නාම-ධෙය්‍යං සුතං යදිදං ජනවසභො''ති. අපි ච මෙ භන්තෙ ලොමානි හට්ඨානි ජනවසභො ති නාමධෙය්‍යං සුත්වා. තස්ස මයහං භන්තෙ එතද-හොසි: න හි නූන සො ඔරකො යෙඛා භවිස්සති යස්සිදං[3] එවරූපං නාමධෙය්‍යං සුපඤ්ඤත්තං යදිදං ජනවසභො'ති. ''අනන්තරා ඛො ආනන්ද සද්දපාතුභාවා උළාරවණ්ණා මෙ යෙඛා සම්මුඛෙ පාතු-රහොසි. දුතියම්පි සද්දමනුස්සාවෙසි: 'බිම්බිසාරො අහං භගවා බිම්බි-සාරො අහං සුගතා'ති. ඉදං සත්තමං ඛො අහං භන්තෙ වෙසාවණස්ස මහාරාජස්ස සහබ්‍යතං උපපජ්ජාමි. සො තතො චුතො මනුස්සරාජා භවිතුං පහොමි.[4]

ඉතො සත්ත තතො සත්ත සංසාරානි චතුද්දස,
නිවාසමභිජානාමි යඤ්ච මෙ වුසිතං පුරෙ.

දීඝරත්තං ඛො අහං භන්තෙ අවිනිපාතො අවිනිපාතං සඤ්ඤානාමි. ආසා ච පන මෙ සන්නිට්ඨිති සකදාගාමිතායා ති.

---

1. උපසන්තපසිදෙසං – ක්‍ං
2. අවසික්කිත්වා – මජ්ඣං
3. යදිදං – මජ්ඣං
4. මනුස්සරාජා පි හොමි – PTS

Free Distribution www.aathaapi.org

7. එ කලැ අනඳ තෙරණුවෝ භගවත් බුදුරජුන් කරා එළැඹියාහ. එළැඹ ඔබ වැඳ එක් පසෙක හුන්හ. අනඳ තෙරණුවෝ එක් පසෙක හුන්නාහු ම භාග්‍යවතුන් වහන්සේට ''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ උපශාන්ත වූ දකුම් ඇති සේක. ඉඳුරන් වෙසෙසින් පහන් බැවින් භාග්‍යවතුන් වහන්සේගේ මුඛවර්ණය බබළන සේ ය. වහන්ස, අද භාග්‍යවතුන් වහන්සේ ශාන්ත විහරණයෙකින් වුසූ සේකැ යි හඟිමි'' යැ යි කීහ. එ විට භාග්‍යවතුන් වහන්සේ වදරන සේක්, ''අනඳයෙනි, යම් විටෙක තෙපි මගද රටැ වුසූ උවසුවන් ඇරබැ මා හමුයෙහි වර්ණනා කරාව කොට හුනස්නෙත් නැඟී නික්මුණහු ද, එ විට ම මම භාතික ගමැ පිඬු පිණිස හැසිර පසු බතැ පිණ්ඩපාතයෙන් පෙරළා ඇක්මුණෙම්, පා දෙවැ ගඩොළු ගෙට වැද මගද රටැ වුසූ උවසුවන් ඇරබැ, කරුණු සලකා බලා මෙනෙහි කොට, සියල්ල සිතින් එක් කොට ගෙන, ඒ භවත්හු යම්බඳු භාතගති ඇත්තෝ වූහු ද, යම්බඳු පරලොව ඇත්තෝ වූහු ද, ඔවුන්ගේ ඒ භාතගතිය, ඒ පරලොව ගතිය දන ගන්නෙමි' යි සිතා, පනවන ලද අස්නැ හිඳැ ගතිමි. අනඳයෙනි, ඒ භවත්හු යම්බඳු භාතගති ඇත්තෝ වූහු ද, යම්බඳු පරලොව ගති ඇත්තෝ වූහු ද, එසේ වූ ගති ඇති මගද රටැ වූ ඒ උවසුවන් මම දුටුයෙම් ම ය.

ජනවසභයා පැමිණිම

8. අනඳයෙනි, එ කලැ අකුරුඳහන් වූ යක්ෂයෙක් 'භාග්‍යවතුන් වහන්ස මම ජනවසභයෙමි, සුගතයන් වහන්ස, මම ජනවසභයෙමි' යි හඬ ඇස්වී ය (ශබ්දයක් පැවැත් වී ය). අනඳයෙනි, ජනවසභ යන මේ නම කොප මෙයින් පෙර ඇසුවා දනිවු ද?'' යි අසා වදළ සේක. ''වහන්ස, ජනවසභ යන මේ නම මෙයින් පෙර ඇසුවා නො ම දනිමි. එහෙත් වහන්ස, ජනවසභ යන නම ඇසීමෙන් මා ලොමුදහ ගත. වහන්ස, ඒ මට 'ජනවසභ යන මෙබඳු නමෙක් යම්කුහට පනවන ලද්දේ නම් හේ එසේ මෙසේ යකෙක් නො වන්නේ යැ'' යි අනඳ තෙරුණුවෝ කිවු ය.

''අනඳයෙනි, හඬ නැහෙන්නා හා ම උදර වූ සිරුරු පැහැ ඇති යක්ෂයෙක් මා ඉදිරියෙහි පහළ විය. දෙවනු වරැ ද හෙ තෙම 'භාග්‍යවතුන් වහන්ස, මම බිම්බිසාර වෙමි, සුගතයන් වහන්ස, මම බිම්බිසාර වෙමි' යි හඬ ඇස්වී ය. ''වහන්ස, මෙ සත්වන වර වෙසවුණු මහරජු ගේ සහභාවයට පැමිණියෙමි. ඒ මම මෙයින් සැව මිනිස් රජක්හු වන්නට හැක්කෙමි. මේ දෙවලොවින් සැවැ සත් වරක් ද, ඒ මිනිස් ලොවින් සැවැ සත් වරක් ද' යි මෙසේ යම් දෙව් මිනිස් දෙ ලොවහි පෙරැ මා වුසූයේ ද, ඒ දෙ කන්හි ම හැම ලෙසින් කඳ පිළිවෙළ තුදුසක් විසිම දනිමි. වහන්ස, දික් කලක් ම අපායකට නො වැටුණෙම, අපායට මගේ නොවැටීම දනිමි. සෙදගැමි බව පිණිස ද මගේ අපේක්ෂාව පවතී'' යැයි ද හේ කී ය.

එව ද ජනවසභ තෙම මතු දක්වෙන කරාවත් කීය:

Free Distribution www.aathaapi.org

9. "අච්ඡරියම්දං ආයස්මතො ජනවසභස්ස යක්ඛස්ස, අබ්භුතම්දං ආයස්මතො ජනවසභස්ස යක්ඛස්ස, 'දීඝරත්තං ඛො අහං භන්තෙ අවිනිපාතො අවිනිපාතං සඤ්ජානාමීති ච වදෙසි, ආසා ච පන මෙ සන්නිට්ඨති සකදාගාමිතායාති ච වදෙසි. කුතො නිදානං පනායස්මා ජනවසභො යක්ඛො එවරූපං උළාරං විසෙසාධිගමං සඤ්ජානාතී?''ති.

"න අඤ්ඤත්‍ර භගවා තව සාසනා, න අඤ්ඤත්‍ර සුගත තව සාසනා. යදග්ගෙ අහං භන්තෙ භගවති එකන්තිකතො[1] අභිප්පසන්නො, තදග්ගෙ අහං භන්තෙ දීඝරත්තං අවිනිපාතො අවිනිපාතං සඤ්ජානාමි. ආසා ච පන මෙ සන්නිට්ඨති සකදාගාමිතාය. ඉධාහං භන්තෙ වෙස්සවණෙන මහාරාජෙන පෙසිතො විරූළහකස්ස මහාරාජස්ස සන්තිකෙ කෙනචිදෙවකරණීයෙන. අද්දසං භගවන්තං අන්තරාමග්ගෙ ගිඤ්ජකාවසථං පවිසිත්වා මාගධකෙ පරිචාරකෙ ආරබ්භ අට්ඨිකත්වා මනසි කත්වා සබ්බං චෙතසො සමන්නාහරිත්වා නිසින්නං 'ගතිං තෙසං ජානිස්සාමි අභිසම්පරායං යංගතිකා තෙ භවන්තො යංඅභිසම්පරායාති. අනච්ඡරියං ඛො පනෙතං භන්තෙ යං වෙස්සවණස්ස මහාරාජස්ස තස්සං පරිසායං භාසතො සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං යංගතිකා තෙ භවන්තො යංඅභිසම්පරායාති. තස්ස මය්හං භන්තෙ එතදහොසි: භගවන්තඤ්ච දක්ඛාමි. ඉදඤ්ච භගවතො ආරොචෙස්සාමීති. ඉමෙ ඛො මෙ භන්තෙ දෙව පච්චයා භගවන්තං දස්සනාය උපසඞ්කමිතුං.

දෙවසභා

10. පුරිමානි භන්තෙ දිවසානි පුරිමතරානි තදහුපොසථෙ පණ්ණරසෙ වස්සුපනායිකාය පුණ්ණාය පුණ්ණමාය රත්තියා කෙවලකප්පා ච දෙවා තාවතිංසා සුධම්මායං සභායං සන්නිසින්නා හොන්ති සන්නීපතිතා, මහතී ච දිබ්බපරිසා[2] සමන්තතො සන්නිසින්නා හොන්ති[3] සන්නීපතිතා. චත්තාරො ච මහාරාජානො චාතුද්දිසා නිසින්නා හොන්ති. පුරත්ථිමාය දිසාය ධතරට්ඨො මහාරාජා පච්ඡිමාභිමුඛො[4] නිසින්නො හොති දෙවෙ පුරක්ඛත්වා. දක්ඛිණාය දිසාය විරූළ්හකො මහාරාජා උත්තරාභිමුඛො නිසින්නො හොති දෙවෙ පුරක්ඛත්වා. පච්ඡිමාය දිසාය විරූපක්ඛො මහාරාජා පුරත්ථාභිමුඛො[5] නිසින්නො හොති දෙවෙ පුරක්ඛත්වා. උත්තරාය දිසාය වෙස්සවණො මහාරාජා දක්ඛිණාභිමුඛො නිසින්නො හොති දෙවෙ පුරක්ඛත්වා. යදා භන්තෙ කෙවලකප්පා ච දෙවා තාවතිංසා සුධම්මායං සභායං සන්නිසින්නා හොන්ති සන්නීපතිතා මහතී ච දිබ්බපරිසා සමන්තතො සන්නිසින්නා හොන්ති සන්නීපතිතා, චත්තාරො ච මහාරාජානො චතුද්දිසා නිසින්නා හොන්ති ඉදං තෙසං හොති ආසනස්මිං.

---

1. එකන්තතො – ස්‍යා
2. දිබ්බා පරිසා – PTS
3. හොති – PTS
4. පච්ඡාභිමුඛො – මජ්ඣං
5. පුරත්ථිමාභිමුඛො – මජ්ඣං

Free Distribution www.aathaapi.org

9. ''වහන්ස, මම් දික් කලක් ම අපායට වැටීමක් නැත්තෙම්, අපායෙන් මිදුණු බව හඳුනමි' යි ද තෙපි කියහු, සෙදැගැමි බව පිණිස මගේ අපේක්ෂාව ද පවත්නේ යැ යි ද කියහු. ආයුෂ්මත් ජනවසභ යක්ෂයාණන්ගේ මේ වචනය ආශ්චර්‍ය ය, ආයුෂ්මත් ජනවසභ යක්ෂයාණන් ගේ මේ වචනය අද්භූත ය. ආයුෂ්මත් ජන වසභයෝ කවර හේතුවකින් මෙ බඳු මහත් අධිගම විශේෂයක් වූ නියා හඳුනත් ද?'' යි මම් ඇසීමි. එ විට ජනවසභ තෙම මෙය කී ය:

''භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ ගේ සස්නෙන් බැහැරෙහි නො වේ, සුගතයන් වහන්ස, ඔබ වහන්සේ ගේ සස්නෙන් බැහැරෙහි නො වේ. වහන්ස, යම් දවසෙක (යෂ්ටිවනෝද්‍යානයෙහි දී පළමුවෙන් ම බණ අසා සෝවාන් වැ) භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ඒකාන්ත වශයෙන් පැහැදිණිම් ද, වහන්ස, එතැන් පටන් කොට මම් දික් කලක් අපායයෙන් මිදුණෙම් වීමි. අපායට නොවැටීම හඳුනමි. සකෘදගාමී බව පිණිස මගේ අපේක්ෂාව ද ඇත. වහන්ස, මෙහි මම් වෙසවුණු මහරජුහු විසින් කිසි කටයුත්තක් සඳහා විරූඪක මහරජු වෙත එවන ලදුයෙමි, මහ අතුරෙහි දී භාග්‍යවතුන් වහන්සේ ගිඤ්ජකාවසථයට වැද මගද රටැ වුසු උවසුවන් ඇරැබැ, වැඩ ඇතියක් කොට සලකා, මෙනෙහි කොට, සියල්ල සිතින් එක් තැන් කොට ගෙන, ඒ භවත්හු යම්බඳු ඥානගති ඇතියෝ ද යම්බඳු පරලොව් ගති ඇතියෝ ද, ඔවුන් ගේ ඒ ඥානගති හා පරලොව් ගති දැනගනිමි' යි වැඩ හුන්නවුන් දිටිමි. වහන්ස, ඒ භවත්හු යම් ඥානගති ඇතියෝ යම් අභිසම්පරාය ගති ඇතියෝ වූහු ද එපවත් ඒ පිරිසෙහි දී පවසන වෙසවුණු මහරජු ගේ වචනය ඔහු හමුයෙහි මා ඇසුවා, ඔහු හමුයෙහි මා පිළිගත්තා පුදුම නො වේ. වහන්ස, ඒ මට 'භාග්‍යවතුන් වහන්සේ ද දකින්නෙමි, මෙය ද භාග්‍යවතුන් වහන්සේට සැළ කරන්නෙමි' යි මේ සිත විය. වහන්ස, මේ භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස මා එළැඹෙනුවට කරුණු දෙක ය.

දෙව් සබය

10. වහන්ස, පෙර දවසැ, බොහෝ දවසකට පෙරැ, ඒ පසොළොස්වක් පොහෝ ද, වැසි සෘතුව එළැඹි, පුරා සඳ ඇති රැයෙහි, සියලු තව්තිසා වැසි දෙවියෝ සුදම් සෙබෙහි එක් වැ හුන්නාහු, එක් රැස් වූවාහු වෙත්. මහත් දෙව් පිරිස්හු ද එක් වැ හුන්නාහු, එක්රැස් වූවාහු ද වෙත්. සිවුවරම් මහ රජදරුවෝ ද සිවු දිගැ හුන්නාහු වෙත්. පෙර දිගැ ධෘතරාෂ්ට්‍ර මහරජ පැසිම් දිගට මුහුණ ලා දෙවියන් පෙරටු කොට හුන්නේ වෙයි. දකුණු දිගැ විරූඪක මහරජ උතුරු දෙසට මුහුණ ලා දෙවියන් පෙරටු කොට හුන්නේ වෙයි. පැසිම්දිගැ විරූපාක්ෂ මහරජ පෙර දිගට මුහුණ ලා දෙවියන් පෙරටු කොට හුන්නේ වෙයි. උතුරු දිගැ වෙසවුණු මහරජ දකුණු දෙසට මුහුණ ලා දෙවියන් පෙරටු කොට හුන්නේ වෙයි. වහන්ස, යම් විටෙක සියලු තව්තිසාවැසි දෙවියෝ සුදම් සෙබෙහි එක් වැ හුන්නාහු, එක් රැස් වූවාහු වෙත් ද, මහත් දෙව්පිරිස්හු වටා එක් වැ හුන්නාහු, එක් රැස් වූවාහු වෙත් ද, එකල් හි සතර වරම් මහ රජ දරුවෝ සතර දිගැ හුන්නාහු වෙත්.

Free Distribution www.aathaapi.org

අථ පච්ඡා අමහාකං ආසනං හොති. යෙ තෙ භන්තෙ දෙවා භගවති බ්‍රහ්මචරියං චරිත්වා අධුනූපපන්නා තාවතිංසකායං, තෙ අඤ්ඤෙ දෙවෙ අතිරොචන්ති වණ්ණෙන චෙව යසසා ච. තෙනසසුදං භන්තෙ දෙවා තාවතිංසා අත්තමනා හොන්ති පමුදිතා පීතිසොමනස්සජාතා, "දිබ්බා වත හො කායා පරිපූරන්ති භායන්ති අසුරා කායා"ති. අථ ඛො භන්තෙ සක්කො දෙවානමින්දෙ දෙවානං තාවතිංසානං සම්පසාදං විදිත්වා ඉමාහි ගාථාහි අනුමොදි:

මොදන්ති වත හො දෙවා තාවතිංසා සහින්දකා[1]
තථාගතං නමස්සන්තා ධම්මස්ස ච සුධම්මතං. [a]

නවෙ දෙවෙ ච පස්සත්තා වණ්ණවන්තෙ යසස්සිනෙ,[2]
සුගතස්මිං බ්‍රහ්මචරියං චරිත්වාන ඉධාගතෙ.

තෙ අඤ්ඤෙ අතිරොචන්ති වණ්ණෙන යසසායුනා
සාවකා භූරිපඤ්ඤස්ස විසෙසූපගතා ඉධ.

ඉදං දිස්වාන නන්දන්ති තාවතිංසා සහින්දකා,
තථාගතං නමස්සන්තා ධම්මස්ස ච සුධම්මතන්ති.

11. තෙන සුදං භන්තෙ දෙවා තාවතිංසා භියොසොමත්තාය අත්ත-මනා හොන්ති පමුදිතා පීතිසොමනස්සජාතා. 'දිබ්බා වත හො කායා පරිපූරන්ති භායන්ති අසුරා කායා'ති.

අථ ඛො භන්තෙ යෙනත්ථෙන දෙවා තාවතිංසා සුධම්මායං සභායං සන්නිසින්නා හොන්ති සන්නිපතිතා, තං අත්ථං චින්තයිත්වා තං අත්ථං මන්තයිත්වා වුත්තවචනාපි තං[3] වත්තාරො මහාරාජානො තස්මිං අත්ථෙ හොන්ති, පච්චනුසිට්ඨවචනාපි[4] තං වත්තාරො මහාරාජානො තස්මිං අත්ථෙ හොන්ති, සකෙසු සකෙසු ආසනෙසු ඨිතා අවිපක්කන්තා.[5]

"තෙ වුත්තවාක්‍යා රාජානො පටිග්ගය්හානුසාසනිං
විප්පසන්නමනා සන්තා අඬංසු සම්හි ආසනෙ"ති.

---

1. සඉන්දකා – සීමු
2. යසස්සිනො – ස්‍යා
3. වුත්තවචනා නාමිදං – කං
4. පච්චනුසිට්ඨවචනා පි තං – මජ්ඣං
5. අවිපක්කන්තා – කං

a. මොදන්ති හො පුනර්දෙවා: ත්‍රයස්ත්‍රිංශ සගත්‍රකාං තථාගතං නමස්‍යන්තා ධර්මස්‍ය සුබධර්මතාම් – මහාවස්තු

Free Distribution www.aathaapi.org

මේ ඔවුන්ගේ අසුන් ගැන්ම වේ. ඉක්බිති අපගේ අසුන් වෙයි. වහන්ස, යම් දෙව් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර හැසිරූ, තව්තිසා දෙව්මුළුවට අළුත පැමිණියාහු වෙත් ද, ඔහු වර්ණයෙන් ද යසසින් ද සෙසු දෙවියන් ඉක්මැ බබළත්. වහන්ස, එයින් තව්තිසාවැසි දෙවියෝ, ''ප්‍රීතියෙක! දෙව් පිරිස් පිරේ, අසුර පිරිස් පිරිහේ'' යැ යි ආරාධිත සිතැත්තෝ සතුටු වූවෝ, උපන් ප්‍රීති හා සොම්නස් හා ඇත්තෝ වෙත්. වහන්ස, එ කල්හි සක්දෙවිඳු තව්තිසාවැසි දෙවියන්ගේ පැහැදීම දැන,

''ප්‍රීතියෙක! භවත්නි, ඉන්ද්‍රයා සහිත තව්තිසා වැසි දෙවියෝ තථාගතයන් වහන්සේ ද ධර්මයා ගේ සුධර්මත්වය ද නමදනාහු,

'සුගතයන් වහන්සේ වෙත බඹසර හැසිර මෙහි පැමිණි, වර්ණවත්, යශස් ඇති, අළුත් දෙවියන් දක්නාහු සතුටු වෙත්' යැ යි ද,

''මහ නුවණැති බුදුරජුන් ගේ සවු වූ, විශෙෂාධිගමයට පැමිණි ඔහු මෙහි පැහැයෙන් ද යශසින් ද ආයුෂයෙන් ද අන් දෙවියන් ඉක්මැ බබළත්'' යැ යි ද,

''ඉන්ද්‍රයා සහිත තව්තිසා වැසි දෙවියෝ මෙය දැක, තථාගතයන් වහන්සේ ද, ධර්මයා ගේ සුධර්මත්වය ද (සංඝයා ගේ සුපිළිවෙත ද) නමදනාහු සතුටු වෙති' යි ද කියා මේ ගාථාවලින් අනුමෝදන් විය (ඔවුන් අනුව සතුටු විය).*

11. වහන්ස, 'ප්‍රීතියෙක! භවත්නි, දෙව්මුළුහු පිරෙත්, අසුරමුළුහු පිරිහෙති' යි යන එ කරුණින් තව්තිසාවැසි දෙවියෝ බෙහෙවින් ආරාධිත සිතැත්තාහු, සතුටු වූවාහු, උපන් ප්‍රීති හා සොම්නස් හා ඇත්තාහු වෙත්.

වහන්ස, ඉක්බිත්තෙන් යම් කරුණෙකින් තව්තිසා වැසි දෙවියෝ සුදම් සෙබෙහි එක් වැ හුන්නාහු එක්රැස් වූවාහු වෙත් ද, එ කරුණ සිතා, එ කරුණ සාකච්ඡා කොට, සිවුවරම් මහ රජදරුවෝ සිය සිය අසුන්හි සිටියාහු, එයින් නැඟී නොගියාහු, (තෙතිස් දෙව් පුතුන් විසින්) එ කරුණෙහි කියන ලද වචන ඇත්තාහු ද වෙත්, සිවුවරම් මහ රජ දරුවෝ එ කරුණෙහි යලි යලිත් අනුශාසිත වචන ඇත්තාහු, නැඟී නො ගියාහු සිය සිය අසුන්හි හුන්නාහු වෙත්.

''තෙතිස් දෙව් පුතුන් විසින් කියන ලද වචන ඇති ඒ සිවු වරම් රජුහු ඔවුන් ගේ අනුශාසනිය පිළිගෙන වෙසෙසින් පහන් වූ සිතැත්තෝ ම සිය අසුන්හි රැඳුණහ.''

---

* අරණ්‍යවාසි භික්ෂු සංඝයාට ආරක්ෂාව සැලැස්වීම් කෙසේ කටයුතු දැයි සාකච්ඡා කිරීම ඒ කිරීමයි.

Free Distribution www.aathaapi.org

13. අථ ඛො භග්ගෙ උත්තරාය දිසාය උළාරො ආලොකො සඤ්ජායි, ඔභාසො පාතුරහොසි, අතික්කමෙමව දෙවානං දෙවානුභාවං. අථ ඛො භග්ගෙ සක්කො දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි. යථා ඛො මාරිසා නිමිත්තානි දිස්සන්ති උළාරො ආලොකො සඤ්ජායති. ඔභාසො පාතුභවති, බ්‍රහ්මා පාතුභවිස්සති, බ්‍රහ්මුනො හෙතං පුබ්බනිමිත්තං පාතුභාවාය යදිදං ආලොකො සඤ්ජායති ඔභාසො පාතුභවති ති.

''යථා නිමිත්තා දිස්සන්ති බ්‍රහ්මා පාතුභවිස්සති,
බ්‍රහ්මුනො හෙතං නිමිත්තං ඔභාසො විපුලො මහාති.''

සනඞ්කුමාරකථා

14. අථ ඛො භග්ගෙ දෙවා තාවතිංසා යථාසකෙසු ආසනෙසු නිසීදිංසු 'ඔභාසමෙතං සුදස්සාම යංවිපාකො භවිස්සති සච්ඡිකත්වා'ව නං ගමිස්සාමා ති. චත්තාරොපි මහාරාජානො යථාසකෙසු ආසනෙසු නිසීදිංසු ''ඔභාසමෙතං සුදස්සාම යංවිපාකො භවිස්සති, සච්ඡිකත්වා'ව නං ගමිස්සාමා'ති. ඉදං සුත්වා දෙවා තාවතිංසා එකග්ගා සමාපජ්ජිංසු ''ඔභාසමෙතං සුදස්සාම, යංවිපාකො භවිස්සති, සච්ඡිකත්වා'ව නං ගමිස්සාමා''ති.

යදා භග්ගෙ බ්‍රහ්මා සනංකුමාරො දෙවානං තාවතිංසානං පාතුභවති ඔළාරිකං අත්තභාවං අභිනිම්මිනිත්වා පාතුභවති. යො ඛො පන භග්ගෙ බ්‍රහ්මුනො පකතිවණ්ණො, අනභිසම්භවනීයො සො දෙවානං තාවතිංසානං චක්ඛුපථස්මිං. යදා භග්ගෙ බ්‍රහ්මා සනංකුමාරො දෙවානං තාවතිංසානං පාතුභවති සො අඤ්ඤෙ දෙවෙ අභිරොචති වණ්ණෙන චෙව යසසා ච. සෙය්‍යථාපි භග්ගෙ සොවණ්ණො විග්ගහො මානුසං විග්ගහං අභිරොචති, එවමෙව ඛො භග්ගෙ යදා බ්‍රහ්මා සනංකුමාරො දෙවානං තාවතිංසානං පාතුභවති, සො අඤ්ඤෙ දෙවෙ අභිරොචති වණ්ණෙන චෙව යසසා ච. යදා භග්ගෙ බ්‍රහ්මා සනංකුමාරො දෙවානං තාවතිංසානං පාතුභවති, න තස්ස පරිසායං කොචි දෙවො අභිවාදෙති වා පච්චුට්ඨෙති වා ආසනෙන වා නිමන්තෙති. සබ්බෙව තූණ්හීභූතා පඤ්ජලිකා පල්ලඞ්කෙන නිසීදන්ති 'යසසද්'නි දෙවිස්ස ඉච්ඡිස්සති බ්‍රහ්මා සනංකුමාරො තස්ස දෙවිස්ස පල්ලඞ්කෙ නිසීදිස්සති'ති. යස්ස ඛො පන භග්ගෙ දෙවිස්ස බ්‍රහ්මා සනංකුමාරො පල්ලඞ්කෙ නිසීදති, උළාරං සො ලභති දෙවො වෙදපටිලාභං උළාරං සො ලභති දෙවො සොමනස්සපටිලාභං. සෙය්‍යථාපි භග්ගෙ රාජා ඛත්තියො මුධාවසිත්තො අධුනාභිසිත්තො රජ්ජෙන, උළාරං සො ලභති වෙදපටිලාභං, උළාරං සො ලභති සොමනස්සපටිලාභං, එවමෙව ඛො භග්ගෙ යස්ස දෙවිස්ස බ්‍රහ්මා සනංකුමාරො පල්ලඞ්කෙ නිසීදති උළාරං සො ලභති දෙවො වෙදපටිලාභං. උළාරං සො ලභති දෙවො සොමනස්සපටිලාභං.

Free Distribution www.aathaapi.org



''එසේ ය, මහාබ්‍රහ්මයෙනි'' යි. දෙවිඳු කිහ.

Free Distribution www.aathaapi.org

Free Distribution www.aathaapi.org



2. සවක්ඛාතො ඛො පන තෙන භගවතා ධම්මො සන්දිට්ඨිකො [illegible]

3. ඉදං කුසලන්ති ඛො පන තෙන භගවතා* සුප්පඤ්ඤත්තං. ඉදං අකුසලන්ති සුප්පඤ්ඤත්තං. ඉදං සාවජ්ජං -පෙ- ඉදං අනවජ්ජං -පෙ- ඉදං

Free Distribution www.aathaapi.org

Free Distribution www.aathaapi.org

Free Distribution www.tipitaka.org



Free Distribution www.aathaapi.org

10 ලෙමි ඛො භන්තෙ සක්කො දෙවානම්න්දෙ බහුමනො

Free Distribution www.aathaapi.org

Free Distribution www.aathaapi.org

තික්ඛඩ නැඟීම

18 [illegible]

Free Distribution www.aathaapi.org

''ඉදින් භවත් ගෝවින්දයෙනි ගිහි ගෙන් නික්ම මහණ කිමට වදනා හු නම්,

Free Distribution www.aathaapi.org

පුරොහිත සසා'ති.

Free Distribution www.aathaa.com

Free Distribution www.aathaapi.org



Free Distribution www.aathaapi.org

5. පන්සිළුහු මෙසේ කී කල්හි භාග්‍යවතුන්වහන්සේ ඔහු අමතා,

Free Distribution www.aathaapi.org

Free Distribution www.sathsan.org

වෙසවණ රජ ගේ භංජනී නම් පාදපරිචාරිකාවක් දෙහොත් මදන් තබා

Free Distribution www.aathaapi.org

ඉධාපි මං එවං ජානන්ති ගොපකො දෙවපුත්තො ගොපකො දෙව-
පුත්තොති. තමෙහ පන මාරිසා භගවති බහමචරියං චරිත්වා හීනං

Free Distribution www.aathaapi.org



[illegible]

ද, ඒ අපි නො දැක්ක යුතු දැයක් දුටුම්හ' යි ඔවුනට චෝදනා කළේ ය.

Free Distribution www.aathaapi.org

තෙසං දූවෙ විරියං ආරභිංසු අනුසසරං ගොතමසාසනානි,

Free Distribution www.aathaapi.org



Free Distribution

www.eatmeapi.org



ප්‍රභව (උපදනා තැන්) කොට ඇත්තේ ය. ප්‍රියාප්‍රිය සත්වයන් ඇති කල්හි ඊර්ෂ්‍යා මාත්සයර්‍ය දෙක වෙයි. ප්‍රියයක්හු හෝ අප්‍රියයක්හු නැති කල්හි

Free Distribution www.aathaapi.org

17 කථං පටිපන්නො පන මාරිස භික්ඛු පපඤ්චසඤ්ඤාසඞ්ඛා-

Free Distribution www.aathaad.org

Free Distribution www.aathaapi.org

උපෙක්ඛම්පාහං දෙවානමිඳ දුවිධෙන වදමි සෙවිතබ්බම්පි

Free Distribution www.aathaapi.org

Free Distribution www.aathaapi.org

ආජානාමි, යථාරූපං භන්තෙ චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති ති, එවරූපං චක්ඛු-

Free Distribution www.aathaapi.org



අකුසල් දහම්හු වැඩෙත් ද කුසල් දහම්හු පිරිහෙත් ද, මෙබඳු වූ චක්ඛුර්-විඤ්ඤය රූපය නො සෙවියැ යුතු. වහන්ස, ඇයින් දැක දත යුතු යම් බඳු

Free Distribution www.vahnaapt.org

ඉමං ඛො අහං භන්තෙ තතියං අච්ඡරියං අබ්භුතං සම්පස්සමානෝ එවරූපං වෙදපටිලාභං සොමනස්සපටිලාභං පවෙදෙමි.

Free Distribution www.aathaapi.org

ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති, බහිද්ධා වා කායෙ

Free Distribution www.buddhadpl.org

වෙසෙයි. වරෙක තමා ගේ ද වරෙක මෙරමා ගේ ද කයෙහි කායානු-
පස්සනාව වඩන සුලු වැ වෙසෙයි. (ඉදිරියට යෑම් ආදි) ක්‍රියාවන් ගේ

Free Distribution www.aathaapi.org

සෙය්‍යථාපි භික්ඛවෙ උක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා

Free Distribution www.aathaapi.org

Free Distribution www.aathaapi.org

මෙසේ තමාගේ කයෙහි හෝ කායානුපස්සී වැ වෙසෙයි, මෙරමා ගේ

Free Distribution www.aathaapi.org

Free Distribution www.sethcapi.org

සාමිසං වා සුඛං වෙදනං වෙදියමානො සාමිසං සුඛං වෙදනං
වෙදියාමී ති පජානාති නිරාමිසං වා සුඛං වෙදනං වෙදියමානො නිරාමිසං

Free Distribution www.aathaapi.org

Free Distribution www.aathaapl.org

සමුදයධම්මානුපස්සී වා ධම්මෙසු විහරති, වයධම්මානුපස්සී වා

Free Distribution www.aathaapl.org

Free Distribution www.aathaapi.org

ආයතනානං පටිලාභෝ, අයං වුච්චති භික්ඛවේ ජාති.

කතමා ච භික්ඛවේ ජරා: යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්ත

Free Distribution www.aathaapi.org

Free Distribution www.aathaapi.org

Free Distribution www.aathaapi.org